විගණකාධිපතිවරයාගේ
ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

රාජ්‍ය සමාගම්

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		5
2.	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		6
3.	අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ වල නිරීක්ෂණ		
	3.1	ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම	13
	3.2	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	30
	3.3	ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	33
	3.4	ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	35
	3.5	ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	36
	3.6	ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පෞද්ගලික සමාගම	38
	3.7	සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ	44
	3.8	කුරුණෑගල වැවිලි සමාගම	49
	3.9	හලාවත වැවිලි සමාගම	53
	3.10	සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව	55
	3.11	ඇල්කඩුව වැවිලි සමාගම	60
	3.12	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	64
	3.13	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	73
	3.14	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	80
	3.15	සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	86
	3.16	සී/ස ලංකා පොහොර සමාගම	91
	3.17	මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම	98
	3.18	සී/ස සී-නෝර් පදනම	103
	3.19	මිල්කෝ පුද්ගලික සමාගම	105
	3.20	ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම	117
	3.21	සී/ස නෝර්ත් සී ලිමිටඩ්	119
	3.22	සෙලන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්	122
	3.23	සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්	123

	3.24	මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම	125
	3.25	මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම	137
	3.26	සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්	145
	3.27	සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනය	147
	3.28	සී/ස කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ(පුද්ගලික) සමාගම	153
	3.29	සී/ස දැදුරුඔය කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගම	156
	3.30	ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම	160
	3.31	කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ්	161
	3.32	වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම	167
	3.33	වෝටර්ස් එජ් ලිමිටඩ්	174
	3.34	සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම	181
	3.35	සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම	186
	3.36	හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්	190
	3.37	කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම	193
	3.38	සී/ස පැලියගොඩ වෙයාහවුස් කම්ප්ලෙක්ස් සමාගම	198
	3.39	සීමා සහිත ලංකා රෙස්ට්හවුස් සමාගම	204
	3.40	ජී එස් එම් බී තාක්ෂණ සේවා (පුද්) සමාගම	213
	3.41	සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ	217
	3.42	සීමාසහිත නාගරික ආයෝජන හා සංවර්ධන(පුද්ගලික) සමාගම	234
	3.43	ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම	238
	3.44	සී/ස එල්ආර්ඩීසි සේවා (පෞද්ගලික) සමාගම	250
	3.45	ලංකා මිනරල් සෑන්ඩ් සමාගම	257
	3.46	ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම	262
	3.47	ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	266
	3.48	ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	271
	3.49	කහටගහ ග්‍රැපයිට් ලංකා සමාගම	278
	3.50	ලංකා පොස්පේට් ලිමිටඩ්	282
	3.51	වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම	288
	3.52	සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම	294
	3.53	ලංකා සතොස ලිමිටඩ්	296

	3.54	සී/ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම	303
	3.55	සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම	305
	3.56	ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	306
	3.57	දුරස්ථ ඉගෙනුම් ආයතනය	319
	3.58	සී/ස කන්තලේ සීනි කර්මාන්තායතනය	321
	3.59	ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්.) සමාගම	325
	3.60	ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම	328
	3.61	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම	330
	3.62	කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම	332
	3.63	ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම	336
	3.64	ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම	338
	3.65	ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම	344
	3.66	සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම	347
	3.67	බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විස් පුද්ගලික සමාගම	354
	3.68	ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය බීඕසී ප්‍රොපර්ටි ඩිව්ලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම	356
	3.69	බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	361
	3.70	පිපල්ස් ලිසින්ග් ඇන්ඩ් ෆයිනෑන්ස් පිඑල්සී	366
	3.71	පිපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	368
	3.72	පිපල්ස් ඉන්ෂුරන්ස් පිඑල්සී	370
	3.73	පිපල්ස් ලිසින්ග් ඇන්ඩ් ෆිලිට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම	374
	3.74	පිපල්ස් ලිසින්ග් ප්‍රොපර්ටි ඩිව්ලොප්මන්ට් පුද්ගලික සමාගම	376
	3.75	පිපල්ස් මයික්‍රෝ කොමර්ස් පුද්ගලික සමාගම	377
	3.76	පිපල්ස් මයික්‍රෝ කොමර්ස් පුද්ගලික සමාගම	378
	3.77	කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම	384
	3.78	ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්	390
	3.79	ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම	392
	3.80	සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගම	397
	3.81	සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම	401
	3.82	ලංකා සෝල්ට් ලිමිටඩ්	410
	3.83	ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම	413

	3.84	පරන්තන් කෙමිකල්ස් සමාගම	415
	3.85	බී.සී.සී. සමාගම	418
	3.86	ශ්‍රී ලංකා බයෝටෙක්නොලොජි ආයතනය	421
	3.87	ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය	422
	3.88	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය	427
	3.89	නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම	429
	3.90	ලංකා සතොස ලිමිටඩ්	431
	3.91	ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම	439
	3.92	සී.ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම	442
	3.93	සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම	447
	3.94	සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	452
	3.95	සී/ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම	458
	3.96	ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම	464
	3.97	ශ්‍රී ලංකා වරාය කළමණාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම	473
	3.98	ශ්‍රී ලංකන් කේටරින් සමාගම	480

1. විධායක සාරාංශය

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවා ඇති, සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් 51% ක් හෝ එයට වැඩි ප්‍රමාණයක්, රජය හෝ රාජ්‍ය අංශයේ ආයතන එකක් හෝ කිහිපයක් හෝ සතු සමාගම් රාජ්‍ය සමාගම් ලෙස හැඳින් වේ.
මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

රාජ්‍ය සමාගම් වල පරිපාලනය සිදු කරනු ලබන්නේ අධ්‍යයක්ෂක මණ්ඩලයක් මගින් වන අතර, අදාළ සමාගමේ ව්‍යාපාර කටයුතු වල ස්වභාවය අනුව ඊට අදාළ සුදුසුකම් සහිත අධ්‍යයක්ෂක මණ්ඩලයක් පත් කර ගැනීම එම ව්‍යාපාරයේ දියුණුවට හේතු වේ.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම් වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද, ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතට අනුව, රාජ්‍ය සමාගම් විසින් මුදල් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය.

එම අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛණ සහ තොරතුරු විගණකාධිපති වරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත එම සමාගමේ වාර්ෂික වාර්තාවේ පල කිරීම සඳහා, එම රාජ්‍ය සමාගමේ පාලක මණ්ඩලයේ සභාපති වරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි.

රාජ්‍ය ව්‍යවසායයන්හි ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වරින් වර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ඉදිරිපත් කර ඇති අතර එහි යම් යම් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සමාගම් මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගතයුතු නමුත් එවැනි එකඟතාවයන් ලබාගැනිමකින් තොරව තීරණ ක්‍රියාත්මක කර ඇති අවස්ථා නිරීක්ෂණය විය.

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය සමාගම් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය සමාගම් හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අභිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අභිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාවනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

රාජ්‍ය සමාගම් වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා රාජ්‍ය සමාගම් 98කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	36	35	33
තත්ත්වාගණනය කල	47	44	39
හිතකර	1	1	0
ව්‍යාවනය	5	3	0
මතය නවමත් තීරණය කර නොමැති ගණන	0	0	0
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	9	15	26

	නම	2021	2022	2023
1.	ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
2.	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
3.	ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
4.	ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
5.	ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
6.	ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පෞද්ගලික සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
7.	සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
8.	කුරුණෑගල වැවිලි සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
9.	හලාවත වැවිලි සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
10.	සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන	-	-	-

	හා අපනයන සංස්ථාව			
11.	ඇල්කඩුව වැවිලි සමාගම	තත්ත්වාගණනය කළ	-	-
12.	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	ව්‍යාවනය කළ	-	-
13.	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කළ	-	-
14.	සී/ස මගනැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
15.	සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
16.	සී/ස ලංකා පොහොර සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
17.	මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
18.	සී/ස සී-නෝර් පදනම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
19.	මිල්කෝ පුද්ගලික සමාගම	ව්‍යාවනය කළ	-	-
20.	ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කළ	-	-
21.	සී/ස නෝර්ත් සී ලිමිටඩ්	-	-	-
22.	සෙලන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
23.	සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
24.	මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
25.	මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
26.	සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	-
27.	සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනය	-	-	-
28.	සී/ස කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ(පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

29.	සී/ස දැදුරුඔය කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
30.	ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
31.	කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ්	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
32.	වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
33.	වෝටර්ස් එජ් ලිමිටඩ්	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	-
34.	සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
35.	සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
36.	හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
37.	කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
38.	සී/ස පැලියගොඩ වෙයාහවුස් කම්ප්ලෙක්ස් සමාගම	-	-	-
39.	සීමා සහිත ලංකා රෙස්ට්හවුස් සමාගම	ව්‍යාවනය කළ	-	-
40.	ජී එස් එම් බී තාක්ෂණ සේවා (පුද්) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
41.	සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ	-	-	-
42.	සීමාසහිත නාගරික ආයෝජන හා සංවර්ධන(පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
43.	ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
44.	සී/ස එල්ආර්ඩීසි සේවා (පෞද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
45.	ලංකා මිනරල් සෑන්ඩ් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
46.	ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම	-	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
47.	ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම	-	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

48.	ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
49.	කහටගහ ග්‍රැපයිට් ලංකා සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
50.	ලංකා පොස්පේට් ලිමිටඩ්	හිතකර	හිතකර	තත්ත්වාගණනය කළ
51.	වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	-
52.	සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	-
53.	ලංකා සතොස ලිමිටඩ්	ව්‍යාවනය කළ	ව්‍යාවනය කළ	-
54.	සී/ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	-	-
55.	සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම	තත්ත්වාගණනය කළ	-	-
56.	ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
57.	දුරස්ථ ඉගෙනුම් ආයතනය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
58.	සී/ස කන්තලේ සීනි කර්මාන්තායතනය	-	-	-
59.	ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්.) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	-
60.	ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
61.	සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
62.	කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම	-	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
63.	ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	ව්‍යාවනය කල	තත්ත්වාගණනය කළ
64.	ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
65.	ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
66.	සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

67.	බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විස් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
68.	ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය බීඕසී ප්‍රොපර්ටි ඩිවිලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
69.	බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
70.	පිපල්ස් ලිසීන්ග් ඇන්ඩ් ෆයිනෑන්ස් පිඑල්සී	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
71.	පිපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
72.	පිපල්ස් ඉන්ෂුරන්ස් පිඑල්සී	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
73.	පිපල්ස් ලිසීන්ග් ඇන්ඩ් ෆිලිට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
74.	පිපල්ස් ලිසීන්ග් ප්‍රොපර්ටි ඩිවිලොප්මන්ට් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
75.	පිපල්ස් මයික්‍රෝ කොමර්ස් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
76.	පිපල්ස් මයික්‍රෝ කොමර්ස් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
77.	කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
78.	ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
79.	ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල
80.	සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
81.	සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
82.	ලංකා සෝල්ට් ලිමිටඩ්	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
83.	ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
84.	පරන්තන් කෙමිකල්ස් සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල

85.	බී.සී.සී. සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය කල	-
86.	ශ්‍රී ලංකා බයෝටෙක්නොලොජි ආයතනය	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
87.	ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය කල	තත්ත්වාගණනය කල
88.	ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල
89.	නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල
90.	ලංකා සතොස ලිමිටඩ්	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	-
91.	ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
92.	සී.ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	-	-
93.	සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම	ව්‍යාවනය කළ	ව්‍යාවනය කළ	-
94.	සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
95.	සී/ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
96.	ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
97.	ශ්‍රී ලංකා වරාය කළමණාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
98.	ශ්‍රී ලංකන් කේටරින් සමාගම	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල	තත්ත්වාගණනය නොකල

3. රාජ්‍ය සමාගම් වල ස්වාධීන නිරීක්ෂණ

3.1 ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	126,844,428,699	85,530,106,999	41,314,321,700	(960,886,767)	තත්ත්වාගණනය නොකළ
2022	179,529,787,309	134,272,632,397	45,257,154,912	6,433,025,990	තත්ත්වාගණනය කළ
2023	191,542,424,482	123,931,232,976	67,611,191,506	33,639,078,59	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, දැනට රජයට අයත් ගුවන් තොටුපළේ ඉඩම් සහ ගොඩනැඟිලි හා සමාගම සතු චංචල සහ නිශ්චල වත්කම් තක්සේරු කරන ලෙසත්, එවකට ශ්‍රී ලංකා රජය විසින් සේවාකරණය කරන ලද ගුවන් තොටුපළ සංවර්ධනයට අදාළ වගකීම් භාර ගැනීමටත් සහ ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමටත් නියෝග කර තිබුණි. කෙසේ වුවද, සමාගම ඊට අදාළ ඉදිරි කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණි.	2021, 2022, 2023	අමාත්‍ය මණ්ඩල අනුමැතියට අදාළ ඉදිරි පියවර ගතයුතු වීම.	2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත මගින් බල ගැන්වෙන ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස සියලුම නිශ්චල වත්කම් පරිහරණය කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලිඛිතව අනුමැතිය ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත	ඉදිරි කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණි.

(ආ)	2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති ගුවන් තොටුපළවල් (කටුනායක සහ රත්මලාන ගුවන් තොටුපළ) සහ තුන්වන උපලේඛනයේ දක්වා ඇති ගුවන් යානා පහසුකම් හත සහ ඊට අදාළ ඉඩම් (එහි ඇති ගොඩනැඟිලි සහ ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම) ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට (CAASL) පවරා තිබුණු අතර නිසි එකගතාවයකින් තොරව සමාගම ගුවන් තොටුපළවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 60,141 ක මුදලක් (දේපළ, පිරියත හා උපකරණ සහ කෙරී ගෙන යන වැඩවල ධාරණ වටිනාකම) ආයෝජනය කර තිබුණි.	2022, 2023	අදාළ අධිකාරියේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණක් ආයෝජනය කළ යුතු වීම.	2023.06.21 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපති වන රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉඩම් වල අයිතිය අධිකාරිය සතු වුවද එකම ක්‍රියාකරු වන සමාගමට එහි යෝජනා කරගෙන යාමට බාධාවක් නොමැති බව දන්වන ලදී.	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ එකගතාවයක්/ අනුමැතියක් මෙතෙක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	කාර්යාල පරිශ්‍ර, ගබඩා පහසුකම් සහ කාර්ය මණ්ඩල නවාතැන් ඉදිකිරීම සඳහා සමාගමට ලැබී තිබුණු කඳපොළ පිහිටි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට හෝ	2023	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමටත් සැලසුම් කර ඇති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටත් කටයුතු කළ යුතු	Covid-19 වසංගතය හේතුවෙන් ඇති වූ මූල්‍ය අර්බුදයත් සමඟ මෙම ව්‍යාපෘතිය අත්හිටුවා ඇත.	මෙම ව්‍යාපෘතියේ කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

	සැලසුම් කර ඇති ඉදිකිරීම් ආරම්භ කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.		වීම.		
(ඇ)	**<u>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ (BIADP) අදියර II පියවර 2 (පැකේජය - A)</u>**				
(i)	2007 දෙසැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මගී ධාරිතාව මිලියන 6ක් වූ ඉහත ව්‍යාපෘතියේ සැලසුම් සහ පසු සැලසුම් පිළිබඳ උපදේශන සේවා ලබා ගැනීම සඳහා සමාගම් දෙකක් තෝරාගෙන තිබුණි. ඒ සඳහා 2009 සිට 2012 දක්වා වසර 04 ක් ගත කර තිබුණු අතර සමාගමේ මුදලින් රු.මිලියන 344.5ක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2013 වර්ෂයේදී මගී ධාරිතාව මිලියන 09 දක්වා වැඩි කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රතිනිර්මාණය කිරීමට තීරණය කිරීම මත ඉහත මුදල අනාර්ථික වී තිබුණු අතර ඒ සඳහා 2014 සිට 2016 දක්වා වසර 03ක් ගත කර තිබුණි.	2021, 2022, 2023	ගුවන් සේවා සංවර්ධන සැලැස්ම සහ ගුවන් තොටුපළ සඳහා ප්‍රධාන සැලැස්ම කඩිනමින් සකස් කළ යුතු වීම හා ගිවිසුම්වලට එළඹීමට පෙර ඉදිකිරීම්වල විෂය පථය සහ සැලසුම් පැහැදිලිව හඳුනාගත යුතු වීම.	දැනටමත් සැලසුම් කර ඇති වසරකට මගීන් මිලියන 6 ට අමතරව වසරකට අමතර මගීන් මිලියන 3 කින් BIA හි මගී හැසිරවීමේ ධාරිතාව තවදුරටත් ඉහළ නැංවීමට යෝජනා කරන ලදී.	අනාර්ථික පිරිවැය අවම කිරීම සම්බන්ධයෙන් සමාගම මෙතෙක් අවධානය යොමු කර නොතිබුණු අතර ව්‍යපෘතියේ කටයුතු තව දුරටත් විශාල ප්‍රමාදයකින් යුතුව සිදු වෙමින් පැවතුණි
(ii)	ව්‍යාපෘතිය සඳහා ජපන් යෙන් මිලියන 74,397 ක් සැපයීම වෙනුවෙන් සමාගම, ඒජන්සිය සමඟ	2021	කොන්ත්‍රාත් ගිවිසුමට අනුව A පැකේජයේ ඉදිකිරීම් කටයුතු	කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම නිසා, කොන්ත්‍රාත්කරුගේ විදේශ කාර්ය	අනාර්ථික පිරිවැය අවම කිරීම සම්බන්ධයෙන්

	2012 සහ 2016 වර්ෂයන්හිදී ගිවිසුම් දෙකකට එළඹ තිබුණු අතර එදින සිට වසර 8 කට පසු ඉන් සියයට 82 ක් 2020 මාර්තු 04 දින ප්‍රදානය කර තිබුණි. ඒ අනුව, 2013 අප්‍රේල් 20 දින සිට 2022 අප්‍රේල් 20 දින දක්වා අරමුදල් ඌන ලෙස භාවිතා කිරීම හේතුවෙන් බැඳීම් ගාස්තු (commitment charges) ලෙස සමාගම විසින් ඒජන්සිය වෙත ජපන් යෙන් මිලියන 250.5 කට සමාන රු.මිලියන 359.5 ක්, ගෙවා තිබුණි. නව පර්යන්ත ගොඩනැගිල්ලේ වහළ සැලසුම ප්‍රතිපත්තිමය තීරණ මගින් කිහිප වතාවක් වෙනස් කිරීම ප්‍රමාද යට හේතු වී තිබුණි.		අවසන් කිරීමට ක්‍රියා කළ යුතු අතර තවදුරටත් ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ඉදිකිරීම් ප්‍රගතිය වරින් වර සමාලෝචනය කළ යුතු වීම.	මණ්ඩලය ගෙන්වා ගැනීමේ ප්‍රමාදයක් ඇති විය. අවසානයේදී කොන්ත්‍රාත් කටයුතු 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කෙරුණි. තවද 2021 පෙබරවාරි 14 දිනට මෙම ව්‍යාපෘතියේ සැලසුම් කළ ප්‍රගතිය 0.03% ට එරෙහිව සත්‍ය ප්‍රගතිය 0.06% විය .2021 අප්‍රේල් 20 දිනට බැඳීම් ගාස්තු ලෙස ජපන් යෙන් මිලියන 235 ක් අංක.SLP 104 ණය ගිවිසුම යටතේ ප්‍රමාද වීමේ අවසාන ගාස්තු ලෙස ජපන් යෙන් මිලියන 90.86ක් SLP 114 යටතේ ද ගෙවා තිබුණි.	සමාගම මෙතෙක් අවධානය යොමු කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු තව දුරටත් විශාල ප්‍රමාදයකින් යුතුව සිදු වෙමින් පැවතුණි.
(iii)	කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2022 ජුනි 30 දිනට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සියයට 30ක් විය යුතු වුවද එදිනට තත්‍ය ප්‍රගතිය සියයට 5.38 ක් පමණක් විය. පසුව 2022 අප්‍රේල් 12 දින මුදල් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය හේතුවෙන්, ණය පහසුකම අත්හිටුවන ලද කාල සීමාව තුල දැරූ	2021, 2022, 2023	ඉහල මට්ටමේ සාකච්ඡා ආරම්භ කරමින් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනමින් පියවර ගත යුතු වීම	2020 දෙසැම්බර් 15 වැනි දිනට පෙර කොන්ත්‍රාත්කරු වෙත වැඩ ආරම්භ කිරීමට උපදෙස් ලබා දුන්නද, එම ස්ථානයේ අඛණ්ඩ ඉදිකිරීම් කටයුතු සඳහා වසංගත තත්ත්වය පිළිබඳ සහතිකයක් නොමැතිවීම යනාදී හේතු නිසා කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීම 2020 දෙසැම්බර් 15 දක්වා ප්‍රමාද විය. පවතින රක්ෂණය දිගටම කරගෙනයාම,	අනාර්ථික පිරිවැය අවම කිරීම සම්බන්ධයෙන් සමාගම මෙතෙක් අවධානය යොමු කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ කටයුතු තව දුරටත් විශාල ප්‍රමාදයකින් යුතුව සිදු වෙමින් පැවතුණි.

	රු.මිලියන 184 ක බැඳීම් ගාස්තු සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් අනාර්ථික වී තිබුණි. තවද, හිමිකම අවසන් කිරීම දක්වා කොන්ත්‍රාත්කරුගේ මාසික වියදම් සහ 2022 දෙසැම්බර් 9 සිට 2024 මාර්තු 31 දක්වා ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.මිලියන 1596 කට සමාන ජපන් යෙන් මිලියන 593 ක අතුරු ගෙවීමක් සමාගම විසින් කර තිබුණු අතර ඇ.ඩො. මිලියන 40 කට ආසන්න ප්‍රතිපාදනයක් කිරීමට උපදේශකයන් විසින් ඇස්තමේන්තු කර තිබුණි.			ඊළඟ කොන්ත්‍රාත්කරු සමඟ අනුකූලවීමට සහ උපදේශක සමඟරවිට ඊළඟ ජපන් ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත පිළිගැනීම යනාදී අවශ්‍යතා මත අවසන් කරන ලද BIA සංවර්ධන II වන අදියරේ 2 වන පියවර පැකේජය A ව්‍යාපෘතියේ අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද වාූහයන් සම්පූර්ණ කිරීම සහ ආරක්ෂා කිරීම කළ යුතුව තිබුණි.	
(iv)	තවද, රු.මිලියන 1,660 ක් වටිනාකමැති අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද ද්‍රව්‍ය හා උපකරණ විදේශීය ස්ථානවල පැවති අතර ඒවා අතුරින් ඉදිරි ඉදි කිරීම් කටයුතු සඳහා භාවිතා කළහැකි ද්‍රව්‍ය පමණක් මෙරටට ගෙන ඒමටත් ,අනෙකුත් උපකරණ හා ද්‍රව්‍ය විදේශීය ස්ථානවලදී බැහැර කිරීමටත් තීරණය කර තිබුණි.	2023	ඉහළ මට්ටමේ සාකච්ඡා ආරම්භ කරමින් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම.	පිළිතුරු ලබා දී නැත	අනාර්ථික පිරිවැය අවම කිරීම සම්බන්ධයෙන් සමාගම මෙතෙක් අවධානය යොමු කර නොතිබුණු අතර ව්‍යපෘතියේ කටයුතු තව දුරටත් විශාල ප්‍රමාදයකින් යුතුව සිදු වෙමින් පැවතුණි.
(ඉ)	2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් ගුවන් යානා ස්ථාපනය කිරීම	2021, 2022	ප්‍රධාන සැලැස්ම සකස් කර සිවිල් ගුවන් සේවා පනතේ සඳහන් පරිදි අනුමැතිය ලබා ගැනීමට	මේ සඳහා තෝරාගත් ලංසුකරු අවසානයේ සාකච්ඡා කළ සහ එකඟ වූ කොන්දේසි වෙනස් කිරීමට සහ සංශෝධනය කිරීමට	ප්‍රධාන සැලැස්ම මෙතෙක් අනුමත කරවා ගෙන නොතිබුණි.

	හෝ පුළුල් කිරීම පිළිබඳ ප්‍රධාන සැලැස්ම සකස් කර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතු වීම.	අදහස් කළේය. එබැවින් රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව ඒ සඳහා නව යෝජනා ඉල්ලීමක් (RFP) කැඳවීමට තීරණය කර ඇත.	
(ඊ)	සමාගමේ පද්ධති සහ ක්‍රියාවලීන්වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධති මොඩියුලයක් ක්‍රියාත්මක කිරීමට 2019 අගෝස්තු 15 දින මූලික පිරිවැය ඇ.ඩොලර් 530,571 (වැට් බදු හැර) සහ රු. 38,900,544 (වැට් බදු හැර) ක් සඳහා අත්සන් කර තිබූ ගිවිසුමට අනුව, 2020 නොවැම්බර් 15 දින කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කල යුතු විය. කෙසේ වෙතත්, 2023 මාර්තු 25 වැනි දින වනවිට ගිවිසුම් අත්සන් කර වසර 3 යි මාස 3ක් ගත වී තිබුණද, අවසන් පිළිගැනීමේ සහතිකය නිකුත් කරමින් ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධති මොඩියුල සම්පූර්ණ කර නොතිබුණි. එදිනට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති ගෙවීම් USD 427,109 ක් සහ රු.14,704,405 ක් (VAT සමඟ) විය.	2022	සැලසුම් කළ පරිදි සහ විශාල ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය අවසන් කළ යුතු වීම.	පහත හේතු නිසා ව්‍යාපෘතිය ප්‍රමාද විය. i. මෙහෙයුම් කමිටුව සමඟ සාකච්ඡා නොකොට මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වැරදි පරතර (GAP) ලේඛනය ii. COVID iii. GI-සජීවීයට පසු ගැටළු නිරාකරණය	පද්ධති මොඩියුල මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි.

(උ)	ආරම්භයේ සිටම මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (MRIA) වර්ග අඩි 3293 ක් සහිත ස්ථාන හතරක් මඟින් කුලී ආදායම් උපයා ගැනීමට සමාගම ක්‍රියා කර නොතිබුණි.	2023	පවතින අවස්ථා තක්සේරු කිරීමට සහ නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කළ යුතු අතර ඒ අනුව කටයුතු කළ යුතු වීම.	තීරුබදු දීමනා සඳහා හිමිකම් ඇති මගී කොටස් දැනට MRIA වෙත නොපැමිණෙන අතර ඒ අනුව; තීරුබදු රහිතව ක්‍රියාත්මක කිරීම වාණිජමය වශයෙන් ශක්‍ය නොවන බව දන්වා ඇත.	කුලී ආදායම් උපයා ගැනීමට සමාගම මෙතෙක් ක්‍රියා කර නොතිබුණි.
(ඌ)	කොන්ත්‍රාත්කරු විසින් මත්තල වැඩ බිමේ ඉතිරිව ඇති කොන්ත්‍රාත් උපකරණ, අතිරික්ත ද්‍රව්‍ය, සුන්බුන්, ඉවත දමන ද්‍රව්‍ය සහ තාවකාලික වැඩ, වැඩබිමෙන් ඉවත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතු වීම.	කොන්ත්‍රාත්කරුවන්ගේ අංගනයේ ගොඩගසා ඇති මෙම ද්‍රව්‍යවලින් සමහරක් කොන්ත්‍රාත්කරුගේ අනුමැතිය ඇතිව නඩත්තු කටයුතු සඳහා AASL විසින් භාවිතා කර ඇති අතර දැනට MRIA හි ඉදිරි නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ ඉතිරි ද්‍රව්‍ය ලබා ගැනීමට කොන්ත්‍රාත්කරු සමඟ කටයුතු කරමින් සිටී.	වැඩ බිමේ ඉතිරිව ඇති කොන්ත්‍රාත් ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට කටයුතු කර නොතිබූණු අතර ඒවා විනාශ වෙමින් පැවතුණි.
(එ)	**මත්තල නඩත්තු, අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණය (MRO)**				
(i)	2013 සැප්තැම්බර් 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මුළු වියදම ඇ. ඩොලර් 122,030,389 ක අතිරේක කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් සීමාසහිත චයිනා හාබර් ඉංජිනියරින් සමාගම (CHEC) සමඟ 2013 සැප්තැම්බර් 06 දින	2023	වලංගු ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු වීම.	සමාගම විසින් ඉහත පහසුකම ඉල්ලා සිටියද, චීනයේ EXIM බැංකුව එය ප්‍රතික්ෂේප කරන ලදී.	ගිවිසුම වලංගුව නොතිබිය දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සම්බන්ධව කිසිදු විමර්ශනයක් මෙතෙක් සිදු කර නොතිබුණි.

						මත්තල සඳහා අත්සන් කරන ලද ප්‍රධාන ගිවිසුම සඳහා පරිපූරක ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමේ අංක 01 වගන්තියට අනුව, ඉහත වැඩවලට අදාළව මහජන චීන සමූහාණ්ඩුව ණය අරමුදල් පහසුකම ලබා නොදීම හේතුවෙන් ගිවිසුමේ පාර්ශ්වයන් ඉන් බැඳී නොතිබුණද, සමාගමේ සභාපතිවරයා විසින් ලබා දී තිබූ ආරම්භක නියෝගය අනුව ගිවිසුම වලංගුව නොතිබියදී, CHEC විසින් මගී පර්යන්ත ගොඩනැගිල්ලේ (PTB) නව ගේට්ටු විවේකාගාරයක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. CHEC විසින් ඉදිරිපත් කර තිබූ රු. 565,491,077 ක බිල්පත සඳහා සමාගම විසින් ඉන්ජිනේරු සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණු අතර බොහෝ සැලසුම් වර්තමානය සඳහා සුදුසු නොවීම ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කර නොතිබීම හේතුවෙන් ඉහත කී මුදලින් රු.187,603,537 ක් (ඇ.ඩො.547,524) අනාර්ථික වී තිබුණි.
(ii)	MRO වැට බදු ගෙවීම් සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරු අංශය නිර්දේශ ඉදිරිපත්	2023	විෂය ඉංජිනේරුවරයා විසින් කරන ලද නිර්දේශ	චීන බැංකුවෙන් නොලැබීම සලකා	EXIM අරමුදල් හේතුවෙන් පරිපූරක	ගිනි ජාලයේ (Fire network) කාන්දුවීම ගිවිසුම මෙතෙක්

	කිරීමේදී මත්තල ගුවන්තොටුපලේ ගිනි ජාලයේ (Fire network) කාන්දුවීමක් ඇති බවත් එය නිවැරදි කරන තෙක් වැටි බදු ගෙවීම නිර්දේශ කළ නොහැකි බවත්, එසේ නොවේ නම් එය නිවැරදි කිරීම සඳහා රු. මිලියන 800 ක් වැය කිරීමට සිදුවනු බවත් දන්වා තිබුණි. කෙසේ වෙතත්, 2013 අගෝස්තු 28 දිනැති අමාත්ය මණ්ඩල තීරණයට අනුව,2008 අංක 14 දරන උපායමාර්ගික සංවර්ධන ව්යාපෘති පනතේ 3 (4) වගන්තිය ප්රකාරව, ඉහත ව්යාපෘතිය බද්දෙන් නිදහස් කර ගැනීමකින් තොරව 2023 ජූලි 28 වන රු. 79,386,492 ක වැටි බදු ගෙවා තිබුණි.		බලා ගෙවීම් කළ යුතු වීම.	බලාත්මක නොවූ බැවින් මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතිය SDP ලෙස ගැසට් කර නොතිබූ අතර ඒ අනුව බදු නිදහස් කිරීම් ලබා දී නොතිබුණි.	නිවැරදි කර නොතිබුණි.
(iii)	2016 වර්ෂයේදී MRO ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් කළ බිල්පත් ගෙවීමට අදාල තීරණය 2022 හා 2023 වර්ෂවලදී ලබා ගැනීම හේතුවෙන් එදිනට ඇ.ඩො.146.03 ක්ව පැවති විදේශ විනිමය අනුපාතය ඇ.ඩො.360 ක් දක්වා වැඩි වී තිබුණි. එබැවින් සමාගමට රු.මිලියන 324.5 ක පාඩුවක් දැරීමට සිදු වී තිබුණි.	2023	විදේශ මුදල් ගෙවීම් නියමිත වේලාවට සිදු කිරීම මඟින් අනවශ්‍ය විනිමය පාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	බිල්පත් පියවූයේ ඇ.ඩො.ලර් වන බැවින් කාල පරතරය නිසා ගෙවන ඇ.ඩො. විනිමය පාඩුව යනු පොතක් ඇතුළත් කිරීමක් පමණි.	ප්‍රමාදය හේතුවෙන් දැරීමට සිදු වූ පාඩුව සම්බන්ධව කිසිදු විමර්ශනයක් මෙතෙක් සිදු කර නොතිබුණි.

(ඒ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 5.1 ක වටිනාකමකින් යුත් ඇන්ටෙනා, මල්ටිකප්ලර් සඳහා වන අකුණු සහ සර්ජ් ආරක්ෂණ පද්ධතියක් ඇතුළත් කර තිබුණද, ඉහත උපකරණ භෞතිකව වැඩබිමේ නොතිබුණි.	2023	වත්කම් තිබේද නැද්ද යන්න හඳුනා ගැනීමට භෞතික පැවැත්ම තහවුරු කර ගත යුතු වීම හා එසේ නොමැති නම් නිසි අනුමැතිය ලබාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වීම	මෙම ඉඩම සහ ගොඩනැගිලි ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවරා ගන්නා ලද අතර විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කරමින්, ERP පද්ධතියේ වත්කම් ලේඛනයෙන් මෙම අයිතමය ඉවත් කිරීම නිර්දේශ කරනු ලැබේ.	ඉතිරි භූගත කොටස් වත්කම් ලේඛනයෙන් මෙතෙක් ඉවත් කර නොතිබුණි
(ඔ)	අංක PED 04/2023 හා 2023 දෙසැම්බර් 11 දිනැති චක්‍රලේඛයේ 2.1 වගන්තියට හා සමාගම විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර සංදේශයේ 4 වන වගන්තියට අනුව, සමාගම විසින් ගෙවා තිබූ රු.50,000 ක් වූ අතිරේක ප්‍රසාද දීමනාව, වසර අවසානයේ ගෙවන ලද රු.125,000 ක වාර්ෂික ප්‍රසාද දීමනාවෙන් අඩු කළ යුතු වුවද, සමාගම විසින් එම අතුරු දීමනාව වාර්ෂික ප්‍රසාද දීමනාවෙන් හෝ වැටුපෙන් මෙතෙක් අඩු කර නොතිබුණි.	2023	චක්‍රලේඛ උපදෙස් අනුව සේවකයන්ට ගෙවන ලද අතුරු දීමනා අයකරගත යුතු වීම.	2024 ජනවාරි මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම මුදල 2024 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි මාසික වාරික වශයෙන් අඩු කළ ද, රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව කළමනාකරණය විසින් 2024 අප්‍රේල් වාරිකය තාවකාලිකව අත්හිටුවන ලදී.	ප්‍රසාද අත්තිකාරම් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.
(ඕ)	2015 මැයි 25 දිනැති අංක PED 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 හා 3.1 වගන්ති හා 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015(ii) දරන චක්‍රලේඛ විධිවිධානවලට	2022, 2023	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු වීම හා අමතර ඉන්ධන ගෙවීම්වලට, මුදල් අමාත්‍යාංශයේ	AASL හි ස්වභාවය සහ නිශ්චිත ව්‍යාපාරික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම කාරණය සවිස්තරාත්මකව පරීක්ෂා කරනු ලැබේ.	චක්‍රලේඛ විධිවිධාන ඉක්මවා ගෙවා තිබුණු දීමනා සඳහා මෙතෙක් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

	පටහැනිව මාසික ඉන්ධන දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 336 දෙනෙකු සඳහා රු.මිලියන 84 ක වටිනාකමැති ඉන්ධන ලීටර් 235,865 ක් ලබා දී තිබුණි. එසේම,චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ අංශ ප්‍රධානීන් 19 ක් සඳහා රු. මිලියන 3.6 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 10,142 ක් ද ලබා දී තිබුණි.		අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.		
(ක)	මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන PFD චක්‍රලේඛයේ 2.6 ඡේදය (වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය සඳහා e-GP ද්වාරය භාවිතා කිරීම) ප්‍රකාරව, සමාගම විසින් වෙළඳපල මිල සැදැහුම් ක්‍රියාපටිපාටිය යටතේ සැලසුම් කර ඇති සියලුම ප්‍රසම්පාදන සඳහා මෙතෙක් e-GP පද්ධතිය හරහා සකස් කර නොතිබුණි.	2022, 2023	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතු වීම.	ERP භාවිතා කරන රජය සතු සමාගම් සඳහා ,පවතින ERP පද්ධතියට ඒකාබද්ධ වෙමින් e-GP ක්‍රියාත්මක කිරීමේ හැකියාව සාකච්ඡා කිරීමට විශේෂ රැස්වීමක් සංවිධානය කිරීමට භාණ්ඩාගාරය එකඟ විය.	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලවීමක් මෙතෙක් සිදු වී නොමැත.
(ග)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රජය සතු ව්‍යාපාර සඳහා වූ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.2.2 (ආ)V වගන්තිය ප්‍රකාරව	2023	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතු වීම.	සමාගමෙහි AoA විසින් හඳුනාගෙන ඇති විධායක අධ්‍යක්ෂ තනතුර ඒ සඳහා සලකා බැලිය හැකි අතර එය ආයතනික පාලනය පිළිබඳ	ප්‍රධාන විධායක නිලධාරී (CEO) තනතුරක් මෙතෙක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් ඊට

	සමාගම සඳහා ප්‍රධාන විධායක නිලධාරියෙකු මෙතෙක් පත් කර නොතිබුණි .මේ නිසා,සමාගමේ වැටුප් ව්‍යුහයේ ඉහළ වැටුප් පරිමාණය ප්‍රධාන විධායක නිලධාරියා සඳහා වෙන් කළ යුතු වුවද, ඉහළ වැටුප් පරිමාණය අංශ ප්‍රධානීන් සඳහා වෙන් කර තිබුණි .			මාර්ගෝපදේශවල දක්වා ඇති පරිදි ප්‍රධාන විධායක තනතුරට සමාන වන බැවින් ප්‍රධාන විධායක තනතුරක් හඳුන්වා දීම සඳහා AoA සංශෝධනය කිරීම අවශ්‍ය නොවේ.	අදාල වැටුප් පරිමාණය අංශ ප්‍රධානීන් සඳහා වෙන් කර තිබුණි.
(ජ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත) 3.2 (i) වගන්තිය ප්‍රකාරව, සමාගමේ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. පසුව, සම්පූර්ණ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය අනුමත කිරීමකින් තොරව 2024 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වැටුප් ව්‍යුහය හා දීමනා අනුමත කරවා ගෙන තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු. මිලියන 213 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා ගෙවා තිබූ විවිධ දීමනා වර්ග 10 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හැර කළමනාකරණ සේවා	2022, 2023	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වීම	මානව සම්පත් සහ වේතන කමිටුව සියලු SORP, සමාලෝචනය කරමින් පවතී.	බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය මෙතෙක් අනුමත කරවා ගෙන නොතිබුණි.

	දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.				
(ට)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත) 3.4 වගන්තිය ප්‍රකාරව,සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට රැකියා විස්තරය සහ බඳවා ගැනීමේ ක්‍රමය ඇතුළත් කර නොතිබුණි.	2022, 2023	චක්‍රලේඛ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම	සියලුම කෙටුම්පත් SORP ආකෘති එකී සංයුතිය සමඟ සකස් කර ඇති අතර පත්කළ කමිටුවේදී සාකච්ඡා කර අවසන් කරනු ඇත.	චක්‍රලේඛට අනුකූලව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සකස් කර නොතිබුණි.
(ඩ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොත) 5.3 වගන්තිය ප්‍රකාරව,2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති බුන්වත් පරීක්ෂාව මත සෑහීමකට පත් වීමෙන්, බදු ගෙවීමෙන් පසු ලාභයෙන් අවම වශයෙන් සියයට තිහක් (30) ඒකාබද්ධ අරමුදල බෙදා හැරිය යුතු වුවද, 2023 වර්ෂයට අදාලව බෙදාහැර තිබුණේ රු. මිලියන 5,000 ක් පමණි. තවද, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු ලාභය	2022, 2023	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතු වීම.	සියලුම ගුවන් තොටුපලවල සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රවාහ අවශ්‍යතා සහ අදාළ වර්ෂය සඳහා දැනටමත් අනුමත ප්‍රාග්ධන සහ මෙහෙයුම් අයවැය සලකා බැලීමෙන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත පදනම්ව මණ්ඩලය විසින් ලාභාංශ අනුමත කරන ලදී.	චක්‍රලේඛ ප්‍රකාරව ඉතිරි මුදල් මෙතෙක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර නොතිබුණි.

	රු.මිලියන 4,802 ක් වාර්තා කර තිබුණු අතර ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණේ රු. මිලියන 1000ක් පමණි.				
(න)	බැංකු සැසඳුම් ප්‍රකාශයේ උපලබ්ධි නොවූ තැන්පතුවක් ලෙස පෙන්වා ඇති රු.මිලියන 14.8 ක මුදලින්, ගුවන් තොටුපළ කළමනාකරණ අංශයේ කළමනාකරණ සහකාරවරයෙකු විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කර එකතු කරන ලද මුදලින් කරන ලද මූල්‍ය වංචාව නියෝජනය කරනු ලබන අතර 2023 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම මුදල පියවා නොතිබුණි.	2022, 2023	මුදල් වංචාවට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු අතර අධිකරණ නඩුව අවසන් කිරීමෙන් පසු අවශ්‍ය ගැලපීම් කළ යුතු වීම	විමර්ශන සහ අධිකරණ නඩුව විභාග වෙමින් පවතින බැවින් වාර්තා සකස් කිරීමට කටයුතු කර නොමැත. තවද, එම නිළධාරියා විසින් රු.මිලියන 6.6 ක් තැන්පත් කිරීම නිසා ශුද්ධ උපලබ්ධි නොවූ තැන්පතුව රු.මිලියන 8.2 කි.	මෙම මුදල මෙතෙක් පියවා නොතිබුණි.
(ප)	2023 වර්ෂයේ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (MRIA) මෙහෙයුම් පාඩුව රු.මිලියන 2,124.1 ක් වූ අතර අපේක්ෂිත වාර්ෂික මඟී ධාරිතාව මිලියනයක් පමණ වුවද පසු ගිය වසර 06 තුල මුළු මඟී සංචලනය 190,750 ක් පමණක් විය. එබැවින් ගුවන්තොටුපල ඉදි කිරීම සඳහා වැය කර තිබූ රු. මිලියන 36,564 ක මුදල ඵලදායි ලෙස භාවිතා කර නොතිබුණි. තවද ඉහත ඉදි කිරීම සඳහා මුලින් ලබා ගත්		මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සැලසුම් කර ඇති පරිදි වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සහ ලාභදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට සහ වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතු වීම.	මේ වන විට රජයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. MRIA සඳහා RFP කැඳවා ඇති අතර MRIA හි කළමනාකාරිත්වය වසර 30 ක කාලයක් සඳහා ඉන්දියානු සහ රුසියානු අනුබද්ධ සමාගමකට පැවරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත.	ගුවන් තොටුපළ වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

	ඩො.මිලියන 190 ක විදේශ ණය සඳහා වාර්ෂික ණය පොලී ලෙස සමාගම විසින් රු. මිලියන 1590 ක මුදලක් ගෙවා තිබුණි.				
(ඛ)	**යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි කාර්යසාධනය (JIA)**				
(i)	සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති පරිදි, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව වහාම ක්‍රියාත්මක වන පරිදි යාපනය ගුවන් තොටුපළ අදියර 03කින් සංවර්ධනය කිරීමට හා දෙවන අදියරේ සංවර්ධන කටයුතු වහාම ආරම්භ කර 2019 දෙසැම්බර් 01 දිනෙන් අවසන් කිරීමට තීරණය වී තිබුණි. කෙසේ වුවද, සංවර්ධන කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.	2022, 2023	අමාත්‍ය මණ්ඩල තීරණ සහ කමිටු වාර්තාවේ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතු වීම.	COVID-19 වසංගතය හේතුවෙන් මෙහෙයුම් අත්හිටුවා 2022 දෙසැම්බර් මාසයේදී නැවත ආරම්භ කරන ලදී.	සංවර්ධන කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.
(ii)	2020-2024 කාලය සඳහා සමාගමේ උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුව, JIA හි ආදායම ඉහළ නැංවීම සඳහා පවතින ගුවන් සේවයේ වාර ගණන වැඩි කිරීම හෝ නව ගුවන් සේවා ආකර්ෂණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි	2023	පවතින ගුවන් සේවයේ වාර ගණන වැඩි කිරීමට සහ නව ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීමට සවිස්තරාත්මක අලෙවිකරණ සැලැස්මක් සකස් කළ යුතු වීම.	AASL විසින් ඉන්ඩිගෝ ගුවන් සමාගම් සමඟ සාර්ථක B2B සාකච්ඡා පවත්වා ඇති අතර, 2024 ජූලි 1 දින සිට චෙන්නායි සහ යාපනය අතර නියමිත ජාත්‍යන්තර දෛනික ගුවන් ආරම්භ කිරීමට ගුවන් සමාගම සැලසුම් කර ඇත	ආදායම ඉහළ නැංවීම සඳහා මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ම)	ඉන්ටර්නැෂනල් එයාර්පෝට් කවුන්සිලය (ACI) විසින් 2018 වසරේ ලෝක ගුවන් තොටුපළ පිළිබඳව නිකුත් කරන ලද 2022 වසරේ වාර්තාවට අනුව, ගුවන් තොටුපළ 2677 කින්, ශ්‍රී ලංකාව මුළු ගමනාගමනය අනුව 548 වන ස්ථානයේද, සම්පූර්ණ මගීන් අනුව 292 වන ස්ථානයේද, සහ සම්පූර්ණ භාණ්ඩ ප්‍රවාහනය අනුව 116 වන ස්ථානයේද විය. ඒ අනුව, 2018 සංඛ්‍යාලේඛන හා සසඳන විට ලෝක ශ්‍රේණිගත කිරීම පහත වැටෙමින් පැවතුණි.		ශක්තීන් , දුර්වලතා, අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණයක් සිදු කළ යුතු වීම හා ඉන් පසුව දුර්වලතා ශක්තීන් බවට පරිවර්තනය කර සමාගමේ වර්ධනය සඳහා ඇති අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතු වීම. තවද, ආයතනයේ වර්ධනය සඳහා සම මට්ටමේ සමාගම් විසින් භාවිතා කරන හොඳම භාවිතයන් සහ උපාය මාර්ග අධ්‍යයනය කිරීම වඩා සුදුසු වේ.	අ) මෙය 2019.04.21 සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ එහි ප්‍රතිවිපාක ආ) රටේ මෙම කාල පරිච්ඡේදය තුළ ආර්ථික අවපාතය සහ එහි ප්‍රතිවිපාක. ඇ) රටේ කොවිඩ් වසංගත තත්ත්වය නිසා සිදු කර ඇත.	ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට අදාලව වර්ධන උපාය මාර්ග මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.
(ය)	ජාත්‍යන්තර එයාර්පෝට් කවුන්සිලය (ACI) විසින් 2018 වසරේ ආසියා පැසිපික් කලාපයේ ගුවන් තොටුපළ පිළිබඳව නිකුත් කළ 2022 වසරේ වාර්තාවට අනුව, ගුවන් තොටුපළ 2483 කින්, ශ්‍රී ලංකාව මුළු ගමනාගමනය අනුව 109 වන ස්ථානයේත්, මුළු මගීන් අනුව 76 වන ස්ථානයේත්, සහ මුළු භාණ්ඩ ප්‍රවාහනය අනුව	2023	ශක්තීන් , දුර්වලතා, අවස්ථා සහ තර්ජන හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණයක් සිදු කළ යුතු වීම හා ඉන් පසුව දුර්වලතා ශක්තීන් බවට පරිවර්තනය කර සමාගමේ වර්ධනය සඳහා ඇති අවස්ථා ප්‍රයෝජනයට	අ) මෙය 2019.04.21 සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය සහ එහි ප්‍රතිවිපාක ආ) රටේ මෙම කාල පරිච්ඡේදය තුළ ආර්ථික අවපාතය සහ එහි ප්‍රතිවිපාක. ඇ) රටේ කොවිඩ් වසංගත තත්ත්වය නිසා සිදු විය.	ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට අදාලව වර්ධන උපාය මාර්ග මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

	30 වන ස්ථානයේත් පසු වූ අතර 2018 සංඛ්‍යා සමඟ සසඳන විට ආසියා පැසිෆික් කලාපයේ ශ්‍රේණිගත කිරීම් පහත වැටී තිබුණි.	ගැනීමට ක්‍රියා කළ යුතුවීම. තවද, ආයතනයේ වර්ධනය සඳහා සම මට්ටමේ සමාගම් විසින් භාවිතා කරන හොඳම භාවිතයන් සහ උපාය මාර්ග අධ්‍යයනය කිරීම වඩා සුදුසු වේ.		
(ර)	BIA හි ජාල පදනම් පොදු ලිපින පද්ධතිය සැපයීම, ස්ථාපනය, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ මූලික ප්‍රසම්පාදන කාලසටහනට අනුව, 2018 නොවැම්බර් 30 දින ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණද, මෙම වාර්තාවේ දිනය දක්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා ගත වූ කාලය වසර 05 කට වැඩි බව නිරීක්ෂණය වූ අතර ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 55 ක් වූ ප්‍රසම්පාදනයේ මූලික ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 271 ක් දක්වා ඉහළ ගොස් තිබුණි.	2023	අඛණ්ඩව සමාලෝචනයක් කරමින් අනවශ්‍ය ප්‍රමාදය අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම හා ඉහළ වටිනාකමක් ඇති ප්‍රසම්පාදන සහ ව්‍යාපෘති ප්‍රමාදයට හේතුව කලින් කලට, අධීක්ෂණය සහ BOD වෙත වාර්තා කිරීම සිදු කළ යුතුවීම තවද, අසාමාන්‍ය ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව දැනුවත් කළ යුතු වීම.	2023 සැප්තැම්බර් මාසයේදී වත්මන් සම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, 2024 මාර්තු මාසයේදී TEC හි අවසාන නිර්දේශය MPC වෙත භාර දෙන ලදී.	ප්‍රසම්පාදන කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි.

3.2 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	52,629,846,537	20,569,324,259	32,060,522,278	27,804,147,902	තත්ත්වාගණනය කළ
2022	43,574,546,372	11,873,398,285	31,701,148,087	31,538,040,003	තත්ත්වාගණනය කළ
2023	88,599,731,687	13,861,288,277	74,738,443,410	45,301,922,846	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගෙන් රු.372,764,954 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. ඒ පිළිබඳව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මුළු ණය ශේෂය වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන ණයගැතියන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද විගණනයේ තහවුරු කරගැනීම අනුව එම ණය ශේෂය තුළ 1976 වර්ෂයේ සිට පැවත එන රු.15,103,410 ක් වූ ණය ශේෂයක්ද ඇතුළත් වී තිබුණි. හිඟ සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් මෙම ණයගැතියන් අයකර ගැනීමට	2022 2023	හිඟ සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	හිඟ සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

නොහැකි වී තිබුණි. තවද මුළු ණයගැති ශේෂයෙන් සියයට 46 කට වැඩි ප්‍රමාණයක් වූ රු.174,800,000 ක් 1993 වර්ෂයේ සිට ඉලෙක්ට්‍රොනික්ස් පුද්ගලික සමාගමෙන්ද, සියයට 40 කට වැඩි ප්‍රමාණයක් වූ රු.145,254,449 ක් 1976 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවෙන්ද අයවිය යුතුව තිබුණි.

(ආ)	කොමිෂන් සභාව සහ කොන්ත්‍රාත්කරු සමඟ එළඹුණු හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ ගිවිසුම අනුව අදාළ කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින නිම කිරීමට නියමිතව තිබුණද, නිමකර තිබුණේ කොන්ත්‍රාත්තුවෙන් සියයට 33 ක් පමණි. 2024 මැයි 30 දින වන විටත් මෙම කොන්ත්‍රාත්තුව අතරමග නතර කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට දරන ලද රු. 711,268,796 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2021 2022 2023	පරිශ්‍රය ආයෝජකයන්ට ලබා දීම මගින් ආදායමක් ලබා ගැනීමට කටයුතු කල යුතුය.	රජය විසින් තිරණය කර ආරම්භ කළ මෙම ව්‍යාපෘතියට අමතරව ක්‍රියාත්මක විය යුතුව තිබූ අනෙකුත් ආශ්‍රිත ව්‍යාපෘති ආරම්භ නොකිරීම නිසාම ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක ලබා ගැනීමට නොහැකි වී ඇති අතර මෙම ව්‍යාපෘතිය සඳහා බෙරුම්කරණ මණ්ඩල විසින් ලබාදුන් නියෝග ප්‍රකාරව කටයුතු කර ඇත. තවද මෙම ව්‍යාපෘතිය දැනට පවතින ආකාරයෙන් ආයෝජකයන් සඳහා මෙම පරිශ්‍රය ලබා දීම සඳහා අභිලාශ (EOI) කැඳවීමක් සිදු කරන ලදි. මේ සඳහා ආයෝජකයෙක් අභිලාෂ ඉදිරිපත් කර නොමැත. තවද තාක්ෂණ අමාත්‍යාංශයේ විගණන	ආදායමක් උපයාගෙන නොතිබුණි.

හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ලබාදුන් උපදෙස් ප්‍රකාරව රාජ්‍ය ආයතන මගින් අභිලාෂ කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

3.3 ඉන්ෆෝමේෂන් කොම්‍යුනිකේෂන් ටෙක්නොලොජී ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	864,114,702	974,100,991	(109,986,289)	(41,648,126)	තත්ත්වාගණනය කළ
2022	635,442,445	769,392,917	(133,950,472)	(20,629,927)	තත්ත්වාගණනය කළ
2023	2,555,162,792	2,693,234,017	(138,071,225)	9,342,086	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	බර් 16 නොවැම් 2021 :දිනැති අංක01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3. 2 ඡේදයේ විධිවිධානය ප්‍රකාරව සමාගම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවාගැනීමේ පරිපාටියක් හා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් නොතිබුණි.	2023	චක්‍රලේඛය ප්‍රකාරව සමාගම සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවාගැනීමේ පරිපාටියක් පැවැතිය යුතුය .	දෙසැම්බර් 4 වැනි 2023 දින තාක්ෂණ (ශයඅමාත්‍යාංMOT) හරහා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා යවා ඇත .	2024 සැප්තැම්බර් 30 දින වන විටත් බඳවාගැනීමේ පරිපාටිය අනුමත වී .නොමැත
(ආ)	රජය සතු ව්‍යවසායන්හි සේවකයෙකු අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොමැතිව නිදහස් නොකළ යුතු අතර මුදාහරින ලද කාලපරිච්ඡේදයන් තුළ කිසිදු දීමනාවක් නොගෙවිය යුතු වුවත් සමාගම එක් නිලධාරිනියක් එසේ අනුමැතිය නොමැතිව	2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැත.

	තාක්ෂණ අමාත්‍යාංශයට මුදාහැර තිබූ අතර වැටුප් හා දුරකථන දිමනා ලෙස සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු.1,948,000ක් හා රු.2,066,400 ක් ගෙවා තිබුණි.				
(ඇ)	ශ්‍රී ලංකා හදිසි පරිගණක ප්‍රතිචාර සංසදය (ලංකා සර්ට්) වෙත ශ්‍රී ගෙවිය යුතු .රු40,215,928 ක් 2017 වර්ෂයේ සිටමනිරවුල් කර නොතිබුණි.	2021 2022 2023	ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය	මේ පිළිබඳව සලකා බැලීම සඳහා තාක්ෂණ අමාත්‍යාංශය කමිටුවක් පත් කර ඇත.	ණයහිමි ශේෂ 2024 සැප්තැම්බර් 30 විටත් දින වන නිරවුල් කර .නොමැත
(ඈ)	සේවකයින් දෙනෙකු 30 සඳහා වැටුප් වර්ධක ලබාදීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් ප්‍රධාන තීරණයට පටහැනිව වැටුප් වර්ධක ලබාදී තිබීම හේතුවෙන් එම වැටුප් සංශෝධන බල රහිත බව සමාගම වෙත සැප්තැම්බර් 2023 දිනැති අංක 14 /ඊ112/2023අයිසිටීඒ / ගේ ලිපියදරන නීතිපති මගින් දැනුම් දී තිබුණි. ඒ ෑනුව සමාගම 2023 වර්ෂයේදී රු. 7,211, 465 ක් වැටුප් ලෙස වැඩිපුර .ගෙවා තිබුණි	2023	අනුමත වැටුප් පරිමාණයන්ට අනුව ගෙවීම් කළ යුතුය.	මෙම වැටුප් ගැලපීම් අඩු කර ඇතත් වැඩිපුර ගෙවීම් අයකර ගෙන නොමැත .	වැඩිපුර ගෙවූ වැටුප් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

3.4 ලංකා ගවර්මන්ට් ඉන්ෆොමේෂන් ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම.

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	46,643,595	5,671,895	40,971,700	(2,041,493)	තත්ත්වාගණනය කළ
2022	45,148,859	5,855,583	39,293,276	(2,133,248)	තත්ත්වාගණනය කළ
2023	45,429,379	1,057,351	44,372,028	-	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2022 නොවැම්බර් 15 වැනි දින පැවති මව් සමාගමේ ඉන්ෆෝමේෂන්) කොමියුනිකේෂන් ටෙක්නොලොජි ලංකා ඒජන්සි ඔෆ් ශ්‍රී යිවට්) ලිමිටඩ්) හිප්‍ර) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගම් පනතේ 242 වගන්තියට අනුව සමාගම ඉන්ෆෝමේෂන් කොමියුනිකේෂන් ටෙක්නොලොජි ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා යිවට්) ප්‍ර) ලිමිටඩ් සමඟ ඒකාබද්ධ කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද 2024 අප්‍රේල් 30 දක්වා එම කාර්යය සම්පූර්ණ කර නොතිබුණි.	2023	කළමණාකරණ තීරණ අනුව කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ කිරීමේ කාර්යය සමාගම් ලේකම් වෙත පවරා ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ඒකාබද්ධ කිරීම සිදුකර නොතිබුණි.

3.5 ශ්‍රී ලංකා සර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	83,277,223	16,392,082	66,885,141	5,512,737	තත්ත්වාගණනය කළ
2022	129,031,608	45,944,106	83,087,502	7,902,861	තත්ත්වාගණනය කළ
2023	384,092,035	279,326,013	104,766,022	22,941,665	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම සඳහා අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් නොමැති වුවද 2013 ල් 01 දින සිට අප්‍රේ යාත්මක වන පරිදි ක්‍රි අධක්ෂක මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලයට, කාර්යසාධන ඇගයීමකට පසු සියයට සිට සියයට 13 5 දක්වා වැටුප් වැඩිකිරීම් දී තිබුණි. තවද ලබා සමාගමේ සියලුම කාර්යමණ්ඩලය ත් පදනමකොන්ත්‍රාමත බඳවාගෙන තිබූ අතර ඉන් දෙදෙනෙක් සඳහා උසස්වීම් 2023 අගෝස්තු 01 දින ක්ෂක මණ්ඩලය අධ්‍ය .අනුමත කර තිබුණි	2023	කොන්ත්‍රාත් පදනම මත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී සේවා කාලය, ගෙවනු ලබන පාරිශ්‍රමිකය පූර්වයෙන් දක්වන බැවින් මෙහෙයුම් අත්පොත ප්‍රකාරව බඳවා ගැනීම් හා උසස් කිරීම් පරීපාටිය සඳහා නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	බඳවාගැනීමේ පරිපාටිය පිළියෙල කර අනුමත කරවාගෙන නොමැත.

(ආ)	සමාගම වර්ෂය 2023 සඳහා රු1,977,653 ක් වැයකර භාණ්ඩාගාර / ක්ෂ මණ්ඩල අධ්‍ය අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලයට වෛද්‍යසෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා දී තිබුණි. තවද එක් නිලධාරියකුට රු2,500 බැගින් සෞඛ්‍ය වෛද්‍ය දීමනාවක් හා රු. 15,000 ක් බැගින් ගමන් වියදම් දීමනාවක් ගෙවා තිබුණ ද ඒ සඳහා ද භාණ්ඩාගාරක්ෂ අධ්‍ය / ල අනුමැතිය මණ්ඩ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	සියළු ගෙවීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.	ශ්‍රී ලංකා සර්ට් ආයතනය එහි සේවකයින් සඳහා ලබා දෙන සෞඛ්‍ය වෛද්‍ය රක්ෂණාවරණය අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ යටතේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා තාක්ෂණ අමාත්‍යාංශය මගින් යොමු කොට ඇත.	අදාල අනුමැතින් මෙතෙක් ලැබී නොමැත.
(ඇ)	දෙසැම්බර් 31 2023 දිනට තොරතුරු සන්නිවේදන හා තාක්ෂණඒජන්සි සමාගමෙන් ලැබිය යුතු රු.40,215,928 ක ශේෂය වර්ෂයේ 2017 සිට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021 2022 2023	ලැබියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය.	මෙම ගිණුම් ශේෂය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කමිටුවක් දින වන විටත් තාක්ෂණ අමාත්‍යාංශය විසින් පත්කර ඇති අතර කමිටු නිර්දේශ මත පදනම්ව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	2024 සැප්තැම්බර් 30 අය කර ගෙන නොමැත.

3.6 ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පෞද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,268,310,944	199,060,552	3,069,250,392	265,226,885	තත්ත්වාගණනය කළ
2022	3,653,529,693	165,568,040	3,487,961,654	413,544,071	තත්ත්වාගණනය කළ
2023	3,865,953,732	172,024,056	3,693,929,676	225,919,819	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	2023වර්ෂය අවසාන වන විට වසර 01– 05ත් අතර කාලයක් ගතවී ඇතත් අයකර නොගත් ණයගැනි ශේෂය රු.4,975, 913ක් වූ අතර, වසර 05– 11ත් අතර කාලයක් ගත වී ඇතත් අයකර නොගත් ණයගැනි ශේෂය රු.9,071, 144ක් විය . තවද විගණිත දින වන විටත් මේ නිවැසියන් කුලී නිවාස වලින් ඉවත් වී තිබූ අතර රු . 1,385, 526ක් අයවිය යුතු නිවැසියන්ගේ ලිපිගොනු අස්ථාන ගත වී තිබුණි.	2021 2022 2023	කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය.	රු .මිලියන 1. 8ක් සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා ඇත .ආයතන වසා දැමීම මත ඇති හිඟ මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් ඉදිරි කටයුතු සිදු කෙරේ.	අයකරගෙන නැත.
(ආ)	**සමාගම් පනත 2007-223(2) වගන්තිය;** සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි	2022, 2023	පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය.	සමාගම් ලේකම් මගින් නිවැරදි කිරීමට කටයුතු කෙරේ.	සිදුකර නොතිබුණි.

	විය යුතු වුවත්, අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් 2015 වර්ෂයේ සිට ලියාපදිංචි වී නොතිබුණි.				
(ඇ)	**සමාගම් පනත 2007–206වගන්තිය** නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකර අධ්‍යක්ෂකවරුන්ගේ ඉවත් කිරීම සහ බදවා ගැනීම සිදු කර තිබුණි. එය සමාගමේ සුමට ක්‍රියාකාරීත්වයට ඍජුවම බලපා තිබුණි.	2022, 2023	පනතේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය.	නිසි ක්‍රියාපටිපාටියක් ඉදිරියේදී අනුගමනය කරනු ලැබේ.	නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.
(ඇ)	සමාගම විසින් 2019 වර්ෂයේදී පාර්ක් රෝඩ් ගොඩනැගිල්ලේ කඩ කාමර 21ක් රු.70,025,000කට මේන් ලෑන්ඩ් ග්ලෝබල් සමාගම වෙත විකුණා තිබුණි .ඒ වෙනුවෙන් 2023දෙසැම්බර් 31 දිනට ගැනුම්කරුගෙන් රු .20,025,000ක මුදලක් අයවිය යුතුව තිබුණි .එම කඩ සාප්පුවලට විරුද්ධව නඩු පවරා තිබීම සහ අවශ්‍ය විදුලිය හා ජලය සපයා නොදීම හේතුවෙන් කඩකාමර භාවිතා කිරීමට නොහැකි වීම නිසා ගැනුම්කරු විසින් රු.මිලියන 130ක වන්දියක් ඉල්ලා කොළඹ දිසා අධිකරණයේ සමාගමට එරෙහිව නඩුවක් ගොනු	2022 2023	එකඟතාවයකට පැමිණ සමථයකට පත්කර ගැනීමට කටයුතු කළයුතුය.	පාක් රෝඩ් කඩ කාමර වසා දැමීමට හේතුව ඒ සම්බන්ධයෙන් නඩු පවරා තිබීම.	නඩු කටයුතු දිගටම පවතී.

	කර තිබුණි .එමෙන්ම 2005වර්ෂයේ ඉදිකිරීම් අවසන්කර තිබූ මෙම කඩ කාමර 21විගණිත දිනය වන 2024 පෙබරවාරි 28දින දක්වා වර්ෂ 19ක් ම වසා දමා තිබීම අකාර්යක්ෂම කළමනාකරණ තීරණවල ප්‍රතිඵලයක් ලෙස නිරීක්ෂණය විය.				
(ඉ)	නුවරඑළිය, මාලිගාවත්ත, දෙල්කඳ, කෑගල්ල වලව්වත්ත හා කෑගල්ල සියඹලාපිටිය යන නිවාස ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමට සමාගම 2022වර්ෂයේ රු .මිලියන 39.5ක් වෙන්කර එම වර්ෂයේ රු .1,012,411 ක් වැය කර තිබුණි .නමුත් 2023 වර්ෂයේ එම ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබූ අතර දෙල්කඳ ව්‍යාපෘතිය වෙනුවෙන් රු .6,650ක් වියදම් කර තිබුණි .මේ අනුව ඉකුත් වර්ෂවල ඉටු කිරීමට නොහැකි වූ ව්‍යාපෘති ඉදිරියට ක්‍රියාත්මක කිරීමට දිගුකාලීන වැඩ පිළිවෙළක් නොමැතිව සමාගම ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා මෙලෙස වියදම් දැරීම දුර්වල කළමනාකරණ තීරණයක් බව නිරීක්ෂණය විය.	2021 2022 2023	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ඉඩම්වල නිරවුල්භාවය තහවුරු කරගත යුතුවේ.	නුවරඑළිය සහ මාලිගාවත්ත ව්‍යාපෘති ඉදිරියේදී සිදුකිරීමට යෝජිතයි .දෙල්කඳ ඉඩම පවතින තත්ත්වයෙන් විකිණීමට යෝජිතයි . කෑගල්ල වලව්වත්ත හා සියඹලාපිටිය ව්‍යාපෘතිවල මූලික නිර්දේශ ලබාගනිමින් පවති .තවද ඉඩම්වල නිරවුල්තාවය නිසියාකාරව නොමැති වීම නිසා ව්‍යාපෘති සිදුකිරීම අපහසු වී ඇත.	ඉඩම් වල අයිතිය නිරවුල් කරගෙන නොමැත.

(ඒ)	නිවාස ඒකක 09ක ගිවිසුම් අවලංගු වී මාස 10සිට වසර 06ක් දක්වා කාලයක් ගතවී තිබුණද නව ගිවිසුම් වලට එළඹීමෙන් තොරව කුලී නිවාස හිමියන් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.	2021 2023	ගිවිසුම් ගතවීම කඩිනමින් සිදුකළ යුතුය.	නිවාස 06ක් සඳහා ගිවිසුම් පිටපතක් යවා ඇත .නිවාස 2 ක් සඳහා කුලී කාලය වැඩි කර ඉල්ලීම් කර ඇත .එක් නිවසක් සඳහා ගිවිසුම් ගත වීමට අවශ්‍ය නීති හා මුද්දර ගාස්තු ගෙවා ඇත.	ගිවිසුම් ගතවීමට කටයුතු කරමින් සිටී.
(ඓ)	2012වර්ෂයේ දී සමාගම විසින් රු .මිලියන 19. 21 ක වියදමින් කහතුඩුව ප්‍රදේශයේ පර්චස් 398. 1 ක ඉඩමක් මිලදී ගෙන තිබූ අතර 2014වර්ෂයේ දී එම ඉඩමේ කහතුඩුව ව්‍යාපෘති I අදියර යටතේ රු .මිලියන 77. 31ක වියදමින් නිවාස 11ක් ඉදිකර තිබුණි .නමුත් එම නිවාස වලින් නිවාස 04ක් 2022වර්ෂය අවසාන වන විටත් විකිණීමට නොහැකි වී තිබුණි .එසේ තිබියදී කහතුඩුව ව්‍යාපෘතිය II අදියර යටතේ පෙර විකුණුම් වියදම මත නිවාස 36ක් ඉදිකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය 2021නොවැම්බර් 21 දින තීරණය කර තිබූ අතර සුදුසු ගැනුම්කරුවකුගෙන් තොරව සමාගමේ අරමුදලින් රු .මිලියන 40. 38ක් වැය කර නිවාස 11ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ නමුත් අවසන් කර නොතිබූ අතර එම පවතින තත්ත්වයෙන්	2021 2022	නිසි ඇගයීමකින් පසුව ආයෝජන තීරණ ගත යුතු අතර පෙර සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය තීරණය කල යුතුය.	සමාගම නිවාස සහ ඉඩම් විකිණීමට කටයුතු කරමින් සිටී.	පවතින තත්ත්වයෙන් නිවාස හා ඉඩම් කොටස් විකිණීමට කටයුතු කරමින් සිටී.

විකිණීමට තීරණය කර තිබුණි.

(ඌ)	05-C නිවාස ඒකකයේ පදිංචිකාරිය 2009 වර්ෂයේ සිට නිවසේ පදිංචිව සිටින නමුත් 2018වර්ෂයේ ඔක්තෝබර් මාසයෙන් පසු ගිවිසුම්ගත වී නොතිබුණි .තවද මෙම නිවාස ඒකකය සඳහා රු . 26,580ක් වැනි අඩු කුලියක් අයකරන නමුත් අනෙකුත් කුලී නිවැසියන්ට මෙන් වාර්ෂිකව කුලිය වැඩිවීමක්ද සිදු වී නොතිබුණි .තවද 2023 ඔක්තෝබර් මස 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා එහි තීරණ අංක 261– 05අනුව මාසික කුලී මුදල වෙනසක් නොකර රු . 26,580ක් හා සේවා ගාස්තු ලෙස රු .7,500ක් ලෙසින් 2024ජනවාරි මස 01වන දින සිට වසර දෙකක් සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කරන ලෙස නිවැසියා වෙත දැනුම් දී තිබුණි . මෙම නිවාස ඒකකයෙහි මාසික කුලී තක්සේරුව රු .240,086ක් වූ අතර ගිවිසුම්ගත කුලිය රු . 26,580කි .මේ නිසා ගිවිසුම්ගත වර්ෂදෙක සඳහා සමාගමට අහිමි වන කුලී ආදායම රු . 5,124,144ක් බව නිරීක්ෂණය විය.	2023	විධිමත් පරිදි ගිවිසුමකට එළඹිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එහි තීරණ අනුව කටයුතු කරනු ලැබේ.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇත.

(එ)	තක්සේරු වටිනාකම රු . 194,285ක් වූ 07-C නිවාස ඒකකය සහ තක්සේරු වටිනාකම රු . 249,320ක් වූ 01-A නිවාස ඒකකය සඳහා 2023ජූලි මස 31දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ තීරණ අංක 257- 04අනුව වාර්ෂික කුලිය වැඩි වීමකින් තොරව වසර 05ක් සඳහා මාසික කුලිය හා සේවා ගාස්තු ලෙස රු . 90,000ක් අයකිරීමට ගිවිසුම් ගත වීමට එකඟතාවය පලකර තිබුණි .ආයතනයේ සාමාන්‍ය ක්‍රමවේදය වනුයේ වාර්ෂිකව කුලිය සියයට 5කින් වැඩි කිරීම වුවද මෙම පුද්ගලයන්ට වසර 05ක කාලයක් සඳහා වාර්ෂික ගාස්තු වැඩි කිරීමක් ද සිදු නොකෙරේ .ඒ අනුව සමාගමට එකතු කළ හැකි වූ රු . 17,478,984 ක ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය.	2023	ආයතනයට අවාසි සහගත නොවන පරිදි වාර්ෂික කුළිය වැඩි කළ යුතුය.	නිවැසියන් මුලික අයිතිවාසිකම් නඩුවක් පවරා පසුව ඉවත් කර ගැනීමට එකඟ වී ඇති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි කටයුතු කෙරේ.	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇත.

3.7 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,255,918,451	375,850,575	1,880,067,876	105,520,305	තත්ත්වාගණනය නොකළ
2022	2,296,664,426	460,167,021	1,836,497,405	(48,310,073)	තත්ත්වාගණනය කළ
2023	3,337,790,207	1,043,236,541	2,294,553,666	555,406,517	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 3.2(v) ඡේදය අනුව දිරිදීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය රහිතව සුපෝෂ අලෙවියෙන් ඉලක්කගත දීමනාවක් ලෙස සමාගමේ සියළුම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.12,687,147ක දිරිදීමනා මුදලක් ගෙවා තිබුණි.	2022 2023	මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සමාගමේ සියළුම අංශයන් ආවරණය කරන ලද මෙහෙයුම් අත්පොත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2023වර්ෂයේදී යොමු කර ඇති බව . නිෂ්පාදනය මත අලෙවියෙන් ලබා දෙනු ලබන ඉලක්කගත දීමනා ගෙවීම් ක්‍රමවේදය අදාළ මෙහෙයුම් අත්පොතෙහි විග්‍රහ කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් අත්පොත විශ්ලේෂණය කර ඉදිරියේදී අවශ්‍ය අනුමැතීන් ලබා දෙන බව .	ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම නිෂ්පාදන ආයතනයක් වන බැවින් එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ඉදිරි අනුමැතිය ලබා දෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් මත අදාළ කටයුතු සිදු කරන බව.

(ආ)	මෙහෙයුම් අත්පොතේ 3.3 ඡේදය අනුව එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023	මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	උපායමාර්ගික මානව සම්පත් සැලැස්ම සඳහා අවශ්‍ය කටයුතු වර්තමානයේදී සිදුකරමින් පවතින බව.	උපායමාර්ගික මානව සම්පත් සැලැස්ම සඳහා අවශ්‍ය කටයුතු වර්තමානයේදී සිදුකරමින් පවතින බව.
(ඇ)	2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ii ඡේදය අනුව වැටුප් හා දීමනා පිළිබඳ තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ලබාදී නොමැති අතර අමතර ගෙවීම් ලෙස සිදුකරනු ලබන සියළු දීමනා සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් 2017 වර්ෂයේදී හඳුන්වා දෙන ලද සුපෝෂ නිෂ්පාදනය සඳහා බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරු හට රු.10,000 ක අමතර දීමනාවක් සුපෝෂ ගිණුමෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත ගෙවා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.120,000 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ	2022 2023	මේ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගත යුතුය	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත මෙහෙයුම් අත්පොතෙහි මේ සඳහා වන නිර්දේශ ඉදිරිපත් කර ඇති බව.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතීන් ලැබෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළ කටයුතු සිදු කරන බව.

	අනුමැතිය රහිතව ගෙවා තිබුණි.				
(ඇ)	යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු.192,091,525 ක් ලෝක ආහාර වැඩසටහන)WFP) මගින් 2021 වර්ෂය තුළදී ලබාදී තිබුණු අතර, එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි . 2023 ජනවාරි 02 දින වන විට එහි කල්පිරුණු අගය වූ රු . 207,815,400 ක මුදල ජනවාරි 20 දින මුදල් කරගෙන තිබුණු අතර මින් රු.125,000,000 ක මුදලක් 2023 ජනවාරි 27 දින නැවත ආයෝජනය කර තිබුණි . කෙසේ වුවත්, මෙම අරමුදල් සැපයූ අරමුණ ඉටු නොකර වෙනත් කාර්යයක් සඳහා මෙම අරමුදල් වැයකර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.	2022 2023	මෙම මුදල අපේක්ෂිත අරමුණ සඳහා වැයකළ යුතුය	සයිලෝ පද්ධතියක් ඉදිකිරීම 2023වසර වන විට ඇස්තමේන්තුව රු.මිලියන 800ක් පමණ වන බව) .2022-රු.මිලියන 500) සමාගම වෙත ප්‍රාග්ධන ප්‍රතිපාදන රහිත වීම හේතුවෙන් 2022 වර්ෂයේදී ස්ථාවර තැන්පතුවෙන් කොටසක් උපයෝජනය කළ බව.	2023 ජනවාරි මස රු.මිලියන 125 ක් ද 2024 ජුලි මස රු.මිලියන 100 ක් ද වශයෙන් රු.මිලියන 225 ක් අදාළ සයිලෝ පද්ධතිය ඉදිරියේදී ඉදිකිරීම සඳහා වෙන්කර ඇති බව.
(ඉ)	සමාගම පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූ, ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීමට වඩා සුපෝෂ නිෂ්පාදනය කිරීම කෙරෙහි සමාගම වැඩි පෙළඹවීමක් ඇති බවත් මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සුපෝෂ නිෂ්පාදන අලෙවි ආදායම මත	2023	වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර නිෂ්පාදන ඉලක්ක දීමනාව විධිමත් කළ යුතුය.	නිෂ්පාදන ඉලක්ක දීමනාව විධිමත් කිරීම සඳහා සමාගමේ සමස්ථ නිෂ්පාදනය මත පදනම්ව ඉලක්ක දීමනාව සංශෝධනය කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාගමේ මෙහෙයුම් අත්පොතට ඇතුළත්	නිෂ්පාදන ඉලක්ක දීමනාව විධිමත් කිරීම සඳහා සමාගමේ සමස්ථ නිෂ්පාදනය මත පදනම්ව ඉලක්ක දීමනාව සංශෝධනය කර ඇති අතර එය අධ්‍යක්ෂ

	පදනම්ව ලාභයෙන් සියයට 5 සිට සියයට 10 දක්වා ඉලක්ක දීමනාවක් ගෙවීමට සමාගම කටයුතු කිරීම බව අනාවරණය විය . එසේම ඉලක්ක දීමනා සඳහා නිසි අනුමැතියක් හා ක්‍රමවේදයක් නොතිබුණි .			කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව .	මණ්ඩල අනුමැතිය මත සමාගමේ මෙහෙයුම් අත්පොතට ඇතුළත් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.
(ඊ)	සමාගම විසින් 2016 වර්ෂයේදී පරිපාලන රීති සංග්‍රහය සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි .කෙසේ වුවත් සමාගම විසින් එහි අඩංගු ඇතැම් අනුමත නොවූ නීති,රීති අනුගමනය කරන බව විගණනයේදී අනාවරණය විය.	2023	අදාළ විධිමත් අනුමැතිය ලැබෙන තුරු මෙහෙයුම් අත් පොතෙහි දැක්වෙන කරුණු ක්‍රියාත්මක නොකළ යුතුය	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති පරිපාලන රීති සංග්‍රහයද ඇතුළත් මෙහෙයුම් අත්පොතෙහි දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදී අනුමැතිය ලැබෙන තෙක් මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ආයතනයක් ලෙසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ක්‍රියාත්මක කරනු ලබන බව.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අදාළ අනුමැතිය ලැබෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කටයුතු සිදු කරන බව.
(උ)	අංක DMS/E4/13/08/413/1 දරන 2013 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ලිපිය ප්‍රකාරව සමාගම වෙනුවෙන් 2010 දෙසැම්බර් 02 දින අනුමත කළ සියලු තනතුරු සඳහා අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ	2023	සෑම තනතුරකටම අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කරවා ගත යුතුය	බඳවා ගනීමේ පටිපාටි රහිත සමාගමේ පවතින තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර ඇති බව.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව.

	විධිවිධාන පරිදි සකස් කරන ලද, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිර්දේශිත බඳවාගැනීම් පටිපාටිය අනුමත කර තිබුණ ද එදිනෙන් පසුව ඇති කරන ලද නව තනතුරු තුනක් සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි . එමෙන්ම අනුමත බඳවාගැනීම් පටිපාටියකින් තොරව ඇතැම් බඳවාගැනීම් ද සිදු කර තිබුණු බව අනාවරණය විය.				
(ඌ)	සේවක දිරිගැන්වීමක් වශයෙන් හා අනුමත කළ/නොකළ වැටුප් රහිත නිවාඩු ලබා නොගත් සේවකයින් 162 කට සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි .ඒ අනුව මාසිකව රු.67,690 ක මුදලක් වැටුප් වර්ධක ලෙස වැඩිපුර ගෙවා තිබුණි . මෙම පූර්වාදර්ශය 2024 වැටුප් වර්ධක ලබාදීමේදීද අනුගමනය කරමින් මෙලෙස වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි.	2023	මේ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය	2023මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව රු.මිලියන 811ක බදු පෙර ලාබයක් වාර්තා කිරීමෙන් නිෂ්පාදන කාර්යසාධනයන් යන කරුණු මත වැටුප් වර්ධක 02බැගින් ගෙවීමට කටයුතු කර ඇති බව .මේ සඳහා සමාගමේ ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලැබී ඇති බව .	ඉදිරියේ දී රේඛීය අමාත්‍යාංශය වෙත ද යොමු කිරීමට කටයුතු කරන බව .

3.8 කුරුණෑගල වැව්ලි සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,287,099,773	338,721,597	2,948,378,176	468,604,709	තත්ත්වාගණනය කළ
2022	3,692,485,597	507,429,292	3,185,056,305	511,539,402	තත්ත්වාගණනය කළ
2023	3,862,697,258	448,857,374	3,413,839,884	534,430,745	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2009 මැයි 26 දිනැති අංක DNS/A/8/27 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 ඡේදය අනුව සමාගමේ HM, MM හා JM වැටුප් කාණ්ඩවලට අදාළව සේවය කරන නිලධාරීන් සඳහා මුදල් බවට පරිවර්තනය කළ හැකි සේවක දීමනා ලෙස රු.13,179,028 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබූ අතර, චක්‍රලේඛ විධිවිධාන පරිදි භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2021	මෙම ගෙවීම් කිරීම සඳහා යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	භාණ්ඩාගාර අනුමැතිය මේ දක්වා ලබාගෙන නැත.

(ආ)	2009 මැයි 26 දිනැති අංක DNS/A/8/27 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 ඡේදයට අනුකූල නොවන පරිදි සමාගමේ නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර දීමනා ලෙස රු. 8,669,745 ක් ගෙවීම් කිරීමේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සිදුකර තිබුණි.	2021	මෙම ගෙවීම් කිරීම සඳහා යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.	භාණ්ඩාගාර අනුමැතිය මේ දක්වා ලබාගෙන නැත.
(ඇ)	සුදු පොල්තෙල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ හා කුරුඳු තෙල් නිෂ්පාදන ව්‍යාපෘතිය 2022 වර්ෂය තුළ දී ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර තිබුණද, විගණිත දිනය වන තෙක් ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.	2022	අපේක්ෂිත ඉලක්කයන් ලභා කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතීන් නිම කිරීමට කටයුතු කරමින් පවතී.	කුරුඳු තෙල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියේ 2023 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර නිෂ්පාදනය මේ වන විට ආරම්භ කර ඇත.එසේම සුදු පොල්තෙල් කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.
(ඇ)	කහ වගාව සඳහා 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ සඳහා ගෙවන ලද එකතුව රු.8,432,049 ක් ගිණුම්ගත කර තිබුණ ද මෙම වියදම ගැලපුම්	2023	කෙටි කාලීන වගාවක් වන කහ වගාව සඳහා දරන ලද වියදම ගැලපුම් සංකල්පයට	කෙටි කාලීන ව්‍යාපෘතිවල (වසරකට අඩු) ඵලදාව ලැබීමත් සමග සියලුම වියදම් ලාභයට එරෙහිව ගැලපීම් කිරීමට	මෙම වියදම් අදාල කාලපරිච්ඡේදයන් හී ගැලපුම් කර නැත.

	සංකල්පයට අනුව දරන ලද වර්ෂයන්වල උපයන ලද ආදායමට එරෙහිව කපා හැරීම නොකර ජංගම වත්කම් වල සටහන් කර තිබීම නිසා ජංගම වත්කම් හා සමුච්චිත ඉපයීම් එම අගයෙන් අධිගණනයවී තිබුණි.		අනුව දරන ලද වර්ෂයන්වල උපයන ලද ආදායමට එරෙහිව කපා හැරීමට කටයුතු කළ යුතුය.	කටයුතු කරමින් පවතී.
(ඉ)	සමාගමේ දඹදෙණිය පළාත් වතු කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා රු.6,500,000ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු නමුත් 2020 වර්ෂයේ සිට 2024 ජනවාරි මාසය දක්වා කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.7,038.605ක් වැයකර තිබුණු අතර එය ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.538,605ක වැඩිවීමක් බවත්, ගොඩනැගිල්ලේ වැඩ මෙතෙක් නිමකර නොමැති නිසා වියදම තව දුරටත් වැඩිවිය හැකි බවත් නිරීක්ෂණය විය. ඇස්තමේන්තුගත වියදම ඉක්මවා වියදම් දැරීම පිළිබඳ අනුමැතියක්ද ලබා ගෙන නොතිබුණි. මෙම ඉදිකිරීමට අදාලව ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර, ඊට අදාලව මැනුම්පත් මගින් වියදම් තහවුරු කිරීමක්ද සිදු කර නොතිබුණි	2023	ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණ පත්‍රයක් හා ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ අනුව අවශ්‍ය ද්‍රව්‍ය හා ප්‍රමාණ මිලදී ගැනීම තුළින් වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදී සිදු කරනු ලබන කාර්යයන් සඳහා ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස උපදෙස් ලබා දී ඇත.	ඉදිකිරීම් මේ දක්වා අවසන් කර නොමැති අතර පිරිවැය පිළිබඳ ඇගයීමට අවශ්‍ය මිනුම් පත්‍රද සකස් කර නැත.

(ඒ)	2023 දෙසැම්බර් 31 දිනට පොල් නිෂ්පාදන ණයගැති ශේෂය වූ රු.63,510,576 ක් තුළ අවුරුදු 03 හා 08 ඉක්මවූ පිළිවෙලින් රු.1,688,527 ක සහ රු.4,677,838 ක ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගෙන නොතිබුණි.	2023	දිගුකාලීන ණයගැති ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.	නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදු කර ඇත.	රු.6,366,365ක අවුරුදු 03 ක හා අවුරුදු 08 ඉක්ම වූ ණයගැතියක් මේ දක්වා අයවී නොමැත.

3.9 හලාවත වැව්ලි සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,392,501,090	471,418,566	1,921,082,524	510,887,112	තත්ත්වාගණනය කළ
2022	2,890,032,133	534,978,980	2,355,053,153	513,881,001	තත්ත්වාගණනය කළ
2023	3,047,592,877	667,990,604	2,379,602,273	302,606,407	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	සමාගම සතු වගා කිරීමට නොහැකි හෙක්ටයාර 186.15 ක් විවිධ පුද්ගලයින් විසින් බලහත්කාරයෙන්, ගම පුළුල් කිරීමට හා අනවසර පදිංචි කිරීම් ලෙස අත්කරගෙන තිබුණි. එයින් හෙක්ටයාර 89.16 ක භූමි ප්‍රමාණයක් පමණක් නැවත අත්කර ගැනීම වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණු නමුත්, ඉතිරි හෙක්ටෙයාර 96.99 ක භූමි ප්‍රමාණය අත්කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.	2022	බදු අයිතිය යටතේ ඇති අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් නිරවුල් කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සමාගමේ වගකීමක් වේ.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙක්ටයාර් 96.99 ක භූමි ප්‍රමාණය සමාගම විසින් මෙම ඉඩම භාර ගැනීමට පෙර සිටම සිදුවී ඇති සිද්ධීන් වන අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොමැත.
(ආ)	වෙනත් ආයතන වෙත ණය ලබා දීමට සමාගමට නීත්‍යානුකූල	2023	සමාගමේ අරමුණු වලට අනුකූලව කටයුතු කළ යුතු	අදාළ ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ණය ලබා දුන් වර්ෂයේ සිට	අදාල ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ණය ලබා දුන්

	හිමිකම් නොමැති වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය සම්පත් ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය හා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාව වෙත සමාගම විසින් එකතුව රු.මිලියන 105ක ණය මුදල් 2010 වර්ෂයේ දී ලබා දී තිබුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2014 වර්ෂයේදී අදාළ සමාගම්වලින් පොළිය ද ඇතුළුව අය වීමට තිබූ රු.මිලියන 119.758ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල පූර්ණ ප්‍රතිපාදන වෙන්කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට පොළිය ද ඇතුළුව අයකර ගැනීමට නොහැකිව තිබූ සම්පූර්ණ ණය මුදල රු.මිලියන 190.157ක් විය.		අතර ලබා දී ඇති ණය මුදල් හා පොළී අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.	විවිධ උත්සහයන් දරා ඇත. කෙසේ වුවද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව 2014 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් මේ සඳහා පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.	වර්ෂයේ සිට විවිධ උත්සාහයන් දරා ඇතත් මේ දක්වා අයකර ගෙන නොමැත. හලාවත වැවිලි සමාගමට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු කල්බදු කුලියෙන් මෙම ණය හා පොළිය අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව ඇති හැකියාව පිළිබඳ විමර්ෂනය කරමින් ඇත.
(ඇ)	ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව දිනකට රු.900ක දෛනික වැටුප් ගෙවීමේ පදනම මත වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින්ද ඇතුළුව සේවකයින් 23 දෙනෙකු බඳවා ගැනීමට වතු අධිකාරීන් විසින් කටයුතු කර තිබුණි.	2023	සමාගමේ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල වන පරිදි නිසි අධිකාරී අනුමැතිය මත බඳවා ගැනීම් සිදු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	දෛනික වැටුප් ගෙවීමේ පදනම මත නිසි අනුමැතීන් මත බඳවා ගැනීමට මේ දක්වා කටයුතු කර නොමැත.

3.10 සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

* සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව 2021, 2022 හා 2023 වර්ෂවලට අදාල ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නැත. (අවසන්වරට 2011.03.31 දිනට ගිණුම් සකස්කර ඇත.)

** 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	අංක අමප/22/2180/616/034 හා 2023 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාස 06ක කාලයක් තුළ සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව ඇවර කිරීමට යටත්ව 2022 දෙසැම්බර් 01 දින සිට බලාත්මක වන පරිදි නිසි බලධාරියෙකු පත්කර තිබුණු නමුත් එම කාලසීමාව ඉක්මවා වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද සංස්ථාව ඇවර කිරීමේ කටයුතු මෙතෙක් අවසන් කර නොතිබුණි.	2023	අංක අමප23/1428/616 /025-1 හා 2023 සැප්තැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මගින් 2023 ජූලි 01 සිට මාස 4 ක කාලයක් සඳහා පමණක් කාලය දීර්ඝ කිරීමක් ලබා දී තිබූ නමුත් 2024 මාර්තු 31 දක්වාම ඇවර කිරීම අවසන් කර නොතිබුණු අතර ඇවර කිරීම කඩිනමින් අවසන් කල යුතුය.	2023 නොවැම්බර් 01 දින සිට නිසි බලධාරියෙකු පත්කර නොමැති බැවින් සංස්ථාව ඇවර කිරීමට නිසි බලධාරිවරයෙකු පත්කිරීම පිළිබඳව කටයුතු සම්පාදනය වෙමින් පවතී.	ඇවර කිරීමේ කටයුතු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

(ආ)	රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කර කුඩා රබර් වතු හිමියන්ට සහන සැලසීම සඳහා 1999 වර්ෂයේදී හා 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් මෙම සමාගමට ලබාදී තිබූ උප ණය මුදලින් 2023 මාර්තු 31 දිනට උපචිත උප ණය මුදල රු.මිලියන766.74ක් හා උපචිත පොළිය රු.මිලියන612.80ක් වුවද වගකීම් පියවීමට ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදුදීමටත් එහි යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීමටත් 2019 අප්‍රේල් 24 දිනැති අංක අමප/19/0985/117/031 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇතත්, එම උපදෙස් ක්‍රියාත්මක කර ඉහත උප ණය ඇතුළු සංස්ථාවේ වගකීම් පියවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.	2023	යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අප්‍රමාදව වගකීම් පියවීමට කටයුතු කළ යුතුය.	ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාවේ යන්ත්‍රසූත්‍ර තක්සේරු මිලට වඩා අඩු මිලකට අලෙවි කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. තක්සේරු මිලට වඩා අඩු මිලකට යකඩ භාණ්ඩ අලෙවියට අනුමැතිය ලබා දිය නොහැකි බවට හා එම භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලයට උපදෙස් දී ඇත.එසේම සමාගම ඇවර කිරීමේදී වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන මුදල් භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති හිඟ උප ණය හා පොළී ගෙවීමට යොදා ගැනීමට උපදෙස් ලබා දී ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ක්‍රියාත්මක වී අදාළ වගකීම් පියවීමට මේ දක්වා කටයුතු කර නොමැත.
(ඇ)	සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව සතු කර්මාන්තශාලා 06 න් 04ක් බදු දී තිබුණු අතර එයින් එක් කර්මාන්තශාලාවක් බූදල් නඩුවක්	2023	අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි යන්ත්‍ර සූත්‍ර තක්සේරු කර ප්‍රසම්පාදන ක්‍රමවේද මගින් අලෙවි කිරීමටත් කර්මාන්ත ශාලාව බදු දීමටත්	ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්ත ශාලාවේ යන්ත්‍ර සූත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ අලෙවි කිරීමට හා ඊට පසු සුදුසු ආයෝජකයකුට බදු දීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ	අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව මේ දක්වා කටයුතු කර නොමැත.

	මාර්ගයෙන් ඉඩමේ අයිතිකරු විසින් පවරා ගෙන තිබුණි. අනෙක් කර්මාන්තශාලාව වන ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදු දීමට හා එහි යන්ත්‍ර සූත්‍ර ඇතුළු වත්කම් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර විකිණීමට 2016 නොවැම්බර් 09 ,2019 අප්‍රේල් 24 හා 2023 මාර්තු 08 දිනැති පිලිවෙළින් අංක අමප/16/1902/726/041, අමප/19/0985/117/031 හා අංක අමප/23/0225/616/006 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මගින් අනුමැතිය ලබා දී තිබුණද වසර 7කට වැඩි කාලයක් ගත වුවද එම කාර්යයන් මේ දක්වා ඉටුකර නොතිබුණි.		කඩිනමින් පියවර ගත යුතුය.	කොමිෂන් සභාව වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.	
(ඇ)	විගණනය වෙත ලද තොරතුරු අනුව ඇරෝමා නැවුරල් රබර් (පුද්) සමාගම වෙත බදු දී තිබුණු මාවනැල්ල කේන්ද්‍ර අපසාරී,මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් කර්මාන්තශාලා තුනෙන් වර්තමානය වන විට බදු මුදල් ගෙවනු ලබන්නේ මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා	2023	බදු ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ලබා දිය යුතුය.	වැඩි වූ බදු මුදල් වර්තමානයේ දී අය කරයි.	බදු මුදල් නොගෙවන කර්මාන්තශාලා වලින් බදු මුදල් අයකර ගැනීම හා ගිවිසුම් ප්‍රකාරව වැඩි වූ බදු අයකර ගැනීම සිදු වී නොමැත.

		දෙක පමණක් වන අතර බදු ගිවිසුම් කොන්දේසි අංක 05 අනුව 2021 මාර්තු 14 සිට වැඩි විය යුතු බදු කුලිය අයකරගෙන තිබුණ ද 2017 මාර්තු 13 දින සිට 2021 මාර්තු 13 දක්වා කාලය සඳහා වැඩි වූ බදු කුලිය එනම් රු.3,908,016ක් අයකරගෙන නොතිබුණි. එසේම 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා මෙම කර්මාන්තශාලා දෙකෙහි අය වූ බදු කුලිය සම්බන්ධ විස්තරද විගණනයට ඉදිරිපත් නොවුණි.			
(ඉ)	2014 වර්ෂයේ සිට පවතින බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණු අතර බදු ගිවිසුම්වල 5 වන වගන්තිය පරිදි බදු ගැණුම්කරුගේ කොන්දේසි xi ප්‍රකාරව බදු ගැනුම්කරු විසින් ගොඩනැගිලි හා අනෙකුත් ස්ථිර ඉදිකිරීම්ද ඇතුළුව සියලු අවදානම් රක්ෂණය කළ යුතු නමුත්, එසේ සිදුකර නොතිබුණි.	2023	බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට හා එහි වගන්ති ප්‍රකාරව ගිවිසුම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	ආයතනය විසින් බදු ගිවිසුම් යාවත්කාලීන කර නොමැත.	බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම හා ගොඩනැගිලි රක්ෂණය සඳහා කටයුතු කර නොමැත.
(ඊ)	සමාගම සතු කර්මාන්තශාලා තුන බදු දෙනු ලබන අවස්ථාවේ දී බදු ගැනුම්කරුවන්ට භාරදුන් ඉන්වෙන්ට්‍රිගත වත්කම් පිළිබඳ ලේඛන	2023	බදු දී ඇති වත්කම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ	බදු දුන් වත්කම් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා මෙතෙක් සකස් කර නැත.	බදු ගැනුම්කරුවන් භාරගත් වත්කම් පිළිබඳ ලේඛණ මේ දක්වා විගණනයට

හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා බදු ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර සහ එම වත්කම්වල පැවැත්ම පිළිබඳ විගණනයට සහතික කර ගැනීමට නොහැකි විය.	යුතුය.	ඉදිරිපත් කර නොතිබුණි.

3.11 ඇල්කඩුව වැව්ලි සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,673,448,658	992,296,484	681,152,174	326,161,829	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

- 2022 හා 2023 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තා 2024 ඔක්තෝබර් 10 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොමැත.
- 2022 හා 2023 වර්ෂ සඳහා ගනුදෙනු වාර්තා සකසමින් පවතී.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II කොටසේ 16 (1) වගන්තිය සහ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 හා 16 වගන්ති ප්‍රකාරව වාරික මුදල් ගෙවීමට සමාගම විසින් කටයුතුකර නොතිබුණු බැවින් අධිභාර මුදල් ද සමග සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට රු. 28,948,985 ක්, සේවක අර්ථසාධක අරමුදලට රු. 276,416,074 ක්, වතු සේවකයින්ගේ අර්ථසාධක අරමුදලට (ESPS) රු.9,603,595	2021	ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි නිරවුල් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරගත යුතුය.	සමාගම ආරම්භයේ සිට පවතින ඌන මුදල් ප්‍රවාහය හේතුවෙන් සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි පරිදි ක්‍රමානුකූලව නිරවුල් කිරීමට සමාගම අපොහොසත් වී ඇත. රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත හා මහා භාණ්ඩාගාරයේ මූල්‍යමය දායකත්වයෙන් හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කිරීමට උත්සහ දරා ඇති නමුත් මෙම හිඟ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට අපොහොසත් වී ඇත. 2022 වසරේ සිට සේවා නියුක්තියන්ගේ	මහා භාණ්ඩාගාරය හරහා හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට රු. මිලියන 522.68ක් ලබාදීමට අනුමැතිය ලැබී ඇත. මුදල් ලැබී නැත.

	ක් හා ලංකා වැව්ලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට (CPPS) රු.17,343,877 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබුණි.			භාරකාර අරමුදල් ගෙවීම් නිසියාකරව සිදුකරන අතර 2023 වසරේ සිට සේවක අර්ථසාධක අරමුදල්, වතු සේවක අර්ථසාධක අරමුදල් සහ පාරිතෝෂික ගෙවීම් යන ව්‍යවස්ථාපිත ගෙවීම් ද නොකඩවා ගෙවනු ඇත.	
(ආ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තිය ප්‍රකාරව සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත සේවකයාට හිමි පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ අනුව නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 1996 වසරේ සිට ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට රු. 171,873,551 ක් විය. 2021 වර්ෂය අවසාන වන විට රු. 51,562,065 ක අධිභාර ප්‍රමාණයක්ද ගෙවිය යුතුව තිබුණි.	2021	ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි ගෙවීම් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කරගත යුතුය.	රේඛීය අමාත්‍යාංශයේ මැදිහත් වීම මත හා මහා භාණ්ඩාගාරයේ මූල්‍යමය දායකත්වයෙන් හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කිරීමට උත්සහ දරා ඇති නමුත් මෙම හිඟ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට අපොහොසත් වී ඇත. 2022 වසරේ සිට සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල් ගෙවීම් නිසියාකරව සිදුකරන අතර 2023 වසරේ සිට සේවක අර්ථසාධක අරමුදල්, වතු සේවක අර්ථසාධක අරමුදල් සහ පාරිතෝෂික ගෙවීම් යන ව්‍යවස්ථාපිත ගෙවීම් ද නොකඩවා ගෙවනු ඇත.	මහා භාණ්ඩාගාරය හරහා හිඟ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීමට රු. මිලියන 522.68ක් ලබාදීමට අනුමැතිය ලැබී ඇත. මුදල් ලැබී නැත.
(ඇ)	කොළඹ විශ්ව විද්‍යාලයේ කළමණාකරන හා මූල්‍ය පීඨය මඟින් 2021 ජුනි ප්‍රකාශයට පත්කල	2021	ඵලදායීතාවයෙන් වැඩි නව රබර් වගාව හා බද්ධ රබර් වගාව තුළින් රබර් නිෂ්පාදනය	සමාගමේ දැනට පවතින රබර් වගාවෙන් 73%ක් ඵලදායීතාවයක් නොමැති ජීවකාලය වසර 60ට වඩා පැරණි	ඵලදායීතාවයෙන් වැඩි නව රබර් වගා කිරීම තුලින් රබර් නිෂ්පාදනය

	පර්යේෂණයට අනුව 2021 වර්ෂයේ හෙක්ටයාරයකට සම්මත රබර් කිරි ඵලදාව කිලෝග්‍රෑම් 800ත් 1000ත් අතර වුවද, සමාගමේ එම අගය කිලෝග්‍රෑම් 326 ත් 711 ත් අතර විය. ඵලදායී ජීව කාලය ඉක්මවූ වගාවන් ඉවත් කර නව වගාවන් සඳහා යොමුවී නොතිබීම රබර් කිරි ඵලදාව පහළ බැසීමට හේතු වී තිබුණි.		ඉහළ නංවා ගැනීමට පියවර ගත යුතුය.	බීජ රබර් වගාවන් වන අතර ඵලදායිතාවයක් සහිත බද්ධ රබර් වගා ප්‍රතිශතය 27% ක් වැනි අඩු අගයක් වී ඇත. 2021 වසරේ පැවති අධික වර්ෂාව හේතුවෙන් හපුගස්පිටිය වතුයායේ දින 110ක් ද නාලන්ද වතුයායේ දින 124ක් ද මිල්ලවාන වතුයායේ දින 110ක් ද බැගින් කිරි කැපීමට නොහැකි වීමද රබර් ඵලදාව අඩුවීමට හේතු සාධක වී ඇත.	ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	වැටුනු පොල් සඳහා කර්මාන්තයේ සම්මතය සියයට 5ක් වුවද සමාගමේ 2021 වර්ෂයේ සත්‍ය පොල් ඵලදාව 1,060,867ක් වන අතර වැටුණු පොල් ගෙඩි ගණන 316,618ක් වූයෙන් එය සම්මත ප්‍රමාණයට වඩා සියයට 25ක වැඩි වීමකි.	2021	පොල් කැඩීමේ කාර්යය නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් වැටුණු පොල් ප්‍රතිශතය අවම කරගැනීමට කටයුතු කළ යුතුය.	දැනට ක්ෂත්‍රයේ ගස් නැගීම මගින් පොල් කඩන්නන්ගේ ඇති හිහකම සහ අධික උසකින් යුත් පොල් ගස් නැගීමට මැලිකමක් දැකිවීම නිසා පොල් වැටීමේ ප්‍රතිශතය දිගින් දිගටම ඉහල ගොස් ඇත. කොවිඩ් 19 වසංගතය හමුවේ විටන් විට රට වසා තැබීමට සිදුවූ නිසා කොන්ත්‍රාත්කරුවන් පොල් කැඩීමට ගෙන්වා ගැනීමට නොහැකි වීම වැටෙන පොල් ප්‍රමාණය වැඩි වීමට හේතු වී ඇත.	පොල් කැඩීමේ කාර්යය නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් වැටුනු පොල් ප්‍රතිශතය අවම කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඉ)	මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත පාලක මණ්ඩලය අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික	2021	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා නියමිත දිනට විගණනය සඳහා	2021 වසරේ විගණන වාර්තාව ලද විගස දැනටමත් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති 2022 හා 2023 වසරට අදාළ	2024 ඔක්තෝබර් 10 දින වන විටත් 2022 හා 2023 වර්ෂයන්හී මූල්‍ය ප්‍රකාශන හා

වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2024 ජූනි 14 දින වන අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මේ දක්වා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	ඉදිරිපත් කළ යුතුය.	කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන අතර 2024 ට අදාල අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද මේවන විටත් කටයුතු කරමින් පවතී.	කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.

3.12 සී/ස මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,411,591,607	10,949,241,250	300	634,734,765	ව්‍යාවනය කළ මතය
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	පාලන ගිණුම් පවත්වා නොගෙන පොදු ලෙජරයේ ගිණුම් 6645ක් පමණ සමාගම විසින් පවත්වාගෙන ගොස් තිබුණි. තවද ගිණුම් කේතයක් නොමැතිව ලෙජර් ගිණුම් 496ක් පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.	2021	පොදු ලෙජරයේ ගිණුම් සෑදීමට පෙර නිසි පරිදි අධිකාරිත්වය පැවරීම හා ශක්තිමත් පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.	එකඟ වේ. දැනට භාවිතා වන ගිණුම්කරණ මෘදුකාංගය ඉදිකිරීම් කර්මාන්තයේ ස්වභාවයට ගැලපෙන පරිදි සකස් කරන ලද පද්ධතියක් නොවේ.	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.
(ආ)	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත ඡේද 21.15 සහ 21.16 ට අනුව දැනට පවතින නීතිමය නඩු 04ක් සහ අවිනිශ්චිත වගකීම් රුපියල් මිලියන 498 ක් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනට සමාගම හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	2021	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත ඡේද 21.15 සහ 21.16 ට ට අනුව කටයුතු කල යුතුය.	එකඟ වේ. ඉදිරි වාර්තාවල අදාළ තොරතුරු හෙළි කිරීමට අපි බලාපොරොත්තු වෙමු.	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.
(ඇ)	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත ඡේද	2021	සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන	එකඟ නොවේ. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.

	33 ට අනුව, සම්බන්ධිත පාර්ශව ගණුදෙනු වලට අදාළ නිසි හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කර නොතිබුණි.		ගිණුම්කරණ ප්‍රමිත ඡේද 33 ට අනුව කටයුතු කල යුතුය.	සවිස්තරාත්මකව සටහන අංක 13.1 හි සඳහන් කර ඇති අතර, එකතුව මූල්‍ය තත්ව ප්‍රකාශනයට සම්බන්ධ කර ඇත.	
(ඇ)	පිරියත සහ යන්ත්‍රෝපකරණවල ආරම්භක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට අනුව රුපියල් මිලියන 1,081 ක් වූ අතර ස්ථාවර වත්කම් ලේඛනයට අනුව එය රු. මිලියන 984 කි. මේ අනුව වෙනස රුපියල් මිලියන 96 ක් විය.	2021	මූල්‍ය ප්‍රකාශන සඳහා නිවැරදි සංඛ්‍යා ලේඛන ගත යුතු අතර වෙනස්කම් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ වේ. ආරම්භක ශේෂයන් පිටපත් කරන විට, පිටපත් කිරීමේ දෝෂයක් තිබිය හැක. ඉදිරි වාර්තා වලදී ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට අපි බලාපොරොත්තු වෙමු.	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.
(ඉ)	සමාගම විසින් පිරිවැය දැරූ අවස්ථාවේ දී ව්‍යාපෘති අනුව ඉදිකිරීම් පිරිවැය හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘතිය සහතික කර නොතිබූ විට දරන ලද පිරිවැය කොන්ත්‍රාත් කෙරීගෙන යන වැඩ වෙත නැවත මාරු කර ඇත. ඒ අනුව, සමාගම විසින් වියදම් වත්කමක් ලෙස හඳුනාගෙන ඇත. මේ හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් සහ ලාභය රු. මිලියන 853 කින් අධිගණනය වී තිබුණි.	2021	කොන්ත්‍රාත් පිරිවැය ආදායමට සමගාමීව දරන ලද කාලයට අනුව හඳුනාගත යුතු අතර එම ඉදිකිරීම් සමාගමට වත්කම් නොවන බැවින් දරන ලද පිරිවැය මූල්‍ය ප්‍රකාශන යටතේ වෙනම වත්කමක් ලෙස හඳුනා නොගත යුතුය.	එකඟ නොවේ. උප කොන්ත්‍රාත් සඳහා ආදායම සහ වියදම් වැඩ නිම කිරීමේ අදියරට අනුව හඳුනා නොගන්නේ නම් අදායම හා වියදම දරන ලද අවස්ථාවේදී ඊට සමගාමීව හඳුනාගනු ලබයි.	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.
(ඊ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල	2021	වෙනස්කම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය.	එකඟ වේ. ඉදිරි වාර්තාවලදී වැරදි නිවැරදි කර ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කිරීමට අපි	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.

	පිළිවෙලින් රු. මිලියන 5,786.94 ක් සහ රු. මිලියන 6,857.93 කි. කෙසේ වෙතත් මාර්ග සංවර්ධන අධිකාරියේ මුල්‍ය ප්‍රකාශනවලට අනුව අදාළ ශේෂය රු. මිලියන 8,030.04 ක් සහ රුපියල් මිලියන 6, 016.56 කි. ඒ අනුව පිළිවෙළින් රුපියල් මිලියන 2,243.10 ක් සහ රුපියල් මිලියන 841.37 ක වෙනසක් නිරීක්ෂණය විය. සැසඳීම් විගණනයට ඉදිරිපත් නොවුණි.			බලාපොරොත්තු වෙමු.	
(උ)	2023 මාර්තු 20 වැනි දින අංක CP/23/0394/608/033 කැබිනට් තීරණයට අනුව මෙම සමාගම ඇතුළුව සමාගම් තුන ඇවර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කර තිබුණි. කෙසේ වෙතත්, සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත ඡේද 3.9 අනුව මූල්‍ය ප්‍රකාශනයේ එය අනාවරණය කර නොතිබුණි	2021	සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කල යුතුය.	එකඟ වේ. අපි අනාගත වාර්තා වල ඇවර කිරීම / අඛණ්ඩ පැවැත්ම යන තත්වය හෙළිදරවු කිරීමට බලාපොරොත්තු වෙමු.	2022 ගිණුම් වාර්තා ඉදිරිපත් කර නොමැත.
(එ)	2007 අංක 07 දරන සමාගම් පනත හි 78 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් කොටස් සහතික නිකුත් කර නොතිබුණි.	2021	රජයේ අයිතිය සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතුයි.	අදහස් දක්වා නොමැත.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.

(ඒ)	2004 අගෝස්තු 18 දිනැති අංක 04/0848/004/013-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ජාතික සංගමය සමඟ ඒකාබද්ධ හවුල් ව්‍යාපාරයට එළැඹීමට අනුමැතියක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, එකී කැබිනට් අනුමැතියට අනුව ඒකාබද්ධ හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම වෙනුවට වගකීමෙන් සීමිත පුද්ගලික සමාගමක් ස්ථාපිත කර ඇති බව නිරීක්ෂණය විය.	2021	රජයේ අයිතිය සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.
(ඔ)	2013 පෙබරවාරි 18 දිනැති අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ අයිතියෙන් වැඩි කොටසක් භාණ්ඩාගාරයට හිමිවන පරිදි හා ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට තීරණය කර තිබුණද, සමාගම විසින් සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කර නොතිබුණි.	2021	සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	එම තීරණය ක්‍රියාත්මක කිරීම රේඛීය අමාත්‍යාංශයේ වගකීම වේ. හිටපු සභාපතිවරයා මේ බව රේඛීය අමාත්‍යාංශයට දන්වා සිටි අතර ඒ සඳහා පියවර ගෙන නොමැත.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.

(ඕ)	මාර්ග කිලෝමීටර් 100000 ව්‍යාපෘතියේ වැඩ ඇණවුම්වලට අදාළව, 2021 වර්ෂයේදී සමාගමේ ඉලක්ක ගත මාර්ග ඉදිකිරීම් සංඛ්‍යාව 1934 වූ අතර දිග කිලෝමීටර් 3010.69 කි. නමුත් 2021 දෙසැම්බර් 31 වන විට නිම කරන ලද මාර්ග සංඛ්‍යාව 774ක් වූ අතර එහි දිග කිලෝමීටර් 1106.11ක් විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 වන විට සමස්ත ප්‍රගතිය සියයට 40ක් වූ අතර සමාගම අපේක්ෂිත ප්‍රගතියෙන් සියයට 50ක භෞතික ප්‍රගතියක් වත් ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021	නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය.	මාර්ග සංවර්ධන අධිකාරියෙන් කොන්ත්‍රාත්තු නිකුත් කළද, පාස්කු ප්‍රහාරයෙන් පසු පිපිරුම් ද්‍රව්‍ය නොමැතිකම, කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් සමාගමට අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය.	තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.
(ක)	සමාගම සේවා සපයන්නන් තෝරාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකළ අතර තෝරාගත් සේවා සපයන්නන්ට හිතකර නිර්ණායක කිහිපයක් ඇතුළත් අයදුම්පතක් සම්පූර්ණ කිරීමෙන් සේවා සපයන්නන් ලියාපදිංචි කර ඇත. ඒ අනුව සේවා සපයන්නන් තෝරාගැනීමේදී සමාගම විනිවිදභාවයකින් තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.	උප කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා සමාගම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කළේ නැත. ලියාපදිංචි උප කොන්ත්‍රාත්කරුවන් ඇගයීම මගින් කොන්ත්‍රාත් ප්‍රදානය සිදු කර ඇත.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.

(ග)	මිල ගණන් කැඳවා සේවා සපයන්නන්ගෙන් තරඟකාරී මිලක් ලබා ගැනීම වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ප්‍රමාණ බිල්පතෙහි වටිනාකමට අමතරව උප කොන්ත්‍රාත් වටිනාකමට ලාභ ප්‍රතිශතයක් එකතු කර තිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.	ප්‍රමාණ බිල්පතට ස්ථාවර ලාභ ප්‍රතිශතයක් එකතු කර තිබුණි. සියලුම පාර්ශවයන් ප්‍රමාණ බිල්පතේ අගය සහ ස්ථාවර ලාභ ප්‍රතිශතය දනී. එබැවින් සමාගම තරඟකාරී ලංසු තැබීමක් සිදු නොකරයි.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.
(ච)	සමාගම කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹීම වෙනුවට උප කොන්ත්‍රාත්කරුවන් සමඟ සේවා සපයන්නන්ගේ ගිවිසුම්වලට එළඹී තිබූ බව නිරීක්ෂණය විය.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.	සමාගම විධිමත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.
(ඡ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 39 උප ග්‍රන්ථයෙහි 5.3.5 වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 150 සිට රු. මිලියන 300ක කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට සී 3 ශ්‍රේණියේ සහ රුපියල් මිලියන 50ත් රු. මිලියන 150ත් අතර කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට සී 4 ශ්‍රේණියේ විය යුතුය. කෙසේ වෙතත්, නියැදි විගණනයේ දී රුපියල් මිලියන 150 ඉක්මවන අවස්ථා 2ක දී සහ රුපියල් මිලියන 50 ඉක්මවන අවස්ථා 6ක දී	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.	එකඟ නොවේ. එක් එක් ශ්‍රේණි සඳහා මූල්‍ය සීමාව 2020 නොවැම්බර් 26 දිනැති අංක 20/1952/319/018 කැබිනට් පත්‍රිකාව මගින් සංශෝධනය කරනු ලැබ ඇත. සී 4 ශ්‍රේණිය සඳහා උපරිම මූල්‍ය සීමාව රු. මිලියන 900 ක් සහ සී 3 ශ්‍රේණිය රු. මිලියන 1500 කි.	තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.

	සී 7 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තු ලබා දී ඇති බව නිරීක්ෂණය විය.				
(ට)	සේවා සැපයුම් ගිවිසුමේ අංක 3 (උ) වගන්තියේ සඳහන් වූයේ කාර්ය සාධන සුරක්ෂිතභාවය ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක් විය යුතු බවයි. කෙසේ වෙතත්, සමාගම විසින් කාර්ය සාධන සුරක්ෂිතතාව ලබාගෙන ඇත්තේ සම්පූර්ණ වැඩ ඇණවුම් 1753, පිරිවැය රු. මිලියන 125,730 කින් වැඩ ඇණවුම් 145, පිරිවැය රු. මිලියන 1,113 ක් වටිනාකමින් යුත් වැඩ ඇණවුම් සඳහා පමණක් බව නිරීක්ෂණය විය.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.	අදහස් දක්වා නොමැත.	තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.
(ඩ)	2020, 2021 සහ 2022 වර්ෂවල කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා සමාගමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු. මිලියන 193,518 ක වැඩ නියෝග 2481ක් ප්‍රදානය කර ඇත. එම වැඩ ඇණවුම් 2481 යෙන් රු. මිලියන 32,736 ක වැඩ ඇණවුම් 351 ක් අවලංගු කර ඇති අතර රු. මිලියන 29,130 ක වැඩ ඇණවුම් 306 ක ඉදිකිරීම්	2021	තරඟකාරී මිල ගණන් වල සහ පළපුරුදු කොන්ත්‍රාත්කරුවන්ගේ සේවාවන්හි උපරිම ප්‍රතිලාභ රජයට ලබා ගැනීමට නම්, කොන්ත්‍රාත් ප්‍රදානය විවෘත තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියට අනුව සිදු විය යුතුය.	මධ්‍යස්ථයි.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.

	කටයුතු ආරම්භ කර නොතිබුණි. රු. මිලියන 5,920 ක වැඩ ඇණවුම් 71 ක් සෘජුව සිදු කිරීම සඳහා සමාගම විසින් භාරගෙන තිබූ අතර එය මුළු වැඩ ඇණවුම්වලින් සියයට 03 ක් පමණි. ඉතිරි ඇණවුම් 1,753, රු. මිලියන 125,730 ක මුළු ඇණවුම් වටිනාකමෙන් සියයට 97 ට සමාන උප කොන්ත්‍රාත්තු ප්‍රදානය මාර්ග සංවර්ධන අධිකාරියේ 2008 අගෝස්තු 01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට පටහැනිව බාහිර සේවා සපයන්නන් හරහා සිදු කරන ලදී.				
(ණ)	මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එච් එස් ආර් රේටයන් මත සියයට 25 ක ලාභ ආන්තිකයක් එකතු කර තීරණය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම මත සමාගමට වැඩ ඇණවුම් ලබා දී තිබුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, සේවා සපයන්නන්ට එකවර දෙන මුදල මත කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර සේවා සපයන්නන්ට වැඩ ඇණවුම් මගින් නියම කර ඇති වටිනාකමෙන් සියයට 20 ක ලාභ ආන්තිකයක් ලැබෙන අතර ඉතිරි සියයට 05 සමාගම විසින් තබා ගන්නා ලදී.ඒ අනුව	2021	රජයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා රජයේ අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කළ යුතුය.	අදහස් දක්වා නොමැත.	වර්තමාන තත්වය නිරීක්ෂණය පරිදිම වේ.

	සමාගම ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට මැදිහත් නොවී මාර්ග සංවර්ධන අධිකාරිය සහ සේවා සපයන්නන් අතර අතරමැදියෙකු ලෙස ක්‍රියා කිරීමෙන් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අනුව රුපියල් මිලියන 652 ක් උපයාගෙන තිබුණි.					
(ත)	සමාගම විසින් 2020 වර්ෂය තුළ කිලෝමීටර් 100,000 මාර්ග ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් ප්‍රගතිය ඇගයීම සඳහා පළාත්, දිස්ත්‍රික් සහ කලාප සම්බන්ධීකාරකවරුන් බඳවා ගෙන තිබූ අතර, 2021 වර්ෂය තුළ සම්බන්ධීකාරකවරුන්ට ගෙවීම් වශයෙන් රු.මිලියන 39ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සම්බන්ධීකාරකවරුන් බඳවා ගැනීමට අදාළ තොරතුරු සහ සම්බන්ධීකාරකවරුන් විසින් සපයන ලද ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත්නොවුණි. එබැවින්, සුදුසුකම් ලත් පිරිස් විධිමත් හා විනිවිදභාවයකින් බඳවා ගත්තේද හා කාර්යය ප්‍රගතිය ඇගයීමෙන් පසු සම්බන්ධීකාරකවරුන්ට ගෙවීම් කර තිබේද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය.	2021	සම්බන්ධීකාරකවරුන් සඳහා කාර්යය ප්‍රගතිය ඇගයීමෙන් පසු මුදල් ගෙවිය යුතු අතර අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කල යුතුය.	එකඟ නොවේ.පළාත් පාලන නියෝජිතයින්ගේ උපදෙස් මත සම්බන්ධීකාරකවරුන් තෝරා ගන්නා ලදී. සමාගම විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය කර ඇති අතර, ඔවුන්ගේ සුදුසුකම් ඇගයීමට ලක් කරන ලදී.	තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.	

3.13 සී/ස මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	240,820,147	182,177,970	58,642,177	7,117,410	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ජේද අංක 13 ට අනුව, සමාගමට අයත් රුපියල් මිලියන 43.94 ක බිටුමන් තොගයක් 2014 වසරේ සිට ඔරුමික්ස් ලංකා භාරයේ තිබෙන අතර එය 2021 දෙසැම්බර් 31 වන විට භෞතිකව තහවුරු කර නොතිබුණි. එබැවින් තොගයේ පැවැත්ම සහ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවුණි.	2021	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ජේද අංක 13 ට අනුව කටයුතු කළ යුතුය.	විමර්ෂණ වාර්තාව ඉදිරිපත් කර ඇත.	2021 වර්ෂයෙන් පසුව ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.
(ආ)	ECB ජාත්‍යන්තර සමාගමට ගෙවිය යුතු හිඟ ශේෂය රු. 24,500,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 08 ක් පුරා නිරවුල් නොවී පැවතුණි.	2021	ගෙවිය යුතු ලෙස හඳුනාගැනීමට පෙර ගණකාධිකාරිවරයා විසින් යෝග්‍ය සාක්ෂි රැස්කරගත යුතුය.	වාණිජ මහාධිකරණයේ අධිකරණ නඩුවේ තීන්දුව ලැබෙන තුරු එම ගෙවීම නතර කිරීමට සමාගම් කළමනාකාරිත්වය	2021 වර්ෂයෙන් පසුව ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.

	කෙසේ වෙතත් ශේෂය සඳහා තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.				තීරණය කර ඇත.
(ඇ)	නිල වාහනයකට හිමිකම් ඇති නිලධාරියෙකු නිල වාහනය භාවිතා කිරීමට හෝ මාසිකව රු.50,000 ක ප්‍රවාහන දීමනාවකට හිමිකම් ලබයි. කෙසේ වෙතත්,සමාගම විසින් නිලධාරීන් හතර දෙනෙකු සඳහා හිමි සිමාවන් ඉක්මවා රු.3,140,000 ක් 2021 වර්ෂය තුල ගෙවා තිබුණි.	2021	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කල යුතු අතර වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	අදහස් නොමැත.	දක්වා වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.
(ඈ)	2004 අගෝස්තු 27 දිනැති අංක 04/0848/004/013-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය සහ ඉදිකිරීම් කර්මාන්ත සභාව සමඟ ඒකාබද්ධව හවුල් ව්‍යාපාරයට එළැඹීමට අනුමැතියක් ලබා දී තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ 2004 ජුනි 09 වන දින අංක දරණ 795/2004 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, මහනැගුම ඉමල්ෂන් (පුද්) සමාගම පිහිටුවා තිබුණ ද, ඒ සඳහා	2021	අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ක්‍රියා කළ යුතුය.	අදහස් නොමැත.	දක්වා වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.

	අමාත්‍ය මණ්ඩල අනුමැතියක්, භාණ්ඩාගාර අනුමැතියක් හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.					
(ඉ)	2013 පෙබරවාරි 18 දිනැති අංක 13/0134/505/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගමේ අයිතියෙන් වැඩි කොටසක් භාණ්ඩාගාරයට හිමිවන පරිදි හා ඉතිරි කොටස මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට තීරණය කර තිබුණද, සමාගම විසින් සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කර නොතිබුණි.	2021	සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	අදහස් නොමැත.	දක්වා	වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.
(ඊ)	2007 අංක 07 දරණ සමාගම් පනත පළමු උපලේඛනයේ 28(2) වගන්තිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී සභාපතිවරයා හට තීරක ඡන්දයක් හිමි වූවද එම සමාගම් පනතේ පළමු උපලේඛනයේ 10 (7) විධානයන් අනුව කොටස් හිමියන්ගේ රැස්වීමක සභාපතිවරයා තීරක ඡන්දයක් සඳහා හිමිකම් නොලබයි.	2021	2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූල විය යුතුය.	අදහස් නොමැත.	දක්වා	වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.

	1982 පනතට අදාළ වූ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව සභාපතිවරයාට හිමි තීරක ඡන්දය 2007 අංක 07 දරණ සමාගම් පනතේ පළමු උපලේඛනයේ 10 (7) විධානයන් අනුව අවලංගු වී ඇත. 2018 පෙබරවාරි 20 දින පවත්වන ලද 2016 වර්ෂයන්ට අදාළ වාර්ෂික මහා සභා රැස්වීමේදී ගනු ලැබූ යෝජනාවන් දෙකකදී මාර්ග සංවර්ධන අධිකාරිය ඊට එරෙහිව ඡන්දය ප්‍රකාශ කළ ද සමාගමේ සභාපතිවරයා විසින් ඔහුගේ තීරක ඡන්දය යොදවා එම කරුණු අනුමත කරවා ගෙන තිබුණි.				
(උ)	2023 මාර්තු 20 වැනි දින අංක CP/23/0394/608/033 කැබිනට් තීරණයට අනුව මෙම සමාගම ඇතුළුව සමාගම් තුන ඇවර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කිරීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කර තිබුණි.ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම විගණනයට සැකසහිත වේ. තවද මාර්ග සංවර්ධන අධිකාරියෙහි	2021	සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කල යුතුය.	විධිමත් ක්‍රියා පටිපාටියකින් පසුව සමාගම ඇවර කරුවෙකු පත් කර ඇත. 2023 අගෝස්තු 29 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ඇවර කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත	සමාගම මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇති අතර ඇවරකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොමැත.

	අනුමැතියෙන් තොරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඈවර කරුවෙකු පත්කර තිබුණි.				
(ඌ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ඡේද අංක 33 ට අනුව, සම්බන්ධිත පාර්ශව ගණුදෙනු වලට අදාළ නිසි හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කර නොතිබුණි	2021	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ඡේද අංක 33 ට අනුව කටයුතු කල යුතුය.	එකඟ වේ. 2022 මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය පරිදි හෙළිදරව් කරනු ලැබේ.	2021 වර්ෂයෙන් පසුව ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.
(එ)	2021 වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, මාර්ග සංවර්ධන අධිකාරියේ කොටස් හිමිකම සියයට 50 ක් සහ කොටස් වටිනාකම රු.100 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගම සඳහා වන පාලන අයිතිය සියයට 99ක් සහ කොටස් වටිනාකම රු.1,000,100 ක් ලෙස දක්වා තිබුණි.ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන අතර කොටස් අයිතිය සම්බන්ධයෙන් රු.1,000,000 ක වෙනස්කම් නිරීක්ෂණය විය.	2021	රජයේ හිමිකාරිත්වය සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර සංඛ්‍යා ලේඛන සැසඳිය යුතුය.	අදහස් දක්වා නොමැත	2021 වර්ෂයෙන් පසුව ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.

(ඒ)	සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලැබිය යුතු ලෙස රු. 78,086,970 මුදලක් හඳුනාගෙන තිබුණි.කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉමල්ෂන් නිෂ්පාදන සමාගමට ගෙවිය යුතු ලෙස රු. 61,885,785 ක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව රු. 16,201,185 ක වෙනසක් නිරීක්ෂණය විය.	2021	ශේෂ අතර වෙනස්කම් වලට හේතු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගත යුතුය.	අප රු. 78,086,970 ක් මෙම සමාගම හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර ගණුදෙනු ලෙස හඳුනාගෙන ඇත. එබැවින් මාර්ග සංවර්ධන අධිකාරියේ පොත්වල සඳහන් ප්‍රමාණය ගැන අපට අදහස් දැක්විය නොහැක. ගැලපීම අවශ්‍ය නොවේ.	2021 වර්ෂයෙන් පසුව ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත.
(ඔ)	2007 අංක 7 දරන සමාගම් පනත 78 වගන්තිය අනුව සෑම සමාගමක්ම, එහි යම් කොටසක් වෙන් කළ දින සිට මාස 2ක් ඇතුළත සහ එවැනි ඕනෑම කොටසක පැවරුමක් සමාගමට පැවරූ දින සිට මාස දෙකක් ඇතුළත, එකී සියලුම කොටස්වල සහතිකය සම්පූර්ණ කර ලබා දීමට සූදානම් විය යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවය ප්‍රකාරව සමාගම විසින් නිකුත් කරන ලද කොටස් සහතික විගණන වාර්තාව නිකුත් කරන දිනය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2021	රජයේ අයිතිය සහ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට කටයුතු කළ යුතුයි.	අදහස් දක්වා නොමැත.	නිරීක්ෂණය පරිදිම වේ.
(ඕ)	2007 අංක 7 දරන සමාගම් පනත 133 (1) වගන්තිය අනුව	2021	සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ	අදහස් දක්වා නොමැත.	නිරීක්ෂණය පරිදිම වේ.

	සමාගමේ ශේෂ පත්‍ර දිනයෙන් පසු මාස 6ක් ඉක්මවීමට පෙර සහ පෙර වාර්ෂික මහා සභා රැස්වීමෙන් මාස පහළොවක් ඉක්මවීමට පෙර සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම වර්ෂයකටම වරක් කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක් කැඳවිය යුතු වේ.කෙසේ වෙතත්, සමාගම විසින් 2016 වසරෙන් පසු වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි.		යුතුය.			
(ක)	සමාගමේ ප්‍රාග්ධන දායකත්වයෙන් වැඩි කොටසක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සපයන ලද අතර සමාගමේ ප්‍රධාන ගැනුම්කරු වූයේ මාර්ග සංවර්ධන අධිකාරියයි. තවද, සමාගමේ මෙහෙයුම් සඳහා භාවිතා කරන ස්ථාවර වත්කම්වලින් විශාල ප්‍රතිශතයක් මාර්ග සංවර්ධන අධිකාරිය සතු වේ. නමුත් කොටස් හිමියෙකු ලෙස මාර්ග සංවර්ධන අධිකාරියට කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.	2021	රජයේ වත්කම් හා අරමුදල් පරිහරණය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට මූල්‍ය ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය.	අදහස් නොමැත.	දක්වා	වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් වී නොමැත.

3.14 සී/ස මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	561,612,868	122,790,218	438,822,650	22,639,710	තත්ත්වාගණනය කළ
2022	644,409,151	107,780,179	536,628,972	(4,310,463)	තත්ත්වාගණනය කළ
2023	552,129,467	21,435,583	530,693,884	(20,657,244)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු.24,307,200 ක් වූ අතර, 2023 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.4,086,661 කි. මේ අනුව රු.20,220,539 වෙනසක් නිරීක්ෂණය විය.	2021 2022 2023- කෙටුම්පත් වාර්තාව	මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර සංඛ්‍යා සැසඳීම හා තහවුරු කිරීම් ලබා ගත යුතුය.	මෙම වෙනස්කම්වලට අදාල හේතූන් සමාගම විසින් හඳුනාගෙන ඇති අතර මෙම වෙනස්කම් වලට අදාලව මාර්ග සංවර්ධන අධිකාරිය සමග සැසඳුම් සකසමින් පවති.	නිරීක්ෂණය පරිදිම වේ.
(ආ)	සමාගම 2004 වර්ෂයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පුද්ගලික සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 වර්ෂයේදී නැවත ලියාපදිංචි කරන ලදී. මෙය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වූයේ ශක්‍යතා	2021 2022 2023- කෙටුම්පත් වාර්තාව	සාංගමික ව්‍යවස්ථාවලියට අනුව අරමුණු ලගා කර ගැනීමට කටයුතු කල යුතුය.	අදහස් ඉදිරිපත් කර නොමැත.	නිරීක්ෂණය පරිදිම වේ.

	අධ්‍යයනයන් සහ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා සැපයීමත්, මාර්ග ඉදිකිරීම් කටයුතු හා පුනරුජ්ඨාපන අංශය සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම වුවත් සමාගම ඇවර කිරීම සඳහා මෙහෙයුම් කටයුතු අවසන් කරන තෙක් සිදුකර තිබුණේ කෝල්ඩ් මික්ස් (Cold mix) නිෂ්පාදනය , අලෙවිය හා ඉදිකිරීම් ව්‍යාපෘති පමණි.				
(ඇ)	ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ව්‍යාපාරික අවස්ථා නොමැති අවස්ථාවක, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සමාගම් තුන ඇවර කිරීමට තීරණය කරන ලද අතර මග නැගුම උපදේශන සහ කළමනාකරණ (පුද්ගලික) සමාගමේ සේවකයින් 47 දෙනාම ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය භාවිතයෙන් විශ්‍රාම ගෙන ඇත. කෙසේ වෙතත්, 2023 අගෝස්තු 11 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව, සමාගම ඇවර කිරීමට සහය වීම සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය කාර්ය මණ්ඩලයෙන් කිහිප දෙනෙකු නැවත බඳවා	2023-කෙටුම්පත් වාර්තාව	මෙම ආර්ථික නොවන වියදම් අඩු කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	පසුගිය වසරේ ඇවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වූ බැවින් එම ක්‍රියාවලියට සහාය වීම සඳහා අවම කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමට අපට සිදු විය. ඒ නිසා එවැනි කාලයක් ඇවර කරන්නෙකු පත් කරන තුරු අපි මේ කාර්ය මණ්ඩලය නඩත්තු කර කාර්ය මණ්ඩල සාමාජිකයන් රඳවා ගත යුතුයි. තවද මෙම කාර්යය මණ්ඩලය අප විසින් නඩත්තු කළ යුතු අතර අවම කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීම සඳහා ඔහුගේ අභිමතය පරිදි කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපතිවරයාට භාර දී	2024 ජනවාරි සිට ජුනි මස දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 11,986,057 ක් ගෙවා ඇත.

	ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ අතර සමාගම විසින් කාර්යය පැවරුම් පදනම මත සේවකයින් 25 දෙනෙකු නැවත බඳවා ගෙන තිබුණි. තවද, සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය 2023 දෙසැම්බර් 31 දින දක්වාවත් ආරම්භ කර නොතිබූ අතර නැවත සේවයේ නියුක්ත වූ සේවකයන්ට 2023 සැප්තැම්බර් සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රුපියල් 7,792,993ක් අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය විය. තවද සේවකයින් 25 දෙනෙකු නැවත බඳවා ගැනීමට මණ්ඩලයේ අනුමැතිය සහ බඳවා ගැනීමට සේවකයින් තෝරා ගැනීමේ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.			ඇත.	
(ඇ)	මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සමාගමේ ප්‍රධාන කාර්යාලය, මැදයාය සහ මහව යන්ත්‍රාගාර පිහිටි පරිශ්‍ර සඳහා සමාගම විසින් කුලී ගාස්තු ගෙවා ඇතත්, මාර්ග සංවර්ධන අධිකාරිය සහ සමාගම අතර බදු ගිවිසුමක් හෝ කුලී ගිවිසුමක් අත්සන් කර නොමැත.	2021 2022 2023- කෙටුම්පත් වාර්තාව	කුලී වත්කම් සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගත යුතුය.	අප විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එහි පිරියත හා උපකරණ සහ ගොඩනැගිලි සඳහා වෙත ගෙවිය යුතු සියලුම ගෙවීම් ගෙවා ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමක් අත්සන් කිරීමට අප නොපසුබස්නා උත්සාහයක් ගෙන	නිරීක්ෂණය පරිදිම වේ.

				ඇති බවත් ඔවුන් ඒ සඳහා පියවර නොගත් බවත් අපි ඔවුන්ට නිතර මතක් කර දෙන බවත් සටහන් කිරීමට කැමැත්තෙමු.	
(ඉ)	සමාගම 2016 වර්ෂයේ සිට රු. 28,351,291 ක් ලාභාංශ වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේනමුත් මේ සම්බන්ධයෙන් වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා වාර්ෂික මහසභා රැස්වීම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	2022 2023- කෙටුම්පත් වාර්තාව	ලාභාංශ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා වාර්ෂික මහසභා රැස්වීම් වාර්තා විගණනයට ඉදිරිපත් කල යුතුය.	මෙය ලාභාංශ සඳහා වෙන්කිරීමක් ලෙස සකස් කරන ලදී. කෙසේ වෙතත් මෙම මුදල ගෙවීමට මහා සභා රැස්වීමේදී තීරණයක් ගෙන නොමැත. ඒ නිසා අපි මෙය ජංගම වගකීම් ලෙස ඉදිරියට ගෙන ගොස් ඇත.	නිරීක්ෂණය පරිදිම වේ.
(ඊ)	සමාගම කොටස් 10003 ක් නිකුත් කර තිබූ නමුත්, 2023 අගෝස්තු 31 වන විටත් කොටස් හිමියන් තිදෙනෙකු කොටස් සඳහා ගෙවීම් කර නොතිබුණි. මෙම රු. 300 ලැබිය යුතු දෑ යටතේ ඇතුළත් වේ. කෙසේ වෙතත්, ඈවර කිරීමට පෙර කොටස් හිමියන් සංඛ්‍යාව තීරණය කළ යුතුය.	2022	මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර සංඛ්‍යා සැසඳීම හා තහවුරු කිරීම් ලබා ගත යුතුය.	සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, සමාගම විසින් කොටස් 03 ක් වෙන් කර ඇති අතර මීට පෙර කොටස් සහතික නිකුත් කර නොමැත. එබැවින් සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන 2017 දී ඒවා නිකුත් කර ඇත.	නිරීක්ෂණය පරිදිම වේ.
(උ)	2007 අංක 7 සමාගම් පනතේ 133 වගන්තිය අනුව සමාගමේ ශේෂ පත්‍ර දිනයෙන් මාස හයකට නොඅඩු සහ පෙර වාර්ෂික මහා සභා රැස්වීමෙන් මාස පහළොවක් ඉක්මවීමට පෙර සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම	2022 2023- කෙටුම්පත් වාර්තාව	සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය.	අදහස් ඉදිරිපත් කර නොමැත.	නිරීක්ෂණය පරිදිම වේ.

	වර්ෂයකට වරක් කොටස්හිමියන්ගේ වාර්ෂික මහ සභා රැස්වීමක් කැඳවිය යුතු වේ.කෙසේ වෙතත් සමාගම විසින් කොටස්හිමියන්ගේ වාර්ෂික මහ සභා රැස්වීමක් 2019 වර්ෂයෙන් පසු පවත්වා නොතිබුණි.				
(ඌ)	නොවැම්බර් 16 දිනැති 01/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් රාජ්‍ය ව්‍යාපාර සඳහා හඳුන්වා දුන් මෙහෙයුම් අත්පොතේ 6.9 ඡේදය අනුව රජය සතු ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමිත ක්‍රියාවලියක් සිදු කිරීමෙන් පාඩු කපා හැරිය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සම්බන්ධිත පාර්ශ්වවලින් අයවිය යුතු මුදල්වලින් රු.12,658,780ක් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ගෙවිය යුතු මුදලින් රු. 13,809,996 ක් කපා හැර තිබුණි.සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ අදාළ මණ්ඩල අනුමැතිය පමණි.	2023-කෙටුම්පත් වාර්තාව	නිවැරදි කරන ලද කපා හැරීමේ අගය නැවත ගැලපීමට කටයුතු කළ යුතුය. චක්‍රලේඛයේ පරිදි නියමිත ක්‍රියාවලිය අනුගමනය නොකර කපා හැරීම හඳුනා නොගත යුතුය.	අදහස් ඉදිරිපත් කර නොමැත.	නිරීක්ෂණය පරිදිම වේ.
(එ)	සමාගම මාර්ග සංවර්ධන අධිකාරියේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් වුවද, සේවක සංඛ්‍යාව,	2021	අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) හඳුන්වා	මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමණාකරණ සේවා (පුද්ගලික) සමාගමේ	නිරීක්ෂණය පරිදිම වේ

වැටුප් ව්‍යුහය සහ සමාගමේ නිලධාරීන්ට ගෙවන අනෙකුත් දීමනා සඳහා අනුමැතිය මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන්, අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයකින් ලබාගෙන නොතිබුණි. ඒ අනුව සමාගම අධිකාරියේ සහ අමාත්‍යාංශයේ පාලන බලය ඉක්මවා කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

දිය යුතුය.

ව්‍යාපාර කටයුතු සිදු කිරීමට සහ පිරිවැය-ඵලදායිතාවයෙන් ක්‍රියා කිරීමට අවම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යයි.

3.15 සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම (2021-2023)

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	20,418,328,166	17,407,884,294	3,010,443,872	313,634,970	තත්වාගණනය කළ
2022	22,292,652,703	19,216,903,050	3,075,749,653	234,154,823	තත්වාගණනය කළ
2023	21,124,922,024	17,692,643,357	3,432,278,667	501,143,796	තත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 වර්ෂයේදී විදේශීය පොහොර සැපයුම්කරුවන් සඳහා මහජන බැංකුවෙන් ගෙවීම් කර එම මුදල දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කර ඇතත් එම ණය මුදලට බැංකුව විසින් අයකළ පොලී ප්‍රමාණය වන රු.160,447,581 ක වටිනාකම වෙනත් ලැබිය යුතු දෑ යටතේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්කර තිබුණද එම මුදල සමාගමට ප්‍රතිපූර්ණය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් එකඟතාවයක් නොතිබුණු බවට නිරීක්ෂණය විය.	2020/2021 2021/2022	මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමේ හැකියාව භාණ්ඩාගාරයෙන් තහවුරු කරවා ගත යුතුය.	මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර පොලී මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.	පොළී මුදල ප්‍රතිපූර්ණය කර නොමැත.
(ආ)	2021 ඔක්තෝබර් 18 දින නැනෝ නයිට්‍රජන් දියර පොහොර බෝතල් 100,224ක් ආනයනයට සැපයුම්කරු	2021/2022 2022/2023	සැපයුම්කරුට වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමට අදාළ පියවර ගත යුතුය.	නීතිමය පියවර ගෙන ඇත.	නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අදාළ නීතිමය කටයුතු සිදු වෙමින් පවතී.

	වෙත බෝතලයකට ඇ.ඩොා 12.45.බැගින් රු.253,301,126 ක් ගෙවීම් කර ඇතත් පසුව බෝතලයක මිල ඇ.ඩොා 10 .දක්වා අඩු කර, වැඩියෙන් ගෙවූ රු.49,846,406 ක මුදල හිලව් කිරීමට සැපයුම්කරු එකඟවී තිබුණද විගණිත දින වන විටත් එම මුදල හිලව්කර ගැනීමට සමාගම විසින් කටයුතුකර නොතිබුණු අතර එය අවසන් ගිණුම් වලින් හෙළිදරව්කර නොතිබුණි.				
(ඇ)	2023 සැප්තැම්බර් 30 දින වන විටත් ගොවීන් වෙත බෙදාහැරීම සිදුනොකළ වටිනාකම රු.3,672,270 ක නැනෝ නයිට්‍රජන් දියර පොහොර මි.ලීටර් 500 බෝතල් 1,809 ක් මෙම සමාගමේ ගබඩාවල සහ වටිනාකම රු.1,423,030ක් වන දියර පොහොර බෝතල් 701 ක් සීමා සහිත ලංකා පොහොර සමාගමෙහි ගබඩාවල පවතින බවත් එම සියලු පොහොර 2023 දෙසැම්බර් මාසය වන විට කල් ඉකුත්වීමට නියමිත බවත් විගණනයේදී නිරීක්ෂණය විය. දියර පොහොර ආනයනයේදී හානිවී සහ කාන්දුවී ඇති බෝතල් ප්‍රමාණය 11 ක් වන අතර ආනයනයේදී	2022/2023	කල් ඉකුත් වීමට පෙර පොහොර තොග බෙදාහැරිය යුතුය.	අමාත්‍යාංශයේ බෙදාහැරීම් සැලැස්මක් හෝ උපදෙස් මේ දක්වා ලැබී නොමැත.	මේ පිළිබඳව ලිඛිතව අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

	ඇති වී ඇති ඌනතාවය බෝතල් 7 කි. එහි වටිනාකම රු.36,540 ක් විය.				
(ඇ)	කොළඹ කොමර්ෂල් පොහොර සමාගම පෞද්ගලීකරණය කරන ලද 1994 ජූලි 29 දින සිට නැවත සමාගම රජය විසින් අත්පත්කර ගන්නා දින වන 1997 ජනවාරි 20 යන කාල සීමාව තුළදී විවිධ පෞද්ගලික ආයතන 15 ක් සඳහා ණය පදනම මත පොහොර නිකුත් කිරීම වෙනුවෙන් විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 22 වන විටත් තව දුරටත් අය විය යුතු මුදල රු.22,053,338 ක් විය. මෙම ණය ශේෂය සනාථ කිරීම සඳහා අදාළ ලියවිලි සමාගම සතුව නොපවතින අතර ඒ හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාගම අපොහොසත් වී ඇත.	2022/2023	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	1994 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැති ශේෂයක් වන බැවින් ඊට අදාළ කිසිදු ලේඛණයක් සමාගම සතුව නොමැත. ඒ හේතුවෙන් මෙම ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇත.	ණය ශේෂ අයකර නොමැත.
(ඉ)	2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාගම්වල සේවකයින් සඳහා ඉතිරිකර ගත් නිවාඩු මත දීමනා ගෙවීමේදී එම ගෙවීම් සඳහා සලකා බලන වර්ෂයට පෙර වර්ෂයට අදාළව	2020, 2021 2022, 2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අදාළ ලාභාංශ හා අයබදු ගෙවීමට කටයුතු කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර නොමැත.

	භාණ්ඩාගාරයට ගෙවියයුතු ලාභාංශ/ අයබදු ගෙවා තිබිය යුතු වුවත්, සමාගම විසින් 2019/2020, 2020/2021 හා 2021/2022 වර්ෂවලට අදාළව ගෙවියයුතු ලාභාංශ ගෙවීම් නොකර සමාගමේ සේවකයින් විසින් ඉතිරිකර ගත් කෙටි නිවාඩු හා වෛද්‍ය නිවාඩු සඳහා එකතු වටිනාකම රු.4,113,280 ක නිවාඩු දීමනා හා විධායක ශ්‍රේණියේ නිලධාරීන් ඉතිරිකර ගත් වෛද්‍ය නිවාඩු සඳහා එකතු වටිනාකම රු.1,708,981 ක දීමනා ගෙවා තිබුණි.				
(ඊ)	මහවැලි අධිකාරියට අයත් හම්බන්තොට බදු ඉඩමේ ගබඩාවක් ඉදිකිරීමට සමාගම විසින් 2018/2019 වර්ෂය තුළදී දරා ඇති ප්‍රාරම්භක වියදම්වල එකතුව රු. 3,732,901 ක් වුවද සමාලෝචිත වර්ෂය වන විටද එහි ඉදිකිරීම් කටයුතු ආරම්භකර හෝ වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා භාවිතාකර නොතිබුණි. ඒ අනුව උක්ත වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.	2020, 2021 2021, 2022 2022, 2023	සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.	එක් එක් කාල වකවානුවන්හි සිදු වූ රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීම් හේතුවෙන් සැලසුම් කළ කාර්යය ඉටු කර ගත නොහැකි වී ඇත. එසේ ඉදිරියේ දී මෙම ඉඩම වඩා ඵලදායී කටයුත්තක් සඳහා යොමු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	බදු ඉඩම පිළිබඳ තීරණයක් ගෙන නොමැත.
(උ)	සීමා සහිත කොළඹ	2022,	ණය ශේෂයන්	එකඟ විය නොහැක.	ණය ශේෂ අයකර

කොමර්ෂල් පොහොර සමාගමේ අනුරාධපුර දිස්ත්‍රික් තොග බෙදුම්කරුවෙකු වශයෙන් කටයුතු කරන ලද කෘෂිකාර්මික බෝග වගා කරුවන්ගේ සංවිධානයට ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදාහැරීමට ලබා දී තිබුණු පොහොර ප්‍රමාණයෙන් 2006 අප්‍රේල් 26 වන දින සිට 2009 මැයි 25 යන කාල සීමාව තුළදී සහනාධාර පොහොර මෙ.ටොන් 7,508.45 ක ඌනතාවයක් නිරීක්ෂණය වී ඇති අතර එම තොග ඌනතාවයේ වෙළඳපල වටිනාකම වූ රු.848,003,961 ක අලාභය මේ වන විටත් එම සංවිධානයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම සිදුවීම 2009 වර්ෂයේ වාර්තා වූ සිදුවීමක් වන අතර, සමාගම පාර්ශවයෙන් ගත හැකි සියලු නීතිමය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. අනුරාධපුර මහා අධිකරණයෙහි නඩු කටයුත්තක් මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවති.	නොමැත. නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

3.16 සී/ස ලංකා පොහොර සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	32,098,651,854	25,752,673,375	6,345,978,479	162,590,416	තත්ත්වාගණනය කළ
2022	34,851,369,347	28,461,143,140	6,390,226,207	65,348,609	තත්ත්වාගණනය කළ
2023	31,438,815,909	25,019,403,746	6,419,412,163	112,960,670	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	පොහොර සැපයුම්කරුවන්ගේ ණයවර ලිපි කල් පිරීමේදී ණයවර ලිපි නිකුත්කර ඇති බැංකුව විසින් සමාගම වෙනුවෙන් ගෙවීම් කර ගෙවූ මුදල රුපියල් ණයකට පරිවර්තනය කිරීමේදී එදිනට අදාළව මහ බැංකුව ප්‍රකාශයට පත්කර ඇති විනිමය අනුපාතයට වඩා වැඩි අනුපාතයක් භාවිතා කිරීම හේතුවෙන් එකතු වටිනාකම රු.485,074,407 ක් කෙටිකාලීන ණය වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සමාගමට සිදුවී තිබුණි.	2020, 2021	මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන් ගැලපිය යුතුය.	බැංකුවේ භාණ්ඩාගාර අංශය මගින් දෙනු ලබන විනිමය අනුපාතයට අනුව කෙටිකාලීන ණයකට පරිවර්තනය කරන අතර අප සමාගම වෙත ලබා දෙන එම අනුපාතය පදනම් කර ගනිමින් ගිණුම් තැබීම සිදු කරනු ලැබේ.	මහ බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන් මත ගැලපීම් කර නොමැත.
(ආ)	සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka	2020, 2021	සමාගම සතු සම්පත් වලින් උපරිම ආදායමක් ඉපයීමට හැකි වන	සී/ස ලංකා පොහොර සමාගමේ රසායනාගාරයේ මූලික කාර්ය වනුයේ	මෙම රසායනාගාර උපකරණ 2011/2012

	Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,264,125 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 103 ක් වන අතර ඊට අදාළ ආදායම රු.1,200,140 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතරම මෙම නිසා රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුන බව නිරීක්ෂණ විය.		පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.	ආයතනය විසින් මිලදී ගනු ලබන පොහොර සහ පොහොර ඇසුරුම් ද්‍රව්‍යන්ගේ සහ මිශ්‍රණාගාරයේ සකස් කරනු ලබන පොහොර මිශ්‍රණයන්ගේ තත්ව පරීක්ෂාවන් සිදු කිරීම වේ. උපරිම ආදායමක් ලබාගැනීමට නම් සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් සම්පූර්ණ කර ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ප්‍රතීතන සහතිකය ලබා ගෙන බාහිර සාම්පල පරීක්ෂාව සිදුකරනු ලැබේ.	වර්ෂයන් හිදී මිලදී ගෙන අළුත්වැඩියා සිදු නොකර භාවිතා කර අභ්‍යන්තර සාම්පල් පරීක්ෂාව සිදු කලද බාහිර සාම්පල පරීක්ෂාව සිදු නොකරයි.එසේම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ප්‍රතීතන සහතිකය ලබා ගෙන නොමැත.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති ණයගැති ශේෂය රු.1,066,771,612 ක් වන අතර එම ශේෂය තුළ එනම් වර්ෂ 1-2 දක්වා පැරණි රු.918,765,715 ක ශේෂයක් ද වර්ෂ 2-3 දක්වා පැරණි රු.120,500 ක ශේෂයක් ද වර්ෂ 4-5 දක්වා පැරණි රු.807,650 ක ශේෂයක්ද වර්ෂ 5-6 දක්වා පැරණි රු.56,596,887 ක ශේෂයක්ද වර්ෂ 9-10 දක්වා පැරණි රු.878,607 ක	2022, 2023	ණය අයකර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය.	වර්ෂ 10 කට වඩා වැඩි ශේෂය වූ රු.86,308,870 ක් අයවීමට ඇත.ජනතා වතු සං.මණ්ඩලයෙන් රු.37,993,346 ක්ද,රාජ්‍ය වැවිලි සංස්ථාව රු.35,931,679 ක්ද,නියෝ.කෘෂිකර්ම අධ්‍යක්ෂ අම්පාර රු. 12,543,845 ක් ලෙස පියවීමට ඇත. .	ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා රාජ්‍ය වැවිලි සංස්ථාව යන ආයතන කිසිදු පියවීමක් කර නොමැත.අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙතින් අයවිය යුතු මුදල් ගෙවීම් නොකිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ව වෙත ඉදිරිපත් කල පැමිණිල්ලට කටයුතු සිදු

	ශේෂයක්ද වර්ෂ 10 කට වඩා වැඩි රු.86,502 ,049 ක ශේෂයක්ද පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. වර්ෂ 10 කට වඩා වැඩි ශේෂයෙන් රු.86,308,870 ක්ම රජයේ ආයතන වලින් ලැබිය යුතු ණයගැති ශේෂයන් වන අතර ඒවා නිරවුල් කර ගැනීමට හා නිවැරදිභාවය තහවුරු කර ගැනීමට සමාගම විසින් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.				කරමින් පවතින බව දන්වා ඇත.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයට පැවති කොම්පෝස්ට් මෙ.ටොන් 3,153 ක් රු.38,063,251 ක වටිනාකමකට ඒවා මිලදී ගැනීමේ වාර්තා අනුව පැවති නයිට්‍රජන් ප්‍රතිශතය වර්ගීකරණය කර මිල තීරණය කර තිබුණි. එහෙත් ඒවායේ පවතින නයිට්‍රජන් ප්‍රතිශතය ගබඩා කිරීමේ හා කාලගුණික තත්ත්ව අනුව වෙනස්වීම මත තොගයේ වටිනාකම සලකා බලා නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.	2022/2023	තොග වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	කොම්පෝස්ට් මිළදි ගන්නා අවස්ථාව වන විට නයිට්‍රජන් ප්‍රතිශතය විශ්ලේෂණය කර ඒ අනුව මිළදි ගැනීම හා අළෙවිය සිදු කර ඇත. කාලගුණික තත්වයන්ට අනුව නයිට්‍රජන් ප්‍රතිශතය නිරන්තරයෙන් වෙනස්කම්වලට භාජනය වන බැවින් නැවත විශ්ලේෂණය කිරීම ප්‍රයෝගිකව සිදුකල නොහැකි අතර ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය මත එහි පෝෂණ සංඝටක තීරණය වන බැවින් එහි වෙනස්වීමට අනුව වටිනාකම ගණනය කිරීම ප්‍රයෝගිකව සිදුකල නොහැකිවේ.	මේ වන විට ඉතිරි තොගය මෙ.ටොන් 2158.43 කි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරන කමිටුව මගින් ලබාදුන් උපදෙස් පරිදි ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට නියමිතව ඇත.

(ඉ)	සමාගමේ අභ්‍යන්තර විගණන නිලධාරී අනුමත තනතුරු සංඛ්‍යාව 01ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට තත්‍ය සංඛ්‍යාව 04 ක් විය. එම අතිරික්ත සංඛ්‍යාව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022, 2023	අනුමත කාර්ය මණ්ඩලය පවත්වා ගත යුතු අතර අවශ්‍යතාවයන් නැවත සමාලෝචනය කර කාර්යමණ්ඩලය සංශෝධනය කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.	සීමාසහිත ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කිරීම සිදු කල බැවින් නව සේවක සංයුතිය සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය නොමැත.
(ඊ)	සමාගම සතුව 2023 මාර්තු 31 දින වන විට මෙ.ටොන් 56 ක කල් ඉකුත් වූ රසායනික පොහොර තොගයක් හා මෙ.ටොන් 26.7 ක ඇමදුම් පොහොර (Sweeping) ප්‍රමාණයක් පැවති අතර ඒවා බැහැර කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022, 2023	අදාළ පොහොර සඳහා නිසි අලෙවිකරණ සැලැස්මක් සහිතව කටයුතු කළ යුතුය.	දැනට තොගයේ ඉතිරි වී ඇති කාබනික පොහොර හා කල් ඉකුත් වූ රසායනික පොහොර, ඇමදුම් පොහොර සම්බන්ධයෙන් රසායනාගාරය වෙත නියැදි යොමු කර එම විශ්ලේෂණ වාර්තාව පදනම් කර ගෙන දෙමුහුන් පොහොර වර්ග නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන අලෙවි කිරීමට සැලසුම් කර ඇත.	පොහොර තොග නිකුත් කර නොමැත.
(උ)	රසායනික පොහොර ආනයනය තහනම් කිරීමෙන් පසු රජයේ පොහොර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සමාගමීව පරිසර හිතකාමී පොහොර මිලදී ගැනීමේ වැඩසටහන යටතේ, 2021 සැප්තැම්බර් 15 දිනැති සමාගමේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක	2022, 2023	අදාළ පොහොර තොග සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම පොහොර සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබ ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව නිර්දේශ අනුව කාබනික පොහොර තොග අලෙවියෙන් සැලකියයුතු ලාභයක් උපයාගෙන ඇති	අදාළ පොහොර තොග ගබඩාවන් තුළ ගොඩගසා තිබුණි.

				බැවින් මෙම පොහොර තොග රජයේ ගොවිපල සඳහා නොමිලේ නිකුත් කිරීමට නිර්දේශ කර ඇත.	
	2021/GM/02 මගින් ප්‍රාදේශීය ගබඩා වෙතින් පොහොර සැපයුම්කරුවන් ලියාපදිංචිකොට ගෙන ඔවුන්ගෙන් කාබනික හා කොම්පෝස්ට් පොහොර මිලදී ගැනීමට අවස්ථාව සලසා දී තිබුණි. එසේ මිලදී ගත් පොහොර ඉතා අඩු අලෙවියක් සිදු වී ඇති අතර, 2023 මාර්තු 31 දින වන විට මෙ.ටොන් 902 ක ප්‍රමාණයක් අලෙවි නොවී ගබඩාවන් තුළ ගොඩගසා තිබූ බවත් නිරීක්ෂණය විය.				
(ඌ)	පරිසර හිතකාමී කාබනික පොහොර වැඩසටහන යටතේ යුධ හමුදාව, සිවිල් ආරක්ෂක දෙපාර්තුමේන්තුව සහ අනෙකුත් සුළු පරිමාණ නිෂ්පාදකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර සමාගම විසින් මිලදී ගෙන ගොවීන් වෙත සැපයීම සඳහා අවශ්‍ය හිස් මලු ලක්ෂ 05 ක අවශ්‍යතාවයක් තීරණය කර එයින් ලක්ෂ 2 ක් හදිසි මිලදී ගැනීම් යටතේ 2021 වර්ෂයේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරු වෙතින් එකක් රු.68.98 බැගින් හිස් මලු 200,000 ක්	2022, 2023	පවතින පොහොර මලු භාවිතය සම්බන්ධයෙන් විකල්ප අවස්ථා සළකා බැලීමට කටයුතු කළ යුතුය.	කොම්පෝස්ට් ඇසුරුම්වලට අදාලව පිරිවිතරයන් සම්බන්ධ ඇති වූ ගැටළුව කළමනාකරණ කමිටුවේදි සාකච්ඡා කර ඊට අදාල Bursting Test මගින් අදාල ඇසුරුමේ ශක්තිය පරීක්ෂා කර ඇති බැවින් එම පරීක්ෂාව අනුව පොහොර මල්ල පලුදුවීමක් හා වෙනත් බලපෑමක් නොමැති බවට තහවුරු කර ඇති බැවින් ප්‍රමිතිය පිළිබඳ ගැටළුව නිරාකරණය කර ඇත. මේවන විට විවෘත වෙළඳපලේ පරිහරණය කරන ලද WPP මළු සඳහා වැඩි ඉල්ලුමක් සහ මිළක්	පොහොර මළු සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	මිලදීගෙන තිබුණි. නැවතත් 2021.09.23 දින හදිසි අවශ්‍යතාවය යටතේ මලු 200,000 ක ප්‍රමාණයක් මිලදී ගැනීමට ඇණවුමක් නිකුත් කර තිබුණ ද දෙවන ඇණවුමට අදාළව සැපැයුම් මලුවල පිරිවිතරයන් සමාගමේ පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් ගෙවීම් අත්හිටුවා තිබුණු බවට නිරීක්ෂණය විය. එලෙස හදිසි අවශ්‍යතාවය මත මිලදී ගත් රු.2,909,094 ක් වටිනා හිස් පොහොර මලු 58,596 ක ප්‍රමාණයක් විගණිත දිනය වූ 2024 ජනවාරි 30 දින වන විටත් ගබඩාව තුළ අවුරුදු 02 කට වැඩි කාලයක සිට ගොඩ ගසා තිබුණි. මෙම හිස් පොහොර මලු COMPOST යනුවෙන් මුද්‍රණය කර තිබීම හේතුවෙන් වෙනත් පොහොර ඇසුරුම් කිරීමේ කාර්යක් සඳහා භාවිත කිරීමට හැකියාවක් නොපවතින බව ද තවදුරටත් නිරීක්ෂණය කෙරේ.			ඇති බැවින් දැනට ගබඩාවල ඉතිරි වී ඇති පොලිතින් හා වරක් පරිහරණය කරන ලද හිස් මළු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව තොග වශයෙන් අලෙවි කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම තොගය මිළදි ගැනීමට ගිය වියදම පියවා ගැනීමට හැකි වේ.
(එ)	සමාගම විසින් රු.22,910,795 ක් වැය කර පරිගණක පද්ධතියක් ප්‍රතිස්ථාපනය කර ක්‍රියාත්මක කරගෙන යමින් තිබුණද සමාලෝචිත වර්ෂයේ	2022, 2023	සමස්ත ගිණුම්කරණ ක්‍රියාවලියම ආවරණය වන පරිදි පද්ධතිය භාවිතයට ගැනීමට හැකි වන පරිදි ස්ථාපිත කළ	අවසාන ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය වාර්තා ලබා ගැනීමට හා ගිණුම් සැකසීමට අවශ්‍ය පහසුකම් ව්‍යවසාය සම්පත් මෘදුකාංගය (ERP පද්ධතිය) තුල තිබෙන	ව්‍යවසාය සම්පත් මෘදුකාංග පද්ධතියේ (ERP පද්ධතිය) ඇති වූ ගැටළු හේතුවෙන් පද්ධතිය හා අත්පොත් ක්‍රමය භාවිතා කරමින්

මූල්‍ය ප්‍රකාශන හා ලෙජර ගිණුම් අත්පොත් ක්‍රමයට (Manual) සිදුකර තීබීම හේතුවෙන් විශාල පිරිවැයක් දරා මිලදී ගන්නා ලද පරිගණක පද්ධතිය තුළින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හැකියාව සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත වන අතර ඉහත පරිගණක පද්ධතිය ඵලදායීව උපයෝජන නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

යුතුය.

අතර පද්ධතියෙහි නිවැරදිභාවය පරීක්ෂා කිරීම හා 100%ක් විශ්වාසනීයත්වය ඇති කර ගැනීම සඳහා වසර කිහිපයක් ,එයට සමගාමීව අත්පොත් ක්‍රමයට (Manual) ගිණුම් සැකසීමද සිදු කරනු ලබයි. මෙහිදී අත්පොත් ක්‍රමය සඳහා ලබා ගන්නා තොරතුරු 100% ක්ද ERP පද්ධතිය තුලින්ම ගනු ලබයි.

අවසන් ගිණුම් සකස් කිරීම සිදුකරනු ලබයි.

3.17 මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,033,915,213	11,969,933,029	1,063,982,182	254,921,963	තත්ත්වාගණනය කළ
2022	13,609,021,745	12,382,825,985	1,226,195,760	254,537,724	තත්ත්වාගණනය කළ
2023	14,213,834,474	12,846,100,974	1,367,733,500	302,698,222	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	**ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**				
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව, මුළු ණයගැති ශේෂය රු.මිලියන 2,397 ක් වූ අතර එයින් රු. මිලියන 401.63 ක් සහ රු. මිලියන 67.08 ක් පිළිවෙළින් වසර 03 ත් 05 ත් අතර කාලයක් සහ වසර 05 කට වැඩි කාලයක් හිඟව පැවතුණි.	2022, 2023	ණයගැති ශේෂයන් කඩිනමින් අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ පිළිබඳව ප්‍රධාන කාර්යාලයෙන් මෙන්ම අදාල මුලික කාර්යාල වලින් ද නිරතුරුවම ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2024 ජුනි 30 දින වන විට මුළු ණයගැති ශේෂය රු. මිලියන 2,786.35 ක් වන අතර එයින් රු.මිලියන 380.31 ක් වසර 03-05 ත් අතර කාලයක් සහ රු.මිලියන 100.14 ක් වසර 05 ට වැඩි කාලයක් හිඟව පවතී.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රඳවා ගැනීම (Retention Receivable) රු.මිලියන 2,962.35 ක් වූ අතර මෙයින් රු.මිලියන 659.28 ක් වූ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළ රඳවා ගැනීම්වලින්	2022, 2023	ප්‍රමාදයකින් තොරව ලැබිය යුතු හිඟ රඳවා ගැනීමේ ශේෂයන් අය කර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ පිළිබඳව ප්‍රධාන කාර්යාලයෙන් මෙන්ම අදාල මුලික කාර්යාල වලින්ද නිරතුරුවම ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2024 ජුනි 30 දිනට ලැබිය යුතු රඳවා ගැනීම් වටිනාකම රු. මිලියන 915.01 ක් වූ අතර මෙයින් රු. මිලියන 283.68 ක් වර්ෂ 03-05 ත්

	රු. මිලියන 127.78 ක් සහ රු. මිලියන 158.02 ක් පිළිවෙලින් වසර 3 ත් 5 ත් අතර සහ වසර 5 කට වැඩි කාලයක් තුළ වගකිවයුතු නිලධාරීන් විසින් නිසි අයකර ගැනීමේ ක්‍රියාමාර්ග නොගැනීම නිසා හිඟව පැවතුණි.				අතර කාලයක සිටද රු.මිලියන 201.48 ක් වසර 05 වැඩි කාලයක සිටද හිඟව පවතී.
02.	**සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම** 2023 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් මව් සමාගමට එනම් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) රු.මිලියන 1,545.96 ක් ගෙවිය යුතු වන අතර සමාගම ආරම්භයේ සිටම සිදු වූ මෙම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර මෙම ශේෂය නිරවුල් කිරීමට කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එබැවින් 2017 වසරේ සිට අඛණ්ඩව මෙම ශේෂය ඉහළ යමින් පැවතුනි.	2021, 2022, 2023	සමාගම හා කාර්යාංශය අතර සිදුවන ගනුදෙනු සඳහා පැහැදිලි ගිවිසුම් ඇති කර ගත යුතු අතර අදාළ ගෙවිය යුතු ශේෂ හෙළිදරව් කිරීමට හා නිරවුල් කිරීමට පියවර ගත යුතුය.	ආයතන අතර පවතින ශේෂ නිවැරදිව කාණ්ඩ යටතේ හඳුනා ගැනීම සිදු වෙමින් පවතී.	මේ දක්වා ශේෂ නිරවුල් කර නැත.
03.	**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම** 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 රාජ්‍ය ආයතන	2021, 2022, 2023	බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමය සඳහා කඩිනමින්	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.	අනුමැතිය මේ දක්වා ලැබී නොමැත.

	යහපාලනය පිළිබඳ මෙහෙයුම් අත්පොත 3.2 (i) ඡේදය සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා 2024 මාර්තු 31 දින වන විටත් අනුමත බඳවාගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි.		අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.		
04.	**හඳුනාගත් පාඩු**				
(අ)	ව්‍යාපෘති කළමණාකරනයේ දුර්වලතා ආදී කරුණු හේතුවෙන් ව්‍යාපෘති 62 කට අදාලව රු.මිලියන 105.75 ක් ප්‍රමාද වන්දි (Liquidated Damages) ලෙස සේවායෝජකයින් විසින් බිල්පත්වලින් අඩුකර ගෙන තිබුණි. මෙයින් ව්‍යාපෘති 09 ක් සඳහා අඩුකල රු.මිලියන 36.81 ක මුදල් අයකර ගැනීමට හැකි වුවද, ව්‍යාපෘති 18 ක් සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉල්ලුම් කළ කාලය දීර්ඝ කර ගැනීම් වෙනුවෙන් අනුමැතීන් ලැබී නොතිබුණු අතර ව්‍යාපෘති 35 කට අදාලව අඩු කල ප්‍රමාද වන්දි මුදල වූ රු. මිලියන 49.01 ක් නැවත අයකර ගත නොහැකිව තිබුණි.	2022, 2023	ප්‍රමාද වන්දි ගෙවීම් වලක්වා ගැනීම සඳහා මනා ලෙස ව්‍යාපෘති අධීක්ෂණය සහ කලමනාකරණය කිරීමට කටයුතු කළ යුතු බව.	මෙම ව්‍යාපෘති සඳහා කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය ලබා ගැනීමට සේවායෝජකයන් සමඟ කටයුතු කර ලබාගත හැකි සියලුම මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	ප්‍රමාද වන්දි රු. මිලියන 49.01 ක් නැවත අයකර ගෙන නොතිබුණි.
(ආ)	නාගරික සංවර්ධන අධිකාරියට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පර්චස් 60 ක ඉඩමක් වසර 30 ක බදු	2021, 2022, 2023	සමාගම විසින් සම්පූර්ණ බදු කුලිය ගෙවා ඇති බැවින් නාගරික සංවර්ධන	මෙම ඉඩමේ හිමිකාරිත්වය UDA ආයතනයට නිල වශයෙන් පැවරුණු වහාම ගිවිසුම් අත්සන්	මේ දක්වා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

	පදනම මත ලබා ගැනීම සඳහා විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව 2019 වර්ෂයේ දී රු.මිලියන 15.43 ක් බදු කුලී ලෙස සමාගම විසින් අධිකාරියට එකවර ගෙවා තිබුණු අතර මෙම ඉඩමේ සබරගමුව මූලික කාර්යාලය පිහිටුවීම සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.		අධිකාරිය සමග අදාළ ගිවිසුම අත්සන් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	කිරීම සඳහා කටයුතු යොදන බව UDA ආයතනය දැනුම් දී ඇත.	
05.	**කළමනාකරණ අකාර්යක්ෂමතා**				
(අ)	ස්ථාන 05ක දී ක්‍රියාත්මක කර තිබූ ඇස්ෆල්ට්/ ක්‍රෂර් යන්ත්‍ර 05 න් යන්ත්‍ර 02 ක් ක්‍රියාකාරීත්වයේ පැවතියද සමාගමට 2023 වර්ෂය තුළදී රු.මිලියන 18.96 ක අලාභයක් සිදු වී තිබූ අතර අනෙක් යන්ත්‍ර 03 අක්‍රීය තත්ත්වයේ පැවතුණි.	2021, 2022, 2023	ඇස්ෆල්ට්/ ක්‍රෂර් යන්ත්‍ර ලාභදායී ලෙස පවත්වාගෙන යාමට සමාගමේ කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය.	රටෙහි ඉදිකිරීම් කර්මාන්තය යථාතත්ත්වයට පත්වන තුරු මෙම යන්ත්‍ර මගින් නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කළත් එම නිෂ්පාදන අලවි කරගැනීමට සුදුසු වෙළඳපලක් නොමැති බැවින් නඩත්තු සඳහා යන වියදම සැමවිටම අලාභයක් ලෙස ලකුණු කිරීමට සිදුවේ.	2024 ඔක්තෝබර් වන විට මෙම යන්ත්‍ර ක්‍රියාකාරීත්වය අලාභදායී වේ.
(ආ)	සමාගම එහි සම්පූර්ණයෙන් නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් පිළිවෙළින් 2023, 2022 සහ 2021 වර්ෂයන් හි දී රු.මිලියන 942.90 ක රු.මිලියන 667.42 ක සහ රු. මිලියන 888.15 ක මෙහෙයුම් අලාභයන් ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වෙමින්	2021, 2022, 2023	කොන්ත්‍රාත් පිරිවැය හා කාලය කළමනාකරණය කර ඉදිකිරීම් ව්‍යාපෘති වලින් සිදුවන පාඩුව වලක්වා ගැනීමට කළමනාකරණය විසින් ඵලදායී පියවර ගත යුතුය.	කළමනාකාරීත්වය වර්තමානයේදී සියලුම ව්‍යාපෘතින් සමීප නිරීක්ෂණයක් පවත්වාගෙන යන අතර (Microsoft 365), ඇති විය හැකි සියලුම ලාභ /අලාභ තත්වයන් හඳුනාගනිමින් ව්‍යාපෘතීන් හැසිරවීම සිදු කරනු ලැබේ.	2024 ඔක්තෝබර් වන විට ව්‍යාපෘති 10 ක් අලාභ ලබමින් පවතී.

පවතින ඉදිකිරීම් ව්‍යාපෘති 40 කින් රු. මිලියන 528.57 ක අලාභයක් ලබා තිබුණි. මෙම අලාභ සමාගමේ අඛණ්ඩ පැවැත්ම සඳහා සෘජුවම බලපාන බැවින් ඒ සඳහා සෘජුව හෝ වක්‍රව වගකිව යුතු පුද්ගලයන් සහ හේතු හඳුනාගෙන මෙවැනි අධික අලාභ අවම කිරීම සඳහා කළමනාකාරිත්වය ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.18 සී.ස සී-නෝර් පදනම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	556,768,828	246,465,747	310,303,081	5,358,737	තත්ත්වාගණනය කළ
2022	1,217,672,223	223,952,254	993,719,969	(9,867,625)	තත්ත්වාගණනය කළ
2023	1,331,369,585	325,966,653	1,005,402,932	3,482,963	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කිසිදු සුරක්ෂණයක් ලබාගැනීමක් හෝ ගිවිසුමකට හෝ එළඹීමකින් තොරව උප කොන්ත්‍රාත් පදනම යටතේ පුද්ගලික ආයතනයකට මාළු දැල් නිපදවීමට රු.5,059,049 ක් වටිනා අමුද්‍රව්‍ය 2011 වර්ෂයේ දී ලබාදී තිබුණු අතර, එයින් රු.149,274 ක් වටිනා මාළු දැල් පදනම වෙත ලබා දී තිබුණි. මේ අනුව රු.4,909,775 ක්වූ ඉතිරි අමුද්‍රව්‍ය 2011 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු දෑ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම ශේෂය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය. එමෙන්ම එම ශේෂය අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම	2021, 2022	දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	පුද්ගලික ආයතනයකින් ලැබිය යුතු රු.4,909,775 ක මුදල වසර 10කට වඩා පැරණි ශේෂයක් වන අතර මේ සම්බන්ධයෙන් ආයතනය තුළ මූලාශ්‍ර ලියවිලි නොමැති බැවින් අවශ්‍යය 2023 මූල්‍ය ප්‍රකාශණය තුළ අඩමාන ණය වෙන්කිරීමක් කිරීමට අවශ්‍ය ගිණුම්කරණමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත.	වාර්තාවේ දිනය වනවිටත් මෙම ශේෂය අය වී නොමැත.

	විසින් ගෙන නොතිබුණු අතර අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් ද සිදුකර නොතිබුණි.				
(ආ)	ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබූ දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාල කාර්යයන් සීමාසහිත සී-නෝර් පදනම හරහා සිදුකරගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් පදනම වෙත ධීවර අමාත්‍යාංශයෙන් එකතුව රු.3,527,824 ක්වූ මුදලක් 2014 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. මෙම මුදල් අයවීම අවිනිශ්චිත තත්ත්වයේ වූ අතර ඒ වෙනුවෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් ද සිදුකර නොතිබුණි.	2021, 2022	දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල අයකර ගැනීමට හෝ අඩමාණ ණය වෙන්කිරීමට කටයුතු කළ යුතුය.	රඳවා ගැනිමේ මුදලක් වූ රු.3,527,823 ආපසු ලබා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය ව්‍යාපෘති අංශය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි.	මෙම වාර්තාවේ දිනය වනවිට මෙම ශේෂය අයකරගෙන නොතිබුණි.

3.19 මිල්කෝ පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	21,451,693,754	20,436,070,474	1,015,623,279	34,325,163	ව්‍යාවනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

- 2022/2023 ගිණුම් ඉදිරිපත් කර නැත.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
(අ)	2003 ජූනි 02 දිනැති අංකපී්ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව 2020 හා 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020,2021 හා 2022 යන වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන හා	2021/2022 ගනුදෙනු වාර්තාව	නොපමාව 2020, 2021 හා 2022 මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු යුතුය.	පරිගණක පද්ධතිවල ඇති වූ දෝෂයක් මත කෙටුම්පත් ගිණුම් වාර්තා සැකසීමේ ප්‍රමාදයක් සිදුව ඇති අතර, එම පරිගණක දත්ත යාවත්කාලීන කිරීම මේ වනවිට සිදුවෙමින් පවතී.	2020 හා 2021 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් වී ඇති අතර 2020 විගණකාධිපති වාර්තා නිකුත් කර අවසන්ව ඇත. 2021 වර්ෂයට අදාල විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව 2024.09.30 දින නිකුත් කර ඇත. 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහි මුද්‍රණ කටයුතු අවසන් කර ඇති බවත්, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්

	කෙටුම්පත් වාර්ෂික වාර්තාවන් 2023 මාර්තු 24 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.				කිරීමට නියමිතව ඇති බවත් හා 2022 ගිණුම් පිළියෙල කිරීම අවසන් කර ඇති බවත් ආයතනය විසින් දන්වා ඇත.
(ආ)	අපේක්ෂිත වෙළඳපොළ කොටස ළඟාකර ගැනීම සඳහා අපේක්ෂිත නිමවුම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය ප්‍රධාන යෙදවුම වන කිරි ප්‍රමාණය රටෙහි සමස්ත කිරි නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගැනීම සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කරුණක් වුවද සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම 2020, 2021 හා 2022 යන වර්ෂයන්දී පිළිවෙලින් රටතුල සමස්ත දියර කිරි නිෂ්පාදනයන් සියයට 14ක්, 13ක් හා 9ක් තරම් පහළ මට්ටමක පැවතුනි.	2021/2022 ගනුදෙනු වාර්තාව	සමාගම විසින් සිය නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කිරි මිලදී ගැනීම වැඩි කළ යුතුය.	කිරි එකතු කිරීම වර්ධනය කර ගැනීම සඳහා උපාය මාර්ගික වැඩපිළිවෙලක් සකස් කර ඇත.	උපායමාර්ගික වැඩපිළිවෙලක් අනුව ක්‍රියාත්මක වී 2024 මාර්තු මස සිට, දෛනික කිරි එකතු කිරීම ලීටර් 200,000 ට ආසන්න අගයක් දක්වා වර්ධනය වී ඇත. එසේ වුවද සමාගමේ නිෂ්පාදන කටයුතු සඳහා තවදුරටත් අවශ්‍ය කිරි මිලදී ගැනීම් වර්ධනය කරගත යුතු වේ.
(ඇ)	කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘති යටතේ නව යන්ත්‍රාගාරය සවිකිරීමෙන් පසු 2017 වර්ෂයේ ජූලි මසදී නිෂ්පාදනය කළ කිරිපිටි කිලෝග්‍රෑම් 771,652 ක් දෝෂ රහිත බවට පරීක්ෂණ වාර්තා නිකුත් කර විකුණුම් කරන ලද	2021/2022 ගනුදෙනු වාර්තාව	විනය පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන්ගෙන් පාඩුව අය කර ගතයුතුය.	මිනිස් පරිභෝජනයට නුසුදුසු ඉතිරි කිරිපිටි තොගය ද විකිණීමට කටයුතු කරන ලද අතර, එම තොග ඉවත්කර ගැනීමට කටයුතු කරමින් පවතී.	නිෂ්පාදන ක්‍රියාවලියේ සිදුකරන ලද වෙනස් කිරීම් මගින් කිරිපිටිවල ලයිපේස් අගය වෙනස් කිරීමට කටයුතු කර ඇතත්, මේ සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්

	අතර පාරිභෝගික පැමිණිලි හේතුවෙන් මිනිස් පරිභෝජනයට නුසුදුසු බැවින් නැවත ගබඩා වෙත ගෙන්වා ගෙන තිබුණි. රුපියල් මිලියන 475.2 ක් වටිනා කිරිපිටි කිලෝග්‍රෑම් 720,000 ක ප්‍රමාණයකින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සත්ත්ව ආහාර ලෙස විකිණීමෙන් පසු ඉතිරි කිලෝග්‍රෑම් 561,264 ක් 2022 දෙසැම්බර් 31 දින අඹේවෙල කර්මාන්තශාලාවේ ගබඩාකර තිබුණි. මිනිස් පරිභෝජනයට නුසුදුසු කිරිපිටි නිෂ්පාදනයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පරික්ෂණයක් පවත්වා නොතිබුණි.				හඳුනාගෙන ඔවුන් සම්බන්ධයෙන් කිසිදු පරික්ෂණයක් පවත්වා නොතිබුණි.
(ඇ)	2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා කර්මාන්තශාලාව වෙත ඉන්ධන තොග ලැබීමේ ආරක්ෂක අංශයේ ලේඛන පරීක්ෂාවේදී රු.9,364,835ක් වටිනා ඩීසල් ලීටර් 92,400ක ප්‍රමාණයක් රැගත් බවුසර් රථ 14 ක් කර්මාන්තශාලාව තුළට පැමිණ නොතිබුණු බව නිරීක්ෂණය වුවද එම ඉන්ධන සඳහා ගෙවීම් සිදුකර තිබුණි. මෙහිදී ඇතැම් තොග සම්බන්ධ	2021/2022 ගනුදෙනු වාර්තාව	ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ට විනයානුකූලව පියවර ගත යුතුය.	ඩීසල් තොග අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් පූර්ණ විගණන පරීක්ෂණයකට ලක්කළ අතර, එම වාර්තාව මගින් හෙළිවූ කරුණු අනුව වගකිව යුතුයැයි සැලකෙන නිලධාරීන් වැඩතහනමකට ලක්කර ඉදිරි විනය පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එමෙන්ම, අපරාධ	මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් අධිකරණයේ විභාග වෙමින් පවති. ආයතනයේ විමර්ශන කටයුතු අවසන් කර චෝදනා පත්‍ර නිකුත් කර ඇත.

	ඉන්වොයිස්වල දැක්වෙන අත්සන් ආරක්ෂණ අංශයේ නිලධාරීන්ගේ අත්සන් හා නොසැසඳෙන බව නිරීක්ෂණය විය.			පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ද, පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.	
(ඉ)	අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ පැරණි සහ නව නිෂ්පාදනගාරයන්හි සමස්ත ධාරිතාවය ලීටර් 9,300,000 ක් වුවද 2020, 2021 හා 2022 අගෝස්තු දක්වා විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සාමාන්‍ය ධාරිතා උපයෝජනය පිළිවෙලින් ලීටර් 3,052,858, ලීටර් 2,675,819ක් හා ලීටර් 1,690,560 ක් වූ අතර එය මුළු ධාරිතාවයෙන් පිළිවෙලින් සියයට 33 ක්, 29 හා 18 ක් තරම් වූ පහළ මට්ටමක පැවතුණි.	2021/2022 ගනුදෙනු වාර්තාව	යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීමට කටයුතු කළ යුතුය.	යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කිරි තොග ප්‍රමාණවත්ව නොලැබෙන හෙයින්, යන්ත්‍රසූත්‍ර ඌන උපයෝජනය සිදුවේ.	මේ වනවිට අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ ධාරිතා උපයෝජනය 2023 වර්ෂයේදී සියයට 12 ක් හා 2024 වර්ෂයේ සැප්තැම්බර් දක්වා සියයට 25 ක් විය. ඒ අනුව කිරි කර්මාන්තශාලාව තවදුරටත් ඌණ උපයෝජිතව පවතී.
(ඊ)	අඹේවෙල කර්මාන්තශාලාවේ 2017 ජූනි මාසයේදී ස්ථාපිත නව යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට ජාතික විදුලිබල සම්බන්ධතාවේ නිතරම සිදුවන විදුලි බිඳවැටීම් හේතුවෙන් බාධක පැමිණීම නිසා වැඩි දියුණුකළ විදුලි පද්ධතිය ක්‍රියාකිරීමට නොහැකි වී ඇත.ඒ හේතුවෙන් එවැනි විදුලි බිඳ	2021/2022 ගනුදෙනු වාර්තාව	අඛණ්ඩ විදුලි බල සැපයුම් ඒකකයක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය.	සමාගමට අගතියක් නොවන අයුරින් එකී නඩුව සමථයකට පත්කර ගැනීමටත්, UPS පද්ධතියක් ස්ථාපිත කර ගැනීමටත් කටයුතු සිදුකරමින් පවතී.	අදාළ සැපයුම්කරු මේ පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් ඔවුන් සමඟ සමථයකට පත්ව අධිකරණයේ ද එකඟතාවය මත එකඟවී තිබූ අඛණ්ඩ විදුලිබල සැපයුම් පද්ධතිය (UPS) ස්ථාපිත

	වැටීමකදී යන්ත්‍ර වල ක්‍රියාකාරිත්වයට හානියක් නොවීම සඳහා අඛණ්ඩ විදුලි බල සැපයුම් ඒකකයක් සපයා සවිකිරීමට ටෙන්ඩර් කැඳවා තිබුණද තෝරාගත් සැපයුම්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පැමිනීමෙන් පසු එය අවලංගු කිරීම නිසා එම සමාගම විසින් මිල්කෝ සමාගමට විරුද්ධව නඩුවක් පවරා තිබුණි. ඉදිරියේදී මේ සඳහා අවිනිශ්චිත වැයක් ඇතිවිය හැකි බවක් මෙන්ම එම සැපයුම් ඒකක මිලදී නොගැනීම නිසා අපේක්ෂිත පරිදි නිෂ්පාදනාගාරයේ කටයුතු සඳහා එම නව විදුලි පද්ධතිය (MV පැනලය) භාවිතා කිරීමට නොහැකි වීම හේතුවෙන් විදුලිබල උත්පාදක යන්ත්‍ර සඳහා අධික පිරිවැයක් දැරීමටද සිදුවී තිබුණි.				කිරීමට කටයුතු කරමින් පවතී.
(උ)	1980 මාර්තු 10 දින මැනුම් කරන ලද පිඹුරු අංක:4754 අනුව අඹේවෙල කර්මාන්තශාලාව පවතින රජයට අයිති ඉඩම අක්කර 40 රූඩ් 01 පර්චස් 36 ක් වන අතර එහි සමාගම විසින් රු. මිලියන 5,548 ක් වටිනා ඉදිකිරීම් හා සවිකිරීම්	2021/2022 ගනුදෙනු වාර්තාව	මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	ඉඩම් පවරාගැනීමට අදාළ නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවතී.	මිල්කෝ ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති බැවින්, එම ඉඩමේ අයිතිය පවරාගැනීමේ කටයුතු තාවකාලිකව

	කර ඇති නමුත් මෙම ඉඩමේ අයිතිය 2022 දෙසැම්බර් 31 දක්වාම සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.				අත්හිටුවා ඇත.
(ඌ)	2020 දෙසැම්බර් 18 දිනැති පී්ඊඩී 03/2020 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පූර්ණ රාජ්‍ය අයිතිය සහිත සමාගම් විසින් 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේදී 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතු බව චක්‍රලේඛයේ සඳහන් කර තිබුණි.2019 වර්ෂය සඳහා ගිණුම් විගණකාධිපති වෙත මාස 30ක් පමණ ප්‍රමාද වී 2022 අගෝස්තු 16 වන දින ගිණුම් ඉදිරිපත් කර තිබූ අතර එම ගිණුම් විගණනය කිරීමට පෙර චක්‍රලේඛයට පටහැනිව විධායක හා විධායක නොවන නිලධාරීන් 1350ක් වෙනුවෙන් එක් නිලධාරියෙකුට රු.15,000 බැගින් 2020 වර්ෂයේදී රු.19,086,375ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.	2021/2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව පූර්ණ රාජ්‍ය සමාගම් විසින් 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමේදී 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතුය .	ප්‍රසාද දීමනා ගෙවීමේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදු කර ඇත.	ගෙවූ ප්‍රසාද දීමනා ආපසු අය කර ගැනීමට කටයුතු කර නැත. 2023 වර්ෂයේ සිට ප්‍රසාද දීමනා ගෙවා නොමැත.
(එ)	2021 දෙසැම්බර් 15 දිනැති පී්ඊඩී 03/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2020 විගණිත මූල්‍ය	2021/2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව 2020 විගණිත මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව 2021	ප්‍රසාද දීමනා ගෙවීමේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදු කර ඇත.	ගෙවූ ප්‍රසාද දීමනා ආපසු අය කර ගැනීමට කටයුතු කර නැත. 2023

	ප්‍රකාශන මත පදනම්ව 2021 වර්ෂයේ ප්‍රසාද දීමනා ගෙවිය යුතු බව චක්‍රලේඛයේ සඳහන්ව තිබුණි. සමාගම විසින් 2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 30ක් පමණ ප්‍රමාද වී 2023 අගෝස්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ගිණුම් විගණනය කිරීමට පෙර චක්‍රලේඛයට පටහැනිව 2021 වර්ෂය වෙනුවෙන් සේවකයන් 1356 ක් සඳහා 2021 අප්‍රේල් 09 දින එක් නිලධාරියෙකුට රු.20,000 බැගින් රු.25,921,238ක්ද 2021 දෙසැම්බර් 21 දින එක් නිලධාරියෙකුට රු.11,657 බැගින් රු.14,800,907ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවීම් කර තිබුණි.		වර්ෂයේ ප්‍රසාද දීමනා ගෙවිය යුතුය.		වර්ෂයේ සිට ප්‍රසාද දීමනා ගෙවා නොමැත.
(ඒ)	2022 දෙසැම්බර් 21 දිනැති පීඊඩී 09/2022 හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා ගෙවීමේදී 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව සිදු කළ යුතු අතර 2021 වර්ෂයේ අලාභයක් නම් ප්‍රසාද දීමනා සඳහා හිමිකම් නොමැති බව දක්වා තිබුණි.සමාගම විසින් 2021 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 24 වන විටත් ඉදිරිපත් කර නොතිබියදී	2021/2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂය වෙනුවෙන් ප්‍රසාද දීමනා ගෙවීමේදී 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ගෙවීම් කළ යුතුය.	ප්‍රසාද දීමනා ගෙවීමේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ගෙවීම් සිදු කර ඇත.	ගෙවූ ප්‍රසාද දීමනා ආපසු අය කර ගැනීමට කටයුතු කර නැත. 2023 වර්ෂයේ සිට ප්‍රසාද දීමනා ගෙවා නොමැත.

	හා ආයතනයේ ලාභදායී තත්ත්වය පිළිබඳව තොරතුරු නොමැතිව තිබියදී ප්‍රසාද දීමනා ලැබීමට හිමිකම් නොමැති තත්ත්වයකදීත් 2022 අප්‍රේල් මස 11 වන දින හා 2022 දෙසැම්බර් 23 වන දින එම වක්‍රලේඛයන්ට පටහැනිව එක් නිලධාරියෙකුට රු.10,000 බැගින් පිළිවෙලින් රුපියල් 13,044,888 ක් හා රුපියල් 12,719,687 ක් විධායක හා විධායක නොවන සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.				
(ඔ)	මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කර්මාන්තශාලාවට 2015 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා ඩීසල් තොග මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිකුත් කර තිබුණු රු.17,209,467ක් වටිනා ඩීසල් ලීටර් 165,300ක් මිල්කෝ ආයතනයේ කර්මාන්තශාලාවේ තෙල් ටැංකි තුළට ගොඩබෑමේ කටයුතු සිදු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.	2021/2022 ගනුදෙනු වාර්තාව	ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ සියලු පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල කටයුතු කළ යුතු අතර මෙවැනි වංචා වැළැක්වීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය.	පරීක්ෂණයක් පවත්වා එම වාර්තාව අනුව අදාළ නිලධාරීන් හඳුනාගෙන ඇත.	මෙයට සම්බන්ධ නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය අත්හිටුවා ඇත. විනය පරීක්ෂණ සිදු කරමින් පවතී.
(ඕ)	මිල්කෝ ආයතනයට අයත් අඹේවෙල කිරි කර්මාන්තශාලාවේ 2019	2021/2022 ගනුදෙනු වාර්තාව	ඉන්ධන අක්‍රමිකතාවයට සම්බන්ධ	පරීක්ෂණයක් පවත්වා එම වාර්තාව අනුව අදාළ නිලධාරීන්	මෙයට සම්බන්ධ නිලධාරීන් දෙදෙනෙකුගේ

	වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා කර්මාන්තශාලාවේ ඇති විදුලි ජනක යන්ත්‍රය සඳහා ටැංකි වලින් ඩීසල් නිකුත් කිරීම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී විදුලි ජනක යන්ත්‍රය සඳහා නිකුත් කර ඇති බවට තොග පොත්වල සඳහන් ප්‍රමාණයන් හා ඉංජිනේරු අංශය විසින් නඩත්තු කර තිබෙන ලේඛනවල ප්‍රමාණයන් අතර ඩීසල් ලීටර් 58,703 ක ප්‍රමාණයක් අස්ථානගතවී තිබුණි.		පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව පියවර ගත යුතු අතර මෙවැනි වංචා හෙළිදරව් වන පරිදි ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය.	හඳුනාගෙන ඇත.	සේවය අත්හිටුවා ඇත. විනය පරීක්ෂණ සිදු කරමින් පවතී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ද පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.
(ක)	2015 පෙබරවාරි 11 දිනැති අංක අමප/15/0205/631/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බඩල්ගම කිරි කර්මාන්තශාලා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු අතර 2015 වසරේදී යූරෝ මිලියන 63.9 ක ආයෝජනයකින් යුතුව ඉදිකිරීම් කටයුතු ඩෙන්මාර්ක් පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට භාරදී තිබුණද 2020 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කළ යුතු ඉදිකිරීම් කටයුතු 2023 පෙබරවාරි වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. එහෙත් 2021 ප්‍රධාන කාර්යසාධන දර්ශක	2021/2022 ගනුදෙනු වාර්තාව	ප්‍රධාන කාර්යසාධක දර්ශක අනුව බඩල්ගම කිරි කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුල සම්පූර්ණ කළ යුතුය.	කර්මාන්තශාලා පරිශ්‍රය ඩෙස්මි ආයතනය විසින් නඩත්තු කටයුතු සිදු කරමින් පවතී	ඉදිකිරීම් කටයුතු සියයට 95 ක් පමණ නිම කර ඇතත් මේ වන විටත් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ක්‍රියාත්මක තත්වයේ නොපවතී.

	පිළියෙල කිරීමේදී ඉදිකිරීම් කටයුතු සියයට 100 ක් නිම කර ඇති බව දක්වා තිබුණි.				
(ග)	සමාගමට අයත් දිගන කිරි කර්මාන්තශාලාවේ පවතින රු.9,500,000 ක් පිරිවැය වූ ස්ථිරියලයිස්ඩ් කිරි බෝතල් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය හා කොළඹ කිරි කර්මාන්තශාලාවේ රු.15,445,587ක් වූ අයිස් ක්‍රීම් බඳුන් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රය පිළිවෙලින් සියයට 46 හා සියයට 71 ක් යනාදී වශයෙන් අවම මට්ටමක ඌන උපයෝජිත තත්ත්වයෙන් පැවතුණි.	2021/2022 ගනුදෙනු වාර්තාව	යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.	යන්ත්‍රසූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා අවශ්‍ය කිරි තොග ප්‍රමාණවත්ව නොලැබෙන හෙයින්, යන්ත්‍රසූත්‍ර ඌන උපයෝජනය සිදුවේ.	මේ වන විටත් ඌණ උපයෝජිතව පවතී.
(ච)	බඩල්ගම කිරි සැකසුම් කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම සඳහා රු.9,932,709,286 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගත වී 2019 දෙසැම්බර් 31 දිනට රු.11,671,726,295 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පැවතුණි. නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර ඇති අඹේවල කර්මාන්තශාලාවට 2019 වර්ෂයේදී දියර කිරි ලැබී තිබුණේ යන්ත්‍ර	2021/2022 ගනුදෙනු වාර්තාව	යන්ත්‍ර සූත්‍ර පූර්ණ ධාරිතාවයෙන් යොදා ගැනීම සඳහා වහාම සැලසුම් සකස් කළ යුතුය	බඩල්ගම කිරි සැකසුම් කර්මාන්තශාලාව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා සැලැස්මක් හෝ සකස් කර නොතිබුණි.	මේ වන විටත් ඌණ උපයෝජිතව පවතී.

	ධාරිතාවයෙන් සියයට 25කට ප්‍රමාණවත් දියර කිරි පමණි. වර්තමානයේ ඉදිවෙමින් පවතින බඩල්ගම කර්මාන්තලාව නිමවීමෙන් පසු අදාළ කර්මාන්තශාලාවේ යන්ත්‍ර ධාරිතාවයට අනුව දිනකට සමාගමට දියර කිරි ලීටර් 400,000ක් අවශ්‍ය බව වාර්තා කර තිබුණි. වර්තමානයේ අනෙකුත් ක්‍රියාකාරී කර්මාන්තශාලා 04 සඳහා ද ආයතනයට එකතු කළ හැකි දෛනික දියර කිරි ප්‍රමාණය ලීටර් 200,000 ක් පමණ වන බැවින් මෙම යන්ත්‍ර සම්පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය.				
(ජ)	පොළොන්නරුව කිරි කර්මාන්තශාලාව පිහිටි අක්කර 12ක ඉඩම හා තවත් අක්කර 37ක් ලෙස ඉඩම් 2ක් සමාගම සතුව පවතී. නමුත් 2019 වර්ෂය අවසන් වන විටත් මෙම ඉඩම් දෙකට අදාළ ඔප්පු හා පිඹුරුපත් සමාගම සතුව නොතිබුණි.	2021/2022 ගනුදෙනු වාර්තාව	නිෂ්කාර්යව පවතින ඉඩම් උපයෝජනය කළ යුතුය. ඉඩම්වල නෛතික හිමිකම ලබාගත යුතුය.	පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	තවම පවරාගෙන නැත.
(ට)	මිල්කෝ ආයතනය යටතේ වන කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවල සිට මිල්කෝ කර්මාන්තශාලා සඳහා	2021/2022 ගනුදෙනු වාර්තාව	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කිරි ප්‍රවාහන බවුසර් රථ තෝරා ගත	ඉදිරි වර්ෂ වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට සැලසුම් කර ඇත.	මේ වන විටත් නිවැරදි වී නොතිබුණි.

කිරි ප්‍රවාහනය කිරීමේදී මිල්කෝ ආයතනය සහ කිරි ටැංකි පෞද්ගලික බවුසර් රථ මඟින් ප්‍රවාහනය කර තිබුණි. 2020 වර්ෂය තුළදී පෞද්ගලික බවුසර් රථ 71ක් ප්‍රවාහන කටයුතු වෙනුවෙන් භාවිතා කර ඇති අතර එම රථ වලින් සමාලෝචිත වර්ෂයේදී කිරි ලීටර් 46,119,573ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.203,781,417ක් ගෙවා තිබුණි. මෙම බවුසර් රථ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ආයතනය විසින් ලබාගෙන තිබූ බවත් එම රථ වලින් 45ක ප්‍රමාණයක් වර්ෂ 05කට අධික කාලයක සිට සමාගම විසින් භාවිතා කර තිබූ බවත් නිරීක්ෂණය විය.

යුතුය.

3.20 ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	263,584,286	5,444,069	209,140,218	9,368,513	තත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති දේපළ පිරියත සහ උපකරණවල ලියාහළ අගය වන රු.75,497,131 ක ශේෂයෙහි රු.2,025,960 ක්වූ ක්ෂය වෙන්කිරීමෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.	2021	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.	වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සැලසුම් කර ඇති අතර මෙතෙක් එම වාර්තා ලැබී නොමැත. එම වාර්තා අනුව නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීමට හැකි වේ.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ආ)	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලිඛඩු සහ උපකරණ ලබා දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 3,431,328 ක ශේෂයක් වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් තුළ ඇතුළත් වන අතර	2021	ලැබිය යුතු ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය	අයකර ගැනීමට කටයුතු කර නොමැත.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් මෙම ශේෂය අය කරගෙන නොතිබුණි.

	වර්ෂ 05 කට අධික කාලයක සිට පැවත එන එම ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සමාගම ඵලදායී පියවර ගෙන නොතිබුණි.				
(ඇ)	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් 2014 වර්ෂයේ සමාගම අත්පත් කර ගත් අතර 2014 ජූලි 08 කරන ලද ඉල්ලීමකට අනුව මව් සමාගම වෙත රු.140,000,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණු අතර මේ දක්වා එම අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021	අත්තිකාරම් මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය	අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මෙම සමාගම විසුරුවා හැර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ඒකාබද්ධ කිරීමට නියමිත බැවින් එම අවස්ථාවේ දී මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නියමිතය.	රු.140,000,000 මුදල මෙතෙක් සමාගමට ලැබී නොමැත.
(ඈ)	මෙම ආයතනය සමාගමක් ලෙස ස්ථාපිත කිරීමට මත්තෙන් පැවති ලන්ලිබ් (LANLIB) නමින් වූ සමාගම 2009 සිට 2013 වර්ෂ දක්වා වූ නොගෙවන ලද රු. 25,932,371 ක බදු වගකීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති අතර එම බදු වගකීම වර්ෂ 07 කට අධික කාලයක සිට පැවත එන ශේෂයක් වන අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ බදු වගකීම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	අදාල බදු වගකීම නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.	2023-09-20 දින සමාගම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපදේශන කමිටුව මගින් සාකච්ඡා කල පරිදි බදු වර්ග කිහිපයක් සඳහා ගෙවීම් සිදු කරන ලදී. ඉතිරි බදු සඳහා ඉදිරියේදී තීරණ ගැනීමට නියමිතය.	මෙම බදු වගකීම නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී .

3.21 සී.ස නෝර්ත් සී ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කර්මාන්ත ශාලා පවත්වාගෙන යන වීරවිල සහ යාපනය ප්‍රදේශවල රජයට අයත් ඉඩම්වල සමාගම විසින් ගොඩනැගිලි ඉදිකර තිබුණද බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට එම ඉඩම්වල අයිතිය සමාගමේ නමට පවරා හෝ බදුදී නොතිබුණි.	2021/2022 (ගණුදෙනු වාර්තාව)	ඉඩමේ අයිතිය සමාගමේ නමට පැවරීමටත්, අනාගතයේදී කිසිදු නීතිමය ගැටලුවක් ඇතිවීම වලක්වා ගැනීමටත්, ගොඩනැගිලි ආයෝජනය ආරක්ෂා කර ගැනීමටත්, එම පරිශ්‍රයේම ව්‍යාපාරය කරගෙන යාමටත් කළමනාකාරීත්වය පියවර ගත යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	මෙතෙක් පවරා ගැනීමක් සිදු කරගෙන නොතිබුණි.
(ආ)	සමාගම විසින් යෝජිත සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022 මාර්තු 25 දිනැති ලිපිය ඉදිරිපත් කරන	2021/2022 (ගණුදෙනු වාර්තාව)	තනතුරු අනුමත කර ගැනීමට ඉල්ලා සිටින තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්	වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	මේ දක්වා එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

	ලදී. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2022 මැයි 18 දිනැති අංක DMS/1747 ලිපිය මගින් පසුගිය වසර 5 තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාව ඉදිරි වසර 5 තුළ සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන්, නිෂ්පාදනය, විකුණුම්, ලැබුණු ආදායම් සහ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ඒවායේ පසුගිය වසර 5ක ප්‍රගතිය සහ සමාගමේ උපාය මාර්ගික සැලැස්ම ඇතුළත් සවිස්තර වාර්තාවක් ඉල්ලා තිබුණි. නමුත් සමාගම විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.		කිරීමට සමාගම කටයුතු කළ යුතුය.		
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්ති ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම එසේ ක්‍රියාකර නොතිබුණි.	2021/2022 (ගණුදෙනු වාර්තාව)	ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.	වාර්තාවේ දින වන විට ඉදිරිපත් කර ඇත්තේ 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පමණක් වන අතර ඉන් පසු වර්ෂවලට අදාලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් වී නැත.
(ඇ)	2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව එකතු	2021/2022 (ගණුදෙනු වාර්තාව)	අනවශ්‍ය දඩ ගෙවීම් වලක්වා ගැනීම සඳහා	හිඟ මුදල මසකට රු.100,000 බැගින් වූ වාරික වශයෙන් ගෙවා	2024 මාර්තු 27 දින වන විට ගෙවීමට පවතින

කළ අගය මත බදු මුදල් සෑම මසකම 20 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් සමාගම විසින් 2021 වර්ෂය අවසානය වන විට රු.182,799,880 ක එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණි.තවද එකතු කළ අගය මත බදු කාලීනව නොගෙවීම හේතුවෙන් දඩ මුදල ලෙස රු.27,693,374 ක්ද ගෙවීමට සිදු වී තිබුණි.නමුත් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 27 දින වන විටත් මෙම මුදල පියවීමට සමාගම කටයුතු කර නොතිබුණි.	අදාළ බදු නීතීන් ගෙන යනු ලබයි. සමග කළමනාකරණය අනුකූල විය යුතුයි.	හිඟ එකතු කළ අගය මත බදු මුදල රු.144,271,952 ක් විය.

3.22 සෙලන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	10	848,136	(848,126)	(848,136)	තත්ත්වාගණනය නොකළ
2022	10	1,084,148	(1,084,138)	(236,012)	තත්ත්වාගණනය නොකළ
2023	10	1,379,572	(1,379,562)	(295,424)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම 2021 දී සංස්ථාපිත කරන ලද නමුත් 2023 ජූලි 31 අවසන් වන තෙක් කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කර නොතිබූ අතර 2023 ජූලි 31 දිනට රු. 1,379,572 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණි.	2021, 2022, 2023	කළමනාකරීත්වය විසින් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මග පෙන්විය යුතුය.	මූලික අයිතිවාසිකම් පෙත්සම සහ වානිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කිරීම නිසා අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.	සමාගමේ කටයුතු 2023 ජූලි 31 අවසන් කර ඇත.
(ආ)	සමාගම මූල්‍ය ප්‍රකාශනවල ඇවර කිරීමේ වියදම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සපයා නොතිබූ අතර 2023 දෙසැම්බර් 19 වන දින දක්වා පවා ඇවරකරුවෙකු පත් කර නොතිබුණි	2023	ඇවරකරුවෙකු පත්කර ඇවර කිරීමේ කටයුතු සිදුකළ යුතුය.	ඇවරකරුවෙකු පත්කිරීමට කටයුතු කරමින් සිටී.	ඇවරකරුවෙකු පත්කර නොමැත.

3.23 සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	15,439,196	4,005,618	11,433,578	(7,689,511)	තත්ත්වාගණනය නොකළ
2022	4,699,429	1,237,280	3,462,149	(7,036,430)	තත්ත්වාගණනය නොකළ
2023	2,164,698	587,552	1,577,146	(1,885,002)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම 2021 දී සංස්ථාපිත කරන ලද නමුත් 2021 දී පුරවැසියෙකු විසින් සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, සෙලන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් යන සමූහයක් වශයෙන් ආරම්භ කරන ලද සමාගම්වලට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් යොමුකිරීම හේතුවෙන් 2023 ජූලි 31 අවසානය දක්වා කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. 2023 ජූලි 31 දිනට සමුච්චිත පාඩුව රුපියල් 19,802,426ක් විය.	2021, 2022, 2023 3.1(අ)	කළමනාකරීත්වය විසින් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට මග පෙන්විය යුතුය.	මූලික අයිතිවාසිකම් පෙත්සම සහ වානිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කිරීම නිසා අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.	සමාගමේ කටයුතු 2023 ජූලි 31 අවසන් කර ඇත.

(ආ)	සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල ඇවර කිරීමේ වියදම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සපයා නොතිබූ අතර 2023 දෙසැම්බර් 19 වැනි දින දක්වා පවා ඇවරකරුවෙකු පත් කර නොතිබුණි.	2023 3.1(ආ)	ඇවරකරුවෙකු පත්කර ඇවර කිරීමේ කටයුතු සිදුකළ යුතුය.	ඇවරකරුවෙකු පත්කිරීමට කටයුතු කරමින් සිටී.	ඇවරකරුවෙකු පත්කර නොමැත.

3.24 මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	80,737,659	10,986,763	69,750,896	(7,689,511)	තත්ත්වාගණනය කළ
2022	86,975,067	11,016,699	75,958,368	(7,036,430)	තත්ත්වාගණනය කළ
2023	104,582,772	20,718,188	83,864,584	(1,885,002)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	මොරගහකන්ද සංචාරක බංගලාව ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව ගෙවීම් සිදුකිරීම නිසා වැඩිපුර ගෙවූ රු.20,200,000 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු මුදලක් ලෙස වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.	2021 2022 2023	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරවහානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදු කළයුතුය. හෙළිදරව් කල යුතුය.	මොරගහකන්ද ව්‍යාපෘතියේ උපකොන්ත්‍රාත්කරු ගේ ලැබිය යුතු රු.20,200,000 ක වටිනාක ශේෂ පත්‍රයේ ලැබිය යුතු ශේෂයක් වශයෙන් පෙන්නුම් කර ඇති අතර එම මුදල අයකරගැනීම සඳහා මේ වන විට නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටී ඒ වෙනුවෙන් නිතිපති අංශයෙන් අවශ්‍ය උපදෙස් හා නිති ක්‍රියාමාර්ග සම්බන්ධව ඉල්ලුම් කර ඇත.	මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව රාජ්‍ය	2023	කාර්යය පටිපාටික රීතිවලට අනුකූලව කටයුතු කළයුතුය.	නිරීක්ෂණය හා එකඟ නොවේ. වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා	නිවැරදි කර නොමැත.

				ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනීමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර, ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ	
	සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද කාර්ය පටිපාටික රීතිවල IX පරිච්ඡේදයේ 115 වගන්තිය අනුව කිසියම් තනතුරක වැඩබැලීම සඳහා පත් කළහැක්කේ එම තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි හෝ සඳහන් සියළු සුදුසුකම් සපුරා ඇති එම තනතුරට සමාන තනතුරක හෝ එම තනතුරට ආසන්න පහල තනතුරෙහි හෝ සේවයේ යෙදී සිටින ස්ථිර නිලධාරියෙකු වූවද, පරිවාස කාලසීමාවේදී මාණ්ඩලික නොවන MN-04 වැටුප් පරිමාණයේ නිත්‍ය තනතුරක සිටින නිළධාරිනියකු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී කාණ්ඩයේ HM 1-3 පරිමාණයේ තනතුරක වැඩබැලීම සඳහා පත්කර තිබුණි. මෙම නිලධාරිනිය උක්ත තනතුරේ වැටුප් ලබන අතරම 2021 පෙබරවාරි සිට 2023 දෙසැම්බර් දක්වා රු.60,907 බැගින් එකතුව රු.2,131,745 වූ වැඩබැලීමේ දීමනාවක් ලබා ගෙන තිබුණි.					
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5 වන	2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය.	දැනට සංක්ෂිප්ත ක්‍රියාකාරී ක්‍රියාකාරී සැලැස්මක් අනුව කටයුතු කෙරේ. එය කොවිඩ් වසංගතය	සැලැස්ම හා සංයුක්ත සැලැස්ම සකස්

	පරිච්ඡේදය අනුව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ කෙටිකාලීන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නිශ්චිත පියවර සහ කාර්යයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සහ සමාගමේ දිගුකාලීන දැක්ම සහ සමස්ත දිශානතිය නිර්වචනය කරන පරිදි පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් සකස් කර අනුමත කරගෙන නොතිබීම.			සහ ආර්ථික අර්බුධය සමයේ සකස් කර පැවති අතර, විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් දැක්ම හා දිශානතියද අදාළ කරගනිමින් ඉදිරි මාස කිහිපයන් තුළ සකස් කිරීමට අපේක්ෂිතය.	කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2 වගන්තිය අනුව විගණන කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය.	ඉදිරි මාස කිහිපය ඇතුළත ස්ථාපිත කෙරෙනු ඇත.	විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොමැත.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොතෙහි 3.2 වගන්තිය අනුව සියළුම රාජ්‍ය ව්‍යාපාර කාර්ය මණ්ඩලය, බඳවා ගැනීමේ පරිපාටිය හා වැටුප් ගෙවීම් ව්‍යූහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළව ඔවුන්ගේ ඉල්ලීම් සඳහා අධ්‍යක්ෂ	2022 2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළයුතුය.	නිරීක්ෂණය හා එකඟ වේ. 2025 මැයි මාසයට පෙර අදාළ අනුමැතීන් ලබා ගැනීම සඳහා සමාගම කටයුතු කරමින් පවතී.	කාර්ය මණ්ඩලය, බඳවා ගැනීමේ පරිපාටිය,වැටුප් ගෙවීම් ව්‍යූහය සහ දීමනා සඳහා අදාළ අනුමැතීන් ගෙන නොතිබුණි.

	මණ්ඩලය අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ අදාළ වන පරිදි රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් (DGPA) හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත (DGNB) සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යැවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත 6.6 වගන්තිය අනුව වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන්වී මාස 05 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාගමේ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2022 2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළයුතුය.	ඉදිරියේදී මේ සම්බන්ධව සොයා බලා නිසි කටයුතු කරනු ලැබේ.	2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(උ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත 6.7 වගන්තිය අනුව සමාගමේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන්	2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළයුතුය.	මේ පිළිබඳව සොයාබලා සුදුසු පියවර ගනු ලැබේ.	භෞතික සමීක්ෂණය සිදුකර නොමැත.

	වාර්ෂික සමීක්ෂණය සිදුකර නොතිබුණි				
(ඌ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත 7.2 වගන්තිය අනුව සමාගමේ කාර්යසාධනය ඇගයීම පිණිස මූලික කාර්යසාධන දර්ශක හා මෙහෙයුම් කාර්යසාධන දර්ශක පිහිටුවා ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු වුවද එසේ කර නොතිබුණි.	2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළයුතුය.	ඉදිරියේ දී මේ සම්බන්ධව සොයා බලා නිසි පරිදි කටයුතු කරනු ලැබේ.	සමාගමේ කාර්යසාධන දර්ශක පිහිටුවා නොමැත.
(එ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත 7.5 වගන්තිය අනුව සමාගමේ මාසික, කාර්තුමය හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා මහාභාණ්ඩාගාරයට යැවිය යුතු වුවත්, එසේ කර නොතිබුණි.	2023	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළයුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	මාසික, කාර්තුමය හා වාර්ෂික කාර්යසාධන වාර්තා මහාභාණ්ඩාගාරයට යවා නොමැත.
(ඒ)	අවමය 2 ක් හා උපරිමය 7 ක් වන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් නිශ්චිත විධිවිධාන සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වා	2023	සාංගමික සංස්ථාවලිය සංශෝධනය කිරීමට කටයුතු කළයුතු අතර, පත් කිරීම් සඳහා නිසි අනුමැතිය ලබා	නිරීක්ෂණය හා එකඟ නොවේ. වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා	පත්කිරීම් සඳහා නිසි අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

නොතිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II පංතියේ II ශ්‍රේණියේ සිවිල් ඉංජිනේරුවරයකු වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුරට පත්කර තිබුණි. එම නිලධාරියා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර තිබුණි. එම ප්‍රධාන විධායක නිලධාරියා වෙත නිකුත් කර තිබූ පත්වීම් ලිපිය අනුව නිලධාරියාගේ පත්වීම පූර්ණකාලීනද අර්ධකාලීනද යන්න පැහැදිලිව දක්වා නොතිබුණු අතර, ඔහුගේ දීමනාව ලෙස 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරකට හිමි රු.98,215 ක වැටුප හා වර්ෂ 05 කට අදාළ රු.13,500 ක වැටුප් වර්ධක ඇතුළත් වැටුපෙන් අඩක් හා අනෙකුත් දීමනාද ඇතුළත් වන පරිදි රු.52,342 ක් බැගින් ගැනීමටත්, පත්වීම්වලට අදාළ සියළු කොන්දේසි ඇතුළත් කිරීමටත් කටයුතු කළයුතුය.

ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනීමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර, ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ.

යෙදවීම රජයේ අවශ්‍යතාවය අනුව සිද්ධ වෙනවා බැවින්, ආයතන සංග්‍රහයේ 1.4 හා 1.6 වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ආයතන සංග්‍රහයේ 09 වන පරිච්ඡේදයේ 2.2 පරිදි පෞද්ගලික රාජ්‍ය ආයතනයකට සේවා සැපයීමේ පදනමින් මෙම සේවාව සමාගම මඟින් සලසා ගැනීම සඳහා රජයේ නිලධාරියෙකු යොදවා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ද ගෙවීමට යුතු ගාස්තුව ද ගෙවීම් කර ඇත.

	භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි. මෙකී දීමනා ලෙස 2023 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. 697,890 ක් ගෙවා තිබුණි. ඒ අනුව මොහුට 2023 වර්ෂය සඳහා තම තනතුරට අදාළව රු.926,976 ක් වැටුප් ලෙසද, ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා රු. 697,890 ක් දීමනා ලෙසද ලබාගෙන තිබුණි.				
(ඔ)	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) වශයෙන් කටයුතු කළ නිලධාරිනිය සමාගම් ලේකම්/නීති නිලධාරී තනතුර සඳහා පත්කර තිබුණද, අදාළ නිලධාරිනිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් නිදහස් කර නොතිබුණු අතර, පත්වීම් ලිපියේ පත්වීම් ස්වභාවය, දීමනා ගෙවන ආකාරය හා අනෙකුත් පත්වීම් කොන්දේසි දක්වා නොතිබුණි. 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව උක්ත තනතුර සඳහා අදාළ වන රු.55,925 ක වැටුප හා රු.6,875 ක් වූ වර්ෂ 05 ක වැටුප් වර්ධක යන ඒවායේ	2022 2023	පත් කිරීම් සඳහා පත් කිරීම් බලධරයාගේ විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු අතර, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් පරිපාටිය හා ගෙවීම් ව්‍යූහ සඳහා කළමනාකරණ සේවා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතුය.	නිරීක්ෂණය හා එකඟ නොවේ. වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනිමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර, ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ. යෙදවීම රජයේ අවශ්‍යතාවය අනුව සිද්ද වෙනවා බැවින්, ආයතන සංග්‍රහයේ 1.4 හා 1.6 වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශ	පත්කිරීම් සඳහා නිසි අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	එකතුවෙන් අඩක් හා අනෙකුත් දීමනා ඇතුළත් වන පරිදි රු.33,700 ක් බැගින් වූ දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මාසිකව ගෙවා තිබුණි. මෙකී දීමනා ලෙස 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 404,400 ක් ගෙවා තිබුණි. තවද මෙම නිලධාරිනිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා ගෙවනු ලබන දීමනාව ලෙස රු.30,000ක මුදලක්ද ලබා ගෙන තිබුණි.			ලේකම්ගේ අනුමැතිය සහිතව ආයතන සංග්‍රහයේ 09 වන පරිච්ඡේදයේ 2.2 පරිදි පෞද්ගලික රාජ්‍ය ආයතනයකට සේවා සැපයීමේ පදනමින් මෙම සේවාව සමාගම මඟින් සලසා ගැනීම සඳහා රජයේ නිලධාරියෙකු යොදවා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ද ගෙවීමට යුතු ගාස්තුව ද ගෙවීම් කර ඇත.	
(ඕ)	වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් සමාගමේ ව්‍යාපෘති කළමනාකරු තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා අනුයුක්ත කර තිබුණු නිලධාරිනිය 2019 අගෝස්තු 01 දින සිට අභ්‍යාසලාභී උපාධිධාරියෙකු ලෙස වාරිමාර්ග අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ අතර, 2021 ජනවාරි 01 දින සිට සංවර්ධන නිලධාරී තනතුරට පත් කර තිබුණි. පත් කිරීමේ බලය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සතු වුවද, වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් තම විෂය පථය	2023	කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය.	නිරීක්ෂණය හා එකඟ නොවේ. වැඩ බැලීමේ තනතුරක් සඳහා පත්කර නොමැත. සිදු කර ඇත්තේ අර්ධ කාලීන සේවාව සපයා ගැනීම සඳහා වෘත්තීමය දක්ෂතා සහිත නිලධාරියෙකු යොදවා ගැනිමකි. එය එලෙස පත් කිරීම්වලදී විගණනය පෙන්වා ඇති කාර්යය පාටිපාටික රීති අදාළ නොවන අතර, ඒ සඳහා සමාගම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් යොදවන පත් කිරීම් අදාළ වේ. යෙදවීම රජයේ අවශ්‍යතාවය අනුව	පත්කිරීම් සඳහා නිසි අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

	ඉක්මවා උක්ත පත් කිරීම් සිදුකර තිබුණි. තවද මෙම නිලධාරිනිය ඇයගේ නිත්‍ය තනතුරවන සංවර්ධන නිලධාරී තනතුර සඳහා වැටුප් ලෙස රු.572,160 ක් ද, සමාගමේ ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහා රු.730,890 ක දීමනාවක්ද 2023 වර්ෂය සඳහා ලබාගෙන තිබුණි. සමාගම විසින් දීමනාව ගණනය කිරීම සඳහා HM 1.3-2016 වැටුප් කේතය පදනම් කරගෙන තිබූ අතර, එයට වෙනත් දීමනා ලෙස රු.2,300 ක් ද පැමිණීමේ දීමනාව ලෙස රු.1,500 ක් ද, ගමන් වියදම් දීමනා ලෙස රු.8,000 ක් ද එකතු කර තිබුණි.			සිද්ද වෙනවා බැවින්, ආයතන සංග්‍රහයේ 1.4 හා 1.6 වගන්ති ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ආයතන සංග්‍රහයේ 09 වන පරිච්ඡේදයේ 2.2 පරිදි පෞද්ගලික රාජ්‍ය ආයතනයකට සේවා සැපයීමේ පදනමින් මෙම සේවාව සමාගම මඟින් සලසා ගැනීම සඳහා රජයේ නිලධාරියෙකු යොදවා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ද ගෙවීමට යුතු ගාස්තුව ද ගෙවීම් කර ඇත.	
(ක)	ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් පිළියෙල කිරීම සඳහා 2017 අප්‍රේල් 28 දින වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුමේ කොන්ත්‍රාත් වටිනාකම රු.22,138,000 ක් ලෙස එකඟවී එම ගිවිසුම අනුව අදාළ කාර්යයන් මාස 09 ක් තුළ නිම කළයුතු වුවත් නියමිත	2022 2023	ගිවිසුම් ප්‍රකාරව භාරගත් උපදේශන කාර්යය නියමිත දිනට නිම කළයුතුය.	ව්‍යාපෘතියේ පරිසර අධ්‍යන වාර්තාව සැකසීම සඳහා අප කාර්යාංශය ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ආයතනයේ පෙර කළමණාකාරිත්වය තුල ඇතිව තිබූ විවිධ ගැටළුකාරී වාතාවරණයන් හේතුවෙන් සහ ගිං නිල්වලා ව්‍යාපෘතිය නිසා රටේ ඇතිව තිබූ අර්බුධකාරී තත්වයන් හේතුවෙන් මෙම සේවාවේ කටයුතු තාවකාලිකව නතර වී ඇත. අලුතින්	පාරිසරික බලපෑම් ඇගයීම් අවසන් වාර්තාව නිකුත් කර නොමැත.

				දිනට කාර්ය ඉටු කර නොතිබියදී 2022 පෙබරවාරි 09 දින කොන්ත්‍රාත්තු වටිනාකම රු.38,854,215 ක් ලෙස වැඩි කර තිබුණි. සමාගම 2022 දෙසැම්බර් 13 දින කෙටුම්පත් අවසන් වාර්තාව මේ සඳහා පත් වූ තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර තිබූ අතර, තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාව 2023 දෙසැම්බර් 27 දින සමාගම වෙත ලබාදී තිබුණි. එම වාර්තාව මඟින් අදාළ කෙටුම්පත් වාර්තාවේ පොදු අඩුපාඩු ලෙස අඩුපාඩු 07 ක් ද, විධායක සාරාංශ යටතේ අඩුපාඩු 09 ක් ද, පරිච්ඡේද 07 ක් යටතේ අඩුපාඩු 95 ක් ද නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස දක්වා තිබූ නමුත්, 2024 ජූලි 22 දින තෙක් එම අඩුපාඩු නිවැරදි කර වාර්තාව නිකුත් කර නොතිබුණි.	කණ්ඩායම් සාමාජිකයින් බඳවා ගැනීමට සිදුවූ අතර නව වියදම් ඇස්තමේන්තු සඳහා අමාත්‍යාංශය සහ උපදේශක කණ්ඩායම සමඟ සාකච්ඡාවන් සිදු කල අතර 2021 වනවිට පැවති ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන නව ඇස්තමේන්තුවක් සඳහා අනුමැතිය හිමිවිය. ඉන් අනතුරුව නැවත මෙම කටයුතු ආරම්භ වූවද කොවිඩ් වසංගතය, රටේ පැවති ඉන්ධන අර්බුධය ආදී දුෂ්කරතා පැවතී හේතුවෙන් එම කටයුතු අප සැලසුම් කල පරිදි සිදුකිරීමට නොහැකි විය. මෙම අවසන් වාර්තාව සැකසීමේදී තාක්ෂණ ඇගයීම් කමිටුව විසින්, අවසන් කෙටුම්පත් වාර්තාව සඳහා ලබාදුන් සියලු අඩුපාඩු සැලකිල්ලට ගනිමින් වාර්තාවේ පැවතී සියලු වැරදි නිවැරදි කෙරිණි.	
(ග)	සමාගම ප්‍රධාන වශයෙන් වාරිමාර්ග අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන ව්‍යාපෘති මඟින් පවරන කාර්යයන් පමණක් ඉටුකර තිබූ අතර, අනෙකුත්	2023	පෞද්ගලික අංශයෙන් උපදේශනාත්මක කාර්යයන් ලබා ගැනීමටද අවශ්‍ය කටයුතු සිදු කළයුතුය.	මේ පිළිබඳව සොයා බලා ඉදිරියේ දී වාර්තා කරනු ලැබේ.	පෞද්ගලික අංශයේ උපදේශනාත්මක කාර්යයන් ලබා ගැනීම කර නොතිබුණි.

	උපදේශන සේවා සපයන පෞද්ගලික ආයතන සමග තරහකාරී ලෙස මිල ගණන් ඉදිරිපත් කරමින් පෞද්ගලික අංශයේ උපදේශනාත්මක කාර්යයන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
(ව)	ආදායම් ජනනය කරන ඒකක සඳහා වෙනම ආදායම් හා වියදම් හඳුනාගෙන ලාභ පාඩු ගැලපීම සිදුකල යුතු වුවත් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස සේවය කරන ලෝක උරුම නකල්ස් ජලපෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංඟාද්‍රෝණි සහ පහළ නිම්නවල වෙසෙන ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ව්‍යාපෘති ලියවිලි (Project Documents) මඟින් තීරණය කර ඊට අදාළ කටයුතු සඳහා දරන වියදමින් ප්‍රතිශතයක් ආදායම ලෙස ලබාගෙන තිබුණි. මීට අදාළව ආදායම් වියදම් හඳුනා ගැනීම	2023	ඒ ඒ උපදේශන කාර්යයන්ට අදාලව වෙන වෙනම ගිණුම් තැබිය යුතුය.	මේ පිළිබඳව සොයා බලා ඉදිරියේ දී වාර්තා කරනු ලැබේ.	ආදායම් ජනනය කරන ඒකක සඳහා වෙන වෙනම ගිණුම් තබාගෙන නොමැත.

සඳහා වෙනම ගිණුම්
තැබීමක් සිදුකර ලාභ
පාඩු ගලපා නොතිබුණි.

3.25 මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	77,325,656	50,059,915	27,265,741	(1,325,556)	තත්ත්වාගණනය කළ
2022	72,300,466	52,042,863	20,257,603	167,815	තත්ත්වාගණනය කළ
2023	74,073,172	54,219,097	19,854,075	(295,352)	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි අක්කර 1,113 රූඩ් 0 පර්චස් 37.76 ක ඉඩම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩම සමාගම විසින් භාවිතා කරමින් තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17 හී 04 ඡේදය අනුව එම ඉඩම්වල වටිනාකම් ගිණුම්වලට ගෙන නොතිබුණි.	2022 2023	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්වලට ගත යුතුය.	සමාගමේ වත්කම් ලෙස ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කර නොමැත. සමාගම වෙත ඉඩම් පැවරීමක් සිදු කර නොමැත.	ගිණුම්ගත කර නොතිබුණි.
(ආ)	වාණිජ දැව වශයෙන් අලෙවි කිරීමට නිර්දේශ කර තිබූ දම්මින්න ගොවිපලෙහි තේක්ක ගස් 195ක් හා ගිරාඳුරුකෝට්ටේ ගොවිපලෙහි තේක්ක ගස් 211ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41හි 10 ඡේදය අනුව	2023	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මෙම ගස් තක්සේරු කර එම වටිනාකම ගිණුම් ගත කළ යුතුය.	ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ තේක්ක ගස් 211 ක් හා දම්මින්න ගොවිපළේ තේක්ක ගස් 195 ක් හඳුනාගෙන ලේඛන ගතකර ඇත. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත්	ගිණුම්ගත කර නොතිබුණි.

	තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.			කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටුවක් මගින් මෙම ගස් තක්සේරු කර එම වටිනාකම 2024 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	
(ඇ)	සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුව පිහිටි සිද්ධපුර ගොවිපොළ, හා වැලිකන්ද පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි. එම ගොවිපොළවල් සතු පිරිවැය රු.22,336,573 ක් වූ ගොඩනැගිලි හා සවිකිරීම්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ 63 ක්, ජෙනරේටර් 03 ක් සහ ලීබඩු හා සවිකිරීම් 260 ක් සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. තවද එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි.	2021 2022 2023	සමාගමට අයත් වත්කම් පමණක් ගිණුම් තැබීමට කටයුතුකළ යුතුය.	සමාගමේ පාලනයෙන් ඉවත් වී ඇති පහත සඳහන් ගොවිපළවල්, නිරාවිය, කන්තලේ, සිද්ධපුර, මුතුවැල්ල, තුංකම යන ගොවිපළවල්වල වත්කම් 2024 වර්ෂයට සමාගම මගින් භෞතික සත්‍යාපනය කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර සත්‍යාපන කමිටුවක් නම්කර එම කමිටුවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාජිකයෙකුද ඇතුළත් කර මෙම කාර්ය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිරවුල් කර නොතිබුණි.

(ඇ)	2013 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 110 ක කාලයක් සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු. 25,840,605 ක දායක මුදලක් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 04 වනවිටත් ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.6,208,029ක් වූ අධිභාර ගිණුම්ගත කර නොතිබුණි.	2022 2023	සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.	සේවක අර්ථ සාධක සඳහා ගෙවිය යුතු අධිභාර 2024 වර්ෂයේ ගිණුම්ගත කරනු ලැබේ	සේවක අර්ථසාධක ගෙවා නොමැති අතර ගෙවිය යුතු අධිභාර ගිණුම්ගත කර නොතිබුණි.
(ඉ)	2020 ජූලි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 42 ක කාලයක් සඳහා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවිය යුතු රු.1,345,988 ක දායක මුදල ගෙවා නොතිබූ අතර, ඊට අදාළව ගෙවිය යුතු රු.652,809ක් වූ අධිභාර, ගිණුම්ගත කර නොතිබුණි.	2022 2023	සියළු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	සේවක භාරකාර අරමුදල් සඳහා ගෙවිය යුතු අධිභාර 2024 වර්ෂයේ ගිණුම් ගතකරනු ලැබේ.	සේවා නියුක්තිකයන් ගේ දායක මුදල ගෙවා නොමැති අතර ගෙවිය යුතු අධිභාර ගිණුම්ගත කර නොතිබුණි.
(ඊ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.5,820,430 ක් වුවද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව අධිකාරිය විසින් සමාගමට ගෙවිය යුතු ශේෂය රු.12,710,820 ක් වීමෙන් ශේෂ අතර රු.6,890,390 ක වෙනසක් විය.	2022 2023	ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැති බව සහතික කරමි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ලැබිය යුතු ශේෂයේ වෙනස ලෙස දක්වා ඇති රු.446,460 ශේෂය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිරාවිය ගොවිපළ භාර ගත් දින	ශේෂ නිරවුල් කර නොමැත.

				2010.09.30 වන විට ගොවිපල සතුව තිබූ නිෂ්පාදන හා අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම බව සහතික කරමි.	
(උ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II කොටසේ 5 (1) වගන්තිය ප්‍රකාරව 2020 පෙබරවාරි මස සේවයෙන් ඉවත් වූ සේවකයන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු වූ රු.842,668ක් වූ පාරිතෝෂික විගණිත දින වූ 2024 මැයි 31 තෙක් ගෙවා නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉවත් වූ සේවකයන්ට පාරිතෝෂික ගෙවීම් කළ යුතුය.	මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඔවුන් සම්බන්ධ කරගන්නා ලදි.	පාරිතෝෂික ගෙවීම් කර නොමැත.
(ඌ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද මෙහෙයුම් අත්පොතේ 3.2 ඡේදය අනුව කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යවා නොතිබුණි.	2023	බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය.	2024 වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි.	අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන නොමැත.
(එ)	2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ	2023	කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය.	2024 වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි.	කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොමැත.

	කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.				
(ඒ)	ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ නිශ්කාර්යව තබා තිබුණු පිරිවැය රු.2,351,000 ක් වූ වාහන 6 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණයට කටයුතු කර නොතිබුණි.	2023	මෙම වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කළ යුතුය.	ගිරාඳුරුකෝට්ටේ ගොවිපලේ වාහන ලේඛනයේ දක්වා ඇති මෙම වාහන 06 න්, අංක 42-1470 දරන චතුර බවුසරය 2013 මැයි 15 දින අළුත්වැඩියාව සඳහා මඩාටුගම වැඩ ඒකකය වෙතද අංක 37-6614 දරන ට්‍රැක්ටරය හා අංක 42-832 දරන ලොරි රථය වෙන්දේසි කිරීම සඳහාද අංක 121-5661 දරන යතුරුපැදිය හා ට්‍රැක්ටර් ට්ලෙරය භාවිතයට ගත නොහැකි ලෙසද ට්‍රැක්ටර් බවුසරය අළුත්වැඩියාව සඳහාද ලෙස වෙන් කර ඇත.	අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොමැත.
(ඔ)	සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2023 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි.	2021 2022 2023	අවශ්‍ය පරිදි කොටස් නිකුත් කිරීමට පියවරගත යුතුය.	2024 වර්ෂයේ අප්‍රේල් මස මින් (රංජිත් අමරණාත් ඉබුල්දෙණිය මහතා) කොටසක් D.G.M.A.S.L. නමට මාරු කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි කොටස් දෙක පවරා ගැනීමෙන් පසු කොටස් නිකුත් කිරීම සිදුකරන බව දන්වා සිටිමි.	කොටස් නිකුත් කර නොමැත.

(ඕ)	ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගම ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක අමප/18/2083/803/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව රාජ්‍ය පෞද්ගලික කළමනාකරණයකට ගිවිසුම්ගතවී ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2022 ජනවාරි 18 දිනැති අංක අමප/21/2229/317/025 -1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද විගණිත දින තෙක් එම කටයුතු අවසන් කර නොතිබුණි.	2022 2023	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික කළමණාකරණය කට ගිවිසුම්ගතවී ප්‍රතිසංවිධානය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය.	මෙම බාහිර ආයෝජකයෙකු තෝරාගැනීමේ කාර්යය මුළුමනින්ම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසිනි.	රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානයවී නැත.
(ක)	පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක බ්‍රොයිලර් මස් නිෂ්පාදනයේ මූල්‍ය ප්‍රගතිය සියයට 11.63 ක් හා භෞතික ප්‍රගතිය සියයට 12.25 ක් වශයෙන් අඩු මට්ටමක පැවතුණි. එළුවන් ඇති කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 55.2 ක් වුවද, එහි භෞතික ප්‍රගතිය සියයට 41.46 ක් වී තිබුණි.	2023	වෙළෙඳපොල අධ්‍යනය කර ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර ඒ අනුව ස්ථාපිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.	ජනවාරි සිට ජූලි කාලය සඳහා පිටතින් මස් මිලදී ගෙන අලෙවි කරන ලදි. කාර්තුවකට කි.ග්‍රෑම් 1200 ගැනීමට ඇස්තමේන්තු කළද විකුණුම් අවශ්‍යතාවය මෙම කාර්තු දෙකට කි.ග්‍රෑම් 588 කි. එළු ඒකකයේ 2023 වර්ෂයට සතුන් අලෙවි කර ඇත්තේ එක් අවස්ථාවක් පමණි.	ගොවිපල නිෂ්පාදනය ඉහළ මට්ටමකට ගෙන නොමැත.

(ග)	ක්‍රියාකාරී සැලසුම අනුව සමාගම අයිස්ක්‍රීම් ලීටර 3,200 ක් නිපදවීම තුළින් රු.මිලියන 1.19ක ආදායමක් ඉපැයීමට අපේක්ෂා කර තිබුණද ලීටර 548ක් නිපදවීම තුළින් රු. මිලියන 0.31ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි.	2023	ප්‍රායෝගික තත්ත්වයන් මත ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කර ස්ථාපිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය.	අයිස් ක්‍රීම් නිෂ්පාදන යන්ත්‍රය නැවත අලුත් වැඩියා කළ නොහැකි ලෙස ක්‍රියා විරහිත වී ඇත. දෙවන කාර්තුවෙන් පසු නිෂ්පාදනය නතර වී ඇත.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය නතර කර ඇත.
(ච)	ගිරාඳුරුකෝට්ටේ ගොවිපොළ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ඉදිකරන ලද ගවගාල්, එළගාල් ඇතුළු ඉදිකිරීම් හා රු. 9,338,000 ක් වූ භාණ්ඩ 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරාදී තිබුණද මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් ඇති කර නොගැනීම හේතුවෙන්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි.	2021 2022 2023	මෙම ඉදිකිරීම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රමවේද සකසා ඒ අනුව කටයුතු කළ යුතුය.	වෙනත් පාර්ශවයකගේ අවශ්‍යතාවය මත ඉදිකරන ලද මෙම ගොඩනැගිලි 2016/02/08 වන දින සමාගම වෙත පවරා දුන් අතර ගොඩනැගිලි භාවිතයට ගැනීමට අවශ්‍ය සතුන් මිලදී ගැනීමේ හැකියාවක් සමාගම වෙත නොවූ අතර ඒ හේතුවෙන් අනවශ්‍ය වත්කම් වෙනුවෙන් ක්ෂය වෙන් කිරීමක් සමාගම වෙත පැවරී ඇත. එය අදායම් නොලබන වැය බරක් වී ඇත.	මෙම වත්කම් භාවිතයට ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් යොදාගෙන නොමැත.
(ජ)	ගිරාඳුරුකෝට්ටේ සත්ත්ව ගොවිපොළට අයත් 1986 වර්ෂයේ ඉදිකර තිබුණු ගොඩනැඟිලි 7 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පවතින හෙයින් ප්‍රයෝජනයට	2023	අබලන් ගොඩනැඟිලි පරීක්ෂා කර භාවිතයට ගත නොහැකි අපහරණයට කටයුතු කළයුතුය.	මෙම ගොඩනැගිලි 2024 වර්ෂය වත්කම් සත්‍යාපනයේදී හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරමි. නිෂ්පාදනාගාරයේ සියලු අලුත්වැඩියාවන් රාජ්‍ය පුද්ගලික හවුල්	ගොඩනැගිලි ඉවත් කර නොමැත.

ගෙන නොතිබුණි.	ව්‍යාපාරය ඇරඹූ පසු සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

3.26 සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	921,221,136	277,681,480	643,539,656	(2,764,772)	තත්ත්වාගණනය කළ
2022	1,204,495,037	319,534,409	884,960,627	346,987,513	තත්ත්වාගණනය නොකළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි රු.23,000,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණු හෙක්ටයර් 4.075 ක් වූ ඉඩමෙහි, 1989 හා 1996 කාලයේ සිට අනවසර පදිංචිකරුවන් 15 දෙනෙකු පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ගැටලුව නිරවුල් කරගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.	2022, 2023	නීත්‍යානුකූල හිමිකම් පරීක්ෂාවෙන් අනතුරුව නීතිමය ක්‍රියාමාර්ග මඟින් ඉඩමේ අයිතිය නිරවුල් කර ගත යුතුය.	අනවසර පදිංචිකරුවන් වෙත නිකුත් කර ඇති බලපත්‍ර අහෝසිකර එම භූමි ප්‍රමාණය කළුබෝවිටියාන කර්මාන්තශාලාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදුකරන ලෙස පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි මඟින් දන්වා ඇත.	අනවසර පදිංචිකරුවන්ගේ ගැටළුව නිරාකරණයකර ඉඩමේ අයිතිය මේ දක්වා නිරවුල් කර ගෙන නොතිබුණි.
(ආ)	තේ ශක්ති අරමුදල යටතේ ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා පිළිවෙලින් 2012 සහ 2015 වර්ෂයන්හිදී කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ් වෙත	2022, 2023	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තේ කර්මාන්තශාලා වල අයිතිය සමාගමට පවරාගැනීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය.	හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව පිහිටි ඉඩම වෙනුවෙන් බදු ගිවිසුමකට ඇතුළත් වීම සඳහා මූලික කටයුතු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සිදුකර තිබුණු	කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය මේ දක්වා පවරාගෙන නොතිබුණි.

මෙහෙයුම් කටයුතු සඳහා පවරා දෙනු ලැබූ අතර සමාගම විසින් තේ ශක්ති අරමුදල වෙත 2015 අප්‍රේල් 09 දින රු. මිලියන 50 ක ණය මුදලක්ද ලබා දී තිබුණි. 2019 මාර්තු 19 දිනැති අංක අමප/19/0743/117/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල සහ අදාළ පොලිය වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

අතර පළාත් ඉඩම් කොමසාරිස් විසින් මැණික්දිවෙල කර්මාන්තශාලාව පිහිටි ඉඩම සමාගම වෙත පවරා ගැනීමට අවශ්‍ය නිර්දේශය ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත ලබා දී ඇත.

3.27 සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 7 කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත කාලයට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	සී/ස හිඟුරාන සීනි කර්මාන්තායතනයේ හිටපු සාමාන්‍යාධිකාරි වෙත මූල්‍ය ප්‍රකාශන ලබා දෙන ලෙස ඉල්ලා 2022 සැප්තැම්බර් 27 දින අමාත්‍යාංශය විසින් ලිපියක් යවා ඇත.	2016 – 2023 වර්ෂ 08 කට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත.

(ආ)	1993 වර්ෂයේ පුද්ගලීකරණයට යටත්වූ මෙම ආයතනය අසාර්ථක වීම නිසා නැවත 1997 වර්ෂයේදී රජයට පවරාගෙන 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවූ බැවින් 2001 වර්ෂයේදී සියළු සේවකයන්ට වන්දි ගෙවා ඔවුන්ගේ සේවය අවසන් කර තිබුණු අතර මෙම කර්මාන්තායතනයට අයත් ඉඩම්වලින් කොටසක් සහ ගොඩනැගිලි අවුරුදු 30 ක බදු පදනම මත ලබාදී ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම පිහිටුවා තිබුණි. ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා 2016 වර්ෂයේදී සේවකයින් 9 දෙනෙකු සේවයේ යෙදී ඇති අතර වර්තමානය වන විට එක් සාමාන්‍යාධිකාරීවරයකු තාවකාලිකව පත් කරන ලද නමුත් ඔහු විසින් අදාළ කටයුතු සිදුකර නොතිබුණි. ඒ අනුව මෙම කර්මාන්තායතනය නාමිකව තිබෙන ආයතනයක් බවට පත්වී ඇති නිසා මෙම ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිතව පවති.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	කර්මාන්තාතන යේ වත්කම් නිශ්කාශනය හා ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය.	මේ වන විට මෙම ආයතනය නාමිකව පවතින ආයතනයක් බවට පත්වී ඇති බැවින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ඈවර කිරීමට කටයුතු කරනු ඇත.	කර්මාන්තායතන යේ වත්කම් නිශ්කාශනය හා ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට පියවර ගෙන නොමැත.

(ඇ)	1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවන මෙම කර්මාන්තායතනයේ ශේෂ පත්‍රයේ දැක්වෙන පිරිවැය රු.මිලියන 183 ක් වූ ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ යනාදි වත්කම් නිෂ්ක්‍රීයව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	කර්මාන්තාතන යේ පවතින වත්කම් වලින් නිසි ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය.	හිඟුරාන සීනි කර්මාන්තායතනයේ වත්කම් නිෂ්කාශනය හා ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත සකස් කර ඇත. ඉදිරි කටයුතු සිදු කරනු ඇත.	කර්මාන්තාතන යේ පවතින වත්කම් වලින් නිසි ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොමැත.
(ඈ)	කර්මාන්තායතනයට අයත් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාළ කම්හල් ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම වෙත 2007 වර්ෂයේදී ලබාදී තිබුණ ද 2009 මාර්තු 26 දිනැති අංක අමප 09/0398/329/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බදු ගිවිසුමක් පිළියෙල කොට ඒ සඳහා නීතිපති අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විධිමත් බදු ගිවිසුමක් සකස් කර නීතිපති අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 4/10/63593 හා 2021 පෙබරවාරි 15 දිනැති ලිපිය මඟින් මෙම ඉඩම් වල පරිපාලනය ගල්ඔය වැවිලි (පුද්) සමාගමට භාර දී ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විධිමත් බදු ගිවිසුමක් සකස් කර නීතිපති අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොමැත.
(ඉ)	වසර 20 කට පමණ පෙර බදු ගිවිසුම් මඟින් ගොවීන් 4493ක් අතර අක්කර 2.5 බැඟින් අක්කර 11,232 ක් ලබාදී තිබුණද, ඒ සඳහා බදු මුදල් අයවී නොතිබුණු අතර එම බදු ගිවිසුම්වල කාලයද ඉකුත්වී තිබුණි. මෙම ඉඩම් ආපසු ලබා ගැනීමට හෝ අලුතින්	2019 – 2022 ගනුදෙනු වාර්තාව	ගොවීන් වෙත ලබාදී තිබූ ඉඩම් සඳහා බදු ගිවිසුම් සකස් කර බදු මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය.	ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා හා මහා භාණ්ඩාගාරය හා සාකච්ජා කොට ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් සකස් කර, ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතී.	ගොවීන් වෙත ලබාදී තිබූ ඉඩම් සඳහා අළුතින් බදු ගිවිසුම් ඇති කිරීමට හෝ සංශෝධන කිරීමට හා බදු මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොමැත.

	බදු ගිවිසුම් අත්සන් කර බදු මුදල් අයකර ගැනීමට හෝ සීමා සහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම වෙත පැවරීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.				
(ඊ)	කර්මාන්තායතනය සතුව තිබෙන වත්කම් හා තොග සම්බන්ධයෙන් වසර 20 කට අධික කාලයක සිට භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	භෞතික සත්‍යාපනයක් කර එම වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කර ගැනීම හා එම වාර්තා විගණනය වෙත ලබාදීම නොපමාව සිදුකළ යුතුය.	සී/ස හිඟුරාන සීනි සමාගමේ වත්කම් නිශ්කාශනය හා ඇවර කිරීමේ කටයුතු වලදී වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් කිරීමට සැලසුම් කර ඇත. කර්මාන්තායතයේ නාරාහේන්පිට පරිශ්‍රයේ පිහිටි දේපළ වත්කම් විධිමත්ව භාර ගැනීමට පත් කළ කමිටුව මඟින් මේ වන විට එම පරිශ්‍රයේ පිහිටි භාණ්ඩ උපකරණ යන්ත්‍ර සූත්‍ර හා ලිපි ගොනු හඳුනාගෙන අවසන් අතර කර්මාන්තායතනය සතු වාහන (යතුරු පැදි හා මෝටර් රථ) වල වත්කම් ලියාපදිංචි කිරීමේ සහතිකය හා ඊට අදාළ යතුරු අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙස දන්වා 2022.09.26 දිනැති ලිපිය මඟින් සී/ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගමේ හිටපු සාමාන්‍යාධිකාරී	භෞතික සත්‍යාපනයක් කර එම වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කර ගැනීම හා එම වාර්තා විගණනය වෙත ලබාදීම සිදු කර නොමැත.

වෙත දැනුම් දී ඇත.

(උ)	කර්මාන්තායතනයට අයත් නිල නිවාස 273 කින් නිවාස 91ක අනවසර පුද්ගලයින් පදිංචිවී සිටින අතර ඔවුන් ඉවත් කිරීමට නීතිමය කටයුතු කර නොතිබුණි. එසේම අනෙකුත් නිවාසවලින් කුලී මුදල් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	නිල නිවාසවල පදිංචි වී සිටින අනවසර පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හා විධිමත් කුලී ගිවිසුම් සකස් කර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අනවසරව පදිංචි නිවාස 91 හි අනවසරකරුවන් ඉවත් කිරීමට හා නිවාසවලින් කුලී අයකර ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල් කටයුතු කරයි.	නිල නිවාසවල පදිංචි වී සිටින අනවසර පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හා විධිමත් කුලී ගිවිසුම් සකස් කර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොමැත.
(ඌ)	නාරාහේන්පිට කාර්යාලය තුළ බෝතල් නිෂ්පාදනාගාරයට අයත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, යතුරුපැදි 3 ක් හා මෝටර් රථයක්ද හිඟුරාන කම්හල් පරිශ්‍රයේ තිබෙන යන්ත්‍ර උපකරණ ඇතුළු වත්කම් ද 1997 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණු අතර එම වත්කම් අපහරණය කිරීමට 2023 වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.	2019 – 2022 ගනුදෙනු වාර්තාව	නිශ්කාර්යව පවතින වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.	2022 අප්‍රේල් 29 දිනැතිව පත්කර ගන්නා ලද කමිටුව මඟින් නාරාහේන්පිට පරිශ්‍රයේ ඇති නිශ්චල හා චංචල දේපළ භාරගැනීමේ කටයුතු අවසන් කර ඇත.	නිශ්කාර්යව පවතින වත්කම් අපහරණය කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත.
(එ)	කර්මාන්තායතනයේ පවතින සියලුම වත්කම් පිළිබඳව රජයේ තක්සේරු වාර්තා ලබාගන්නා ලෙස 2018 පෙබරවාරි 27 දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් හිටපු	2019 – 2022 ගනුදෙනු වාර්තාව	කර්මාන්තායතනයේ වත්කම් හා වගකීම් නිරවුල් කර ඇවර කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය.	මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත සකස් කර අවසන් වී ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ඇත.	කර්මාන්තායතනයේ වත්කම් හා වගකීම් නිරවුල් කර ඇවර කිරීමේ කටයුතු මේ දක්වා අවසන් කර නොමැත.

සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දී තිබුණු අතර 2017 පෙබරවාරි මස පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ හා 2019 අගෝස්තු 27 දිනැති අංක අමප/1972/117/058 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තායතනය ඇවර කිරීමටත් ඒ සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු බවටත් නියෝග හා අනුමැතිය ලබා දී තිබුණ ද 2023 වර්ෂය අවසානය දක්වා එම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.28 සී/ස කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ(පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	554,758,696	361,510,878	193,247,818	38,979,739	තත්ත්වාගණනය කළ
2022	574,804,381	392,814,989	181,989,392	(11,258,426)	තත්ත්වාගණනය කළ
2023	514,473,531	331,419,686	183,053,845	1,064,453	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට වසර 4 ක් සඳහා ආයෝජන මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු.24,749,632 ක් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය පියවීමට සමාගම අපොහොසත් වී තිබුණි.	2021, 2022, 2023	ආයෝජන මණ්ඩලයේ හිඟ ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතුය.	ගෙවීම් සැලැස්මක් යටතේ නියමිත හිඟ මුදල් පියවීම සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ (අයකිරීම්) සමඟ සාකච්ඡා කිහිපයක් සිදු කර ඇත.	ගෙවීම් සිදු කර නොතිබුණි.
(ආ)	සමාගම විසින් 2015 පෙබරවාරි 18 දින සිට වසර 20 ක කාලයක් සඳහා කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම, සහ පවත්වාගෙන යාමේ හිමිකම සහිතව ඉඩමක් බදු ලබාගැනීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළැඹ තිබුණි. කෙසේ වෙතත්,	2021, 2022, 2023	ගිවිසුම් අනුව ගෙවීම් සිදු කළ යුතුය.	ගෙවිය යුතු ගාස්තු අවසන් කිරීම සඳහා සාකච්ඡා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සිදු වෙමින් පවතී.	මුළු බලපත්‍ර ගාස්තුව වාරික 4 කින් ගෙවීමට එකඟ වී ඇති අතර ඉන් එක් වාරිකයක් ගෙවා තිබුණි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 17 වන දින සමාගමට යවන ලද ලිපියට අනුව, 2017 සිට 2023 දක්වා කාලය සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු.31,308,661 ක් මෙතෙක් ගෙවා නොතිබුණි.

(ඇ) සමාගම 2015 මාර්තු 10 දින පෞද්ගලික වාණිජ බැංකුවකින් රු.මිලියන 426.4 ක කාලීන ණයක් ලබා ගෙන තිබූ අතර, ණය ගිවිසුමේ විශේෂ කොන්දේසි අංක 11 අනුව, ව්‍යාපෘතිය මගින් ජනනය කරන ලද මුදල් ණය වාරික ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම් ණය සම්පූර්ණයෙන්ම පියවන තුරු හා අවශ්‍ය විටෙක ඒවා නැවත ප්‍රතිපූර්ණයට, මාස 03 ක ණය වාරික වලට සමාන මුදලක් ආවරණය වන පරිදි රු.13,200,000 ක සංචිතයක් තැන්පතු ගිණුමක පවත්වාගත යුතුව තිබුණි. එහෙත් සමාගම විසින් එවැනි සංචිත ගිණුමක් පවත්වා ගෙනනොතිබුණි. තවද, සමාගම විසින් නියමිත වේලාවට ණය වාරික ගෙවීමට අපොහොසත් වී තිබූ බැවින් 2023 වර්ෂය තුළදී රු.59,202,221 ක ණය වාරික තාවකාලික අයිරා

	පහසුකමක් හරහා බැංකුව විසින් අයකරගෙන තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමටණය පොලිය හැර රු.2,167,496ක අයිරා පොලී සහ වෙනත් දඩ පොලියක් ලෙස රු.149,435 ක් ගෙවීමට සිදුව තිබුණි.				
(ඇ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 185 (1) (අ) වගන්තියේ විධිවිධානයට පටහැනිව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සීමාසහිත බයෝ - මෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගම අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 101 ක මුදලක් සීමාසහිත ශ්‍රී ලංකා එනජීස් (පුද්ගලික) සමාගමට ලබා දී තිබුණි.	2023	සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	ඉදිරිපත් කරන ලද යෝජනාවන් සමඟ, සමාගම අනාගතයේදී මෙම හොඳම භාවිතයට අනුගත වනු ඇත.	අනාගතයේදී ප්‍රධාන ගනුදෙනු සඳහා ඒ ඒ සමාගමට වෙන් වෙන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමට අපේක්ෂිතය.

3.29 සී/ස දැදුරුඔය කුඩා ජල විදුලි (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	379,064,295	310,565,190	68,499,105	31,430,866	තත්ත්වාගණනය කළ
2022	429,467,605	325,530,581	103,937,024	35,437,919	තත්ත්වාගණනය නොකළ
2023	411,182,558	301,005,903	110,176,655	6,239,630	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පුරස්කාර ගාස්තු රු.31,259,762 ක් වූ අතර මෙම ශේෂය 2021, 2022 සහ 2023 වසර සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු පුරස්කාර ගාස්තුවලින් සමන්විතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂය පියවීමට සමාගම කටයුතු කර නොතිබුණි.	2021, 2022, 2023	නියමිත ශේෂය පියවීමට කටයුතු කළ යුතුය.	අවබෝධතා ගිවිසුමට අනුව ගෙවීම් සිදු කරනු ලබන්නේ ඉල්ලූ විට පමණි. දැනට මෙය එකතු වී තිබුණත් ඉල්ලන ලද ඉල්ලීම් සියල්ල මේ වන විට අවසන් කර ඇත.	ගෙවීම් සිදු කර නොතිබුණි.
(ආ)	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 126 වන වගන්තිය නිසි පරිදි සම්පූර්ණ කරන ලද බදු වාර්තා සහ උපලේඛන සමඟ වෙනත් අවශ්‍ය ලියකියවිලි තක්සේරු වර්ෂය අවසානයේ	2021, 2022, 2023	දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	2022/23 සඳහා ආදායම් බදු වාර්තාව ගොනු කිරීමට කටයුතු කරනු ලැබේ.	2022/2023 තක්සේරු වර්ෂය සඳහා බදු වාර්තා ගොනු කර නොතිබුණි.

	නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද සමාගම 2022/2023 තක්සේරු වර්ෂය සඳහා වාර්තා ගොනු කර නොතිබුණි. සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බදු මුදල රු. 22,927,946ක් විය.				
(ඇ)	සමාගම 2021 අගෝස්තු 06 වැනි දින පෞද්ගලික වාණිජ බැංකුවකින් රු.මිලියන 83.2ක කාලීන ණයක් ලබා ගෙන තිබූ අතර, ණය ගිවිසුමේ විශේෂ කොන්දේසි අංක 02 අනුව, ව්‍යාපෘතිය මගින් ජනනය කරන ලද මුදල් ණය වාරික ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම් ණය සම්පූර්ණයෙන්ම පියවන තුරු හා අවශ්‍ය විටෙක ඒවා නැවත ප්‍රතිපූර්ණයට, ණය සේවා සංචිත ගිණුමක් මාස 03ක ණය සේවා බැඳීමකට යටත්ව පවත්වාගෙන යා යුතුව තිබුණි. එහෙත් සමාගම විසින් එවැනි සංචිත ගිණුමක් පවත්වා ගෙන නොතිබුණි. තවද, සමාගම විසින් නියමිත වේලාවට ණය වාරික ගෙවීමට	2023	ණය කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියා කළ යුතු අතර දඩ පොලී මගහරවා ගැනීමට නියමිත දිනට ණය වාරික ගෙවීමට කටයුතු කල යුතු සේම, අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කල යුතුය.	• විදුලිබල මණ්ඩලයේ ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් මේ තත්ත්වය ඇති වී ඇත. • ඉදිරියේදී සවිස්තරාත්මක හෙළිදරව් කිරීම් එකතු කරනු ලැබේ.	• සංචිත ගිණුමක් මේ දක්වා ආරම්භ කර නොතිබුණි. • මේ වන විට අයිරාව මගින් ණය වාරික නොගෙවන අතර, නියමිත දිනට ණය වාරික ගෙවමින් පවතී. • 2024 දී සවිස්තරාත්මක හෙළිදරව් කිරීම් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

අපොහොසත් වී තිබූ බැවින් 2023 වර්ෂය තුළදී රු.10,800,000 ක ණය වාරික තාවකාලික අයිරා පහසුකමක් හරහා බැංකුව විසින් අයකරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමට ණය පොලිය හැර රු.2,204,244 ක අයිරා පොලී සහ වෙනත් දඩ පොලියක් ගෙවීමට සිදුව තිබුණි.

තවද, ව්‍යාපෘති වත්කම් (ඉඩම් හැර පිරියත සහ යන්ත්‍රෝපකරණ) සහ ව්‍යාපෘතිය වෙනුවෙන් රාජ්‍ය ආයතන විසින් නිකුත් කරන ලද සියලුම අවසර පත්, බලපත්‍ර සහ අනුමැතීන් මූලික සුරැකුම් වශයෙන් ද සමාගම විසින් නිකුත් කරන ලද කොටස් හිමියන්ගේ 100% කොටස් අයිතිය අවලංගු කල නොහැකි ඇටෝර්නි බලපත්‍රයක් මඟින් අතිරේක උකසක් ලෙසද පවරා ගැනීමේ අයිතිය බැංකුව වෙත පවරා තිබුණි. එසේම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ සමාගම අතර ඇති අවබෝධතා ගිවිසුමේ (MOU) 06 වැනි වගන්තියට අනුව, ව්‍යාපෘතියට ලබා දී ඇති මූල්‍ය ආධාර ආපසු ගෙවීම පැහැර හරින අවස්ථාවකදී එහි පාඩුව අයකර ගැනීම සඳහා

	බැංකුව විසින් බලාගාරයේ මෙහෙයුම් අත්පත් කර ගත හැකි සේද දක්වා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත ණය මුදලෙහි ඇප කොන්දේසි සවිස්තරාත්මකව හෙළිදරව් කර නොතිබුණි.				
(ඇ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 185 (1) (අ) වගන්තියේ විධිවිධානයට පටහැනිව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සීමාසහිත බයෝ - මෙඩ් හයිඩ්‍රෝ පවර් (පුද්ගලික) සමාගම අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 97 ක මුදලක් සීමාසහිත ශ්‍රී ලංකා එනජීස් (පුද්ගලික) සමාගමට ලබා දී තිබුණි.	2023	සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	ඉදිරිපත් කරන ලද යෝජනාවන් සමඟ, සමාගම අනාගතයේදී මෙම හොඳම භාවිතයට අනුගත වනු ඇත.	අනාගතයේදී ප්‍රධාන ගනුදෙනු සඳහා ඒ ඒ සමාගමට වෙන් වෙන් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමට අපේක්ෂිතය.

3.30 ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	196,208,335	63,466,587	132,741,748	31,430,866	තත්ත්වාගණනය කළ
2022	199,542,227	64,714,482	134,827,745	35,437,919	තත්ත්වාගණනය කළ
2023	193,514,977	56,736,379	136,778,597	6,239,630	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 90 (1) (අ) වගන්තියට අනුව, "වාරික ගෙවන්නෙකු" වන පුද්ගලයෙකු කාර්තු වශයෙන් බදු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, සමාගම ආරම්භයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු රු.මිලියන 17.47 ක් විය.	2021, 2022, 2023	දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	පසුගිය වර්ෂ සඳහා ආදායම් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. සමාගමේ මූල්‍ය තත්වය මත ආදායම් බදු ගෙවීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.	පසුගිය වර්ෂ සඳහා ආදායම් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. ආදායම් බදු ගෙවීම් සිදු කර නොමැත.

3.31 කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,309,405,097	186,614,997	1,122,790,100	75,874,385	තත්ත්වාගණනය නොකළ
2022	1,432,482,221	221,988,334	1,210,493,887	129,321,728	තත්ත්වාගණනය නොකළ
2023	1,683,741,116	348,151,957	1,335,589,159	241,581,037	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම විසින් 2022 වර්ෂය තුළ හා 2023 ජූලි මාසය දක්වා කාලය තුළ ප්‍රසම්පාදන 55 ක් වෙනුවෙන් රු.4,113,720 ක් මුදලින් ගෙවා ඇති අතර ඒ අනුව සුළු මුදල් ප්‍රමාණය ඉක්මවා ගෙවා ඇති බැවින් මුදල් හැසිරවීම් පාලන අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.	2022	අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටීන් ශක්තිමත් කළ යුතුය.	හදිසි මිලදී ගැනීමේදී ඇතිවන මුදල් ගනුදෙනු අඩු කිරීම සඳහා නඩත්තු ද්‍රව්‍ය තොග පවත්වා ගෙන යනු ලැබේ.	අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටීන් ශක්තිමත් කර නොතිබුණි.
(ආ)	කුලී ගැනුම්කරුවන් සහ කැනොවින් ආයතනය අතර බදු ගිවිසුම්වලට අනුව සියළුම කුලී ගැනුම්කරුවන් කැනොවින් ආයතනය විසින් සපයනු ලබන ජලය, විදුලිය සහ අනෙකුත් උපයෝගීතා සම්බන්ධයෙන් උපයෝගීතා	2022	බදු ගිවිසුම් වලට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	හිඟ බදු මුදල් සාකච්ඡා කර අයකර ගැනීමට කුලී ගැනුම්කරුවන් සමඟ රැස්වීම් පැවැත්වීම සිදු කළ බව දැනුම් දී තිබුණි. සාප්පු හිමියන් ඔවුන්ගේ දුෂ්කරතාවය ඉස්මතු කර උපයෝගිතා බිල්පත් ගෙවීම ප්‍රමාද කරන අතර	2024 සැප්තැම්බර් 30 දිනට ක්‍රියාකාරී කුලී ගැනුම්කරුවන් ගේ හිඟ උපයෝගිතා ශේෂය රු.7,908,890 දක්වා අඩු වී ඇත.

	ඉන්වොයිසිය නිකුත් කිරීමෙන් පසු දින 7 ක් ඇතුළත උපයෝගීතා බිල්පත් ගෙවිය යුතුය. නියමිත දිනට කුලී ගැනුම්කරුවන් විසින් උපයෝගීතා බිල්පත් පියවා නොමැති නම් එවැනි කාලසීමාවකට පසුව උපයෝගීතා විසන්ධි කරනු ලැබේ. කෙසේ වෙතත් එම කාලපරිච්ඡේදය සඳහා කුලී ගැනුම්කරුවන් 24 දෙනෙකුගෙන් රු.27,430,097 ක් හිඟ හිට ඇති අතර සමාගම උපයෝගීතා විසන්ධි කිරීමට හෝ ගෙවිය යුතු මුදල් අය කර ගැනීමට පියවර ගැනීමට අපොහොසත් වී තිබුණි.			පැමිණෙන පාරිභෝගිකයින්ට උසස් තත්ත්වයේ සේවාවක් සැපයීම සමාගමේ අරමුණයි. එබැවින් කල්බදු ගිවිසුම අනුගමනය කිරීම සහ ඔවුන්ගේ උපයෝගිතා සැපයුම විසන්ධි කිරීම කළ නොහැකි බැවින් දිගින් දිගටම මතක් කරමින් ඔවුන්ගේ හිඟ උපයෝගිතා බිල්පත් එකතු කර ඇත.	
(ඇ)	කැනොවින් ආකේඩ් ඉදිකිරීම් මූලික සැලැස්මට අනුව, හරිත සංකල්පයට අනුකූලව ඉහළ මහලේ විවෘත ප්‍රදේශයේ ගස් සිටුවීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත්, එය ආරම්භයේ සිට මේ දක්වා සමාගම විසින් සිදු කර නොතිබුණි.	2022, 2023	මූලික සැලැස්මට අනුකූල වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	---	මූලික සැලැස්මට අනුව ගස් සිටුවීමට වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.
(ඈ)	කනොවින් ආර්කේඩ්හි ඉහළ මහලේ පරිපාලන කාර්යාලය, ගබඩා සහ විශේෂ පුද්ගලයන් සඳහා වන වැසිකිලි පමණක් පිහිටා තිබුණි. දීර්ඝ කාලයක සිට එම මහලේ ඉතිරි ප්‍රදේශය	2022, 2023	පවතින ඉඩ ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	2022 අප්‍රේල් 25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව Arcade හි ප්‍රභූ විවේකාගාරයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව	ආදායම් උත්පාදනය සඳහා මෙම ඉඩකඩ ප්‍රයෝජනයට ගැනීමට කළමනාකාරිත්වය අවශ්‍ය

	නිසි කළමනාකාරීත්වයකින් තොරව ප්‍රයෝජනයට ගෙන නොමැති බැවින් මෙම ප්‍රදේශයෙන් ලැබෙන කුලී ආදායමද අහිමි වී තිබුණි.			සාකච්ඡා වූ අතර SLIC සභාපතිවරයා ප්‍රකාශ කළේ ඒ සඳහා ආයෝජනය කිරීමට සලකා බලන බවයි. එසේ වුවද, ප්‍රභූ විවේකාගාරය පිළිබඳ සාකච්ඡා අවසන් නොවීය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඉ)	2024 අගෝස්තු 29 වැනි දින විගණනය විසින් කරන ලද පරීක්ෂණයට අනුව, කැනොවින් ආකේඩ් හි ‘‘ඒ’’ සහ ‘‘බී’’ බ්ලොක් දෙකෙහි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්ථාපිත කිරීමට නියමිත ස්ථාන 5 න් ස්ථාන 2 ක් හිස්ව ඇති බව නිරීක්ෂණය විය.	2022, 2023	පවතින ඉඩ ඵලදායී ලෙස භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	හිස් ඉඩ සඳහා ATM යන්ත්‍රය හෝ CRM යන්ත්‍රය සවි කරන ලෙස සමාගම මහජන බැංකුවෙන් සහ ලංකා බැංකුවෙන් (BOC) ඉල්ලා ඇත. මෙය අසාර්ථක වී ඇත.	කළමනාකාරීත්වය වෙනත් වාණිජ බැංකුවලින් මෙම සේවාව ලබා ගැනීමට උත්සාහ කරයි.
(ඊ)	කැනොවින් ආකේඩ් හි පිහිටා ඇති LED පුවරු දෙක ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. සමාගමට බදු දී ඇති ඉඩමේ මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් ඔවුන්ගේම මුදලින් මෙම පුවරු ඉදිකර ඇති අතර මෙම වත්කම්වල අයිතිය RDA විසින් සමාගමට පවරා නොතිබුණි. RDA හෝ Canowin Arcade හෝ මෙම පැනලයන් රජයට ආදායම් උත්පාදනය කිරීමට කළමනාකරණය කර නොතිබුණි.	2022, 2023	මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ නිගමනයකට පැමිණිය යුතුයි.	ගැටලුව විසඳීම සඳහා සමාගමේ කළමනාකාරීත්වය මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) සමඟ සාකච්ඡා කළේය. එවිට සමාගමෙන් විරෝධයක් ඇත්නම් LED පුවරු RDA අයත් ඉඩමකට ගෙන යාමට RDA එකඟ විය. සමාගම සිය විරෝධය ප්‍රකාශ කළ පරිදි, මෙම LED පැනල් මාරු කිරීමේ අරමුණ සඳහා ඉඩම් මැනීමක් සිදුකිරීමට RDA සමාගමේ සභාපතිවරයාගෙන්	සාකච්ඡා මට්ටමේ පවතී.

				අවසර ඉල්ලා ඇති අතර අවසානයේ දී ඉඩම් මැනීම සිදු කර වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්ශවය එකඟ වී ඇත.	
(උ)	2023 වර්ෂය ආවරණය කෙරෙන කාලපරිච්ඡේදයට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2021, 2022, 2023	සංයුක්ත සැලැස්ම සකසා ක්‍රියාත්මක කිරීම තුළින් එහි උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.	සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා සාකච්ඡා කිහිපයක් සිදු කරන ලදී. වසරක් සඳහා සකස් කරන ලද දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් එකතු කර වැඩිදුර කටයුතු සඳහා අධ්‍යයනය කරන ලදී.	ගිණුම් වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි. 2025 සිට 2030 දක්වා සංයුක්ත සැලැස්ම පිළියෙළ කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගනිමින් සිටී.
(ඌ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.1.1 (අ) වගන්තියට අනුව, ව්‍යාපෘතිය නියමිත වේලාවට අවසන් කිරීම සහතික කිරීම සඳහා සහ ඒ සඳහා හොඳම වෙළඳපල වටිනාකම ලබා ගැනීම සඳහා සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, ආයතනය 2023 වර්ෂය සඳහා නිශ්චිත කාල රාමු සහිතව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2021, 2022, 2023	කළමනාකරණය ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.	ප්‍රසම්පාදන සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම තුළින් 2025 වසර සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කෙරේ.	2025 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.
(එ)	නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු සහ විගණන හා කළමනාකරණ කමිටු	2023	වගකිවයුතු පුද්ගලයාගෙන් පාඩුව අයකර ගැනීම සඳහා මේ	ආරම්භයේ සිටම වත්කම් ලේඛනයක් නොතිබූ බැවින් වත්කම් අලාභ සඳහා	ස්ථාවර වත්කම් අත්පොතට අනුව වත්කම් පාලනය කළද වත්කම්

	(AMC) රැස්වීමේ නිර්දේශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව පාඩු කපාහැරිය හැකි වුවද, PED 01/2021 (1) අංක දරන සහ 2023 මැයි 16 දිනැති පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අනුගමනය නොකර සමාගම විසින් දේපළ පිරියත උපකරණ අගය රු.1,654,747ක් කපා හැර තිබුණි.		සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම අවශ්‍ය වන අතර සමාගම විසින් චක්‍රලේඛ මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට නොහැකි වූ අතර වත්කම් මේ වන විටත් ක්ෂය වී ඇති බැවින් පොලිස් ක්‍රියාමාර්ග හෝ නීතිමය ක්‍රියාමාර්ග නොගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේ නැති වූ වත්කම්, වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමටයි.	අලාභ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොමැත. .
(ඒ)	2022 වර්ෂය සඳහා සබ්වේ (Subway) මෙහෙයුම් වලින් ලද විකුණුම් ආදායම රු.43,223,601 කි. කෙසේ වෙතත්, ද්‍රව්‍ය, ශ්‍රමය, පුරස්කාරය සහ අනෙකුත් වියදම් ඇතුළුව සම්පූර්ණ මෙහෙයුම් පිරිවැය රු.43,724,252 කි. සමාගම 2023 වර්ෂය තුළ සබ්වේ (Subway) මෙහෙයුම් වලින් රු.500,651 ක පාඩුවක් වාර්තා කර තිබුණි. මෙලෙස සෘණ ප්‍රතිලාභ ලබා ගැනීම සමාගමට මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවේ.	2022, 2023	සබ්වේ (Subway) ලාභ උපයන ආයතනයක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අලෙවිකරණ ප්‍රයත්න වැඩි කිරීම, මෙනුව ප්‍රතිසංස්කරණය කිරීම, ආහාර පිරිවැය පාලනය කිරීම, කාර්ය මණ්ඩල පුහුණුව වැඩි දියුණු කිරීම, මූල්‍ය කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ තරඟකරුවන්ගෙන් වෙනස් කිරීම සඳහා ක්‍රියා කර ඇත.	Subway ලාභදායී ආයතනයක් බවට පත් කිරීමට කටයුතු කරමින් පවතී.
(ඔ)	2024 අගෝස්තු 29 සහ 30 යන දිනවල සිදු කරන ලද විගණන පරීක්ෂණයේ දී කැනොවින් ආකේඩ් හි	2023	මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු	හානියට පත් ස්ථානවල අලුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.	A සහ B කලාප දෙකෙහිම epoxy coating of the water base layer ආලේපනයෙන්

A සහ B පැත්තේ පඩිපෙළේ හානි කිහිපයක් නිරීක්ෂණය විය. තවද, A පැත්තේ පඩිපෙළ අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව රු.1,480,000කට ලබා දී ඇති බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්තුව අසම්පූර්ණ වුවද, සමාගම සම්පූර්ණ කොන්ත්‍රාත්තුව වටිනාකම ගෙවා ඇත. මෙම ආකේඩ් හි B පැත්තේ පඩිපෙළ අලුත්වැඩියා කිරීම සම්බන්ධ කොන්ත්‍රාත්තුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර එම කොන්ත්‍රාත්කරුටම රු.1,680,000 කට ලබා දී ඇත.	අයගෙන් පාඩු අයකරගත යුතුයි.	50% ක් මේ වන විට අවසන් කර ඇත.

3.32 වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	171,278,409	182,466,260	(11,187,851)	(14,205,722)	තත්ත්වාගණනය කළ
2022	150,692,540	158,785,341	(8,092,801)	(1,971,616)	තත්ත්වාගණනය කළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ඕටර්ස් ඇක්වටික් සමාජශාලා පරිශ්‍රය තුළ පවතින පැසිපන්දු ක්‍රීඩා පිටිය සඳහා 2020 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා රු.175,790 ක් පමණ ඉතා අවම ආදායමක් උපයාගෙන තිබුණ අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වියදමින් නවීකරණය කොට, ජාතික පැසිපන්දු කණ්ඩායමේ පුහුණුවීම් සඳහා භාවිතා කිරීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විමසා තිබුණි. නමුත් 2021 සැප්තැම්බර් 27 දිනැති අංක 53/2/29 දරන නාගරික සංවර්ධන අධිකාරි අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව ඔටර්ස් ඇක්වටික් සමාජශාලා පරිශ්‍රය	2021	සමාගම සතු වත්කම් ඵලදායි ලෙසත් උපරිම කාර්යක්ෂමතාවයක් ලැබෙන ආකාරයටත් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් මෙම පරිශ්‍ර සහ ව්‍යාපාරික මෙහෙයුම උනන්දුවක් දක්වන පාර්ශ්වයකට යෝජනාව සඳහා වන ඉල්ලීම (Request for Proposal) හරහා පැවරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. එබැවින් තවදුරටත් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආයෝජනය කිරීමට අදහසක් නැත.	UDA විසින් මෙම පරිශ්‍රයට සහ ව්‍යාපාරික මෙහෙයුමට උනන්දුවක් දක්වන පාර්ශවයකට යෝජනාව සඳහා වන ඉල්ලීම (Request for Proposal) හරහා පැවරීමේ ක්‍රියාවලියේ ආරම්භක අවස්ථාවේ පවතී.

	සංවර්ධනය කිරීමට අදාළව සංවර්ධන යෝජනා කැඳවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වා තිබුණි. නමුත් 2022 අගෝස්තු 17 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී කිසිදු සංවර්ධනයක් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.				
(ආ)	කොළඹ 07 සරණ මාවතේ හෙක්ටයාර් 1.163 ක පමණ වපසරියකින් යුතු ඔටර්ස් ඇක්වටික් සමාජශාලාව පවත්වාගෙන යන ඉඩම හා දේපල ඉතාම සළුලදායීව හා ඉතා අලංකාරව ක්‍රීඩාවන්ට මුලිකත්වය දෙමින් පවත්වාගෙන යා හැකි ස්ථානයක් වුවත් ඌන උපයෝජිතව පැවතීම හේතුවෙන් රජයේ දේපල නිසි නඩත්තුවකින් තොරව අකාරයක්ෂමව පවතින බව නිරීක්ෂණය විය.	2021, 2022	සමාගම පිහිටුවීමේ අරමුණු හඳුනාගෙන ඒ අනුව අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	- එම -	පවතින අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.
(ඇ)	2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සම්පූර්ණ වගකීම් එහි මුළු වත්කම් රු.8,092,801 කින් ඉක්මවා ඇති අතර 2021 සහ 2022 වසර සඳහා මෙහෙයුම් වලින් අඛණ්ඩ අලාභයන්	2022	අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලු මඟහරවා ගැනීමට සැලසුම් සකස් කළ යුතුය.	ත්‍රෛපාර්ශවීය ගිවිසුමේ නියමයන් සහ කොන්දේසිය අනුව සමාගම විසින් අවන්හල් පවත්වාගෙන යාමේ කටයුතු භාරගෙන ඇත. කෙසේ වෙතත්, ත්‍රෛපාර්ශවීය	අමතර ආදායම වැඩි කර ගැනීම සඳහා සියලුම ක්‍රීඩා කටයුතු සඳහා බාහිර පුද්ගලයින්ට සහ සාමාජිකයින් නොවන අයට ව්‍යාපාරික

				පිළිවෙලින් රු.14,205,722 ක් සහ රු.1,971,616 ක් ලෙස වාර්තා කර ඇත. තවද 2022 වර්ෂය අවසානයේදී ජංගම වගකීම්, රු.27,531,234 කින් ජංගම වත්කම් ඉක්මවා ඇත. මෙම සිදුවීම් මඟින් පෙන්නුම් කරනු ලබන්නේ සමාගමට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව වන අතර එම නිසා සමාගමට සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළින් එහි වත්කම් උපයෝජනය කර ගැනීමට සහ වගකීම් පියවීමට නොහැකි විය හැකිය. 2022 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන වල (සහ එහි සටහන්) මෙම කරුණ සමඟ පවතින සැලසුම්, කළමනාකාරිත්වය විසින් ක්‍රියාත්මක කර ඇති හෝ පවතින වෙනත් අවම කිරීමේ සාධක සම්බන්ධයෙන් අවශ්‍ය හෙළිදරව් කිරීම් පිළිබඳව අනාවරණය නොකරයි.	ගිවිසුමේ විශේෂ කොන්දේසි හේතුවෙන් පිටස්තරයින්ට සහ සාමාජිකයින් නොවන පුද්ගලයින්ට සේවා සැපයීම සීමා කිරීම හේතුවෙන් සාර්ථක මෙහෙයුමක් ලෙස පවත්වාගෙන යාම සහ සාධාරණ ආදායම් උත්පාදනයක් සීමා කර ඇත. සාමාජිකයින් බලාපොරොත්තු වූ පරිදි අනුග්‍රහය නොදැක්වීම නිසා මෙය ෝටර්ස් එජ් වෙත බරපතල ප්‍රශ්නයක් වී ඇත	කටයුතු සඳහා ඉඩ සැලසීම සඳහා සමාගම හි කළමනාකාරිත්වය 80 සමාජ ශාලාවෙහි කමිටු සාමාජිකයින් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. කෙසේ වෙතත්, වරින් වර පාඩු අවම කිරීම සඳහා කාර්යයන් සිදු කිරීමට කළමනාකාරිත්වයට නොහැකි වී ඇත.
(ඇ)	සමාගමේ අවසාන මව් ආයතනය වන නාගරික සංවර්ධන අධිකාරිය 80 ක්ලබ් ආයතනයේ ගොඩනැගිල්ල	2022	මෙම ආයෝජනය මූල්‍යමය වශයෙන් ශක්‍ය එකක් බවට පත් කිරීමට ක්‍රියා කළ යුතුය.	ත්‍රෛපාර්ශවීය ගිවිසුමට අනුව සමාගම පත් කරනු ලබන්නේ ආපනශාලාව	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ආයෝජන නිසි පරිදි

				කළමනාකරණය සහ පවත්වාගෙන යාම සහ පරිශ්‍රය නඩත්තු කිරීම සඳහා පමණි. එබැවින් සමාගම හට සාමාජිකත්වයට හෝ UDA විසින් පාලනය වන වෙනත් කටයුතුවලට සම්බන්ධ වීමට අයිතියක් නැත.	කළමනාකරණය කර නොතිබුණි.
					ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.මිලියන 411.42 ක් වැය කර ඇතත්, 80 ක්ලබ් ආයතනයේ ප්‍රධාන ආදායම වන සමාජයේ සාමාජික ගාස්තු ආදායම සමාගමට හෝ නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර නොතිබුණි. 2022 වර්ෂය සඳහා සමාජයේ සාමාජික ගාස්තු ආදායම රු.19,484,722 කි. ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව 80 ක්ලබ් කමිටුව විසින් සාමාජික ගාස්තුව එකතු කරන ලද අතර කමිටුව නාගරික සංවර්ධන අධිකාරියට මාසික ගාස්තුව රු.මිලියන 1.2 ක් සහ සමාගමට රු.505,000 ක් පමණක් ගෙවා ඇත. මෙවැනි විශාල ආයෝජනයක් සඳහා එවැනි අඩු ප්‍රතිලාභයක් ලබා ගැනීම නාගරික සංවර්ධන අධිකාරියේ හෝ සමාගම යන දෙපාර්ශවයටම මූල්‍යමය වශයෙන් ශක්‍ය නොවේ.
(ඉ)	ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවේ ටෙනිස් පිටියේ තාප්පයෙන් වෙන්කර තිබූ පර්චස් 2 ක පමණ ඉඩම ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබුණි.	2021, 2022	පවතින සම්පත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	-	2024 සැප්තැම්බර් 30 දින වන විටත් සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ඊ)	ඔටර්ස් ඇක්වටික් සමාජශාලාවෙහි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට පෙර ඉදිකරන ලද තාර ඇතුරු පැසිපන්දු පිටිය සහ විවෘත වේදිකාව අතර ගොඩනැගිල්ල කිසිදු කාර්යයක් සඳහා භාවිතා කර නොතිබුණ අතර ආයතනයේ භාවිතයට ගත නොහැකි අබලි භාණ්ඩ ගබඩා කර පැවතුනි.	2021, 2022	- එම -	වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම අවන්හලෙහි සහ ක්‍රීඩා ක්‍රියාකාරකම්හි මෙහෙයුම් කටයුතු පමණක් සිදු කරන අතර, දැනට පවතින තත්ත්වයත් සමඟ ආයෝජනයේ ප්‍රතිලාභ අනපේක්ෂිත බැවින් සමාගම ප්‍රාග්ධන ආයෝජනය සිදු නොකරයි.	UDA විසින් මෙම පරිශ්‍ර සහ ව්‍යාපාරික මෙහෙයුම් උනන්දුවක් දක්වන පාර්ශ්වයකට යෝජනාව සඳහා වන ඉල්ලීම (Request for Proposal) හරහා පැවරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.
(උ)	ආයතනයේ පවතින වර්ග අඩි 1680 ක වායුසම්කරණය කරන ලද හා වර්ග අඩි 1692 ක වායුසම්කරණය නොකරන ලද උත්සව ශාලා දෙක වැඩිදියුණු කර උත්සවයන් සඳහා කුලී පදනම් සඳහා ලබාදී ඉහල ආදායමක් ඉපයිය හැකි වුවද මෙම පරිශ්‍රයෙන් රු.241,350 ක ආදායමක් පමණක් උපයා තිබුණි. කෙසේ වෙතත් මෙම පරිශ්‍රය කුලී පදනම් මත ලබාදීමට උත්සව ශාලාව සඳහා අවශ්‍ය පහසුකම් (සනීපාරක්ෂක පහසුකම්, සැරසිලි, ගෘහභාණ්ඩ) නොමැති බව නිරීක්ෂණය විය.	2021, 2022	-එම -	මෙහි ක්‍රියාකරු වන වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම අවම ආයෝජනයකින් එම ඉඩ ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගෙන ඇති අතර මෙය විකිණිය හැකි තත්වයට පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත.	-එම -
(ඌ)	ආයතනයේ ගොඩනැගිලි භාවිතයට සුදුසු තත්ත්වයේ සහ ආරක්ෂිතව නොතිබුණ	2021, 2022	-එම -	අවශ්‍ය පරිදි ඉංජිනේරු දෙපාර්තමේන්තුව මඟින් විදුලි බල සැපයුම අධීක්ෂණය	-එම -

	අතර ප්‍රධාන පුවරුව සහ බල සැපයුම් පරිපථ ද අනතුරුදායක තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.			කරනු ලැබේ.	
(එ)	සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ ක්‍රමවේදයක් (SOR) නොතිබුණි.	2022	සමාගම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සකස් කර අනුමත කර ගැනීමට අවශ්‍ය වේ.	මව් සමාගම වන වෝටර්ස් එජ් ලිමිටඩ් සඳහා 2024 වර්ෂයේදී බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සාදා අවසන් කර ඇති අතර එම පියවර සමාගම වෙත ද ගනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි.
(ඔ)	2022 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.	2021, 2022	උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.	UDA විසින් උනන්දුව දක්වන පාර්ශ්වයන්ගෙන් සමාජශාලා දෙකටම යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කර ඇති බැවින් සමාගම සඳහා නිසි තීරණයක් ගත යුතුව ඇත.	UDA මඟින් උනන්දුවක් දක්වන පාර්ශ්වයෙන් යෝජනා සඳහා ඉල්ලීම් (RFP) කැඳවීමට තීරණය කර ඇති බැවින් වෝටර්ස් එජ් කළමනාකාරීත්වය සමාජ ශාලා දෙකෙහිම ව්‍යාපාරික මෙහෙයුම් දිගටම කරගෙන යාම සම්බන්ධයෙන් තීරණයක් ගත යුතුව ඇත.
(ඕ)	වාණිජ ඉලක්ක සහිත ව්‍යාපාර සැලැස්ම මත පදනම්ව වර්ෂය තුළ සිදු කිරීමට බලාපොරොත්තු වූ ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැස්ම සමාගම විසින් සකස් කර නොතිබුණි.	2021,2022	ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය.	සමාගම සිය වාර්ෂික සැලැස්ම ලෙස වාර්ෂික ආදායම, වියදම් සහ CAPEX අයවැය මත ක්‍රියා කරයි, එයට සෘතුමය බලපෑම සමඟ ගණනය කර ඇති	සමාගම 2025 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් සිටී.

සියලුම මෙහෙයුම් සහ අලෙවිකරණ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. මෙම මෙහෙයුම් ක්‍රියාව වාර්ෂික අයවැය ලෙස ආදායම් සහ වියදම් බවට පරිවර්තනය කර ඇති අතර එය සාමාන්‍ය භාවිතයක් ලෙස සෑම වසරකම අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

3.33 චෝටර්ස් එජ් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	6,599,395,602	5,468,775,124	1,130,620,478	(141,309,989)	තත්ත්වාගණනය කළ
2022	7,448,023,414	5,961,262,612	1,486,760,802	443,534,879	තත්ත්වාගණනය නොකළ
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම් පරිශ්‍රය තුළ විනෝද උද්‍යානයක් ඉදිකිරීම, මූල්‍යනය හා වසර 15 ක කාලයක් සඳහා ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම කළමනාකරණය කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී සමාගම දේශීය සංස්ථාපනය කරන ලද විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව වර්ෂයකට එක්සත් ජනපද ඩොලර් 20,000 කට සමාන ශ්‍රී ලංකා රුපියල් වටිනාමක් (2021 ජනවාරි පැවැති විනිමය අනුපාතය අනුව එක්සත් ජනපද ඩොලර් එකක් රු.153.74 ක් ලෙස ස්ථිර විනිමය අනුපාතයක් යටතේ) ගෙවීමේ පදනම මත එකඟ වී තිබුණි. කෙසේ	2021	ස්වාධීන හා පිළිගත හැකි ශක්‍යතා අධ්‍යයනයක් මඟින් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව.	මෙම ව්‍යාපෘතිය ෆැන්ටසි අයිලන්ඩ් පාර්ක් නමින් සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇතත්, අප සමඟ ඇති තොරතුරු අනුව මෙහෙයුම් සහ සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට බාහිර හා අභ්‍යන්තර සාධක රාශියක් බලපෑවේය. කෙසේ වෙතත්, Fantasy Island (Pvt) Ltd විසින් 2022 ජූලි 05 වන දින විධිමත් ලිපියක් යවා ව්‍යාපෘතිය දිගටම කරගෙන නොයන ලෙස බලපා ඇති කරුණු සහ සාක්ෂි සඳහන් කරමින් ව්‍යාපෘතිය දිගටම	2022 ඔක්තෝබර් 14 දිනැති අංක 24/2022 දරන මණ්ඩල පත්‍රිකාවට අනුව ව්‍යාපෘතිය අත්හැර දමා ඇති අතර 2022 නොවැම්බර් 18 දින සැලසුම් අංක 3527 බදු ගිවිසුම අවලංගු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගෙන් විධිමත් ඉල්ලීමක් කර ඇත. එසේ වුවද මෙම වාර්තාවේ දිනය වන විටත් සුදුසු පියවර ගෙන නොතිබුණි.

	වූවද 2021 වර්ෂය අවසාන වන විට සමාගම විසින් කොන්ත්‍රාත් සමාගමට එක්සත් ජනපද ඩොලර් 9,956 ක් හෙවත් ශ්‍රී ලංකා රු.මිලියන 1.53 ක් ගෙවා තිබුණු අතර විනෝද උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අතර මඟ නවතා දමා තිබුණි.			කරගෙන නොයන බවට අභවා ඇති බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව. ව්‍යාපෘතිය අතහැර දමා ඇති බැවින් බදු ගිවිසුම අවලංගු කිරීම සලකා බැලීම සඳහා 2022 ඔක්තෝබර් 14 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිකා අංක 24/2022 යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දීමට චෝටර්ස් එජ් කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.	
(ආ)	ප්ලැට්ෆෝම් රෙස්ටෝරන්ට් භෝජනාගාරය ඉතා අඩු ආදායමක් යටතේ පවත්වාගෙන යමින් පැවතුණි. එය මුහුදු භෝජනාගාරයක් වශයෙන් වෙනස් කිරීමට 2021 අගෝස්තු 04 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද 2022 ජූලි වන විටත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.	2021	ආදායම් උත්පාදනය වන ව්‍යාපෘති කාර්යක්ෂම ක්‍රියාත්මක කළ යුතු බව.	එම කාලය තුළ සිදු කරන ලද තොරතුරු ලබා ගැනීමේ හැකියාව සහ ශක්‍යතා අනුව, යෝජිත Fantasy Islands (Pvt) Ltd විසින් සිදුකරන “Colombo Eye” සහ Lala Park ව්‍යාපෘතිවලට අනුකූලව අතිරේක ආදායමක් උපයා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, හේතු කිහිපයක් නිසා ආයෝජන සමාගම විසින් ව්‍යාපෘති අත්හැර දමා ඇත. මෑතදී 2024 වසරේ තේමා උද්‍යානය (ලලා උද්‍යානය) ඉවත් කර නාගරික සංවර්ධන අධිකාරිය (UDA)	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ආදායම් වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

				වෙත ඉඩම ලබා දී ඇත. එබැවින් වෝටර්ස් එජ්ට අපේක්ෂිත ආදායම සහ මෙය ලාභදායී මෙහෙයුමක් ලෙස පවත්වාගෙන යාම සඳහා අනාගත සේවාදායක පදනමක් ගෙන ඒමට අපේක්ෂිත යටිතල පහසුකම් අහිමි වී ඇත.	
(ඇ)	රු.57,337,629 ක් වියදම් කරමින් ඉදි කරනු ලැබූ ස්පෝර්ට් බාර් ව්‍යාපෘතිය, 2022 ආරම්භයේ සිට උපයෝජනය කිරීමකින් තොරව පැවති අතර එය වර්තමානයේදී ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පවතියි.	2022	ආයෝජනය සිදු කිරීමට පෙර විධිමත් ඇගයීමක් සිදු කළ යුතුය.	එම කාලය තුළ සිදු කරන ලද තොරතුරු ලබා ගැනීමේ හැකියාව සහ ශක්‍යතා අනුව,යෝජිත Fantasy Islands (Pvt) Ltd විසින් සිදුකරන “Colombo Eye” සහ Lala Park ව්‍යාපෘතිවලට අනුකූලව අතිරේක ආදායමක් උපයා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. කෙසේ වෙතත්, හේතු කිහිපයක් නිසා ආයෝජන සමාගම විසින් ව්‍යාපෘති අත්හැර දමා ඇත. මෑතදී 2024 වසරේ තේමා උද්‍යානය ඉවත් කර නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම ලබා දී ඇත. එබැවින් වෝටර්ස් එජ්ට අපේක්ෂිත ආදායම සහ මෙය ලාභදායී මෙහෙයුමක් ලෙස පවත්වාගෙන	පරිශ්‍රය භාවිතා නොකරන අතර එම පරිශ්‍රයේ භාවිතා කළ හැකි වන්කම් අනෙකුත් ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වය සඳහා භාවිතා කිරීමට සමාගම අවශ්‍ය පියවර ගෙන ඇත.

				යාම සඳහා අනාගත සේවාදායක පදනමක් ගෙන ඒමට අපේක්ෂිත යටිතල පහසුකම් අභිමි වී ඇත.	
(ඇ)	බත්තරමුල්ල හෝටල් පරිශ්‍රය තුළ කාමර 48 ක් සමග බුටික් හෝටලයක් ඉදිකිරීම වෙනුවෙන් මූලිකව ගෙන තිබුණු අගය රු.1,405,700,000 ක් වූ ණය මත පොලිය ගෙවීම සඳහා රු.240,000,000 ක ණය පහසුකමක් ගෙන තිබුණු අතර ඒ සඳහා රු.7,577,515 ක අමතර පොලියක් ගෙවා තිබුණි.	2022	තීරණයක් ගැනීමට පෙර විධිමත් ඇගයීමක් සිදු කළ යුතුය.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර බුටික් හෝටලයෙන් ආදායම් ඉපැයීම සිදු කෙරෙන තුරු වර්තමාන මෙහෙයුම් මුදල් ප්‍රවාහය මත බලපෑම අවම කිරීම සඳහා මූලික ණය සඳහා වූ පොළී ප්‍රමාණය සහ රු.මිලියන 240 ක අගයකට වූ වෙනත් ණය සඳහා වූ පොළී ප්‍රමාණය ආවරණය කිරීම සඳහා තවත් රු.මිලියන 240 ක ණය ප්‍රමාණයක් සඳහා ඉල්ලුම් කර තිබුණු බව.	සමාගම විසින් ලංකා බැංකුව සමඟ තවදුරටත් සාකච්ඡා කර ඇති අතර, එම ණය මුදල සම්පූර්ණ ව්‍යාපෘති ණය ලෙස නැවත සලකා වසරක සහන කාලය සමඟ වසර 11 කින් ආපසු ගෙවීම සඳහා දීර්ඝ කිරීම සඳහා ඉල්ලා ඇත. බැංකුව ද එය සලකා බැලීමට එකඟ වී ඇත.
(ඉ)	දියත දුම්රිය ස්ථාන අවන්හල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සමග ගිවිසුම අත්සන් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් 2018 පෙබරවාරී 28 දින සිට 2022 ජූලි 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.19,527,684 ක අගයක් පොළිය ලෙස ගෙවීමට සිදුව තිබුණි.	2022	ගිවිසුමවලට නියමිත වේලාවට එළඹිය යුතුය	ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් එම කාල පරිච්ඡේදය තුළ යම් යම් සාකච්ඡා කිරීම් සිදු වූ බව, 2022 අගෝස්තුහිදී පාර්ශව දෙකම තීරණයකට පැමිණීම නිසා ඒ අනුව අප ගිණුම් තබා ඇති බව, ඊට අමතරව, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සියයට 15 ක පොළී අනුපාතයක් මූලික වශයෙන්	සමාගම ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLDC) සමඟ ණය ආපසු ගෙවීමේ ගිවිසුමට එළැඹ ඇති බැවින් ගෙවීම 2022 සිට ආරම්භ කර ඇති අතර ඉතිරිය 2024 සැප්තැම්බර් 30 වන විට රු.මිලියන 35.59 ක් ගෙවිය යුතු වුවත් ගෙවා

				යෝජනා කර තිබුණු අතර ඊට සමාගම එකඟ වී නොතිබුණු බව සහ එමගින් සමාගමට පොළී අනුපාතය සියයට 5 ක් දක්වා අඩු කර ගැනීමට හැකිව තිබුණු බව, කෙසේ නමුත්, ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමාදවීම හේතුවෙන් අමතර පොළී ගෙවීමක් දැරීමට සිදුව තිබෙන බව.	නොතිබුණි.
(ඊ)	ලාලා පාර්ක් වෙතින් රු.10,719,033 ක මුදලක් වාර්ෂික කුලී ගාස්තු ලෙස උපයා තිබුණද ඉඩම සම්බන්ධයෙන් කල්බදු හිමියා සමග කල්බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.	2022	ගිවිසුම් සදහා එළඹිය යුතුය.	එක්ස්ට්‍රීම් ඇඩ්වෙන්චර් (පුද්ගලික) සමාගම සහ වොටර්ස් ඒජ් සමාගම අතර 2017 දෙසැම්බර් 21 දින ඇති කර ගත් ගිවිසුම යටතේ අපගේ මව් සමාගම වන නාගරික සංවර්ධන අධිකාරියේ අවබෝධය මත කුලී ආදායම ලෙස රු.10,719,033 ක මුදලක් 2022 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු බව, කෙසේ නමුත්, මෙම ව්‍යාපෘතිය ඉවත් කර ඇති අතර UDA විසින් එම පරිශ්‍රයේ භාවිතය සඳහා රු.මිලියන 12.62 ක් ගෙවන ලෙස දන්වා එවා ඇත.	UDA වෙත මෙම මුදල ආපසු ගෙවීමට සමාගම අවශ්‍ය පියවර ගනු ඇත.

(උ)	කාමර 48 ක් සමග බුටික් හෝටලයක් ඉදිකිරීමේ කටයුතුවල මූලික ආරම්භක දිනය 2019 ඔක්තෝබර් 02 දින වන අතර අවසන් කිරීමේ දිනය 2021 මාර්තු 24 දිනය විය. කෙසේ නමුත්, 2019 වර්ෂයේදී සිදු කළ ඉදිකිරීම් කටයුතුවල අත්හිටුවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කළ දිනය වන 2021 නොවැම්බර් 06 දින දක්වා ආසන්න වශයෙන් මාස 24 ක් පමණ ප්‍රමාද වී තිබුණි. තවද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව මෙම ව්‍යාපෘතිය කාමර 20 ක් දක්වා අඩු කිරීමට තීරණය කර තිබුණු අතර නව අවසන් කිරීමේ දිනය 2023 නොවැම්බර් 01 දින විය. කෙසේ නමුත්, බුටික් හෝටලය ඉදිකිරීම් කටයුතු 2024 සැප්තැම්බරර් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි.	2022	ව්‍යාපෘති යෝජනාවේ දින වකවානුවලට අනුකූල වීම සඳහා පියවර ගත යුතුය.	ව්‍යාපෘතිය අත්හිටුවා නැවත කාලසටහන්ගත කර ඇති අතර 2023 නොවැම්බර් 01 වැනි දින අවසන් කිරීමට නියමිතව තිබූ නෛතික අනුමැතියන් කිහිපයක් නිරාකරණය කර නොමැත.	චෝටර්ස් එජ් කළමනාකාරිත්වය විසින් මූල්‍ය රෙගුලාසිවලට අනුකූල වන පරිදි ප්‍රසම්පාදන හා නීත්‍යානුකූල අනුමැතිය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර මීල ඉහළ යාම සහ විෂය පථය වෙනස් කිරීම කැබිනට් මණ්ඩලයට දන්වා නොමැති බැවින් අවශ්‍ය ලියවිල්ලක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ද කටයුතු කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘති උපදේශක විසින් ලබා දී ඇති සුපරික්ෂාකාරී ඇගයීම සහ උපදේශන මත පදනම්ව කාමර 20 ක් සම්පූර්ණ කිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට නැවත කාලසටහන් කර කාලය දීර්ඝ කර තිබුණි.
(ඌ)	2022 වර්ෂය ආවරණය කරමින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2022	සංයුක්ත සැලැස්ම පිළියෙල කර එහි උපාය මාර්ගික පරමාර්ථ සපුරා	2023 සිට 2030 කාලය සඳහා මූලික සංයුක්ත සැලැස්ම පෞද්ගලික වරලත්	2023 සිට 2030 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කිරීමට

			ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය.	ගණකාධිකාරීවරුන් ගේ ආයතනයකින් උපදෙස් ඇතිව පෙර කළමනාකාරිත්වය සමඟ සිදු කර ඇත.	කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගෙන නැත.
(එ)	2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2021, 2022	2022 වර්ෂයට අදාළ අනුමත අයවැය, ආසන්නතම ක්‍රියාකාරී සැලැස්ම ලෙස සළකනු ලබන බව.	සමාගම සිය වාර්ෂික සැලැස්ම ලෙස වාර්ෂික ආදායම, වියදම් සහ CAPEX අයවැය මත ක්‍රියා කරයි, එයට සෘතුමය බලපෑම සමඟ ගණනය කර ඇති සියලුම මෙහෙයුම් සහ අලෙවිකරණ ක්‍රියාකාරකම් ඇතුළත් වේ. මෙම මෙහෙයුම් ක්‍රියාව වාර්ෂික අයවැය ලෙස ආදායම් සහ වියදම් බවට පරිවර්තනය කර ඇති අතර එය සාමාන්‍ය භාවිතයක් ලෙස සෑම වසරකම අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.	2023 සහ 2024 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.34 සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	28,623,347,812	7,151,694,115	21,471,653,697	760,645,501	තත්ත්වාගණනය නොකළ
2022	38,086,738,164	11,859,611,135	26,227,127,029	(2,446,366,057)	තත්ත්වාගණනය නොකළ
2023	38,017,589,303	11,531,161,729	26,486,427,574	133,364,534	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කළමනාකරණ අකාර්යක්ෂමතාව හේතුවෙන් ව්‍යාපෘති දීර්ඝ කිරීමේ පිරිවැය ලෙස රු.913,174,853 ක් සමාගම විසින් දරන ලදී.	2021	මෙවැනි අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීමට හැකිවන පරිදි කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ප්‍රමාණවත් අරමුදල් ගලා ඒමක් කළමනාකරණය විසින් සහතික කළ යුතුය.	-	කළමනාකරණ අකාර්යක්ෂමතාවයට හේතු වූ කරුණු පිළිබඳව පරීක්ෂණයක් කර නොතිබුණි.
(ආ)	සමාගමේ කළමනාකාරීත්වය විසින් සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර තිබුණු අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්ව තිබුණි.	2023	ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු පිළිබඳව තීරණයක් ගැනීමට අදාළ බලධාරීන් සම්බන්ධීකරණය කිරීමට සමාගමේ කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	-	රේඛීය අමාත්‍යාංශයේ නියමයන්ට අනුව, සමාගමේ කළමනාකාරීත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.

	තවදුරටත්, අඛණ්ඩ පැවැත්මක් ඇතිව ඉදිරියට කටයුතු කරගෙන යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නොතිබුණි. 2020 ජූලි 08 දිනැති අංක 20/1092/204/050-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණද 2022 මැයි 30 දින සිට බලපැවැත්වෙන පරිදි, මාස නවයක කාලපරිච්ඡේදයක් සඳහා පරිමාණය අඩු කිරීමක් සහිතව ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කර තිබුණු අතර වාර්තා කරන දින වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.			
(ඇ)	යුරෝ 28,869,392 ක මිලකට ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර යෝග්‍යතාවය සහ නිම කිරීමේ කටයුතු සැපයීම වෙනුවෙන් ඇති කරගත්	2023	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් ගොනු කර ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි.	නඩුව විභාග වෙමින් පවතී.

	කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හේතුවෙන්, නඩු අංක 21266/CYK/PTA හි අවසන් තීරණය අනුව වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරුට හානි ලෙස යුරෝ 7,432,062 ක්ද, බේරුම්කරණ පිරිවැය ලෙස ඇ.ඩො. 483,500 ක් සහ බේරුම්කරණ අතිරේක පිරිවැය ලෙස යුරෝ 516,597 ක් ගෙවීමට සමාගමට සිදු විය. මෙම වන්දි මුදල කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ මිලෙන් සියයට 30 කි.				
(ඇ)	2012 අගෝස්තු 15 දිනැති අංක 1771/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, සමාගම විසින් ඇ.ඩො. 158,890,000 (රු.බිලියන 18.5) ක් ආයෝජනය කරමින් අංක 116, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ ගෘහ ඒකක 90 කින් යුත් කාමර 475 ක නාගරික හෝටලයක් ඉදි කර පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. ඉහත ගැසට් පත්‍රය අනුව, ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2012 ජූලි 19 වන අතර ව්‍යාපෘතියේ ආරම්භක දින සිට මාස 24 ක් ඇතුළත වාණිජ මෙහෙයුම් කටයුතු	2022, 2023	ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජනවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාම වළක්වා ගැනීමට ලබා දී ඇති කාල රාමුව තුළ කළමනාකාරීත්වය ව්‍යාපෘතිය අවසන් කළ යුතුය.	ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ඉවත් කිරීමට රජය තීරණය කර ඇත.	ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියක පවතී.

			ක්‍රියාත්මක කිරීම හා ආරම්භ කිරීම සැලසුම් කර තිබුණද මෙම ව්‍යාපෘතිය වාර්තාගත දිනය වන විටත් අවසන් කර නොතිබුණි. 2020 ජූලි 10 දිනැති අංක 20/1042/204/050 – I දරන කැබිනට් තීරණය අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය දළ වශයෙන් රු.බිලියන 60 ක් විය. කාමර 458 වෙනුවට ඉන් කාමර 236 ක් සමග අංගසම්පූර්ණ හෝටලයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 31 වන මහල සමඟ මහල් 16 ක් අර්ධ වශයෙන් නිම කිරීමකට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. ඉතිරි කාමර 222 සහ ගෘහ ඒකක 100 සම්පූර්ණ කිරීම අදියර 2ට ඇතුළත් වේ. පළමු අදියරේ ඉලක්කගත අවසන් දිනය 2021 අගෝස්තු වේ. කෙසේ නමුත්, මුල් ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය වන 2014 ජූලි 19 වන දින සිට සමාලෝචිත වර්ෂය සඳහා ආසන්න වශයෙන් වර්ෂ 10 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.		
(ඉ)	2023 වර්ෂය ආවරණය කෙරෙන කාලපරිච්ඡේදයට අදාළව සංයුක්ත	2021, 2022, 2023	අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට වහා පියවර ගත යුතුයි.	මෙය දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන අතර රජයෙන් හෝ	සමාගමේ කළමනාකාරිත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකර

	සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.			පාර්ශ්වකරුවන්ගෙන් ලැබිය යුතු මූල්‍ය සම්පත් නොමැතිකම හේතුවෙන් කළමනාකාරිත්වය විසින් ව්‍යාපෘතිය අත්හිටුවා ඇත. එබැවින්, වර්තමාන තත්ත්වය තුළ අලෙවිකරණ උපායමාර්ගය නිර්වචනය කළ නොහැකි අතර රේඛීය අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් පරිදි, සමාගමේ කළමනාකාරිත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.	ණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.
(ඊ)	සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි.	2021, 2022, 2023	සමාගම විසින් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමැතිය ලබාගත යුතු අතර එහි වාර්ෂික ඉලක්ක සපුරාගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය.	-	රේඛීය අමාත්‍යාංශයේ නියමයන්ට අනුව, සමාගමේ කළමනාකාරිත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.

3.35 සිනෝලංකා හොටෙල්ස් සහ ස්පා (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	693,941,159	2,516,408	691,424,751	15,626,177	තත්ත්වාගණනය නොකළ
2022	703,954,155	4,824,161	699,129,994	16,284,129	තත්ත්වාගණනය නොකළ
2023	572,166,885	1,843,821	570,323,064	(2,731,176)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 සහ 2022 වර්ෂය සඳහා සමාගම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබිණි.	2021, 2022	අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට වහා පියවර ගත යුතුය.	-	රේඛීය අමාත්‍යාංශයේ නියමයන්ට අනුව, සමාගමේ කළමනාකාරිත්වය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.
(ආ)	2015 වසරේ හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නතර කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසන් විය. තවද, 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන කැබිනට් තීරණයට අනුකූලව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන	2022, 2023	අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කළ යුතුය.	කොටස් හුවමාරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.	2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එකල පැවති සීමාවන් හේතුවෙන් කොටස් හුවමාරුව ක්‍රියාත්මක කර නොතිබුණි. Canwill Holdings (Pvt)

	කිරීමේ අමාත්‍යාංශය මගින් මව් සමාගම වන කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස් හිමිකාරීත්වයට අදාළ සමාගමේ කොටස මාරු කිරීම සඳහා ඔවුන්ගේ උපදෙස් ලබා දී තිබුණි. තව දුරටත්, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන කැබිනට් තීරණයට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතුව පවතින කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස්, මහා භාණ්ඩාගාරය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා දීම සඳහා කැබිනට් අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම වැඩසටහන වාර්තා කරන දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.			Ltd යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු කොටස් 2024 ජූලි 08 දින භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරිණි. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ කොටස් පැවරීමේ ක්‍රියාවලිය අවසන් කර නොමැත.
(ඇ)	2024 පෙබරවාරි 13 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රු.මිලියන 400 ක ප්‍රාග්ධන අඩු කිරීමක් සිදු කිරීමට තීරණය කර තිබූ අතර එය එක් කොටසකට රු.10 ක ප්‍රතිෂ්ඨාවක් ලෙස සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම වෙත ලබාදුන් ණය මුදලකට සමාන වනු ඇත. තවද 2023	2023	තත්ත්වය නිසි සමාගම් සමූහයේ ලෙස ඇගයීමෙන් පසු තීරණ ගත යුතුය.	යහපත සලකා මෙම තීරණය ගෙන ඇත.	පොළිය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	වසර සඳහා පොලිය අත්හිටුවීමට සහ රු.126,075,753 ක ලැබිය යුතු පොලී කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. 2023 වර්ෂය තුළ පොළී කපා හැර තිබුණද, 2018 වර්ෂයේ සිට ඉහත කී ගනුදෙනුවලින් ලද උපලබ්ධි නොවූ පොළී ආදායම මත පදනම්ව සමාගම දැනටමත් බදු ගෙවා තිබුණි.				
(ඇ)	හෝටලය ඉදිකිරීම නවතා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බැවින් ඉදිකරමින් පවතින ප්‍රාග්ධන වැඩ ශේෂය වන රු.111,103,548 ක් 2015 වර්ෂයේදී කපා හැර තිබුණි. එබැවින් ඉදිකිරීම් සඳහා වැය කරන ලද ඉහත සඳහන් මුළු මුදල ගිලුණු පිරිවැයක් බවට පත් විය.	2023	ආයෝජන සිදු කිරීමට පෙර නිසි ඇගයීමක් කළ යුතුය.	ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතිය ඉදිකිරීමට ප්‍රමුඛත්වය දීමට 2015 දී ගත් උපායමාර්ගික තීරණය නිසා මෙය සිදු විය.	රේඛීය අමාත්‍යාංශයේ නියමයන්ට අනුව, සමාගමේ කළමනාකාරිත්වය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.
(ඉ)	2014 අගෝස්තු 28 වන දින හෙලන්කෝ හොටෙල් සහ ස්පා (පුද්ගලික) සමාගම සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර අත්සන් කරන ලද බදු ගිවිසුමේ 3.10 ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් ආරම්භයේ සිට මාස 36 ක් ඇතුළත ඉඩම සම්පූර්ණයෙන් සංවර්ධනය කිරීමට අපොහොසත් වීම යන	2023	කල්බදු ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි වලට අනුකූල වීම අධීක්ෂණය කිරීමට සහ නිවැරදි කිරීම් සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය.	-	මූලික අදියරේදී සම්පූර්ණ බදු මුදලම නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇත. එහෙත් මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.

	කොන්දේසිය උල්ලංඝණය කිරීමට යටත්ව බදු ගිවිසුම ස්වයංක්‍රීයව අවලංගු වන අතර මුලින් තැන්පත් කර ඇති ඉඩමේ වටිනාකමෙන් සියයට 10 ක් ආපසු ගෙවීමකින් තොරව රාජසන්තක කරනු ලැබේ. එබැවින් සමාගමේ මූල්‍ය තත්ත්වය තවදුරටත් දුර්වල කරමින් සියයට 10 ක දඩයක් පැනවීමේ හැකියාවක් පවතී.				ගිවිසුමේ කොන්දේසි පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කිරීමට නියමිතය.
(ඊ)	සමාගම රු.මිලියන 177.97 ක් ආයෝජනය කර හෙක්ටයාර් 3.8 ඉඩමක් බදු පදනම මත නාගරික සංවර්ධන අධිකාරියෙන් 2014 වර්ෂයේදී අත්පත් කරගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම ඉඩම කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි.	2021, 2022, 2023	මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ වෙනත් ප්‍රයෝජනයවත් අරමුණක් සඳහා භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.	-	යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහනට අනුකූලව කටයුතු කරමින් පවතී.

3.36 හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	16,768,381,000	3,603,463,000	13,164,918,000	(976,415,000)	තත්ත්වාගණනය නොකළ
2022	17,229,774,000	4,947,007,000	12,282,767,000	(632,764,000)	තත්ත්වාගණනය නොකළ
2023	20,566,957,000	8,300,066,000	12,266,891,000	(784,367,000)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 වර්ෂය ආරම්භයේදී සමාගමේ සමුච්චිත අලාභය රු.7,821,569,000 ක් වූ අතර 2021 වර්ෂය අවසාන වන විට එය රු.8,808,317,000 ක් දක්වා වර්ධනය වී තිබුණි. එයට සමානව, 2021 වර්ෂය ආරම්භයේදී සමාගමේ අවාසිදායක කාරක ප්‍රාග්ධනය රු.997,068,000 ක් වූ අතර 2021 වර්ෂය අවසාන වන විට එය රු.1,059,237,000 ක් දක්වා වර්ධනය වී තිබුණි. 2011 අංක 43 දරන ඌන උපයෝජිත වත්කම් පනතේ විධිවිධාන ප්‍රකාරව සමාගමේ සියලුම කොටස් භාණ්ඩාගාරයේ ලේකම් සතු වුවද, පවරාගැනීමෙන් වසර	2021	ලාභ උපයන අංශ කරා එහි දිශානතිය වේගවත් කිරීම සහ කාරක ප්‍රාග්ධන කළමනාකරණය අවශ්‍ය කෙරේ.	2021 වසර කොවිඩ් වසංගතය හේතුවෙන් රටට සංචාරකයින් පැමිණීමේ දැඩි පහත වැටීම සහ කාල සීමාව පුරාවටම අගුලු දැමීම් හේතුවෙන් දරුණුතම බලපෑමට ලක්වූ වසරවලින් එකකි. එබැවින් සමස්ත ගෝලීය සත්කාරක ව්‍යාපාරයට දැඩි බලපෑමක් එල්ල වූ අතර එම නිසා ජාත්‍යන්තර වෙළඳනාම සහිත හෝටල් කළමනාකරණය කිරීමේදී මෙහෙයුම් පාඩු නොවැළැක්විය හැකි විය. සීමිත මුදල් ප්‍රවාහයන් සමඟ කර්මාන්තයේ පුළුල් මෙහෙයුම් සීමාවන් හේතුවෙන් කාරක ප්‍රාග්ධනය	වර්තමානයේදී, පවතින් සම්පත් වලින් හෝටලය සියයට 60 ක් භාවිතයත් සමඟ සුමටව ක්‍රියාත්මක වන අතර 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පුරෝකථනය කළ මෙහෙයුම් ලාභය රු.බිලියන 1 කි.

	10 න් පසුවද, කිසිදු ප්‍රතිලාභයක් කොටස්හිමියා වෙත ලබාදී නොතිබුණි.			කළමනාකරණය කිරීම ද අතිශය අභියෝගාත්මක විය.මෙම කාල පරිච්ඡේදය තුළ, අතිරේක ආදායම් මාර්ග ගලා ඒම ඇති කරන ආහාර සහ පාන සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් හඳුන්වා දීම සඳහා හෝටලය නව්‍ය ව්‍යාපාරික උපාය මාර්ගයක් අනුගමනය කරන ලදී.	
(ආ)	මහජන බැංකුවෙන් ලබාගත් රු.බිලියන 2 ක කාලීන ණය මුදල එකඟ වූ කාර්යයන් සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කර නොතිබුණු අතර 2023 අප්‍රේල් මාසය දක්වා ව්‍යාපෘති වියදම ලෙස රු.මිලියන 1,427 ක් පමණක් වැය කර තිබුණි. තවද, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රු.මිලියන 900 ක අනුමත අයිරා සීමාවක් ඇති මහජන බැංකුවේ ජංගම ගිණුමට මෙම ණය ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත්, තවමත් නවීකරණ කටයුතු සිදු වෙමින් පැවතියද, 2022 දෙසැම්බර් 31 දිනට එකී අයිරාව රු.මිලියන 883 ක් විය. එබැවින්, සමාගම නිසි ලෙස ඇස්තමේන්තුගත කර එකඟ වූ කාර්යයන් සඳහා අරමුදල් වියදම්	2021, 2022	අරමුදල් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කළ යුතුය.	නව කාරක ප්‍රාග්ධන පහසුකම 2022 වර්ෂය තුළදී ලබා නොගත් අතර, එබැවින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ද අර්ධ වශයෙන් කාලීන ණය පහසුකම හරහා මූල්‍යකරණය කරන ලදී. කාරක ප්‍රාග්ධන අරමුණු සඳහා භාවිතා කරන අරමුදල් දැන් වර්ධන අවධියේ පවතින මෙහෙයුම් වලින් ප්‍රගතිශීලී ලෙස අයකර ගනු ලැබේ.	වැඩිවන සංචාරක පැමිණීම් සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන අවසන් කිරීමත් සමඟ මෙහෙයුම් 2025 සිට, පෙර කොවිඩ් මට්ටමට පැමිණෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. එබැවින්, මෙහෙයුම් ලාභය රු.බිලියන 1.7 කට වඩා වැඩි වනු ඇත. මෙය කාරක ප්‍රාග්ධන ප්‍රකෘතිමත් වීම සඳහා තවදුරටත් දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

	කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.				
(ඇ)	2016 වසරේ සිට රථගාල සඳහා භාවිත කරන හෝටලය ඉදිරිපිට පර්චස් 30 ක ඉඩමෙහි සත්‍ය සන්තකය සමාගම සතු වුවද, බදු ගිවිසුම අත්සන් කර නොතිබුණි. තවද, 2022 දෙසැම්බර් 20 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් යවන ලද දැනුම්දීම අනුව, 2021-2023 කාලය සඳහා ගෙවිය යුතු මුදල රු.මිලියන 24 ක් වූ අතර ගෙවිය යුතු නියමිත දිනය 2023 ජනවාරි 01 විය. කෙසේ වෙතත්, ඉහත නිවේදනයට අනුකූලව කටයුතු කිරීමට සමාගම අපොහොසත් වී ඇත.	2022	බදු ගිවිසුමකට එලඹිය යුතුය.	සමාගමේ නීතීඥයින් විසින් සඳහන් කරන ලද කරුණු සහිතව අවසන් කෙටුම්පත UDA වෙත යොමු කරන ලදී.	හිඟ මුදල් ගෙවා තිබුණද ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

3.37 කැන්විල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	20,886,043,035	18,167,126	20,867,875,909	6,598,472	තත්ත්වාගණනය නොකළ
2022	20,880,551,757	17,028,095	20,863,523,662	(6,126,467)	තත්ත්වාගණනය නොකළ
2023	21,284,274,688	416,186,661	20,868,088,027	5,445,592	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 වර්ෂය ආවරණය කෙරෙන කාලපරිච්ඡේදයට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2021, 2022, 2023	සංයුක්ත සැලැස්ම පිළියෙල කර එහි උපායමාර්ගික අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය.	සමාගමේ කළමනාකාරිත්වයේ අදහස වන්නේ එවැනි සැලසුම් මුලපිරීම් ක්‍රියාත්මක කළ හැක්කේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩපිළිවෙළ තහවුරු කළ විට පමණක් බවයි.	හෝටල් පරිශ්‍රයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය රජයෙන් හෝ පාර්ශ්වකරුවන් ගෙන් ලැබිය යුතු මූල්‍ය සම්පත් නොමැතිකම හේතුවෙන් කළමනාකාරිත්වය විසින් අත්හිටුවා ඇත. එබැවින්, වර්තමාන තත්ත්වය තුළ අලෙවිකරණ උපායමාර්ගය නිර්වචනය කළ නොහැකි අතර සමාගමේ කළමනාකාරිත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.

(ආ)	2023 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2021, 2022, 2023	වර්ෂයේ ආරම්භයේදී සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අනුමත කර ගත යුතු අතර එහි වාර්ෂික ඉලක්කයන් සපුරාලීම සඳහා ක්‍රියාත්මක කළ යුතුය.	සමාගමේ කළමනාකාරිත්වයේ අදහස වන්නේ එවැනි සැලසුම් මුලපිරීම් ක්‍රියාත්මක කළ හැක්කේ ව්‍යාපෘතියේ ඉදිරි වැඩපිළිවෙළ තහවුරු කළ විට පමණක් බවයි.	රේඛීය අමාත්‍යාංශයේ නියමයන්ට අනුව, සමාගමේ කළමනාකාරිත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටින අතර 2022 සිට සියලුම ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.
(ඇ)	2015 වර්ෂයේදී පරිපාලිත සමාගමක් වන හෙලංකො හොටෙල්ස් සහ ස්පා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් හම්බන්තොට ප්‍රදේශයේ හෝටලය ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියට අදාළ හෝටලය ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි. තවද, 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන කැබිනට් තීරණයට අනුකූලව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන කිරීමේ අමාත්‍යාංශය මගින් මව් සමාගම වන කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස් හිමිකාරීත්වයට අදාළ සමාගමේ කොටස	2021, 2023	කැබිනට් අමාත්‍යවරුන්ගේ තීරණ ක්‍රියාත්මක කළ යුතුය.	කොටස් හුවමාරු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත.	Canwill Holdings (Pvt) Ltd යටතේ SLIC සතු කොටස් 2024 ජූලි 08 දින භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරිණි. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ කොටස් පැවරීමේ ක්‍රියාවලිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් තවමත් සම්පූර්ණ කර නොමැත.

මාරු කිරීම සඳහා ඔවුන්ගේ උපදෙස් ලබා දී තිබුණි. තව දුරටත්, 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන කැබිනට් තීරණයට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතුව පවතින කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ කොටස්, මහා භාණ්ඩාගාරය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා දීම සඳහා කැබිනට් අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා දී තිබුණි. මෙම වැඩසටහන වාර්තාකරන දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ)	සිනොලංකා හොටෙල්ස් සහ ස්පා පුද්ගලික සමාගමේ (පරිපාලිතය) කළමනාකාරීත්වය විසින් සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර තිබුණු අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්ව තිබුණි. තවදුරටත්, අඛණ්ඩ පැවැත්මක් ඇතිව ඉදිරියට කටයුතු කරගෙන යාමට සමාගමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු	2021, එම - 2023	ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කළද ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුදල් ලැබී නොමැත.	සමාගමේ කළමනාකාරීත්වය යෝජිත ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන සඳහා කටයුතු කරමින් සිටී.

	සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නොතිබුණි. 2020 ජූලි 08 දිනැති අංක 20/1092/204/050-1 මගින් ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කර තිබුණද 2022 මැයි 30 දින සිට බලපැවැත්වෙන පරිදි, මාස නවයක කාලපරිච්ඡේදයක් සඳහා පරිමාණය අඩු කිරීමක් සහිතව ග්‍රෑන්ඩ් හයට් කළම්බු ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කර තිබුණු අතර වාර්තා කරන දින වන විටත් ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර නොතිබුණි.				
(ඉ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 52 (3) වගන්තිය ප්‍රකාරව ප්‍රතිෂ්ඨාව ලබා ගැනීමකින් තොරව, කොටසකට රු.8.50 ක් බැගින් කොටස් 235,294,117 ක් නිකුත් කර තිබුණු අතර කොටස් නිකුතුව සමාගම් රෙජිස්ට්‍රාර්හි ලේඛන ගත කර තිබුණි. කෙසේ නමුත්, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ	2022, 2023	සමාගම් පනතේ වගන්තිවලට අනුකූල වන පරිදි පියවර ගත යුතුය.	Canwill Holdings (Pvt) Ltd හි ප්‍රකාශිත ප්‍රාග්ධනයේ සමාගම් රෙජිස්ට්‍රාර් හි මෙම කොටස් නිකුතුව අවලංගු කිරීම යාවත්කාලීන කිරීම සඳහා සමාගම මෙම කොටස් නැවත ලබාගැනීමේ (Share buyback) ක්‍රියාවලිය ආරම්භ කර ඇත.	Canwill Holdings (Pvt) Ltd හි ප්‍රකාශිත ප්‍රාග්ධනයේ සමාගම් රෙජිස්ට්‍රාර් හි මෙම කොටස් නිකුතුව අවලංගු කිරීම යාවත්කාලීන කිරීම සඳහා සමාගම මෙම කොටස් නැවත ලබාගැනීමේ

ගැලපුම් සිදු කර නොතිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශන තුළ සහ සමාගම් රෙජිස්ට්‍රාර් සතුව පවතින වාර්තාවන් තුළ කොටස් ප්‍රාග්ධනය ලෙස පෙන්නුම් කරන අගයෙහි රු.බිලියන 2 ක වෙනසක් නිරීක්ෂණය විය.

(Share buyback) ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

3.38 සී/ස පැලියගොඩ වෙයාහවුස් කම්ප්ලෙක්ස් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	සීමාසහිත පැලියගොඩ වෙයා හවුස් සමාගම විසින් 2017, 2018, 2019, 2020,2021,2022 සහ 2023 වර්ෂයන් සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2024 ගණුදෙනු වාර්තාව 2.1	සමාගමේ මූල්‍ය වාර්තා නියමිත දිනට විගණනය වෙත ඉදිරිපත් කල යුතු අතර මේ සම්බන්ධයෙන් ඇවරකරු නිසි වගකීමට යටත් කළ යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.
(ආ)	අවසන් වරට විගණනය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ වත්කම්, වගකීම් හිමිකම් මෙම වාර්තාවේ දිනය දක්වා කොපමණ වෙනස් වී ඇද්ද සහ මෙම වාර්තාවේ දිනට වත්කම්,වගකීම් සහ හිමිකම කොපමණද යන්න තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන හෝ ආනුශංගික කිසිදු සාක්ෂියක් විගණනයට	2024 ගණුදෙනු වාර්තාව 2.3	සමාගමේ මූල්‍ය වාර්තා නියමිත දිනට විගණනය වෙත ඉදිරිපත් කල යුතු අතර මේ සම්බන්ධයෙන් ඇවරකරු නිසි වගකීමට යටත් කළ යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	වත්කම් නාගරික සංවර්ධන අධිකාරිය භාරයේ හා එහි වෙනම මෙහෙයුම් ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ.

	ඉදිරිපත් නොවූ අතර වත්කම් තක්සේරුවක් සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණයක් කල බවට හෝ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.				
(ඇ)	2017 ජූනි 27 දින පැවති නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත්කරන ලද අංක 208/2017 අධ්‍යක්ෂක මණ්ඩලයට අදාල තීරණය අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු හා වත්කම් අධිකාරිය වෙත පවරා හැකි ඉක්මනින් ඇවර කිරීමේ කටයුතු අවසන් කරන ලෙස තීරණය කලද මෙම වාර්තාවේ දිනය දක්වා ඇවර කිරීමේ කටයුතු නිම වී නොතිබුණි.	2024 ගණුදෙනු වාර්තාව 2.4(අ)	සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාමාර්ග කඩිනම් කල යුතු අතර ප්‍රමාදය සම්බන්ධයෙන් ඇවරකරු නිසි වගකීමට යටත් කල යුතුය.	ඇවරකරුවෙකු පත්කර තිබුණි.	ඇවර කිරීමේ ක්‍රියාවලිය අවසන් වී නොතිබුණි.
(ඈ)	මෙම සමාගම පිහිටා ඇති පැලියගොඩ ප්‍රදේශය අවට තිබෙන ගබඩාවකට අදාල සෙසු පහසුකම් සහිතව ගබඩා පහසුකම් සපයනු ලබන ආයතන වර්ග අඩියක් සඳහා රු. 60 සිට 100 අතර මුදලක් අයකරනු ලබන නමුත් සමාගම, තරහකාරී නොවන මිළ ගණන් යටතේ ගබඩා පහසුකම් සැපයීම නිසා දැනට ක්‍රියාකරී තත්ත්වයේ ඇති ආයතන වලින් පමණක් මාසිකව උපරිම වශයෙන් රු.මිලියන 4 ක පමණ	2024 ගණුදෙනු වාර්තාව 3.2(අ)	සමාගමට අයත් ගබඩා පරිශ්‍ර නිසි අලුත් වැඩියාවක් සිදුකර තරහකාරී මිලකට ව්‍යාපාරිකයන් වෙත ගබඩා පරිශ්‍ර ලබාදීමට කටයුතු කල යුතුය.	ගණුදෙනුකරුවන්ගෙන් නිරතුරුව අළුත්වැඩියා කටයුතු සඳහා ඉල්ලීම් කරන බැවින් තරහකාරී ආයතන අයකරන මිල ගණන් අයකිරීම සුදුසු තත්වයක නොපවතින බව දන්වා ඇත.	නිරීක්ෂණ එලෙසම පවතී

ඉපයිය හැකි ආදායමක් අහිමිවන බව නිරීක්ෂණය කෙරේ.

(ඉ)	ගබඩා සංකීර්ණයකින් සාමාන්‍යයෙන් සලසනු ලබන්නේ අමු ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවට හෝ නිමිද්‍රව්‍ය වෙළඳපලට නිකුත් කරන අතරතුර ගුණාත්මකව සහ සුරක්ෂිතව ගබඩාකර තබාගැනීමයි. ඒ සඳහා වන අයකිරීම බොහෝ විට වර්ග අඩියක් පදනම් කරගෙන ගණනය කෙරේ. නමුත් පැලියගොඩ වෙයාහවුස් සමාගමේ WH (II) නැමති ගබඩා පරිශ්‍රයෙන් වර්ග අඩි 55,985 ක් පමණ පරිහරණය කරන එක් සිමෙන්ති සමාගමක් ගබඩා පහසුකම් සලසා ගැනීමට අමතරව, සිමෙන්ති කුඩු වශයෙන් ආනයනය කොට යන්ත්‍රානුසාරයෙන් ඒවා 50 kg බැගින් වූ මළු වලට ඇසිරීම සිදුකරන ක්‍රියාවලියටද මෙම පරිශ්‍රය කිසිඳු අමතර ගෙවීමකින් තොරව භාවිතා කරයි. මේ අනුව බලන විට එය එම සමාගමට අතිරේක වාසියක් සැලසීමක් වන අතර, ගබඩා පහසුකම් සඳහා පමණක් භාවිතා කරන සෙසු ආයතන වලින්ද මෙම සිමෙන්ති සමාගමින් අයකරන	2024 ගණුදෙනු වාර්තාව 3.2(ආ)	නිමි ද්‍රව්‍ය, අමුදුව්‍ය හෝ අර්ධ නිමි ගබඩා කිරීමෙන් ඔබ්බට වූ නිෂ්පාදන කටයුතු වෙනුවෙන්ද පරිශ්‍රයෙන් ලබාදීම සඳහා නියමිත මිළගණන් අයකල යුතුය.	ඇතිකරගෙන තිබෙන ගිවිසුම සලකා බලා ඇසුරුම් ක්‍රියාවලියට අමතර ගාස්තුවක් අයකර ගැනීමට ඇති හැකියාව සොයා බලන බවට විගණනයට දන්වා තිබුණි.	නිරීක්ෂණය එලෙසම පවතී

	මුදලම අය කිරීමෙන් එම සමාගම් වලට බලවත් අසාධාරණයක්ද සිදුවන බව නිරීක්ෂණය කෙරේ. මේ අනුව බලන විට වර්තමානයේ වෙයා හවුස් සමාගමේ ආදායම් එකතු කරන නාගරික සංවර්ධන අධිකාරියට මේ දක්වා විශාල ආදායමක් අහිමි වී තිබෙන අතර මේ වන විටද ආදායමක් අහිමි වෙමින් පවතින බව නිරීක්ෂණය කෙරේ.				
(ඊ)	WH 1 ගබඩාවේ වර්ග අඩි 6,750 කින් සමන්විත C කොටස ප්‍රතිසංස්කරණයකින් තොරවම ගබඩා පහසුකම් වෙනුවෙන් සපයා ආදායම් රැස්කල හැකිව තිබූ නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා එම කොටස නිශ්කාර්යව තැබීම නිසා දැනට වර්ග අඩියක් ලබාදෙන රේටයෙන් ගණනය කලහොත් මාසිකව අහිමිවන ආදායම රු. 405,000 වන අතර වර්ෂයකට එය රු. මිලියන 4.88 කි.	2024 ගණුදෙනු වාර්තාව 3.2(ඇ)	ගබඩා පරිශ්‍රය සුදුසු ව්‍යාපාරිකයන් වෙත උපයෝජනය කිරීමට අවස්ථාව සලසා දිය යුතුය.	සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියේ පස් සාම්පල් ගබඩා කිරීම සඳහා නිවාස අමාත්‍යාංශයට ලබාදී ඇති අතර එහි ගබඩා කර තිබෙන ද්‍රව්‍ය මාරු කිරීමට ඉල්ලීම් කර ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී
(උ)	1993 ජූලි 29 දින සංස්ථාපනය කරනු ලැබූ සීමාසහිත පැලියගොඩ වෙයාහවුස් සංකීර්ණ සමාගම (PB401) නාගරික සංවර්ධන අධිකාරියෙන් 99 අවුරුදු බදු පදනමින් ලබාගත්	2024 ගණුදෙනු වාර්තාව 4.1	සමාගමේ ඇවර කිරීමේ ක්‍රියාමාර්ග කඩිනම් කල යුතු අතර ප්‍රමාදය සම්බන්ධයෙන් ඇවරකරු නිසි වගකීමට යටත් කල යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නිරීක්ෂණය එලෙසම පවතී.

	අක්කර 11 රූඩ් 02 පර්චස් 23 ක ඉඩමක ස්ථාපිත කර ඇති නාගරික සංවර්ධන අධිකාරියට පුර්ණ හිමිකමක් සහිත පරිපාලිත සමාගමකි. 2017 ජුනී 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සමාගම ඇවර කොට වතිකම් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට තීරණය කර තිබුණි. කෙසේ නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම සමාගමේ ඇවර කටයුතු අවසන්න නොතිබූ අතර සමාගම සතු වත්කම්ද අධිකාරිය වෙත පැවරීමක් සිදුකර නොතිබුණි.				
(උ)	සමාගමේ ගබඩා සංකීර්ණයෙන් ගබඩා පහසුකම් ලබාගත් ආයතන 06 කින් රු.මිලියන 42.93 ක මුදලක් මෙම වාර්තාවේ දිනය දක්වා අයවී නොතිබුණි.	2024 ගණුදෙනු වාර්තාව 4.5	අදාල මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීති අංශයට හා නීති දෙපාර්තමේන්තුවට යොමුකර ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී.
(එ)	ගබඩා සංකීර්ණය පිහිටි පර්චස් 1,863 ක වපසරිය සහිත ඉඩමෙන් සැලකිය යුතු ඉඩකඩ ප්‍රමාණයක් කිසිදු භාවිතයකට නොගෙන නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර ඉතා ඉහළ වානිජ වටිනාකමක් සහිත මෙම	2024 ගණුදෙනු වාර්තාව 4.6	ප්‍රදේශයේ හා ඉඩකඩවල පවතින ස්වභාවය සැලකිල්ලට ගෙන සුදුසු ආර්ථික කටයුත්තක යෙදවිය යුතුය.	ගබඩා පරිශ්‍රය වරාය අධිකාරියට පැවරීමට යෝජිතව පවතින බැවින් කිසිදු අළුත්වැඩියාවක් සිදු කර නොමැති අතර අබලන් තත්වයට පත්ව ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී

	භූමිය මෙලෙස නිශ්කාර්යව තැබීමට ඉඩනොහැර ඵලදායී ආර්ථික කටයුත්තකට යෙදවීමට අදාල උපායමාර්ගික තීරණ වලට එළඹිය යුතු බව නිරීක්ෂණය කෙරේ.				
(ඒ)	දැනට අධිකාරිය කුලී මුදල් අයකරන රේටයෙන්ම ගණනය කල විට රු. මිලියන 151 ක් එනම් නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික විදුලි වියදමින් සියයට 70 ක්ම ආවරණයට දායකත්වය ලබාගත හැකි මෙම ගබඩා පරිශ්‍රයේ දැනට මෙහෙයුම් කටයුතු සිදුවන්නේ ඉතාමත් අඩු පහසුකම් යටතේය. ගබඩා පරිශ්‍රය ඉතා අපිරිසිදු ස්වභාවයක් ගැනීම නිසා රාජ්‍ය ආයතනයක් ලෙස අධිකාරියටද එය අපකීර්තියක් ඇතිකරන තත්වයකි. WH I හා WH II ගබඩා පරිශ්‍ර අතර ඉඩ, සාමාන්‍යයෙන් සියලු ආයතනවල වාහන, උපකරණ හැසිරවීමේ පොදු භාවිතය සඳහා මනාව සකස් කල ඉඩකඩක් විය යුතු වුවත් එවැනි තත්ත්වයක් දක්නට නොලැබුණි.	2024 ගණුදෙනු වාර්තාව 4.7	අදාල ගබඩා පරිශ්‍රය, මෙහෙයුම් කටයුතු පහසු කිරීමට හා සියලු ආයතනවල පොදු භාවිතය සඳහා සකස් කිරීම යෝග්‍ය වේ. ඒ අනුව අයකරන රේඛයන්ද සාධාරණව සංශෝධනය කල යුතුවේ.	2024 වර්ෂය තුලදී අළුත්වැඩියා සිදුකර ප්‍රශස්ත භාවිතයට යොදා ගන්නා බව දන්වා ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී

3.39 සීමා සහිත ලංකා රෙස්ට්හවුස් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	97,842,973	130,117,930	(32,274,957)	(2,008,783)	ව්‍යාචනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/3 ගැසට් පත්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පාලනය පවරාගන්නා ලද තානායම් අතුරින් 2021 දෙසැම්බර් 31 වන විට ඇති තානායම් 32 ක ඉඩම් සහ ගොඩනැගිලි ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 හි 22 ඡේදය ප්‍රකාරව භාවිත අයිතිය සහිත වත්කම් යටතේ හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	2021 1.5.2 (අ)	තානායම් 32 සහ ඉඩම්, ගොඩනැගිලි සහිත භාවිත අයිතිය සහිත වත්කම් ලෙස හඳුනාගත යුතුය.	-	1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/3 ගැසට් පත්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පාලනය පවරාගන්නා ලද තානායම් අතුරින් 2021 දෙසැම්බර් 31 වන විට ඇති තානායම් 32 ක ඉඩම් සහ ගොඩනැගිලි ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 හි 22 ඡේදය ප්‍රකාරව භාවිත අයිතිය සහිත වත්කම් යටතේ හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ)	සමාගම විසින් සෘජුව මෙහෙයුම් කටයුතු සිදුකරන මහියංගනය තානායමේ 2020 වර්ෂයේදී රු.මිලියන 10.42 ක අළුත්වැඩියාවක් සිදුකර තිබූ අතර එහිදී එම වියදමට අදාල ප්‍රධාන වත්කම් හෝ වත්කම හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව දරන ලද වියදම දේපල හා පිරියත ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබුණි.	2021 1.5.4 (අ)	ප්‍රාග්ධන වියදම් - වලට අදාල මූලික වත්කම හඳුනාගත යුතුය.	සමාගම විසින් සෘජුව මෙහෙයුම් කටයුතු සිදුකරන මහියංගනය තානායමේ 2020 වර්ෂයේදී රු.මිලියන 10.42 ක අළුත්වැඩියාවක් සිදුකර තිබූ අතර එහිදී එම වියදමට අදාල ප්‍රධාන වත්කම් හෝ වත්කම හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව දරන ලද වියදම දේපල හා පිරියත ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර තිබුණි.
(ඇ)	2021 වර්ෂයේ අවසාන දිනට සමාගම විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ ඇතුලත් එකතුව රු.444,824 ක් වූ හර ශේෂ 05 ක් හා එකතුව රු.මිලියන 14.93 වූ බැර ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතුලත් කර නොතිබුණි. තවද ගිණුම් ශේෂ 10 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමේ දී ශේෂ පිරික්සුමේ අගයන් සමඟ සැසඳීමේදී රු.මිලියන 12.99 ක වෙනසක් පැවතුණි. මේ	2021 1.5.4 (ආ)	නිසි වෘත්තීය - සැලකිල්ලෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.	2021 වර්ෂයේ අවසාන දිනට සමාගම විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ ඇතුලත් එකතුව රු.444,824 ක් වූ හර ශේෂ 05 ක් හා එකතුව රු.මිලියන 14.93 වූ බැර ශේෂ 02 ක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇතුලත් කර නොතිබුණි. තවද ගිණුම් ශේෂ 10 ක් මූල්‍ය

	අනුව මුල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය පිළිබඳව විගණනයට ප්‍රශ්නකාරී විය.				ප්‍රකාශන වලට ගැනීමේ දී ශේෂ පිරික්සුමේ අගයන් සමඟ සැසඳීමේදී රු.මිලියන 12.99 ක වෙනසක් පැවතුණි. මේ අනුව මුල්‍ය ප්‍රකාශනවල තුල්‍යතාවය පිළිබඳව විගණනයට ප්‍රශ්නකාරී විය.
(ඇ)	2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමේ ජංගම නොවන වත්කම් ප්‍රමාණය මෙන් 6.45 ක ගුණයකින් ජංගම වත්කම් ඉහළ අගයක් ගෙන ඇත. එමෙන්ම ව්‍යාපාරයේ රදවාගත් ඉපයීම්ද රු.මිලියන 32.28 ක ඍණ අගයක් පෙන්නුම් කරන අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව සියයට 74 කින් පිරිහීමකි. තවද පෙර වසරට සාපේක්ෂව සමාගමේ ජංගම වත්කම්වල වර්ධනය සියයට 4.96 ක් වී තිබුණද ජංගම වගකීම්වල වර්ධනය සියයට 15.64 ක් වී තිබුණි. ඒ අනුව සමාගමේ ආදායම් ඉපයීමේ හැකියාව, කෙටිකාලීන ද්‍රවශීලතාවය පිළිබඳ මෙන්ම විශේෂයෙන්ම	2021 1.5.6	මුල්‍ය තත්ත්වය හා මෙහෙයුම් කාර්යසාධනය යහපත් කරගත යුතුය.	-	2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමේ ජංගම නොවන වත්කම් ප්‍රමාණය මෙන් 6.45 ක ගුණයකින් ජංගම වත්කම් ඉහළ අගයක් ගෙන ඇත. එමෙන්ම ව්‍යාපාරයේ රදවාගත් ඉපයීම්ද රු.මිලියන 32.28 ක ඍණ අගයක් පෙන්නුම් කරන අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව සියයට 74 කින් පිරිහීමකි. තවද පෙර වසරට සාපේක්ෂව සමාගමේ ජංගම වත්කම්වල වර්ධනය සියයට 4.96 ක් වී තිබුණද ජංගම වගකීම්වල

	අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අනාගතයේදී ගැටළු පැන නැගිය හැක.				වර්ධනය සියයට 15.64 ක් වී තිබුණි. ඒ අනුව සමාගමේ ආදායම් ඉපයීමේ හැකියාව, කෙටිකාලීන ද්‍රවශීලතාවය පිළිබඳ මෙන්ම විශේෂයෙන්ම අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අනාගතයේදී ගැටළු පැන නැගිය හැක.
(ඉ)	තානායම් වලින් ලැබෙන මාසික කළමනාකරණ ගාස්තු ආදායමින් පළාත් පාලන ආයතන වෙනුවෙන් සියයට 65 ක ප්‍රමාණයක් අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු බවට ගත් තීරණය පිළිබඳ තොරතුරු හා ලියවිලි මේ දක්වා විගණනය වෙත ඉදිරිපත් වී නොමැති අතර 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එලෙස ගෙවිය යුතු මුදල ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව රු මිලියන 56.08 කි.	2021 3.4	අදාල නිරීක්ෂණයන් සහතික කල පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කල යුතුය.	-	තානායම් වලින් ලැබෙන මාසික කළමනාකරණ ගාස්තු ආදායමින් පළාත් පාලන ආයතන වෙනුවෙන් සියයට 65 ක ප්‍රමාණයක් අදාළ පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු බවට ගත් තීරණය පිළිබඳ තොරතුරු හා ලියවිලි මේ දක්වා විගණනය වෙත ඉදිරිපත් වී නොමැති අතර 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එලෙස ගෙවිය යුතු මුදල ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව රු මිලියන 56.08 කි.

(ඊ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් වාර්ෂික මුල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුත් 2021 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2024 අප්‍රේල් 26 දිනදීය. එමෙන්ම පනතේ 133 වගන්තිය ප්‍රකාරව කාලපරිච්ඡේදයට අනුව සමාගමක් විසින් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවත් සී/ස ලංකා රෙස්ට් හවුසස් සමාගම විගණිත දින වන විටත් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි	2021	1.7 (අ) (ඇ)	පනතේ 150(1) අනුව කටයුතු කල යුතුය.	-	2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් වාර්ෂික මුල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුත් 2021 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2024 අප්‍රේල් 26 දිනදීය. එමෙන්ම පනතේ 133 වගන්තිය ප්‍රකාරව කාලපරිච්ඡේදයට අනුව සමාගමක් විසින් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවත් සී/ස ලංකා රෙස්ට් හවුසස් සමාගම විගණිත දින වන විටත් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි
(උ)	2021 වර්ෂය අවසාන වන විට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 08 කින් ද සෙසු කාර්ය මණ්ඩලය 15 කින්ද පමණක් සමන්විත විය. සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික	2021	3, 3.1	සමාගම විසුරුවා හැර වත්කම් නාගරික සංවර්ධන අධිකාරිය යටතට පවරාගත යුතුය.	-	2021 වර්ෂය අවසාන වන විට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 08 කින් ද සෙසු කාර්ය මණ්ඩලය 15 කින්ද

	මෙහෙයුම් ආදායම වූ රු.මිලියන 30.29 ට වඩා පරිපාලන වියදම් රු.මිලියන 36.08 ක් දැරීම හේතුවෙන් එම වර්ෂයේ සමාගම රු.මිලියන 2 ක අලාභයක් ලබා තිබුණි. මේ අනුව තානායම් 32 ක පරිපාලන කටයුතු පමණක් සිදුකිරීම සඳහා වෙනම සමාගමක් ඇතිකිරීම ආර්ථිකමය වශයෙන් කෙතරම් ඵලදායීද යන්න විගණනයේදී ගැටළු සහගත විය.			පමණක් සමන්විත විය. සමාගමේ 2021 වර්ෂයේ වාර්ෂික මෙහෙයුම් ආදායම වූ රු.මිලියන 30.29 ට වඩා පරිපාලන වියදම් රු.මිලියන 36.08 ක් දැරීම හේතුවෙන් එම වර්ෂයේ සමාගම රු.මිලියන 2 ක අලාභයක් ලබා තිබුණි. මේ අනුව තානායම් 32 ක පරිපාලන කටයුතු පමණක් සිදුකිරීම සඳහා වෙනම සමාගමක් ඇතිකිරීම ආර්ථිකමය වශයෙන් කෙතරම් ඵලදායීද යන්න විගණනයේදී ගැටළු සහගත විය.
(ඌ)	සමාගමේ මූල්‍ය කටයුතු, පරිපාලන හා මානව සම්පත් කටයුතු, මෙහෙයුම් කටයුතු සහ ප්‍රසම්පාදන හා ටෙන්ඩර් කටයුතු සම්බන්ධයෙන් ආයතනික රාමුවක් හෝ පිළියෙල කර නොමැති අතර සමාගම විසින් එකී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කුමන ආයතනික රාමුවක් හෝ	2021 3.2 (අ)	නාගරික සංවර්ධන අධිකාරියේ සහ අමාත්‍යාංශයේ එකඟතාවය සහිතව මේ සම්බන්ධයෙන් ආකෘතිමය රාමුවක් ගොඩනැගිය යුතුය.	- සමාගමේ මූල්‍ය කටයුතු, පරිපාලන හා මානව සම්පත් කටයුතු, මෙහෙයුම් කටයුතු සහ ප්‍රසම්පාදන හා ටෙන්ඩර් කටයුතු සම්බන්ධයෙන් ආයතනික රාමුවක් හෝ පිළියෙල කර

	ප්‍රතිපත්තියක් අනුවද යන්න මේ දක්වා තීරණයකට එළඹ නොතිබුණි.				නොමැති අතර සමාගම විසින් එකී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කුමන ආයතනික රාමුවක් හෝ ප්‍රතිපත්තියක් අනුවද යන්න මේ දක්වා තීරණයකට එළඹ නොතිබුණි.
(එ)	සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2021 වර්ෂයේ තානායම් 32 න් තානායම් 25 ක් ක්‍රියාකාරී වූ අතර තානායම් 07 ක් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් සමාගම වෙත ලැබිය යුතු වූ ආදායමක් අහිමි වී තිබුණිඅ	2021 3.3	නිෂ්කාර්ය තානායම් ඉක්මනින් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය.	-	සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2021 වර්ෂයේ තානායම් 32 න් තානායම් 25 ක් ක්‍රියාකාරී වූ අතර තානායම් 07 ක් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් සමාගම වෙත ලැබිය යුතු වූ ආදායමක් අහිමි වී තිබුණි.
(ඒ)	2021 වර්ෂයේ පැවති කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් තානායම්වල ව්‍යාපාර කටයුතු අඩපණ ව පැවති බැවින් සමාගමේ වාර්ෂික ආදායම පහත වැටී තිබුණි. එම නිසා අදාල තානායම හිමි පළාත් පාලන ආයතනයට, තානායම්වල කුලී	2021 3.4 (අ)	අදාල එකඟතාවයන් ලබාගැනීමට කටයුතු කල යුතුය.	10	2021 වර්ෂයේ පැවති කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් තානායම්වල ව්‍යාපාර කටයුතු අඩපණ ව පැවති බැවින් සමාගමේ වාර්ෂික ආදායම පහත වැටී තිබුණි. එම නිසා

ආදායමින් ගෙවනු ලබන සියයට 65 න් සියයට 50 ක සහනයක් සමාගම විසින් අදාල පළාත් පාලන ආයතනයෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ සඳහා ඇතැම් පළාත් පාලන ආයතන එකඟතාවය පලකර තිබූ නමුත් ඇතැම් ආයතන අනුමැතියක් ලබාදී නොතිබුණි. ඒ අනුව සමාගම විසින් පළාත් පාලන ආයතන සමඟ එකඟතාවයකින් තොරව අදාල පළාත් පාලන ආයතනය සඳහා සමාගම විසින් ගෙවිය යුතු සියයට 65 ක අගය සම්බන්ධව ඒක පාර්ශ්වික ලෙස සියයට 50 ක සහනයක් ලබාගෙන තිබුණි.

අදාල තානායම හිමි පළාත් පාලන ආයතනයට, තානායම්වල කුලී ආදායමින් ගෙවනු ලබන සියයට 65 න් සියයට 50 ක සහනයක් සමාගම විසින් අදාල පළාත් පාලන ආයතනයෙන් ඉල්ලීම් කර තිබුණි. ඒ සඳහා ඇතැම් පළාත් පාලන ආයතන එකඟතාවය පලකර තිබූ නමුත් ඇතැම් ආයතන අනුමැතියක් ලබාදී නොතිබුණි. ඒ අනුව සමාගම විසින් පළාත් පාලන ආයතන සමඟ එකඟතාවයකින් තොරව අදාල පළාත් පාලන ආයතනය සඳහා සමාගම විසින් ගෙවිය යුතු සියයට 65 ක අගය සම්බන්ධව ඒක පාර්ශ්වික ලෙස සියයට 50 ක සහනයක් ලබාගෙන තිබුණි.

(ඔ) නියමිත දිනට කල්බදු හිමියා විසින් තානායම් කුලිය සමාගම වෙත ගෙවීමට අපොහොසත් වුවහොත් මසකට සියයට 1.5 ක අධිභාරයක් අයකරන බව සමාගම හා බදු ගැනුම්කරු අතර වූ ගිවිසුම්වල සඳහන් වී තිබුණද එම අධිභාරය පනවනු ලබන්නේ මාසික කුලියටද නැතිනම් ලැබිය යුතු කුලි ශේෂයටද යන්න ගිවිසුම් තුළ පැහැදිලිව සඳහන් කර නොතිබුණි.	2021 3.4 (ආ)	ගිවිසුම්වල මෙලෙස පවතින අපැහැදිලි සහ අවුල් සහගත තත්ත්වයන් හඳුනාගෙන ඒවා වහා නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.	-	නියමිත දිනට කල්බදු හිමියා විසින් තානායම් කුලිය සමාගම වෙත ගෙවීමට අපොහොසත් වුවහොත් මසකට සියයට 1.5 ක අධිභාරයක් අයකරන බව සමාගම හා බදු ගැනුම්කරු අතර වූ ගිවිසුම්වල සඳහන් වී තිබුණද එම අධිභාරය පනවනු ලබන්නේ මාසික කුලියටද නැතිනම් ලැබිය යුතු කුලි ශේෂයටද යන්න ගිවිසුම් තුළ පැහැදිලිව සඳහන් කර නොතිබුණි.

3.40 ජී එස් එම් බී තාක්ෂණ සේවා (පුද්) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	478,105,056	191,035,664	287,069,392	28,753,025	තත්ත්වාගණනය කළ
2022	546,652,265	193,297,671	353,354,594	97,081,603	තත්ත්වාගණනය කළ
2023	553,581,574	150,611,124	402,970,450	159,733,997	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය යටතේ කැණීම් කර වැලි ගබඩාවක් වෙත ප්‍රවාහනය කර තිබූ වැලි කියුබ් 46,306 ක ප්‍රමාණයෙන් වැලි කියුබ් 41,773 ක් විකුණා තිබූ අතර ඉතිරි වැලි අලෙවි නොකර මාස 10 ක පමණ කාලයක් තිබීම නිසා සුළු වශයෙන් රොන්මඩ කලවම් වී තිබූ අතර ඉතිරි කියුබ් 4,533 ක ප්‍රමාණය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. මෙම ස්ථානයේ වැලි කියුබ් 1,000 කට අඩු ප්‍රමාණයක් පමණක් පවතින බව ටෙන්ඩර්කරුවන් විසින් දන්වා තිබූ අතර එහි තිබූ වැලි කියුබ් 875 ක ප්‍රමාණයක් ටෙන්ඩර්කරුවකු වෙත විකුණා තිබුණි. ඒ අනුව	2021	විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.	කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය පිළිබඳව කමිටුවක් මඟින් විශේෂ විමර්ශනයක් සිදු කර ඇත	ඌනතාවය සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි.

	වැලි කියුබ් 3,658 ක ඌනතාවයක් පැවති අතර එම වැලි තොගයේ පිරිවැය රු.12,107,980 ක් විය.				
(ආ)	2022 වර්ෂය තුළ මාදුරුඔය ආශ්‍රිතව ක්‍රියාත්මක වන අරලගන්විල, බෝඅත්ත, නිදන්වල වැලි ව්‍යාපෘතිවලින් පිළිවෙලින් රු.1,345,485 ක, රු.3,975,095 ක, රු.97,541 ක හා මුතූර් වැලි ව්‍යාපෘතිය තුළින් රු.3,216,621 ක අලාභ ලබා තිබුණි.	2022	ව්‍යාපෘති අලාභ ලැබීම අනෙකුත් ව්‍යාපෘති කෙරෙහිද අහිතකර ලෙස බලපාන බැවින් ලාභදායී ක්‍රියාමාර්ග වලට යොමුවීමට කළමනාකාරිත්ව ය විසින් පියවර ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	අලාභය අඩුකර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.
(ඇ)	කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුරියපුර ග්‍රාම නිලධාරී වසමේ මහවැලි ගඟේ ආරක්ෂණ වේල්ලට තර්ජනයක් වන වැලි කැණීම හා ගං ඉවුර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ තැන්පත් වී ඇති කියුබ් 103,128 ක් වූ වැලි නිධිය ඉවත් කිරීමට 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත පවරා ඇතත් 2022 ජූලි 10 වන දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු වැලි කැණීම් කටයුත්තක් සිදුනොකර රු.4,773,910 ක වැටුප්, දීමනා, ගෙවල් කුලී, කාර්යාල වියදම්, ගමන්	2023	ව්‍යාපෘතිය නිසි සැලසුම්කරණයකින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර ගංවතුර තත්ත්වයකදී වේල්ලට සිදුවිය හැකි හානි සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	ආයතනය වැලි කැණීම සඳහා ඉල්ලුම් කළ වැලි ප්‍රමාණයන්ගෙන් සියයට 53.6 පමණක් කැණීම් කිරීම සිදු කර ඇති අතර, බාදන වාරක ඉදිකිරීම සියයට 75 පමණ නිමකර ඇත	ගංවතුර තත්ත්වයකදී වේල්ලට සිදුවිය හැකි හානි සම්බන්ධව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

	වියදම් යනාදී වියදම් දරා තිබුණි. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ රු.168,254,363 ක ඇස්තමේන්තුවකට මහවැලි ගඟේ බාදන වාරක 03ක් ඉදිකිරීමට සමාගම සැලසුම් කර ඇතත් එක් බාදන වාරකයක් පමණක් ඉදිකර අවසන් කර තිබූ අතර ඉතිරි බාදන වාරක 02 හි ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 75 හා 54 ක් විය. මෙම බාදන වාරක ඉදිකිරීම්වල ගිවිසුම් කාලය මේ වන විට ඉක්මවා ඇති අතර, බාදන වාරක 02 හි වැඩ අවසන් කර නොමැති බැවින් ගංවතුර තත්ත්වයන් වලදී මහවැලි ගඟේ වේල්ලට හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.				
(ඇ)	රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජවක රක්ෂිතය තුල පවතින කැල්සයිට් නිධිය කැණීම් කර අගය එකතුකර අපනයනය කිරීමත්, දේශීය වශයෙන් භාවිත කිරීමත් අරමුණු කරගෙන ව්‍යාපෘතියක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ එක්ව සිදුකිරීම සඳහා 2020	2023	ව්‍යාපෘතිය අතහැර දමා තිබීම සම්බන්ධයෙන් හා දරන ලද නිශ්කාර්ය වියදම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකළ යුතුය. නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත	ව්‍යාපෘතියේ නිශ්කාර්ය වියදම් පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කර ඇත.	ව්‍යාපෘතිය අතහැර දමා තිබීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

වර්ෂයේ සිට සැලසුම් කර තිබුණි. විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට උපදේශන සේවා ගාස්තු ගෙවීම, ප්‍රවාහන, ගමන් වියදම්, සංයුක්ත දීමනා පරීක්ෂණ ගාස්තු යනාදී සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට සමාගම රු.3,304,612 ක වියදම් දරා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

යුතුය.

3.41 සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම** 2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි ඇතුළත් අත්පොතෙහි 6.6 ඡේදය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 4 යි මාස 08 ක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. සමාගම විසින් භාවිතා කරනු ලැබූ පරිගණක සර්වර් යන්ත්‍රය 2019 වර්ෂයේ දී වෛරස් ආක්‍රමණයක් හේතුවෙන්	2022	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව.	2018 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා 2023 ඔක්තෝබර් 27 දින ලබා දී ඇත. 2019 වර්ෂයේ අක්‍රීය වූ පරිගණක පද්ධතිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිදු කළ පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කොට ඒ පිළිබඳව වාර්තාවක් 2024 මාර්තු 04 දින දක්වා ලැබී නොමැත.	2019 සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන 2024 ඔක්තෝබර් 30 දින දක්වා ඉදිරිපත් කර නොමැත.

	අක්‍රීය වූ බවත් එම අවස්ථාවේ දත්ත උපස්ථවල (Backups) ගබඩා කර නොතැබීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති බව දක්වමින් 2019 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. 2022 අප්‍රේල් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග මත මේ සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 28 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබුණද එම වාර්තා සම්බන්ධයෙන් වර්තමාන තත්වය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.			

2. භාණ්ඩ මිලදී ගැනුම්

(අ)	කෙටුම්පත් මාසික ගිණුම් වාර්තා අනුව 2022 වසරේ ඇස්බැස්ටෝස්, යකඩ, ටයිල්, සිමෙන්ති, වැලි, වෙනත් ද්‍රව්‍ය වශයෙන් මුළු මිළදී ගැනීම් රු. මිලියන 941 ක් විය. මෙම ප්‍රසම්පාදන කටයුතු වලදී 2006 ජනවාරි 25 දිනැති අංක 06 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ පරිදි ප්‍රසම්පාදන කමිටු	2022	සමාගම සඳහා භාණ්ඩ මිලදී ගැනීම් සිදුකිරීමේදී 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු බව.	භාණ්ඩ මිලදී ගෙන අලෙවි කරන ආයතනයක් වන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ආයතනයේ ක්‍රියාකාරිත්වයට අනුගත වන අයුරින් 2022/2023 වර්ෂවලට අදාලව කමිටු පත් කර ඇත.	මේ දක්වා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටු පත්කර නොමැත.

පත්කර නොතිබුණි.

(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) අනුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විෂය යටතට ගැනෙන සියලු ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවා තිබිය යුතු වුවත් සමාගමේ ප්‍රසම්පාදන තීරණ ගැනීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පිහිටුවා නොතිබුණි.මාර්ගෝප දේශ සංග්‍රහයේ 2.8.4 ඡේදය අනුව සමාගමේ ප්‍රධානියා විසින් පත්කල තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් ප්‍රසම්පාදනයට අවශ්‍ය තාක්ෂණික ඇගයීම් ලබා දිය යුතු වුවත් අයිතම මිලට ගැනීම් සඳහා අවශ්‍ය විෂය පිළිබඳ විශේෂඥයෙකුගේ ඇගයීම් ලබාගෙන නොතිබුණි.	2022	ආයතනය සඳහා මිලදී ගැනීම් සිදුකිරීමේදී 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමට කටයුතු කළ යුතු බව.	සාමාන්‍යාධිකාරි විසින් 2022.06.07 දින සහ 2022.09.16 දිනැති ලිපි මගින් ප්‍රසම්පාදන කමිටු පත් කර ඇත.	මේ දක්වා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොමැත .

3. භාණ්ඩ විකුණුම්

(අ)	2022 වර්ෂය සඳහා සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කර තිබුණු ගිණුම් වාර්තාව අනුව සමාගමෙහි විකුණුම් වටිනාකම රු.මිලියන 3,324 ක් විය. මෙම විකුණුම් වටිනාකම තුළ විකුණුම් වැඩිකර	2022	සාවද්‍ය ලෙස වැඩිකර දැක්වූ විකුණුම් නිවැරදි ලෙස ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතු අතර මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන කඩිනම් විනය පියවර ගත යුතු බව.	ආයතනික මට්ටමින් වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැත.	වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන විනය පියවර ගැනීමට කටයුතු කර නැත.

				දැක්වීමේ අරමුණ ඇතිව පස්වන විධායක ජනාධිපති/ අග්‍රාමාත්‍ය නිලනිවස අළුත්වැඩියාව හා නවීකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් සාවද්‍ය ලෙස නිකුත් කර තිබූ රු.මිලියන 557.02 ක් වටිනා ඉන්වොයිස්පත් 98 ක් ද නාගරික සංවර්ධන අධිකාරිය වෙත සාවද්‍ය ලෙස නිකුත්තර තිබූ රු. මිලියන 79.19 ක් වටිනා විකුණුම් ඉන්වොයිස්පත් 22 ක් ද ඇතුලත් කර තිබූ බව නිරීක්ෂණය විය. එම විකුණුම් වෙනුවෙන් ඇණවුම් කල භාණ්ඩ අතරින් සෘජුවම අදාල වැඩබිම්වලට සපයා තිබූ භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩ භාරගත් බවට සහ පිරිවිතරයන්ට අනුකූල බවට තොරතුරු ඉදිරිපත් නොවීය.		
(ආ)	සමාගම විසින් විකිණීම සඳහා භාණ්ඩ මිළදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර විනිවිදභාවයකින් යුතුව එම මිලදී ගැනීම් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් සාධාරණ මිළට භාණ්ඩ මිළදී ගැනීමට නොහැකි වීම නිසා පිරිවැය වැඩිවීම හේතුවෙන් භාණ්ඩයන්ගේ විකුණුම් මිළ ගණන්ද ඉහළ	2022	ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර අවම මිලට භාණ්ඩ මිලදී ගැනීමට හා තරඟකාරී වෙළඳපොලේ තරඟකාරී විකුණුම් මිළ ගණන් යටතේ උපරිම වාසි ලැබීමට සමාගම කටයුතු කල යුතු බව.	ලියාපදිංචි සැපයුම්කරුවන් හරහා ආයතනයට වාසිදායක වන අයුරින් වෙළඳපල මිල ගණන් සංසන්දනය කරමින් අවම මිල ගණන් යටතේ භාණ්ඩ මිලදී ගැනීමට ආයතනය විසින් කටයුතු කරනු ලැබේ.	සමාගමට තරඟකාරී වාසි ලබා ගැනීමට හැකි අයුරින් නිෂ්පාදකයන් කිහිපදෙනෙකු ගෙන් මිළ ගණන් කැඳවීම් නොකර සැපයුම්කරුවන් ගෙන් මිළ ගණන් කැඳවා තිබුණි.

දැමීමට සමාගමට සිදුව තිබුණි. එහෙයින් වෙළඳපලෙහි ඒ හා සමාන භාණ්ඩයන්ගේ මිලගණන් සමඟ තරහකිරීමට සමාගම අපොහොසත් වීම මත සමාගමෙහි විකුණුම් ආදායම දිනෙන් දිනම පිරිහීමට ලක්ව තිබූ බව නිරීක්ෂණය විය.

4. දිගු කාලීන හා කෙටිකාලීන ණය

(අ) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමේ අරමුණින් සමාගම විසින් රුපියල් මිලියන 150 ක කෙටිකාලීන ණය මුදලක් 2017 මාර්තු 02 දින සිට 2018 අප්‍රේල් 10 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 03 කදී මහජන බැංකුවෙන් ලබා ගෙන තිබුණි. ණය ගිවිසුමේ ඇතුලත් කොන්දේසි අංක 07 ප්‍රකාරව ලබා ගත් ණය, අපේක්ෂිත අරමුණට යොදාගත් බව තහවුරු කලයුතු වුවත් මෙම ණය මුදල ලබාගැනීමේ අරමුණ නොතකා සමාගමේ පඩිනඩි ගෙවීම්, ප්‍රසාද දීමනා ගෙවීම් ආදී පරිපාලන වියදම් ද ඇතුළුව වෙනත් වියදම් සඳහා වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.
කෙසේ වුවද මෙම ණය මුදල නියමිත පරිදි පියවීමට සමාගම

2021 2022	ඇතිකර ගනු ලැබූ ණය ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ණය මුදල් උපයෝජනය කර ණය පියවීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතු බව.	2022.01.28 දින සිට 2024.06.24 දින දක්වා රු.500,000/= බැගින් වාරික වශයෙන් රු. මිලියන 14.5ක් ගෙවීමට කටයුතු කර ඇත.	2024 ජුනි මාසය වන විට රු.මිලියන 14.5 ප්‍රමාණයක් ගෙවීම් කර ඇති අතර වර්තමානයේ ආයතනය මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගෙන 2024 ජූලි මාසයේ සිට ගෙවීම් තාවකාලිකව නතර කර දමා ඇත.

	අපොහොසත් වී තිබුණු බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය මුදල සහ උපචිත වූ පොලියද සමග මුළු හිඟ මුදල රු. මිලියන 220.37 ක් වූ අතර ඒ වෙනුවෙන් ගෙවිය යුතු දඩමුදල රු. මිලියන 17.12 ක් බවද නිරීක්ෂණය විය.				
(ආ)	මූල්‍ය දුෂ්කරතා ජයගනිමින් ඉදිකිරීම් කර්මාන්තයේ ශක්තිමත් පාර්ශවකරුවකු වීමට සමාගමට හැකි වනු පිණිස භාණ්ඩාගාර ඇපයක් මත 2018 මාර්තු 28 දිනැති හා අංක අමප/18/0504/736/007 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ලංකා බැංකුව විසින් රුපියල් මිලියන 500 ක ණය මුදලක් 2018 ඔක්තෝබර් 23 දින සමාගම වෙත ලබා දී තිබුණි. එයින් එදින වන විට ලංකා බැංකුවට අයවීමට තිබූ රු. මිලියන 199.05 ක් වූ මුදලක් අඩුකර ගෙන ඉතිරි මුදල වූ රු. මිලියන 301.38 ක් ආයතනයට ලබා දී තිබුණි. එයින් සියයට 35 ක් එනම් රු. මිලියන 105.98 ක් ණය ලබා ගැනීමේ අරමුණට පටහැනි වියදම් වූ සේවක වැටුප් ගෙවීම්, සේවක අර්ථසාධක / භාරකාර අරමුදල් ගෙවීම්, ණය පොළි	2021 2022	ණය මුදල් ලබාගන්නා අරමුණ වෙනුවෙන් යෙදවීමට කළමනාකරණය පියවර ගත යුතු බව.	මෙවැනි සැලැස්මක් සකස් කිරීමේ හා එය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වය හේතුවෙන් බැංකුවට එවැනි සැලැස්මක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	මේ දක්වා ණය ආපසු පියවීමට සමාගම අපොහොසත් වී තිබුණි.

	ගෙවීම්, ප්‍රසාද දීමනා ගෙවීම්, අයිරා පියවීම, ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් වැය කර තිබුණි. මෙම රු.මි. 500 ක ණය මුදලද එකඟ වූ කොන්දේසි අනුව පියවීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2023 මැයි 26 දිනට හිඟ ණය පොළිය රු. මිලියන 264.43 ක් වී තිබුණි.				
5.	**බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**				
(අ)	සමාගමේ ටයිල් ව්‍යාපෘතිය යටතේ 2021 සැප්තැම්බර් මාසයේ සිට 2023 ජූනි 30 දක්වා රු. මිලියන 2,924.73 ක විකුණුම් ආදායමක් ලබා තිබුණද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ අයකර ගත් එකතු කළ අගය මත බදු රු. මිලියන 129.59 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.	2022	එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අය කර ගත් බදු මුදල් වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ට ප්‍රේෂණය කළ යුතු බව.	2021 වර්ෂයේ සිට විකුණුම් අගයන් ගිණුම්කරණ දත්ත පද්ධතියට ඇතුළත් කෙරෙමින් පවතින අතර මේ වන විට 2021 වර්ෂයේ මුල් කාර්තු 3 හි විකුණුම් අගයන් දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.	විකුණුම් ආදායම් ලබා තිබුණද වැට් බදු ශේෂය ගෙවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.
(ආ)	2023 ජූනි 15 දිනැති අංක නාභා/වරි/හිඟ ගෙවීම් 2021 දරන කොළඹ මහනගර සභාවෙහි නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරිකගේ (ආදායම්) ලිපිය අනුව 2007 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා	2021 2022	ගෙවිය යුතු වරිපනම් බදු පිළිබඳ විස්තර අදාළ පළාත් පාලන ආයතන වෙතින් විමසා ගෙවීමට කටයුතු කළ යුතු බව.	එහිදී 2007 සිට 2021 දක්වා වූ හිඟ වරිපනම් ආපසු ගෙවීම සම්බන්ධ සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කළ නමුදු වර්තමාන මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන එවැනි සැලැස්මක් ඉදිරිපත්	2007-2021 හිඟ වරිපනම් ලෙස රු.මිලියන 23.34 ක් උපචිතව පවතී.

	හිඟ වරිපනම් බදු මුදල් රු. මිලියන 23.34 ක් 2023 අගෝස්තු 17 දින දක්වාම නිරවුල් කර නොතිබුණි.			කිරීමට නොහැකි විය.	
6.	**අවධිමත් ගණුදෙනු**				
(අ)	2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002/-1 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අග්‍රාමාත්‍ය / පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, උපකරණ සහ සැපයිය හැකි සියලුම අයිතමයන් සැපයීම සහ සිවිල් ඉංජිනේරු වාස්තු විද්‍යාත්මක සහ අභ්‍යන්තර නිර්මාණ සම්බන්ධ උපදේශනාත්මක සේවා ටෙන්ඩර් කැඳවීමකින් තොරව රාජ්‍ය ආයතනයක් වන සංස්ථාව මගින් ලබා ගැනීමටත් අවශ්‍ය පරිදි ආයතනය සමග ගිවිසුම්වලට එළඹීමටත් අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද සමාගම විසින් අවශ්‍ය කරන ද්‍රව්‍ය හා ප්‍රමාණ ඇතුලත් ඇස්තමේන්තුවක් හා භාණ්ඩ සැපයීමේ කොන්දේසි, මුදල් ගෙවීම් ආදී කරුණු ඇතුළත් ගිවිසුමකට අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ එළඹ නොතිබුණි.	2021 2022	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ක්‍රියා කිරීමට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමටත් ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්ගතවීමටත් ක්‍රියා කල යුතු බව .	කෝවිඩ් සමය තුළ මෙම ගනුදෙනු සිදු වී ඇත.එබැවින් මෙම නිර්දේශයෙහි සඳහන් ආකාරයට කටයුතු කිරීමේ දුෂ්කරතාවන් පැවති ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාව සමඟ ගිවිසුම් ගත වීමට ක්‍රියා කර නොතිබුණි.

(ආ)	තවද උපදේශනාත්මක සේවා සැපයීම සමාගමෙහි කාර්යයන් තුළ නොවුවද ඉහත අළුත්වැඩියා හා නඩත්තු කිරීමට අවශ්‍ය සිවිල් ඉංජිනේරුමය වාස්තු විද්‍යාත්මක හා අභ්‍යන්තර නිර්මාණ සම්බන්ධයෙන් උපදේශනාත්මක සේවා කටයුතු සැපයීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම්, තෝරාගැනීම් ආදිය සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකොට කිසිදු ගිවිසුම්ගතවීමක් හෝ නොමැතිව සමාගම විසින් රු. මිලියන 10 ක මුදලක් ගෘහ නිර්මාණ ශිල්පියෙකු වෙත ගෙවා තිබුණු අතර 2023 ජූලි 30 දින වන විටත් අදාල ඉන්වොයිස් වටිනාකමින් රු. මිලියන 3.07 ක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.	2021 2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමටත් ගණුදෙනුකරුවන් සමඟ ආරම්භයේදීම ගිවිසුම්ගතවීමටත් ක්‍රියා කල යුතු බව.	කෝවිඩ් සමය තුළ මෙම ගනුදෙනු සිදු වී ඇත. එබැවින් මෙම නිර්දේශයෙහි සඳහන් ආකාරයට කටයුතු කිරීමේ දුෂ්කරතාවන් පැවති ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර නොමැත.
(ඇ)	ඉහත ආකාරයට තෝරාගනු ලැබූ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ වාචික උපදෙස් මත ඔවුන් විසින් නම් කරනු ලැබූ සැපයුම්කරුවන් 16 දෙනෙකුගෙන් මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය	2021 2022	මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමටත් ගෙවීම් නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා ගෙවීම් වවුචර් මෙන්ම අවශ්‍ය උපකාරක ලියවිලි	ගෙවීම් වවුචරයට අදාළ අවශ්‍ය උපකාරක ලියවිලි 2023 වර්ෂයේ සිට නිවැරදිව ලියවිලි සමඟ අමුණා ඇත.	මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකරන ලද අතර ගෙවීම් වවුචර්ද නිවැරදිව ඉදිරිපත් නොවීය.

	අනුගමනය කිරීමකින් තොරව සිදු කර ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගැනුම් ඇනවුම් මත මිලදී ගෙන තිබුණි. පසුව නිලනිවාස ව්‍යාපෘතියට භාණ්ඩ නිකුත්කර ඒවා සමාගමේ නමින් ඉන්වොයිස් කර තිබුණි. අග්‍රාමාත්‍ය කාර්යමණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලබන වියදම් ඇතුළත් වූ ගෙවීම් වව්චර්පත් විශාල ප්‍රමාණයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර මේ පිළිබඳව 2023 අගෝස්තු 07 දින ලිඛිතව සභාපති වෙත දන්වා සිටියද එම ගෙවීම් වව්චර්පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.		සියල්ල අමුණා තිබිය යුතු බව.		
(ඇ)	2023 ජූලි 30 දින වන විට අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පියවා තිබූ මුදල රු. මිලියන 559.59 ක් වූ අතර ඒ අනුව තවදුරටත් අයකර ගත යුතු වූ මුදල රු. මිලියන 90.23 ක් වී තිබුණි.	2021 2022	මෙම සියළුම මුදල් ප්‍රතිපූරණය කර ගැනීමට ක්‍රියා කල යුතු බව .	මිලදී ගැනීමේ ඇණවුම්වල හා ණය ලියකියවිලිවල පවතින ගැටළු සඳහන් වාර්ථාවක් 2024/10/23 වන දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නියමිතයි.	මේ වන විට අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් අය කර නොගත් මුදල රු. මිලියන 84.63 ක් වේ.
7.	**කාර්යසාධනය**				
	1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව 1992 වර්ෂයේ දී 1982 අංක 17 දරන	2022	සමාගමේ අරමුණු හා දැක්ම අනුව කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු මෙහෙයවීම කළමණාකරණයේ වගකීම වන බව.	1977 න් පසු විවෘත ආර්ථිකයක් ඇතිවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබේ. නමුත්, මෙරට නිෂ්පාදිත ගොඩනැගිලි සහ ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ,	සමාගම පිහිටුවීමේ අරමුණ සහ දැක්මට අනුව කටයුතු මෙහෙයවා සාධාරණ ලාභදායීත්වයක්

සමාගම් පනත යටතේ ද 2010 වර්ෂයේ දී 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ද නැවත ලියාපදිංචි කර තිබූ අතර එහි දැක්ම ‘‘ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම හා රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනැගීම’’ විය. එසේ වුවද වර්තමානය වන විට ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යන නවීකරණය කරන ලද ප්‍රදර්ශනාගාරයේ සහ ශාඛා කාර්යාල මගින් පෞද්ගලික ගොඩනැගිලි ද්‍රව්‍ය උපකරණ සපයන්නන්ගෙන් මිලදී ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ලාභ ආන්තිකයක් ඇතිව විකිණීමේ කටයුතුවල නිරතව පැවතුණි. මේ අනුව සමාගම පිහිටුවීමේ අරමුණු හා සමාගමේ දැක්මද ආවරණය නොවන බව නිරීක්ෂණය විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද 2013 සිට 2018 දක්වා වූ වර්ෂ 06 ක කාලය තුළදී ද ශුද්ධ අලාභය රුපියල් උපකරණ, මෙවලම් සහ අනෙකුත් උපාංග ලංකාව පුරා අලෙවි කිරීම සහ බෙදා හැරීම යන සියළු කටයුතු ආයතනය මගින් ඉටු කරනු ලබන බව දක්වමි. මෙම පනත ඉදිරියේ දී ආයතනයට යෝග්‍ය පරිදි වෙනස් කිරීමට බලාපොරොත්තු වන අතර, වර්තමාන ආර්ථිකයට ගැලපෙන අයුරින් තරඟකාරී වෙළඳපළට ක්‍රියාකාරී සැලැස්මකට අනුව ප්‍රවේශ වීමට බලාපොරොත්තුවේ. උපයා ගැනීමට හැකි වී නොමැත.

මිලියන 15 සිට රුපියල් මිලියන 167 දක්වා වර්ධනය වී තිබුණි.

8. අරමුණට පටහැනි වූ ගණුදෙනු

ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීම 2015 සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 7 ක කාලපරිච්ඡේදය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සූරිය පොකුණ දෙබොක්කාව නිවාස ව්‍යාපෘතියේ නිවාස හිමියන්ට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ණය පදනම මත සංස්ථාවෙන් නිකුත් කර තිබුණි. මෙම ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් අම්බලන්තොට, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්ස, වීරකැටිය, ඇඹිලිපිටිය, සූරියවැව, යන ශාඛා ගබඩාවන්ගෙන් රු. මිලියන 34.69 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය කිසිදු සීමාවක් නොතකා නිකුත් කර තිබුණු අතර 2023 ජූනි 30 දින දක්වාම මෙම ණයශේෂ නිරවුල් වී නොතිබුණි.	2022	සමාගමෙහි ව්‍යාපාරික අරමුණු ඉටුකරගත හැකි වන පරිදි සමාගම් කළමනාකරණය ක්‍රියාකලයුතු වන බව.	ආදර්ශ ගම්මාන වැඩ සටහනෙහි භාණ්ඩ ලබාදුන් අය හා සම්බන්ධීකරණය සිදු කරන ලද නිලධාරියාගේ අධීක්ෂණය යටතේ රාජකාරි කළ නිලධාරීන් ආදර්ශ ගම්මාන වල සතියේ දින 02 ක් මුදල් එකතු කිරීමේ කටයුතු සඳහා යොදවන ලදි.	හිඟ මුදල් මෙතෙක් අයකර ගෙන නොමැත.

9. හඳුනාගත් පාඩු

(අ)	ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව ආනයනකරුවන්ගෙන් මිළ ගණන් කැඳවා තෝරාගත් පාකිස්ථානු ආයතනයක ලංකාවේ අතරමැදි සමාගමක් වන DMW Ventures (Pvt) Ltd සමඟ මෙට්‍රික් ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 79.50 ක් බැගින් වූ සිමෙන්ති මෙට්‍රික් ටොන් 5600 ක් කි.ග්‍රෑ. 50 බැගින් "BMC" නාමය මුද්‍රණය කරන ලද කඩදාසි මළුවල බහා සැපයීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. 2022 මාර්තු 14 දින මේ සඳහා මුදල් තැන්පතුවක් වශයෙන් රු.මිලියන 05 ක් ගෙවා තිබුණි. එසේ වුවද රටේ පවතින විනිමය අර්බුදය හමුවේ ණයවර ලිපි විවෘත කිරීම මහජන බැංකුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සිමෙන්ති ආනයනය කළ නොහැකි වූ අතර ඒ පිළිබඳව කලින් තහවුරු කර ගැනීමකින් තොරව ගෙවා තිබූ රු.මිලියන 05 නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2022	ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව ගෙවූ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව.	අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් සැපයුම් නොකිරීම මත මෙම මුදල ආපසු අය කර ගැනීම සඳහා DMW Ventures (pvt) Ltd ආයතනය වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත. මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කර නිර්දේශ ලබා දී ඇත.	සැපයුම්කරුගේ පිළිතුරු ලිපිය හරහා ආයතනය මඟින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වීමක් සිදු නොවූ බැවින් මෙම තැන්පතුව නැවත ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත. අදාල නිර්දේශය පරිදි නඩු දමා මෙම මුදල අයකර ගැනීමට ක්‍රියාකර නැත.

10. වත්කම්

කළමනාකරණය

(අ)	රුඩ් 03 පර්චස් 35.6 ක් වූ අනුරාධපුර ඉඩමක නඩු කටයුතු අවසන් වී	2021 2022	අදාළ දේපල සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු ලබා	ඉඩම් හා ගොඩනැගිලිවල ගැටළු නිරාකරණය	අනවසර පදිංචිකරුවන් ඉවත් කර

	ඇතත් අනවසර පදිංචිකරුවන් ඉවත්කර භුක්තිය භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.		ගැනීමට සහ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට සමාගම ක්‍රියා කළ යුතු බව.	කර ගැනීම සඳහා සාකච්ඡාවක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) සමග 2024.04.30 වෙනි දින පැවැත් විය.	ආයතනයට අදාල දේපලේ භුක්තිය භාර ගැනීම සඳහා මේවන තෙක්ම කටයුතු කර නැත.
(ආ)	අංක 549/A, බොරුපන, මොරටුව ඉඩමේ පැවරුම ලබාගැනීම සඳහා 2019 අගෝස්තු 21 දිනැතිව සහ අංක අමප/19/2192/122/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ඉඩමේ අයිතිය සමාගම වෙත ලබාදීමට අනුමැතිය ලබාදී ඇතත් සමාගම විසින් ඉඩමේ අයිතියට අදාළ ඔප්පුව සකස්කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2021 2022	හිමිකම් ඔප්පු සකස් කර ලියාපදිංචි කර ගැනීමට සමාගම සම්බන්ධිත ආයතන සමග කටයුතු කළ යුතු බව.	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) සමඟ 2024.04.30 දින පැවැති සාකච්ඡාවේ දී ඔප්පු ලිවීමේ කටයුතු බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් හරහා සිදු වෙමින් පවතින බව ප්‍රකාශ විය.	මේ වන විටත් හිමිකම් ඔප්පු සකස් කර නොමැත.
(ඇ)	නව තක්සේරු වාර්තා ලබා ගැනීමකින් තොරව වර්ෂ 05කට වැඩි පැරණි මිල ගණන් යටතේ සමාලෝචිත වර්ෂයේදීද සිමෙන්ති ගබඩාව, අංක 06 ගබඩාව සහ සංඝරාජ අංක 11 ගබඩාව කුලියට ලබා දී තිබුණි.	2021 2022	වත්කම් තක්සේරු කර ඒ අනුව කුලී ප්‍රමාණය යාවත්කාලීන කර ගබඩාව කුලියට දිය යුතු බව.	පැරණි මිල ගණන් යාවත්කාලීන කර ගිවිසුම් අළුත් කිරීම සඳහා නව මිල ගණන් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත.	මේ වන තෙක්ම තක්සේරු වාර්තා ලබා ගෙන නොමැත.
(ඈ)	2015 අප්‍රේල් මස සිට වර්ග අඩියක් රු.45 බැගින් වර්ග අඩි 1480 ක් වූ අංක 541 ශ්‍රී සංඝරාජ මාවතේ සමාගම් පරිශ්‍රයේ සමාගම සතු ගබඩාවක් මසකට රු. 66,600 ක	2021 2022	නව තක්සේරුවකට අනුව ගබඩා කුළියට ලබාදීමටත් හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කල යුතු බව.	මෙම ගබඩා කුළියට ලබාදීම සඳහා ගිවිසුම් ගත වීමට නව තක්සේරු අගය ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.	මේ වන තෙක්ම තක්සේරු වාර්තා ලබා ගෙන නොමැත.

		මුදලකට ව්‍යාපාරිකයෙකු වෙත කුලියට දී තිබුණි. ගිවිසුම් කාලය 2017 අප්‍රේල් 09 දින දක්වා වූ අතර නව ගිවිසුමකට එළඹීමකින්ද තොරව මුල් ගිවිසුම අනුව පැවති කුලී මුදලටම 2022 දෙසැම්බර් 31 දින දක්වාම ලබා දී තිබුණි.		

11. මුදල් කළමනාකරණය

සමාගම විසින් බැංකු ගිණුම් 12 ක් පවත්වාගෙන යනු ලබන අතර ඉන් දෙකක් අක්‍රීය තත්ත්වයේ පවතී. 2022 වර්ෂය සඳහා ආරම්භක සහ අවසාන ශේෂයන් සඳහන් කරමින් මුදල් පොත් කිසිවක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි. එම බැංකු ගිණුම් ශේෂ සනාථ කිරීම් අනුව බැංකු ගිණුම් 03 ක හර ශේෂය රු. මිලියන 25.78 ක් වූ අතර ගිණුම් 07 ක බැර ශේෂය රු. මිලියන 303.04 ක් විය. මේ හේතුවෙන් සමාගම ප්‍රමාණවත් පරිදි මුදල් පිළිබඳ පාලනයක් ක්‍රියාවේ යොදවා නොමැති බව නිරීක්ෂණය විය.	2021 2022	වඩාත් නිවැරදිව ගණනය කර ගත් ආරම්භක ශේෂයක් පදනම් කර කරමින් මුදල් පොත් සහ බැංකු සැසඳුම් මාසිකව පිළියෙල කිරීමට කටයුතු කිරීමට කළමණාකරණය වහාම කටයුතු කල යුතු බව හා එය මූල්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීමක් වන බව.	2023 වර්ෂය සඳහා මුදල් පොත පිළියෙල කර ඇත.ඊට අදාළ බංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල වී නොමැත. 2024 වර්ෂයේ සියලු ම ජංගම ගිණුම් සඳහා මුදල් පොත පිළියෙල කර ඇති අතර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කටයුතු යොදා ඇත.	මේ වන තෙක්ම නිවැරිදි ආකාරයට බැංකු සැසඳුම් පිළියෙල කර නොමැත.

12. මානව සම්පත් කළමනාකරණය

(අ)	වාණිජ අංශයේ සේවය කරන නිලධාරීන් දෙදෙනෙකුගේ කාර්යාලය (මේස ලාච්චුව) තුල සමාගමෙහි සැපයුම්කරුවන් තිදෙනෙකුගේ ලිපි ශීර්ෂ සහ මුද්‍රා තිබී හමුවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගමෙහි හිටපු සාමාන්‍යාධිකාරීගේ වැඩ තහනම් කර වාණිජ අංශය මුද්‍රා තබා තිබුණි. මේ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 28 දින කොළඹ වංචා විමර්ෂණ කාර්යාංශයේ අංක IR/629/06/22 දරන යොමුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද මේවන තෙක්ම පරීක්ෂණ නිමවා වාර්තාවක් ඉදිරිපත් වී නොතිබුණි. එමෙන්ම හිටපු සාමාන්‍යාධිකාරීවරයා 2020 නොවැම්බර් 02 දින එම තනතුරට පත්වීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද සහතික ව්‍යාජ ඒවා බව අභ්‍යන්තර විගණකගේ 2023 ජනවාරි 27 දිනැති වාර්තාවෙන් සභාපති/අධ්‍යක්ෂ	2022	අවශ්‍ය පරීක්ෂණ සහ විනය ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණය වහාම කටයුතු කල යුතු බව.	සමාගම් සැපයුම්කරුවන්ගේ ලිපි ශීර්ෂ සහ මුද්‍රා තිබී හමුවීම හේතුවෙන් සේවය නතරකරන ලද මෙම නිලධාරීන් සම්බන්ධව මූලික පරීක්ෂණ පවත්වා එම පරීක්ෂණයෙන් අනතුරුව විධිමත් විනය පරීක්ෂණය සිදු කරමින් පවතියි.	මේ වන තෙක්ම පරීක්ෂණ අවසන් කර අවසාන තීරණයකට පැමිණ නොමැත.

මණ්ඩලය වෙත දන්වා තිබුණි. මෙතෙක් ඒ සම්බන්ධයෙන් විමර්ෂණ පවත්වා අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.42 සීමාසහිත නාගරික ආයෝජන හා සංවර්ධන(පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,657,997,096	1,315,426,122	2,342,570,974	451,854,296	තත්ත්වාගණනය කළ
2022	10,972,479,358	826,328,569	10,146,150,789	7,839,601,455	තත්ත්වාගණනය කළ
2023	12,745,901,727	546,533,813	12,199,367,913	2,105,068,141	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු එකතුකල අගය මත බදු රු. මිලියන 80 ක අගය සකස් වී ඇත්තේ, වර්ෂ 2007 සිට 2013 දක්වා සමාගමේ ආනයන බදු නිදහස් කාලසීමාවට අදාලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු.මිලියන 91 ක එකතුකල අගය මත බදු හා එදිනෙදා සමාගමේ සාමාන්‍ය ගණුදෙනු මත ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු.මිලියන 11 ක් වූ එකතුකල අගය මත බදු අගයන් එකිනෙක හිලව් කිරීමෙනි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගමේ වගකීම්	2021 1.5.3	ගෙවිය යුතු බද්ද සහ අයවිය යුතු බද්ද වෙන්ව නිරූපනය කල යුතුය.	දේශීය අදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපුරණය කරගත යුතු එකතු කල අගය මත බදු සමාගමේ සාමාන්‍ය ගනුදෙනු මත එකතු කල අගය මත වෙන් වෙන්ව නිරූපනය කිරීමට 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් කටයුතු කරනු ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී.

	රු.මිලියන 11කින්ද ප්‍රතිපූර්ණය කරගත යුතු බදු වත්කමද එම අගයෙන්ම ඌණනය වී තිබුණි.				
(ආ)	2021 නොවැම්බර් 17 දින සිට බලාත්මක රජයට අයත් ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 7.7 ඡේදය ප්‍රකාරව පරිපාලක සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත සමාගමේ කටයුතු අධීක්ෂණය හා සමාලෝචනය සඳහා පහසුකම් සැලසීමට ව්‍යූහයක් සැකසිය යුතු වුවත් නාගරික ආයෝජන හා සංවර්ධන (පුද්ගලික) සමාගමේ මෙහෙයුම්, පරිපාලන හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය දක්වා එවැනි ව්‍යූහයක් සකස් කර නොතිබුණි.	2023 1.7	අත්පොතෙහි 7.7 ඡේදය අනුව පරිපාලිත සමාගම් කටයුතු අධීක්ෂණය සඳහා ව්‍යූහයක් ගොඩනැගිය යුතුය.	සමාගම විසින් බදවා ගන්නා ලද කාර්ය මණ්ඩලය සමාගමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව බදවාගෙන ඇත.	නිරීක්ෂණය එලසෙම පවතී.
(ඇ)	සමාගම ආරම්භ කරන අවස්ථාවේ පැවති අරමුණ අනුව මෙය වෙනමම ආයතනයක් ලෙස ආරම්භ කිරීම ප්‍රායෝගික වුවත් සමාගමේ වර්තමාන කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් විසින් ඉටු කරන බැවින් වෙනම සමාගමක් ලෙස පවත්වාගෙන යාම කොතරම් දුරට ඵලදායී	2023 3.1 (අ)	මෙම සමාගම නාගරික සංවර්ධන අධිකාරියේ අංශයක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.	ආයතනය ලබාගත් ණය මුදල පියවාගැනීමෙන් අනතුරුව සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් වෙනත් අරමුණු අනුව එම ආයෝජන ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමුකිරීමට කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඉදියේදී ඉහළ කළමනාකාරිත්වය	නිරීක්ෂණය එලසෙම පවතී.

	දැයි විගණනය ප්‍රශ්නකාරී වේ.			තීරණය කරනු ඇත.	
(ඇ)	සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය ඕනෑම ප්‍රදේශයක, ඕනෑම සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීම,ගොඩනැගීම හා සංවර්ධනය කිරීම සමාගමේ පරමාර්ථය වුවද මෙම පුළුල් අරමුණ ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සමාගම ක්‍රියාකරන බව සමාගමේ 2021-2024 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මට අනුව නිරීක්ෂණය නොවේ. ඒ වෙනුවට සිදුවන්නේ බදු පදනමට ලබාදුන් ගොඩනැගිල්ලේ වාර්ෂික කුලී සහ සේවා ආදායම් එකතු කිරීමත් ගොඩනැගිල්ල නඩත්තු කිරීමත් පමණි.	2023 3.2	සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව විවිධාංගීකරණ උපාය මාර්ග පිළිබඳව අවධානය යොමුදකල යුතුය.	වෙනත් ව්‍යාපෘති කටයුතු වල ආයෝජනය සිදු කිරීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තිය සලකා බැලීමේන් අනතුරුව ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ඉහල කළමනාකාරීත්වය අවධානය යොමු කරනු ඇත.	නිරීක්ෂණය එලෙසම පවතී.
(ඉ)	කාර්යසාධන ඉලක්ක, මූල්‍ය ඉලක්ක සහ ප්‍රසම්පාදන සැලසුම් ඇතුලත් කරමින් 2021,2022 හා 2023 වර්ෂ සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.	2021 4.1 2022 4.1 2023 4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුය.	2021 – 2024 කාලපරිච්ඡේදයට අදාලව උපායශීලී සැලැස්මක් (Strategic plan) ආයතනය සතුව පවතින අතර ඒහි ක්‍රියාකාරී සැලැස්මක් ඇතුලත් වන අතර එය විස්තරාත්මකව ඉදිරිපත් කර නොමැති බව පිලිගනී.	නිරීක්ෂණය එලෙසම පවතී.
(ඊ)	සමාගමේ නිළධාරින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව රේඛීය	2021 3.3	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.	පිළිතුරු ලබාදී නොතිබුණි.	වර්තමානයේ මෙම සේවකයන්

	අමාත්‍යාංශයේ හෝ වෙනත් ආයතනයක සේවයට මුදා නොහැරිය යුතු වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් 2017 වර්ෂයේ ප්‍රමාණ සමීක්ෂණ නිළධාරීන් 02 ක හා 2019 වර්ෂයේ සහකාර සැලසුම් නිළධාරීන් 09 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන නාගරික සංවර්ධන අධිකාරියට මුදාහැර තිබූ අතර 2022 අගෝස්තු 30 යන විගණිත දින දක්වාම සේවයේ යොදවා තිබුණි. සමාලෝාචිත වර්ෂය සඳහා රු.7,553,369 ක වැටුපක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.				සමාගමේ කාර්ය මණ්ඩලය තුළ දක්නට නොලැබෙන නමුත් සමාගම එවකට දරණු ලැබූ වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.
(උ)	සමාගමේ "සෙන්සිරිපාය අදියර - II " ගොඩනැගිල්ල භාවිතා කරනු ලබන රාජ්‍ය ආයතන වලින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු කුලී ආදායම, ලැබිය යුතු වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 142.71 ක් වූ අතර එයින් රු.මිලියන 41.62 ක් මාස 03 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි.	2022 1.6	අයවිය යුතු ණයගැති ශේෂ කඩිනමින් අය කරගත යුතුය.	පිළිතුරු ලබාදී නොතිබුණි.	එවකට පැවති ශේෂ පසුව අයවී තිබුණද නව ශේෂයන් බිහිවී ඇත. තවද සමාගමේ ගිණුම් පද්ධතියේ අඩුපාඩු හේතුවෙන්ද මෙවැනි දීර්ඝ කාලීන ශේෂ නිරූපණය වෙමින් පවතී.

3.43 ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	453,272,633	483,971,095	(30,698,462)	332,980	තත්ත්වාගණනය කළ
2022	423,599,291	440,913,811	(17,314,520)	11,462,577	තත්ත්වාගණනය කළ
2023	506,770,221	456,156,051	50,614,170	7,561,406	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම සතු රු.මිලියන 301.28 ක් වටිනා මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ගොඩනැගිල්ල රු.මිලියන 326.30 කට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර මව් සංස්ථාව මගින් 2021 වර්ෂයේදී පවරාගෙන තිබුණි. නමුත් ගොඩනැගිල්ලෙහි පිරිවැය ජල රැඳවුම් පොකුණුද ඇතුළත්ව රු.මිලියන 331.02 ක් ලෙස සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ අතර ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් තක්සේරු වටිනාකමින් අඩු කළ යුතු වුවත් ඉහත සඳහන් සම්පූර්ණ වටිනාකමම තක්සේරු වටිනාකමට එරෙහිව කපා හැර තිබුණි. ඒ අනුව රු.මිලියන 25.03	2023-1.5.3 2022-1.5.3 (අ)	ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් තක්සේරු වටිනාකමින් අඩු කළ යුතු බව	කෙරිගෙන යන වැඩ ගිණුමේ තිබූ ගොඩනැගිල්ලේ තක්සේරු වාර්තාවට අදාල වටිනාකම ඉවත්කල අතර, ජල රැඳවුම් පොකුණුද ඇතුළුව සම්පූර්ණ ගණුදෙනුව සිදුවූ පසු ඉතිරි වටිනාකම් ඉවත්කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම ව්‍යාපෘතියට අදාල සියලු වත්කම් පැවරීම් කටයුතු හා අදාළ ගැළපීම් මේ වන විටත් සිදු කර නොමැත.

	කින් සමාගමේ රඳවා ගත් ඉපැයුම් හා ජංගම නොවන වත්කම් ඌන ගණනය වී තිබුණි.				
(ආ)	2019 වර්ෂය අවසාන වන විට හිඟුරක්ගොඩ කර්මාන්තශාලාවේ හා අම්පාර කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු නවතා දමා තිබුණු අතර 2023 වර්ෂය අවසානයට කර්මාන්තශාලාවේ උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ඌන උපයෝජිතව තිබුණි. කර්මාන්තශාලාව බදු දීමට හෝ වෙනත් ව්‍යාපාරික කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලැසුම් කර ඇති බව සඳහන් වුවද 2023 වර්ෂය දක්වා ඒ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.	2023 – 3.1 (අ) 2022 -3.2 (අ)	සමාගම සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවය කින් හා ඵලදායීව භාවිතයට ගත යුතු බව.	හිඟුරක්ගොඩ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු සිදු කිරීමේදි විශාල අලාභයක්(මෙහෙයුම් අලාභයක්) සිදුවන බැවින් මෙම කර්මාන්තශාලාව වසාදැමීමට තීරණය කර ඇති අතර කර්මාන්තශාලාවේ උපකරණ ආරක්ෂාකිරීම සඳහා මුරකරුවෙකු පමණක් රඳවා ඇත. මෙහි ස්ථාපිත යන්ත්‍ර වෙනත් ස්ථානයක් තෝරාගත් පසු ඉවත්කිරීම සුදුසු බැවින් එම යන්ත්‍ර මෙම ස්ථානයේම තබා ඇත.	මේ වන විට කර්මාන්තශාලාව ල නිෂ්පාදන නවතා ඇත. ආයතන ස්ථානගත ඉඩම්වල අයිතිය සමාගම සතු නොවන බැවින් බදු දීමට නොහැකි වී ඇත. යන්ත්‍රෝපකරණ කුලියට ලබාගැනීමට එකඟතාවයට පැමිනි අය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අවගමනය හේතුවෙන් එම සැලසුම් අත්හිටුවා ඇත
(ඇ)	වසර 30 ක කාලයක සිට හිඟුරක්ගොඩ, ත්‍රිකුණාමලය හා අම්පාර යන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවා ඇති එකතුව හෙක්ටයාර 2.1979 ක් පමණ වන රජයට හා රජයේ වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල බදු අයිතිය හෝ හිමිකම ලබා ගැනීමට සමාගම හෝ	2023 - 3.1 (ආ)	ඉඩම්වල බදු අයිතිය හෝ හිමිකම ලබා ගැනීමට සමාගම හෝ මව් ආයතනය කටයුතු කළ යුතුය.	මෙම ඉඩමේ භුක්තිය වසර 30 කට වඩා වැඩි කාලයක් සමාගම විසින් දරන අතර සිමෙන්ති නිෂ්පාදන හැර වෙනත් කාර්යක් සඳහා ඉදිරියේදි යෙදවීමට සැලසුම්කර තිබේ.	ඉඩම්වල බදු අයිතිය මේ වන විටත් ලබාගෙන නොතිබුණි.

	මව් ආයතනය වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2023 වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.				
(ඇ)	**මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ව්‍යාපෘතිය**				
(i)	ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කිසිදු ව්‍යාපෘති ඇගයීමක් හෝ ශක්‍යතා අධ්‍යනයකින් තොරව සහ මූලික පිරිවැය ඇස්තමේන්තුවක්ද පිළියෙල කිරීමෙන් තොරව සමාගමේ මව් සංස්ථාවෙහි ව්‍යාපාර සැලසුම් හා සංවර්ධන අංශය මගින් ඉදිරිපත් කර තිබූ යෝජනාවකට අනුව මෙම ව්‍යාපෘතිය 2018 වසරේදි ආරම්භ කර ක්‍රියාත්මක කර තිබූ අතර ඒ වෙනුවෙන් මව් සංස්ථාව විසින් රු.මිලියන 200 ක ණය මුදලක් අවුරුදු 02 ක සහන කාලයක් යටතේ සියයට 12 ක පොලී අනුපාතයන් යටතේ වසර 10 ක් තුළදි නිරවුල් කිරීමට සමාගම වෙත ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාගම විසින් දැරූ මුළු පිරිවැය රු.මිලියන 382.50 ක් වී තිබූ අතර ව්‍යාපෘතිය පවත්වාගෙන යනු ලැබූ මව් සංස්ථාව සතු ඉඩම	2023 – 3.1 (ඇ) (i) 2022 - 3.2 (ඇ) 2021 - 1.7(ඉ)	ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නිසි කළමනාකාරීත්ව යකින් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු බව.	2018 වර්ෂයේ රජය විසින් ගංගාවැලි ගොඩදැමීම සීමාකිරිමට ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයත්, එවකට පැවති වැලි සඳහා ඉල්ලුමද සැලකිල්ලට ගෙන මුහුදු වැලි ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර, මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතව තිබුණත් සැලසුම් කර තිබූ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එලෙස සංස්ථාව සතු මෙම ඉඩම සමාගම වෙත පවරා ගැනීමට නොහැකි වී ඇත. මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම තුල සමාගම විශාල වශයෙන් පාඩු ලබන තත්වයකට පත්වන බැවින් මෙම ව්‍යාපෘතියේ ඇතැම්	මෙම ව්‍යාපෘතිය වර්තමානයේදි ක්‍රියාත්මක නොවන අතර ඒ වෙනුවෙන් මව් සංස්ථාව විසින් පරිපාලිත සමාගම වෙත ලබාදුන් රු.මිලියන 200 ණය මුදලෙන් රු141,233,022 ක් සංස්ථාවට ලැබිය යුතුව පැවතුණි. තවද මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් යොදාගත් ඉඩම හා ගොඩනැගිල්ල පුද්ගලික ආයතනයක් වෙත බදු ගිවිසුමක් රහිතව සහ අයකරගත යුතු වටිනාකම අයකර ගැනීමකින් තොරව පරිහරණය කිරීමට ලබාදී තිබුණි.

	සම්බන්ධයෙන් කිසිදු ගිවිසුමකට එළඹීමට සමාගම විසින් කටයුතු කරද නොතිබුණි. ව්‍යාපෘතිය අරඹා වසර 02 ක් පමණ කෙටි කාලයක් ගතවීමට මත්තෙන් එනම් 2020 වර්ෂයේදී මව් සංස්ථාව විසින් උක්ත ව්‍යාපෘතිය පවත්වාගෙන යාම පාඩු සහගත බව සඳහන් කරමින් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර තිබූ අතර පෞද්ගලික ආයතනයක් මගින් 2020 පෙබරවාරි 07 දින සිදුකර තිබූ ඉල්ලීමකට අනුව ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලද ඉඩම හා ගොඩනැගිල්ල වසර 50 කට දිගු කාලීන බදු පදනම මත ලබාදීමට තීරණය කර ගොඩනැගිල්ල 2021 ජුනි 14 දින එම සමාගමට ලබාදී තිබුණි.			කොටස් (මුහුදු වැලි සෝදා පිරිසිදු කිරීම හැර) නතරකර දැමීමට තීරණය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නා ලද ඉඩම සංස්ථාව සතු ඉඩමක් බැවින්, එහි ඉදිකල ගොඩනැගිල්ල සමඟ රජයේ වැඩි හිමිකාරීත්වයක් දරන සමාගමක් වෙත බදු පදනම මත ලබාදීමේ අපේක්ෂාවෙන් සංස්ථාව වෙත පවරාගන්නා ලදී.	
(ii)	විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වී චිනයෙන් ආනයනය කළ පෙර සැකසූ ව්‍යුහයකින් යුත් වානේ සැකිල්ල වෙනුවෙන් හා අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සමාගම විසින් දැරූ මුළු වියදම රු.මිලියන 211.93 ක් වූ අතර මෙම වානේ ගොඩනැගිලි සැකිල්ල මිලට	2023 – 3.1 (ඇ) (iii) 2022 -3.2 (ඇ) 2021- 3.3	නීතිමය ක්‍රියාමාර්ග අවසන් වූ පසු මෙයට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගතයුතු බව.	මෙම මිලදී ගැනීමේදී සිදු වූ බවට වාර්තා වී ඇති අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ මේ වන විටද විභාග වෙමින් පවතියි.	ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ විභාග වෙමින් පවතින අතර වගකිව යුතු පාර්ශවයන් මේ වන විටත් හඳුනාගෙන

	ගැනීමේදී සිදු වූ අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සමාගම විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ පැමිණිලි කර ඇති අතර එම පැමිණිලි 2023 වර්ෂය අවසාන වන විටත් විභාග වෙමින් පැවතුණි.				අලාභයක් අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඉ)	වැලි ඇසුරුම් කිරීම සඳහා රු.මිලියන 13.79 ක් වැයකර පොලිසැක් බෑග් 500,000 ක් චීනයෙන් ආනයනය කර තිබූ අතර එම වර්ගයේම බෑග් දේශීය සැපයුම්කරුවකුගෙන් රු.මිලියන 12.13 කට මිලදී ගත හැකි ව පැවති නමුත් ඉදිරිපත් කරන ලද සාම්පල්වල ආයතනයේ නම මුද්‍රණය කර නොමැති බව දක්වමින් එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද ආනයනය කර තිබූ බෑග්වලද ආයතනයේ නම මුද්‍රණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් රු.මිලියන 1.67 ක අලාභයක් සමාගමට දැරීමට සිදුවී තිබුණු නමුත් ඒ පිළිබඳ වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මිලදී	2023 - 2022- 2.2.4 (ඇ) 2021 – 3.5 (ආ)	වෙළඳපල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර ඒ අනුව මිලදී ගැනීම් සිදු කළ යුතු අතර පිරිවැය අවම වන අයුරින් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවධානය යොමු කළයුතු බව හා අනාර්ථික තීරණගත් පාර්ශවයන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගතයුතු බව.	මෙම බෑග් පරිසර හිතකාමී ලෙස නිෂ්පාදනය කර ඇති බැවින්, ඒවායේ කල් පැවැත්ම ඉතා කෙටි කාලීන වේ. මෙම බෑග් තොගය ඉක්මනින් දිරාපත්වන බැවින්, කඩිනමින් විකිණීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අදාල අංශයේ සහභාගිත්වයෙන් සැපයුම්කරුවන් තුන්දෙනෙකුගෙන් මිල ගණන් ලබාගෙන සාමාන්‍යාධිකාරීගේ අනුමැතියට යටත්ව සිදුකර තිබූ බවට අදාල පාර්ශවයන් විසින් කරුණු දක්වා තිබේ.	මේ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ගන්නා ලද පොලිසැක් බෑග්වලින් වැලි ඇසුරුම් කිරීම සඳහා බෑග් 5,355 ක් පමණක් භාවිතා කර තිබුණු අතර තවත් බෑග් 54,000 ක් මුදල් අයකර ගැනීමකින් තොරව මව් සංස්ථාව වෙත ලබාදී තිබුණි. බෑග් 1645 ක් අපතය ලෙසද බෑග් 2595 ක් වෙනත් කාර්යයන් සඳහාද භාවිතා කර තිබුණු අතර ඉතිරි බෑග් 436,405 ක් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද රහිතව සාමාන්‍යාධිකාරිගේ අනුමැතිය මත රු.මිලියන 5.88 කට 2023 වර්ෂයේදී විකුණා දමා තිබූ අතර මේ අනුව වැලි ඇසුරුම් බෑග් මිලදී ගැනීමේ ගණුදෙනුවෙන් රු.මිලියන 8.14 කට අධික අලාභයක් සමාගමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.				
(ඊ)	සමාගම විසින් මුහුදු වැලි සේදීමේ ව්‍යාපෘතිය සඳහා මිලට ගත් රු. මිලියන 7.55 ක් වටිනා ජල පිරිපහදු යන්ත්‍රය හා වැලි සේදීම සඳහා අවශ්‍ය පිරිසිදු ජලය රැඳවීම සඳහා රු.මිලියන 29.74 ක් වැය කර ඉදිකර තිබූ ජල රැඳවුම් පොකුණුද 2023 වර්ෂය අවසාන වන විට ඌන	2023 – 3.2 2022 - 1.5.2 (ඉ)	සමාගම සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීව භාවිතයට ගත යුතු බව.	ජල පිරිපහදු යන්ත්‍රය මවු ආයතනය වෙත භාරදී ඇති අතර ඉදිකර තිබූ ජල රැඳවුම් පොකුණු මේ වන විට ද වැලි සේදීම සඳහා භාවිතා කරනු ලබයි	සියළු වත්කම් මේ වන විට නිෂ්කාර්යව පවතී

	උපයෝජිතව පැවති අතර මුහුදු වැලි ඇසුරුම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මිලදිගෙන තිබූ රු.මිලියන 17.81 ක් වටිනා මුහුදු වැලි ඇසුරුම් කිරීමේ යන්ත්‍රය 2024 මැයි වන විටත් නිශ්කාර්යව පවතින බව විගණනයට නිරීක්ෂණය විය.				
(උ)	සමාගම විසින් හොරණ සති පොළ ඉදිකිරීමේ කාර්යය සඳහා 2014 වර්ෂයේදී උප කොන්ත්‍රාත්කරුට ලබා දුන් රු. මිලියන 4.65 ක සවලීය අත්තිකාරම් මුදලින් 2015 සැප්තැම්බර් මස වන විට රු. මිලියන 2.65 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර 2023 වර්ෂය අවසාන වන විටත් ඉතිරි රු. මිලියන 2 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 අනුව අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව උප කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් ලබාදීම හේතුවෙන් සමාගමට අයනොවී පවතින අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2023 -3.3 (අ) 2022 – 3.3 (අ) 2021 – 3.6 (ඇ)	උප කොන්ත්‍රාත්කරු ගෙන් අත්තිකාරම් මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු බව.	උප කොන්ත්‍රාත් කරුට ලිපි මගින් දන්වා ඇති අතර ඔවුන් සඳහා ගෙවීමට ඇති මුදල් අත්හිටුවා ඇත. තවද සමාගමට මුදල් අයකරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	මේ වන විටත් අත්තිකාරම් මුදල් නිරවුල් වී නොතිබුණි.

(ඌ)	නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2018 මැයි 15 නිමකිරීමට ගිවිසුම්ගතව සමාගමට ලබා දී තිබූ හා කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 9.72 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලයට අයත් ඉඩමක් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ කාර්යයන් 2019 වර්ෂයේ සිට අතරමඟ නතර කර දමා තිබූ අතර අංක 14/01/134/73 හා 2018 අගෝස්තු 21 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ ලිපියකින් එම කොන්ත්‍රාත්තුවේ එදිනට සිදු කර ඇති මූලික මට්ටමේ වැඩ කොටස ද ප්‍රමිතියෙන් තොර හා නිසියාකාරව සිදු කර නොමැති බව දන්වා තිබුණි. මේ හේතුවෙන් සමාගම විසින් 2018 දෙසැම්බර් 10 දින සේවාදායකට යොමු කර තිබූ රු.මිලියන 5.75 ක පළමු ප්‍රගති බිල්පත ද (Progress Claim) සේවාදායක විසින් 2023 වර්ෂය අවසාන වන විටත් සහතික කර නොතිබුණි.	2023 -3.3 (ආ) 2022 – 3.3 (ආ) 2021 – 3.6 (ඇ)	ප්‍රමිතියෙන් තොර හා නිසියාකාරව සිදු කර නොමැති වැඩ කොටස් සඳහා හේතු සොයාබලා ඊට අදාලව දරන ලද වියදම් අයකර ගතයුතු බව.	ලංකා විදුලිබල මණ්ඩලයට අයත් 2018 මැයි 15 දින කොන්ත්‍රාත් ගත වූ ව්‍යාපෘතිය පිළිබඳව හා නාගරික සංවර්ධන අධිකාරියේ විසින් ව්‍යාපෘති කටයුතු පිළිබඳ අවැසි කරුණු ලබා ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට ලිපි රාශියක් යොමු කලද, කිසිදු ප්‍රතිචාරයක් නොලැබීම මත, ව්‍යාපෘතිය අත්හිටුවීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය දැනුම් දුන් අතර, නාගරික සංවර්ධන අධිකාරියට යොමුකර අදාල පළමු බිල්පත අයකරගැනීමට කටයුතු කරනු ලැබේ.	නැවත 2024 සැප්තැම්බර් මස බිල් පත්‍රයක් යොමු කර තිබුණද මුදල් මේ වන විටත් ලැබී නොතිබුණි.
(එ)	සමාගම වෙත මව් සංස්ථාව වෙතින් ලද රු.මිලියන 20.29 ක වටිනාකමකින් යුත් උප කොන්ත්‍රාත් කාර්යයක්	2023 – 3.3 (ඇ) 2022 – 3.3 (ඇ)	අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු බව.	ව්‍යාපෘතිය 2016 වර්ෂයට අදාලව ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් බැවින් මේ සම්බන්ධව	මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තු වට දැනුම් දී

	ලෙස ලැබුණු උඩුකිරිඇල්ල වැව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සවලීයකරණ අත්තිකාරමක් මව් සංස්ථාව වෙතින් ලබා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණු අතර එම කොන්ත්‍රාත් කාර්යය නිම කිරීමට රු.මිලියන 6.90 ක් සමාගම වැය කර තිබුණද කිසිදු මුදලක් 2023 වසර අවසාන වන විටත් අය වී නොතිබුණි.			අධ්‍යනය කර, මව් සමාගම සමග සාකච්ඡාකර කඩිනමින් අදාල මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී	අදාල ලිපි සෙවීමට කටයුතු කරමින් පැවතියද කිසිදු මුදලක් ලැබී නොතිබුණි.
(ඒ)	සමාගම විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2016 ජුනි 7 දින රු.මිලියන 6.98 ක වටිනාකමකින් යුත් ෆර්ගසන් මාර්ගයේ යෝජිත ප්‍රජා ශාලාව ඉදිකිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබු අතර එයට අදාළ සවලීයකරණ අත්තිකාරම් වටිනාකම රු.මිලියන 1.39 ක් වුවත් සමාගම වෙත ලැබී තිබුණේ රු.මිලියන 1.04 පමණි. එමෙන්ම උක්ත කොන්ත්‍රාත් කාර්යය උප කොන්ත්‍රාත්කරුවකු වෙත රු. මිලියන 6.10 ක වටිනාකමට ලබා දී තිබු අතර එම කාර්යය 2023 වර්ෂය අවසාන වන විටත් අවසන් නොකර පැවතුණි. සමාගම විසින් 2018 දෙසැම්බර් 18 දින	2023- 3.3 (ඇ)	කළ වැඩ වටිනාකමට අදාළව ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතු බව	මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර සේවාදායක ආයතනය වෙත එය භාරගන්නා ලෙස අවස්ථා කිහිපයකදී දැනුම් දුන්නත්, සේවාදායක ආයතනය එය භාරගැනීමට කටයුතු නොකරන ලදී. ඉදිරියේදී සේවාදායක ආයතනය සමඟ සාකච්ඡා කර තීරණයක් ගනු ලැබේ.	බිල්පත් වටිනාකම මේ වන විටත් අයවී නොතිබුණි.

	ඉදිරිපත් කළ රු.මිලියන 2.43 ක් වටිනා බිල්පත් 2023 වර්ෂය අවසාන වන විටත් සහතික නොවී පවතින අතර මෙම කොන්ත්‍රාත් කාර්යය වෙනුවෙන් උප කොන්ත්‍රාත්කරුට ගෙවූ රු. මිලියන 1.10 ක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.				
(ඔ)	2023 වර්ෂය අවසානයට වූ මුල්‍ය ප්‍රකාශනවලට අනුව පිළිවෙලින් රු.මිලියන 27.43 ක් හා රු.මිලියන 71.30 ක් වූ වෙළඳ ණයගැති ශේෂයන්ගෙන් හා කොන්ත්‍රාත් ණයගැති ශේෂයන්ගෙන් රු.මිලියන 15.41 ක් හා රු.මිලියන 35.25 ක් සමාගමෙහි මව් සමාගම වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලැබිය යුතුව තිබුණි. තවද ඉන් වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු ශේෂයන්ගෙන් වසර 1 ත් 4 ත් අතර රු.මිලියන 5.86 ක් ද වසර 4 ට වඩා වැඩි ශේෂය රු. මිලියන 7.34 ක් ද මව් සංස්ථාව වෙතින් අයකර ගත යුතුව පැවතුණු අතර ඉතිරි වෙළඳ ණය ගැතියන්ගෙන් සමාගමට අයවිය යුතු මුදල ලෙස ගිණුම්වල දැක්වුණු රු.මිලියන 12.02 ක	2023 – 1.7 (අ) 2022 – 1.7 (ඇ)	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු කඩිනමින් නිරවුල් කරගැනීමට කටයුතුකළ යුතුය.	වෙළඳ ණයගැති ශේෂයන්ගෙන් හා කොන්ත්‍රාත් ණයගැති ශේෂයන්ගෙන් රු.මිලියන 15.41 ක් හා රු.මිලියන 35.25 ක් සමාගමෙහි මව් සමාගම වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලැබිය යුතුව ඇති අතර 2024 වර්ෂයෙදි වෙළඳ ණය ගැතියන්ගෙන් රු.මිලියන 9.98 ක් අය කරගෙන ඇති අතර කොන්ත්‍රාත් ණයගැතියන්ගෙන් රු. මිලියන 34.9 අයකරගෙන ඇත.	සමාගම වෙත අයවිය යුතු සියළු මුදල් මේ වන විටත් අයකර ගෙන නොතිබුණි.

	මුදලින් රු.මිලියන 9.92 ක් වර්ෂ 4 කට වඩා වැඩි කාලයක සිටද අය නොවී පැවතුණි.				
(ඕ)	සමාගමෙහි 2023,2022 සහ 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් ණය ස්කන්ධ අනුපාතය පිළිවෙලින් (25.46),(15.77),සහ (26.60) ක් වූ අතර මෙම සෘණ ණය ස්කන්ධ අනුපාතය පෙන්නුම් කරනුයේ සමාගමේ වගකීම් එහි වත්කම් ඉක්මවා යාම වන අතර මෙය ඉහළ අවධානම් තත්ත්වයක් සඳහා සාක්ෂි සපයනු ලබන අතර සමාගම අනාගතයේදී බුන්වත්භාවයට එළඹීමට ඇති හැකියාවද පෙන්නුම් කරයි. මෙය සමාගමේ දිගු කාලීන ණය ප්‍රාග්ධන අනුපාතය 2023, 2022 සහ 2021 වර්ෂයන්හිදී පිළිවෙලින් 1.10, 1.12 සහ 1.11 ක් ලෙස පැවතීම මෙම තත්ත්වයට තවදුරටත් සාක්ෂි සපයනු ලබයි.	2023 – 2.3 (අ), (ආ) 2022 - 2.3 (අ), (ආ) 2021 – 2.2 (iv)			
(ක)	2014 ඔක්තෝබර් 10 දිනැති අංක 2014/89/554 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව රු.මිලියන 4.56 ක ලාභාංශයක් ප්‍රකාශයට පත්කර තිබුණද 2023 වර්ෂය අවසාන වන විට	2023 – 3.1 (ඈ) 2022 - 3.1 (උ) 2021 – 3.2 (අ)	සමාගම අදාළ බැඳියාවන්ගෙන් නිදහස් වීමට කඩිනම් පියවර ගත යුතුය.	මූල්‍ය තත්වය යහපත් වූ විගස මෙම ගෙවීම් සිදු කරනු ඇත.	මේ වන විටත් ලාභාංශ ගෙවා නොතිබුණි.

	වර්ෂ 09 ක් ඉක්මවා ගොස් ඇතත් කිසිදු ලාභාංශයක් ගෙවීමට සමාගම අපොහොසත් වී තිබුණි.				
(ග)	සමාගම යටතේ ක්‍රියාත්මක කර්මාන්තශාලා 8 න් කර්මාන්තශාලා 7 ක හා වැඩ පළෙහි සමස්ත මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 13 ක අලාභයක් වී තිබුණි. සමාගමේ පිරිවැය කළමණාකරණ දුර්වලතා හා අලෙවිකරණ උපක්‍රම භාවිතා නොකිරීම මේ සඳහා සෘජුව බලපා තිබුණි. සමාගම විසින් 2021 වර්ෂය සඳහා අලෙවිකරණ සැලැස්මක් සකස් කර තිබුණද ඒ අනුව අලෙවිය ඉහළ නැංවීමට හා වෙළඳපළ වර්ධනය කර ගැනීමට අපොහොසත්ව තිබුණි. විස්තර පහත පරිදි වේ.	2021 – 3.1	ක්ෂේත්‍රයේ පවත්නා තරඟකාරී පිරිවැය හා වෙළඳපොළ උපක්‍රම භාවිතා කරමින් රැඳී සිටීමට හා සංවර්ධනය කිරීමට පියවර ගත යුතු බව	රජයේ චක්‍රලේඛ හා ප්‍රසම්පාදන ක්‍රියාවලින්ද රජය විසින් පනවන ලබන බදු නිසාද අපගේ නිෂ්පාදනයන්හි පිරිවැය අධිකවිම මත ගෘහස්ත කර්මාන්තකරුවන් සමග තරග කිරීමට ඉතාමත් අපහසු වී ඇත.	කර්මාන්තශාලා 06 න් 04 ක් තවමත් අලාභ ලබමින් පවතී

3.44 සී/ස එල්ආර්ඩීසි සේවා (පෞද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,230,511,322	837,078,181	393,433,142	54,984,909	තත්ත්වාගණනය කළ
2022	1,656,652,603	1,201,302,915	455,349,688	81,482,328	තත්ත්වාගණනය කළ
2023	2,093,128,024	1,550,137,758	542,990,266	123,979,053	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2019 වර්ෂයට අදාලව මුදල් පදනම මත එකතු කළ අගය මත බදු වටිනාකම රු. මිලියන 110.91 ක් 2023 වර්ෂය අවසාන වන විට ද ගෙවිය යුතුව පැවතුණි. සමාගමේ කාරක ප්‍රාග්ධනය වෙනුවෙන් එම බදු මුදල් යොදාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.	2023- 1.9 2022 -1.8 (ඇ) 2021- 1.6.2	ගෙවිය යුතු වැට් බදු එළඹෙන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු බව.	2023 වර්ෂයේදි රු.මිලියන 40 ක් ගෙවීමට සැලසුම් කර ඇත.	එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමේ සැලැස්ම සමඟ හිඟ බදු මුදල් සඳහා වන අධිභාරයෙන් ආයතනය නිදහස් කරන ලෙස ඉල්ලීම් 2024 අගෝස්තු 02 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත.
(ආ)	සමාගම සිය ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිඩියේ පිහිටි පර්චස් 120 ක ඉඩමක් ප්‍රධාන මව් සමාගමෙන් වර්ෂ 30 කට දිගු කාලීන බදු පදනම මත රු. මිලියන 19.91 කට 2018 වර්ෂයේදි ලබා	2023 – 3.1 (අ) 2022 - 3.1 (අ) 2021- 3.1 (අ)	අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව.	මෙම ඉඩම නැවත ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පවරා දීමට නියමිත අතර ඒ මත ආයතනය වෙත ආපසු ගෙවන ලබන මුල්‍යමය අගය සම්බන්ධයෙන් මේ වනවිට මව් සමාගම	මෙම ඉඩම නැවත ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත පවරා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරනය ගෙන ඇති අතර ඒ අනුව 2024

				සමඟ සාකච්ඡා කර තීරණයක් ගනු ලැබේ.	සැප්තැම්බර් 27 දිනෙන් බදු ගිවිසුම අවසන් කොට ආයතනය එම ඉඩම භාවිතා කරනු ලැබූ කාල සීමාව සඳහා රු.මිලියන 3.3ක් අය කර ඉතිරිය වන රු.මිලියන 13.2ක මුදල සී/ස එල්ආර්ඩීසී සේවා (පෞද්ගලික) සමාගම වෙත ලබා දීමට නියමිතව ඇත.
	ගෙන තිබූ අතර 2024 ජූනි වන විට බදු කාලයෙන් වසර 06 ක් ගතවී තිබුනද කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි. එම ඉඩම වටා රු. මිලියන 5.87 ක පිරිවැයක් දරා අඩි 700 ක් පමණ දිගකින් යුත් තාප්පයක් 2019 වර්ෂයේදි ඉදිකර තිබූ අතර මව් සමාගමට අයත් කොටසක්ද ඇතුළත් කරමින් එම තාප්පය සමාගම විසින් ඉදිකර තිබුණු අතර ඊට අමතරව එම ඉඩමේ ආරක්ෂාව, විදුලිය හා ජලය සඳහා 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසාන වන විට රු. මිලියන 2.72 ක් වැය කර තිබුණි. ඉඩම මැදින් 33KVA අධි බලැති විදුලි රැහැන් ඇද ඇති බැවින් ඉදි කිරීම් සඳහා මෙම ඉඩම තෝරා ගැනීම විගණනයේදි ප්‍රශ්නකාරී විය. එමෙන්ම අනාගතයේදි මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් අනාර්ථික වියදමක් විය හැකි බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.				
(ඇ)	අලෙවිය සඳහා සමාගම විසින් 2018 වර්ෂයේදි ඩොලර් 49,537.90 කට (රු.මිලියන 8.73) මිලදිගෙන තිබූ CCTV උපකරණ 1,669 කින්	2023 – 3.1 (ඉ) 2022 -3.2 (ඇ) 2021- 3.2 (ඉ)	වෙළඳපල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර මිලදී	ආරක්ෂක සේවාව සපයන ප්‍රමුඛතම ආයතනයක් ලෙස 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරුදින ක්‍රිස්තියානි පල්ලි හා	මිලදී ගැනීමට අදාළව අනුගමනය කරනු ලැබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා

	2023 වර්ෂය තුළ උපකරණ 248 ක් පමණක් අලෙවි කර තිබූ අතර රු.මිලියන 2.4 ක් වටිනා ඒකක 587 ක් 2023 වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි. මේ හේතුවෙන් සමාගමෙහි මුදල් අනවශ්‍ය ලෙස තොගයෙහි ඇතුළත්ව පැවතුණි. භාණ්ඩ අලෙවි කිරීමට නොහැකි වීම හේතුවෙන් හා ඒවා තාක්ෂණික යල්පැනීම හේතුවෙන් 2021 වර්ෂයේදී රු. මිලියන 3.19 ක තොග කපා හැරීමක්ද සිදුකර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවන මිලදී ගැනීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.		ගැනීම් සිදු කළ යුතුය.	හෝටල් වලට එල්ල කල බෝම්බ ප්‍රහාරය නිසා රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ හදිසි තත්වයන් මත නිවැරදිව පුරෝකථනය කල නොහැකි තත්වයක් තුළ ආයතනය විසින් මෙහි සඳහන් ආරක්ෂක උපකරණ ආනයනය කිරීමට සිදුවී තිබුණි.	සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණයක් සිදු කර 2020 නොවැම්බර් 26 දින වාර්තා කර තිබේ. එම වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත 2021 මාර්තු 17 දින පැමිණිලි කිරීමට කටයුතු කර ඇත.
(ඇ)	වෙළඳපලෙහි අවශ්‍යතාවය පිළිබඳව නිවැරදිව පුරෝකථනය නොකොට 2018 වර්ෂයේදී රු.මිලියන 2.34 කට ආනයනය කර තිබූ Hand Held Metal Detectors with Chargers ඒකක 1000 කින් ඒකක 506 ක් හා රු. මිලියන 10.77 ක් වැය කොට ආනයනය කරන ලද අයිතම 8 කට අදාළ ඒකක 731 ක ආරක්ෂක උපකරණ	2023 – 3.1 (ඊ) 2022 – 3.2 (ඇ) 2021- 3.2 (ඉ)	වෙළඳපල අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදනය සිදුකර මිලදී ගැනීම් සිදු කළ යුතුය.	ආරක්ෂක සේවාව සපයන ප්‍රමුඛතම ආයතනයක් ලෙස 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරුදින ක්‍රිස්තියානි පල්ලි හා හෝටල් වලට එල්ල කල බෝම්බ ප්‍රහාරය නිසා රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ හදිසි තත්වයන් මත නිවැරදිව පුරෝකථනය කල නොහැකි තත්වයක් තුළ ආයතනය විසින්	මිලදී ගැනීමට අදාළව අනුගමනය කරනු ලැබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති දුර්වලතා සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂණයක් සිදු කර 2020 නොවැම්බර් 26 දින වාර්තා කර තිබේ.

	2023 වර්ෂයේදීද අලෙවි කිරීමට නොහැකිව පැවතුණි. මෙම උපකරණවල වගකීම් කාලය මේ වන විට ඉකුත් වී තිබූ අතර අලෙවියෙන් පසු සේවා සඳහා දේශීය නියෝජිතයෙකු පත්කර ද නොතිබුණි. භාණ්ඩ අලෙවි කිරීමට නොහැකි වීම හේතුවෙන් හා තාක්ෂණික යල් පැනීම් හේතුවෙන් 2021 වර්ෂයේදී එම උපකරණවලින් රු. මිලියන 5.18 ක තොග කපාහැරීමක් සිදු කර තිබුණි. තවද මෙම ගණුදෙනුව සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක්ද 2021 වර්ෂයේ සිට සිදුවෙමින් පවතින නමුත් සමාගම විසින් මේ දක්වා එම ගණුදෙනු සම්බන්ධ කිසිදු පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.		මෙහි සඳහන් ආරක්ෂක උපකරණ ආනයනය කිරීමට සිදුවී ඇත.	එම වාර්තාව පදනම් කරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත 2021 මාර්තු 17 දින පැමිණිලි කිරීමට කටයුතු කර ඇත.
(ඉ)	2023 වර්ෂය අවසානයට සමාගමේ වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 1,557.36 ක් වූ අතර ඉන් රු. මිලියන 62.89 ක් වර්ෂ 1ත් 2ත් අතර පැවැති අතර වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවති වටිනාකම රු.මිලියන 110.18 ක් විය. එමෙන්ම වර්ෂ 5 ට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවති	2023 – 1.6.1 (අ) 2022 - 1.6.1 (අ) 2021 - 1.6.1 (අ)	ණයගැති ශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළයුතු වේ.	මෙම නිරීක්ෂණ හා එකඟ වේ. වර්තමානයේ ණය එකතු කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි දැඩි අවධානයක් යොමු කොට එය මනා ලෙස කළමණාකරණය කිරීම හේතුවෙන් මෙම ණයගැති ශේෂය රු.මිලියන 1557 සිට රු.මිලියන 1150	මේ වන විටත් අයකර ගත යුතු සම්පූර්ණ ණය ගැනි ශේෂයන් අයකර ගෙන නොතිබුණි.

	වටිනාකම රු.මිලියන 25.33 ක් විය. මෙම ණය ගැනි ශේෂයන්ගෙන් රු.මිලියන 1,251.6 ක් ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වූ අතර එම ශේෂයන් ගෙන් සියයට 53 කට අධික ප්‍රමාණයක් එනම් රු. මිලියන 669.63 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ වූ අතර සියයට 14 ක් එනම් රු. මිලියන 171.78 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂ විය. මෙම ණය ගැනි ශේෂයන්ගෙන් රු.මිලියන 302.54 ක් මිනිස් බල සැපයීම වෙනුවෙන් ආයතන 04 කින් අයකර ගත යුතුව පැවතුණි.			දක්වා අඩු වී ඇත.	
(ඊ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත 15 වන ඡේදය ප්‍රකාරව විගණනය කරන ලද රජයේ මූල්‍ය ප්‍රකාශන සහ ඒ සම්බන්ධ විගණකාධිපතිවරයාගේ මතයද සහිතව වාර්ෂික වාර්තාව, පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාගම විසින් 2018 වර්ෂයේ සිට විගණිත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා	2023 – 1.7 (ආ) 2022 - 1.8 (ඊ) 2021 – 4.2	විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් කරුණු සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමේ ක්‍රියාවලියක් ගනු ඇත.	මේ වන විටත් විගණිත මූල්‍ය ප්‍රකාශ හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

	පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.				
(උ)	සමාගමේ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්ති අංක 2.4.1 අනුව විශ්වාසවන්තව මිනුම් කළ හැකි තහවුරු කර ගත් සාක්ෂි මත ඉන්වොයිසි පිළියෙල නොකිරීම හේතුවෙන් සේවාලාභී ආයතන ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමෙන් ඉන්වොයිස් කරන ලද 2023, 2022 හා 2021 වර්ෂයන්හිදි පිළිවෙලින් රු.මිලියන 59.07 , රු.මිලියන 32.94, රු.මිලියන 23.30 ක ආදායමක් අහිමි වී තිබුණි. මෙය නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා කටයුතු කරන බව ඉකුත් වර්ෂයේදි සමාගම විසින් විගණනයට පිළිතුරු ලබාදී තිබු නමුත් එසේ කටයුතු කර නොතිබුණි.	2023 – 3.1 (ඇ) 2022 – 1.5.3 2021 – 1.5.2	විශ්වාසවන්තව මිනුම් කළ හැකි තහවුරු කර ගත් සාක්ෂි මත ඉන්වොයිසි පිළියෙල කළ යුතුය.	පාලනමය ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම තුළින් ඉදිරියේදී මෙම තත්ත්වය සතුටුදායක මට්ටමකට පත් කිරීමට සියලු උත්සාහයන් ගනු ඇත.	මෙය නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඌ)	වෙළඳපල අවශ්‍යතාවය නිවැරදිව ඇගයීමකින් තොරව සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද බෝට්ටු සේවය සඳහා 2023,2022 හා 2021 වර්ෂයන්වලට අදාළ ආදායම පිළිවෙලින් රු. මිලියන 7.81, රු.මිලියන 4.32ක් හා	2023 - 3.2 2022 – 3.2 2021 – 3.2	වෙළඳපළ අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගැනීම සහ පිරිවැය අවම වන අයුරින් ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවධානය යොමු කළයුතු වේ.	බෝට්ටු සේවයේ මූල්‍යමය අලාභය ඉදිරියේදි අවම කිරීම සඳහා ආයතනය විනෝද බෝට්ටු සවාරි සඳහා අය කරනු ලබන මිල ගණන් සංශෝධනය කිරීම හා සේවා කාර්යය අඩු කිරීම	බෝට්ටු සේවය මේ වන විටත් අලාභ ලබමින් පවතී

රු.මිලියන 2.51 ක් වුවද බෝට්ටු සේවය පවත්වාගෙන යාම සඳහා වර්ෂය තුළ දරන ලද තත්‍ය පිරිවැය පිළිවෙලින් රු. මිලියන 14.23, රු.මිලියන 10.77 හා රු.මිලියන 7.75 ක් වුයෙන් බෝට්ටු සේවය පවත්වාගෙන යාමෙන් එම වර්ෂ 03 තුළදි රු.මිලියන 18.1 ක අලාභයක් සිදුව තිබුණි.

සිදුකරනු ලැබේ.

3.45 ලංකා මිනරල් සෑන්ඩ් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,845,829,450	1,679,080,522	4,166,748,926	1,386,986,318	තත්ත්වාගණනය කළ
2022	11,063,871,281	3,701,320,009	7,362,551,271	6,160,425,036	තත්ත්වාගණනය කළ
2023	9,902,118,691	891,053,163	9,011,065,528	4,050,724,331	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරි කර ගැනීම සඳහා රු.62,370,234 ක් වටිනා ඩ්‍රයර් යන්ත්‍රයක් 2016 ජූනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.1,164,350 ක ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.43,838,767 ක් ගෙවා තිබුණු අතර එය එදින සිට 2021 දෙසැම්බර් 31 දින වන විටත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් යටතේ පෙන්වා තිබුණි. මෙය මිලදී ගෙන වසර 06 ක් ගතවුවද, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට මෙම වාර්තාවේ දින වන විටත් සමාගමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්	2021	යන්ත්‍රය නිෂ්පාදන කටයුතු වලට යොදා ගැනීමට කටයුතු කළ යුතු අතර මේ සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	හඳුනාගෙන ඔවුනට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.				
(ආ)	සමාගම සතු කැණීම් බලපත්‍ර ඌන උපයෝජිතව පැවතීම හා පවතින කැණීම් බලපත්‍රවල ධාරිතාවය ඉදිරි වර්ෂ 20 ක මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් නොවන බව සාධාරණීකරණය කර, ඉදිරි වර්ෂ 20 සඳහා කැණීම් සැලැස්මක් ඉදිරිපත් නොකිරීම මත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සමාගම විසින් ඉල්ලුම් කළ නව ගවේෂණ බලපත්‍ර 07 ක් සඳහා වූ අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශයක් බැවින් කෝකිලායි කලපුවේ නයාරු-වෙම්මලෙයි ප්‍රදේශය සඳහා ලබාගත් අංක EL/406 දරන ගවේෂණ බලපත්‍රය මත ගවේෂණ කටයුතු අවසන් කර කැණීම් බලපත්‍රයක් ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර එම ගවේෂණ බලපත්‍රය 2022 දෙසැම්බර් 31 දින අවලංගු වී තිබුණි. මේ හේතු මත විගණිත දින වූ 2023 මැයි 31 දින වන	2022	කැණීම් සැලැස්මක් සකස් කර කඩිනමින් ගවේෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	කැණීම් සැලැස්මක් ඉදිරිපත් නොකිරීම නිසා කැණීම් බලපත්‍ර ඌන උපයෝජිතව පැවතුණි.

	විට සමාගම සතුව කිසිදු වළංගු ගවේෂණ බලපත්‍රයක් නොතිබුණි.				
(ඇ)	පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ පැවති රු.53,695,105 ක් වූ වීල් ලෝඩර් හතරක් හා රු.800,000 ක් වටිනා ලොරි රථයක් වසර 5 කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව තබා තිබුණි.	2023	නිශ්කාර්යව පවතින වත්කම් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ක්‍රියාකාරී ලෙස යොදා ගෙන නොතිබුණි.
(ඇ)	පොඩුවාකට්ටු ප්‍රදේශයේ හෙක්ටයාර 0.5041 ක ඉඩමක ඛනිජ වැලි කැණීම් කිරීම සඳහා ලබාගත් බලපත්‍ර කිසිදු කැණීම් කටයුත්තක් සිදුකර හෝ බලපත්‍රය අලුත් කර හෝ නොතිබූ බැවින් අවළංගු වී තිබුණු අතර ඒ සඳහා වැයකළ රු.1,284,500 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2023	බලපත්‍ර විධිමත් පරිදි උපයෝජනය කර කැණීම් සිදුකළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	කැණීම් කටයුතු සිදු කිරීමට හෝ බලපත්‍රය අලුත් කිරීමට ක්‍රියා කර නොතිබුණි.
(ඉ)	සමාගම සතුව වීල් ලෝඩර් යන්ත්‍ර 13 ක් පැවතුණද සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර 7 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර ඉතිරි යන්ත්‍ර අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. සේවයේ යෙදවූ යන්ත්‍ර 06 ද වර්ෂය තුළ පැය 17,343 ක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර සමාගම වීල් ලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරුවන් 21	2023	පවතින වීල් ලෝඩර් යන්ත්‍ර අවශ්‍ය පරිදි අලුත්වැඩියා කර උපරිම ධාරිතාවයෙන් භාවිතා කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	සමාගම සතුව වීල් ලෝඩර් යන්ත්‍ර උපරීම ලෙස ක්‍රියා කිරීමට හා ඇස්තමේන්තුගත රේටයන්ට පමණක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

	දෙනෙකු සේවයේ යොදවා 2023 වර්ෂය තුළ රු.20,368,840 ක වැටුප්, දීමනා හා අතිකාල ලෙස ගෙවා තිබුණි. උපරිම ධාරිතාවයෙන් වීල් ලෝඩර් යන්ත්‍ර 7 ම සේවයේ යොදවා තිබියදී රු.12,400 ක පැයක රේටයකට කුලී පදනමට ගත් ලෝඩර් යන්ත්‍රයක් ද සේවයේ යොදවාගෙන තිබුණි. එම කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී පැයකට රු.9,500 ක් ඇස්තමේන්තු කර තිබියදී ඇස්තමේන්තුගත රේටයට වඩා රු.2,900 ක් වැඩි මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2023 නොවැම්බර් 17 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කුලී පදනමට ගත් වීල් ලෝඩරය පැය 817.9 ක් සේවයේ යොදවා රු.7,161,204 ක් ලෝඩර් යන්ත්‍ර සැපයුම්කරුට ගෙවා තිබුණි.				
(ඊ)	අනෙකුත් ජංගම වත්කම් ලෙස දක්වා තිබූ 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු රු.102,010,243 ක එකතු කළ අගය මත බදු වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	ලැබිය යුතු බදු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.	බදු බැදියාව කර නොතිබුණි.	බදු බැදියාව නිරවුල් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී සමාගමේ විද්‍යාගාරය තුළ සිදුකරන ලද නියැදි පරීක්ෂණ ප්‍රතිඵලයට අනුව දළ වැලි තුළ අන්තර්ගත ඛනිජ වැලි ප්‍රතිශතය සියයට 39 කට අඩු අගයක තිබූ අතර “Block A” යන්ත්‍රාගාරය මගින් Tailings (සුදු වැලි) වශයෙන් සියයට 42 සිට 57 දක්වා ප්‍රමාණයක් ඉවත් කර තිබූ බව නිරීක්ෂණය විය.	2023	නව කැනිම් භූමි හඳුනාගත යුතුය.	ක්‍රියා මාර්ග නොතිබුණි	ගෙන නියමිත ප්‍රමිතයෙන් යුතු ඛනිජ වැලි හඳුනා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය.

3.46 ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	317,820,000	255,790,000	62,030,000	(37,970,000)	තත්ත්වාගණනය නොකළ
2023	351,190,000	235,910,000	115,280,000	(46,750,000)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය යටතේ ක්‍රියාත්මක වන නව සමාගමක් ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම සමාගම විසින් 2022 දෙසැම්බර් 16 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණි. එම අයදුම්පත 2022 දෙසැම්බර් 20 වැනි දින ආයෝජන මණ්ඩලය (BOI) විසින් පිළිගෙන තිබුණු අතර BOI වෙත 2023 දෙසැම්බර් 31 දිනට ගෙවා ඇති මුළු ලියාපදිංචි ගාස්තුව රු.මිලියන 1.2 ක් විය. කෙසේ වෙතත්, 2024 ජූනි මස අවසන් වන විටත් මේ සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලය සමඟ සමාගම ගිවිසුම අත්සන් කර නොතිබුණි.	2023	ආයෝජන මණ්ඩල ලියාපදිංචිය ලබා ගැනීමට සහ ව්‍යාපාරික අරමුණු කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට කඩිනමින් පියවර ගත යුතුය.	ආයෝජන මණ්ඩලයේ නීති අංශය සමඟ පැවැත්වූ සාකච්ඡාවලදී, ගිවිසුම අත්සන් කිරීමට පෙර සංශෝධිත සාංගමික ව්‍යවස්ථාවලිය, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය, අනුමත මැනුම් සැලැස්ම, කෙටුම්පත් ගිවිසුම සහ විගණකවරුන්ගේ තහවුරුව වැනි ලියකියවිලි කිහිපයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇති අතර එම ලේඛන සකස් කිරීමෙන් පසු මෙම ලියාපදිංචිය ලබා ගැනීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වේ.	2024 නොවැම්බර් 18 දින වන විටත් BOI හි ලියාපදිංචිය ලබා ගෙන නොතිබුණි

	එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමට මේ දක්වා BOI නීතියේ 17 වගන්තිය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. තවද, එය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට සහ ව්‍යාපාරික අරමුණු කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීමට අහිතකර ලෙස බලපා තිබුණි.				
(ආ)	සමාගමේ කෙටි කාලීන උපායමාර්ගික සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ පළමු අදියරේදී හෝ පළමු වසර තුනක කාලය තුළ තෙල් ටැංකි 09ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, මේ වන විට පළමු වසර දෙක ගෙවී ගොස් තිබියදීත් සමාගම නියමිත වේලාවට ඉලක්කය කරා ළඟා වී ඇති බව නිරීක්ෂණය කිරීමට නොහැකි විය. එබැවින් උපායමාර්ගික සැලැස්මට අනුව ව්‍යාපෘතිය නිම කිරීම සහ ව්‍යාපාරික කටයුතු නියමිත වේලාවට ආරම්භ කිරීම ගැටළු සහගත විය.	2023	ව්‍යාපෘතිය මේ සම්බන්ධයෙන් අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය.	මේ සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය ඇමරිකානු ඩොලර් මිලියන 11.9 කි. මෙම ආයෝජනය සඳහා සමාගම සතුව අරමුදල් නොමැති බැවින්, 2024 මැයි 20 දින පුවත්පත් සහ 2024 මැයි 21 දින සිට TPTL, CPC සහ LIOC වෙබ් අඩවිවල ජාත්‍යන්තරව අභිලාෂ කැඳවීමක් (EOI) සිදු කරන ලදී. එහි ප්‍රතිපල මත ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට බලාපොරොත්තු වේ.	2024 ඔක්තෝබර් 31 දින වන විටත් EOI ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි.
(ඇ)	සමාගම පොදු පරිශීලක පහසුකම් ලබා ගැනීමේ ගිවිසුමකට එළැඹී නොතිබූ අතර ජැටි, නල	2022, 2023	ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ මෙහෙයුම් කටයුතු	ව්‍යාපෘතියේ පළමු අදියරේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සඳහා පත් කරන ලද	2024 ඔක්තෝබර් 31 දින වන විටත් පොදු පරිශීලක

	මාර්ග සහ වෙනත් අනුබද්ධ සේවාවන් භාවිතා කිරීම ඇතුළුව පොදු පරිශීලක පහසුකම් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් සමඟ සැලැස්මක් හෝ නොතිබුණි. එබැවින් ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ මෙහෙයුම් කටයුතු සාර්ථක කර ගැනීමට අදාළ පාර්ශ්ව සමඟ පොදු එකඟතාවක් නොතිබුණු බව නිරීක්ෂණය විය.		සාර්ථක කර ගැනීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ පොදු පරිශීලක පහසුකම් ගිවිසුම්වලට එළඹීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	උපදේශකවරයා 2024 ජූනි මාසය තුළ සවිස්තරාත්මක සැලසුම ලබා දීමට එකඟ වී ඇත. ව්‍යාපෘතියේ පළමු අදියරේ සවිස්තරාත්මක සැලසුම අධ්‍යයනය කිරීමෙන් පසු CPC සහ CPSTL විසින් පොදු පරිශීලක පහසුකම් ගිවිසුමේ කටයුතු අවසන් කරනු ලැබේ.	පහසුකම් ගිවිසුම්වලට එළඹී නොතිබුණි.
(ඇ)	ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය මූලික පරිසර පරීක්ෂණ (IEE) වාර්තාවක් සකස් කිරීම සඳහා වූ උපදේශන ව්‍යාපෘතිය රු.මිලියන 3.3 ක කොන්ත්‍රාත්තු වටිනාකමකට 2023 සැප්තැම්බර් 13 දින දේශීය උපදේශකයෙකු වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 2.5ක් වුවද මේ දක්වා IEE වාර්තාව ලබාගෙන නොතිබුණි. සමාගමේ වාර්තාවලට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමුච්චිත ප්‍රගතිය සියයට 10ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස	2023	මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගැනීමට සමාගමට හැකිවන පරිදි මූලික පරිසර පරීක්ෂණ (IEE) වාර්තාව උපදේශක මඟින් සකස් කිරීම කඩිනම් කළ යුතුය.	පහත සඳහන් හේතූන් නිසා උපදේශකවරයාගේ කාර්යයේ ප්‍රගතිය ප්‍රමාද විය. •වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට ව්‍යාපෘතියේ සමහර පාර්ශ්වකරුවන් අනුමැතිය ලබා දීම ප්‍රමාද වීම. •අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් චයිනාබේ කලපු ප්‍රදේශය තුළ භූගත ජල සමීක්ෂණය දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමට නොහැකි වීම. •ව්‍යාපෘතියට සම්බන්ධ අනෙකුත් කොන්ත්‍රාත්කරුවන් ගෙන් දත්ත සැපයීම ප්‍රමාද වීම.	2024 ඔක්තෝබර් 31 දින වන විටත් මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

	ව්‍යාපෘතිය සඳහා IEE වාර්තාව සකස් කිරීම 2024 ජූලි වන විට මාස 07ක් ප්‍රමාද වී තිබුණි.				
(ඉ)	විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව, 2022 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන අයවැයෙන් සියයට 76 ක් හෙවත් රු.මිලියන 139.81ක් උපයෝජනය කර නොතිබූණු අතර, 2023 වර්ෂය තුළ සියයට 100ක් හෙවත් රු.මිලියන 3,965ක් උපයෝජනය කර නොතිබුණි. සමාගමේ ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් සඳහා 2024 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 4,291.16 ක ප්‍රාග්ධන අයවැයක් වෙන් කර තිබුණද, එම ප්‍රාග්ධන වියදම් මූල්‍යකරණය කිරීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර අරමුදල් මූලාශ්‍රයක් නොමැති බව නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘතිය සඳහා විශ්වාසදායී ලෙස අරමුදල් ලබා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය	2023 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයෙන් සියයට 50ක් තෙල් ටැංකි අලුත්වැඩියා කිරීම සහ තෙල් ටැංකි 10ක් ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කර ඇති අතර, ශේෂය අනුශාංගික පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කර ඇත. ජාත්‍යන්තරව අභිලාශ කැඳවීමේ (EOI) ප්‍රතිපල මත ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සහ 2024 සඳහා සංශෝධිත අයවැය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදු කෙරේ	2024 ඔක්තෝබර් 31 දින වන විටත් EOI ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි.

3.47 ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	33,998,801,381	5,999,110,141	27,999,691,240	1,169,211,614	-
2022	33,481,121,505	6,252,243,898	27,228,877,607	(1058,696,799)	තත්ත්වාගණනය නොකළ
2023	32,227,513,385	5,746,840,480	26,480,672,905	36,611,411	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	පෙර වර්ෂවල විගණන වාර්තාවල නැවත අවධාරණය කළ පරිදි, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සාමාන්‍ය පොදු පරිශීලක පහසුකම් සඳහා කොටස් හිමිකරු ගිවිසුම හා කොටස් විකිණුම් මිලදී ගැනීමේ ගිවිසුම 2008 දෙසැම්බර් 31 දින අවසන්ව ඇත. මේ සම්බන්ධව දිගුවක් ලබාගැනීම හෝ අදාළ සියලු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන්, නිසි ඇගයීමකින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නව ගිවිසුමකට ඇතුළත් වී නොමැත. එබැවින් 2011 වර්ෂයේ සිට නිමා ගාස්තු හා ස්ලැබ් (slab) ගාස්තු ද ඇතුළුව ප්‍රවාහන ගාස්තු අයකර	2021 2022 2023	අදාළ ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කළ යුතුයි.	CPC සමඟ දැනටමත් අත්සන් කර ඇති ගිවිසුමට අනුකූලව 2024 ජූලි මාසයේදී LIOC සමඟ නව ගිවිසුමක් අත්සන් කිරීමට යෝජිතව ඇත.	2024 නොවැම්බර් වන විටත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

	ගැනීම තීරණය කිරීම සඳහා අදාළ සියලු පාර්ශවයන්ගේ එකඟතාවයෙන් යුතුව භාවිතා කළ මිල සූත්‍රය සංශෝධනය කර නොමැත.				
(ආ)	සමාගමේ උප ඩිපෝ 09 ක ඉඩම් අයිතිය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සතුව ඇති අතර, සමාගම මෙම ඉඩම් කල් බදු පදනම යටතේ භාවිතා කරනු ලබයි. මෙම ඉඩම් පරිහරණය කිරීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ ඇති කල් බදු ගිවිසුම් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ අතර සමාගම මෙම කල්බදු ගිවිසුම් කල් ඉකුත් වූ පසුවත් නව ගිවිසුමකට එළඹීමෙන් හෝ පවතින ගිවිසුම් අලුත් කිරීමකින් තොරව අඛණ්ඩව මෙම ඉඩම් භාවිතා කරනු ලබයි. කෙසේ වෙතත් සමාගම මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.	2022 2023	නව බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය.	වෙනත් විකල්පයක් නොමැති බැවින් සහ ඩිපෝ පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය බැවින් කල්බදු ගිවිසුම් කල් ඉකුත් වූ පසුවද සමාගම CGR ඉඩම් භාවිතා කිරීම දිගටම කරගෙන ගියේය. 2014 න් පසු, CGR විසින් සමාගම විසින් සිදු කරන ලද වැඩිදියුණු කිරීම් ඇතුළුව තක්සේරු කිරීම් සිදු කිරීමෙන් ලීසිං කුලී 100% කට වඩා වැඩි කර ඇත. සාධාරණීකරණය කළ නොහැකි ලෙස වැඩි කරන ලද ලීසිං කුලී ගෙවීමට සමාගම එකඟ නොවූ බැවින්, මණ්ඩලයේ අනුමැතිය ඇතිව 2014 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා CGR මගින් නිවැරදි තක්සේරුවක් සිදු කරන තෙක් කල්බදු කුලී දැනට පවතින ගාස්තු මත ගෙවන ලදී. CGR කල්බදු ගිවිසුම් ප්‍රත්‍යාවර්තී බලාත්මකව ක්‍රියාත්මක කිරීමට	2024 නොවැම්බර් වන විටත් නව බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

				එකඟ නොවීය. පසුගිය වසර 08 සඳහා හිඟ බදු කුලී ගෙවීම සම්බන්ධයෙන් 2023 සිට වසර 05 ක කාලයක් සඳහා බදු ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ඔවුන් එකඟ වී ඇත. ගෙවීම් ගැටළුව විසඳන තුරු, කල්බදු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කළ නොහැක. CGIR දැනටමත් 2027 දෙසැම්බර් 31 දක්වා බදු ගිවිසුම් කෙටුම්පත් ඉදිරිපත් කර ඇත.	
(ඇ)	සමාගම විසින් 2018 වර්ෂයේදී කොලොන්නාව තෙල් පර්යන්තයේ කලාප 06 හි නව පොම්පාගාරයක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. මෙම පොම්පාගාරය තනි ඉදිකිරීම් පැකේජයක් ලෙස ඉදිකිරීම වෙනුවට සමාගම මෙම කාර්යය වෙන වෙනම ඉදිකිරීම් 05 කට බෙදා තිබුණි. ගොඩනැගිල්ල, නල ආධාරක ඉදිකිරීම, විදුලි සවිකිරීම්, අංගන සංවර්ධනය සහ සිම්ප්ලෙක්ස් බාස්කට් පෙරනයක් සෑදීම ලෙස සමාගම විසින් මෙම ඉදිකිරීම් 05 වෙන් වෙන් වශයෙන් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකුට ලබා දී තිබුණි. 2019 සහ 2020 වර්ෂයන් තුළදී	2022 2023	සමාගම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.	2024 සැප්තැම්බර් 30 වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතය.	ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද , භාවිතා කිරීමට සුදුසු තත්වයට පත් කිරීමට අවශ්‍ය වැඩ 2024 නොවැම්බර් වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

			පොම්පාගාර ගොඩනැඟිල්ල, විදුලි සවිකිරීම් සහ අංගන සංවර්ධනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, නල ආධාරක ඉදිකිරීම අවසන් වී නොමැති බවත්, ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොමැති බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. 2023 මැයි 31 වන දින දක්වා පොම්පාගාරය සිට ගැන්ට්‍රි සහ ටැංකි සංකීරණය සම්බන්ධ කරමින් නල මාර්ග පද්ධය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පොම්පාගාරය අපේක්ෂිත භාවිතයට සුදුසු තත්ත්වයේ නොමැති බව සහ සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැයකරන ලද රුපියල් 115.2 ක මුදල නිෂ්කාශී වත්කමක් බවට පත්ව තිබූ අතර කොන්ත්‍රාත් පැකේජකරණය අකාර්යක්ෂම තත්වයට පත්ව ඇති බව නිරීක්ෂණය විය.		
(ඇ)	2023 වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් (CPC) ලැබිය යුතු මුදල රු. මිලියන 7,357 කි.	2021 2022 2023	අන්තර් සමාගම් ශේෂයන් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් සහ අයවිය යුතු මුදල් නියමිත වේලාවට පියවීම	CPC සමඟ මතභේදයට තුඩු දී ඇති ගනුදෙනු බොහොමයක් විසඳීමට තීරණය කර ඇත. CPC කළමනාකාරීත්වය	ශේෂ තවමත් නිරවුල් කර ගෙන නොතිබුණි.

	කෙසේ වෙතත්, බනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඊට අනුරූපී ගෙවිය යුතු ශේෂය රු. මිලියන 6,128 ක් සහ ඒ අනුව වෙනස රු. මිලියන 1,229 ක් බව නිරීක්ෂණය විය. සමාගම වෙනස සසඳා තිබුණු අතර CPC ආයතනය සමග සාකච්ඡා කර ඇත. ඒ අනුව, සමාගම අන්නෝන්‍ය වශයෙන් රු. මිලියන 313 ක ශුද්ධ වෙනසකට එකඟ වී තිබුණද ගිණුම්වල කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණි.		හෝ අයකර ගැනීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග ගත යුතුය.	සමඟ සාකච්ඡා කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු පැරණි නොගෙවූ පරිශීලක බලපත්‍ර ගාස්තු පියවීමට එකඟ විය.	
(ඉ)	2023 වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ලංකා ඉන්දියන් ඔයිල් සමාගමෙන් (LIOC) ලැබිය යුතු මුදල රු. මිලියන 693 කි. කෙසේ වෙතත් LIOC විසින් තහවුරු කරන ලද ශේෂය රු. මිලියන 289 ක් වූ අතර රුපියල් මිලියන 404 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව වෙනස්කම් හඳුනා ගැනීමට සැසඳීම් කර තිබුණු නමුත් සහ තොග ප්‍රවාහන ගාස්තු රු. මිලියන 301ක් LIOC සමඟ අන්නෝන්‍ය වශයෙන් එකඟ වී නොතිබුණි.	2021 2022 2023	අන්තර් සමාගම් ශේෂයන් සහ අදාළ පාර්ශ්වයන්ගෙන් සහ අයවිය යුතු මුදල් නියමිත වේලාවට පියවීම හෝ අයකර ගැනීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග ගත යුතුය.	2022 නොවැම්බර් 24 දින මණ්ඩල තීරණය අංක 14/231 අනුව, අන්තර් පර්යන්ත තොග ඉන්ධන ප්‍රවාහන ගාස්තු රු. 2022 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි CPC සහ LIOC සමඟ අත්සන් කිරීමට යෝජිත නව ගිවිසුමේ අංක 06 වගන්තියට අනුව LBD ඉන්ධන අලෙවිය සඳහා LIOC වෙතින් රුපියල් මිලියන 300 ක්. ඒ අනුව, CPSTL විසින් රු. මිලියන 300 ක් වන අතර ගෙවීම් අද දක්වා නොවිසඳී ඇත.	ශේෂ නිරවුල් කරගෙන නොතිබුණි.

3.48 ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,383,443,548	1,367,712,163	12,015,731,385	1,200,865,503	තත්ත්වාගණනය නොකළ
2022	13,859,961,921	1,634,037,303	12,225,924,618	1,159,594,660	තත්ත්වාගණනය නොකළ
2023	14,618,950,510	1,937,372,247	12,681,578,263	2,161,303,131	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම රාජ්‍ය ව්‍යවසායක (SOE) HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඉහළින් ස්ථානගත කර ඇති ඕනෑම නිලධාරියෙකුට පිළිවෙලින් මසකට ලීටර් 145 සහ 115 ට සමාන ඉන්ධන දීමනාවක් හිමි උවද සමාගම විසින් සේවකයින් හත් දෙනෙකු සඳහා ඉහත	2021 2022 2023	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ	ඉන්ධන දීමනාව පදනම් වී ඇත්තේ සේවකයින්ගේ රැකියා කාණ්ඩය, ඉටු කරන ලද කාර්යභාරය/ආශ්‍රිත රාජකාරිය මත ය. සමාගමේ මෙහෙයුම් ආකෘතියට අනුව කාර්ය මණ්ඩලයට ගමන් කිරීම (Travel) අවශ්‍ය වේ. මෙම පරිචය ෂෙල් කළමනාකරණය සිට භාවිත කරන ලදී. ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.	මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් හත් දෙනෙකු සඳහා ඉන්ධන සීමාව ඉක්මවා ඉන්ධන දීමනාව ගෙවනු ලබයි.

ඉන්ධන සීමාව ඉක්මවා ලීටර් 200 සිට ලීටර් 600 දක්වා මාසික ඉන්ධන දීමනාවක් ලබා දී තිබුණි. ඒ අනුව 2023 වර්ශයේදී පමණක් එම නිලධාරීන් සඳහා රුපියල් මිලියන 1.75 ක වැඩිපුර ඉන්ධන දීමනා ගෙවීමක් සිදුකර තිබූ අතර ඉන්ධන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයකු හටද සමාගම විසින් රුපියල් 301,648 ක් ගෙවා තිබුණි.

(ආ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 27 දිනැති 01/2015 (i) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 2021 2022 2023

නිල වාහනයකට හිමිකම් ඇති නිලධාරියෙකු හට නිල වාහනය භාවිතා කිරීමට හෝ රු. 50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්පයන් පවතී. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදිය යුතු වේ. නමුත් චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පටහැනිව;

(i) සමාගම විසින් රු. 171,600 සිට රු. 2021 2022 අධ්‍යක්ෂ මණ්ඩලය රැකියා ආශ්‍රිත වාහන මුදල් මේ අවශ්‍ය සේවකයින් අමාත්‍යාංශයේ

	360,360 දක්වා පරාසයක මාසික ප්‍රවාහන දීමනාවක් සේවකයින් හත් දෙනෙකු සඳහා ගෙවා ඇති අතර 2023 වර්ෂය තුළදී රුපියල් මිලියන 15.36 ක් වැඩිපුරද ගෙවා තිබුණි.	2023	සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.	කිහිප දෙනෙකු සඳහා සමාගම නඩත්තු කරන වාහන ඉන්ධන ප්‍රතිපාදන සහිතව සමාගම සතු වාහන ලබා ගැනීමේ හැකියාව මත සපයා ඇත. මෙම සේවකයන් හට ප්‍රවාහන දීමනාවක් ලබාදී නොමැත. සමාගමේ මෙහෙයුම් සිදු කිරීම සඳහා එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වාහන සැපයීම ඉතා වැදගත් වේ.	පූර්ව අනුමැතියකින් තොරව සේවකයින් හත් දෙනෙකු සඳහා නියමිත සීමාව ඉක්මවා ප්‍රවාහන දීමනාව ගෙවනු ලබන අතර සේවකයින් දෙදෙනෙකු සඳහා රියදුරු දීමනාවද ගෙවනු ලබයි.
(ii)	සමාගම විසින් ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයින් දස දෙනෙකු සඳහා මාසික ප්‍රවාහන දීමනාව ලෙස රුපියල් මිලියන 6.09 ක් 2023 වර්ශය තුළ ලබා දී තිබුණි.	2021 2023	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.	ප්‍රවාහන දීමනා රැකියා කාණ්ඩය සහ වාහනවල වෙළඳපල මිල මත පදනම් වේ. මෙම පරිවය ෂෙල් කළමනාකාරිත්වයේ සිට භාවිතා කරන ලදී. ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.	මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව එම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් නොලබන සේවකයින් දස දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනාව ගෙවනු ලබයි.
(ඇ)	ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සඳහා පෙට්‍රෝලියම් ද්‍රව වායු තොග ගබඩා පහසුකම් සැපයීම සඳහා සමාගම පිහිටුවා ඇති අතර 2023 සහ 2022 වසර සඳහා පිළිවෙළින් සියයට 525	2023	සමාගම විසින් මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ.	ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් හි ප්‍රතිදාන ගාස්තුව (Throughput fee) අඩු කිරීම මගින් මෙහෙයුම් වියදම් අඩු කිරීමට සමාගම සැලකිය යුතු පියවර ගෙන ඇත. අප	සමාගම මේ දක්වා ගබඩා ධාරිතාව පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කර නොමැත.

				සමාගමේ දිගුකාලීන ශක්‍යතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කරමින්, පිරිවැය අඩු කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පහසුවට සහාය වන ක්‍රියාමාර්ග ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දිගින් දිගටම කටයුතු කරනු ලැබේ .නිෂ්පාදනයේ වර්තමාන වැඩිවන ඉල්ලුම සමඟ අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා ගබඩා ධාරිතාව පුළුල් කළ යුතු බව ගම්‍යවේ.මේ සඳහා කළ යුතු ආයෝජනය සැලකිය යුතු අගයක් වේ . ඒබැවින් තවදුරටත් වියදම අඩු කර ගැනීමට යම් තීරණයක් ගැනීමට පෙර මෙම ගැටලුව විසඳා ගත යුතුවේ.
	ක් සහ සියයට 352 ක් ලෙස සැලකිය යුතු ඉහළ දළ ලාභ ආන්තිකයක් (විකුණුම් පිරිවැය මත පදනම්ව) වාර්තා කර ඇත. පෙර වසරට සාපේක්ෂව 2023 වර්ෂය තුළ දළ ලාභය රුපියල් මිලියන 554 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. 2019 ඔක්තෝබර් 28 වන දිනැති LGGTTL/AOB/03/OCTOBER/2019 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් තීරණය කරන ලද ගෑස් ටොන් එකකට ඇ.ඩො 51 ක ප්‍රතිදාන ගාස්තුව (Throughput fee) 2023 වර්ෂයේදී ඇ.ඩො 20 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ද්‍රව ගෑස් තොග ගබඩා පහසුකම් ගාස්තු තවදුරටත් අඩු කිරීම මගින් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට සහ ඒමගින් රටේ ගෑස් පාරිභෝගිකයාට සිදුවන අපහසුතාවයන් අවම කිරීමට සහාය වීම සඳහා ගෑස් මිල අඩු කිරීමට සමාගම විසින් පියවර ගෙන නොතිබුණි.				
(ඇ)	සමාගම විසින් 2021 වසරේදී ඔක්සිජන් පිරවුම්හලක් ඉදිකිරීම සඳහා සහ/හෝ අතිරේක ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මෙහෙයුම් සහ	2021 2022 2023	අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව සමාගම විසින් මෙම දේපල අපේක්ෂිත අරමුණ	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) වෙත ලද්දේ සමාගමේ මෙහෙයුම් සඳහා	අදාල ඉඩම සහ ගොඩනැඟිලි එලදායී ලෙස භාවිතා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය

ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් හෝ වෙනත් අදාළ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට කෙරවලපිටියේ අක්කර 22ක ඉඩමක් සහ ගොඩනැඟිල්ලක් සඳහා සම්පූර්ණ බදු දීමනාවෙන් කොටසක් ලෙස රුපියල් මිලියන 500ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ සිදුවෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ඉහත ඉඩම සමාගමට බදු දීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට කැබිනට් අනුමැතිය සමාලෝචිත වර්ෂය දක්වාම ලබා දී නොතිබුණි. එබැවින් ඉහත ගෙවීමෙන් සමාගම මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.

සඳහා හෝ වෙනත් සුදුසු කටයුත්තක් සඳහා භාවිතා කළ යුතුය.

අත්‍යවශ්‍ය උපාය මාර්ගික ව්‍යාපෘති සඳහා ඉඩම සුරක්ෂිත කර ගැනීමේ අදහසිනි. සිදුවෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් කැබිනට් අනුමැතිය ප්‍රමාද වුවද, ඉඩම සඳහා කල්බද්ද සුරක්ෂිත කර සමාගමට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන බවට සහතික කිරීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) සහ මුදල් අමාත්‍යාංශය සමඟ අඛණ්ඩ සන්නිවේදනය සහ සාකච්ඡා සමඟින් තත්ත්වය සක්‍රීයව කළමනාකරණය කරනු ලැබ ඇත. මීට අමතරව, මෙම පහසුකම් තුළ ස්ථානගත කිරීමට නියමිත සමාගමේ අනෙකුත් පහසුකම්වල නව සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. එය අවසන් කර අනුමත වූ පසු එහි විස්තර සපයනු ලැබේ.

මෑත කාලීන සංවර්ධනය

රුපියල් මිලියන 500 ක ගෙවීමක් සිදු කර ඇත්තේ දේපලෙහි ඇති ගොඩනැගිල්ල භාවිතා කිරීමේ කොන්දේසිය මත වන වේ.

				අතර එය 2022 සිට සමාගමේ අරමුණු සඳහා භාවිතා කරන ලදී.	
(ඉ)	රේඛීය අමාත්‍යාංශය විසින් නම් කරන ලද සභාපතිවරයා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (මව් සමාගම) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී ඔහුව ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද පත් කර තිබුණි. 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ වල 2.2.2 මාර්ගෝපදේශය අනුව, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වන අතර මාර්ගෝපදේශ 2.5.1 අනුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වන්නේ උපායමාර්ගික, උපායශීලී සහ මෙහෙයුම් සැලසුම් සකස් කිරීම වේ. මෙම තනතුරු දෙකෙහිම රාජකාරි එකම පුද්ගලයෙක් විසින් ඉටු කිරීම යහපාලන භාවිතයන්ට පටහැනිය.	2021 2022 2023	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන ප්‍රබල ගැටුම්කාරී භූමිකාවන් දෙක වෙන් කිරීම නිර්දේශ කෙරේ.	එම් එස් ජී පීරිස් මහතා ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමෙහි (LGTLL) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන දෙඅංශයෙන්ම පත් කිරීමට ගත් තීරණය හදිසි මෙහෙයුම් අර්බුදයකට විසඳුම් සෙවීමේ අවශ්‍යතාවය මත සිදු වූ අතර එය සමාගමේ සහ ජාතියේ යහපත උදෙසා ගනු ලැබීය. ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු සිටීම යහපාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. 2024 අගෝස්තු 13 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම තීරණය පිළිබඳව සලකාබලා ඇති අතර 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කර ඇත.	සමාගම් දෙකටම නව සභාපතිවරයකු පත් කර ඇති අතර ප්‍රධාන විධායක නිලධාරියා මේ දක්වා පත් කර නොමැත.
(ඊ)	විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වී එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට	2022 2023	විගණන කමිටුව ක්‍රමවත්ව රැස්විය යුතු අතර සමාගමේ මූල්‍ය	අවම අවශ්‍යතාවය සපුරා නොතිබුණද, 2023 වර්ෂය තුළදී විගණන සැලැස්ම	2024 වර්ෂය තුළ සමාගම සඳහා කිසිදු විගණන සහ

	වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ සමාගම සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.		කාර්යය සහ අනෙකුත් අදාළ කරුණු නිරීක්ෂණය කළ යුතුය.	ආවරණය කිරීමට අවධානය යොමු කොට එය ඉටු කරගනු ලැබීය. කෙසේ වෙතත්, අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමේ අවශ්‍යතාවය 2024 වර්ෂය තුළ සම්පූර්ණ කරනු ඇත.	කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොමැත.
(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල, මාර්ගෝපදේශ 4.2.2 සහ 4.2.3 හි සඳහන් උපදෙස් සහ ප්‍රසම්පාදන සංග්‍රහයේ අදාළ ව්‍යුහයට අනුව, ප්‍රසම්පාදන සැලැස්ම හරහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන ආයතනයක් සූදානම් කළ යුතුය. තවද, එක් එක් තනි ප්‍රසම්පාදන ක්‍රියාව ආරම්භයේ සිට එය අවසන් වන තෙක් කාලානුක්‍රමික අනුපිළිවෙලින් විස්තර කරමින් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත මාර්ගෝපදේශයන්ට අනුකූලව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.	2022 2023	සමාගම විසින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කෙරෙන කාලානුක්‍රමික අනුපිළිවෙලින් ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතුය	රුපියල් මිලියන 50 කට වැඩි වටිනාකමකින් යුත් (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විශාල කොන්ත්‍රාත්) (DPC major) ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ කාලසටහන රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ආයතනය වෙළඳපල මිල සැදහුම් මට්ටමේ ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරනු නොලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.

3.49 කහටගහ ග්‍රැපයිට් ලංකා සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	510,862,155	58,458,933	452,403,221	11,085,760	තත්ත්වාගණනය කළ
2022	566,673,584	64,720,489	501,953,095	57,110,521	තත්ත්වාගණනය කළ
2023	591,174,305	64,617,781	526,556,524	28,262,020	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්ද්ශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	නියමිත දිනට විදුලි වියදම් නොපියවීම හේතුවෙන් සමාගම විසින් රු.447,754 ක අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි	2023	නියමිත දිනට වියදම් පියවීම කල යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ගෙවිය යුතු වියදම් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් හදුන්වා දී නොතිබුණි.
(ආ)	2023/2024 වර්ෂයේ රු.128,558,961 ක් වූ සමාගමේ මුළු මිනිරන් විකුණුම් ආදායමින් රු.103,708,458 ක් විදේශීය විකුණුම් ද රු.24,850,503 ක් දේශීය විකුණුම් ද විය. 2023 සැප්තැම්බර් මස 11 වන දින පැවති සමාගමේ මිල කමිටුව මගින් එළඹී තීරණ අනුව සියයට 97-99 කාණ්ඩයේ මිනිරන් (lump+10mm) මෙට්‍රික් ටොන් 1 ක් ඩොලර් 2400 ක මිලකට අලෙවි කිරීමට නියම කර	2023	මිල කමිටු තීරණය කළ මිල මත පාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	මිල කමිටුව මගින් එළඹී තීරණ අනුව ක්‍රියා කර නොතිබුණි.

	තිබුණද 2023 ඔක්තෝබර් 02 වන දින සමාගම බෝගල ග්‍රැපයිට් සමාගමට ග්‍රැපයිට් මෙ.ටොන් 40 ක් ටොන් එකක් ඩොලර් 1,600 බැගින් රු.20,768,126 ක මුදලකට අලෙවි කර තිබුණි. මේ හේතුවෙන් එකී ගනුදෙනුව තුළින් රු.10,384,000 ක ආදායමක් සමාගමට අහිමි වී තිබුණි.				
(ඇ)	ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් මිනිරන් කැණීම් කර මාසික නිෂ්පාදිතය මෙ.ටොන් 80 දක්වා වර්ධනය කර ගැනීමට සමාගම සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය නිෂ්පාදනය මෙ.ටොන් 44 ක් වූ අතර මුළු නිෂ්පාදනය මෙ.ටොන් 530 ක් වූයෙන් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟාවීමට සමාගම අපොහොසත් වී තිබුණි.	2023	ප්‍රායෝගික සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	මාසික නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.
(ඈ)	මිනිරන් ඛනිජය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් සිදුකිරීම අරමුණු කර ගෙන සමාගමේ විද්‍යාගාරය ස්ථාපිත කර තිබුණද ඊට අදාළ කාර්යයන් කිසිවක් එහි සිදුකර නොතිබුණු අතර අපනයනය සඳහා සකස්	2023	මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් ආරම්භ කිරීමට පියවර ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	මිනිරන් ඛනිජය සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා ස්ථාපිත විද්‍යාගාරය මගින් එම කාර්යය සිදු කර නොතිබුණි.

	කරන ලද මිනිරන් සාම්පල තුළ අන්තර්ගත කාබන් ප්‍රතිශතය මිනුම් කිරීම පමණක් එහිදී සිදුකර තිබුණි. සමාගම වර්තමානය වන විට පියලි (Flake- කාබන් සියයට 97 ත් සියයට 99) සහ චිප්ස් (Chips- කාබන් සියයට 90 ත් සියයට 92) යන ආකාර වලින් පමණක් මිනිරන් අපනයනය කර තිබුණු අතර අගය එකතු කර නිමි හෝ අර්ධනිමි භාණ්ඩ වශයෙන් නිෂ්පාදනයන් සිදුකර නොතිබුණි.				
(ඉ)	සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වාර්ෂිකව මිනිරන් මෙ.ටොන් 647 ක් අලෙවි කිරීමට අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී මෙ.ටොන් 264 ක් පමණක් අලෙවි කර තිබුණි. එය අපේක්ෂිත අලෙවියට වඩා සියයට 57 කට අඩු මට්ටමක් විය.එසේම මෙකී කාලපරිච්ඡේදය තුලදී සමාගම තරඟකාරීත්වයේ වාසි අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර අලෙවි කර තිබූ මිනිරන් මෙ.ටොන් 264 න් 220 ක්ම එක් විදේශීය ගැනුම්කරුවෙකු වෙත අලෙවි කර තිබුණි.	2023	අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමට අලෙවිකර සැලසුම් ක්‍රියාවට නැංවීම කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	අපෙක්ෂිත අලෙවි සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඒ)	2003 ඔක්තෝබර් 15 දිනැති ප්‍රතිපත්ති සම්පාදන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියට අනුව දොඩම්ගස්ලන්ද යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් අවශ්‍යය ඉඩ පහසුකම් කහටගහ පතලට අයත් ඉඩම්වලින් ලබා දීමට 2003 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2003 වර්ෂයේ සිට වර්ෂ 03 ක කාලයක් සඳහා ඉඩම නිදහස් කර තිබුණද විගණිත දිනය වන විට එම කාලය වසර 17 ක් ඉක්මගොස් ඇතත් බදුකුලී ගිවිසුමකට එළඹීමෙන් හෝ බදුකුලී ගෙවීමෙන් තොරව පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉඩම පාවිච්චි කරනු ලබයි.	2022	බදු කුලී ගිවිසුමකට එළඹීම සඳහා අදාළ පාර්ශව සමඟ එකඟතාවයකට පැමිණීමටත්,ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමටත්, හිඟ බදු කුලී අයකර ගැනීමටත් පියවර ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් ලබාදුන් ඉඩම සඳහා බදුකුලී ගිවිසුමකට එළඹී නොතිබුණි.
(ඓ)	පතලේ පළමු අඩි 1130 මට්ටමේ සිට අඩි 2000 මට්ටම දක්වා පිවිසුමට දෙවන පතල් වළ (2nd shaft) ක අවශ්‍යතාව වසර කිහිපයකට පෙර හඳුනාගෙන මූලික කටයුතු ආරම්භ කර ඇතත් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.	2021	සැලසුම් ප්‍රකාරව මෙහෙයුම් කටයුතු පුළුල් කර ගැනීමට පියවර ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	දෙවන පතල් වළේ නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

3.50 ලංකා පොස්පේට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,184,905,387	116,386,382	1,068,519,006	157,030,089	හිතකර
2022	1,310,280,038	298,537,689	1,011,742,351	69,334,034	හිතකර
2023	1,468,740,433	413,336,131	1,055,404,302	363,349,438	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම අඩුකිරීම යන කරුණු පදනම් කර ගනිමින් රු.34,654,178 කට නව යන්ත්‍රයක් ලෙස පාවිච්චි කරන ලද ක්‍රෂර් යන්ත්‍රයක් 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ බව හා එම යන්ත්‍රයේ කිසිම කොටසක එහි වර්ගය, මාදිලිය, නිෂ්පාදන සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ඡායා රූපමය සාක්ෂි සහිතව හා ලිඛිතව සාමාන්‍යාධිකාරිට දැනුම් දී තිබුණි. මෙම යන්ත්‍රය ස්ථාපිත දින සිට 2024	2021 2022 2023	රු.මිලියන 34 කට වැඩි මුදලක් වැයකර මිලදී ගෙන ඇති යන්ත්‍රය ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	ක්‍රෂර් යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට හෝ එහි අලාභයන් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

	නොවැම්බර් 30 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. තවද මිලදී ගැනීමේදී නව ක්‍රෂර් යන්ත්‍රය වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍රය මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට වූ අලාභය, එදින සිට භාවිතයට නොගැනීම වෙනුවෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට හා අලාභයන් අයකර ගැනීමට සමාගමේ බලධාරීන් මෙතෙක් කටයුතු කර නොතිබුණි. එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු අතර මෙම යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් යන්ත්‍රය මිලදීගත් සමාගම වෙත ගෙවිය යුතු රු.4,386,358ක් වූ රඳවාගැනීම් මුදලද නිදහස් කර නොතිබුණි.				
(ආ)	2014 වර්ෂයේදී රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා තිබූ අතර මුළු ව්‍යාපෘතිය තුළින් රු.මිලියන 31.71 ක	2022 2023	රු.මිලියන 21 කට අධික ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් බැවින් උද්ගතව ඇති ගැටලු කඩිනමින් විසඳා ගෙන ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට	නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය විසින් කටයුතු කොට ඇත.	ඉඩමෙහි බදු කාලසීමාව අලුත් කිරීමට හෝ ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

	අලාභයක් සිදුවී තිබුණි. තවද, ව්‍යාපෘති කාර්යයන් සඳහා පස් අවුරුදු බදු පදනම මත ලබා ගන්නා ලද ඉඩමෙහි බදු කාලසීමාව 2018 සැප්තැම්බර් 05 දිනෙන් අවසන් වී තිබූ අතර බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණද 2022 සැප්තැම්බර් මස සිට සමාගමට ව්‍යාපෘති භූමිය තුළට ඇතුළු වීම ඉඩම් හිමිකාර පාර්ශවය විසින් වළක්වා තිබූ අතර එම ආරවුල නිරවුල් කර ගැනීමට 2024 නොවැම්බර් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.	
(ඇ)	සමාගම විසින් CIC සමාගම වෙත අලෙවි කරන ලද ERP පොහොර මෙ.ටොන් 393 ක තිබිය යුතු යැයි අපේක්ෂිත රොක් පොස්පේට් ප්‍රතිශතය නොතිබීම හේතුවෙන් එම පොහොර තොගය ආපසු එවා තිබුණි. ඒ සඳහා ප්‍රවාහන වියදම් හා පැටවීමේ කුලී වියදම් ලෙස රු.1,739,381 ක නිෂ්කාර්ය වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි. එම ERP තොගය අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සමඟ මිශ්‍ර	2023	නියමිත නිෂ්පාදන ප්‍රමිතය පවත්වා ගත යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	නියමිත ප්‍රමිතින්ට අනුව නිෂ්පාදනය අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි.

	කොට නැවත සැකසීම 2023 ජූලි 23 සිට 2023 අගෝස්තු 07 දින දක්වා කාල පරිච්ඡේදයේදී සිදුකර ඇතත් අලෙවි කර නොතිබුණි.			
(ඇ)	පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ 2012 අප්‍රේල් 20 දිනැති අංක 16/2012 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයහි ඛනිජ ද්‍රව්‍ය ප්‍රාථමික ස්වරූපයෙන් අපනයනය කිරීම අධෛර්යමත් කරන බව දක්වා ඇති නමුත්, කිසිදු අගය එකතු කිරීමකින් තොරව පොස්පේට් ඛනිජය අපනයනය කිරීම සඳහා ගැණුම්කරුවන් තිදෙනෙකු වෙත දේශීය මිල මත අලෙවි කිරීමට සමාගම කටයුතු කර තිබුණි. එම ගැනුම්කරුවන් වෙත පොස්පේට් අලෙවි කිරීමේදී නිසි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බවට විගණනය වෙත සාක්ෂි ඉදිරිපත් නොවීය. සමාලෝචිත වර්ෂය තුළදී, සමාගම අදාළ ගැනුම්කරුවන් තිදෙනා වෙත පොස්පේට් මෙ.ටොන් 13,207 ක ප්‍රමාණයක් දේශීය මිල මත අලෙවි කර රු.343,382,000 (මෙ.ටොන් 1 ක් රු.26,000 බැගින්) ක	2023	නිෂ්පාදනයට අගය එකතු කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කල යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	පොස්පේට් ඛනිජය සඳහා කිසිදු අගය එකතු කිරීමක් කර නොතිබුණි.

	ආදායමක් උපයාගෙන තිබුණි.				
(ඉ)	යන්ත්‍රාගාරය සඳහා අවශ්‍ය අමතර කොටස්වල අවශ්‍යතාවය ඇගයීමක් සිදු කිරීමකින් තොරව මිලදී ගන්නා ලද රු.3,975,998 ක් වටිනා අමතර කොටස් සමාගමේ ගබඩාව තුළ වසර ගණනාවක සිට භාවිතයට ගැනීමකින් තොරව රඳවා ගෙන තිබුණි.	2023	අවශ්‍යතාවය ඉක්මවා මිලදී ගැනීමේ අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	අමතර කොටස් භාවිතා කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.
(ඊ)	සමාගම විසින් බනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකකයක් රු.350 ක් බැගින් දේශීයව මිලදී ගෙන විගණිත දින වූ 2024 අප්‍රේල් 01 දක්වාම අදල යන්ත්‍ර සඳහා භාවිතා කරමින් පැවතුණි. අදාළ භාණ්ඩ ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී තොගය ශූන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින රබර් බුෂ් ඒකක 200 ක් ඒකකයක් රු.79,082 ක් බැගින් රු.15,816,482 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.70,000(රු.350x200) ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම තොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින්	2023	අනාර්ථිකව මිලදී ගැනීම් සඳහා වගකිව යුතු අයට විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. තොගය භාවිතයට ගත යුතුයි.	ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි	වැඩි මිළට ආනයනය කල රබර් බුෂ් ගබඩා ලේඛන තුළ ඇතුළත් නොකොට නිෂ්ක්‍රීයව තබා තිබුණි.

රු.15,746,482 ක අලාභයක් සමාගමට සිදුව තිබුණි. මිලදී ගත් මෙම තොගය විගණිත දින වූ 2024 අප්‍රේල් 01 වන විටත් භාවිතයට නොගෙන ගබඩා ලේඛන තුළ ඇතුළත් කිරීමකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව සම්බන්ධක ඇණ(Coupling bolt) ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවා නිෂ්කාර්යව තබා තිබුණි.

3.51 වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	99,983,953,818	19,461,258,191	80,522,695,627	18,736,211,849	තත්ත්වාගණනය නොකළ
2022	149,271,421,430	58,321,192,508	90,950,228,916	19,427,533,289	තත්ත්වාගණනය නොකළ
2023	-	-	-	-	-

අ/අ	විගණන නිරීක්ෂනය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	විදුලිය නිපදවීම සම්බන්ධව, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට අනුව සමාගම විසින් නිකුත් කරන ලද මාසික ඉන්වොයිස් ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) විසින් සමාලෝචනය කර ඇති අතර, බොහෝ අවස්ථාවලදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිළිගත් මුදල, ඉන්වොයිස් කරන ලද ප්‍රමාණයට වඩා අඩු වී තිබුණි. මෙම වෙනසට බලපෑ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලය එකඟ වූ මුදල තහවුරු කර තිබුණි. 2023 මාර්තු 31 දිනට ලංවිමෙන් ලැබිය යුතු මුළු ශේෂය රු. මිලියන 110,194 කි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩලයේ	2022/ 2023 2021/ 2022	ලංකා විදුලිබල මණ්ඩලය සමග ඇති මතභේදය විසඳා ගැනීමට කටයුතු කල යුතුය.	වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණනාවකදී සාකච්ඡා කර ඇති පරිදි, සමාගම ගිවිසුම්ගතව එකඟ වූ පරාමිති සහ අගයන් මත පදනම්ව ලංවිම වෙත මාසික බලශක්ති ඉන්වොයිසි සකස් කරයි. නමුත් ලංවිම, වෙස්ට් කෝස්ට් සහ ලංවිම එකඟ නොවූ තමන්ගේම විවිධ පරාමිතීන් මත පදනම්ව සමාගමට ගෙවිය යුතු ශේෂය සකස් කරයි. පහත විස්තර කර ඇති පහත සඳහන් ක්ෂේත්‍ර හය (මතභේද) ඉහත විශාල වෙනස සඳහා දායක වී ඇත. 1) පරාමිති සාකච්ඡා අවසන්	වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ සහ ලංවිම හි අධ්‍යක්ෂ මණ්ඩලය යෝජිත පරාමිතීන් සඳහා එකඟ වී ඇත.

ශේෂ තහවුරු කිරීමට අනුව සමාගමට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 79,382 කි. තවද, සමාගම විසින් ඉහත ලැබිය යුතු ශේෂය සඳහා රුපියල් මිලියන 12,160 ක් හානිකරණ ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණි.

වීමෙන් පසු අගයන් අත්තනෝමතික ලෙස යෙදීම.

ලංවිම සමග පැවති සාකච්ඡා කිහිපයකින් පසු, 2024 සැප්තැම්බර් 02 වන දින පැවති ඒකාබද්ධ කමිටු සාකච්ඡාවක දී වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම විසින් පරාමිතීන් සඳහා එකඟ වී ඇත.

2) ඉන්ධන බලශක්ති අනුපාත මතභේදය.

2016 දෙසැම්බර් මාසයේ සිට වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ ඉන්ධන භාවිතා කර ඇති සූත්‍රය භාවිතා කිරීමට ලංවිම එකඟ වී ඇත.

3) ඩීසල් ඉන්ධන මෙහෙයුම.
ඔටෝ ඩීසල් මෙහෙයුම් සඳහා ඉන්ධන ගණනය කර ඇති ඉන්ධන බලශක්ති අනුපාත (FER)පරාමිතිය නිවැරදි බව ලංවිම සහ වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ කමිටුව සඳහන් කළ අතර සම්පූර්ණ ඩීසල්

මෙහෙයුම් කාලය සඳහා නියමිත ගෙවීම පියවීමට ලංවිම එකඟ විය.

4) ඉන්ධන නොමැති වීම මත පනවා ඇති ද්‍රවශීලතා හානි.

ලංවිම සහ වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම යන දෙඅංශයෙන්ම සමන්විත කමිටුව, ඉන්ධන නොමැති වීම මත පනවන ලද ද්‍රවශීලතා හානි හේතුවෙන් අඩු කරන ලද මුදල් සඳහා සඳහන් කාල සීමාව (නොවැම්බර්, දෙසැම්බර් 2019 සහ ජනවාරි 2020) තුළ පනවන ලද ද්‍රවශීලතා හානි ඉවත් කිරීමට නිර්දේශ කර එකඟ විය.

5) ආනයන බලශක්ති මතභේදය

බලශක්ති අලෙවි මාසික ඉන්වොයිස් වලින් ආනයනිත විදුලි ඒකක අඩුකිරීම නැවැත්වීමට සහ කර්මාන්ත ගාස්තු 3 (IP3) කාණ්ඩය යටතේ ගාස්තුව තීරණය කිරීමට ලංවිම එකඟවිය.

6) අතිරික්ත බලශක්තිය අඩු කිරීම

(ආ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.1 වගන්තිය අනුව, රජය සතු සියලුම ව්‍යවසායන් තම සේවක සංඛ්‍යාව සහ වේතන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි.	2022/2023 2021/2022	ඉහත අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය.	කළමණාකරන අදහස් දැක්වීම් ලැබී නොමැත.	වෙස්ට් කෝස්ට් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පමණක් අනුමත කර කර තිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.2 (vi) වගන්තිය අනුව, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධානයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවිය යුතුය. ඒ අනුව, සමාගම 2022 දෙසැම්බර් 21 දිනැති පොදු ව්‍යවසාය චක්‍රලේඛයට අනුව ප්‍රසාද දීමනා ගෙවිය යුතු නමුත්, සමාගම විසින් ඉහත චක්‍රලේඛයට අනුගත නොවෙමින් සමාගමේ සේවකයින් තිදෙනාට සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසාද දීමනාව ලෙස රුපියල් මිලියන 1.85 ක් ගෙවා තිබුණි. තවද, ඉහත ගෙවීමට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අනෙකුත් ලේඛනගත	2022/2023 2021/2022	ඉහත අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය.	මෙම කරුණ සම්බන්ධයෙන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් විගණන කමිටුව දැනුවත් කර ඇති අතර, ප්‍රසාද දීමනා සඳහා ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීමට විගණන කමිටුව නිර්දේශ කර ඇත.	මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානවලට අනුකූල වී නොමැත.

	සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.				
(ඇ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය අනුව, මුදල් වර්ෂය අවසන් වී මාස පහක් (5) ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ආරම්භයේ සිටම වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි.	2022/2023	ඉහත අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය.	කළමණාකරන අදහස් දැක්වීම් ලැබී නොමැත.	මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානවලට අනුකූල වී නොමැත.
(ඉ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි වගන්තිය 7.5 අනුව, රජය සතු ව්‍යවසායයන් විසින් මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්‍යසාධන වාර්තා අදාළ රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී තිබුණි.	2022/2023 2021/2022	ඉහත අත්පොතෙහි විධිවිධානවලට අනුකූල විය යුතුය.	මහා භාණ්ඩාගාරය සමාගම තුළ කිසිදු අරමුදල් ආයෝජනය කර නැත. එහි මැදිහත්වීම විදේශ ණයක් හරහා බලාගාරය සඳහා මුදල් සැපයීමේ අරමුණින් පමණක් සිදු වූ අතර එම ණය මුදල සම්පූර්ණයෙන්ම පියවා ඇත.	මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානවලට අනුකූල වී නොමැත.
(ඊ)	2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිලිබඳ මාර්ගෝපදේශයේ 4.4. වගන්තිය අනුව, රජය සතු සියලුම ව්‍යවසායන්	2022/2023 2021/2022	ඉහත මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	වෙස්ට් කෝස්ට් සමාගම හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත් කර ඇත.	කාර්තුමය මූල්‍ය වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇති අතර, විගණන කමිටුවේ සභාපති විසින් අධ්‍යක්ෂ

තුල අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු අතර ඔහු විගණන කමිටුව හරහා අධ්‍යක්ෂක මණ්ඩලයට පමණක් වාර්තාකල යුතුය. කෙසේ වෙතත් සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

මණ්ඩලය වෙත යාවත්කාලීන කිරීම් ලබා දී ඇත.

3.52 සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	54,857,827	12,851,457	42,006,370	(11,024,650)	තත්ත්වාගණනය නොකළ
2022	79,812,761	46,869,301	32,943,461	(9,062,909)	තත්ත්වාගණනය කළ
2023	126,691,734	64,765,983	61,925,750	(11,017,710)	තත්ත්වාගණනය නොකළ

අ/අ	විගණන නිරීක්ෂනය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සාම්පූර් හි මෙගාවොට් 50 ක සූර්ය බලාගාරයක් පිහිටුවීමට සමාගමට 2018 වසරේ දී කැබිනට් අනුමැතිය ලැබී තිබුණි.කෙසේ වෙතත්, එම බලාගාරයේ මෙහෙයුම් කටයුතු 2024 මාර්තු 31 වන දින දක්වා ආරම්භ කර නොතිබුණි. සමාගම විසින් මෙහෙයුම් කටයුතු කිසිවක් සිදු කර නොතිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා පරිපාලන වියදම් සඳහා රුපියල් මිලියන 13 ක් වැය කර තිබිණි. 2023 මාර්තු 31 දිනට සමාගමේ සමුච්චිත රඳවාගත් අලාභය රුපියල් මිලියන 635 කි.	2022/2023 2021/2022	ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	සාම්පූර් හි මෙගාවොට් 50 ක සූර්ය බලාගාරයක් පිහිටුවීමට ප්‍රතිපත්තිමය වශයෙන් කැබිනට් අනුමැතිය ලැබී තිබුනත්, නීතිපතිගේ උපදෙස් මත ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනය වෙනුවෙන් රජයකින් රජයකට සිදුවන ක්‍රමවේදය අනුගමනය පිණිස වන කැබිනට් අනුමැතිය ලැබී ඇත්තේ 2024-06-19 දිනැතිව වන අතර දැනට ඒ සඳහා වන තාක්ෂණික හා මූල්‍යමය යෝජනාව ව්‍යාපෘති කමිටුවේ සහ කැබිනට් මණ්ඩලයෙන් පත්කළ කේවල් කිරීමේ කමිටුවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව රජයේ	නිර්දේශ ක්‍රියාත්මක වෙමින් පවතියි.

ප්‍රතිපත්තිය අනුව ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබෙයි.

3.53 ලංකා සතොස ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,908,170,536	23,848,470,808	(14,940,300,272)	(840,281,278)	ව්‍යාවනය කළ
2022	12,175,345,725	24,785,185,492	(12,609,839,767)	(35,424,512)	ව්‍යාවනය කළ
2023	-	-	-	-	-

අ/අ	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2022 වර්ෂය අවසානයේ සමාගමේ ඌනතාවය රු. 35,424,512ක් වූ අතර ජංගම වත්කම් රු 10,832,852,647 ක් හා ජංගම වගකීම් රු.17,780,745,951 ක් වූයෙන් ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.6,947,893,304 ක් ද මුළු වත්කම් රු.12,175,345,725 ක් හා මුළු වගකීම් රු.24,785,185,491 ක් වූයෙන් මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් රු. 12,609,839,766 ක් ද විය. ඒ හේතුවෙන් සමාගමට සිය වත්කම් තුළින් වගකීම් වලට මුහුණ දීමේ හැකියාව සහ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාදීමකින් තොරව අඛන්ඩව පවත්වාගෙන යාමේ	2022 2021	සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගම කටයුතු කළ යුතුය.	වර්තමානය වන විට ආයතනයේ වගකීම් අඩු කරගැනීමට හැකි වී ඇත.	2023 වර්ෂයේ ගිණුම් ලබා දී නොමැති බැවින් පරීක්ෂා කළ නොහැකි විය.

	හැකියාව අවිනිශ්චිත තත්වයක පවතී. තවද සමාගම් පනතේ 220 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින තත්ත්වය සම්බන්ධව අවධානය යොමු කර සමාගමේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.				
(ආ)	2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් භාණ්ඩාගාර අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව නිල වාහන භාවිතා කිරීමට හිමිකම නොමැති නිලධාරීන් සඳහා මාසිකව රු.12,500 බැගින් 2021 වර්ෂයේදී නිලධාරීන් 14 දෙනෙක් සඳහා රු.1,775,000ක්ද 2022 වර්ෂයේදී නිලධාරීන් 11 දෙනෙක් සඳහා රු.1,487,500ක්ද වූ ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.	2022 2021	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය.	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රවාහන දීමනාව අනුමත කර ගැනීම සඳහා කරුණු පැහැදිලි කරමින් ලිපියක් යොමු කර ඇත.	මේ දක්වා අනුමැතිය ලැබී නොමැත.
(ඇ)	2017 පෙබරවාරි 22 දිනැති අංක DMS/1744 හා 2017 මැයි 16 දිනැති අංක DMS/1741 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපි වලට පටහැනිව	2022	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව කටයුතු කළ යුතුය.	කළමණාකරණ සේවා දෙපාර්තතමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා යොමුකර ඇත.	නීත්‍යානුකූල නොවූ ගෙවීම් අයකරගෙන නැත.

	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ප්‍රධාන විධායක නිලධාරි සඳහා රු.250,000ක මාසික දීමනාවක් ද, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ නොමැතිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින් සඳහා රු.150,000 ක මාසික දීමනාවක් ද ගෙවා තිබුණෙන් අනුමැතියෙන් තොරව වැඩිපුර ගෙවා තිබුණු මුදල 2021 වර්ෂයේදී රු.5,795,000ක් ද 2022 වර්ෂයේදී රු. 4,001,666ක් ද විය.				
(ඇ)	2019 ජූනි 25 දිනැති අංක 19/1659/108/147 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සමාගම විසින් සහල් ආනයනය කිරීම සඳහා ලබාගෙන ඇති ණය මුදලෙහි ප්‍රාග්ධන වටිනාකම පියවීම සඳහා 2020 වසරේ සිට වර්ෂ 05ක් පුරා භාණ්ඩාගාරය විසින් රජය සතු ව්‍යවසායන්හි කොටස් ආයෝජනයක් ලෙස ප්‍රතිපාදන සැපයිය යුතු බවට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ සිට වර්ෂ 03කට අදාලව පියවන ලද ණය මුදලෙහි සමුච්චිත වටිනාකම වන රු.5,739,364,265 සඳහා කොටස් පැවරීමක් සිදු	2022	පියවන ලද ණය මුදලෙහි සමුච්චිත වටිනාකම සඳහා කොටස් පැවරීමක් ලබා ගැනීමට කටයුතු කල යුතුයි.	වැළක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	මේ වන තෙක් කොටස් පැවරීමක් සිදු කර නොමැත.

කර නොතිබුණි.

(ඉ)	2015 වර්ෂයේ සිට පැවත එන කුලී අත්තිකාරම් ගිණුමෙහි වූ රු.3,498,678ක හඳුනා නොගත් ශේෂය සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	හඳුනා නොගත් ශේෂය සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	වැළක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව වූ ක්‍රියාකාරී අත්පොතෙහි 6.6 ඡේදය අනුව සමාගමේ නිසි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක විය යුතු බවට සහතික විය යුතු නමුත් සමාගම විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් 04ක් අයිරා තත්වයට පත්වී තිබුණ අතර, 2022 වර්ෂයේ අයිරා ශේෂයන්ගේ එකතුව රු.5,050,282,232ක් වූ අතර, පෙර වර්ෂයට සාපේක්ෂව රු.1,868,683,577 කින් හෙවත් සියයට 37කින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල බැංකු අයිරා සඳහා ගෙවූ පොළිය රු.829,787,908ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව රු.607,589,920ක් හෙවත් සියයට 273කින් වැඩි වී තිබුණි.	2022	චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය.	ආයතනයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මත ආයතනයේ බැංකු අයිරා ශේෂය තීරණය වන අතර වර්තමානය වන විට බැංකු අයිරා ශේෂ අඩු කරගැනීමට කටයුතු කරනු ඇත.	අයිරා තත්වය දිගටම පවතී.

(උ)	සමාගමේ අලෙවිසල් 114ක ආරක්ෂිත කැමරා පද්ධති සවිකර නොතිබුණ අතර අලෙවිසල් 65ක සවිකර තිබූ ආරක්ෂිත කැමරා වලින් කොටසක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පවතී. අලෙවිසැල්වල තොග අඩුමාන පැවතීම දිගින් දිගටම සිදුවී තිබුණ ද අලෙවිසැල් වල කැමරා පද්ධති ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ නොවීම හේතුවෙන් අලෙවිසැල් හා සම්බන්ධ සෘජු පාලනයක් ප්‍රධාන කාර්යාලයට පවත්වාගත නොහැකි වී තිබුණි. තවද 2016 වර්ෂයේදි ස්ථාපිත කර ඇති මෙම ආරක්ෂිත කැමරා පද්ධතිය අදාළ කොන්ත්‍රාත් ආයතනයේ වසර 02ක වගකීම් කාලය අවසන් වීමෙන් පසු නඩත්තු කටයුතු සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	2022	ආරක්ෂිත කැමරා පද්ධති සවිකර නිසි පරිදි නඩත්තු කටයුතු සිදුකල යුතුය.	වැළක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(ඌ)	2022 වසරේ පැවති ලැබිය යුතු තොග හානි රු.342,327,235කින් කිසිදු වටිනාකමක් විගණිත දින වන විටත් ආපසු අයකරගෙන නොතිබුණි. ඉකුත් වර්ෂවල තොග හානි අයකර ගැනීමේ ක්‍රමවේදය පරීක්ෂා කිරීමේදී, 2018 හා 2019 වර්ෂවල තොග	2022	තොග හානි සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පදධතිය ශක්තිමත් කල යුතු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් තොග හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	තොග හානි අයකරගනිමින් පවතී.	දිගින් දිගටම තොග හානි වාර්තා වන අතර අයකර ගැනීමේ ක්‍රියාවලිය මන්දගාමීව සිදුවේ.

	ඌනතාවය පිළිවෙලින් රු.271,125,743 හා රු.193,280,144න් කිසිදු වටිනාකමක් අයකරගෙන නොතිබුණි. 2020 සහ 2021 වර්ෂයේ තොග ඌනතාවය පිළිවෙලින් රු.55,253,300 හා රු.194,770,627කින් අයකරගෙන තිබුනේ පිළිවෙලින් රු.5,032,576ක් හා රු.1,151,372ක වටිනාකමක් පමණි. ඒ අනුව මෙම තොග හානි වටිනාකම අයකර ගැනීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.				
(එ)	කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක සමාගම විසින් රු.22,748,813ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදිකර 2014 වර්ෂයේ සිට අලෙවිසැලක් පවත්වාගෙන යන නමුත් එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩම බදු පදනම මත පවරා ගැනීමට අදාල බදු ගිවිසුමක් හෝ ගොඩනැගිල්ල ඉදිකල පසු එම ගොඩනැගිල්ල සහ ඉඩම නීත්‍යානුකූලව භුක්ති විඳීමට අදාල බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.	2022	අදාල ඉදිකිරීම් සිදු කිරීමට පෙර අයිතිය පවරාගත යුතුය.	කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මෙම ඉඩම 2014-2034 වර්ෂ සඳහා ගිවිසුම් ගත වීමට එකඟතාවය පළ කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඒ)	2021 ජූලි 30 දිනැති	2022	බඳවා ගැනීම්	අධ්‍යක්ෂ මණ්ඩල	නිර්දේශ

අංක 108 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර, Head of Online Trading නමින් වෙනස් කර තිබුණි. එසේ වුවද අනුමත බඳවා ගැනීම් පරිපාටියේ මෙවැනි තනතුරක් නොතිබූ අතර, නව තනතුරු නාමයද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබුණි. එම හේතුවෙන් අනුමත නොවූ තනතුරකට ගෙවා තිබුණු වැටුප 2021 නොවැම්බර් 01 දින සිට 2023 මැයි 31 දක්වා රු.4,125,000ක් විය.

පරිපාටියට එම තනතුර ඇතුළත් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.

පත්‍රිකාවක් යොමුකරමින් අවසර ලබා ගෙන ඇත.

ක්‍රියාත්මක කර නොතිබුණි.

3.54 සී-ස සතොස ආරක්ෂක සහ පොදු (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	119,151,223	73,949,121	45,202,102	(5,271,216)	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

අ/අ	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව වූ මෙහෙයුම් අත්පොතෙහි 3.1 ඡේදය අනුව කාර්ය මණ්ඩලය මහා භාණ්ඩාගාරය විසින් අනුමත කර නොතිබුණි.	2021/2022	චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව වූ මාර්ගෝපදේශයේ 4.4 ඡේදය අනුව සමාගම විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.	2021/2022	චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	- එම -	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව වූ	2021/2022	චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	- එම -	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

මෙහෙයුම් අත්පොතෙහි ඡේදය අනුව ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබුණි.	6.7

3.55 සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,258,482,698	1,186,050	1,257,296,648	(2,224,093)	තත්ත්වාගණනය කළ
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

අ/අ	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් බද්ද රු.13,044,600 ක් වූ අතර ඉන් රු.12,962,617 ක් වසර 05 කට වැඩි කාලයක් හිඟව තිබුණි.	2021	2021 1.6.1 (අ)	සමාගමේ බදු පිළිබඳ පූර්ණ වාර්තාවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස සමාගමේ බදු උපදේශකයින් වෙත දැනුම් දීම.	ලැබිය යුතු ආදායම් බදු පියවීම පිළිබඳ අවසන් එකඟතාවයකට මේ දක්වා එළඹී නැත.
(ආ)	2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අනුව , වසර 03 ක කාලයක් සඳහා රු.14,730,273 ක අනෙකුත් ලැබිය යුතු දෑ හිඟව තිබුණි.	2021	1.6.1 (ආ)	අදාල ගැලපීම් සිදුකර අවසන් නිශ්චිත ලැබිය යුතු ශේෂ හඳුනා ගැනීම.	2023 වර්ෂයේ ගිණුම්වල අදාල ගැලපීම් සිදු කර ඇති බව දන්වා තිබුණද ගිණුම් ඉදිරිපත් කර නොමැති බැවින් පරීක්ෂා කල නොහැකි විය.

3.56 ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	30,323,792,284	20,244,505,058	10,079,287,227	(10,170,174,257)	තත්ත්වාගණනය නොකළ
2022	28,778,959,194	17,779,546,381	10,999,412,813	1,122,049,096	තත්ත්වාගණනය නොකළ
2023	33,646,162,208	18,722,031,036	14,924,131,172	6,571,254,858	තත්ත්වාගණනය නොකළ

අ/අ	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ට පටහැනිව, සිලින්ඩර 400 ක් සඳහා 62.5% අත්තිකාරම් මුදල රුපියල් මිලියන 10.15 ක් , සිලින්ඩර 200 ක් සඳහා 100% අත්තිකාරම් මුදල රුපියල් මිලියන 7.16 ක් සහ අත්තිකාරම් ගෙවීමක් සහතිකයක් (guarantee) ලබා ගැනීමකින් තොරව සිලින්ඩර 4,330 සඳහා ඩොලර් 100,000 (රු. මිලියන 20.3) ගෙවා ඇත. සමාගම විසින් මිලදී ගැනීමේ ඇණවුම අවලංගු කිරීම හේතුවෙන් මෙම අත්තිකාරම් ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ.	2021 2022 2023	අත්තිකාරම් ගෙවීමේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව සමාගම විසින් අත්තිකාරම් ගෙවීමක් නොකළ යුතුය.	පහත හේතූන් නිසා සමාගම අත්තිකාරම් ගෙවීමේ සහතිකයක් ලබාගෙන නොමැත. - රෝහල්වලට වෛද්‍ය ඔක්සිජන් සිලින්ඩර සැපයීමේ හදිසි අවශ්‍යතාවය සලකා බලා, ලිට්‍රෝ සඳහා වෙන් කර ඇති තොග තබා ගැනීම සඳහා සුළු LC සමඟ ගෙවීම කල්තියා නිකුත් කිරීමට තීරණය කරන ලදී. ඇපකර සැකසීමේ කාලය අඩු කිරීමට සහ ප්‍රසම්පාදන කාලය විශාල වශයෙන් කෙටි කිරීමට අත්තිකාරම් ඇපකරය ඉවත් කරන ලදී. - Litro ඔහුන්ගේ පෙර හැසිරීම මත	මෙම ගැටලුව සම්බන්ධව දෙපාර්ශවය නීතිමය ක්‍රියාමාර්ග වලට එලබ ඇත. මෙතෙක් අත්තිකාරම අයකර ගෙනද නොමැත.

				සැපයුම්කරු කෙරෙහි විශ්වාසය තබයි. අත්තිකාරම් ගෙවීමෙන් පසු සැපයුම්කරු සහතිකයක් නොමැතිව අතිතයේ සිට අඛණ්ඩව අවශ්‍ය භාණ්ඩ සපයමින් සිටියේය.	
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට සමාගමට ලැබිය යුතු වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද (PAL) රුපියල් මිලියන 50.6 කි. මෙම වටිනාකම 2013, 2019 සහ 2021 වසරවල දී LP ගෑස් ආනයනය කරන අවස්ථාවේ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සඳහා පිළිවෙලින් ගෙවන ලද රු. මිලියන 15.5, රු. මිලියන 29.8 ක් සහ රු. මිලියන 3.2 කින් සමන්විත වේ.	2022 2023	සමාගම විසින් කාලීන පදනමක් මත හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම කාරණය ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ සාකච්ඡා කර ඇති අතර අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් වැඩිදුර තොරතුරු සහ ලේඛන ඉල්ලා ඇත.	මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට සමාගම මෙතෙක් සමත් වී නොමැත.
(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු බහාලුම් තැන්පතු ප්‍රමාණය රු. මිලියන 4.57ක් වන අතර එයට 2002 වර්ෂයේ සිට දිගුකාලීන හිඟ මුදල්ද ඇතුළත්ය. මෙම කල් ඉක්ම වූ මුදල් අයකර ගැනීමට සමාගම තවමත් සමත් වී නොමැත.	2022 2023	හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම හිඟ ශේෂයන් කපා හැරීම සඳහා විගණන කමිටුව වෙත යොමු කර ඇති අතර විගණන කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් අනුව ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ වැඩිදුර කටයුතු සිදු කරනු ලැබේ.	මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට සමාගම මෙතෙක් සමත් වී නොමැත.

(ඇ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම රාජ්‍ය ව්‍යවසායක (SOE) HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඉහළින් ස්ථානගත කර ඇති ඕනෑම නිලධාරියෙකුට පිළිවෙලින් මසකට ලීටර් 145 සහ 115 ට සමාන ඉන්ධන දීමනාවක් හිමි වේද, සමාගම විසින් සේවකයින් 28 දෙනෙකු සඳහා ඉහත ඉන්ධන සීමාව ඉක්මවා ලීටර් 200 සිට ලීටර් 600 දක්වා මාසික ඉන්ධන දීමනාවක් ලබා දී තිබුණේ අනුව2023 .

වර්ශයේදී එම නිලධාරීන් සඳහා රුපියල් මිලියන 8.05 ක වැඩිපුර ඉන්ධන දීමනා ගෙවීමක් සිදුකර තිබූ අතර 2023 වර්ෂය තුල ඉන්ධන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයන් 43 දෙනෙකු හටද සමාගම විසින් රුපියල්

2021
2022
2023

අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය බැහැරවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.

ඉන්ධන දීමනාව පදනම් වී ඇත්තේ සේවකයින්ගේ රැකියා කාණ්ඩය, ඉටු කරන ලද කාර්යභාරය ආශ්‍රිතවය. රාජකාරිය අනුව කාර්ය මණ්ඩලයට ගමන් කිරීම (Travel) අවශ්‍ය වේ. මෙම පරිවය ෂෙල් කළමනාකරණය සිට භාවිත කරන ලදී.

ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් ඉන්ධන සීමාව ඉක්මවා මාසික ඉන්ධන දීමනා ගෙවන අතර ඉන්ධන දීමනා සඳහා සුදුසුකම් නොලබන සේවකයින් සඳහාද හටද ඉන්ධන දීමනා ගෙවනු ලබයි.

මිලියන 30.32 ක් ගෙවා තිබුණි.

(ඉ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 27 දිනැති 01/2015 (i) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. නිල වාහනයකට හිමිකම් ඇති නිලධාරියෙකු හට නිල වාහනය භාවිතා කිරීමට හෝ රු 50,000 .ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්පයන් පවති .කෙසේ වෙතත් එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදිය යුතු වේ .නමුත් චක්‍රලේඛ ප්‍රතිපාදන වලට පටහැනිව;	2021 2022 2023	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය බැහැරවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රැකියා කාණ්ඩය සහ අදාළ රාජකාරිය අනුව වාහන දීමනාව සහ ඉන්ධන වෙන් කිරීම සිදු කෙරේ. මෙය අනුගමනය කළ මූලාකෘතිය වන අතර, උද්ධමනය සඳහා සංශෝධන සිදුකර ඇත රැකියා ආශ්‍රිත වාහන අවශ්‍ය සේවකයින් කිහිප දෙනෙකු සඳහා සමාගම නඩත්තු කරන වාහන ඉන්ධන ප්‍රතිපාදන සහිතව සමාගම සතු වාහන ලබා ගැනීමේ හැකියාව මත සපයා ඇත. මෙම සේවකයන් හට ප්‍රවාහන දීමනාවක් ලබාදී නොමැත. සමාගමේ මෙහෙයුම් සිදු කිරීම සඳහා එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වාහන සැපයීම ඉතා වැදගත් වේ.	මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව නියමිත සීමාව ඉක්මවා ප්‍රවාහන හා රියදුරු දීමනා ගෙවනු ලබයි.
(i)	සමාගම විසින් රු. 171,600 සිට රු. 360,360 දක්වා පරාසයක මාසික ප්‍රවාහන දීමනාවක් සේවකයින් 28 දෙනෙකු සඳහා ගෙවා ඇති අතර 2023 වර්ෂය තුළදී රුපියල් මිලියන 149.67 ක් වැඩිපුරද ගෙවා තිබුණි. තවද ඉහත සඳහන් නිලධාරීන්ගෙන් 4 දෙනෙකු සඳහා මාසික රියදුරු දීමනාව ලෙස රුපියල් මිලියන 1.2ක්				

	2023 වර්ෂය තුළදී ගෙවා තිබුණි. සමාගම විසින් ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයින් 147 දෙනෙකු සඳහා මාසික ප්‍රවාහන දීමනාව ලෙස රුපියල් මිලියන 172.3 ක් වර්ශය 2023 තුළ ලබා දී තිබුණි.				
(ii)	සමාගම විසින් 2023 වර්ෂය තුල විකුණුම් සහ අලවි අධ්‍යක්ෂ සඳහා රුපියල් මිලියන 2.7 ක මාසික විනෝදාස්වාද දීමනාවක් ලබා දී තිබුණි.	2021 2022 2023	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අතාවශ්‍ය බැහැරවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.	2020 පෙබරවාරි 21 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරන ලද බලය අනුව 2021 ජනවාරි 18 දිනැති සභාපති/ප්‍රධාන විධායක නිලධාරී ලිපිය මගින් අධ්‍යක්ෂ විකුණුම් සහ අලෙවිකරණ සඳහා විනෝදාස්වාද දීමනාව තීරණය කර අනුමත කර ඇත. විකුණුම් සහ අලෙවි අධ්‍යක්ෂවරයා සෘජුව හැසිරවිය යුතු ප්‍රවර්ධන සිදුවීම්වලට අදාළ බාහිර ක්‍රියාකාරකම් රැසකට සම්බන්ධ වන බැවින්, එම අවස්ථාවන්ට අදාල වියදම් පියවා ගැනීම සඳහා ඔහුට අමතර දීමනාවක් ගෙවීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත.	මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගැනිමකින් තොරව අදාල දීමනා තවදුරටත් ගෙවනු ලබයි.

(ඊ)	2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2015 ජූනි 17 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගේ උපරිම සහභාගි වීමේ දීමනාව රු. 12,500 ක් වන අතර ඔහුට හිමිවනුයේ සහභාගි වීමේ දීමනාව පමණි. කෙසේ වෙතත්, 2020 වසරේ සිට සමාගම විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සඳහා රුපියල් 100,000 ක් බැගින් වූ මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දී තිබුණි.	2021 2023	සමාගම අදාළ වන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.	මෙය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.	විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ගෙවනු ලබන මාසික ප්‍රවාහන දීමනාව සඳහා අනුමැතිය ගෙන නොතිබුණි.
(උ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 වගන්තිය අනුව, රජය සතු ව්‍යවසායන් හි සේවකයින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අමාත්‍යාංශයකට හෝ වෙනත් ආයතනයකට නිදහස් නොකළ යුතු අතර එම කාල සීමාව	2023	සමාගම අදාළ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.	අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව මෙම සේවකයා 2020 පෙබරවාරි 18 වන දින සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ රාජකාරි සඳහා නිදහස් කර ඇති අතර ඔහු එහි කාර්යාල සහකාරවරයෙකු ලෙස සේවය කරනු	2024 ඔක්තෝබර් වන විටත් අදාල සේවකයා නැවත සමාගමේ සේවයට වාර්තා කර නොතිබුනි.

	තුළ නිදහස් කරන ලද සේවකයාට කිසිදු දීමනාවක් නොගෙවිය යුතුය. කෙසේ වෙතත්, සමාගමේ සේවකයෙකු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව අග්‍රාමාත්‍ය කාර්යාලයට තාවකාලිකව නිදහස් කර ඇති අතර 2023 වර්ෂය සඳහා ගෙවා ඇති මුළු වැටුප රු. මිලියන 2.18 කි.			ලැබේ.	
(ඌ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාගේ 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01, සහ 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 දරන චක්‍රලේඛ ප්‍රකාරව 2023 වර්ෂය සඳහා සේවකයින් 71 දෙනෙකු සඳහා ලබා දී ඇති රුපියල් මිලියන 59 ක ඉන්ධන දීමනා, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කිරීමේදී සමාගම විසින් සලකා බලා නොතිබුණි.	2023	සමාගම බදු රෙගුලාසි වලට අනුකූල විය යුතු අතර ඒ අනුව බදු ගෙවිය යුතුය.	සේවකයන්ට ඉන්ධන දීමනාවක් ගෙවනු නොලැබේ. සැබෑ පරිභෝජනය මත ඉන්ධන මාසික පදනමකින් ප්‍රතිපූරණය කරනු ලැබේ. රැකියා ශ්‍රේණිය සහ අවශ්‍යතාවය අනුව එක් එක් සේවකයා සඳහා ඉහළ සීමාවක් සකසා ඇත.	සමාගම බදු රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර නොමැත.
(එ)	ගනුදෙනු වාර්තා කිරීම (සන් පද්ධතිය) සහ විශ්ලේෂණ කිරීම (විෂන් පද්ධතිය) සඳහා සමාගම පද්ධති දෙකක් භාවිතා කරනු ලබයි. රජයේ විගණනය විසින් එම පද්ධති වෙත ප්‍රවේශ පහසුකම් ඉල්ලා	2023	ජාතික විගණන පනතට අනුකූලව කළමනාකරණ තොරතුරු පද්ධති සඳහා අවශ්‍ය ප්‍රවේශය කළමනාකරණය විසින් ලබා දිය යුතුය.	විගණනයට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා නිළධාරීන් දෙදෙනකු යොදවා ඇත.	මේ වන තුරු ප්‍රවේශ පහසුකම් ලබා දී නොමැත.

	ඇත. නමුත්, සමාගම විසින් සන් පද්ධතියට පමනක් ප්‍රවේශ පහසුකම් ලබා දී තිබුණි. එමනිසා, සවිස්තරාත්මක ගිණුම් තොරතුරු බැලීමට, එම දත්ත විශ්ලේශණය කිරීමට නොහැකි වීම මගින් විගණනයේ කාර්යක්ෂමතාව සීමා වී ඇත.				
(ඒ)	සමාගම 2017 දී එහි පද්ධතිය පෞද්ගලික උපදේශන සේවා ආයතනයක් සම්බන්ධ කර ගෙන තක්සේරු කර ප්‍රධාන ගැටළු හඳුනාගෙන ඒවා විසඳීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධති විසඳුමක් නිර්දේශ කර තිබුනි. එම වාර්තා කරන ලද නිරීක්ෂණ මත පදනම්ව, ව්‍යාපෘති කමිටුව 2020 දෙසැම්බර් 21 වන දින ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික සමාගම් දෙකක සේවය ලබා තිබුණි.සමාගම පසුව මෙම ව්‍යාපෘතිය නතර කර ඇති අතර 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නැවත ආරම්භ කර ඉහත කී පුද්ගලික සමාගමක් වෙත අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 23.7	2023	ව්‍යාපෘතියේ සාර්ථකත්වය ලබා ගැනීම සඳහා වැඩිදියුණු කිරීම් සිදු කළ හැකිව තිබූ ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ව්‍යාපෘති කළමනාකරණ භාවිතයන් වැඩි දියුණු කිරීම සඳහා සමාගම විසින් පශ්චාත් ක්‍රියාත්මක කිරීමේ සමාලෝචනයක් (PIR) සිදු කිරීම.	2022 වර්ශයේ ව්‍යාපෘති නැවැත්වීමේ රජයේ තීරණය අනුව කටයුතු කර ඇත.	මෙම ව්‍යාපෘතිය නැවත සක්‍රීය කිරීමේ හැකියාව පිළිබඳව පසු සමාලෝචනයක් මේ දක්වා සිදු කර නොතිබුණි.

	ක් සමාගම විසින් ගෙවා ඇත. මීට අමතරව, සමාගම ERP බෙදාහැරීම් සමාලෝචනය කිරීම සඳහා පෞද්ගලික උපදේශන සමාගමක් නැවත සේවයේ යොදවා එම සමාලෝචනය සඳහා රුපියල් මිලියන 1.9 ක් සහ 2021 සහ 2022 දී සැලැස්ම සඳහා රුපියල් 972,000 ක් ගෙවා ඇත. නමුත් මෙම උත්සාහයන් සහ ආයෝජනද සිදුකර තිබියදීත්, ව්‍යාපෘතිය නැවත නතර කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සමාගම රුපියල් මිලියන 30.37 ක මුළු පිරිවැයක් දරා ඇති අතර, අදාල පද්ධතිය සම්පූර්ණ කර නැත.				
(ඔ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 සහ 4.2.3 අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වයක් අපේක්ෂිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සහ කාලසටහන සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් මුළු වටිනාකම රු. මිලියන 659.12 ක් පමණ වන ප්‍රසම්පාදන කටයුතු 129 ක් සඳහා ඉහත	2022 2023	සමාගම විසින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කෙරෙන කාලානුක්‍රමික අනුපිළිවෙලින් ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතුය.	රුපියල් මිලියන 50 කට වැඩි වටිනාකමකින් යුත් (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විශාල කොන්ත්‍රාත්) ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ කාලසටහන රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ආයතනය වෙළඳපල මිල සැදහුම් මට්ටමේ ප්‍රසම්පාදන සඳහා	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් 2024 වර්ශය සඳහාදසකස් කර නොතිබුණි.

	මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි.			ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරනු නොලැබේ.	
(ඕ)	2022 ඔක්තොම්බර් 06 දිනැති අංක 06/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ IV ඡේදයට අනුව වයස අවුරුදු 60 ඉක්මවූ රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයින් 2022 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාම ගැන්විය යුතුය. වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් නව දෙනෙකු දැනට සේවයේ යොදවා ඇති අතර අධ්‍යක්ෂ ප්‍රසම්පාදන වැනි ප්‍රධාන තනතුරුද ඇතුළත් වන අතර, එම තනතුරු සඳහා 2023 සහ 2024 වසර සඳහා පිළිවෙලින් රු. මිලියන 35.8 ක් සහ රු මිලියන 29.97 පමණ ගෙවා ඇත .	2023	සමාගමට මානව සම්පත් කළමනාකරණය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් තිබිය යුතු අතර චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූල විය යුතුය.	ලිට්රෝ සමාගමේ සියලුම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ මුල් සේවා කොන්ත්‍රාත්තුවට අනුව වයස අවුරුදු 60 ට ළඟා වන විට විශ්‍රාම යන අතර ඔවුන්ගේ ස්ථිර සේවක තත්ත්වය එදින සිට අවසන් වන අතර වසර 60 සම්පූර්ණ වීමෙන් පසු එම පත්වීම දිගටම කරගෙන යාමට අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් සේවකයාට සමාගම විසින් යෝජනා කරනු ලබයි.	සමාගමට තවමත් මානව සම්පත් කළමනාකරණය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් පිළියල කර නොමැති අතර තවමත් අදාල සේවකයින් සේවයේ යොදවා ඇත.
(ක)	රේඛීය අමාත්‍යාංශය විසින් නම් කරන ලද සභාපතිවරයා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (මව් සමාගම) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇති අතර,පසුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද	2021 2022 2023	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමතුලිතතාවය පවත්වා ගැනීමට සහ ලබැදියාවන් අතර ගැටුම් වළක්වා ගැනීම සඳහා සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන ප්‍රබල ගැටුම්කාරී භූමිකාවන් දෙක වෙන් කිරීම නිර්දේශ කෙරේ.	එම් එස් ජී පීරිස් මහතා ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමෙහි (LGLL) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන දෙඅංශයෙන්ම පත් කිරීමට ගත් තීරණය හදිසි මෙහෙයුම් අර්බුදයකට විසඳුම් සෙවීමේ	සමාගම සඳහා නව සභාපතිවරයකු පත් කර ඇති අතර ප්‍රධාන විධායක නිලධාරියකු මේ දක්වා පත් කර නොමැත.

				2019 වර්ෂයේ සිට පත්කර තිබුණි. 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.2.2 මාර්ගෝපදේශය අනුව, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වන අතර මාර්ගෝපදේශ 2.5.1 අනුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වන්නේ උපායමාර්ගික, උපායශීලී සහ මෙහෙයුම් සැලසුම් සකස් කිරීම වේ. මෙම තනතුරු දෙකෙහිම රාජකාරි එකම පුද්ගලයෙක් විසින් ඉටු කිරීම යහපාලන පරිවයන්ට පටහැනි වේ.	අවශ්‍යතාවය මත සිදු වූ අතර එය සමාගමේ සහ ජාතියේ යහපත උදෙසා ගනු ලැබීය. ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු සිටීම යහපාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. 2024 අගෝස්තු 13 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම තීරණය පිළිබඳව සලකාබලා ඇති අතර 2025 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කර ඇත.	
(ග)	2021 නොවැම්බර් 16 දිනැති සහ 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 4.2 මාර්ගෝපදේශයට අනුව විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් වත් රැස්වී එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම 2022 හා 2023 වර්ෂවලදී	2022 2023	විගණන කමිටුව කාලීනව රැස්විය යුතු අතර සමාගමේ මූල්‍ය සහ අනෙකුත් අදාළ කටයුතු සමාලෝචනය කළ යුතුය.	අවම අවශ්‍යතාවය සපුරා නැතත්, විගණන සැලැස්ම ආවරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත්තේ 2023 වර්ෂය තුළදීය. කෙසේ වෙතත්, අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමේ අවශ්‍යයතාව 2024 වර්ෂය තුළ දී සම්පූර්ණ කරනු ඇත.	වර්ෂය 2024 සඳහා 2024 ඔක්තෝබර් වන විට සමාගම විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 2ක් පවත්වා තිබුණි.

	පිළිවෙළින් රැස්වීම් 3 ක් හා 2 ක් පමණක් පවත්වා තිබුණි. තවද, 2023 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණන කමිටුව විසින් සමාලෝචනය කර නොමැති බව නිරීක්ෂණය විය.				
(ව)	2023 සඳහා ඇස්තමේන්තුගත ගෑස් විකුණුම් ආදායම රුපියල් බිලියන 108.64 ක් වන අතර සත්‍ය ආදායම රු. බිලියන 87.37 ක් වූයෙන් වෙනස රු. බිලියන 21.27 ක හිඟයක් විය. ආදායම් ලභා කර ගෙන නොමැති උවද,2023 වර්ෂය සඳහා විකුණුම්, අලෙවිකරණ සහ ප්‍රවර්ධන වියදම් සඳහා සමාගම රු.මිලියන 338.98 ක් වැය කර තිබුණි.එය 2022 වසර හා සසඳන විට 304% ක වැඩිවීමකි. 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 18 වන වගන්තිය යටතේ 2022 ජූලි 08 දිනැති අංක 2287/37 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් කරන ලද සංශෝධනයට අනුව ද්‍රව බනිජ තෙල් ගෑස් අත්‍යාවශ්‍ය භාණ්ඩයක් ලෙස නම් කර ඇති අතර සමාගම සතු	2023	අයවැය ගිණුම් මූල්‍ය පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිතා කළ යුතු අතර අනවශ්‍ය වියදම් සමාගම විසින් වළක්වා ගත යුතුය.	2023 දී විනිමය අනුපාතික අර්බුදය නිසා LPG සිලින්ඩර ආනයනය කිරීමට ඇති හැකියාව අඩු විය. ආනයනය සඳහා වූ බාධාවන් නිසා පවතින ඉල්ලුම සපුරාලීමට අපට ඇති හැකියාව සීමා විය.	2024 වර්ෂය සඳහාද රු. මිලියන 139 ක අලවිකරණ ඇස්තමේන්තුවක් පිළියල කර තිබුණු අතර ඉන් රු.මිලියන 135 ක් 2024 සැප්තැම්බර් වන විට වැය කර තිබුණි.

වෙළඳපොළ කොටස 85% ක් වේ. එබැවින්,ගෑස් අලෙවිකිරීම සඳහා ඉහළ ප්‍රචාරණ වියදමක් දැරීමේ අවශ්‍යතාවය හා තාර්කික බව විගණනයේදී නිරීක්ෂණය කළ නොහැකි විය. තවද, පසුගිය වසර 5 සඳහා සමාගමේ සාමාන්‍ය වෙළඳපල කොටස 80% ක් පමණ වේ.

3.57 දුරස්ථ ඉගෙනුම් ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	128,977,651	9,045,217	119,932,434	(3,863,535)	තත්ත්වාගණනය නොකළ
2022	143,529,611	15,974,078	127,555,533	(2,197,283)	තත්ත්වාගණනය නොකළ
2023	146,776,961	10,068,757	136,708,204	8,699,112	තත්ත්වාගණනය නොකළ

අ/අ	විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් සහ අනෙකුත් ක්‍රියාකාරකම්වලින් රු.58,111,029ක ආදායම් උපයා ගැනීමට අපේක්ෂා කර තිබුණද, රු.24,067,890ක් හෙවත් සියයට 41ක් පමණක් උපයාගෙන තිබුණි. එසේම, නව වැඩසටහන්, ප්‍රාදේශීය පුහුණු සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළයුතුව තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.	2022	අයවැය, කළමනාකරණ පාලන කාරකයක් ලෙස සලකා ඒ අනුව කටයුතු කළ යුතුය.	පුද්ගලික අංශය හා අනෙකුත් රාජ්‍ය නොවන ආයතන ඉලක්ක කරගත් අලෙවිකරණ උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කිරීම හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය හරහා පුහුණු පිරිවැය අවම කිරීමට සැලැසුම් කිරීම සිදු කරන බව.	2024 වර්ෂයේ උපයාගත් ආදායම රු.25,377,469ක් පමණක් විය. එයින් සියයට 34 ක්ම පහසුකම් සැපයීම වෙනුවෙන් ලබාගත් ආදායම විය.
(ආ)	වසර 5 කට වැඩි කාලයක් තිස්සේ ලැබිය යුතු බදු ලෙස දක්වා තිබූ රු.4,136,528 ක්	2023	අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අවසාන ගිණුම්වල හානිකරණ ගැලපීම් සඳහා සලකා බැලිය යුතු අගය තක්සේරු	නිරවුල් කර නැත.

	නිරවුල් කරගෙන නොතිබුණි.			කිරීමට 2023 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.	
(ඇ)	2006 වර්ෂයේ නිකුත් කළ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 අනුව විධිමත් පිළිගැනීමේ ලිපියක් හෝ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව පුහුණු වැඩසටහන් සඳහා පුද්ගලික ආයතනයකට ආහාර සැපයීමේ සේවාව ලබා දී ඇති අතර වර්ෂය තුළ ආහාර සැපයීමේ සේවාව සඳහා එම සමාගමට රු.1,751,230 ක මුදලක් ගෙවා තිබුණි.	2021/ 2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය.	2025 වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කරන බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නැත.
(ඈ)	2020, 2021 සහ 2022 යන වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	2023	වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි.	2020 සහ 2021 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.	2022 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නැත.

3.58 සී/ස කන්තලේ සීනි කර්මාන්තායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

2021, 2022 සහ 2023 වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත

අ/අ	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 4 කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ	2020 – 2023 ගනුදෙනු වාර්තාව	චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	1994 වර්ෂයේ සිට මේ දක්වා සමස්ත මුදල් රේඛීය අමාත්‍යාංශය වෙතින් ලබාදෙනු ලබන අතර ආදායම් හා වියදම් පිළිබඳව සටහන් මුදල් පොත්වල පවත්වාගෙන යනු ලබයි. කර්මාන්තායතනය ට අදාළ 2020,2021 වර්ෂ වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සකසා ඇති අතර 2022, 2023 වර්ෂ වලට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවති.	2020 – 2023 වර්ෂ 4 කට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත.

	දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.				
(ආ)	1957 වර්ෂයේදී ආරම්භ කරන ලද කන්තලේ සීනි කර්මාන්තායතනය වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් 16,320 ක, මොලැසස් මෙට්‍රික් ටොන් 9,000 ක හා පරිපාරක ස්ප්‍රිතු ලීටර් මිලියන 3.9ක නිෂ්පාදන ධාරිතාවයකින් යුක්ත විය. කර්මාන්තායතනයේ පරිපාලනයේ හා මෙහෙයුම්වල පැවති දැඩි අකාර්යක්ෂමතාවය හා අක්‍රමවත්භාවය වැනි කරුණු මත 1994 වර්ෂයේදී 1,133 ක් වූ සියලු සේවකයන්ට පාරිතෝෂික ගෙවමින් සේවය අවසන් කර තිබුණු අතර එතැන් පටන් කිසිම නිෂ්පාදන කටයුත්තක් නොමැතිව කර්මාන්තායතනය වසා දමා තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට රු.3,179,245 ක ඍණ ශුද්ධ වත්කම් තත්ත්වයක්ද නිරීක්ෂණය විය. එසේම 2021 වර්ෂයේදී කර්මාන්තායතනයේ නිෂ්පාදන ඇරඹීමට පෞද්ගලික සමාගම් දෙකක් සමඟ	2020 – 2023 ගනුදෙනු වාර්තාව	කර්මාන්තශාලාවේ මෙහෙයුම් කටයුතු කඩිනමින් කළමනාකරණය කළ යුතුය.	මෙම ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලික කටයුතු මුදල් අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකර ඇත.	2024 නොවැම්බර් 30 දින වන විටත් කර්මාන්තායතනයේ මෙහෙයුම් ආරම්භ කර නොමැත.

	අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණද මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වීමෙන් මෙම කර්මාන්තායතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිතව පවතී.				
(ඇ)	කන්තලේ සීනි කර්මාන්තායතනය වෙත 1957 වර්ෂයේදී අංක 11212 දරන ගැසට් පත්‍රය මඟින් අක්කර 21233 රූඩ් 2, පර්චස් 30 ක (හෙක්.8,596) ඉඩම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශ විසින් ලබා දී තිබුණු අතර එම ඉඩම් කලාප 4 ක් සඳහා හෙක්ටයාර් 4,887 ක් ද ගොවිපළ, සීනි කම්හල හා නිවාස සංකීර්ණය, යොවුන් සේනාංකය, සරණාගතයන්, කැළෑව, ඇලවල් හා පාරවල් සහ යුධ හමුදා කඳවුරු වෙත ඉතිරි හෙක්ටයාර් 3,709 ක් ද වශයෙන් වෙන්කර භාවිතා කර තිබුණි. වර්තමානයේදී එම භූමි ප්‍රමාණයෙන් අක්කර 500 බැගින් පුද්ගලික ආයතනයකට හා රාජ්‍ය ආයතනයකට පවරා තිබුණද ඒ සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	2020 – 2023 ගනුදෙනු වාර්තාව	තම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධයෙන් තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට රේඛීය අමාත්‍යාංශය විසින් නොපමාව කටයුතු කළ යුතුය.	කන්තලේ සීනි කර්මාන්තායතනයට අයත් ඉඩම් සම්බන්ධයෙන් කටයුතු ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරයි.	වැවිලි අමාතයාංශය යටතේ පවතින මෙම කර්මාන්තායතනයේ ඉඩම් පැවරීම සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොමැත.

(ඇ)	1999 වර්ෂයේ සිට කර්මාන්තායතනයේ කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවුවද වත්කම් ආරක්ෂා කිරීම සහ අනෙකුත් කාර්යයන් සඳහා පමණක් සාමාන්‍යාධිකාරි ඇතුළු අතීතයේදී වන්දි ලබා ඉවත් වූ සේවකයින් 33 ක් එනම් ආරක්ෂක නිලධාරීන් 3 ක් හා නියාමකවරුන් 15 ක්, රියදුරන් 4ක්, ගබඩාකරුවන් 3 ක්, පොත් තබන්නා ලිපිකරු 6 ක් හා කාර්මික උදව්කරුවන් 2 ක් වර්තමානයේද සේවය කරමින් සිටින අතර 2020, 2021, 2022 හා 2023 වර්ෂයන්හි වැටුප් හා දීමනා, අතිකාල දීමනා සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් සඳහා පිළිවෙලින් රු.14,822,246 ක්, රු.15,000,761 ක්, රු.16,838,619 ක් හා රු.16,569,952 ක් ගෙවීම්කර තිබුණි.	2020 – 2023 ගනුදෙනු වාර්තාව	රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට වගකිවයුතු පාර්ශවයන් විසින් නොපමාව කටයුතු කළ යුතුය.	1994 මාර්තු 31 සිට මේ වන තෙක් කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවන අතර, පවතින වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා සේවකයින් 230ක් රඳවාගන්නා ලදි. එම සේවකයින් අතරින් කිහිපදෙනෙක් මියගොස් ඇති අතර ඇතැම් සේවකයන් ඉල්ලා අස්ව ඇත. වර්තමානය වනවිට සේවකයින් 33 දෙනෙක් ඉතිරිව ඇත. දැනට ඉතිරිව සිටින සේවකයින්ගේ වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇත.	කිසිදු මෙහෙයුම් කාර්යයක් සිදු නොවන මෙම ආයතනය විසින් සේවකයින් 33කට වැටුප් හා දීමනා ගෙවීම් කරන අතර නිශ්ක්‍රියව පවතින රාජ්‍ය සම්පත් ඵලදායී උපයෝජනයක යොදවාද නොමැත.

3.59 ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්.) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,887,731.42	3,037,164.61	10,850,566.81	196,388,57	තත්ත්වාගණනය කල
2022	16,297,269.65	2,916,630.43	13,380,638.62	2,530,071.81	තත්ත්වාගණනය කල
2023	-	-	-	-	-

අ/අ	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතේ 2 ඡේදය ප්‍රකාරව සමාගම විසින් මෙහෙයුම් පද්ධති සහ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබුණි.	2021	චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය.	මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	සමාගමේ සිටින සිමිත කාර්ය මණ්ඩලය තුල හැකි අයුරින් මෙහෙයුම් පද්ධති සහ පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ඇත. සමාගමේ උපායමාර්ගික සැලැස්ම අනුව 2027 -2028 වර්ෂයන්හිදී ව්‍යවසාය සම්පත් සැලැස්මක් (ERP) සකස් කිරීමට සැලසුම් කර ඇත.
(ආ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත	2021	චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොත අනුව කටයුතු කල යුතුය.	කාර්යසාධන දර්ශක සකස් කර සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇති අතර ඉදිරියේදී සමාලෝචනයට	2024 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී මේ සම්බන්ධයෙන් සමාලෝචනයන්

	ඡේද අංක 7.3 අනුව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලික කාර්යසාධන දර්ශක (KPI) අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය සමඟ (KPI) කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.			ඉදිරිපත් කරනු ලැබේ.	සිදු කරනු ලැබේ.
(ඇ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 6.6 අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 20 ක් ප්‍රමාද වී එනම් 2023 ඔක්තෝබර් 30 වන දින ද 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 12 ක් ප්‍රමාද වී 2024 මාර්තු 05 දින ඉදිරිපත් කර තිබුණි.	2022	චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව කටතු කල යුතුය.	ඉදිරියේදී වාර්ෂික වාර්තාවන් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	2023 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා අවසන් ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයේ අදාල වාර්තාවන් නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.
(ඈ)	2022 වර්ෂයට අදාලව සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවීම ප්‍රමාද වීම මත රු.169,225 ක අධිභාර පනවා තිබුණද එම අධිභාර මුදල් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන	2022	පනත් මඟින් නිර්දේශිත ව්‍යවස්ථාපිත අවශ්‍යතා අනුව කටයුතු කල යුතුය.	2022 වර්ෂයට අදාලව සේවක අර්ථසාධක අරමුදල සඳහා රු.169,225 ක අධිභාර සමාගම වෙත පනවා නොමැත.	සේවක අර්ථසාධක අරමුදල සඳහා පනවා ඇති අධිභාරය 2022 මූල්‍ය ප්‍රකාශන සකසන අවස්ථාවේදී

තුළින් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	සමාගම වෙත ලැබී නොතිබුණි.

3.60 ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	7,861,493	8,823,109	(961,616)	(328,912)	තත්ත්වාගණනය නොකල
2022	32,202,575	25,685,688	6,516,887	7,478,503	තත්ත්වාගණනය නොකල
2023	26,305,183	21,802,544	4,502,639	(2,014,248)	තත්ත්වාගණනය කල

අ/අ	විගණන නිරීක්ෂනය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	පිරිවැය රුපියල් මිලියන 5.2 ක් වන දේපල පිරියත උපකරණයන්හි පැවැත්ම තහවුරුකිරීම සඳහා ස්ථාවර වත්කම සත්‍යාපන සමාගම විසින් සිදුකර නොතිබුණි. තවද, මෙම වත්කම් සියල්ල 2013 වසරේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.	2021,2022 ,2023	භෞතික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීමට කටයුතු කලයුතුය.	2024 වර්ෂ අවසන් වත්කම් සත්‍යාපනය කිරීමට අවශ්‍යය කටයුතු යොදා ඇත.	සත්‍යාපන මණ්ඩල පත්කර නොමැත. වත්කම් සත්‍යාපනය අවසන් වූ වහාම අදාළ වාර්ථා විගනණය සඳහා යොමු කෙරෙනු ඇත.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීනව නොගෙවූ වෙළෙඳ සහ වෙනත් ලැබියයුතු ශේෂය රුපියල් මිලියන 9.47 ක් විය. එම ශේෂයෙන් රුපියල් මිලියන 9.41 ක් වසර 05 කට වඩා ඉතිරිව තිබුණි. සමාගම විසින් ණයගැතියන්ගෙන් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග	2022,2023	දීර්ඝකාලීන ලැබිය යුතු මුදල් අයකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	මෙම ලැබිය යුතු මුදල් නැවත අය කර ගැනීමට ඇති අවස්ථා අනුව ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.	අයකර ගෙන නොමැත. ඒවා පොත් වලින් ලිහා හැරීමට අදාල අනුමැතියනට යොමු කිරීමට කටයුතු යොදමින් පවතී.

	ගෙන නොමැතිබව නිරීක්ෂණය විය. කෙසේවෙතත්, වසර 05 කට වැඩි ශේෂ සඳහා රුපියල් 9.35 ක් හානිකරණය කර ඇත.				
(ඇ)	ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ එක් ප්‍රධාන ව්‍යාපාරයක් වන විදුලි කණු නිෂ්පාදනය තත්ව පරීක්ෂාව අසමත් වීම හේතුවෙන් 2013 වසරේදී නවතා දමා තිබුණි. ඉන්පසු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කණු වල ගුණත්වය ඉහල නංවමින් නැවත විදුලිකණු නිෂ්පාදනය ඇරඹීම හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීම හෝ සිදුකර නොතිබුණි. තවද, 2023 දෙසැම්බර් 31 දිනට සමාගම රුපියල් මිලියන 20.5 ක සමුච්චිත අලාභ වාර්ථාකර තිබුණි.	2021,2022 ,2023	ගුණත්වය ඉහල දමමින් කණු නිෂ්පාදනය නැවත ආරම්භ කිරීමට හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනාගැනීමට කටයුතු කලයුතුය.	ව්‍යපෘති කිහිපයකම ශක්‍යතා අධ්‍යයනයන් සිදුකරන ලදී.	විදුලි කණු නිෂ්පාදනය ආරම්භකර නොමැති අතර වඩාත් යෝග්‍ය ව්‍යපෘතියක් තෝරා ගැනීමට කටයුතු යොදමින් සිටී.

3.61 සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,241,273,362	722,169,972	519,103,390	61,251,801	තත්ත්වාගණනය නොකල
2022	1,238,941,583	811,031,354	427,910,229	(106,184,727)	තත්ත්වාගණනය කල
2023	1,736,966,432	993,370,037	743,596,395	325,256,881	තත්ත්වාගණනය නොකල

අ/අ	විගණන නිරීක්ෂනය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තා වලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට සමාගම පෙර වර්ෂ වලට අදාලව රුපියල් මිලියන 23.4 ක හිඟ බදු සහ දඩ මුදල් ගෙවිය යුතුව තිබුණි. සමාගම මෙම හිඟ බදු වගකීම මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණු අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2022 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණයෙන් වගකීම් අඩුවෙන් හා රඳවාගත් ඉපැයීම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	2022	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අදාල ගෙවීම් පිළිබඳ සමථයකට පත් කර ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ගණකාධිකාරීවරයා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සහ සමාගමේ බදු උපදේශකවරයා සමඟ බදු මුදල රුපියල් මිලියන 23.4 සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත. බදු උපදේශකවරයා සාංගමික ආදායම් බදු- (CIT) සම්බන්ධයෙන් අභියාචනයක් යවා ඇති අතර සමාගම විසින් මෙම ගෙවීම් නිවැරදිව සිදු කර ඇති බැවින් ගෙවිය යුතු වැටි බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇත.	1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමාගම විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සලකා බැලූ අතර කේත අංක 1820 සඳහා සඳහන් කළ වැටි බදු පැහැර හැරීම දැනටමත් නිවැරදි කර ඇත. 2. දඩය ඇතුළුව රුපියල් 15,134,322 ක මුදල නිවැරදි කර ඇත. 3. ගණකාධිකාරී වරයා 2024 අවසන් වීමට පෙර ආරවුල්

					ඇති ශේෂ බදු මුදල් වර්ග කිරීමට IRD සමඟ සම්බන්ධීකරණය කරනු ඇත.
(ආ)	2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වැනි වගන්තියට අනුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට (2011 වසරේ සිට පැවතින) ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද රුපියල් මිලියන 12.4 ක් බව නිරීක්ෂණය විය.	2023	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගැටලුව නිරාකරණය කළ යුතුය.	ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරීම.	1. කාලපරිච්ඡේද කිහිපයක් සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ඉවත් කර ඇත. 2. මෙම කාරණය සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලෙගසි (Legacy) ඒකකයෙන් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගණකාධිකාරී වරයා වෙත දන්වා ඇත.

3.62 කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	1,346,533,985	741,556,996	604,976,989	104,976,979	තත්ත්වාගණනය නොකල
2023	1,831,719,203	1,056,677,872	775,041,331	170,064,342	තත්ත්වාගණනය නොකල

අ/අ	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13 (ආ) වගන්තිය ප්‍රකාරව සමාගමක කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳව විධිවිධාන සැලැස්විය යුතුය. කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ අංක 02 ප්‍රකාරව සමාගම, භාණ්ඩාගාරයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර පොදු ගිවිසුමක් (Master Agreement) ඇති කරගත යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2022 2023	2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කළමනාකරණ ගිවිසුම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ බදු ගිවිසුම දැනටමත් අත්සන් කර ඇති බැවින් ප්‍රධාන ගිවිසුමේ අවශ්‍යතාවය ඉවත් කරමින් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීමට එකඟ වීම.	2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ)	2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව	2022 2023	2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව	2024 ජූනි 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත හා එවැනි සේවකයින්	2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර
(i)	2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ තීරණ අංක 13 ට අනුව වැටුපට අමතරව ගෙවනු ලබන සියලු දීමනා සඳහා රජයේ චක්‍රලේඛ අදාළ කරගත යුතු බව දක්වා තිබියදී ඉහළ කළමනාකරණ මට්ටමේ (HM1) නිලධාරීන්ට ඉන්ධන දීමනාව ලෙස මාසික තෙල් ලීටර් ප්‍රමාණය ගෙවිය යුතු වුවද සමාගම විසින් ඊට පටහැනිව 2023 වර්ෂයේ නිලධාරීන් 19 කට රු. 4,441,459 ක් ගෙවා තිබුණි.		කටයුතු කළ යුතුය.	විසින් සිදුකරනු ලබන කාර්යයයේ ස්වභාවය මත ඉන්ධන හා ප්‍රවාහන දීමනා ගෙවීම.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii)	නිල වාහන හිමිකාරීත්වය හිමි නොවන නිලධාරීන් 20 කට 2023 වර්ෂයේ වාහන දීමනා ලෙස රු. 4,231,577 ක් ගෙවා තිබුණි.				
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය ප්‍රකාරව බදු පසු ලාභයෙන් අවම ලෙස සියයට 30 ක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරය	2022 2023	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ, අනාගත ව්‍යාපාර පුළුල් කිරීම සඳහා යෙදවීමට අධ්‍යක්ෂ මණ්ඩලය නියම කළ අතර ඊට අදාළ අනුමැතිය රාජ්‍ය ව්‍යාපාර	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. තවද සමාගමේ මුළු ප්‍රාග්ධනයම භාණ්ඩාගාරය සතු වන බැවින් උක්ත සියයට 30 ක ලාභාංශයට අතිරේකව ඉතිරි ලාභාංශයද භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.			දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කිරීම.	
(ඇ)	රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ප්‍රකාරව, සමාගමේ රු. 393,621,112 ක් වූ ස්ථාවර වත්කම් හා ගබඩා ද්‍රව්‍ය වාර්ෂික සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද 2024 මැයි 27 දින දක්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මිලදී ගත් භාණ්ඩ වසර 2 ක්වත් සම්පූර්ණ නොවීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොමැත	රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඉ)	කොළඹ නෙලුම් කුලුන පිළිබඳ භෞතික පරීක්ෂාවේදී කුලුනේ නැරඹුම් මහලේ බිත්ති ආලේපවලට හානිවන ලෙස නම් හා විවිධ රූප ඇඳ තිබුණි. එම හානි අවම කිරීම සඳහා රු. 1,084,050 ක් වැය කර නැරඹුම් පීටිකාවේ විදුලි ආලෝකයෙන් දැල්වෙන ප්ලාස්ටික් පුවරු සවි කළද ඒවාද නරඹන්නන් විසින්	2022 2023	අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය.	ප්ලාස්ටික් UV Light Board සවිකිරීමට එකඟ වීම.	අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

හානිකර තිබුණි. කුලුන තුළ ආරක්ෂක කැමරා පද්ධති සවිකර එහි ක්‍රියාකාරීත්වය සඳහා සේවකයින් යොදවා තිබුණද එම හානිය ගණනය කිරීමට හා හානි කළ පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

3.63 ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,340,406,496	1,641,175	1,338,765,321	(60,738,483)	තත්ත්වාගණනය කල
2022	1,276,226,059	5,829,381	1,270,396,678	(51,364,173)	ව්‍යාවනය කල
2023	1,629,473,504	5,695,782	1,623,777,722	355,812,551	තත්ත්වාගණනය කල

අ/අ	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ කළමනාකරණ මණ්ඩලය විසින් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පසුගිය වසර කිහිපය තුළ දී කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. සමාගම පසුගිය වසර 06 ක කාලය තුළ ලද ස්ථාවර තැන්පතු පොළී ආදායම හා කොටස් සඳහා ලැබූ ලාභාංශ ආදායමින් රු.31,621,843 ක් පරිපාලන වියදම් ලෙස දරා තිබුණි. ඒ අනුව කිසිදු ක්‍රියාකාරකමක් නොමැතිව සමාගම තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුණි.	2021, 2022, 2023, 2024	පරිපාලන වියදම, අරමුණු ඉටු කිරීමට සමගාමීව දැරිය යුතුය.	එකග වේ. නව කලමණාකාරිත්වය යටතේ * මාර්ග යෝග්‍යතාව (Road worthiness) * කාර්මික රසායනගාරය (Industrial Laboratory) *සූර්ය පැනල (Solar Panels) යන නව ව්‍යාපෘති 3 හඳුනා ගෙන ක්‍රියාවට නංවීමට කටයුතු කර ඇති අතර ඉන් පළමු ව්‍යාපෘති දෙකහි ශක්‍යතා අධ්‍යනයක් සිදුකරමින් පවතී. ඒ අනුව ඒ තුළින් උපද්දවන අදායම් මඟින් අනාගතයේ ආයතනයේ පරිපාලන වියදම් දැරීමට අපේක්ෂා කර තිබුණි.	කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොමැත.

(ආ)	සමාගමේ සේවයෙන් ඉවත් වූ සේවකයන් වෙනුවෙන් වෙන්කරන ලද රු.1,514,896 ක් වූ පාරිතෝෂික දීමනා වලට අදාළ උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023, 2024	විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.	එකඟ වේ. මීට අදාල කිසිදු උප ලේඛනයක් මීට පෙර පැවති පාලන අධිකාරියෙන් ලැබී නොමැති අතර මේ සඳහා නඩු කටයුත්තක්ද පවතී. නඩුවේ තීරණයට අනුව කළමණාකාරීත්වයේ තීරණ මත උචිත ගැලපීම් ඉදිරියේදී සිදු කරන බව දන්වා තිබුණි.	උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොමැත.
(ඇ)	2007 අංක 07 දරන සමාගම් පනතේ 132 වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තාව සමඟ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රකාශය සහ අධ්‍යක්ෂකවරයෙකු හා සමාගමේ ලේකම්වරයා අත්සන් කරන ලද සහතිකය 2018 වර්ෂයේ සිට සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට යැවීමට කටයුතු කර නොතිබුණි.	2023, 2024	සමාගම් පනත පරිදි කටයුතු කළ යුතුය.	මේ දක්වා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්වීම සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත්තේ සමාගමේ හිටපු අධ්‍යක්ෂක මහා භාණ්ඩාගාරයේ නියෝජිත හිමාලි බෝගොඩගෙදර මහත්මිය යථා පරිදි සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් නොකිරීම හේතුවෙන් බව දන්වා තිබුණි.	වාර්තා මෙතෙක් යවා නොමැත.

3.64 ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	104,493,622	40,977,344	63,516,279	(9,880,554)	තත්ත්වාගණනය කල
2022	111,716,728	64,279,403	47,437,325	(20,197,033)	තත්ත්වාගණනය කල
2023	138,731,172	65,199,846	73,531,325	28,039,032	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23 (අ) වගන්තිය ප්‍රකාරව වාහන සේවා කටයුතු සිදු කරන ආයතන විසින් ඊට අදාළව බලපත්‍රයක් ලබා ගත යුතු වුවද, සමාගම මේ දක්වා එම බලපත්‍රය ලබා ගෙන නොතිබුණි.	2021	පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	අදාළ පාරිසරික බලපත්‍ර ලබාගෙන නොතිබුණි.
(ආ)	ආයතනය සතු වාහන 07 වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අළුත්වැඩියා වියදම රු.1,390,393 ක් වී තිබුණි. මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 371 ක වැඩි වීමක් වී තිබුණි. නමුත් අළුත්වැඩියා කරන ලද වාහන 02 ක් වර්තමානය වන විට	2021	අළුත්වැඩියා වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	අළුත්වැඩියා කරන ලද බස් රථ 2 තවදුරටත් ධාවනය කිරීමට නොහැකි අතර, ත්‍රී රෝද රථ 2 ක් ද, ධාවනය කිරීමට නොහැකි තත්වයේ පවතී.

	ධාවන තත්ත්වයේ නොමැති බවට විගණනයේ දී නිරීක්ෂණය විය.				
(ඇ)	ටෙන්ඩර් කොන්දේසි අනුව ටෙන්ඩරය හිමිවන තැනැත්තන් අදාළ භාණ්ඩ ඉවත්කර ගැනීමට ප්‍රථම රුපියල් ලක්ෂ 05ක මුදලක් ආයතනයේ ජංගම ගිණුමේ තැන්පත් කළ යුතු වුවත්, ටෙන්ඩර් ලබා ගත් ටෙන්ඩර්කරුවන් 17 දෙනෙකු රු.8,500,000 ක තැන්පත් සිදුකර නොතිබුණි.	2021	ටෙන්ඩර් කොන්දේසිවලට අනුව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ටෙන්ඩර් කොන්දේසි අනුව කටයුතු කර නොමැත.
(ඇ)	සමාගමට අයත් අබලි යකඩ ඇළුමිනියම් හා අනෙකුත් ද්‍රව්‍ය විකිණීම සඳහා කටයුතු සිදු කර තිබුණ ද, සමාගම ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ප්‍රථම විකිණීමට ඇති අබලි ද්‍රව්‍යවල ප්‍රමාණය හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ දී රු.11,535,238 ක් වටිනා අබලි යකඩ හා ඇළුමිනියම් අලෙවි කරනු ලැබුවද, විකිණූ ප්‍රමාණයන්ගේ නිවැරදිතාවය පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.	2021	නිසි ක්‍රමවේදයකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	විකිණීමට තිබුණු යකඩ ප්‍රමාණය හඳුනාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

(ඉ)	සමාලෝචිත වර්ෂය තුළදී රු.571,216,224 ක් වටිනා බස්රථ අමතර කොටස් අළුත්වැඩියාව ගරාජය හා සේවා මධ්‍යස්ථාන යනා දී ස්ථාන සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව පුද්ගලික සමාගම් වෙත මිලදී ගෙන තිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ජාතික තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව මිළ සැදැහුම් ක්‍රම යටතේ මිලදී ගැනීම් සිදු කරයි.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට වාහන සේවා අංශයේ අමතර කොටස් වටිනාකම රු.1,867,245 ක් ලෙස දක්වා තිබුණද එම අමතර කොටස් බින්කාඩ් පත්‍රවල ලේඛනගත නොවීම සහ වාර්ෂික තොග සත්‍යාපනය නොකිරීම හේතුවෙන් එම වටිනාකම විගණනයේ දී සත්‍යාපනය කිරීමට නොහැකි විය.	2022	සමාගම වෙත ලැබෙන සියලු අමතර කොටස් තොග ලේඛන ගත කර ගිණුම් වලට ඇතුළත් කර වාර්ෂිකව සත්‍යාපනය කළ යුතුය.	ඔබ විසින් හඳුනාගෙන ඇති අයිතම 17 එක් එක් ස්ථාන වලින් සේවා මධ්‍යස්ථාන වෙත ලැබුණු ඒවා වන අතර ඒවා මුදල් දී මිලදී ගත් ඒවා නොවේ. එම අයිතම සඳහා එම නිසා මුදල්මය වටිනාකමක් නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති බව වාර්තා කර තිබුණි.	බින්කාඩ් වල ඇතුළත් කර ගිණුම්ගත කර නොමැත.
(උ)	බස් රථයක සම්පූර්ණ අළුත්වැඩියාව සඳහා එක් පැත්තක් සඳහා දින 8 බැගින් පැති 6 ක් වෙනුවෙන් දින 48ක ඇස්තමේන්තු කාලයක් හඳුනාගෙන තිබුණද, විගණනය විසින් සිදු කරන ලද	2022	මූල්‍ය දුෂ්කරතා වලට අදාළ උපක්‍රම උපයෝගී කරගෙන කාල ප්‍රමාදයකින් තොරව ගනුදෙනු කරුවන්ගේ අළුත්වැඩියා කටයුතු සිදු කළ යුතුය.	ආයතනය තුළ පවතින මූල්‍ය අර්බුදය අනුව අමතර කොටස් නිසි වෙලාවේදී මිළට ගැනීමට නොහැකිවූ බැවින් ඇස්තමේන්තු ගත කාලයට වඩා වැඩි කාලයක් බස්රථ අළුත්වැඩියාව සඳහා	සමාගමේ පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් අළුත්වැඩියා කටයුතු ප්‍රමාදවී තිබුණි.

	නියැදි පරීක්ෂාවේදී එම කාල සීමාව ඉක්මවා බස් රථයක් සඳහා දින 76 සිට 210ක් දක්වා කාලයක් ගත කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.			ගතවී තිබුණි.	
(ඌ)	සමාගමේ අලුත්වැඩියා අංශයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික දැනුමින්යුත් පුහුණු ශ්‍රමිකයින් අත්‍යවශ්‍ය වුවද, පවත්නා මානව සම්පත මනා ලෙස කළමනාකරණය කර යොදාගැනීම හා අවශ්‍යතාවය මත පුහුණු ශ්‍රමිකයන් බඳවාගෙන කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී බස් රථ අලුත්වැඩියා අංශයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා කොන්ත්‍රාත් කණ්ඩායම් 15ක සේවය ලබා ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් රු.29,150,085 ක් ගෙවා තිබුණි.	2022	ආයතනයේ අත්‍යාවශ්‍ය කටයුතු සඳහා අවශ්‍ය පරිදි පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.	ආයතනය වෙත ස්ථිර සේවකයන් බඳවා ගැනීමට අනුමැතියක් ලබා නොදෙන බැවින් අදාල ඉලක්කයන් සපුරාගැනීම සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගෙන අදාල අළුත්වැඩියාවන් සිදුකරනු ලබයි.	බස් බොඩි ගැසීම, පින්තාරු හා අනෙකුත් කටයුතු සඳහා කොන්ත්‍රාත් කණ්ඩායම් යොදවා ගැනීම සිදු කරනු ලබයි.
(එ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය පරිදි	2022	චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.	වාර්ෂික වාර්තා සකස් කර ඇති අතර එය පාරලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා භාර දීමට නියමිත	වාර්ෂික වාර්තා සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

	ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2014 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණු අතර අවසන් වරට 2013 වර්ෂයට අදාළ වාර්තාව සභාගත කර තිබුණේ 2016 ජූලි 21 දින දී බව නිරීක්ෂණය විය.				බව දන්වා තිබුණි.
(ඒ)	සමාගමේ සේවා මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ආරම්භ කර මේ දක්වා පවත්වා ගෙන එනු ලැබුවද ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් සේවක මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් වාහන බාහිර ආයතන වෙත ලබා දී අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ දී වාහන අලුත්වැඩියා සඳහා බාහිර ආයතන වෙත රු.15,012,342 ක් ගෙවා තිබුණි. සේවා මධ්‍යස්ථානයේ පිරිවැය රු.20,858,703 ක් වන විට ආදායම රු.17,906,855 ක් වීම හේතුවෙන් සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යාම තුළින් සමාලෝචිත වර්ෂයේදී සමාගමට	2022, 2023	සේවා මධ්‍යස්ථානයේ ආදායම ඉහළ නැංවීමට හා පිරිවැය කළමනාකරණය මඟින් ලාභදායී අංශයක් බවට පත්කළ යුතුය.	වාහන සේවා මධ්‍යස්ථානයේ කාර්යයන් නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා නිසි පුහුණුව ලත් කාර්මිකයන් බඳවා ගැනීම සඳහා අවස්ථා කිහිපයකදීම ඉල්ලුම් කලද එ් සඳහා අදාල ආයතන වෙතින් අනුමැතිය ලැබී නොතිබුණි.	සේවා මධ්‍යස්ථානයේ කටයුතු නවතා දමා ඇත.

	රු.2,951,848 ක අලාභයක් දැරීමට සිදුවී තිබුණි.				
(ඔ)	සමාගමේ තනතුරු 28 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 121 ක් වන අතර ඉහළ කළමණාකරණ මට්ටමට අයත් සාමාන්‍යාධිකාරී, පරිපාලන නිළධාරි සහ අභ්‍යන්තර විගණන නිළධාරී යන තනතුරු, බඳවා ගැනීම් පටිපාටිය අනුමත වූ 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණු අතර ගණකාධිකාරී තනතුර 2021 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.	2021, 2023	පැවරීම් කිරීමේ කටයුතු වලට අවශ්‍ය පරිදි මානව සම්පත කළමනාකරණය කළ යුතුය.	අදාල තොරතුරු සඳහා සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතියන් නිසි ආයතන වලින් නොලැබීම හේතුවෙන් මෙම තත්වය උදා වී ඇත.	බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර නොමැති අතර සමාගමේ තනතුරු තවදුරටත් පුරප්පාඩුව පවතී.
(ඕ)	සේවා මධ්‍යස්ථාන කටයුතු සිදුකිරීම සඳහා මිල දී ගන්නා ලද රු.11,407,706 ක් වටිනා උපකරණ ඌන උපයෝජිතව පැවති අතර ඒවා අතරින් රු.1,684,975 ක් වටිනා 3ඩී වීල් එලයින්මන් (3D Wheel Alignment) උපකරණය ක්‍රියාකරවීමට නොහැකි මට්ටමේ පැවතුණි.	2021, 2023	යන්ත්‍ර උපකරණ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	මෙම යන්ත්‍රය සඳහා පුහුණු ශ්‍රමිකයන් නොමැති වීමෙන්, අදාල යන්ත්‍රය නිසි පරිදි ස්ථාපිත නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උදාවී ඇත.	සේවා මධ්‍යස්ථානයේ කටයුතු නවතා ඇති බැවින් එම උපකරණ හා යන්ත්‍ර භාවිතයෙන් තොරව අනාර්ථිකව පවතී.

3.65 ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	5,339,762,716	730,431,989	4,609,330,727	649,977,839	තත්ත්වාගණනය නොකල
2022	6,638,714,674	873,144,132	5,765,570,542	793,327,849	තත්ත්වාගණනය නොකල
2023	7,777,011,924	828,247,821	6,948,764,103	913,854,457	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	පීඩීල් ටවර් ගොඩනැගිල්ල දැනට වසර 50ක් පුරා ක්ෂය වෙමින් පවතින අතර එය ගොඩනැගිල්ලේ ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා අඩු බව පෙනී යයි. වත්කම එහි ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා අඩු කාල සීමාවක් තුළ ක්ෂය වූ විට වත්කම අව තක්සේරු කරනු ලබන අතර ක්ෂය වියදම ප්‍රතිලාභයට නිවැරදිව නොගැලපෙන බැවින් ලාභය නිවැරදිව වාර්තා නොවේ.	2021	ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ අවශේෂ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ පුරෝකථන මත පදනම්ව අවශ්‍ය ගැලපීම් කිරීමට නිර්දේශ කෙරේ.	කළමනාකාරිත්වය විසින් 2022 අගෝස්තු මාසයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයෙන් (CECB) ලංකා බැංකුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ අවශේෂ ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ වාර්තාවක් ලබා ගන්නා ලදී. ඒ අනුව, සීඊසීබී (CECB) වාර්තාව මගින් පුරෝකථනය කර ඇති පරිදි නව ප්‍රයෝජනවත් ජීව කාලය මත පදනම්ව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ සිට සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කරන ලදී.	නිර්දේශයට අනුකූල වී ඇත.

(ආ)	1840 අංක 07 දරන වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, සහ 2022 අංක 31 දරන නොතාරිස් පනතට සංශෝධන 14(30ඒ) නීතිය. එකී නියමයට අනුව, තමා විසින් සහතික කරන ලද සෑම ඔප්පුවක් හෝ ලියකියවිල්ලක්ම ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් වෙත සහතික කළ දින සිට දින තිහකට පෙර ඉදිරිපත් කිරීම සෑම නොතාරිස්වරයෙකුගේම යුතුකම වේ. කෙසේ වෙතත්, සමාගම නියමිත කාලය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් හමුවේ අදාළ කුලී ගිවිසුම ලියාපදිංචි කර නොතිබුණි.	2022, 2023	නියමිත කාලය තුළ සෑම ඔප්පු හෝ ලියකියවිලි ලියාපදිංචි කළ යුතුය.	මෙම කාරණය ලංකා බැංකුව (එනම් බදු ගැණුම්කරු) සමඟ සාකච්ඡා කරමින් පවතින අතර යොමුව යටතේ ඇති කාරණයේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් පහත කරුණු දක්වා ඇත. (අ) මෙම කාරණය කළමනාකරු (එච්ආර්ඒ)/පීඩීඑල් විසින් 2023 අගෝස්තු 09 දිනැති පීඩීඑල් ලිපිය මගින් ලංකා බැංකුව (එනම් බදු ගැණුම්කරු) වෙත දැනුම් දෙන ලදී. (ආ) ලංකා බැංකුව විසින් 2023 දෙසැම්බර් 12 දිනැති ඔවුන්ගේ ලිපි යොමු ඒජීඑම්/පිආර්ඕපී/සීඑම්/පිකේඑස් මගින් යොමු කර ඇති කාරණය සම්බන්ධයෙන් ඇතැම් ලියකියවිලි ඉල්ලා තිබුණි. (ඇ) පීඩීඑල් විසින් එම ලේඛන 2024 මාර්තු 18 දිනැති පීඩීඑල් හි ලිපිය මගින් ලංකා බැංකුව වෙත යවන ලදී. ඒ අනුව ලංකා බැංකුවෙන් ප්‍රතිචාරයක් ලැබුණු විට මණ්ඩලයේ අනුමැතිය ඇතිව සුදුසු ක්‍රියාමාර්ගයක් ලංකා බැංකුවෙන් ප්‍රතිචාරයක් බලාපොරොත්තු වෙන් සිටියි. (එනම් මව් සමාගම සහ බදු ගැණුම්කරු)

ආරම්භ කරනු ලැබේ.

(ඇ) ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන කටයුතුවල ප්‍රමාදයන් 2022 වර්ෂයේ අයවැයෙන් පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් සලසා තිබුණද, 2022 වර්ෂය තුළදී වැඩ සිදුකර නොමැත.

	විස්තරය	අයවැයෙන් ප්‍රතිපාදනය (රු.000)	හේතුව
(i)	Chiller Management System වැඩිදියුණු කිරීම.	4,000	Chiller Management System වැඩිදියුණු කිරීම සඳහා වූ මුළු අයවැයෙන් ප්‍රතිපාදනය 2022 වසර තුළදී භාවිතා කර නොමැත.
(ii)	26න බිම් මහලේ සිට 17වන මහල දක්වා 11KV Power Cables ප්‍රතිස්ථාපනය කිරීම සහ 17වන මහලේ 11KV Isolator සැහලය ප්‍රතිස්ථාපනය කිරීම	30,000	26න බිම් මහල සිට 17 වන මහල දක්වා 11KV Power Cables ප්‍රතිස්ථාපනය කිරීම සහ 17 වන මහලේ 11KV Isolator සැහලය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන 2022 වර්ෂය තුළදී භාවිතා කර නොමැත.

2022 (i) ප්‍රමාදයකින් තොරව හෝ ඉක්මන්වීමකින් තොරව නියමිත වේලාවට අයවැය සකස් කිරීම අවශ්‍ය වේ.
(ii) කොන්ත්‍රාත්තුව මේ වන විටත් ප්‍රදානය කර ඇති බැවින් , මාදය නිසා සිදුවිය ප්‍ර හැකි පාඩු අවම කර ගැනීමසඳහා අවශ්‍ය පියවර ගත යුතුය .

වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන ඉදිරිපත් කිරීමට පෙර අදාළ ප්‍රතිස්ථාපන/වැඩිදියුණුගත කිරීමේ ව්‍යාපෘති පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට තීරණය කර ඇත.

ව්‍යාපෘති දෙකම දැනටමත් අවසන් කර ඇත.

(ඇ) ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන කටයුතුවල ප්‍රමාදයන් 2023 වර්ෂයේ අයවැයෙන් පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් සලසා තිබුණද, 2023 වර්ෂය තුළදී වැඩ සිදුකර නොමැත.

	විස්තරය	අයවැයෙන් ප්‍රතිපාදනය (රු.000)	හේතුව
(i)	වායු හුස්මිරීමේ ඒකක (Air Handing Units) සැපයීම සහ ස්ථාපනය කිරීම	84,000	වායු හුස්මිරීමේ ඒකක (Air Handing Units) සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා වූ මුළු අයවැයෙන් ප්‍රතිපාදනය 2023 වසර තුළදී භාවිතා කර නොමැත. 2023 වසර අවසානය දක්වාම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ද සියයට මිංදුකි.
(ii)	කෝගහන් මහල්වල විදුලි බල උප බෙදාහැරීමේ පැනලයන් ප්‍රතිස්ථාපනය කිරීම	15,000	ව්‍යාපෘතිය සඳහා වූ මුළු අයවැයෙන් ප්‍රතිපාදනය 2023 වසර තුළදී භාවිතා කර නොමැත. 2023 වසර අවසානය දක්වාම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ද සියයට මිංදුකි.

2023 ප්‍රමාදයකින් තොරව හෝ ඉක්මන්වීමකින් තොරව නියමිත වේලාවට අයවැය සකස් කිරීම අවශ්‍ය වේ.

වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන ඉදිරිපත් කිරීමට පෙර අදාළ ප්‍රතිස්ථාපන/වැඩිදියුණුගත කිරීමේ ව්‍යාපෘති පිළිබඳව සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට තීරණය කර ඇත.

දැනට පවත්නා වායු හැසිරවීමේ ඒකක සහ බල උප බෙදාහැරීමේ පැනලයන් තවත් වසර 2 සිට 3 දක්වා කාලයක් භාවිත කළ හැකි බැවින් ව්‍යාපෘති දෙකම 2026 දක්වා කල් දැමීමට කළමනාකාරීත්වය විසින් තීරණය කරන ලදි.

3.66 සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	43,050,722	108,136,180	(65,085,458)	(26,669,357)	තත්ත්වාගණනය නොකල
2022	47,443,901	115,022,207	(67,578,306)	(2,492,848)	තත්ත්වාගණනය නොකල
2023	24,532,080	88,762,131	(64,230,051)	3,348,255	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම විසින් ස්වයංක්‍රීය පද්ධතිය වෙනුවට ඉන්වෙන්ටරි කළමනාකරණය සහ වාර්තා සටහන් කිරීම අත්හුරු ක්‍රමයට සිදු කරනු ලබන අතර එය සමාගමේ ඉන්වෙන්ටරි කළමනාකරණය සහ පාලනය සම්බන්ධව අවදානම වැඩි කිරීමට හේතු වෙයි.	2021	ඉන්වෙන්ටරි කළමනාකරණයට අදාළව පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට සහ ඉන්වෙන්ටරි වලන අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා ඉන්වෙන්ටරි මොඩියුල ක්‍රියාත්මක කිරීම සලකා බැලීමට නිර්දේශ කෙරේ.	ප්‍රධාන කාර්යාල මට්ටමින්, සමස්තයක් වශයෙන් තොග මට්ටම් මාසිකව නිරීක්ෂණය කරන්නෙමු. බිල්පත් කිරීම සඳහා ඩිජිටල්කරණ පද්ධතියක් හඳුන්වාදීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර ඉන්වෙන්ටරි සඳහාද පද්ධතිය සහ පාලනයන් තුළ ප්‍රතිපාදන කර තිබේ.	අප විසින් ඉන්වෙන්ටරි සඳහා අතින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටිය අනුගමනය කරන බැවින් ඉන්වෙන්ටරි කළමනාකරණයේ වගකීම ඒ ඒ විශ්‍රාම ශාලාවේ අදාළ නේවාසික කළමනාකරුවෙත පැවරේ. සමාගම නව පරිගණකගත පද්ධතියක් හඳුන්වා දෙන තුරු, දැනට පවතින අතින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටිවල පාලනය ශක්තිමත් කිරීමට සහ

					ඉන්වෙන්ටරි සම්බන්ධ අවදානම අවම කිරීමට පියවර ගනු ඇත.
(ආ)	අමුත්තන්ගේ නිවාසවල වෙන්කිරීම් අධීක්ෂණය කිරීම සඳහා සමාගම විසින් අමුත්තන්ගේ නිවාස පිළිබඳ මධ්‍යගත පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර නොමැත.	2021	අමුත්තන්ගේ නිවාසවල වංචනික ක්‍රියාකාරකම් සහ එහි අවදානම වළක්වා ගැනීම සඳහා අමුත්තන්ගේ නිවාස සඳහා මධ්‍යගත වෙන් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම නිර්දේශ කෙරේ.	ප්‍රධාන කාර්යාලය විසින් හදිසි වැටලීම් සහ නිවාඩු නිකේතනවල භාරකරුවන් පිළිබඳව සොයා බැලීම සඳහා ලංකා බැංකුවේ නිලධාරීන්ගේ සහාය ලබා ගනියි.	ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය නිවාඩු නිකේතන වෙන්කරවා ගැනීමට සුදුසුකම් ලබන්නේ සුබසාධන වෙන්කිරීමේ ක්‍රමය හරහා පමණි.
(ඇ)	රුපියල් 1,687,931 ක වෙළඳ ණයගැති ශේෂයට මාස තුනකට වැඩි කාලයක සිට පැමිණෙන රුපියල් 740,821 ක දිගුකාලීන හිඟ ශේෂයක් ඇතුළත් වේ. දිගු කලක් නොගෙවූ ණයගැති ශේෂයන් අයකර ගැනීමට සමාගම විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොමැත. ණයගැති කාල විශ්ලේෂණය පහත දැක්වේ.	2021	නියමිත කාල සීමාව තුළ ණයගැති ශේෂයන් අයකර ගැනීම නිර්දේශ කෙරේ.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සමාගම විසින් පසුගිය මූල්‍ය වර්ෂය තුළ දී 532,801.18 හි දිගුකාලීන හිඟ ශේෂයක් කපා හැර ඇත. සමාගම ණයගැති එකතු කිරීමේ කාලය අඩු කර ඇත.	දිගුකාලීන හිඟ ශේෂයන්හි ප්‍රමාණවත් අයිතම නොමැත.

කාල සීමාව	හිඟ ශේෂය (රු.)
දින 0-30	580,400
දින 31-90	366,710
දින 91-180	16,425
181-365	125,340
වර්ෂයකට වැඩි	599,056
එකතුව	**1,687,931**

(ඇ)	B1/B2 නුවරඑළිය සහ මහනුවර නිවාඩු බංගලා පිළිවෙලින් 2018 සහ 2019 සිට ප්‍රතිසංස්කරණය කරමින් පවතී. මෙම බංගලා මගින් 2018 වර්ෂය තුළ රුපියල් මිලියන 1.4 ක ආදායමක් උපයා ඇති අතර, ප්‍රතිසංස්කරණ අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සෑම වසරකම සමාගමට මෙතරම් ආදායමක් අහිමි වන බව නිරීක්ෂණය විය.	2021	ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීම සහ වාණිජ මෙහෙයුම් සඳහා බංගලා ලබා දීම නිර්දේශ කෙරේ.	නවීකරණ කටයුතු අවසන් කිරීමෙන් පසු නිවාඩු නිකේතන දෙකෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.	නිවැරදි කර ඇත.
(ඉ)	2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමස්ත ණයගැති ශේෂය රුපියල් 4,185,341 ක් වූ අතර එයට දිගුකාලීන ණයගැති ශේෂයන් ඇතුළත් වේ. සමස්ත ශේෂයෙන් රු. 719, 686ක් එනම් සියයට 17 ක් වසරකට වැඩි කාලයක සිට හිඟව පැවති අතර කාලෝචිත අන්දමින් හිඟ ශේෂයන් අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.	2022	දිගුකාලීන හිඟ ණයගැති ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සමාගම විසින් පසුගිය මූල්‍ය වර්ෂය තුළ දී 532,801.18 හි දිගුකාලීන හිඟ ශේෂයක් කපා හැර ඇත.	නිවැරදි කර ඇත.

කාල සීමාව	හිඟ ශේෂය (රු.)
දින 0-30	2,074,560
දින 31-90	1,283,065
දින 91-180	80,435
181-365	27,595
වසරකට වැඩි කාලයක්	116,350
වසර දෙකකට වැඩි කාලයක්	128,825
වසර තුනකට වැඩි කාලයක්	474,511
එකතුව	**4,185,341**

(ඊ)	සමාගම විසින් කළමනාකරණය කරනු ලබන විවේක සහ නිවාඩු නිකේතන සඳහා වෙන්කරවා ගැනීම් (සුභසාධන අරමුණු සඳහා පවත්වාගෙන යන ඒවා හැර) සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් (දුරකථනයෙන් හරහා හෝ පැමිණීමෙන්) හෝ විවේක නිකේතන (දුරකථනයෙන්) සිදු කළ හැක. මාර්ගගත වෙන් කිරීම් සඳහා සමාගම් වෙබ් අඩවිය (www.ceybankholidayhomes.com) ක්‍රියාත්මක නොවන බව හා කිසිදු යාන්ත්‍රණයක් නොමැති බවත් නිරීක්ෂණය විය. තවද එලදායී අලෙවිකරණ මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය (උදා: ෆේස්බුක්) කාලානුරූපව යාවත්කාලීන නොකරන බව නිරීක්ෂණය විය.	2022	ආදායම වැඩි කර ගැනීම සඳහා නව තාක්ෂණය භාවිතා කිරීම ඇතුළුව ගත හැකි සෑම පියවරක්ම අනුගමනය කිරීම කළමනාකාරීත්වය සහතික විය යුතුය.	සමාගම විසින් සමාගම සඳහා වෙබ් අඩවියක් සැකසීමට කටයුතු කරමින් සිටී.	සමාජ මාධ්‍ය (ෆේස්බුක්) සමාගම විසින් කාලානුරූපව යාවත්කාලීන කරනු ලැබේ.
(උ)	සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ වෙන් කිරීම් අවලංගු කිරීම් සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොමැති බව නිරීක්ෂණය විය.	2022	කළමනාකරණය විසින් වෙන්කිරීම් අවලංගු කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවලංගු කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙරේ.	නිවැරදි කර ඇත.

	වෙන් කිරීම් අවලංගු කිරීම් සහ ආපසු ගෙවීම් සඳහා අනුමත ලේඛනගත ප්‍රතිපත්තියක් නොමැති වීමෙන් අදාළ ක්‍රියා පටිපාටිවල නොගැලපීම් ඇති විය හැකි අතර පාරිභෝගික අතෘප්තියකට සහ අසාධාරණ ලෙස සැලකීමකට හේතු විය හැකිය.				
(ඌ)	බැංකු ප්‍රකාශන සමඟ අත්තිකාරම් වෙන්කරවා ගැනීම සඳහා ප්‍රමාණවත් සැසඳුම් ලේඛනයක් නොමැතිකම. වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් ශේෂය තහවුරු කර ගැනීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සිදුකිරීමේදී, බැංකු ප්‍රකාශන සමඟ වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් සැසඳීම සඳහා සමාගම විසින් ක්‍රමවත් ලේඛනයක් නොපවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය. සපයා ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වෙන්කරවා ගැනීම අත්තිකාරම් ශේෂය රු. 1,307,540/- කි. ක්‍රමවත් සැසඳීමේ ලේඛනයක්	2023	සුදුසු පරිදි දෛනික, සතිපතා හෝ මාසික පදනමින් අත්තිකාරම් වෙන්කරවා ගැනීම සඳහා ක්‍රමවත් සැසඳීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. මෙම ක්‍රියාවලිය තුළින් බැංකු ප්‍රකාශනවලට එරෙහිව සිදු කරන ලද වෙන්කරවා ගැනීම් හරස් පරීක්ෂණයන්ට ලක් කිරීම තුළින් සියලුම ගනුදෙනු නිවැරදිව සටහන් කර ගිණුම්ගත කර ඇති බව සහතික කර ගත හැක. එසේ කිරීමෙන්, සමාගමට මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ හැකි අතර දෝෂ ඇතිවීමේ අවදානම අඩු කර ගත හැක.	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් අංශය) යටතේ ඇති ලංකා බැංකුවේ සුබසාධන දෙපාර්තමේන්තුව පද්ධතියක් හරහා නව වෙන් කරවා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටියි. ක්‍රියාවලිය අවසන් වූ පසු, එම ක්‍රමය භාවිතා කර ජංගම ගිනුම් සැසඳීමට හැකි වනු ඇත.	මේ මොහොතේ සමාගම අංක 324 දරණ ජංගම ගිණුම සැසඳීම සිදු කරනු ලබන්නේ වෙන්කරවා ගැනීමේ පද්ධතියෙන් ලබා ගන්නා තොරතුරු මගින් සහ ඉතිරිය අතින් සිදු කර ලබා ගන්නා තොරතුරු ජීටල් ඩි .මගිනි ලෙස සැසඳීම සිදු කිරීම සඳහා යෝජිත පද්ධතිය තුළ .තිපාදන පවතීප්‍ර

	නොමැතිකම සැලකිය යුතු අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ඇති කරයි. බැංකු ගනුදෙනු සමඟ අනුරූපව වෙන්කරවා ගැනීමේ අත්තිකාරම් නිරන්තර සැසඳීමක් සිදු නොකිරීම හේතුවෙන්, වැරදි හෝ හඳුනා නොගත් විෂමතාවන් පැවතීමේ අවදානම ඉහළ යයි. මෙය මූල්‍ය වාර්තාකරණයේ සාවද්‍ය ප්‍රකාශනවලට තුඩු දිය හැකි අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවයටද බලපෑ හැකිය.				
(ඒ)	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමාගම රුපියල් 3,348,255 ක ලාභයක් උපයා තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය දක්වාම සමාගම අඛණ්ඩව පාඩු ලබා ඇත. තවදුරටත් 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු වගකීම් මුළු වත්කම් රුපියල් 64,230,049කින් ඉක්ම වූ අතර පෙර වසරේ (2022) එම මුදල රුපියල් 67,578,306ක් විය. තවදුරටත්, 2007 අංක	2023	සමාගම විසින්ම ලාභ ලැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	සමාගම විසින්ම තම සමාගමට මූල්‍යනය කිරීමට හැකිවන තෙක් මූල්‍ය සහය ලබා දීමට මවු සමාගම වන ලංකා බැංකුව එකඟවී ඇති අතර ඒ සම්බන්ධයෙන් සහනදායක ලිපියක්ද නිකුත් කර ඇත.	සමාගම 2023 සිට ක්‍රමයෙන් ලාභ ලබමින් සිටියි.

07 දරණු සමාගම් පනතේ 220 වැනි වගන්තියට අනුව සමාගම තදබල ප්‍රාග්ධන පාඩුවකින් පීඩිතව ඇත.

3.67 බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විස් පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	887,749	33,600	854,149	(29,083)	තත්ත්වාගණනය නොකල
2022	854,826	33,600	821,226	(32,923)	තත්ත්වාගණනය නොකල
2023	819,128	43,338	775,790	(45,436)	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වර්ෂයේදී සමාගම අනාගතයේදී ඇවර කළ යුතු යැයි යෝජනා සම්මත කර තිබුනද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව බැංකුවේ අක්‍රීය ණය අය කර ගැනීමේ සේවා නියෝජිතයා බවට පත් කර ගැනීම සඳහා 2021 පෙබරවාරි 08 වන දින පැවති **ලංකා බැංකු** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී යෝජනා සම්මත කර ගෙන ඇත. කෙසේ වෙතත් තීරණය බැංකුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.	2021,2022,2023	බැංකුව තවමත් කිසිදු තීරණයක් ගෙන නොමැති නම් ව්‍යාපාරයෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව බැංකුව සලකා බැලිය යුතුය.	බැංකුව තුළ ශක්තිමත් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියක් තිබීමේ අවශ්‍යතාවය සහ බැංකුව විකුණුම්කරුවන් මත යැපීම වැලැක්වීමේ අවශ්‍යතාව පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, 2024 අප්‍රේල් 03 වැනි දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් පුද්ගලික) සමාගම) (MSS), දැනට අක්‍රියව පවතින බීඕසී (BOC) හි අනුබද්ධිත ආයතනයක් වන අතර එය සම්පූර්ණයෙන්ම හිමි තොරතුරු තාක්ෂණ සමාගමක් ලෙස නැවත ප්‍රයෝජනයට ගැනීමට මණ්ඩලය	සීබීඑස්එල් (CBSL) විසින්, 1988 අංක 30 දරන බැංකු පනතට අනුව, සංශෝධිත ලෙස, දැනට පවතින අනුබද්ධිත ආයතනය නැවත ප්‍රයෝජනයට ගනිමින් තොරතුරු තාක්ෂණ (IT) සේවා සැපයීම සඳහා අනුබද්ධිත ආයතනයක් පිහිටුවීමට බීඕසී (BOC) සඳහා අනුමැතිය ලබා දී ඇති අතර බැංකුව මේ සඳහා දැනට කටයුතු කරමින්

				තීරණය කළේය. ඒ අනුව, බැංකුව විසින් යෝජිත තොරතුරු තාක්ෂණ අනුබද්ධ සමාගමේ ව්‍යාපෘති වාර්තාව සකස් කර අනුමැතිය සඳහා සීබීඑස්එල් (CBSL) හි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලදී.	සිටී.
(ආ)	සමාගමේ මූලික ව්‍යාපාරික කටයුත්ත වන්නේ ලංකා බැංකුවේ මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා සේවකයින් බඳවා ගැනීම වේ. කෙසේ වෙතත්, සමාගම විසින් කරන ලද තහවුරු කිරීම අනුව, 2007 වසරේ සිට එය මූලික කටයුත්තෙහි නොයෙදී ලංකා බැංකුවේ නියමය පරිදි ව්‍යාපාරික කටයුතු 2007 වසරේ දී නවතා දමන ලදී. ඒ අනුව සමාගමේ කළමනාකාරිත්වය සමාගම ඉදිරියට ගෙන යාම පිළිබඳව සුදුසු තීරණයක් ගත යුතුය.	2022/ 2023	කිසිදු ආදායමක් නොමැතිව වියදම් දැරීම හේතුවෙන් සමාගම පවත්වාගෙන යාම පිළිබඳව සමාගමේ කළමනාකාරිත්වය සුදුසු තීරණයක් ගත යුතුය.	එම	එම

3.68 බීඕසී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,112.041,012	100,363,803	2,011,677,209	188,841,319	තත්ත්වාගණනය නොකල
2022	2,169,300,415	154,837,458	2,014,462,957	278,909,443	තත්ත්වාගණනය නොකල
2023	2,350,447,667	134,045,140	2,216,402,527	309,255,057	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සියළු බදුකරුවන් සමග ඇති බදු ගිවිසුම් අනුව, සෑම මසකම පළමු දින සිට දින 14 කට පෙර මාසික කුලිය ගෙවීමට අපොහොසත් වුවහොත් මාසික කුලියට සියයට 20 ක දඩයක් බදුකරුගෙන් අය කෙරේ. සමහර අවස්ථාවලදී කල්බදු හිමියන් යම් මාසයකට ගෙවිය යුතු ගෙවීම් මාස 03 කට වැඩි කාලයක් ප්‍රමාද කළ අවස්ථා නිරීක්ෂණය විය. කෙසේ වුවත් ප්‍රමාද වූ ගෙවීම් සම්බන්ධයෙන් ඔවුන්ගෙන් කිසිදු දඩ මුදලක් අයකර නොමැත.	2021	කල්බදු ගිවිසුම්වල සඳහන් පරිදි ප්‍රමාද වූ කල්බදු ගෙවීම් සඳහා දඩයක් නියම කිරීමට නිර්දේශ කරනු ලැබේ.	මෙම වගන්ති සියළුම ගිවිසුම්වලට ඇතුලත් වුවද, අපි පුරුද්දක් ලෙස දඩ මුදල් අයකර නොමැත.මෙම ගැටළුව සම්බන්ධයෙන් කළමනාකාරිත්වයෙන් අනුමැතිය ලබාගැනීමට අප විසින් යෝජනා කරනු ලැබේ.	සමාගම විසින් ප්‍රමාද වූ ගෙවීම් සඳහා තවමත් දඩ අයකරනු නොලබයි.

- ඉන්ජිනියුටි පුද්ගලික සමාගම
- සමීර කේටර්ස්

(ආ)	සියළු බදුකරුවන් සමග ඇති බදු ගිවිසුම් අනුව,සෑම මසකම පළමු දිනයේදී කුලිය කල්ඇතිව ගෙවිය යුතුය.කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ ලැබිය යුතු කුලී ශේෂය රු.18,115,075 ක් වන අතර ඉන් රු. 9,754,221 හෝ සියයට 54 ක් දින 90 කට වැඩි කාලයක් හිඟ ව ඇත. ඒ අනුව කුලී ගිවිසුම්වල එකඟ වූ පරිදි බදු වාරික එකතු කරගැනීමට සමාගමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මුළු හිඟ බදු වාරික අතරින් රු.9,581,823 හෙවත් සියයට 53 ක් කොල්ලුපිටිය මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලෙන්ද සියයට 47 ක් වන ශේෂය මහනුවර සී බැන්ක් නිවසින් ද වේ. ලැබීම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.	2022	නියමිත කාලයට ලැබිය යුතු කුලී එකතු කර ගැනීමට අවශ්‍ය සියළු පියවර ගත යුතු බව නිර්දේශ කෙරේ.	SLIIT ඇකඩමිය, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සහ ඉන්ජිනියුටි පුද්ගලික සමාගම හැරුණු විට පහතින් දක්වා ඇති සියළු ලැබිය යුතු දේ මුළුමනින් පියවා ඇත. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් සහ SLIIT ඇකඩමියෙන් ලැබිය යුතු ශේෂ ඉන්ධන අර්බුදය තුල හඳුන්වා දුන් ඉන්ධන අධිභාර සඳහා වේ.	ඉන්ජිනියුටි පුද්ගලික සමාගම සඳහා නීතිමය කටයුතු ක්‍රියාත්මක වේ. අනෙක් ශේෂයන් දෙක සඳහා ඔවුන් සමග සාකච්ඡා අවසන් වීමෙන් පසු 2024 දී එම ශේෂයන් ලියාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.



විස්තරය	බිල අවස්ථා (%)				
	දින 1-30 ----------	දින 31-60 ----------	දින 61-90 ----------	දින 90 ට වැඩි ----------	එකතුව ----------
කැපී පෙනීමක් - වර්ෂාන්ත වර්ෂ හතරකටත් වඩා					
1. ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ගණුම් කළ වියදම් මිලදීගැනීම්	2,001,885	-	-	-	2,001,885
2. ලංකා බැංකුව- බණ්ඩාරවෙල අලුත්ම උප ගාඛාව	207,473	-	-	-	207,473
3. ලංකා බැංකුව- සබරගමු පළාත් කාර්යාලය	344,448	-	-	-	344,448
4. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය	983,421	-	-	188,833	1,172,254
5. සියඹලා ගුණවර්ධන (ප්‍රද්ගලික) සමාගම	1,240,082	-	-	174,280	1,414,362
6. ලංකා ඛණිජ තෙල් (ප්‍රද්ගලික) සමාගම	-	-	-	3,247,312	3,247,312
7. විශ්වකලා ආක්ෂිකයන් සීමාසහිත	101,933	39,243	-	-	141,176
8. මාර්කන්ටයිල් (ප්‍රද්ගලික) සමාගම	50,850	-	-	-	50,850
9. සංවර්ධන (විකුණුම්) ඇණවුම්වල ගුණාත්ම (ප්‍රද්ගලික) සමාගම	57,721	1,474	-	-	59,195
10. ශ්‍රී ලංකා විදේශ ඇණවුම්වල සාමාන්‍යවේදය සහතිකයි	332,459	-	-	-	332,459
11. සමාගම් (විශේෂ) සහාය ගුණාත්ම (ප්‍රද්ගලික) සමාගම	82,707	-	-	17,364-	782,371
12. ශ්‍රීලංකා (විදේශ) සහතික කළේය	14,061	-	-	-	14,061
එකතුව (අ)	5,322,678	40,695	-	4,228,450	9,591,823
කැපී පෙනීමක් - බ වලාන් සඳහා වියදම්					
1. ලංකා බැංකුව- මධ්‍යම පළාත් කාර්යාලය	770,830	770,830	770,196	2,315,001	3,198,343
2. ලංකා බැංකුව- සබරගමු පළාත් කාර්යාලය වියදම්	695,553	695,553	695,553	2,910,710	3,333,369
එකතුව (බ)	966,383	966,383	1,074,715	5,225,771	6,531,252
මුළු එකතුව (අ) + (බ)	6,279,061	1,007,078	1,074,715	9,754,221	16,123,07 5

(ඇ) බදු ගිවිසුම් හතරක කාලය ඉකුත් වී තිබුණද විගණන දිනය වන 2023 අගෝස්තු 21 දින දක්වා අළුත් කළ ගිවිසුම් නොතිබූ බව නිරීක්ෂණය විය.එසේ කාලය ඉකුත් වූ බදු ගිවිසුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

බදු කාලය ආරම්භ වීමට පෙර බදු ගිවිසුම්/ අළුත් කිරීම් අත්සන් කළ යුතු බව නිර්දේශ කෙරේ.	**1 සහ 3 ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව මහනුවර/ ලංකා බැංකුව- මධ්‍යම පළාත ගිවිසුම් අංක 266 සහ 267/117/2073** මෙම ගිවිසුම් 2 2021 හා 2022-2024 සඳහා අළුත් කර ඇති අතර අළුත් කළ ගිවිසුම් ලංකා බැංකුව- මධ්‍යම පළාත් කාර්යාලය වෙත යවා ඇති අතර අත්සන් කළ ගිවිසුම් ලැබිය යුතුව ඇත.	මෙම ගිවිසුම් අත්සන් කිරීම සම්පූර්ණ කර ඇත

01	ලංකා බැංකුව-බස්නාහිර පළාත උතුර කාර්යාලය	266	2021 නොවැම්බර් 04
02	ලංකා බැංකුව-බස්නාහිර පළාත උතුර	353/3050	01.01.2021 සිට 31.12.2022
03	ලංකා බැංකුව- මොබිටෙල් බදු ගිවිසුම	267/117/0073	01.12.2019 සිට 31.12.2020
04	මොබිටෙල්	194	18.02.2018 සිට 17.02.2023

2. ලංකා බැංකුව-බස්නාහිර පළාත උතුර ගිවිසුම් අංක 353/3050

2023/24 අළුත් කළ කෙටුම්පත් ගිවිසුම් තහවුරු කිරීමට යවා ඇත. ලංකා බැංකුව-බස්නාහිර පළාත උතුර කාර්යාලයෙන් තහවුරුව බලාපොරොත්තුව සිටී.

04. මොබිටෙල් බදු ගිවිසුම් අංකය 194

කුලී වටිනාකම පිළිබඳ සාකච්ඡා කෙරෙමින් පවතින අතර 2023 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) සාමාන්‍යයෙන් සෑම සමාගමක් විසින්ම වර්ෂ පහක කාලසීමාවක් සඳහා සංයුක්ත සැලසුම් ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ එය සමාගමේ අරමුණු ලඟාකරගැනීමට සහ එහි සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කිරීමට උපකාරී වන බැවිනි.කෙසේ වෙතත් සමාගම විසින් 2022 සිට 2026 දක්වා වසර පහක කාලසීමාවකට සංයුක්ත සැලසුමක් 2022 සමාගමේ අරමුණු ලඟාකරගැනීමට සහ එහි සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සහතික කිරීමට සංයුක්ත සැලසුමක් පිළියෙල කළ යුතු බවට නිර්දේශ කෙරේ. සමාගමට එහි ආරම්භයේ සිටම සංයුක්ත සැලසුමක් නොතිබුණි. 2023-2025 සඳහා නව සංයුක්ත සැලසුමක් පිළියෙල කර ඇත සමාගම විසින් 2023-2025 සඳහා සංයුක්ත සැලසුමක් පිළියෙල කර ඇත

පිළියෙල කර නොතිබුණි.

(ඉ)	ඉන්ජිනියුටි (පුද්ගලික) සමාගමේ කුලී ගිවිසුම 2021 දෙසැම්බර් මාසයෙන් අවසන් වුවද, විගණන දිනය වන 2024 ජුනි 10 දින දක්වා අයකරගෙන නොතිබූ හිඟ ශේෂය රු.3,847,913 කි.	2023	සමාගමට පාඩුවක් දැරීමකින් තොරව හිඟ ශේෂය අයකරගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ.	ඉන්ජිනියුටි (පුද්ගලික) සමාගමෙන් හිඟ අයකර ගැනීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇත.(නඩු අංක ඩීඑම්ආර් 1375/23-පිළිතුරු සඳහා අවසාන කැඳවීමේ දිනය2024.06.14 සහ අනුකරණ සඳහා කැඳවීමේ දිනය 2024.10.18)	නීතිමය කටයුතු ක්‍රියාත්මක වේ.
(ඊ)	බදු කාලය ආරම්භවීමට පෙර බදු ගිවිසුම් අත්සන් කළ යුතුය. එසේ වුවද, 2023 වර්ෂය ඇතුලත නියමිත බදු කාලය ආරම්භවීමේ සිට මාස 03 කට පසු බදු ගිවිසුම් 04 ක් අත්සන් කර තිබුණි.	2023	බදු කාලය ආරම්භ වීමට පෙර බදු ගිවිසුම් අත්සන් කළ යුතු බව නිර්දේශ කෙරේ.	තහවුරු කිරීම් ප්‍රමාදවීම, කුලී සංශෝධනය සහ බදුකරුගේ පාර්ශවයෙන් ඔවුන්ගේ අනුමැතීන් ප්‍රමාදවීම, හේතුවෙන් බදු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කල් ඉකුත් දින ඉක්මවා ගොස් තිබුණි.	ප්‍රමාදයකින් තොරව බදු ගිවිසුම් අත්සන් කිරීමට සියළු උත්සාහයන් ගෙන ඇත

	බදුකරුගේ නම	බදු ගිවිසුම් අංකය
01	භාර්ති (Bharti) එයාටෙල් ලංකා (පුද්ගලික) සමාගම	436
02	ශ්‍රී ලංකා මර්චන්ට් බැංක් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි	386
03	ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව මහනුවර	393
04	ක්ලෝස් ෂෝප් ලංකා (පුද්ගලික) සමාගම	388

3.69 බීඹීසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	298,760,000	134,623,000	164,137,000	(39,707,000)	තත්ත්වාගණනය නොකල
2022	353,737,000	143,358,000	210,379,000	48,587,000	තත්ත්වාගණනය නොකල
2023	451,393,000	157,356,000	294,037,000	91,778,000	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෙළඳ ශේෂය රු. 51,376,877 ක් වන අතර එහි දින 0 සිට දින 360 ට වඩා වැඩි දිගු හිඟ ශේෂයන් ඇතුලත් වේ. සමාගම විසින් දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. සමාගමේ ගෙවිය යුතු වෙළඳ ශේෂය පිළිබඳ කාල වීශ්ලේෂණයක් පහත දක්වා ඇත.	2022	දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට නිර්දේශ කෙරේ.	ගෙවීම සඳහා ඉන්වොයිස්පත් අප වෙත එවන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියද මේ දක්වා සමහර ගෙවිය යුතු වෙළඳ ශේෂයන් ගෙවීමට ඉල්ලීම් සිදුකර නොමැත. එවැනි සිදුවීමකදී සමාගමේ පරිවය අනුව මෙම ගෙවිය යුතු ශේෂ වසර 5 ක් තබාගෙන පසුව නිසි සත්‍යාපනයක් සිදුකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ආදායමට මාරු කරනු ලැබේ.	ගෙවිය යුතු හිඟ වෙළඳ ශේෂයන් ඉවත් කිරීමට සියළු උත්සාහයන් සිදුකර ඇත.

දින ගණන	මුදල (රු.)
0-90	50,024,617
91-180	712,727
181-270	86,634
271-360	19,989
> 360	532,910
එකතුව	**51,376,877**

(ආ)	සමාගමේ ණය ප්‍රතිපත්තියට අනුව, රජයේ දෙපාර්තමේන්තුවලට, ආයතනික ගණුදෙනුකරුවන්ට සහ තනි ගණුදෙනුකරුවන්ට පිළිවෙලින් දින 60, දින 30 සහ දින 15 ක උපරිම ණය කාලසීමාවන් ලබා දී ඇති අතර උපරිම ණය දිගුව ලබාදෙන්නේ දින 10 කට පමණි.සෑම පාරිභෝගික කාණ්ඩයකම හිඟ ණයගැනි ශේෂ විශ්ලේෂණය කිරීමේදී සමහර ශේෂ සමාගමේ ඉඩ දී ඇති ණය කාලය ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය විය.එම නිසා නියමිත ණය කාලය ඇතුලත හිඟ ණයගැනි ශේෂ අයකරගැනීමට සමාගමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මුළු හිඟ ණයගැනි ශේෂයන්හි කාල විශ්ලේෂණයක් පහත වගුවේ දැක්වේ.	2023	සමාගමේ ණය ප්‍රතිපත්තිය අනුව ණය කාලසීමාව තුලදී ලැබියයුතු ශේෂයන් අයකරගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු බවට නිර්දේශ කෙරේ. එසේම සමාගමේ කාරක ප්‍රාග්ධනයට බලපෑමක් නොවෙමින් දිගු හිඟ ශේෂයන් අයකරගැනීමට නව උපාය මාර්ග භාවිතා කළ යුතු බව නිර්දේශ කෙරේ.	චාරිකා හා සංචාරක ව්‍යාපාරය අවාසනාවන්ත ලෙස ණය මත පදනම් වන වෙළඳපලක් වේ. සමාගමේ ණය ප්‍රතිපත්තියට අවනත වන ලෙස රජයේ ආයතන හෝ ආයතනික ආයතනවලට අනවශ්‍ය ලෙස බලපෑම් කිරීම සේවාලාභින් විවිධ සංචාරක සහ සංචාරක සමාගම් සමඟ ඉදිරියට යාමට සහ ගනුදෙනු කිරීමට අවස්ථාව ඇති බැවින් අපෙන් ඇත් වීමේ අවදානමක් ඇත. අපගේ සැපයුම්කරුවන්ට නියමිත වේලාවට පියවීම් සහතික කිරීම උදෙසා සමාගම තුලට සුමට ලෙස අරමුදල් ගලා එ ීමට සමාගම තුල පවත්නා ණය ප්‍රතිපත්තියට අවනතව කටයුතු කිරීමට කාර්ය මණ්ඩලය වෙත සැමවිටම උපදෙස් දෙනු ලැබේ. මේ සඳහා ගණකාධිකාරීවරයා විසින් කාලානුරූපීව සියලු කාර්ය මණ්ඩලය සමඟ තනිව රැස්වී ණය ගැතියන්ගේ දිගු හිඟ මුදල් අයකර ගැනීම	චාරිකා හා සංචාරක ව්‍යාපාරය ණය මත පදනම් වන වෙළඳපලක් වන අතර, ඔවුන්ගේණය ප්‍රතිපත්තිය අනුව ණය ගැතියන්ගෙන් අයකර ගැනීමට හැකි සියළු ක්‍රියාමාර්ග ගෙන ඇත.

කාර්යභාරය කාණ්ඩය	2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ (රු.000')				මුළු හිඟයේ ප්‍රතිශතයක් ලෙස
	දින 0-180	දින 181-360	දින 360 ට වැඩි	මුළු එකතුව	
රාජ්‍ය	52,217.1	1,250.4	8,054.3	61,501.8	38
සහායකත්ව	73,706.1	7,197.9	19,192.4	100,096.4	62
මුළු එකතුව	125,923.2	8,448.3	27,226.7	161,598.2	100

(i)රු.161,598,215 ක මුළු හිඟ ණයගැති ශේෂයෙන් රු. 125,923,253 හෝ සියයට 78 ක් දින 180 ක කාලසීමාවක් දක්වා සහ රු. 27,226,719 හෝ සියයට 17 ක් දින 360 කට වඩා හිඟව පවතින අතර එය සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අහිතකර ලෙස බලපෑ හැක.

(ii) 161,598,215 ක මුළු හිඟ ශේෂයෙන් රු. 100,096,424 හෝ සියයට 62 ක් ආයතනික ගණුදෙනුකරුවන් ගෙන් ලැබිය යුතු වේ.සමාගම විසින් ආයතනික ගණුදෙනුකරුවන් සඳහා දින 30 ක ණය කාලසීමාවකට ඉඩ දී තිබුණද ,2023 දෙසැම්බර් 31 දිනට මුළු ලැබීම් වලින් රු.26,390,319 හෝ සියයට 16.3 ක් දින පිළිබඳව සාකච්ඡා කරයි.

බොහෝ අවස්ථාවන්හිදී, රාජ්‍ය ආයතන සහ පුද්ගලික/ආයතනික සමාගම් සමඟ, සෑම විටම ගෙවීම් සිදු කිරීම සහ අළුත් ප්‍රවේශපත් නිකුත් කිරීම වෙළඳ රටාවක් වන බැවින් වරකට ආපසු අයකරගත හැකි ප්‍රමාණය ශූන්‍ය වීමේ සීමිත හැකියාවක් පවතී.

	181 කට වඩා හිඟව තිබුණි.				
(ඇ)	පරිපාලිතයේ ප්‍රධාන ව්‍යාපාර කටයුතු 1988 අංක 30 දරන බැංකු පනතේ 17 (1) වගන්තියේ (අ)-(ජී)දක්වා විෂය පථයට නොවැටෙන බැවින්, ඉදිරි වර්ෂ 3 තුල බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම ලංකා බැංකු සමූහයේ හිමිකාරත්වයෙන් ඉවත් කිරිමට 2017 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා බැංකුව වෙත උපදෙස් දී තිබුණි.පරිපාලිතය ඉවත් කිරීමේ තීරණය 2017 දෙසැම්බර් 28 දින ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. 2023 ජූලි 24 දින සමාගම විසින් ඉවත් කිරීම සඳහා යෝජනාවක් සම්මත කර ඇත. 2024 මැයි 19 සහ 20 යන දිනවල පුවත්පත් 5 ක දැන්වීමක් පළ කරන ලද්දේ අනාගත ආයෝජකයින්ගෙන් කැමැත්ත ප්‍රකාශ කරවා ගැනීමට යි. යෝජනාව ඉල්ලුම්	2023	ඉවත් කිරීමේ කටයුතු වේගවත් කළ යුතු බවට නිර්දේශ කෙරේ.	බීඕසී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම ඉවත් කිරීමේ කටයුතු ලංකා බැංකුව මගින් හසුරුවනු ලැබේ.	ක්‍රියාත්මක වෙමින් පවතී.

කිරීම අවසන් කිරීමේදී එක් අනාගත ආයෝජකයෙකු පමණක් ලංසුවක් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, තොරතුරු ප්‍රමාණවත් නොවීම සහ යෝජනාව ඉල්ලුම් කිරීමෙහි දක්වා ඇති පරිදි අවශ්‍යතා සපුරා නොගැනීම හේතුවෙන් එම යෝජනාව ඉල්ලුම් කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගනුදෙනුවට සම්බන්ධ උපදේශකවරයා නිර්දේශ කර ඇත.

3.70 පීපල්ස් ලිසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	180,764,579,000	141,946,268,000	38,818,311,000	4,659,009,000	තත්ත්වාගණනය නොකල
2022	171,073,162,000	131,281,097,000	39,792,065,000	3,017,638,000	තත්ත්වාගණනය නොකල
2023	159,852,088,000	118,025,950,000	41,826,138,000	3,540,497,000	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	තෝරාගත් නියැදියට අනුව, ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් InBank සහ Microfin පද්ධතිවල කාලානුරූපව අක්‍රීය කර නොමැත. ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රීය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි නොගැනීම හේතුවෙන් ව්‍යාපාර ගනුදෙනු සඳහා වගකීම් පැවරීමේදී සැලකිය යුතු ගැටළු ඇති විය හැකිය. උදාහරණයක් ලෙස, ඉල්ලා අස් වූ සේවකයෙකුගේ ගිණුම භාවිතා කර දැනට සිටින පරිශීලකයෙකුට පද්ධතිය තුළ	2022/ 2023, 2023/ 2024	සේවයෙන් ඉවත් වූ සේවකයන්ගේ ප්‍රවේශ ගිණුම් අනිසි ලෙස පරිහරණය කිරීමේ අවදානම අවම කිරීම සඳහා එම ගිණුම් ප්‍රවේශයන් ආයතනයේ යෙදවුම් පද්ධතියෙන් කඩිනමින් ඉවත් කිරීම වැදගත් වේඉවත් වූ . සේවකයින්ගේ පරිශීලක ගිණුම් ඔවුන්ගේ ඉල්ලා අස්වන දිනයේ පාරික දිනය ව්‍යා ය කළ අවසානයේ අක්‍රී .යුතුය	සේවකයෙකු ඉල්ලා අස් වූ විට, මානව සම්පත් දෙපාර්තමේන්තුව සේවකයාගේ පද්ධති ප්‍රවේශය අක්‍රීය කිරීම සඳහා ප්‍රවේශ ඒකකයට තොරතුරු) තාක්ෂණ දෙපාර්තමේන්තුවට) දිනපතා ඉල්ලීමක් .ඉදිරිපත් කරයි	මෙම ක්‍රියාවලියේදී කිසියම් ගැටළුවක් මතු වුවහොත් ඒවා විසඳීමට ඉක්මන් වැළැක්වීමේ පියවර ගනු ලැබේ.

වංචනික ගනුදෙනු සිදු කළ හැකි නමුත් ඔහු/ඇය වෙනත් කෙනෙකුගේ පරිශීලක ගිණුමක් භාවිතා කරන බැවින් එවැනි ගනුදෙනු සඳහා ඔහුට/ඇයට වගකීමක් පැවරිය නොහැක.

3.71 පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	96,052,212	34,609,439	61,442,773	(6,500,086)	තත්ත්වාගණනය නොකල
2022	133,283,665	56,723,169	76,560,496	19,096,383	තත්ත්වාගණනය නොකල
2023	164,779,861	70,082,686	94,697,175	21,307,198	තත්ත්වාගණනය නොකල

විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ) ලැබිය යුතු ගිණුම්				
(i) ලැබිය යුතු මුදල් රු.20,075,063 ක් හෝ සමස්ත වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 85 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු දෑ ලෙස නියෝජනය කරන අතර රු.604,615 ක් හෝ මුළු ලැබිය යුතු මුදලින් සියයට 3 ක් මහජන බැංකුව වෙතින් ලැබිය යුතු වේ. සමාගමේ ණය ප්‍රතිපත්තියට අනුව ණය අය කරගත යුතු කාලය දින 15 ක් වුවද , රු. 7,734,186 ක වෙළඳ ණයගැති ශේෂය තුල වසර 01 කට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂ ඇතුලත් වන අතර	2022/ 2023	ණය ශේෂයන් ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා පසු විපරම් ක්‍රියා පරිපාටි ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	-	සටහන් කර ගන්නා ලදී . දීර්ඝ කාලයක් තිස්සේ නොගෙවූ ණය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් ගෙන ඇතපෙන්වන . ලද ණයගැතියන් දැනටමත් අයකරගෙන ඇත.

	සමාගම විසින් එම හිඟ ශේෂ වසරක් තුල අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.			
(ii)	ගොඩනැගිල්ල සඳහා නිසි බදු ගිවිසුමක් 2020 වසරේ සිට මහජන බැංකුව සහ පීපල්ස් ට්‍රැවල්ස් සමාගම අතරනොතිබුණි.	2022/ 2023	එම ලේඛන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය .	සඳහන් කරන ලද ගිවිසුම මහජන බැංකුව සමඟ දැනටමත් අත්සන් කර ඇති අතර ක්‍රියාත්මක වෙමින් පවතී.

3.72 පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	11,054,713,518	6,061,617,536	4,993,095,982	979,669,349	තත්ත්වාගණනය නොකල
2022	11,216,615,678	6,563,132,953	4,653,482,725	635,958,900	තත්ත්වාගණනය නොකල
2023	12,144,228,792	6,895,677,109	5,248,551,683	521,578,016	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**				
	(a) ලැබිය යුතු රක්ෂණ වයස් විශ්ලේෂණයෙහි සම්බන්ධිත පාර්ශව පහකින් ලිබිය යුතු රක්ෂණ ශේෂ රු. 10,914,222 ක් ඇතුලත්ව ඇත. කෙසේ වෙතත්, සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු රක්ෂණ වාරික සඳහා වෙනම වයස් විශ්ලේෂණයක් පවත්වාගෙන නොතිබුණි.	2022	සම්බන්ධිත පාර්ශව අතර ලැබිය යුතු රක්ෂණයේ වයස් විශ්ලේශනයන් හඳුනාගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා වෙනම යාන්ත්‍රණයක් තිබීම නිර්දේශ කරනු ලබයි.	සම්බන්ධිත පාර්ශවයන්ට අදාල ප්‍රතිපත්ති සාමාන්‍ය ලැබිය යුතු රක්ෂණ වාරික වයස් විශ්ලේෂණය යටතේ සලකා බැලේ. දිගු කාලීනව ලැබිය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන්ද මේ ආකාරයෙන්ම නියාමනය කරනු ලැබේ.	සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු රක්ෂණ වාරික හඳුනාගැනීම සඳහා වෙනමම යාන්ත්‍රණයක් සම්පූර්ණයෙන් ස්ථාපනය කර නොමැත.

1.7 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම				
(ඉ)ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තීරණ අංක 03, තීරණයට අනුව, වාරික ගෙවීමේ කාලසීමාව වරිකය ගෙවිය යුතු දින සිට දින 60 ක් ලෙස නියම කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අංක 03 දරන තීරණය පටහැනිව විවිධ ප්‍රතිපත්ති සඳහා දින 90 සිට 120 දක්වා ණය කාලය ලබා දී තිබුණි.	2022	ණය ප්‍රතිපත්ති රටේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.	කර්මාන්තයේ තරඟකාරීත්වය පවත්වාගැනීම සඳහා අපි මෙම ප්‍රවේශය සීමිත ලෙස පිළිපදින්නෙමු. අංක 03 තීරණයට අනුකූල වන පරිදි ලබා දී ඇති ණය කාලසීමාවන් අපි ක්‍රමයෙන් අඩු කරමින් සිටිමු.	3 තීරණයට අනුකූලව කාල සීමාව තුල සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීමට සමාගමට තවමත් නොහැකි වී ඇත
1.8 මුදල් පාලනය				
(ආ) සමාගමේ ආයෝජන මෙහෙයුම් අත්පොතේ 2.1 ඡේදයට අනුව, දිගුකාලීන ආයෝජන සහ කෙටි කාලීන ආයෝජන මිශ්‍රණය පිළිවෙලින් සියයට 40 ක් සහ සියයට 60ක් විය යුතුය. කෙසේ වෙතත් 2022 දෙසැම්බර් 31 දිනට	2022	සමාගමේ ආයෝජන ප්‍රතිපත්තියට අනුව දිගකාලීන හා කෙටි කාලීන ආයේජන අතර විචක්ෂණශීලී ආයෝජන මිශ්‍රණයකි තිබිය යුතුය.	කළමනාකාරිත්වයට අනුව. අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමාගමේ වියදම් සහ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ හිමිකම් ගෙවීම් සලකා බලා ආයෝජන ආදායම උපරිම කර ගැනීම සඳහා මෙම තීරණය ගෙන ඇත	මෙහෙයුම් අත්පොත සමඟ ආයෝජන මිශ්‍රණය සමපාත විය යුතුය.

සමාගමේ දිගු කාලීන ආයෝජන සියයට 74 ක් එනම් රු. 6,470,865,303 ක් වූ අතර කෙටිකාලීන ආයෝජන සියයට 26 ක් එනම් රු. 2,223,514,875ක් විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ශාකා කාර්ය සාධනය මැනීම සඳහා ස්ථාවර ක්‍රමවේදයක් හෝ ව්‍යුහයක් නොතිබුන අතර, පෙර වසරේ කාර්ය සාධනය කලාප අනුව ඇගයීමට ලක් කරන අතර ප්‍රවර්ථන වර්ෂයේ කාර්ය සාධනය ශාඛා වශයෙන් ඇගයීමට ලක් කෙරේ. එබැවින් වාර්ෂිකව හා පිරිවැය මධ්‍යස්ථාන පදනමින් සැසඳීමක් කළ නොහැක. වත්මන් වර්ෂයේ ශාඛා විශ්ලේෂණයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ශාඛා 21 න් ශාඛා 3 ක් ලාභ ලැබූ අතර ශාඛා 18ක් පාඩු ලබා ඇත. ලාභ ලබන ශාඛාවල සමුච්චිත ලාභය	2022	වාර්ෂිකව ශාඛා කාර්ය සාධනය මැනීම සඳහා ස්ථාවර ක්‍රමවේදයක් හෝ ව්‍යුහයක් තිබිය යුතුය.	2021 දී ආයතනයට අංශ ප්‍රධානීන් තිදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපාරික අංශ තුනක් තිබුණි. 2022 දී එම අංශ 3 ඒකාබද්ධ කරන ලද අතර පිරිවැය අඩුකර කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා එක් විකුණුම් ප්‍රධානියෙක් පත් කරන ලදී..	කළමනාකරණය සමාගම සඳහා ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඔවුන් 2021 වර්ෂයේ සිට වාර්ෂික සැලැස්මක් අනුව කටයුතු කරයි. ඒ අනුව ශාඛා ජාලයේ අනාගත ලාභදායීතාවය පුරෝකථනය කර ඔවුන්ගේ ආයතනික සැලසුම් සකස් කිරීමට කළමනාකාරිත්වයට නොහැකි වී ඇති බව විගණනය නිරීක්ෂණය කළේය.

රුපියල්
57,502,527 ක් වූ අතර පාඩු ලබන ශාඛා සඳහා වර්ෂය සඳහා සමුචිත පාඩුව රු. 486,742,147 කි.

3.73 පීපල්ස් ලිසිං ෆිලිට් මැනේජ්මන්ට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	445,058,774	59,272,802	385,785,972	153,515,853	තත්ත්වාගණනය නොකල
2022	444,218,702	95,338,757	348,879,945	39,189,932	තත්ත්වාගණනය නොකල
2023	220,052,079	27,649,377	192,402,702	19,091,375	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	පහත සඳහන් ලෙජර් ගිණුම්වල දීර්ඝකාලීනව හිඟ හිටි රු. 793,152 ක වටිනාකම ඇති වෙනත් මූල්‍ය වත්කම් නිරීක්ෂණය විය. ලෙජර් ගිණුම් රු. ණය ගැති-ණයපත් 10,049 නඩත්තු වියදම්-වෙනත් සමාගම් වාහන 280,052 පිස්ල්සි සමූහ කාර්ය මණ්ඩල 83,678 ණය ගැතිපිපල්ස් - මර්චන්ට් පිස්ල්සි 419,373	2021/ 2022	දිගුකාලීන හිඟහිටි ශේෂවල අයකර ගැනීමේ හැකියාව හා සුදුසුබව තක්සේරු කිරීම අවශ්‍ය වේ.	එම ශේෂයන් අඩු කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට දිගුකාලීන හිඟ ශේෂයන් තිබීමට හේතුවන සමාගමේ දැනට පවතින අයකිරීමේ ක්‍රියාවලියේ හිඩැස් හඳුනා ගනිමින් සිටී.	සමාගම දැනට එම ශේෂයන් අයකර ගැනීමේ හැකියාව තක්සේරු කරමින් සිටී.

(ආ) අපහත සඳහන් ණය ගැනියන් සම්බන්ධයෙන් දිගුකාලීන හිඟ ශේෂයන් වාර්තා විය.

ලෙජර් මැතුම්	ණ.	ගෙදර ලෙජර් ගෙවුම	ණයකැරියා	ශේෂය (රු.)
ණය ගැනී-ණයෙන්	10,049	1304990210	තාවකාලික විදේශීය-ණයකරු සමාගම් විශ්‍රහය	280,052
තාවකාලික විදේශීය-ණයකරු සමාගම් විශ්‍රහය	280,052	PMPLC	ණයකරුගය-විසඳුම් ඉදිරිපත් සිදුලදී	419,373
සිදුලදී සඳහා කාර්ය මණ්ඩල	83,678	1304990022	ණයකරුයෝ -විසඳුම් දීමේ-මුදල සමාගම්	776,568
ණය ගැනීමදෙස්-ත්‍රිවිධාරී සිදුලදී	419,373			

3.74 පීපල්ස් ලිසින්ග් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,711,213,467	911,883,250	1,799,330,217	240,622,829	තත්ත්වාගණනය නොකල
2022	3,060,561,071	978,669,062	2,081,892,009	398,310,971	තත්ත්වාගණනය නොකල
2023	3,521,322,241	1,001,809,005	2,519,513,236	466,635,621	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 මාර්තු 31 දිනට සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු.4,931,450 ක ශේෂයක් වසර 5 කට වැඩි කාලයක සිට කිසිදු ගනුදෙනුවක් සිදු නොවී පැවතිණි.	2022/ 2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව අදාළ ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුවේ.	සමාගම විසින් හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.	සමාගම දැනට හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව සමඟ සාකච්ඡා පවත්වයි.

3.75 පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,070,809,760	2,552,191,322	518,618,438	196,856,866	තත්ත්වාගණනය නොකල
2022	2,635,250,826	2,122,969,234	512,281,592	67,028,756	තත්ත්වාගණනය නොකල
2023	2,941,796,183	2,318,838,230	622,957,953	111,010,290	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ප්‍රවර්තන ණය සඳහා වෙන් කිරීම් ගණනය කිරීමේදී, හිඟ දින ගණන (days past due) පද්ධතිය තුල නොමැති වීම හේතුවෙන් ණය සම්බන්ධ වෙන්කිරීම සඳහා ගනුදෙනුකරුගේ ණය ශේෂයේ වයස පදනම් කර තිබුණි. ගනුදෙනුකරුගේ ණය ශේෂයේ වයස, සමස්ත හිඟ මුදල මත පදනම් වන හෙයින් එමඟින් තත්‍ය ණය හිඟ දින ගණන පෙන්නුම් නොකෙරේ.	2022/ 2023	ණය හිඟ දින ගණන නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	ණය හිඟ දින ගණන (DPD) ගණනය කිරීම වයස (පද්ධති උත්පාදනය) මත පදනම්ව සිදු කරන අතර නිවැරදි DPD සඳහා සමාගම අතින් ගණනය කෙරේ.	සමාගම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ පද්ධතියේ DPD ගණනය කිරීම ස්වයංක්‍රීය කිරීම ආරම්භ කර ඇත.

3.76 කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	159,276,727	219,857,297	(60,580,570)	28,146,609	තත්වාගණනය නොකල
2022	175,357,056	202,745,307	(48,020,135)	33,192,319	තත්වාගණනය නොකල
2023	235,567,335	283,587,470	(27,388,251)	20,631,884	තත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය.**				
	(ඇ) සමාගම විසින් සියලුම ගෙවීම් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ (මව් සමාගම) ගෙවීම් වව්චර උපයෝගී කරගනිමිනි. ස්වාධීන සමාගමක් වශයෙන් වව්චර පිළියෙල කර ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදයක් සමාගම තුල ස්ථාපනය කර නැත.	2021	කළමනාකාරිත්වය විසින් සමාගමට අනන්‍යවූ ගෙවීම් වවුවර සහිත ගෙවීම් පද්ධතියක් සහ ක්‍රියාකාරී අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දිය යුතුය.	ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු අනුව 2022 වර්ෂයේ සිට සමාගම සඳහා ගෙවීමේ වව්චර හඳුන්වාදීමට කටයුතු කරනු ඇත.	මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පුද්ගලික) සමාගම වව්චර ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදයක් සමාගම තුල ඇති කර නොමැත
	(d) සමාගමේ සේවකයින්ට ලබාදෙනු ලබන ණය පහසුකම් සහ	2021, 2022	සේවකයන්ට ලබාදෙන ණය පහසුකම සේවක ප්‍රතිලාභවල කොටසකි. මේ නිසා සේවකයින්ට	ණය ලෙජරයක් පවත්වාගෙන යාම 2022දී ආරම්භ කර ඇත.	සේවක ණය මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ

එහි අයකර ගැනීම් සමාගමේ පොත්වල සටහන් කර නොතිබුණි. ඒ වෙනුවට එම ශේෂයන් මව් සමාගමේ පොත්වල සටහන් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු. 155,295,603ක් ලෙස දැක්වේ.		ලබාදෙන ණය සම්බන්ධව ලේඛණ සමාගම විසින් පවත්වාගෙන යායුතුය.		(පුද්ගලික) සමාගමේ ගිණුම්වල මේවනවිටත් ගිණුම් ගත වී නොමැත.
1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා				
රු. 597,098 නොසැසඳු ගිණුම් ශේෂයක් සමාගම සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග ඇති ජංගම ගිණුම් අතර නිරීක්ෂණය විය	2021	කළමනාකරණය විසින් මෙකී වෙනස්වීම් සඳහා හේතු හඳුනාගෙන කාලඡේදයන්ට අනුකූලව ඒවා නිවැරදි කිරීමට කටයුතු කලයුතුය.	ගිණුම් අතර සංසන්දනය දැනටමත් ලබාදී ඇත.	රු. 52,353,772 ක වෙනසක් 2023 වර්ෂයේදී නිරීක්ෂණය විය.
1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම				
(අ.) වෛද්‍ය නිවාඩු සඳහා දීමනා ගෙවීම රු. 23,572,912 ගෙවීම සඳහා අනුමත කරනලද ආයතනික ප්‍රතිපත්තියක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා දී නැත.	2021, 2022	කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස්කර අදාල පරිදි අධිකාරී බලය ලබාගැනීමට කටයුතු කලයුතුය.	මෙය ආරම්භයේ සිටම සමාගමේ පරිවයක් ලෙස ක්‍රියාත්මක වූවකි.	වෛද්‍ය නිවාඩු දීමනා සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස් කර නොමැත.

(ආ.) වාහන ණය රු. 75,802,708 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් සහිත ආයතනික ප්‍රතිපත්තියක්	2022	කළමනාකරණය විසින් මේ සඳහා නියමිත ප්‍රතිපත්තියක් සකස් කර අදාල පරිදි අධිකාරී බලය ලබා ගැනීමට කටයුතු කල යුතුය	මෙය ආරම්භයේ සිටම සමාගමේ පරිචයක් ලෙස ක්‍රියාත්මක වූවකි..	නියමිත ප්‍රතිපත්තියක් සකස්කර නොමැත.
(ඇ.) ලාභයෙන් ගෙවන බෝනස් මුදල රු.39,377,303 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව	2022			
(ඇ.) තෑගි වවුචර දීමනාව රු.1,305,000 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සහ අනුමැතිය	2022			
1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්				
2020 අංක 04 දරන ආර්ථික සහ සේවා ගාස්තු (සංශෝධන) පනත අනුව ආර්ථික සහ සේවා ගාස්තු අයකිරීම 2020 ජනවාරි මස සිට අත්හිටුවා ඇත.. නමුත් 2021 දෙසැම්බර් 31 දින වනවිට නැවත අයකරගැනීම සඳහා සුදුසු පියවර ගැනීමට අපොහොසත්වූ රු. 4,346,862 ක සහ ගෙවිය යුතු රු. 1,940,901 ක ආර්ථික සේවා	2021, 2022	කළමනාකරණය විසින් මෙම ශේෂයන් ආපසු අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග ගතයුතුයි	මේ සම්බන්ධයෙන් යොදා තිබූ ජනල් සටහන මගින් සිදුවූ බලපෑම නිවැරදි කිරීමට කටයුතු කරන අතර නැවත ජනල් සටහන් යෙදීමට පෙර නිසි අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත.	මෙම වටිනාකම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් සමාගම විසින් ගෙන නොමැත.

ගාස්තු වටිනාකමක් ගිණුම්වල නිරීක්ෂණය විය.				
1.6.1 ලැබිය යුතු මුදල් ලැබිය යුතු වැට්බදු ලෙස රු. 218,482 ක ශේෂයක් 2019 වර්ෂයේ සිට ඉදිරියට ගෙනවිත් ඇත. සමාගම විසින් එම ශේෂය හඳුනාගෙන නැවත අයකරගැනීමට කටයුතු කර නොතිබුනි.	2021	කළමනාකරණය විසින් මෙම ශේෂයන් ආපසු අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග ගතයුතුයි	කළමනාකරණයට අනුව ගෙවිය යුතු වැට් බදු සහ වැට්බදු ආදාන වටිනාකම අතර ගැලපීමකින් මෙම ශේෂය හටගෙන තිබේ. මෙය ගිණුම්කරණ දෝශයකි. මෙය නිසි සාධාරණීකරණයක් සහිතව ලබන වසරේදී ගැලපීමට කටයුතු කරනු ඇත..	මෙම වටිනාකම 2023 මූල්‍ය වාර්තාවලද දක්නට ලැබේ.
1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම. (ආ) යහපාලන, මනා පරිචය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ B.3 වගන්තිය අනුව සමාගමේ වාර්ෂික වාර්තාවේ වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාවක් අඩංගු විය යුතුයි. කෙසේ වෙතත් සමාගමේ සහ මව් සමාගමේ වේතන ප්‍රතිපත්තිය මව් සමාගමේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර නොතිබුන බව නිරීක්ෂණය විය.	2022	ආයතනයේ වාර්ෂික වාර්තාවේ වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාවක් ඇතුලත් විය යුතුයි	ආයතනයේ වාර්ෂික වාර්තාවේ වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාවක් ඇතුලත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොමැත.	ආයතනයේ වාර්ෂික වාර්තාවේ වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාවක් ඇතුලත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොමැත.

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ.) සමාගමේ එක් අරමුණක් වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා බඳවාගැනීම සහ යොමු කිරීමයි. කෙසේවෙතත් සමාගම විසින් බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකාර තනතුරු සමාගම විසින් හඳුනාගෙන නොතිබුනි. තවද සමාගමේ සංවිධාන ව්‍යුහය විගණනයට ඉදිරිපත් කර නොමැත	2022	සමාගම හරහා බඳවාගැනීමට සහ යොමු කිරීමට අවශ්‍ය ප්‍රධාන කළමනාකරණ තනතුරු සමාගම විසින් හඳුනාගත යුතුයි.	සමාගමේ සංවිධාන ව්‍යුහය සකස් කර ඉදිරිපත් කර ඇත	ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යනුවෙක් බෙදා වෙන් කර ඇත. මෙම වෙන් කිරීමෙන් පසු සමාගමේ සේවකයන්ද එම ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ආයතනවලට ස්ථිරව පත් කර ඇත. මේ නිසා සමාගමේ සංවිධාන ව්‍යුහය වෙනස් කර ඇත.
(ඇ) සමාගම විසින් 2022 වර්ෂය සඳහා බඳවා ගැනීමේ සැලැස්මක් පිළියෙල කර නොමැත. වැටුප් ලේඛනයට සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ තනතුරු දෙකක් (02) විශ්‍රාම යාම/ ඉල්ලා අස්වී ඇත. තවද සමාලෝචිත වර්ෂය තුලදී පුද්ගලයන් හය දෙනෙකු (06) සමාගම සඳහා බඳවාගෙන මව්	2022	සමාගම සතුව නියමිත බඳවාගැනීමේ සැලස්මක් පැවතිය යුතුය.	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උපායමාර්ගික සැලැස්ම සහ ව්‍යාපාරික අවශ්‍යතා මත බඳවාගැනීම් සිදු කරයි	ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යනුවෙක් බෙදා වෙන් කර ඇත. මෙම වෙන් කිරීමෙන් පසු සමාගමේ සේවකයන්ද එම ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ආයතනවලට ස්ථිරව පත් කර ඇත.

සමාගම වෙත අනුයුක්ත කර ඇත.				
4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය				
4.1 අභ්‍යන්තර විගණනය සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇත. නමුත් අභ්‍යන්තර විගණන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2022	අභ්‍යන්තර විගණන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය.	කළමනාකරණයට අනුව අභ්‍යන්තර විගණන වාර්තාව අවසන් කල පසු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අභ්‍යන්තර විගණන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොමැත

3.77 ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	2,094,880,624	1,079,155,295	1,015,725,329	(343,711,481)	තත්ත්වාගණනය කල
2022	1,998,574,171	1,344,413,113	654,161,058	(370,278,935)	තත්ත්වාගණනය කල
2023	2,125,748,733	1,635,827,141	489,921,592	(205,344,079)	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 02 ඡේදය ප්‍රකාරව නිලවාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 41 දෙනෙකු සඳහා ප්‍රවාහන දීමනා වශයෙන් රු.6,524,899 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි.	2022	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	පොදු ප්‍රවාහන පහසුකම් අවම වීමද සලකා මෙම දීමනාව ආයතනික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා ඇත. නිලවාහන හිමිකම් නොමැති කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව සඳහා අනුමැතිය ඉල්ලා 2023 සැප්තැම්බර් 25 සහ 2024 මාර්තු 16 දිනැති ලිපි ජනමාධ්‍ය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු

					කර ඇත. එය ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ කර අනුමැතිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2024 ජූලි 22 දින යොමු කර ඇත. 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අනුමැතිය ලැබී නොතිබුණි.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ ලැබියයුතු ශේෂය රු.905,105,718 ක් වූ අතර රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා 4 ක වර්ෂ පහ ඉක්මවූ රු. 222,661,338ක ශේෂය ඇතුළුව ලැබියයුතු රු.903,747,078 ක් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2023	ණය ගැනි ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	මේ වන විට රු.මි. 19.7 ක් පමණ ප්‍රමාණයකට නීතිමය ක්‍රියාමාර්ග සඳහා නීති අංශයට යොමු කර ඇති අතර ඉන් රු.මි. 5 ක පමණ ප්‍රමාණයකට නීති කටයුතු අවසන් කර ඇති බව දන්වා ඇත.	වර්තමානයේ ණය ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.
(ඇ)	ස්වාධීන රූපවාහිනී සේවයේ වසර 05 ඉක්මවූ රු.100,000ට වැඩි ණයගැනි ශේෂ අතුරින් රු.139,877,017ක් ද වසන්තම්	2021 2022 2023	ණය ගැනි ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	වසර ඉක්මවූ ණයගැනි ශේෂයන් අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කළත් එම නියෝජිත ආයතන මෙහෙයුම් කටයුතු නවතා ඇති බැවින් නීතිමය පියවර	මෙම ශේෂයන් තුල ඇති ප්‍රති වෙළඳ ගනුදෙනු ශේෂයන් හා සත්‍ය වශයෙන් දැන්වීම් විකාශනය නොවූ ශේෂය

	රූපවාහිනී නාලිකාවේ, වසන්තම් ගුවන්විදුලි නාලිකාවේ හා ලක්හඬ ගුවන් විදුලි නාලිකාවේ වසර ඉක්මවූ රු.100,000ට වැඩි ශේෂයන් අතුරින් පිළිවෙලින් රු.21,610,622ක්, රු.885,903ක්, හා රු.6,810,041 ක් ද සමාලෝචිත වර්ෂයට පෙර වසරේ පැවති ශේෂයම නොවෙනස්ව පැවති අතර එම ශේෂ අයකර ගැනීම සඳහා සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.			ගැනීමේ කටයුතු දිගටම කරගෙන යාමේ ප්‍රායෝගික ගැටළු ඇති වී තිබූ බව දන්වා ඇත .	රු.මිලියන 60.2 ක් පමණ වන අතර එම ශේෂයන් විගණන හා කළමනාකරණ කමිටුවට යොමුකර අදාළ නිර්දේශ සහිතව ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා පොත් වලින් ඉවත් කර තිබූ බව දන්වා ඇත.
(ඇ)	සමාගම විසින් විකාශනාගාර කුළුණු දුරකථන සමාගම් වෙත බදු දීමේ දී, දුරකථන සමාගම් සමඟ එළඹී බදු ගිවිසුම් 05 ක් අවලංගු වීමෙන් පසුව එළඹෙන කාලපරිච්ඡේදයට අදාළව එම ගිවිසුම් අළුත් කිරීමකින් තොරව සන්නිවේදන පහසුකම් සැපයීමට	2023	විධිමත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු අතර අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සන්නිවේදන කුළුණු කුලියට දීම සම්බන්ධව ඇතැම් සේවාදායක ආයතන වල ගිවිසුම් අළුත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එම ගිවිසුම් අළුත් කරන තුරු සේවා සැපයීම දිගටම සිදු කර ඇත. ලංකා බෙල් ආයතනයෙන් ලැබිය යුතු රු.6,502,042 ක මුදල් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතී. අනෙක්	ගිවිසුම සකස් කිරීම සඳහා පාලන අංශයේ නීති නිලධාරිණිය වෙත යොමුකොට අදාළ ආයතන වෙත කෙටුම්පත් යොමුකොට ඇති බව දන්වා ඇත. නමුත් දුරකථන ආයතන වල තිබෙන

කටයුතු කර තිබුණි. තවද සන්නිවේදන පහසුකම් සැපයීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට දුරකථන සමාගම් වලින් අයවිය යුතු හිඟ ශේෂය රු.19,971,680 ක් ව පැවතුණි.

සේවාදායකයන්ගෙන් ලැබිය යුතු මුදල් මේ වනවිට අය වෙමින් පවතින බව දන්වා ඇත.

අභ්‍යන්තර ගැටළු මත එම ගිවිසුම් වල නිරවද්‍යතාවය පරීක්ෂා කොට නැවත සමාගම වෙත ලැබීමේ ප්‍රමාදයක් පවතින බැවින් එම ගිවිසුම් කලට වේලාවට යාවත්කාලීන වීම පිළිබඳව ගැටළු පැනනැගී ඇති බව දන්වා ඇත. සමහර ආයතන වසා දමා ඇති බවත් අලුත් කර නොතිබූ ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.

2024 සැප්තැම්බර් 30 දින වනවිට තවදුරටත් රු. 13,663,821 ක් අයවිය යුතුව පැවතුණි.

(ඉ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයගැතියන් විසි දෙදෙනෙකුගෙන් සමන්විත ප්‍රතිවෙළඳ ණය ගැති ශේෂ එකතු වටිනාකම රු.28,824,030 ක් වූ අතර සමාගම විසින් අදාළ සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වර්ෂ 05 ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණය ගැති ශේෂයන්ගේ එකතුව රු.17,288,1678 ක් වී තිබුණි.මෙම ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දීද කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	ප්‍රති වෙළඳ ශේෂ අයකර ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය.	ප්‍රති වෙළඳ ගනුදෙනු වලට අදාළ සේවාව ලබාගත් බවට තහවුරු කෙරෙන ලේඛන නොතිබීම නිසා මෙම වටිනාකම ගිණුම් වල පෙන්නුම් කෙරෙන නමුත් ඊට අදාළව ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව හානිකරණ ගැලපීම් සිදු කර ඇත. ඉදිරියේදී අදාළ වක්‍රලේඛ වලට අනුව දීර්ඝ කාලයක් පවතින ප්‍රතිගනුදෙනු ශේෂයන් කපා හැරීමට කටයුතු කරන බව දන්වා ඇත.	විගණන හා කළමනාකරණ කමිටුවේ මේ සම්බන්ධව විස්තරාත්මකව විශ්ලේෂණය කර අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත.
(ඊ)	සමාගමෙහි ස්කන්ධ ප්‍රාග්ධනය 2015 වර්ෂයේ රු. 3,198,499,721 ක් වූ අතර 2022 වර්ෂයේදී රු.654,161,058 ක් වූ ස්කන්ධ ප්‍රාග්ධනය සමාලෝචිත වර්ෂයේ දී රු.489,921,592 ක් දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. සමාගම 2016 වර්ෂයේ සිට 2022	2021 2022 2023	අලාභ අවම කර ගැනිමටත් ආදායම් වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.	2023 වර්ෂයේදී අලාභ තත්ත්වය අඩු කර ගනු ලැබුවද අලාභ තත්වයන් හේතුවෙන් ස්කන්ධ ප්‍රාග්ධනය අඩු වී ඇති නමුත් 2024 වර්ෂයේදී ලාභදායී මට්ටමට ලභා කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	2023 වර්ෂයට සාපේක්ෂව 2024 දී අලාභ තත්වය සියයට 50 පමණ අඩු කරමින් ලාභ සමායන ලක්ෂයට ළඟා වීමට අපේක්ෂා කරන බව දන්වා ඇත.

වර්ෂය දක්වා රු. 107,189,266 ක් සිට රු. 361,564,271 ක් දක්වා අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ද රු.213,739,466 ක් වශයෙන් අඛණ්ඩව අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනී සේවයේ අලාභය රු.180,808,436 ක් වූ අතර ඒ යටතේ පවතින වසන්තම් ටීවී, අයිටීඑන් එෆ්එම්, අලාභයන් පිළිවෙලින් රු.9,882,712 සහ රු.27,816,668 ක් විය.

3.78 ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ශ්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	18,692,467	29,600	18,662,867	(9,600)	තත්ත්වාගණනය නොකල
2022	18,673,267	9,600	18,663,667	800	තත්ත්වාගණනය නොකල
2023	18,637,747	23,000	18,614,747	(48,920)	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	1985 වර්ෂයේ දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ යෙදීම වෙනුවෙන් මෙම සමාගම මූලිකව ආරම්භ කර තිබුණු අතර 2007 අගෝස්තු 01දින සිට මෝටර් රථ, ලොරි, බස්, වෑන්, ටැක්සි කැබ්ස්, ඔමිනි බස් හෝ ඕනෑම අනෙකුත් ආකාරයේ රථ වාහන මිලදී ගැනීම්, අලෙවි/කල්බදු හෝ කුලී පදනමට ලබා ගැනීම සඳහා එහි අරමුණු පසුකාලීනව වෙනස් කරගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු ලෙස	2023	සමාගමේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි මෙහෙයුම් කටයුතු සක්‍රිය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.	මෙම සමාගමේ ව්‍යාපාර කටයුතු සිදු නොවන නමුත් අනාගතයේදී මෙම සමාගමේ කටයුතු සක්‍රීය කිරීමට අදහස් කරන බැවින් ඇවර කිරීමකින් තොරව පවත්වාගෙන යනු ලබයි.	ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින අතර එම නිසා කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් සිදු වී නොමැත. මෙම තත්ත්වය හේතු කොට ගෙන මෙම සමාගම ඇවර කිරීමේ හැකියාව සලකා බලා ඉදිරි තීරණ ගැනීමට 10/07/2024 දින සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර

	රු.33,800 ක් හා ලේකම් ගාස්තු ලෙස රු.15,120 ක් වන පරිදි රු.48,920 ක වියදමක් පමණක් ආදායම් ප්‍රකාශයෙන් නිරූපණය වූ අතර ඒ හැර කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු කර නොතිබුණි.				ඇත.
(ආ)	මෙම සමාගම සතු අක්කර 8 කින් යුත් හෝකන්දර ඉඩම 2014 වර්ෂයේදී රු.3,801,363 කට හා 2015 වර්ෂයේදී අංක 3068095 දරන ජංගම ගිණුමේ රු.13,958,641 ක ශේෂය, සි/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගමේ ජංගම ගිණුමට පවරාගෙන තිබීම හේතුවෙන් සමාගමේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	සමාගමේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි මෙහෙයුම් කටයුතු සක්‍රිය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.	සටහන් කර ගන්නා ලදී.	ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින අතර එම නිසා කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරිකමක් සිදු වී නොමැත. මෙම තත්ත්වය හේතු කොට ගෙන මෙම සමාගම ඇවර කිරීමේ හැකියාව සලකා බලා ඉදිරි තීරණ ගැනීමට 10/07/2024 දින සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

3.79 සැලසිනේ මීඩියා සොලූෂන්ස් පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	436,001,394	343,615,026	92,386,368	(6,841,002)	තත්ත්වාගණනය කල
2022	373,289,927	275,558,426	97,731,501	(14,695,458)	තත්ත්වාගණනය කල
2023	364,102,084	284,333,129	79,768,955	(18,647,695)	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	අවශ්‍යතාවයට වඩාත් යෝග්‍ය වන ගොඩනැඟිල්ලක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තෝරාගැනීම වෙනුවට ආයතනය සමාලෝචිත වර්ෂයේදී විශාල අලුත්වැඩියාවන් සිදු කිරීමට පවතින වර්ග අඩි 6850ක ගොඩනැඟිල්ලක් මසකට රු.675,000ක මුදලකට වසර 10ක බදු පදනම මත ලබාගෙන තිබුණි. ගොඩනැඟිල්ලේ හිමිකරු හා ආයතනය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව නිමකරන ලද වැඩ පරීක්ෂා කිරීමක් සිදුවූ බවට	2021	ආයතනයට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කළ යුතුය.	මූල්‍ය අපරාද විමර්ශන අංශය මඟින් මේ සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර ඊට අදාළ සියලු ලිපිලේඛන ආදිය ඔවුන්ගේ භාරයට ගැනීම සිදුකර ඇත.	මූල්‍ය අපරාද විමර්ශන අංශය මඟින් මේ සම්බන්ධව විමර්ශනයක් ආරම්භ කර ඊට අදාළ සියලු ලිපිලේඛන ආදිය ඔවුන්ගේ භාරයට ගැනීම සිදුකර ඇත.

			හෝ තවදුරටත් අලුත්වැඩියා කටයුතු අවශ්‍ය වන්නේද යන්න හඳුනාගැනීමකින් තොරව ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 21ක් ද ඊට අතිරේකව රු.මි.8ක් ඉක්මවූ මුදලක් ද වැයකර තිබුණු අතර නැවත අයකරගත හැකි තැන්පතුවක් ලෙස මාස හයක ගොඩනැඟිලි කුලී වටිනාකම රු.4,050,000 ක්ද ගොඩනැඟිලි හිමිකරුට ගෙවා තිබුණි. ඒ සඳහා අවශ්‍ය මුදල් සපයාගැනීම සඳහා ආයතනයේ රු.23,000,000ක ස්ථාවර තැන්පතු තුනක් ඉවත්කරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් ආයතනයට රු. 1,066,424කට ආසන්න පොලී ආදායමක් අහිමි වී තිබුණි.		
(ආ)	ආයතනය විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් අංක 224,	2021 2022	ගිවිසුම් ගත කාලය හා ගිවිසුම් ගත වියදම් පිළිබඳ අවධානය යොමුකරමින් ආයතන	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් සමාගම් වෙත ඇති	ආයතන දෙක අප අතර ලැබියයුතු රු.7,946,311.73 ශේෂයන්හි

බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දරන ස්ථානයේ පිහිටි ගොඩනැඟිල්ලේ පහළ මාලය අංක 4660 දරන බදු ගිවිසුම මඟින් 2014 ජනවාරි 15 දින සිට 2019 ජනවාරි 14 දින දක්වා වසර 05ක කාලයකට බදු පදනම යටතේ ලබාගෙන තිබූ අතර එම බදු කාලය අවසන් වීමෙන් පසුවද 2022 මාර්තු මාසය දක්වා වසර තුනකට වැඩි කාලයක් එම පරිශ්‍රයේ රැඳී සිට තිබුණි. එසේ වුවද නැවත විධිමත් පරිදි ගිවිසුමකට එළැඹීමට කටයුතු කර නොතිබුණු අතර මෙසේ ගිවිසුමකට නොඑළඹී රැඳී සිටි කාලය වෙනුවෙන් ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපති වෙත යොමුකරන ලද 2022 මැයි 25 දිනැති අංක NFC/103/04/01 දරන ලිපිය ප්‍රකාරව අතර ගැටළු ඇති නොවීමට හා ගැටළු නීත්‍යානුකූලව විසඳාගැනීමට කටයුතු කළ යුතුය.

මුදලින් පියවා ඉතිරි මුදල අප සමාගම වෙත ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපියක් 2023 ජූලි 26 වන දින නිකුත් කර ඇත.

පවතින ගැටලුව මෙතෙක් නිරාකරණය වී නොතිබුණි.

	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාසික ගොඩනැඟිලි කුලී තක්සේරු වාර්තාව අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු. 12,111,000 ක් බවට දන්වා තිබුණි. එසේ වුවද ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල ගෙවියයුතු හිඟ මුදල ලෙස පැරණි ගිවිසුම ප්‍රකාරව රු.4,725,000ක් පමණක් හඳුනාගෙන තිබුණු අතර මෙම ගැටළුව විසඳාගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.				
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා 2(1) වන උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර ගැනීම සඳහා මෙම වාර්තාවේ දින දක්වා කටයුතු කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණකවරයකු මෙම විගණන	2023	පනතේ විධිවිධාන වලට අනුකූලව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගත යුතුය.	2024 වර්ෂයේදී ආයතනයේ යෝජිත කාර්යමණ්ඩලය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බැවින් එය අනුමත කිරීමේදී ප්‍රථම විගණක වරයෙකු කාර්යමණ්ඩල සංයුතියට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත.	සමාගමේ යෝජිත කාර්යමණ්ඩලය අනුමත කරගැනීම සඳහා ලිපි හුවමාරුවක් සිදුව නොතිබුණු අතර ගැටලුව සාකච්ඡා මට්ටමේ පවතී. මෙතෙක් අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණි.

	වාර්තාවේ දිනය දක්වා පත්කර නොතිබුණි.				
(ඇ)	2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා ආයතන සංග්‍රහය VII පරිච්ඡේදයේ 5 වගන්තියට පටහැනිව 2023 සැප්තැම්බර් 30 දිනට ආයතනයේ නිලධාරීන් 04 දෙනෙකුට වැටුප් වශයෙන් රු. 1,519,236ක් වැඩිපුර ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය	මූලික වැටුපට එකතු කර ගෙවීම් කටයුතු සිදුකර ඇති වැටුප් වර්ධක පහ, 2022 ඔක්තෝබර් 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ගෙවීම වසර 05ක කාලයක් දක්වා නවතා ඇත. එමෙන්ම 2024 ජනවාරි 05 පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව, වැඩිපුර ගෙවා ඇති වැටුප් අයකර ගැනීමේ ගැටලුවක් පවතින බවට දැනුම් දී ඇත.	වැඩිපුර ගෙවන ලද මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.80 සී/ස එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,429,440,000	1,594,195,000	1,835,245,000	332,012,000	තත්ත්වාගණනය කල
2022	3,330,284,000	1,571,420,000	1,758,864,000	(191,937,000)	තත්ත්වාගණනය කල
2023	3,195,071,000	1,404,351,000	1,790,720,000	22,775,000	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවකයන් විශ්‍රාම යාම,සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා සමාගමෙන් ඉවත් වූ වසර 01 සිට වසර 25දක්වා අය කර නොගත් සේවකයන් 17දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.6,359,729ක්වූ ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	කඩිනමින් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නීති මගින් අයකර ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නීති අංශයට යොමු කොට ඇත.	2024 ජූලි 31 දිනට මෙම මුදලින් රු.622,685.28 ක මුදලක් පමණක් අයකර ගෙන ඇත.
(ආ)	2008දෙසැම්බර් මස සමාගම විසින් ලංකා පුවත් ලිමිටඩ් හි කොටස් 1200ක් මිලදී ගැනීම සඳහා රු.1,200,000 ක මුදලක් වැය කර තිබුණි.කෙසේ	2023	ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජනය කළ යුතුය.	ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ලංකා පුවත් සමාගම 2014 වසරේ සිට ක්‍රියාත්මක නොවන සමාගමකි.	ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ලංකා පුවත් සමාගම 2014 වසරේ සිට ක්‍රියාත්මක නොවන

				වෙතත්2023 දෙසැම්බර් 31වන විටත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ආයතන 03 ක් සමග වලංගු ප්‍රතිවෙළඳ ගිවිසුම් නොමැතිව වටිනාකම රු.21,357,080 ක දැන්වීම් පල කර තිබුණු අතර ගිවිසුම් ඉදිරිපත් වූ ආයතන දෙකෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අදාළව සමාගම සමග සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රතිවෙළඳ දැන්වීම් පල කිරීම සඳහා ගිවිසුමට එළඹ තිබුණේ ගිවිසුමේ වලංගු කාලය අවසන් වීමට දින 03කට පෙර වූ අතර තවත් එක් පෞද්ගලික මාධ්‍ය ආයතනයක් සමග ඇති කර ගත් ප්‍රතිවෙළඳ ගිවිසුමේ එකඟ වී තිබුණු වටිනාකම ඉක්මවා රු.1,815,925 ක් වූ දැන්වීම් පල කර තිබුණි. තවද සමාගම විසින් ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන්	2023	ප්‍රතිවෙළඳ ගිවිසුම් විධිමත්ව පවත්වා ගෙන යාමට කළමනාකරණය කටයුතු කළ යුතුය.	ඉදිරියේදී ප්‍රති වෙළඳ ගිවිසුම් කළමනාකරණය වඩාත් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අදාළ නිළධාරී වෙත උපදෙස් මාලාවක් නිකුත් කර ඇත.	ඉදිරියේදී ප්‍රති වෙළඳ ගිවිසුම් කළමනාකරණය වඩාත් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අදාළ නිළධාරී වෙත උපදෙස් මාලාවක් නිකුත් කර ඇත.

	නෙට්වර්ක් සමග ප්‍රතිවෙළඳ ගිවිසුමකින් තොරව 2021හා 2022වර්ෂවල වටිනාකම රු.18,595,910ක් වූ දැන්වීම් පළ කර තිබුණු අතර, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිවෙළඳ ගිවිසුම් යටතේ සෙසු මාධ්‍ය ආයතනවල උපයෝජනය කළ දැන්වීම්වල වටිනාකමට අදාළ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.				
(ඇ)	නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා 1985 වර්ෂයේදී මිලදී ගත් 2021වර්ෂයේදී රු.733,000,000 කට නැවත තක්සේරු කළ හෝකන්දර ප්‍රදේශයේ පිහිටි අක්කර 8ක ඉඩම මිලදී ගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.	2023	ආයතනයේ අරමුණුවලට අනුකූලව ඵලදායී ලෙස ආයෝජනයන් සිදු කළ යුතුය.	2024 සැප්තැම්බර් 11 දින ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව ආයතන 02ක් විසින් නිවාස ව්‍යාපෘතියකට සහ ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතියකට යෝජනා ඉදිරිපත් වූ අතර මේ පිළිබඳ සාකච්ඡා සිදුකරමින් පවතී.	2024 සැප්තැම්බර් 11 දින ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව ආයතන 02ක් විසින් නිවාස ව්‍යාපෘතියකට සහ ක්‍රීඩා සංකීර්ණ ව්‍යාපෘතියකට යෝජනා ඉදිරිපත් වූ අතර මේ පිළිබඳ සාකච්ඡා සිදුකරමින් පවතී.
(ඉ)	සමාගමේ සේවකයන් ස්වේච්ඡාවෙන්	2023	කළමනාකරණය විසින් එකඟ වූ කොන්දේසි පරිදි	ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික ව්‍යුහය, දෙපාර්තමේන්තු ව්‍යුහය,	සංයුක්ත සැලැස්මේ පිටපතක් 2024

විශ්‍රාම ගැන්වීමට අදාළ රු.300,000,000 ක රාජ්‍ය ප්‍රදානයක් ලබා ගැනීම සඳහා 2023 ජුනි මස 23 දින අමාත්‍යාංශය සමග ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමේ එකඟ වූ පරිදි 2023 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු ආයතනික සංයුක්ත සැලැස්ම,ක්‍රමෝපාය සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික ව්‍යුහය,දෙපාර්තමේන්තු ව්‍යුහය,රදවා ගන්නා තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ සැලසුම් ඉදිරිපත් කර නොතිබුණු අතර එකඟ වූ කොන්දේසි ඉටු කර නොතිබුණද, ලබා ගත් රාජ්‍ය ප්‍රදානයෙන් රු.261,330,760 ක වියදමක් සේවකයන් විශ්‍රාම ගැන්වීමට දරා තිබුණි.

කටයුතු කළ යුතුය.

රදවා ගන්නා තනතුරු හා සේවක සංඛ්‍යාව ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. දැනට සකසා අවසන්කර ඇති ආයතනයේ සංයුක්ත සැලැස්මේ කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව 2024 මැයි මස අවසානයට පෙර අමාත්‍යාංශය වෙත යැවීම සඳහා කටයුතු සැලසුම් කර ඇත.

ජුනි මස 18 දින අමාත්‍යාංශය වෙත යවා ඇත.

3.81 ලංකා සෝල්ට් ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	1,631,847,913	554,711,508	1,077,136,405	39,117,032	තත්ත්වාගණනය කල
2022	2,717,605,128	954,286,559	1,763,318,569	915,699,382	තත්ත්වාගණනය කල
2023	3,848,074,337	1,244,084,900	2,603,989,437	1,756,205,318	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2023 පෙබරවාරි 22 දින වනවිට මිලදීගත් දිනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණු රුපියල් 1,160,355 ක ගබඩා අයිතම 174 ක් දීර්ඝ කාලයක් තුල භාවිතයට නොගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි. 2018 නොවැම්බර් 29 දින වර්ග 03 කට අයත් අමතර කොටස් ඒකක 06 ක් රුපියල් 1,748,082 කට මිලදීගෙන තිබුණු අතර එම උපකරණ භාවිතයට නොගෙන ගබඩාවේ ඉතිරිව	2022	අවශ්‍යතා හඳුනාගෙන අමතර කොටස් ඇණවුම් කළ යුතුය. අනවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	ගබඩාවේ ඉතිරි තොග පිළිබඳව විමසීම් නොකර පිරියත අංශය විසින් ගැණුම් අධියාචනා පත්‍රය ඉදිරිපත් කර ඇති බව සහ 2018 වර්ෂයේ සිට භාවිතයට නොගෙන ගබඩාවේ පවතින බව.

	තිබියදී එම උපකරණ කොටස් වලින් ඒකක 2 බැගින් රුපියල් 1,163,994 කට 2019 ජුනි 18 දින නැවත මිලදිගෙන තිබුණි. අවශ්‍යතා නිශ්චිතව හඳුනා නොගෙන මිලදී ගැනීම නිසා 2023 පෙබරවාරි 22 දින වන විට එම අමතර කොටස් 10 ක් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.				
(ආ)	කුඩා හා මධ්‍ය පරිමාණ අස්පීත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 1.2 ඡේදය ප්‍රකාරව ලංකා සෝලට් ලිමිටඩ් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකකයක් ලෙස හඳුනාගත නොහැකි නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී කුඩා හා මධ්‍ය පරිමාණ අස්පීත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණි.	2021 2022 2023	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වේ.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	මේ සම්බන්ධයෙන් ගිණුම් ප්‍රවීනයන් කිහිප දෙනෙකුගෙන් විමසීමේදී ඔවුන් පවසා සිටියේ ප්‍රථම වතාවට මෙම ප්‍රතිපත්ති මාරු වීම උපදේශකවර යෙකුගේ සහාය ඇතිව සිදුකරන ලෙසය. මේ සඳහා විගණන කමිටු අනුමැතිය ලබාගෙන ක්‍රමවේදය වෙනස් කිරීමට කටයුතු කරන බව.

(ඇ)	2019 වර්ෂයේදී ලුණු ප්‍රවාහනයෙන් ලැබී තිබුණු ආදායම් වලින් රු.7,579,030 ක මුදලක් අස්ථානගත වී තිබුණු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ප්‍රවාහන ආදායම් ලෙස දක්වා සම්පූර්ණ වටිනාකම සඳහාම අඩමාණ ණය වෙන්කර තිබුණි. ඒ අනුව මෙම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	2021 2022 2023	මූල්‍ය වංචාව සම්බන්ධයෙන් පැහැදිලි සහ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 වර්ෂයේ හෙළිදරව් කිරීමට එකඟ වන බව.
(ඈ)	2021 නොවැම්බර් 11 දිනැති පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය				
(i)	රජය සතු සමාගම් සඳහා මාර්ගෝපදේශ සහ මෙහෙයුම් අත්පොත 3.1 ඡේදය සමාගමේ සේවක සංඛ්‍යාව සහ වේතන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2023	මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් සිටින බව.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අනුමැතිය ලබාගෙන නොමැත.

(ii)	3.2 ඡේදය සමාගමේ කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2023	අදාල අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ අනුමැතිය ලබාගෙන නොමැත.
(ඈ)	පලටුපාන ලේවායේ 2022 මාර්තු 31 දින සම්පූර්ණ කර තිබුණු සුපර් ග්‍රේඩ් ශ්‍රේණියේ රු.27,324,000 ක් වටිනා ලුණු මෙට්‍රික් ටොන් 569.25 ක් ආවරණය කර තිබුණු පොලිතීන් හා පොල්අතු දිරාපත් වී ලුණු සමඟ මිශ්‍රවී අට්ටියේ ලුණු දියවී යාමට ලක්ව තිබුණි. ඒ හේතුවෙන් ලුණුවල තත්ත්වය බාල වී තිබුණි.	2023	සමාගමට සිදුවී ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් එම තොගය හානි වෙමින් පවතින බව.
(ඉ)	**බුන්දල ලේවාය**					
(i)	2016, 2018, 2019, 2020 සහ 2021 වර්ෂ වලදී නිෂ්පාදනය කරන ලද වර්තමාන වෙළඳපොල වටිනාකම	2023	පැරණි තොග අලෙවි කිරීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අලාභය අයකරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැති

	රු.2,342,398 ක් වූ ලුණු මෙට්‍රික් ටොන් 73.98 අලෙවි කර නොතිබුණි.					බව.
(ii)	සමාලෝචිත වර්ෂයේ ලබාගෙන තිබුණු ලුණු අස්වැන්න ආවරණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය නියමිත කාලයේදී නිසි ප්‍රමාණයෙන් සැපයීමට අපොහොසත් වී තිබුණු බැවින් රු. 65,425,279 ක් වටිනා ලුණු මෙට්‍රික් ටොන් 1816.19 ක් හානි වී තිබුණි.	2023	වගකිව යුතු නිලධාරීන් නිර්නය කර අලාභයන් අයකර ගත යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අලාභය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ආරම්භ කර නොමැත.
(ඒ)	2019 වර්ෂයේ සිට ප්‍රධාන ගබඩාවේ CCTV ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රියාකාරී තත්වයෙන් යාවත්කාලීනව පවත්වා ගැනීමට වගකිව යුතු නිලධාරීන් අපොහොසත් වී තිබුණි.	2023	CCTV ආරක්ෂිත කැමරා පද්ධතිය යාවත්කාලීනව පවත්වා යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් කැමරා පද්ධතිය අක්‍රීය තත්ත්වයේ පවතී.
(ඓ)	ගබඩාවේ පවතින තොග ප්‍රමාණය, වටිනාකම සහ තොග චලනයන් සලකා බැලීමේදී පරිගණකගත තොග කළමනාකරණ මෘදුකාංගයක්	2023	පරිගණකගත තොග කළමනාකරණ මෘදුකාංගයක් භාවිතා කළ යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන	2024 සැප්තැම්බර් 25 දින වන විටත් තොග කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදී නොමැත.

	භාවිතා කළ යුතු වුවද මැනුවල් ක්‍රමයට සියලු තොග වාර්තා නඩත්තු කර තිබුණි. මේ හේතුවෙන් තොග වාර්තාවල නිරවද්‍යතාවය උසස් මට්ටමක නොපවතින අතර තොග මට්ටම් ස්වයංක්‍රීයව දැනුම් දීමේ ක්‍රමයක් අනුගමනය කිරීමේ අවස්ථාව සමාගමට අහිමි වී තිබුණි.				
(ඌ)	2010 වර්ෂයේ සිට මිලදීගෙන තිබුණු වටිනාකම රුපියල් 2,233,655 ක් වූ තොග අයිතම 15 ක් 2015 වර්ෂයේ සිට මිලදීගෙන තිබුණු රු. 3,467,862 ක් වටිනා මෝටර් වර්ග 22 ක් සහ ගියර් බොක්ස් 05 ක් 2008 වර්ෂයේ සිට මිලදීගෙන තිබුණු වටිනාකම රු.2,156,526 ක් වූ ගබඩා අයිතම 422 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව ගබඩාව තුළ රඳවා තිබුණි. ඒ අනුව, අවශ්‍යතාවය නිසි පරිදි හඳුනානොගෙන	2022 2023	අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව මිලදීගැනීම් කළ යුතු අතර වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභයන් අයකරගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ තොග අයිතම නිශ්කාර්යව පවතී.

	මෙම භාණ්ඩ මිලදීගෙන ඇති බව නිරීක්ෂණය කෙරේ.				
(එ)	ප්‍රධාන ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත හදිසි මිලදීගැනීම් යටතේ මිලදීගෙන තිබුණු රු.2,846,010 ක් වටිනා පුෂර් ප්ලේට් (Pusher Plate) අයිතම 02 ක් පිරියතය සඳහා නොගැලපෙන බැවින් භාවිතයට ගත නොහැකිව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්කාර්යව ගබඩාවේ පැවතුණි. මෙම මිලදීගැනීම සම්පූර්ණ කිරීමට මාස 17 කට අධික කාලයක් ගතකර තිබුණි.	2023	වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන සමාගමට සිදුවී ඇති අලාභයන් අයකර ගත යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ අමතර කොටස් නිශ්කාර්යව පවතී.
(ඒ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 3.6 අනුව නැවත ඇණවුම් කිරීම සඳහා අදාළ ප්‍රසම්පාදන කමිටුවේ විරෝධයක් නොමැති බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සහතික වන්නේ නම්, මුල් කොන්ත්‍රාත්	2023	වගකිව යුතු නිලධාරීන් නිර්නය කර විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කර මිලදීගැනීම සිදුකරන බව.	මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුවෙමින් පවතින බව.

	වටිනාකමින් සියයට 50 සීමාව දක්වා භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම සඳහා නැවත ඇණවුම් කිරීමට විශේෂ අවස්ථානුගත කරුණුවලදී පමණක් බලය පවරනු ලැබිය හැකි වේ. ඊට පටහැනිව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව පුද්ගලික සමාගමකින් රු.23,925,000 වටිනා කිලෝ ග්‍රෑම් 1 (1 kg) ලක්ලුණු ඇසුරුම් මිලියන 1.5 ක් සහ රු.7,400,000 වටිනා 400 g මේස ලුණු (නිල්) ඇසුරුම් මිලියන 1 ක් මිලදීගෙන තිබුණි.				
(ඔ)	කිලෝ ග්‍රෑම් 01 ක ලක්ලුණු ඇසුරුම් සහ ග්‍රෑම් 400 ක මේස ලුණු ඇසුරුම් පිළිවෙලින් ඉදිරි දින 68 කට සහ දින 61 කට ප්‍රමාණවත් තොග ආයතනය තුළ තිබියදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව ඉකුත් වර්ෂයේ නොවැම්බර් 02 දින	2023	වගකිව යුතු නිලධාරීන්ගෙන් සමාගමට සිදුව ඇති අලාභය අයකර ගත යුතුය.	මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුවෙමින් පවතී බව.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් අදාළ අලාභය අයකර නොමැත.

	කිලෝ ග්‍රෑම් 01 ක ලක්ලුණු සහ ග්‍රෑම් 400 මේස ලුණු ඇසුරුම් 01 ක් පිළිවෙලින් රු.15.95 ක් සහ රු. 7.40 ක් බැගින් මිලදීගෙන තිබුණි. මෙම ඇසුරුම්වලට අදාළව ඉකුත් වර්ෂයේ නොවැම්බර් 17 දින ටෙන්ඩර් මිල පිළිවෙලින් රු. 8.65 ක් සහ රු.4.05 ක් වූ බැවින් මෙම ප්‍රතිඇණවුම් මිලදී ගැනීම හේතුවෙන් සමාගමට රු.16,230,031 ක පාඩුවක් සිදුකර තිබුණි.				
(ඕ)	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හා මු.රෙ 770(4) සහ 770 (අ), (ඇ) ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින සහ අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන අපහරණය කල යුතු වුවද සමාගමට අයත් ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහන 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023	අදාළ චක්‍රලේඛ ක්‍රියාමාර්ග ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 25 දින වන විටත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොමැත.

3.82 පරන්තන් කෙමිකල්ස් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	938,697,754	354,427,780	584,269,974	138,180,996	තත්ත්වාගණනය නොකල
2022	1,230,390,183	535,346,106	695,044,077	362,358,886	තත්ත්වාගණනය නොකල
2023	1,350,681,034	685,509,850	665,171,184	479,965,403	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2022 වර්ෂයේදී අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අවස්ථා දෙකකදී බංග්ලාදේශයෙන් රු.38,644,540 ක් වටිනා කි.ග්‍රෑම් 25 කෝස්ටික් සෝඩා බෑග් 5,997 ක් මිලදී ගෙන තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම තොගයෙන් රු.15,022,368 ක් වටිනා කෝස්ටික් සෝඩා බෑග් 1,869 ක් එනම් සියයට 31ක් ඉතිරි වී තිබුණි.	2023	සමාගමට අලාභයන් ඇති නොවන ලෙස තීරණ ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.	මෙම කොස්ටික් සෝඩා තොගය, අදාල සමාගම විසින් මාරු කර දීමට කැමැත්ත පළ කර ඇති අතර ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇත.	තොගය තවදුරටත් ඉතිරිව පවතී.
(ආ)	අක්කර 227 කින් යුත් පරන්තන් භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට	2023	ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පරන්තන් කෙමිකල්ස් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම මුදල්, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ බැවින් මේ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග එම අමාත්‍යාංශයේ තීරණ	යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර නැත.

	2016 වර්ෂයේ යෝජනා කර තිබුණු අතර, ඒ සඳහා 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය අවසානය දක්වා ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් හා පරන්තන් ඉඩම සංවර්ධනය හා ශාක වගා කිරීම වෙනුවෙන් රු.13,094,727ක් වියදම් දරා තිබුණද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.			වලට අනුව සිදු කිරීමට නියමිතව තිබුණි.	
(ඇ)	2022 ඔක්තෝබර් 07 දින බංගලාදේශය වෙත හිස් ක්ලෝරීන් සිලින්ඩර් 42 ක් රැගත් බහලුම් 3 ක් ක්ලෝරීන් සැපයුම් ආයතනය වෙත යැවීමේදී එම බහලුම් නිදහස් කර ගැනීමට අදාළ ලියකියවිලි නියමිත වේලාවට යැවීමට අපොහොසත් වීම හේතුවෙන් එම ආයතනය වෙත රු.6,830,145 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට පරන්තන් සමාගමට සිදු වී තිබුණි. ඊට අදාල පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන්	2023	සමාගමට අලාභයන් ඇති නොවන ලෙස කටයුතු කිරීමට කළමනාකරණය වගබලා ගත යුතුය.	මෙම කරුණ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයකුගේ සහභාගිත්වයෙන් නිලධාරි තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාව මේ වන විටත් සමාගමට ලැබී නොමැත. වාර්තාව ලැබුනු පසු එහි නිර්දේශ අනුව කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.	වාර්තාව තවමත් ලැබී නොමැත. අලාභය වග කිව යුතු පාර්ශව වෙතින් අය කර නොමැත.

	මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
(ඇ)	ශ්‍රී ලංකාව තුළ යූරියා පොහොර නිෂ්පාදනය කිරීමට ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පෞද්ගලික) ආයතනය මඟින් ශක්‍යතා අධ්‍යනයක් කරවා ගැනීමට 2020 දෙසැම්බර් 31 දින රු.35,353,000 ක් ලබා දී තිබුණ ද, 2023 වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.	2023	ශක්‍යතා අධ්‍යයනය සිදුකර යූරියා පොහොර නිෂ්පාදනය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය සම්බන්ධව SLINTEC ආයතනයේ කටයුතු දිගින් දිගටම ප්‍රමාද වන නිසා මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධ උපදෙස් ඉල්ලා 2024 ජූලි 22 දින මුදල් අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇත. එම උපදෙස් ලැබුනු පසු එහි උපදෙස් මත ඉදිරි කටයුතු කිරීම නියමිතව ඇත.	2024 වර්ෂය වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොමැත.

3.83 බී.සී.සී. සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	8,673,617,368	282,862,817	8,390,754,551	124,752,053	තත්ත්වාගණනය නොකල
2022	12,183,399,654	304,967,074	11,878,432,580	149,169,834	තත්ත්වාගණනය කල
2023	4,941,340,321	146,415,953	4,794,924,368	155,729,211	-

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	2012 වර්ෂයේ දී බී.සී.සී ප්‍රධාන කාර්යාලයේ පැවති සබන් නිෂ්පාදන යන්ත්‍රාගාරය වතුපිටිවල අක්කර 03ක වපසරියක් යුක්ත ආයෝජන මණ්ඩල භූමිය වෙත ගෙන ගොස් ස්ථාපනය කර තිබුණද එය සවිකරන ලද දිනයේ සිට 2023 වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	2022, 2023	භාවිතයට ගත නොහැකි යන්ත්‍ර සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය.	වතුපිටිවල යන්ත්‍රාගාරයේ සවිකර ඇති Soap Noodles නිපදවීම් යන්ත්‍රය දිගුකාලයක සිට අක්‍රීය තත්වයෙන් පවතී. එම ගොඩනැගිල්ලේ සවිකර ඇති යන්ත්‍රසූත්‍ර ද සේවකයින් විසින් ඉවත්කර ගනිමින් පවතී. එම යන්ත්‍රය භාවිතය සම්බන්ධයෙන් ඉදිරියේදී කළමනාකාරිත්වය තීරණය කරනු ඇත.	වතුපිටිවල යන්ත්‍රාගාරයේ සවිකර ඇති යන්ත්‍රසූත්‍ර භාවිතා නොකරණ අතර සේවකයින් විසින් ඉවත්කර ගනිමින් පවතී.
(ආ)	2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 30 පරිදි 2006 වර්ෂයේ දී සමාගම	2022, 2023	බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ	ආයතනය මුදල් අමාත්‍යාංශයට යටතට පවරා ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියට යොමුකර ඇති ආයතනයක් බැවින් මේ සඳහා තවම	මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය

ප්‍රතිව්‍යුහගත කිරීමේදී චක්‍රලේඛය පරිදි එක් එක් වැටුප් පියවරයන්හි පිහිටුවා වැටුප් ගෙවා තිබුණද අදාළ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරවාගෙන නොතිබුණි. 2023 මාර්තු 31 දිනට ස්ථිර නිලධාරීන් 42 ක්, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 6 ක් සේවයේ නියුක්තව සිටි අතර මිනිස් බල සැපයුම මඟින් නිලධාරීන් 20 ක් 30 ක් අතර ප්‍රමාණයක් සමාගමේ රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.8,518,702 ක්ද ගෙවා තිබුණි.	යුතුය.	කළමනාකරන සේවා ලබාගෙන දෙපාර්තමේන්තුවේ නොමැත. අනුමැතිය ලැබී නොමැත.

3.84 ශ්‍රී ලංකා බයෝටෙක්නොලොජී ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	64,293,150	1,015,921	63,277,229	(50,222,771)	තත්ත්වාගණනය නොකල
2022	156,665,962	2,088,784	154,577,178	(144,338,432)	තත්ත්වාගණනය කල
2023	386,334,570	206,627,226	179,707,344	(196,064,835)	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය පිහිටුවීමේ ව්‍යාපෘතිය සඳහා ආයෝජකයින්ට සිය මෙහෙයුම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දීමේ අපේක්ෂාවෙන් ජෛව තාක්ෂණ උද්‍යානය පිහිටුවීමේ පළමු අදියර 2020 දෙසැම්බර් වන විට සම්පූර්ණ කල යුතු වුවත් සමාගම ආරම්භ කර වසර දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබුණි.	2022	අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.	ඉඩම පවරා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීමට ඇති මුදල සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව නාගරික සංවර්ධන අධිකාරිය හා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ කල සාකච්ඡා අනුව ගෙවීමට ඉතිරි වී ඇති මුදල කඩිනමින් ගෙවා නිමකර ඉඩමේ අයිතිය SLIBTEC ආයතනය වෙත පවරා ගැනීමට රු.මිලියන185.67 ක් මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කරන ලදී.	ඉඩම සඳහා වන මුදල මුදල් අමාත්‍යාංශ වෙතින් ලබා දී ඇති අතර අවශ්‍ය නීතිමය ලියකියවිලි ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය අපොහොසත් වීම හේතුවෙන් ගෙවීම ප්‍රමාද වී ඇත. ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය සඳහා වන නිර්මාණ සැලසුම් සැකසීම (architecture design) සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

(ආ)	ජාත්‍යන්තර ජාන විද්‍යාත්මක ඉංජිනේරු සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානය (ICGEB- International canter for Genetic Engineering and Biotechnology) වෙතින් ඉන්සියුලින් සහ වර්ධන හෝමෝන ඇතුළු ජෛවීය ද්‍රව්‍ය 10 ක් දේශීයව නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය පවරා ගැනීම මඟින් එම ජෛව ද්‍රව්‍ය ආනයනය සඳහා දැරීමට වන වියදම අවම කිරීම සමාගම පිහිටුවීමේ අරමුණක් වූවද, එම අරමුණ ලගාකර ගැනීමට සුදුසු පසුබිමක් මෙතෙක් සකස්කර නොතිබුණි.	2022	අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.	මෙම කරුණු කඩිනමින් සිදු වීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති බැවින් ගැටළු ඉක්මනින් විසඳා ගැනීමට අදාල ආයතන සමඟ කටයුතු කරමින් පවතී.	නවෝත්පාදන උද්‍යානයේ වැඩ කටයුතු ආරම්භ වීමත් සමඟ ආයෝජකයන් හට සිය ආයෝජනයන් ආරම්භ කිරීමට හැකි වන අතර ඒ සමඟම මෙම නිෂ්පාදනයන් දේශීයව නිෂ්පාදනය කිරීමේ කටයුතු ආරම්භ වේ. ආයෝජකයන් හට කැමැත්ත පල කිරීමේ යෝජනා (expression of interest) ලබන වසරේ මැද බාගයේදී ඉදිරිපත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල රු. 10,983,725 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය මිලදීගෙන තිබුණත්, ඉන් භාවිතා කර තිබුණේ සියයට 1.2 ක් තරම් ඉතා සුළු ප්‍රමාණයක් විය.	2022 2023	තොග අයිතම මිලදී ගැනීමේදී තොග මට්ටම් පිළිබඳ සැලකිලිමත් වී මිලදී ගැනීම් සිදු කළ යුතුය.	පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම මේ වසර තුල සිමා කර ඇති අතර රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම අවශ්‍යතාව පරිදි පමණක් සිදු වේ.	අදාල ද්‍රව්‍ය සැලසුම් කල පර්යේෂණ සඳහා මෙන්ම බාහිර පාර්ශවයන් සමඟ සිදු කෙරෙන සේවා සඳහා භාවිතා කෙරේ.

(ඇ)	2022 වර්ෂයේදී මිලදී ගන්නා ලද පාරිභෝජ්‍ය ද්‍රව්‍ය (පර්යේෂණ) අයිතම 14 කින් රු.3,551,668 ක වටිනාකමින් යුතු ද්‍රව්‍ය 2023 දෙසැම්බර් 31 දින දක්වා පාවිච්චි නොකර ඌණ උපයෝජිතව පැවතුණි.	2023	අනවශ්‍ය පරිදි තොග රැස් කිරීමෙන් වැලකීම සහ නිශ්චිතව අවශ්‍යතාවයන් හඳුනාගෙන මිළදී ගැනීමත් පර්යේෂණ සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර පර්යේෂණ සිදුකළ හැකිද යන්න හඳුනාගැනීම කල යුතුය.	ආයතනය විසින් 2022 වර්ෂය තුලදී රු.9,033,432ක් වැය කර විද්‍යාගාර කටයුතු සඳහා ප්‍රයෝජනයට ගන්නා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගෙන ඇති අතර එම ද්‍රව්‍ය කල් ඉකුත් වීමක් සිදු නොවේ. කෙසේ නමුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම මේ වසර තුල සිමා කර ඇති අතර රසායනික ද්‍රව්‍ය මිලදී ගැනීම අවශ්‍යතාව පරිදි පමණක් සිදු වේ.	අදාල ද්‍රව්‍ය සැලසුම් කල පර්යේෂණ සඳහා මෙන්ම බාහිර පාර්ශවයන් සමඟ සිදු කෙරෙන සේවා සඳහා භාවිතා කෙරේ.

3.85 ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,387,167,225	4,398,287,099	(11,119,874)	(4,875,832)	තත්ත්වාගණනය නොකල
2022	4,147,682,688	4,207,485,158	(59,802,470)	(22,431,598)	තත්ත්වාගණනය කල
2023	3,977,908,023	4,041,549,818	(63,641,795)	10,253,101	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම දිගින් දිගටම ශුද්ධ අලාභයන් ලබා ඇති අතර සමාගමේ මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් පවතී.	2021/2022 2022/2023 2023/2024	සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතුය.	මේ සඳහා විශේෂ මහා සභා රැස්වීමේදී අවධානය යොමු කර ඇත.	අලාභ වාර්ෂිකව වැඩි වී ඇත.
(ආ)	වටිනාකම රු.1,412,601 ක් වූ නිමි පොහොර තොගයක් ගිණුම් වර්ෂය අවසාන දිනය වන විටත් ගබඩාව තුළ නොවිකිණී පැවතුණි.	2022/2023 2023/2024	නව නිෂ්පාදන සඳහා සුදුසු වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	පොහොර තොගය එලෙසම පවතී.
(ඇ)	නැනෝ පොහොර සංවර්ධන තාක්ෂණය පැවරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් 2012 මාර්තු	2021/2022 හා 2022/2023	ලැබිය යුතු ආදායම එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	ලැබිය යුතු මුදල් අය වී නොමැත.

	15 වැනි දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹ ඇත. ගිවිසුමට අනුව සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,250,000 ක් වූ අතර වාරික හතරකින් ආපසු අයකර ගැනීමට නියමිතව තිබිණි. කෙසේ වෙතත්, ගිවිසුමට අනුව ඇමරිකානු ඩොලර් 1,000,000 ක මුදලක් පමණක් නියමිත කාලයේ නිරවුල් කර ඇති අතර, 2013 ජූනි 30 වන දින ඇමරිකානු ඩොලර් 750,000 ක මුදලකට ඉන්වොයිසියක් නිකුත් කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.				
(ඇ)	2017 වසරේදී රු.33,373,109 ක වියදමින් හරිත නිවසක් ඉදිකර තිබුණද, 2023 සැප්තැම්බර් වන විටත් එය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි.	2022/2023	භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය.	වරින් වර පාරිභෝගිකයන් කිහිප දෙනකුට ප්‍රයෝජන ගැනීමට ලබා දී ඇත.	2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය අතහැර දමා ඇත.

(ඉ)	2017 වර්ෂයේ රු.88,770,040 ක වියදමින් සක්‍රීය ඖෂධීය අමුද්‍රව්‍ය නියමු බලාගාර උපාය මාර්ගික ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රසායනාගාර උපකරණ සහ ගෘහභාණ්ඩ 2023 මාර්තු මාසය අවසන් වන විටත් එකී කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	2022/2023	භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය.	ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.	2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය අතහැර දමා ඇත

3.86 ස්ලින්ටෙක් ඇකඩමි

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	4,639,251	13,281,631	(8,642,380)	(316,483)	තත්ත්වාගණනය කල
2022	-	-	-	-	ගිණුම් ලැබී නැත
2023	-	-	-	-	ගිණුම් ලැබී නැත

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමේ මුළු වගකීම් මුළු වත්කම් ඉක්මවා ඇති බැවින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවධානමක් ඇති බව නිරීක්ෂණය කෙරිණි.	2021, 2022	සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	මේ වන විට මෙහෙයුම් කටයුතු සිදු නොවන අතර පසුගිය වර්ෂ දෙකක ගිණුම් ඉදිරිපත් කර නැත.

3.87 ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	11,079,758,348	9479,867,446	1599,890,902	794,641,069	තත්ත්වාගණනය නොකළ
2022	14,280,597,314	10,533,971,780	3,746,625,535	226,555,987	තත්ත්වාගණනය නොකළ
2023	14,647,301,904	10,419,020,155	4,228,281,749	1,105,462,555	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2017 වසරේ දී ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) විසින් සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ (NSBM) රු.800,000,010ක් ආයෝජනය කර ඇති අතර, 2017 මූල්‍ය වර්ෂයේ සිට 2022 මූල්‍ය වර්ෂය දක්වා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයට කිසිදු ප්‍රතිලාභයක් ලබා දී නොතිබුණි. එමෙන්ම ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 02	2022	ආයෝජනය කරන මුදලට සාධාරණ ප්‍රතිලාභයක් ලබා ගත යුතුය. එමෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය අනුව ප්‍රධාන ගණන්දීමේ නිළධාරි කටයුතු කළ යුතුය.	2020 සිට 2022 දක්වා අදාළ වර්ෂ සඳහා සිදු කරන ලද නුබුන්වත්භාවය පිළිබඳ පරීක්ෂාවේදී ලාභාංශ බෙදාහැරීම වෙනුවෙන් සෑහීමකට පත්වී නැත. ලාභාංශ ප්‍රකාශ නොකිරීමේ තීරණයට NIBM හි සභාපතිවරයා සහ නියෝජිතයින් සහභාගි වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව එකඟ වූ බව.	NIBM ආයතනය විසින් ආයෝජනය කර ඇති රු.800,000,010 ක් හා ඒ සඳහා පොළිය රු.1,081,434,224 ක් ලෙස එකතුව රු.1,881,434,234 ගෙවීමට එකඟතාවය මත, අංක 24/0958/607/058-1 හා 2024 ජුනි 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය 2024 ජුලි 15 දින සිට 2007 අංක 07 දරන සමාගම් පනතේ

					වැනි දින පාර්ලිමේන්තුවේ පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ පිළිබඳව සාකච්ඡා කළ අතර, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹීමට සහ මෙම ආයතන දෙකෙහි අධීක්ෂණය සහ ව්‍යුහය නිරීක්ෂණය කිරීම සඳහා විශේෂඥ මණ්ඩලයක් පත් කරන ලෙස එම කමිටුව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට නියෝගයක් නිකුත් කර තිබුණි.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ ඇතුළත් මෙහෙයුම් අත්පොතෙහි 3.2v ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරයන්හි දිරිදීමනා යෝජනා ක්‍රම සඳහා සෑම විටම කාර්යසාධනය පදනම් කරගත් ගෙවීම් නිර්ණායක සකස් කල යුතු අතර, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පමණක් දිරිදීමනා	2023	පරිපාලිත සමාගම් වලට අදාල භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කළ යුතුයි.	සමාගමේ ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීම, මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු බලතල අධ්‍යක්ෂ මණ්ඩලයට තිබෙන අතර,දිරිගැන්වීම් සඳහා අවශ්‍ය සියලුම අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගෙන ඇති බව.	සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය (NSBM) අමප 24/0958/607/058-1 අංක හා 2024 ජූනි 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් 2024 ජූලි 15 දින සිට රජයේ අයිතියෙන් හා පාලනයෙන් බැහැරව 2007 අංක 07 දරන සමාගම් පනතේ 32 වගන්තිය යටතේ

	යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළයුතු බව අවධාරණය කර තිබුණි. 2024 අගෝස්තු වනවිටත් දිරිදීමනා ගෙවීමේ ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.				ඇපයෙන් සීමිත සමාගමක් ලෙසට පරිවර්ථනය කර තිබීම හේතුවෙන් 2024 ජූලි 15 දින සිට රජයේ චක්‍රලේඛ අදාල නොවේ.
(ඇ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ගේ අංක SEC/2023/E/01 හා 2023.03.29 දිනැති චක්‍රලේඛය හා SEC/2023/E/02 හා 2023.04.06 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සේවා යෝජක විසින් සේවා නියුක්තිකයන් වෙත ගෙවන වැටුප් හා දීමනා මෙන්ම, සපයනු ලබන සියළුම මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කිරීම සඳහා සලකා බැලිය යුතු වුවත්, ආයතනයේ නිලධාරීන් සඳහා ලබා දී තිබුණු නිල නිවාස, වාහන හා ඉන්ධන වල වටිනාකම බදු	2023	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ගේ අංක SEC/2023/E/01 හා 2023.03.29 දිනැති චක්‍රලේඛය, SEC/2023/E/02 හා 2023.04.06 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	VC නිවස කිසිවකුට පවරා නොමැති අතර නිල වාහන වෙන්කර නොමැති බව.	උපකුලපති නිවස වෙන්කර ඇත්තේ උපකුලපති වරයා සඳහා වන අතර මේ දක්වාම නිවැරදිව APIT ගණනය කිරීමක් සිදු නොකරයි.

	(APIT) ගණනය කිරීමේදී සලකා බලා නොතිබුණි.				
(ඇ)	ජාතික ව්‍යාපාර කලමනාකාරීත්ව විද්‍යායතනයේ Phase II ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය දීමේදී සලකා බලන ලද ව්‍යාපෘති වාර්තාව, ආයෝජන සැලැස්ම හා ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව වර්ෂ තුනකට වරක් පමණක් පාඨමාලා ගාස්තු වැඩි කිරීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණද, ඊට පටහැනි ලෙස 2020 හා 2021 වර්ෂවලදී පාඨමාලා 12ක වර්ෂයකට එක් වතාවක් හා 2022 හා 2023 වර්ෂවලදී පාඨමාලා 17 එක වර්ෂයකට දෙවතාවක් බැගින් සියයට 17ත් සියයට 75 ත් අතර පරාසයක පාඨමාලා ගාස්තු වැඩි කර තිබුණි.	2023	පාඨමාලා ගාස්තු වැඩිකිරීමේදී සැබෑ පාඨමාලා පිරිවැය හා සමාජ සාධාරණත්වය සලකා බැලිය යුතුය.	කොවිඩ් හා ආර්ථික අර්බුධය හේතුවෙන් හා ණය පොලී අනුපාත වැඩිවීම නිසා ගාස්තු වැඩි කිරීමට සිදු වූ බව හා 2023 වර්ෂයෙන් පසුව ගාස්තු වැඩිකිරීමක් සිදු කර නොමැති බව.	2024 වර්ෂයේදී පාඨමාලා ගාස්තු වැඩි කර නොතිබුණි.
(ඉ)	වසර 05 කට වඩා පැරණි වාහන 3ක් මෝටර් රථ	2023	රජයට අයත් වාහන විකිණීමේදී රජයේ තක්සේරු	ආයතනය විසින් පත්කරන ලද වාහන සම්බන්ධ	2024 වර්ෂයේදී සිදුකර තිබුණු වාහන

ඉංජිනේරුවරයකු විසින් අපහරණය කළයුතු බවට නිර්දේශ කර නොතිබියදී 2023 අගෝස්තු 09 දින විද්‍යායතනය විසින් අපහරණය කළ යුතු බවට තීරණය කර තිබුණි. එමෙන්ම, පෞද්ගලික තක්සේරු ආයතනයකින් තක්සේරු වාර්තා ලබාගෙන පුවත් දැන්වීම් පලකර ලංසු කැඳවා තිබුණි. ප්‍රමාණවත් තරම් ලංසු ඉදිරිපත් වී නොතිබියදී පෞද්ගලික තක්සේරු ආයතනයේ වටිනාකම් අනුව වෙළඳපොල වටිනාකමට වඩා රු. 5,450,000ක් අඩුවෙන් වාහන 03 විකුණා තිබුණි.	කරුවකුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගත යුතුය.	ප්‍රවීණයන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අපහරණ කටයුතු සිදු කරන ලද බව.	විකිණීමේදීද පෞද්ගලික තක්සේරු ආයතනයක වටිනාකම් අනුව සිදුකර තිබුණි.

3.88 නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	192,241,111	13,651,920	178,589,191	(7,162,850)	තත්ත්වාගණනය නොකළ
2022	222,009,826	12,796,939	209,212,887	31,699,608	තත්ත්වාගණනය නොකළ
2023	286,383,784	33,401,425	252,982,359	63,113,433	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14(I) පරිච්ඡේදය සී/ස නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම මඟින් මෙහෙයවනු ලබන විභාග හා වැඩසටහන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි කළ යුතුය. එසේ වුවද 2024 මාර්තු 31 දක්වාම ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අධ්‍යාපන වැඩසටහන් හා විභාග පැවැත්වීම සඳහා තුන්වන	2021 2023	සමාගමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.	නිපුණතා අරමුදල් සමාගම යටතේ ගිවිසුම්ගත වී ඇති රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය ඇති ආයතන සඳහා TVEC ආයතනයේ ලියාපදිංචි වීමට දන්වා ඇත. ඒ අනුව ලියාපදිංචි නොවූ ආයතනවල ලියාපදිංචිය අවලංගු කිරීමට බලාපොරොත්තු වේ.	ගිවිසුම් ගතවූ ආයතන 5 ක් එපරිදි ලියාපදිංචි වී නොතිබුණි.

	පාර්ශවයන් සමඟ ගිවිසුම් අත්සන් කිරීමට පෙර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ. එසේ වුවද ගිවිසුම් ගතවූ ආයතන 5 ක් එපරිදි ලියාපදිංචි වී නොතිබුණි.				
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3 ඡේදය පරිදි බදු ගෙවීමෙන් පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30ක් ඒකාබද්ධ අරමුදල/කොටස් හිමියන් වෙත බෙදා හැරීමට අපේක්ෂා කළද, 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති ද්‍රව්‍යමය පරීක්ෂණය සෑහීමකට පත්වීමෙන් පසුව, සමාගම ඊට අවනත වී නොමැත.		චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය	කොටස් හිමියන්ගේ ලේඛනය යාවත්කාලීන කිරීමේදී නොගැලපීම් ඇතිවිය. එය ලාභ බෙදා හැරීම නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට බලපෑවේය.	චක්‍රලේඛ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ඇ)	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දිරි දීමනා වශයෙන් රු. 600,000 ක මුදල ගෙවා ඇත.	2021 2023	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ඉල්ලා සිටියේය.	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.89 ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	199,418,190	64,860,997	134,557,194	(15,326,918)	නත්ත්වාගණනය කළ
2022	265,195,751	93,278,250	171,917,501	45,392,378	නත්ත්වාගණනය කළ
2023	517,741,932	194,982,606	322,759,326	218,261,498	නත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ශ්‍රමිකයින් විදේශගත කරන විදේශීය සමාගම්වලින් සමාගම වෙත ලැබිය යුතු රු.6,453,985 ක ශේෂය තුළ (invoice receivable) වර්ෂ 05 ඉක්මවූ රු.3,770,670 ක ශේෂයක් පැවති අතර එම මුදල් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2022 2023	මෙම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් අනුව ලිපි යොමු කිරීමට කටයුතු කරමින් පවතී.	මුදල් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(ආ)	2006 වර්ෂයේදී දකුණු කොරියාවට රැකියා සඳහා පිටත් වන විගමණිකයින්ගෙන් ආපසු ගෙවීමේ පදනම මත අය කරනු ලැබූ එකතුව රු.15,265,000 ක් වූ	2022 2023	ගෙවිය යුතු පාර්ශ්වයන් හඳුනාගෙන මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.	අදාළ ආයතන හා පුද්ගලයින් වෙත නැවත ලිපි යොමු කිරීමට හා පුවතපත් දැන්වීම් පලකර ගෙවීම් කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබාදී ඇත.	ඇප තැන්පතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

	ඇප තැන්පතු මුදල් වර්ෂ 15 ක් ගත වී තිබුණු නමුත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.4,707,263 ක ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.618,372 ක් හා වර්ෂ 5 ත් 10 ත් අතර රු.4,088,891 ක ශේෂ පැවතුණි.				
(ඇ)	2023 ජූලි 15 හා 16 දෙදින යාපනය මුට්ටෙව්ලි ක්‍රීඩාංගනයේ පවත්වා තිබූ ජංගම රැකියා වෙළඳ ප්‍රදර්ශනය සඳහා සමාගම විසින් වෙළඳකුටි 05 ක් හා නාම පුවරුවක් මිලදී ගැනීමට අදාලව 2023 ජූලි 08 දින සමාගමේ සභාපතිගේ පෞද්ගලික නමට මිල ගණන් හා ඉන්වොයිස් පත් ඉදිරිපත් කර තිබුණු අතර මිලදී ගත් ආයතනයේ නම සඳහන් කිරීම වෙනුවට Glocal Fair නමින් වූ බැංකු ගිණුමක් වෙත රු.2,180,000 ක් ගෙවීම් කර තිබුණි.	2023	මෙම ගනුදෙනුව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කර අවිධිමත් ගනුදෙනුවක් සිදුව ඇති නම් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	විගණන විමසුම සඳහා මෙතෙක් පිළිතුරු ලබාදී නොමැත.	විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.90 සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	10,237,238,024	4,026,865,299	6,210,372,725	1,250,587,281	ව්‍යාචනය කළ
2022	15,765,076,190	4,517,018,766	11,248,057,424	6,045,575,871	ව්‍යාචනය කළ
2023	-	-	-	-	ගිණුම් ලැබී නොමැත.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**				
(i)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පැල්වත්ත අංශයේ ස්ථාපිත ස්කාගාර දෙපාර්තමේන්තුව යටතේ පිරිවැය රු 760,763,818 .ක් වූ ස්ථාවර වත්කම් වල එක් එක් වත්කම් පන්තිවල එකතුව පමණක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු බැවින්, වර්ෂයේ ක්ෂය වියදම හා ක්ෂය වෙන් කිරීම්වල නිරවද්‍යතාවය විගණනයට තහවුරු නොකෙරුණි.	2021	වත්කම් නිවැරදිව හඳුනාගෙන ඊට අදාළ ක්ෂය වියදම හා ක්ෂය වෙන්කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	ක්ෂය වියදම් නිවැරදිව ගිණුම්ගත කර නොමැත.

(ii)	සෙවනගල හා පැල්වත්ත අංශවල වසර 08 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින පිළිවෙලින් රු. 9,475,416 සහ රු. 4,904,160 ක් වූ මාර්ගස්ථ තොග සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවල විගණන වාර්තාව මඟින්ද පෙන්වාදී තිබුණු නමුත් එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021	මෙම භාණ්ඩ ලැබී තිබේද යන්න පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන නිවැරදි කර නොතිබුණි.
(iii)	සීමාසහිත ලංකා සීනි සමාගම රජයට පවරාගත් 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් තොග ශේෂයෙන් යල්පැන ගිය තොගය (Provision for obsolete stocks) වශයෙන් රු.9,251,437 ක් අඩුකර දක්වා තිබුණු නමුත් එම තොගය සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2021	භාණ්ඩ සමීක්ෂණයකින් යල්පැනගිය තොග නිශ්චිත හඳුනාගත යුතුය.	ක්‍රියාමාර්ග නොමැත.	ගෙන යල් පැන ගිය තොග නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ආ)	**නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**				
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය;				
(i)	XIX පරිච්ඡේදයේ 5.2 ඡේදය සෙවනගල අංශය රජයට පවරා ගැනීමට පෙර සිට අය කරනු ලැබූ රු. 20 ත් රු. 85 ත් අතර මාසික නිවාස කුලී ගාස්තු වසර 11 කට අධික කාලයක සිට අයකරමින් පැවතුණි.	2021 2022	වර්තමාන වෙළඳපොල තත්ත්වයට ගැලපෙන පරිදි නිවාස කුලිය සංශෝධනය කළ යුතුය.	නිවාස තක්සේරු කටයුතු කිරීමට අවශ්‍ය කාර්යයන් මේ වන විට සිදු කරමින් පවතින බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii)	XIXපරිච්ඡේදයේ 5.8 ඡේදය ජල බිල්පත් හා විදුලි බිල්පත් නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද සෙවනගල අංශයේ ජල පරිභෝජනය ඒකක 60 කට වැඩියෙන් භාවිතා කර ඇති අවස්ථාවලදී පමණක් නිලධාරියාගෙන් ගාස්තු අයකර ගැනීමත්, විදුලිපරිභෝජනය සඳහා මාසිකව රු. 250 ක සහනයක් ලබාදීමෙන් පසු ඉතිරි විදුලි බිල වැටුපෙන් අයකර	2021 2022	විදුලිය හා ජලය සඳහා වන ගාස්තුව නිලධාරියා විසින් දරාගත යුතුය. සමාගම විසින් ගෙවන ලද ගාස්තුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ගැනීමත් තුළින් සමාගම විසින් පිරිවැය දැරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිලධාරීන්ගේ නිවාසවල විදුලි ගාස්තු ලෙස රු.1,544,798 ක් සමාගම විසින් වැයකර තිබුණි.				
(ඇ)	2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 09/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ;				
(i)	1.1 ඡේදය යොමුගත ඡේදය ප්‍රකාරව සෙවනගල අංශය සහ ප්‍රධාන කාර්යාලය සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු.28,600,000 ක් වුවද ප්‍රසාද දීමනා සහ දිරිදීමනා වශයෙන් රු.228,703,125ක් ගෙවා තිබුණු බැවින් රු.200,103,125ක් වැඩියෙන් ගෙවා තිබුණි.	2022	යොමුගත විධිවිධාන ක්‍රියාමාර්ග ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නොමැත.	ගෙන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii)	1.2 ඡේදය යොමුගත ඡේදය අනුව පැල්වත්ත අංශය සඳහා	2022	යොමුගත විධිවිධාන ක්‍රියාමාර්ග ප්‍රකාරව කටයුතු කළ යුතුය.	නොමැත.	ගෙන නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය හැකි දිරිදීමනාව රු.88,460,000ක් වුවද දිරිදීමනා වශයෙන් රු.508,017,000ක් ගෙවා තිබුණු බැවින් රු.419,557,000ක් වැඩියෙන් ගෙවා තිබුණි.				
(ඇ)	අවශ්‍යතා නිසි පරිදි හඳුනා නොගෙන ගබඩා අයිතම මිලදීගෙන තිබුණු බැවින් රු.106,651,370 ක් වටිනා තොග අයිතම 4558 ක් වසර 05 ක් තුළ නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.	2021 2022	අපහරණයට හෝ විකිණීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඉ)	පැල්වත්ත අංශය විසින් 2013 වර්ෂයේදී කල් බදු පහසුකම් යටතේ රු.128,910,000 ක ක්‍රේන් යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා රු.120,750,000 ක මුදලක් හා ඊට අවශ්‍ය විදුලිය සැපයීමට රු.2,254,850 ක් වැය කර තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් එකඟ වූ පරිදි එම යන්ත්‍රය කර්මාන්තායතනය	2021 2022	අනාර්ථික වියදම හේතුවෙන් සමාගමට සිදුවී තිබෙන පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය.	2023 වර්ෂයේදී අදාල සැපයුම්කරු සමග සාකච්ඡා කොට ගිවිසුමකට එළඹ ඇති නමුත් අදාල සැපයුම්කරු විසින් එය ඉටුකිරීමට අසමත්වී ඇති බැවින් එම ආයතනයට එරෙහිව නඩු පැවරීමට ආයතනය තීරණය කර ඇති බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	තුළ ස්ථාපිත නොකිරීම හේතුවෙන් රු. 123,004,850 ක පිරිවැයක් දරා තිබුණු මෙම යන්ත්‍රය මිලදීගත් දින සිට ප්‍රයෝජනයට ගත නොහැකිව නිශ්කාර්යව පැවතුනි.				
(ඊ)	සෙවනගල අංශය වෙතින් උක් වගාව සඳහා ණය ලබාගත් ගොවීන් උක් වගාවෙන් බැහැර වී වෙනත් අනවසර බෝග වගාවන් සඳහා යොමුවීම හේතුවෙන් ගොවීන් 229 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.12,171,641 ක ණය ශේෂ අයකර ගැනීමට හා ගොවීන් නැවත උක් වගාවන් සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මෙම ණය වලින් රු.9,212,580 ක් වසර 05 කට වැඩි කාලයක සිට ද, රු.804,080 ක් වසර 3 ත් 5 ත් අතර කාලයක සිට ද අය නොවී පැවතුනි.	2021 2022	හිඟ ණය ශේෂ අයකරගත යුතු අතර ගොවීන් උක් වගාවට යොමුකරගත යුතුය.	උක් වගාවෙන් බැහැර වන ලද ගොවීන්ගෙන් ණය අයකර ගැනීමට පෙර නැවත එම ගොවීන් උක් වගාවට යොමු කළ යුතු අතර ආයතනයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා විවිධ උපක්‍රම යොදනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
(උ)	පැල්වත්ත අංශයේ භාවිතයෙන් ඉවත්කර ඇති වටිනාකම	2022	යල්පැන ගිය තොග සමාගමට වාසිදායක වන ආකාරයට	තොග නැවත භාවිතයට ගැනීම සම්බන්ධව ආයතනයේ ඉංජිනේරුවරුන් මගින්	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	රු.6,890,375 ක් වූ වාහන අමතර කොටස් 1017 ක් සහ ගබඩාව තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට භාවිතයට නොගන්නා වටිනාකම රු.106,251,731 ක් වන ද්‍රව්‍ය සහ උපකරණ 3602 ක් වෙන්දේසියේ විකිණීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි.		අපහරණය කළ යුතුය.	වර්ගීකරණය කර ඇත. ඒ අනුව ආයතනයේ අපහරණ කමිටුව වෙත එම විස්තර ලබාගැනීමෙන් පසු භාවිතයට ගත නොහැකි තොග බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගැනීමට කටයුතු කරන බව.	
(ඌ)	උක් වගාව සඳහා පැල්වත්ත අංශය වෙතින් ණය ලබාගත් ගොවීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොවිණය ශේෂය රු.1,539,296,739 ක් වූ අතර මෙම ණය වලින් රු.508,989,845 ක් වසර 05 කට වැඩි කාලයක සිට ද, රු.58,269,202 ක් වසර 3 ත් 5 ත් අතර කාලයක සිට ද අය නොවී පැවතුණි.	2022	සමාගමට අයවිය යුතු ණය මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 ජනවාරි මාසයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් 2015 දෙසැම්බර් 31 දිනට පෙර ගොවීන් විසින් ලබාගෙන තිබූ රු.464,023,067 ක ණය අයකිරීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කළ බව සහ ඉතිරි ගොවිණය ප්‍රමාණය අය වෙමින් පවතින බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ)	සෙවනගල අංශය විසින් 2018 වර්ෂයේදී රු.9,564,866 ක් වටිනා වාෂ්පීකරණ යන්ත්‍රයක් (Evaporator) ඉන්දියාවෙන් ආනයනය කර රු.3,924,394 ක රේගු ගාස්තු ගෙවා තිබුණි. ඊට අදාල උපාංග (SS Tube) පිරිවිතරවලට එකඟ නොවීම මත ආපසු යවා 2019 වර්ෂයේදී නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු.4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් එම වටිනාකමෙන් සමාගමට පාඩුවක් සිදුවී තිබුණු අතර එම රේගු ගාස්තුව ගෙවීමට අදාළ ලියකියවිලි සමාගම සතුව නොතිබීම හේතුවෙන් එම වටිනාකම ද විදේශීය ඇණවුම් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.	2021 2022	රේගු ගාස්තුව ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව අදාළ නිලධාරියා සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.91 සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	10,684,313,739	106,969,282	10,791,283,021	10,791,283,021	තත්ත්වාගණනය කළ
2022	18,210,629,468	119,504,879	18,330,134,347	18,330,134,347	තත්ත්වාගණනය කළ
2023	42,478,725,442	119,504,879	42,598,230,321	42,598,230,321	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) සහ සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් (Liberty Commodities Ltd) වෙතින් වසර දෙකකට වැඩි කාලයක් සඳහා දිගුකාලීන හිඟ ලැබිය යුතු පිළිවෙලින් රු.මිලියන 589.97ක් සහ රු.මිලියන 244.83 හි දිර්ඝකාලීන හිඟ ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ආපසු අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබූ අතර භානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.තවද,	2021, 2022, 2023	දිගුකාලීන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.	සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් ලංකා ගල් අඟුරු සමාගම විසින් 2021/12/31 දින බේරුම්කරණයෙන් නියෝගයක් සහ/හෝ ප්‍රදානයක් ලැබුණු අතර, 3%ක වාර්ෂික පොලිය සහ රු.මිලියන 10 ක බේරුම්කරණ පිරිවැය සමඟ හිමිකම් පාන්නාට (ලංකා ගල් අඟුරු සමාගම) එජඩොලර් 1,575,141.86 ගෙවීමට වගඋත්තරකරුට නියම කළේය. ලිබර්ටි කොමඩිටීස් වෙත වත්කම් විස්තර ඉල්ලමින් රේඛීය අමාත්‍යාංශය හරහා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් වෙත ලිපියක් යවන ලදී.	ලැබිය යුතු ශේෂයන් අයකරගැනීමක් මෙතෙක් සිදුවී නොතිබුණි.

	ලංකා නැව් සංස්ථාව සහ සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් විසින් එම හිඟ ශේෂයන් තහවුරු කර නොතිබූ බැවින්, එම ශේෂවල නිර්වද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.			සීමාසහිත ලංකා නැව් සංස්ථාව බෙරුම්කරණ යෝජනාව කැබිනට් මණ්ඩලයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස කැබිනට් මණ්ඩලය උපදෙස් දී ඇත. ඒ අනුව, ලංකා නැව් සංස්ථාව ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයට දැනුම් දී ඔවුන්ගේ ප්‍රතිචාරය බලාපොරොත්තුවෙන් සිටී.	
(ආ)	නැවගත කිරීමේ අංක 123 සඳහා 2016 දී සමාගම විසින් රු.මිලියන 136.24ක් රේගු වැටි බදු ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගු ප්‍රකාශනය අනුව සත්‍ය වැටි බද්ද රු. මිලියන 106.97ක් පමණක් විය. ඒ අනුව සමාගම විසින් රු.මිලියන 29.27 ක් වැඩිපුර ගෙවා ඇති බවත් එම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් අයකර ගැනීමට කටයුතු කර	2021, 2022, 2023	වැඩිපුර ගෙවූ වැටි බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩිපුර ගෙවන වැටි බදු රු.29,266,965.00 ක් වාර්තා කර ඇති බව ලංකා ගල් අඟුරු සමාගම(LCC) සොයා ගෙන ඇති අතර LCC හි හිඟ රේගු ශේෂයන්ට එරෙහිව මෙම වැඩිපුර ගෙවූ වැටි බදු හිලව් කිරීමට සුදුසු විධිවිධාන අවශ්‍ය වනු ඇත.	වැඩිපුර ගෙවන ලද මුදල මේ වන තෙක් ආපසු අයකරගෙන නොතිබුණි.

නොමැති බවත් නිරීක්ෂණය විය

(ඇ)	කොන්ත්‍රාත් ගිවිසුමේ එකඟ වූ පරිදි සැපයුම්කරුට අත්තිකාරම් ගෙවීමට සමාගම අපොහොසත් වී තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ නැවිගත කිරීම් තුනක් සඳහා සමාගම විසින් පැටවුම් වරායේ ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 137.88 ක මුදලක් ගෙවා තිබුණි.	2023	අත්තිකාරම් ගෙවීම් නියමිත දිනට පියවීමටත් ප්‍රමාදය අවම කිරීමටත් කටයුතු කළ යුතුය.	යාත්‍රාව නම් කිරීමට පෙර 30% ක අත්තිකාරම් ගෙවීමේ ක්‍රමය යටතේ ඉතිරි ගල් අඟුරු ප්‍රමාණය මිලියන 1.125 +/-10% ගොඩබෑමට පෙර පැටවීමේ වරායේ පළමු දිනට ආසන්න වශයෙන් දින 15 කට පෙර සැපයීමට සැපයුම්කරු එකඟ විය. යම් ගෙවීම් ප්‍රමාදයක් සිදු වුවහොත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත ගැණුම්කරුගේ ගිණුම් මත පවතිනු ඇති බවට කොන්දේසියක් ද සැපයුම්කරු එකතු කරන ලදී. ඒ අනුව, ගිවිසුමේ නව කොන්දේසි අනුව එකඟ වූ පරිදි සැපයුම්කරුට අත්තිකාරම් ගෙවීමට අපට නොහැකි වූ අතර පැටවුම් වරායේ ප්‍රමාද ගාස්තු අනුව රු.137,883,574 ක මුදලක් ගෙවා තිබුණි.	සම්පූර්ණ මුදලම සමාගමට අලාභයක් විය.

3.92 ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	607,615,693	144,559,773	463,055,920	79,967,074	තත්ත්වාගණනය කළ
2022	954,149,940	272,361,953	681,787,987	325,127,474	තත්ත්වාගණනය කළ
2023	1,162,770,135	263,872,024	898,898,111	352,194,009	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.1	**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**				
(අ)	1954 අගෝස්තු 9 දිනැති අංක 19 දරණ සාජ්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 වන වගන්තියට අනුව යම් ආයතනයක් සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස සමාගම විසින් 2023 වර්ෂයේදී මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සේවකයින් 40 දෙනෙකු දිනකට පැය 24 ක වැඩමුර සඳහා	2021 2022 2023	සේවකයන්ගේ වැඩ කළ යුතු කාලය පනතේ දක්වා ඇති අයුරින් ක්‍රියාත්මක කළ යුතු බව.	2024/08/06 දිනැති විගණන රැස්වීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙතින් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගෙන නිවැරදි වැඩමුර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට තීරණය විය.	විමසුමේ දක්වා ඇති පරිදි පනතට පටහැනි ලෙස ක්‍රියා කිරීම මේ දක්වා නිවැරදි කර නොමැත.

	සේවයේ යොදවා තිබුණි. අඛන්ඩව පැය 24 සේවයේ යෙදවීම පනතට පටහැනි වුවත් එසේ සේවයේ යොදවා සතියකට දින 2 ක් පමණක් සේවය ලබාගෙන තිබුණි.			
(ආ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2022 ජනවාරි 14 දිනැති 01/2015 (ii) අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සංස්ථා, මණ්ඩල හා රජය සතු සමාගම්වල ප්‍රවාහන පහසුකම් ලබාගත හැකි නිලධාරී කාණ්ඩ 03ක් සඳහා පවරා දී ඇති වාහන වෙනුවෙන් මාසිකව ලබාගතහැකි ඉන්ධන සීමාව ඉක්මවා එම නිලධාරී කාණ්ඩ 03 අතර ලීටර් 90ක් ලීටර් 85ක් හා ලීටර් 40 වශයෙන් චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන ලබාදී තිබූ අතර එම වැඩිවීම සියයට 62, සියයට 59 හා සියයට 30ක් වූයෙන් 2023 ජූනි සිට දෙසැම්බර් දක්වා වූ මාස 07 සඳහා රු.621,581ක් (ලීටර් 1670ක්) වැඩිපුර ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛයෙහි දක්වා ඇති ඉන්ධන සීමාව ඉක්මවා කටයුතු නොකළ යුතු බව.	ඉන්ධන දිමනාව වැඩිකිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශය විසින් මව් ආයතනය (Parent Institute) වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිසි අනුමැතිය ලබාගන්නා ලෙස දන්වා ඇති අතර ඒ අනුව ලබාගත් අනුමැතිය පරිදි ඉන්ධන දිමනාව වැඩිකිරීමට පියවර ගෙන ඇත.	විමසුමේහි දක්වා ඇති පරිදි භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනි ලෙස ඉන්ධන සීමාව වැඩි කර ගෙන ඉන්ධන ලබා ගැනීම මේ දක්වා සිදු කරනු ලබයි.

1.2 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2023 ඔක්තෝබර් 24 දිනැති හා අංක FPFS/CONF/2023/25 දරන ලිපිය අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පලමු උපලේඛණයේ ii වන කොටසේ අයිතම 04 යටතේ තෙල් පොම්ප කිරීමේ ගාස්තු බදු නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බව දක්වා තිබුණද 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සහ 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පිළිවෙලින් රු.115,462,139ක් හා රු.420,136,784ක් වූ තෙල් පොම්ප කිරීමේ ගාස්තුව මත අයකල යුතු සමාජ ආරක්ෂණ බද්ද රු.2,960,568ක් හා රු.10,772,738ක් අයකරගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	රජය විසින් හඳුන්වාදෙන බදු පනත් අනුව අදාළ බදු එකතුකර රජයට ප්‍රේෂණය කළ යුතු බව.	සමාජ ආරක්ෂණ බද්ද තෙල් පොම්ප කිරීමේ සේවාව (pumping charge) අදාලද යන්න බදු උපදේශන ආයතනයෙන් විමසන ලදුව ඔවුන් විසින් එය බද්දෙන් නිදහස් සේවාවක් ලෙස පවසන ලදි. මේ පිළිබඳ පැහැදිලි නිර්වචනයක් ලබාගැනිම සඳහා 2024 සැප්තැම්බර් 2 දින දේශීයආදායම් දෙපාර්තමේන්තුව වෙත විමසා යවන ලදි.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් නිශ්කාශණය පරිදි විගණන විමසුම නිකුත් කල අතර විගණන විමසුමේ සඳහන් පරිදි බද්ද අයකිරිමට මේතෙක් පියවර ගෙන නොමැත.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

මෙට්‍රික් ටොන් 1000 ක ධාරිතාවයෙන් යුතු අංක 102 දරණ තෙල් ටැංකියෙහි 2023 දෙසැම්බර් 31 දිනට 380 (HSFO) මෙට්‍රික් ටොන් 275ක් ගබඩා කර තිබුණි. එය සකස් වී ඇත්තේ සමාගම් දෙකකට අයත් මෙට්‍රික් ටොන් 40.26 ක්ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් මෙට්‍රික් ටොන් 72 ක් ද ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර ඇති තෙල් මෙට්‍රික් ටොන් 162.257කින් වේ. නීතිමය කටයුත්තක් සඳහා රේගුව විසින් මෙම තෙල් ටැංකිය මුද්‍රා තබා ඇති බැවින් 2020 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.	2021 2022 2023	අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාකර තෙල් ටැංකි ඉඩකඩ කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව.	102 ටැංකිය තුළ ගබඩා කර ඇති 380 (HSFO) මෙ.ටො. 40.26 න් මෙ.ටො. 38 සඳහා ගෙවන ගබඩා ගාස්තු අදාල සමාගම් වලින් අයකරන අතර ශේෂය අනෙකුත් සමාගම් කිහිපයකට අයත් මෙ.ටො. එකකටත් වඩා අඩු ප්‍රමාණයන්ගේ එකතුවයි. මෙ.ටො. 72 සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ටෙන්ඩර් කර විකිණීම සඳහා එම තෙල්වල භීමිකාරීත්වය පිළිබඳ අප ආයතනයෙන් විමසීම් කර ඇති අතර එය අප අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය සඳහා යොමු කර ඇත.	රේගුව විසින් මෙම තෙල් ටැංකි මුද්‍රා තැබීම හේතුවෙන් වර්ෂ ගණනාවක් සිට මේ දක්වා ව්‍යාපාර කටයුතු සඳහා භාවිතයට ගැනීමට නොහැකිවී ඇත.

2.2. ප්‍රසම්පාදන කළමනාකරණය

මානව සම්පත් ක්‍රියාකාරකම් හා වැටුප් ලේඛන සම්බන්ධ කටයුතු අතින් (manual) සිදුවීම හේතුවෙන්	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල විය යුතු බව.	HR & Payroll පරිගණක මෘදුකාංග පද්ධතිය සකස් කරනු ලබන Antler IT Solutions සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි	පද්ධතිය සැකසීම සඳහා ලබාදී තිබුණු දිනයන් තුලදී කාර්ය නිම කොට

කාර්යක්ෂමව හා ඵලදායීව කාර්යය ඉටුකිරීමට ක්‍රමෝපායක් අවශ්‍ය බැවින් 2021 වර්ෂයේ සිට රු.976,000ක් වැයකර ලබාගත් HR & Payroll පද්ධතිය මේ වන තෙක් ක්‍රියාත්මක කර ගත නොහැකි තත්ත්වයක පැවතීම හා HR & Payroll පද්ධතිය මගින් ලබාගත යුතු අවසාන ප්‍රතිඵලය වන වැටුප් පත්‍රිකා නිවැරදිව මුද්‍රණය කරවා ගැනීමට මේ වනතෙක් අපොහොසත්ව තිබුණු බැවින් දරන ලද වියදමට උපරිම ප්‍රතිලාභයක් ලබාගැනීමට නොහැකිව තිබුණි.

කැදවා දැනට පවත්නා ගැටළු පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඒ අනුව ඔහු විසින් 2024/09/19 දිනැති ලිපිය මගින් මේ වන විට සිදු කරන ලද වැඩි දියුණු කිරීම් පිළිබඳ වාර්තා කර ඇත.

අවශ්‍යතාවය සපුරා ගැනීමට මේ දක්වා නොහැකි වී ඇත.

3.93 ශ්‍රී ලංකා වරාය කළමණාකරණ හා උපදේශන සේවා පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පෙර ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	296,763,738	126,938,054	169,825,684	4,758,337	තත්ත්වාගණනය කළ
2022	262,670,344	86,453,641	176,216,703	8,637,217	තත්ත්වාගණනය කළ
2023	318,853,542	153,482,247	165,371,415	3,976,218	තත්ත්වාගණනය කළ

අ/අ	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**				
1.1	**ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**				
	වරාය අධිකාරියට අයත් මැකලම් ගේට් පරිශ්‍රය භෝජනාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2018 පෙබරවාරි 01 දින සිට 2023 ජනවාරි 31 දින දක්වා වසර 05ක් සඳහා තෙවන පාර්ශවයක් සමඟ ගිවිසුම් ගත වී තිබූ නමුත් 2020 අප්‍රේල් සිට අගෝස්තු දක්වා එම පාර්ශවය විසින් සමාගම වෙත ගෙවිය යුතු හිඟ මුදල වන රු.4,477,679ක් සමාලෝචිත	2021 2022 2023	අදාළ අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට සමාගම කටයුතු කළ යුතු බව.	වරාය අධිකාරිය හා මුලික ගිවිසුම අත්සන් කිරීමකින් තොරව තුන්වන පාර්ශවයක් හා ගිවිසුමකට එළඹීම SLPMCS විසින් සිදුකර තිබූ නමුත් එම ගිවිසුමෙහි නීත්‍යානුකූල භාවයක් නොමැති මෙන්ම අක්‍රිය ගිවිසුමකි. එබැවින් අවලංගු වූ ගිවිසුමකින් සමාගම ආදායමක් එකතු කර නැත. මුලික ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධව වරාය අධිකාරිය හා කිහිප අවස්ථාවක සාකච්ඡා පැවත්වා ඇති අතර	වරාය අධිකාරිය හා SLPMCS අතර වන ගිවිසුම අත්සන් කිරීම මේ දක්වා ක්‍රියාත්මක කර නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව ඇත.

වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම අදාල දේපල බදු ගිවිසුමකින් නිත්‍යානුකූලව වරාය අධිකාරියෙන් පවරා නොගෙන මෙම පරිශ්‍රය නැවත වෙනත් තෙවන පාර්ශවයට උප බදු දීම සඳහා 2023 මාර්තු 01 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර එබැවින්, ගිවිසුම්වල නිත්‍යානුකූල නොවන භාවය හේතුවෙන් සමාගම උපයා ගැනීමට තිබූ ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ අහිමි වී තිබුණි.			ලිඛිත ඉල්ලීම්ද යොමු කර ඇති අතර වරාය අධිකාරිය හා SLPMCS අතර මූලික ගිවිසුමට එළඹීමෙන් අනතුරුව එදින සිට ක්‍රියාත්මක වන පරිදි තුන්වන පාර්ශවය සමඟ විධිමත් හා නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට 2024 සැප්තැම්බර් 09 දින SLMPCS/27/2024 අංක දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලැබී ඇති අතර සමාගමෙහි තීරණයන් වරාය අධිකාරිය වෙත දන්වා යැවීමටද කටයුතු කර ඇත.	

2.` මෙහෙයුම් සමාලෝචනය

2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වර්ග අඩි 22,456 ක වපසරියකින් යුත් බදු දේපලක් වාර්ෂිකව රු.459,857කට ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව හා තක්සේරු කටයුතු සිදු කිරීමකින් තොරව 2014 වර්ෂයේ සිට	2022 2023	අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම්ගත වීමට සමාගම කටයුතු කළ යුතු බව.	මෙම පරිශ්‍රය පිළිබඳ වරාය අධිකාරිව දැනුවත් කර දෙපාර්ශය ගිවිසුම්ගත වීමටටත් ඒ අනුව විධිමත් ක්‍රමවේදයකට අනුව තෝරාගන්නා බදු ගැණුම්කරුවෙකු හා ගිවිසුම්ගත වීමට සමාගම අපේක්ෂා කරයි.	වාර්තා කරන දින වනවිටත් ගිවිසුම් ගතවීමක් සිදු වී නොමැත.

එකම පුද්ගලයෙකු වෙත ලබාදී තිබුණද ඒ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි.					
2.2 මානව සම්පත් කළමනාකරණය					
2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතහි 3.1 (i) සහ 3.2 පරිච්ඡේද අනුව, සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් බදවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2022 2023	අදාල චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් බදවා ගැනීමේ පටිපාටියක් සකස් කර රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.	2024 වර්ෂය තුළ මෙහි ආරම්භය ලබාගෙන ඇති අතර සමාගමෙහි සංවිධාන ව්‍යුහය හා තනතුරු සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇති අතර බදවා ගැනීමේ පටිපාටිය (SOR) පිළියෙල කිරීම සඳහා විශේෂඥ දැනුම ලබා ගැනීමට සාකච්ඡා කරමින් පවතී.	වාර්තා කරන දිනය වනවිට සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍යව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශය සංග්‍රහය 2.3 පරිච්ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම 2023 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.	සමාගම විසින් 2024 වර්ෂය සඳහා අයවැයක් ඉදිරිපත් කර ඇති අතර 2024 ජුනි 10 දින SLMPCS/22/2024 අංක දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබාගෙන ඇති අතර ක්‍රියාකාරී සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම සැකසීම 2024 වසර තුළ ආරම්භ කර ඇති අතර පස් වසරක ක්‍රියාකාරී සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල වෙත යොමු කරන ලෙස 2024 සැප්තැම්බර් 09 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී උපදෙස් ලබා දී තිබුණි.	උපාය මාර්ගික සැලැස්මක් සමාගම විසින් සම්පූර්ණ කර මේ වන තෙක් අදාල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි.

3.2 අභ්‍යන්තර විගණනය

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය	2021 2022	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය සැලසුම්	අභ්‍යන්තර විගණනයක් සඳහා බාහිර විගණන ආයතනයක් හරහා	මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැති

ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශය සංග්‍රහයෙහි 4.2 පරිච්ඡේදය හා 4.4 පරිච්ඡේදය ප්‍රකාරව රජය සතු සියලුම ව්‍යවසායන් විගණන කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට පමණක් වාර්තා කරන අභ්‍යන්තර විගණනයක් තිබිය යුතු වුවද, එයට අනුව සමාගම අභ්‍යන්තර විගණනය සැලසුම් කර නොතිබුණු අතර එම නිසා අභ්‍යන්තර පාලනයේ දුර්වලතා හඳුනාගැනීමට නොහැකිවී තිබුණි.	කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව	සේවාව ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර මේ සඳහා අමරසේකර විගණන ආයතනයේ යෝජනාව හා මිල ගණන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එමෙන්ම තවත් විගණන ආයතන දෙකක මිල ගණන් හා යෝජනාද අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස 2024 ජුනි 10 දින SLMPCS/22/2024 අංක දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මඟින් උපදෙස් ලබා දී තිබුණි.	බව නිරීක්ෂණය වූ අතර බාහිර විගණන ආයතනවලින් යෝජනා හා මිල ගණන් පමණක් ලබාගෙන තිබුණි.

3.94 ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගම

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021/2022	5,332,800,000	10,168,162,000	(4,835,362,000)	තත්ත්වාගණනය කළ
2022/2023	14,873,905,000	8,726,181,000	6,147,724,000	තත්ත්වාගණනය නොකළ
2023/2024	28,753,590,000	21,584,255,000	7,169,335,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
(අ)	රජය සතු ව්‍යාපාර (SOEs) සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය සහ මෙහෙයුම් අත්පොත සඳහා වූ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ඡේදය සමාගමේ සේවකයන්ට ප්‍රසාද දීමනා හෝ ලාභය පදනම් කරගත් දිරිදීමනා ගෙවීම් අතුරු සහ අවසාන බදු / ලාභාංශ ප්‍රකාශ කිරීමෙන් තොරව සිදු නොකළ යුතු වුවද, සමාගම විසින් 2021/2022 මූල්‍ය වර්ෂය සඳහා වන ලාභය මත පදනම්ව අතුරු සහ අවසාන	2021	රජය සතු ව්‍යාපාර (SOEs) සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ සහ මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන පිළිපැදිය යුතුය.	කළමනාකරණ ගිවිසුමේ කරුණු අංක 7.4.2 සහ 7.4.3 අනුව, සියළුම GOPL සේවකයින් බඳවා ගැනීමට, සේවයෙන් පහ කිරීමට, උසස් කිරීමට, අධීක්ෂණය කිරීමට, මෙහෙයවීමට සහ පුහුණු කිරීමට සහ ඔවුන්ගේ වැරදි වන්දි, දිරිගැන්වීම්, වැටුප්, වේතන සහ ප්‍රතිලාභ ප්‍රතිපත්ති නියම කිරීමට කළමනාකරණයට විධිවිධාන ඇත. ඉහත වගන්ති මත පදනම්ව Ex Gratia ගෙවීම් නිකුත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභාංශ ප්‍රකාශ කිරීම සඳහා ඔවුන්ගේ කැමැත්ත ලබා දුන් නමුත් සමාගමේ බුන්වත්භාවය හේතුවෙන් අවසන්	අධ්‍යක්ෂ මණ්ඩලය 2021-22 සහ 2022-23 යන වර්ෂ දෙකේදීම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට ඔවුන්ගේ කැමැත්ත ලබා දී ඇත. නමුත් සමාගමේ බුන්වත්භාවය හේතුවෙන් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, සමාගම විසින් 2023-24 වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරි විගණන කමිටු රැස්වීමේදී/

	බදු / ලාභාංශ ප්‍රකාශයට පත් නොකර 2021/2022 වසර තුළ එහි සේවකයින් සඳහා රු.59.441.160ක ප්‍රසාද දීමනාවක් ගෙවීම් කර තිබුණි.		ලාභාංශ තීරණය කර නොමැත.	මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නියමිතයි.
(ආ)	රජය සතු ව්‍යාපාර (SOEs) සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය සහ මෙහෙයුම් අත්පොත සඳහා වූ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.3 ඡේදය 2007 අංක 07 දරන සමාගම් පනතේ දක්වා ඇති පරිදි නුබුන්වත්භාවය පරීක්ෂාවෙන් සෑහීමකට පත් වී. බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට / කොටස් හිමියන්ට බෙදා දෙනු ලබන බවට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සමාගම විසින් ඒකාබද්ධ අරමුදලට / කොටස් හිමියන්ට කිසිදු ලාභාංශයක් ගෙවා නොතිබුණි.	2021	රජය සතු ව්‍යාපාරය (SOEs) සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ සහ මෙහෙයුම් අත්පොතෙහි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.	සමාගමේ බුන්වත්භාවය හේතුවෙන්. ලාභාංශ අවසන් කර නොමැත.	අඅධ්‍යක්ෂ මණ්ඩලය 2021-22 සහ 2022-23 යන වර්ෂ දෙකේදීම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට ඔවුන්ගේ කැමැත්ත ලබා දී ඇත. නමුත් සමාගමේ බුන්වත්භාවය හේතුවෙන් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, සමාගම විසින් 2023-24 වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරි විගණන කමිටු රැස්වීමේදී/ මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නියමිතයි.

(ඇ)	කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් 06 දෙනෙකු සම්බන්ධයෙන් වූ වසර 5කට වැඩි කාලයක් තිස්සේ පවතින රු.35,191,312 හිඟ ශේෂයක් ගෙවීමට හෝ කපා හැරීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. තවද, ගෙවීම් ප්‍රමාද වීමට හේතු කළමනාකරණය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2022	නියමිත ක්‍රියාවලියන් අනුගමනය කරමින් හිඟ ශේෂයන් ගෙවීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය.	මෙම හිඟ මුදල් පියවීම සඳහා සමාගමට නිසි ඉන්වොයිසි ලැබී නොමැත. කෙසේ වෙතත්, සැපයුම්කරුවන් ඔවුන්ගේ හිඟ මුදල් මෑතකදී තහවුරු කරන ලද අතර. තවමත් ඔවුන්ට ගෙවීම් සිදු කර නොමැත. නමුත්, වර්තමානයේ කර්මාන්ශාලා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් සමාගම යම් මුදල් හිඟයකට මුහුණ දී ඇති අතර, මුදල් ප්‍රවාහය වර්ධනය වූ පසු ඒ අනුව සැපයුම්කරුවන්ගේ බිල්පත් ගෙවීම් කරනු ලැබේ.	අකෙසේ වෙතත්, සමාගම 2024 නොවැම්බර් 30 දිනට නියමිත ශේෂයට එරෙහිව රුපියල් මිලියන 01ක් පියවා ඇත
(ඇ)	සමාගම විසින් සපයන ලද තොරතුරුවලට අනුව, දමන ප්‍රාදේශීය සභාවකට 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වරිපනම් බද්ද ලෙස සමාගම විසින් රු.456,740ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ආයතනයේ සේවකයින් සඳහා ලබාදිය හැකි නිල නිවාස 233 න් අනවසර පවුල් පදිංචිව සිටින නිල නිවාස 211 ක් පවතින බව නිරීක්ෂණය විය.	2023	නිවාස පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීම සහ අත්සන් කළ පසු අදාළ පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුය.	මෙම ඉඩම දැනටමත් රජයේ නිමිකමට ඇතුළත් කර ඇති අතර, අපි විසින් සියලු බදු රජයට ගෙවිය යුතු වේ. එමනිසා පළාත් පාලන ආයතනයට සියලු වරිපනම් බදු ගෙවීමට සිදු වේ. මුදල් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහාය ඇතිව ඉඩම් බදු ගිවිසුමෙහි නටයුතු අවසන් කිරීම කඩිනම් කර ඇත. ගිවිසුම අත්සන් කළ පසු සමාගමට සුදුසු	මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (භාණ්ඩාගාරය), ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදියර වශයෙන් ඉඩම් බදු ගිවිසුම අවසන් කිරීම සිදු වෙමින් පවතී. ගිවිසුම අත්සන් කළ පසු

	ඔවුන් ඉවත් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.			ක්‍රියාමාර්ග ගත හැකිය.	සමාගමට සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිය.
(ඉ)	2009 මාර්තු 6 දිනැති කැබිනට් තීරණයට අනුව, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර 207.3584 ක ඉඩමක් වසර 30 ක බද්දකට උක් වගාව සඳහා සමාගමට ලබා දී ඇත. කල්බදු කාලයෙන් වසර 13කට අධික කාලයක් ගතවී ඇතත්, සමාගමේ කළමනාකාරීත්වය විසින් හිමිකාරිත්වය සම්බන්ධයෙන් නිශ්චයකරගෙන ඇතත් කල්බදු අයිතිය තහවුරු කර ගැනීමට තවමත් කටයුතු කර නොතිබුණි. හෙක්ටයාර 170.7345 ක බදු සැලැස්මක් සකස් කර අවශ්‍ය ලියකියවිලි අම්පාර මිනින්දෝරු කාර්යාලයට ඉදිරිපත් කර ඇතත් මෙම ඉඩමේ අයිතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සමාගම විසින් ඉදිරියට ගෙනගොස්	2023	කල්බදු අයිතිය සුරක්ෂිත කිරීමට සමාගම් කළමනාකාරීත්වය පියවර ගත යුතුය.	1975 සහ 1989 වර්ෂවල ගැසට් කර තිබූ උක් වගාකිරීමේ ඉඩම්වල කළමනාකරණ අයිතිය වසර 5 ක කාලයක් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් 2021.02.15 දින ලබා දී තිබුණි. හෙක්ටයාර 277.7539 ක ඉඩම් සහ ඒවායේ වසර 30 ක ශුද්ධ වර්තමාන බදු කුලී වටිනාකම රජයේ හිමිකමට ඇතුළත් කර ඇත. මුදල් අමාත්‍යාංශය, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහාය ඇතිව ඉඩම් බදු ගිවිසුමේ කටයුතු අවසන් කිරීම කඩිනම් කර ඇත. අවශ්‍ය සියලුම ලියකියවිලි සහ අදාළ වාර්තා අප විසින් නියමිත වේලාවට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යවා ඇත. අවශ්‍ය සියලුම පසුවිපරම් නියමිත වේලාවට සිදු කරනු ලබන නමුත් ඉහත අංක (ඈ) යටතේ පැහැදිලි කර ඇති පරිදි	ඉතිරි ඉඩම් 36.6239 හි “L” රූප සටහන් සකස් කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කළ යුතුය. සමාගම ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීමට රජය පැත්තෙන් ධනාත්මක ප්‍රතිචාරයක් බලාපොරොත්තු වෙන් සිටී.

	නොතිබුණි. මීට අමතරව, ඉතිරි හෙක්ටයාර් 36.6239 සඳහා බදු සැලැස්මක් සකස් කර අම්පාර මිනින්දෝරු කාර්යාලයට ඉදිරිපත් කිරීමට විගණන දිනය වන විටත් කටයුතුකර නොතිබුණි.			මෙම ඉඩම් සහ නිවාස ආදියෙහි පදිංචිව සිටින අනවසර පුද්ගලයින් හේතුවෙන් රජය පාර්ශ්වයෙන් ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීම අවසන් කිරීමට නොහැකි වී ඇත. කලින් සඳහන්කරන ලද නිලධාරීන්ගේ අඛණ්ඩ පසු විපරම් සහ සහයෝගයෙන් පසුව, මෙම දිගුකාලීන බදු දීම අදියර දෙකකට සිදු කිරීමට එකඟ විය. ඒ අනුව ගැටළුකාරී තත්ත්වයන් නොමැති ඉඩම් කට්ටි සඳහා පළමු අදියර යටතේ දිගුකාලීන බදු දීමට අවශ්ය “L” රූපසටහන් මේ වන විටත් මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෘජු ඉල්ලීම වෙත යොමු කර ඇත.	
(ඊ)	2024 මාර්තු 31 දිනට මූල්ය තත්ත්වය අනුව ගොවීන්ගෙන් අයවිය යුතු රු.2,043,877,258 ක ශේෂයෙන් රු.48,861,623 ක් සහ රු.46,977,986 ක් පිළිවෙළින් වසර 03 ට වඩා වැඩි	2023	ගොවීන්ගෙන් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	2024 ජූලි 31 වන දින වන විට ගෙවිය යුතු රු.මිලියන 2,044න් රු.මිලියන 574ක් අයකර ගැනීමට සමාගමට හැකි විය. තවද සමාගම විසින් දිගුකාලීන හිඟ මුදල් සහ පියවීම් නොකළ ශේෂයන් සම්බන්ධයෙන්	සමාගම විසින් 2024 නොවැම්බර් 30 වන දිනට අයවිය යුතු මිලියන 2,044 න් රුපියල් මිලියන 1,131 ක් අය කර ගෙන ඇත. තවද,

කාලයක සහ වසර 05 කට වඩා වැඩි කාලයක සිට අයකර නොතිබුණි.	නිරන්තර අධීක්ෂණයන් සිදුකරයි.	පිළිවෙලින් වර්ෂ 03 කට සහ වර්ෂ 05කට වැඩි කිලයක සිට අයවිය යුතු රුපියල් මිලියන 11 සහ රුපියල් මිලියන 9ක මුදලක් අයකර ගන්නා ලදී.

3.95 එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	27,751,006,297	24,310,554,828	3,440,451,469	6,049,077	තත්ත්වාගණනය නොකල
2022	15,062,468,867	11,347,260,393	3,715,208,473	(2,025,825,745)	තත්ත්වාගණනය නොකල
2023	26,648,096,696	21,146,789,243	5,501,307,453	2,579,034,679	තත්ත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2016 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් සේවා ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කිරීමට අදාළව මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු ශේෂය වන රු. 246,939,587 න් සියයට 36කට සමාන වන රු. 88,939,587 ක් 2016 වසරේ සිට ශේෂව පවතී.	2021	තවදුරටත් ප්‍රමාදයකින් තොරව නියමිත මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව සමාගමට නිර්දේශ කෙරේ.	සමාගමට අනුව ඔවුන් විසින් ශේෂය අයකර ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ආයතනය මට්ටමින් ගෙන ඇත. සියලුම උපකාරක ලේඛණ සහිත නවතම ඉල්ලීම් ලිපිය 2023.11.22 දින මුදල් අමාත්‍යාංශය වෙත යවා ඇත	රු. 88,939,587 තවමත් අයකර ගැනීමට නොහැකිව පවතී. මුදල් අමාත්‍යාංශය වෙත සිහි කැඳවීම් කිහිපයක් යවා ඇත.
(ආ)	ආදායම් බදු වැඩිපුර ගෙවීම හේතුවෙන්, ලැබිය යුතු ආදායම් බදු ලෙස රුපියල් 67,401,151 ක මුදලක් 2014 වර්ෂයේ සිට පවතී	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ලැබිය යුතු ආදායම් බදු අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නිර්දේශ කෙරේ.	මීට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD), IRD විගණනය අවසන් කිරීමට පෙර ආදායම් බදු වගකීම්වලට එරෙහිව ආදායම් බදු වැඩිපුර	සමාගම එය ගෙවිය යුතු 2023/24 තක්සේරු වර්ෂයේ 4 වන බදු වාරිකයට එරෙහිව හිලව් කර ඇත.

				ගෙවීම් අයකර ගැනීමට ඉඩ නොදුන් නිසා ඒ සඳහා හිමිකම් නොකියා ඇති අතර වර්ථමානයේ, IRD එය ආදායම් බදු වගකීම්වලට එරෙහිව හිලව් කිරීමට ඉඩ දී ඇති අතර සමාගම එය ගෙවිය යුතු 2023/24 තක්සේරු වර්ෂයේ 4 වන බදු වාරිකයට එරෙහිව හිලව් කර ඇත.	
(ඇ)	2023 මැයි 15 වැනි දින වැරදි SWIFT පණිවිඩ සහ හිමිකරු කේතය ඇතුළත් කර සුරැකුම්පත් ලබා නොදීම හේතුවෙන් සමාගමට රුපියල් 20,991 ක දඩයක් CBSL වෙත ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනුවේදී සුරැකුම්පත් වෙන් නොකිරීමේ එවැනිම සිදුවීමක් සිදුවීමෙන් පෙර වසරේ ද මහ බැංකුව වෙත රුපියල් මිලියන 259.957ක් අය කර තිබුණි.	2023	සමාගම ඒ අනුව විධානවලට අනුකූල විය යුතුය.	සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇති අතර ඒ අනුව අවවාද ලිපි ලබා දීම, වැටුප් වර්ධක අත්හිටුවීම සහ පාඩුව අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන අදාළ නිලධාරීන්ගෙන් අලාභය අයකර ගන්නා ලදී.	අනාගතයේදී මෙම ආකාරයේ මහහැරීම් වළක්වා ගැනීම සඳහා සමාගම විසින් ආරක්ෂණ ක්‍රම ස්ථාපිත කර ඇත.
(ඈ)	සමාගමේ පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය තම සර්වරයට (server)හෝ NSB	2023	දත්තවල නිරවද්‍යතාවය සහ වලංගුභාවය සහතික කිරීම සඳහා සමාගමේ උපස්ථ ක්‍රියාපටිපාටිය	දැනට පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) NSB FMC පරිශ්‍රය තුළ පිහිටා ඇති NSB FMC	සමාගම තවමත් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය වෙත උත්ශ්‍රේණි කිරීම සම්පූර්ණ කර

	සර්වරයට (server) සම්බන්ධ කර නොමැති බැවින්, සමාගම එහි උපස්ථ ක්‍රියාපටිපාටිය ස්වයංක්‍රිය නොවන ලෙස සිදු කළ යුතුය. මේ අනුව, මානව දෝෂ සහ ප්‍රතිආවරණ ගැටලු ඇතිවීමෙන් දත්ත නිරවද්‍යතාවයේ අවදානම වැඩිවීමේ ඉහළ සම්භාවිතාවක් තිබිය හැකිය.		ස්වයංක්‍රීය කළ යුතු බව නිර්දේශ කෙරේ.	සර්වරයට (server) ස්ථාපනය කර ඇත. එය NSB සර්වරයට (server) සම්බන්ධ නොවේ. උපස්ථයන් දළ වශයෙන් මධ්‍යාහ්න 12:00 සහ සවස 5:00 ට ගනු ලැබේ, පිටපත් මහරගම ආපදා ප්‍රතිආවරණ (DR) වෙබ් අඩවියේ සහ NSB ප්‍රධාන කාර්යාලයේ හවුල් ෆෝල්ඩරයක ගබඩා කර ඇත. NSB FMC විසින් දැනට පවතින භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය නව අනුවාදයකට වැඩිදියුණු කිරීමට ගිවිසුමක් අත්සන් කර ඇති අතර, ස්වයංක්‍රීය උපස්ථ පහසුකම ඇතුළත් වේ. නව වැඩිදියුණු කළ අනුවාදය සජීවී වීමෙන් පසු මෙම ස්වයංක්‍රීය උපස්ථ විශේෂාංගය ක්‍රියාත්මක වනු ඇත.	නැත.
(ඉ)	සමාගමේ Efixin පද්ධතිය SWIFT පද්ධතිය සමඟ සම්බන්ධ වී නොමැති බැවින්, SWIFT පද්ධතියට වැරදි පණිවිඩ ඇතුළත් කිරීමේ ඉහළ හැකියාවක් පවතී.	2023	දෝෂ ඇතිවීමේ අවදානම වැළැක්වීම සඳහා සමාගම සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුය.	පවතින පද්ධතිය වැඩිදියුණු කිරීමත් සමඟ සම්පූර්ණ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය අවසන් වනු ඇත. කෙසේ වෙතත්, පහත ස්වයංක්‍රීය ක්‍රියාවලිය දැනටමත් ස්ථාපිත කර ඇත. වත්මන් පද්ධතියෙන් (e FixIn) විකුණුම් පණිවිඩවල පෙළ ගොනුව (Text File)	සමාගම තවමත් පවතින පද්ධතිය සම්පූර්ණයෙන්ම වැඩිදියුණු කර නොමැත.

				උත්පාදනය කරන අතර සත්‍යාපනය සහ බලයදීමේ ක්‍රියාවලිය සඳහා SWIFT SERVER වෙත සෘජුවම ඇතුලත් කරයි.	
(ඊ)	2023 අගෝස්තු 29 වැනි දින පවත්වන ලද වෙන්දේසියේදී මාස 03ක භාණ්ඩාගාර බිල්පත් ලංසු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාගමට රුපියල් 782,815 ක ශුද්ධ අලාභයක් දැරීමට සිදු විය.	2023	සමාගම ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කළ යුතු අතර එම පාලනයන් අඛණ්ඩව පවත්වාගෙන යාම සොයා බැලිය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය ඇතිව, බැංකුවේ අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් කර අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කිරීම, වාර්ෂික වැටුප් වර්ධක රදවා තබාගැනීම සහ වෙනත් අංශයකට මාරු කිරීම මගින් අදාළ නිලධාරියාට එරෙහිව සමාගම දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවෙන් ද්විතියන පදනම මත නිලධාරියෙක් ලංසු සඳහා අවසරය දීමට පසු කාර්යාලයට අනුයුක්ත කරන ලදි. අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ සමඟ උපදෙස් මාර්ගෝපදේශ නිකුත් කර ඇත.	ඉදිරියේදී මෙවැනි දෝෂ ඇතිවීම වැලැක්වීම සඳහා චක්‍රලේඛ හරහා අදාළ උපදෙස් ලබාදී ඇත.
(උ)	2020 මාර්තු මස අවසන් වන විට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සමාගම ඉන්දියාවේ ක්‍රෙඩන්ස් ඇනලිටික්ස් සමාගම සමඟ ගිවිසුමකට	2023	සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු සුමට කිරීම සඳහා නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සමාගම විසින් වේගවත් කළ යුතුය	ක්‍රෙඩන්ස් පද්ධතියේ ප්‍රගතිය සහ කාල රාමුව සැලකිල්ලට ගනිමින්, NSB FMC අධ්‍යක්ෂ මණ්ඩලය, NSB හි නීති අංශයේ උපදෙස් ලබා ගන්නා ලෙසත්, මෙතෙක් ගෙවා ඇති මුදල ආපසු ඉල්ලා විකුණුම්කරුට ලියා	සමාගම තවමත් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කර නොමැති අතර දැනටමත් විකුණුම්කරු වෙත ගෙවා ඇති ගෙවීම් ආපසු

				තබන ලෙසත් උපදෙස් දුන්නේ, ඔවුන් එසේ කිරීමට ඇති ඉඩකඩ ඉතා අඩු බැවිනි. දැනටමත් අවසන් වී ඇති කාල සීමාව තුළ ගැටළු නිවැරදි කිරීමට හැකි වනු ඇත. NSB FMC දැනටමත් ඔවුන්ගේ උපදෙස් ලබා ගැනීම සඳහා NSB හි නීති අංශයට ලිඛිතව යවා ඇත.	අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
	එළැඹ ඇත. සමාගම දැනටමත් රුපියල් 53,833,248 ට සමාන වන ඩොලර් 267,131 ක් ගෙවා ඇති අතර මෙය USD 51,000 ක වාර්ෂික නඩත්තු ගාස්තුවක් සමඟ USD 395,706.25 ක මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 67.5 ක් විය. කෙසේ වෙතත්, සමාගමට නියමිත වේලාවට අදාළ සැපයුම්කරුගෙන් සේවාව ලබා ගැනීමට නොහැකි වූ අතර පසුව දෙපාර්ශවය අතර පැවති සාකච්ඡා සමඟ, එම සමාගම 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පද්ධතිය භාර දීමට එකඟ විය. එය අවසන් කිරීමට එකඟ වූ දින සිට වසර 04කට ආසන්න කාලයක් ගත වී ඇතත්, තවමත් සමාගමට ප්‍රාථමික ගනුදෙනු පද්ධතිය ස්ථාපිත කිරීමට නොහැකි විය.				
(ඌ)	2019 වර්ෂයේදී පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගම	2022/2023	යෝජිත වැඩසටහන් කාලෝචිත ලෙස ක්‍රියාත්මක කළ යුතුය.	පාරිභෝගික කළමනාකරණ පද්ධතිය දෙවන අදියර අවසන් වූ පසු ජංගම යෙදුමක් හඳුන්වා දීමට	සමාගම තවමත් පාරිභෝගික කළමනාකරණ පද්ධතියේ දෙවන අදියර

	සැලසුම් කර ඇතත්, විගණන දිනය වූ 2024 මාර්තු 31 දින දක්වාම ජංගම යෙදුමක් හඳුන්වා දීමට සමාගමට නොහැකි විය.			සැලසුම් කර ඇත.	සම්පූර්ණ කර නොමැත
(එ)	ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මෙහෙයුම් අත්පොත අනුව අවම වශයෙන් කාර්තුමය විගණන කමිටු රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වුවද, සමාගම නියමිත අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් පැවැත්විණි.	2022/ 2023	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, විගණන කමිටු ප්‍රඥප්තියට අනුකූලව පැවැත්විය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය නොමැති වීම හේතුවෙන් 2023 ජූනි 12 දින අනු කමිටු පත් කරන ලදී. ඉන් පසුව, පසුගිය කාර්තු 02 සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු 02ක් පවත්වන ලදී.	සමාගම 2024 මුදල් වර්ෂය සඳහා කාර්තුමය පදනමින් මණ්ඩල විගණන කමිටු රැස්වීම් පවත්වන ලදී.

3.96 සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	325,874,190	220,510,591	105,363,599	6,580,963	තත්ත්වාගණනය කල
2022	340,544,104	225,249,363	115,294,741	12,584,033	තත්ත්වාගණනය කල
2023	389,370,570	135,940,968	253,429,603	13,755,176	තත්ත්වාගණනය කල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**				
	1.5.1 ගිණුම්කරණ අඩුපාඩු				
	2009 ජූනි 04 වැනි දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුවට අනුව, සමාගමේ බහුතර කොටස්වල නීත්‍යානුකූල අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තබාගැනීමට භාණ්ඩාගාර ලේකම් වෙත පැවරිණි. එකී තීන්දුවට අනුව, ඩිස්ටිලරීස් සමාගම ශ්‍රී ලංකා පෞද්ගලික සමාගම, මෙම සමාගමේ මව් සමාගම ලෙස කටයුතු කල	2021, 2022	ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කිරීමට නිර්දේශ කෙරේ.	පෙර මව් සමාගමට ආරෝපණය කළ ලාභය ගණනය කර ගෙවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය භාණ්ඩාගාර ලේකම්වරයාට නියෝග කර ඇත.මේ නිසා මෙම ලාභය ගණනය කිරීම සම්බන්ධව සමාගම සෘජුව මැදිහත් නොවේ.	ආරෝපණය කළ හැකි ලාභ තීරණය කිරීමට අපේක්ෂාවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර නොමැත.

කාලසීමාව තුළ සමාගම ඉපයූ ලාභ ලාභ වලින් පෙර මව් සමාගමට ආරෝපණය කළ යුතු ලාභය ගණනය කර පියවිය යුතු බවට භාණ්ඩාගාර ලේකම්වරයාට නියෝග කරන ලදී. කෙසේ වෙතත්, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (SLIC) ජනාධිපති නීතීඥවරයාගේ 2022 මාර්තු 09 දිනැති නීති නියෝජන ලිපියේ සඳහන් වන පරිදි මතය වන්නේ කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DMR/02394/19 අනුව ඉහත ප්‍රකාශිත ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්වල (Sc FR අංක 117/2007 අංක SC/ FR අංක 158/2007) ක්‍රියා දාමයන් භාණ්ඩාගාර ලේකම්වරයාගේ වගකීම් ඉටු කිරීමට දිසා අධිකරණ නඩුවේ පැමිණිළිකරුවන්ට සමාගමෙන් සහන ඉල්ලා සිටිය නොහැකි බවයි. තවද 2023 ජනවාරි 18 වැනි දින මුදල් අමාත්‍යාංශය සමඟ කළ සාකච්ඡාවට අනුව, ඉදිරිපත් වූ

ලේඛණ මතුපිටින් පරීක්ෂාවේදී සමාගම ඉහත් නඩුවේ පාර්ශවකරුවෙකු නොවන බව අමාත්‍යාංශයේ අදහස විය. එබැවින් මෙම තත්වය සනාථ කරගැනීම සඳහා නීතිපතිවරයාගෙන් නීතිමය තහවුරු කිරීමක් ලබා ගැනීමට සමාගම කටයුතු කරමින් සිටී.කෙසේ වෙතත් ඉහත අංක DMR/02394/19 දරන නඩුවේ තීන්දුව කොළඹ දිසා අධිකරණය විසින් වාර්තා කරන කාලය වනවිට ප්‍රකාශ කර නොමැති අතර, ඉහත සඳහන් කල නඩුවලින් වගකීම් පියවීමට අදාළ සුදුසු විගණන සාක්ෂි මුදල් අමාත්‍යාංශය සමග පැවති සාකච්ඡාවේදී ලබා ගැනීමට නොහැකි විය.

තවද, සමාගමේ ස්ථාවරය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ එම තහවුරු කිරීම්ද වාර්තා කිරීමේ කාල සීමාව තුළදී ලැබීමට නියමිතව තිබුණි. එබැවින් ශ්‍රේෂ්ඨාධිකරණය

	විසින් ගනු ලැබූ මුල් තීරණ සහ පසුව ඇති වූ සාකච්ඡා සහ වර්තමාන වර්ධනයන් සැලකිල්ලට ගත් කල, සමාගම ඉහත සඳහන් තීරණ මගින් ආරෝපනය කළ හැකි ලාභය සඳහා මූල්‍ය ප්‍රකාශන වල කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුනි.				
(ආ)	**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම** ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පීඑල්සී සමාගමෙන් ලැබිය යුතු මුදල වූ රු.136,479,445 සඳහා ශේෂ තහවුරු කිරීම	2022	අදාල මුදල් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරනු ලැබේ.	මෙම ශේෂයට ඩිස්ටිලරීස් සමාගමෙන් ලැබිය යුතු ශේෂය ඇතුලත් වේ. 2009 ජූනි 04 දින ලබා දුන් අධිකරණ තීන්දුව අනුව ගෙවීම් අවසන් කල පසු මෙම වටිනාකම් ගලපනු ලැබේ.	තහවුරු කිරීම් තවමත් නොමැත. එබැවින් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් අවශ්‍ය වේද යන්න තීරණය කළ නොහැක
(ඇ)	**1.6 අඛණ්ඩ පැවැත්ම**				
	මූල්‍ය ප්‍රකාශනවල සටහන 49 ට අනුව කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම සහ එහි පරිපාලිත සමාගම වන හෙලන්කෝ හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගම සහ සිනෝලංකා හොටෙල් සහ ස්පා පෞද්ගලික සමාගම	2022	කළමනාකාරීත්වය අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතුය	සමාගමේ කළමනාකාරිත්වය ඉදිරි කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී	MF/018/2023/055 දරන කැබිනට් තීරණයට අනුව ආයතනය කොටස් කිරීම් වැඩසටහන ආරම්භ කර ඇත. අදාල පාර්ශව විසින් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය

සම්බන්ධව අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සමූහයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂකවරු විසින් තක්සේරුවක් කර අනාගත අපේක්ෂා කළ හැකි කාල සීමාවක් සඳහා ව්‍යාපාර වලට ඉදිරියට යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත් වන බව සඳහන් කර ඇත. තවද අඛණ්ඩව ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව පිළිබඳව සැළකිය යුතු සැකයක් ඇති කල හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් අධ්‍යක්ෂකවරුන්ට අනාවරණය වී නොමැත. එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පදනම මත පිළියෙළ කර ඇත. කෙසේ වෙතත් හෙලන්කෝ හොටෙල් සහ ස්පා පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය 2015 වර්ෂයේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇති අතර සමාගමේ දැනටමත් අවසන් කර ඇත

කළමණාකරණය ඉදිරි කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගන්නා බව සඳහන් කරන ලදී. ඒසේම 2020 ජූලි10 දිනැති අංක 20/1042/204/050 දරණ කැබිනට් පත්‍රිකාව විසින් අමාත්‍යාංශ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇතැත් වාර්තා කරන කාලය වන විට සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම කොළඹ ග්‍රන්ඩ් හයිට් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත් ආරම්භ කර නොතිබුණි.

තවද සීමාසහිත කැන්විල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමෙහි සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සතු කොටස් සහ ලිට්රෝ ගෑස් ලංකා සමාගම සතු කොටස් 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරණ අමාත්‍යාංශ මණ්ඩල තීරණය අනුව මහා භාණ්ඩාගාරය වෙත

	පැවරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.				
(ඇ)	**1.8 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.** (2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්තය විදිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තිය සමාගම දිගුකාලීන රක්ෂන ව්‍යාපාරය හසහ ඒය විසින් කරගෙන යනු ලබන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන වෙනම සමාගම් දෙකකට වෙන් කර නැත. කෙසේ වෙතත් 2023 මාර්තු 14 දිනැති අංක 23/0431/604/046 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2011 අක 03 දරණ රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනතේ විධිවිධාන වලට සම්පූර්ණයෙන්ම අනුකූලව වෙනම නෛතික ආයතන යටතේ ඒහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යන	2022	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ රෙගුලාසි සහ අවශ්‍යතා අනුගමනය කිරීම නිර්දේශ කෙරේ	සමාගම් පනතට අනුව දැනටමත් අවශ්‍ය සමාගම් පිහිටුවා ඇත.	සමාගම් වෙන්ව පිහිටුවීම දැනටමත් සිදු කර ඇත. පිහිටවූ සමාගම් 2ම 2024 පෙබරවාරි 1වන දින සිට තම ව්‍යාපාරික කටයුතු සිදු කරගෙන යනු ලබයි.

	ලෙස සමාගමට උපදෙස් දී ඇත. සටහන 46.2 හි සඳහන් පරිදි වාර්තාකරණ කාලපරිච්ඡේදය වන විට අධ්‍යක්ෂක මණ්ඩලය සහ රක්ෂන නියාමන කොමිෂන් සභාව විසින් වෙන් කිරීමේ ආකෘතිය අවසන් කර අනුමත කර නොමැති අතර තවමත් සාකච්ඡා මට්ටමේ පවතී			
(ඉ)	**1.10 තොරතුරු තාක්ෂණ පොදු පාලනයන්**			
	ජීවිත රක්ෂණ පරිගණක පද්ධතිය සහ සාමාන්‍ය රක්ෂණ පරිගණක පද්ධතිය පසු අන්ත පරිගණක පද්ධතිය සමඟ නිසි ලෙස ඒකාබද්ධ වී නොමැති බව නිරීක්ෂණය විය. දැනට ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ පරිගණක පද්ධති වලින් දත්ත පසු අන්ත පරිගණක පද්ධතිය වෙත මාරු කරනු ලබන්නේ තොරතුරු තාක්ෂණ දත්ත මධ්‍යස්ථානය විසින් ජනනය කර අදාළ මූල්‍ය අංශයේ නිළධාරීන් විසින්	2022	යෙදුම් පද්ධති අතර හුවමාරු වන දත්ත වල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවට වැඩි දියුණු කිරීම සඳහා ආයතනය පොදු ලෙජරය සමඟ ඉහත කී මොඩියුල වල ස්වටංක්‍රීයකරණය පිළිබඳව (ඒකාබද්ධ කිරීම) සලකා බැලිය යුතුය. වඩාත් ආරක්ෂිත තාක්ෂණය උසස් ක්‍රියාකාරීත්වය පවතින පද්ධති සමඟ ඒකාබද්ධ වීමේ පහසුකම සහිත වෙනත් පැකේජයකට සංක්‍රමණය වීම	දැනට ඉදිරි රක්ෂණ පද්ධති සහ පසු අන්ත පද්ධති අතර දත්ත හුවමාරුව සිදු කරනු ලබන්නේ දෛනිකව අතින් සාමූහ උඩුගත කිරීමක් ලෙසය. මෙම ක්‍රියාවලියේ දී මූලික රක්ෂණ පද්ධතිය හිමිකම්, ලැබීම් සහ කොමිස් ගෙවීම් වැනි ගනුදෙනු පිළිබඳව තොරතුරු ජනනය කරනු ලබයි. මූල්‍ය පද්ධතිය වෙත දින අවසාන ක්‍රියාවලියක් ලෙස එම ගනුදෙනු උඩුගත කරනු ලැබේ. වත්තම් අතින් දත්ත උඩුගත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම සඳහා අවශ්‍ය	පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

උඩුගත කරන ලද ගොනුවක් හරහාය.		කළමණාකරණය සැලකිය යුතු බව නිර්දේශ කරමු. තවද නව පද්ධතිය අත්පත් කර ගැනීමේදී අතින් සිදු කළ ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීමේ පහසුකම සලකා බැලීම දැඩිව නිර්දේශ කෙරේ	ඒ්කාබද්ධ කිරීම දැනට සංවර්ධනය කර ඇති අතර තොරතුරු තාක්ෂණ , මූල්‍ය අංශ පාර්ශවකරුවන් සමඟ අභ්‍යන්තර විගණනය ඉදිරියේ පරීක්ෂණ අදියරේ පවතී.	
(ඊ) **3.2 අරමුදල් අඩු භාවිතය**				
2015 වසරේ සිට පරිපාලිත සමාගම්වල ආයෝජනයෙන් සමාගම අඩු ප්‍රතිලාභයක් ලබා ඇති බව නිරීක්ෂණය විය. පරිපාලිත සමාගම් පහක ආයෝජනය කළ ප්‍රාග්ධනය රු. මිලියන 23,032 ක් වූ අතර 2015 සිට 2022 දක්වා සාමාන්‍ය ලාභාංශය රු. මිලියන 1,035.6 කි එබැවින් වාර්ෂික සාමාන්‍ය ප්‍රතිලාභය 4.5% කි. මේ නිසා සමාගමට තම ආයෝජනය කළ හැකි අරමුදල් සඳහා ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී ඇත.	2022	අනාගත ආයෝජන තීරණ ගැනීමේදී කළමනාකාරීත්වය ආයෝජනයේ ප්‍රතිලාභය සලකා බලන ලෙස නිර්දේශ කරනු ලැබේ. මීට අමතරව, සමාගමේ ඇල්ම ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරීත්වය මෙම සමාගම් පිළිබඳ මණ්ඩල නියෝජනයන් ලබා ගත යුතුය. ඒ අනුව ආයෝජන කළඹ පවත්වාගෙන යන ලෙස නිර්දේශ කරමු.	මෙම සියලුම පරිපාලිත උපාය මාර්ගික අයෝජනයන් වේ. මෙම ආයෝජන ශ්‍රී ලංකා රජයේ උපාය මාර්ගික දිශානතිය අනුව සමාගමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	MF/018/2023/ 055 දරන කැබිනට් තීරණයට අනුව ආයතනය කොටස් කිරීම් වැඩසටහන ආරම්භ කර ඇත. අදාල පාර්ශව විසින් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය දැනටමත් අවසන් කර ඇත

3.97 යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	-	-	-	-	-
2022	-	-	-	-	-
2023	-	-	-	-	-

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	යූත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ පසුගිය වර්ෂ විසින් 2021,2022 හා 2023 කාල පරිච්ඡේදයට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වා ඉදිරිපත් කර නොතිබුණි.	2021 2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය.	අදාළ ගිණුම් ඉදිරිපත් කරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(2) (උ) වගන්තිය අනුව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ	2021 2022 2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඉදිරි කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවත් සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 4.2.2 ඡේදය අනුව සභාවේ කාර්ය සාධනය ඇගයීම හා අවශ්‍ය පාලනයන් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් වාර පහක් පමණක් පවත්වා තිබුණි.	2021	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කොවිඩ් තත්ත්වය මත අධ්‍යක්ෂ මණ්ඩල පැවැත්වීමට නොහැකි වූ බැවින් ඉදිරියේ දී නිසි ලෙස පවත්වාගෙන යාමට උපදෙස් ලබා දෙන ලදී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තිය අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවක් හා කෙටි කාලීන හා දිගු	2021 2022 2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අයවැය ඇස්තමේන්තුව සකස් කිරීමට ගිණුම් අංශය වෙත උපදෙස් ලබා දී ඇත.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	කාලීන දැක්මක් සහිතව කළමනාකරණය කිරීම සඳහා සංයුක්ත සැලැස්මක් සහ ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.				
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි සමාගම විසින් වාර්ෂික වාර්තා පිළියෙළ කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ වන විට වාර්ෂික වාර්තා සකස් කරමින් පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 6.7 වගන්තිය අනුව ස්ථාවර වත්කම් සහ ගබඩා සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර	2021 2022 2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අදාළ කටයුතු සිදු කරමින් පවතී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

	භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, සමාගම විසින් 2016 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.				
(උ)	1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ10 වන වගන්තියේ 2 වන අනු වගන්තිය අනුව සේවක අර්ථ සාධක දායක මුදල් එක් එක් මාසය වෙනුවෙන් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දිනට පෙර සේවක අර්ථ සාධක අරමුදල වෙත ගෙවිය යුතු වුවත්, අවස්ථා හතරකදී එකතුව රු. 3,408,357 ක් වූ දායක මුදල් මාස 01 ත් 03 ත් අතර කාල ප්‍රමාදයකින් යුක්තව ගෙවීම් කර තිබුණි.	2021 2022 2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කොවිඩ් තත්ත්වය මත සමාගමේ රාජකාරී කටයුතු හා මූල්‍ය තත්ත්වය අයහපත්වීමත් ලැබිය යුතු ණය මුදල් නියමිත වේලාවට නොලැබී යාමත් නිසා මූල්‍ය තත්ත්වය යහපත් වූ පසු අදාළ ගෙවීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
(ඌ)	1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ16 වන වගන්තිය අනුව සේවා නියුක්තිකයකු සම්බන්ධයෙන් සේවා යෝජක විසින් ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනයේදී නොගෙවීම මත 2021-2023 දක්වා වර්ෂවලදී	2021 2022 2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී එවැනි සිදුවීම් සිදු නොවීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි

	රු.209,130ක් අධිභාර ලෙස ගෙවා තිබුණි.				
(එ)	සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණු අතර සහකාර ගණකාධිකාරී තනතුරද 2019 ජුනි 03 දින සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තත්ත්වය අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට කාලීනව ඉදිරිපත් නොවීමටද හේතු වී තිබුණි.	2021 2022 2023	බඳවාගැනීමේ පටිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	ගණකාධිකාරී පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. බඳවා ගැනීමේ කටයුතු සිදුවන තෙක් වැඩ බලන ගණකාධිකාරීවරයෙකු පත්කර ඇති බව දන්වමි.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.
(ඒ)	සමාගමේ මුද්‍රණාලයේ 2018 වර්ෂයේදී රු. මිලියන 17ක්ව පැවති වාර්ෂික ආදායම 2022/2023 වර්ෂය වන විට රු. මිලියන 2.6 ක් දක්වා අඩු වී තිබුණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 15.2 ක අඩු වීමක් වන අතර සමාගමේ මුද්‍රණාලයේ ආදායම් වැඩිකර ගැනීම සඳහා කළමණාකරණය කිසිදු ක්‍රියාමාර්ගයක්	2021 2022	ආදායම ප්‍රවර්ධනය කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.	දැනට පවතින මුද්‍රණ යන්ත්‍රයෙන් ඉලක්කගත ආදායම්කරා යාමට අපහසු බැවින් නවීන මුද්‍රණ යන්ත්‍රයක් මිල දී ගැනීමට අපේක්ෂා කරන අතර, එමඟින් මුද්‍රණාලයේ ආදායම ඉහළ නංවා ගැනීමට සැලසුම් කර ඇත.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි

ගෙන නොතිබුණි.

(ඔ)	2021අප්‍රේල් 01 දින සමාගමට සමාගමට අයත් නොවන තරුණ සේවා සභාවේ මාතලේ තරුණ මධ්‍යස්ථාන භූමි කොටසකට අදාලව වැටක් ඉදිකිරීම සඳහා සහ සමාගමේ ආරක්ෂක සේවා සැපයීම් ආයතන පිළිබඳ නිරීක්ෂණ චාරිකාවක් සඳහා කළමනාකරණ අධ්‍යක්ෂක වෙත ගෙවා තිබුණු රු.100,000ක දීමනාවක් සඳහා අදාළ උපයෝගී ලියවිලි හා වියදමට අදාළ අනුමැතියක් විගණය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022	අදාල මුදල් අප්‍රමාදව පියවීමට කටයුතු කළ යුතුය.	එවකට සිටින ලද සභාපතිතුමාගේ උපදෙස් මත කළමනාකාර අධ්‍යක්ෂ විසින් මෙම මුදල් ප්‍රමාණය ලබා ගෙන ඇති අතර, මේ දක්වා පියවීම් සිදු කර නොමැත. එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි
(ඕ)	කිසියම් විශේෂිත කාර්යක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරින්ට පමණක් එක් අවස්ථාවකදි රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දීමට හැකි අතර එම කාර්‍ය නිමකල විගස අග්‍රිමය පියවිය යුතු වුවත් ,ඊට පටහැනිව	2022	අතුරු අග්‍රිම අදාල සිමාවන්ට යටත්ව ලබා දීමටත් එම කාර්ය නිමකල විගස අග්‍රිමය පියවීමටත් කටයුතු කළ යුතුය	අදාළ අත්තිකාරම් මුදල් ලබා ගෙන වැඩසටහනට අනුව වෙනත් නිළධාරීන් ලවා ආහාර නිකුත් කිරීමට උපදෙස් ලබා දුන් අතර, ආපනශාලාවේ සියලු සේවකයින් සේවයට වාර්තා කිරීමක් සිදු කර නොමැත.	නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි

සමාගම විසින් 2022 වර්ෂයේ රු.මිලියන 1.6ක් හා 2023 වර්ෂයේ රු.මිලියන 1.3ක් අත්තිකාරම් ලබාදී තිබුණි.

3.98 ශ්‍රී ලංකන් කේටරින් සමාගම

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	13,495,559,618	2,840,427,414	10,655,132,204	2,802,700,908	තත්වාගණනය නොකල
2022	19,536,985,832	4,750,011,531	14,786,974,302	4,697,214,496	තත්වාගණනය නොකල
2023	22,832,051,346	3,978,826,389	18,853,224,957	4,054,238,126	තත්වාගණනය නොකල

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගමට ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් (SLA) රු .බිලියන 15.3 ක සැලකිය යුතු ලැබිය යුතු ශේෂයක් වූ අතර එය 98% ක වැඩිවීමක් නියෝජනය විය. මෙම ශේෂයෙන් 63% වසරකට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි.	2023	සමාගම ප්‍රධාන වශයෙන් එක් පාරිභෝගිකයෙකු මත යැපෙනවාට වඩා අනෙකුත් ගුවන් සේවා සහ අනුබද්ධ සේවා (සංක්‍රමණ හෝටල්, රෙදි සෝදන, වැනිලා පොඩි ආදිය) විකුණුම් සලකා සමාගමේ පාරිභෝගික පදනම ගොඩනගා ගත යුතු අතර SLA වෙතින් ලැබිය යුතු විශාල ශේෂය සඳහා ප්‍රතිසාධන සැලසුම් සකස් කළ යුතු වීම.	ප්‍රධාන වශයෙන් 2022/23 සහ 2023/24 මූල්‍ය වර්ෂවල උපයාගත් ලාභයෙන් SLC වෙතින් ලාභාංශ ප්‍රකාශ නොකිරීම හා නොගෙවීම හේතුවෙන් පසුගිය මූල්‍ය වර්ෂ දෙක තුළ SLA වෙතින් ලැබිය යුතු ශේෂය වැඩි වී ඇත, භාවිතයට අනුව, ශ්‍රී ලංකන් කේටරින් සමාගම විසින් සිය මුදල් ප්‍රවාහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වූ විට SLA විසින් අවශ්‍ය අරමුදල් සපයනු ලබන අතර එය ශ්‍රී ලංකන් කේටරින් සමාගම විසින් භාවිතා නොකරන ලද ණය පහසුකම් වලින් පැහැදිලි වේ. ද්‍රවශීලතා කළමනාකරණය කණ්ඩායම් මට්ටමින් සලකා බලනු ලැබේ.	වෙළඳ ලැබිය යුතු ශේෂය 2024 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 16.4 දක්වා වැඩි වී ඇත..

(ආ)	මිහින් ලංකා පෞද්ගලික සමාගම සඳහා Snorkel lift කුලියට ගැනීම වෙනුවෙන් 2010 අගෝස්තු 01 සිට 2015 මැයි 31 දක්වා කාලය සඳහා ගෙවිය යුතු රුපියල් 6,200,000ක මුදලක් දිගුකාලීන හිඟ පවති.	2021	ප්‍රතිපාදන ආපසු හැරවිය යුතු නැත.	මිහින් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් තවදුරටත් ක්‍රියාත්මක නොවන අතර නීති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ප්‍රතිපාදනය ආපසු හරවනු ලැබේ.	මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොතිබුණි.
(ඇ)	ගුවන් ගමන් ආහාර සේවා සම්බන්ධයෙන් ගිවිසුම්ගත අනුකූලතාවයේ සැලකිය යුතු අඩුපාඩුවක් විගණනය විසින් හඳුනා ගැනුණි. ගුවන් සමාගම් 16 න්, ගුවන් යානා ආශ්‍රිත සේවා සහ හැසිරවීමේ ගාස්තු සඳහා ගුවන් සමාගම් තුනක් සමඟ ගිවිසුම් කල් ඉකුත් වී ඇති අතර විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව සේවා දිගටම පවත්වා ගෙන ගොස් තිබුණි.	2023	ගුවන් යානා ආහාර සේවා සම්බන්ධයෙන් ගිවිසුම්ගත අනුකූලතාවයේ සැලකිය යුතු අඩුපාඩුවක් විසඳීමට කළමනාකාරීත්වය ඉක්මන් පියවර ගනී. අනාගතයේදී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා දැනට පවතින සියලුම කොන්ත්‍රාත්තු පිළිබඳ පුළුල් සමාලෝචනයක් සහ කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා ශක්තිමත් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.	2024 ජූනි 30 දිනෙන් තුර්කි ගුවන් සේවය සමඟ ඇති ගිවිසුම අවසන් වූ අතර මිල නියම කිරීම සඳහා වාහකයාගේ කැමැත්ත ලැබීමෙන් පසු කොන්ත්‍රාත්තුව 2024 දෙසැම්බර් 15 ට පෙර අවසන් කෙරේ. Covid 19 වසංගතයෙන් පසු ගුවන් සමාගම කොළඹ වෙත සිය මෙහෙයුම් නවතා දැමූ බැවින් Cathay Pacific Airline සමඟ නව ගිවිසුමක් සඳහා අවශ්‍යතාවයක් නොතිබුණි. 2024 පෙබරවාරි මාසයේදී වාහකය සිය මෙහෙයුම් නැවත ආරම්භ කළද, ශ්‍රී ලංකන් කේටරින් ආයතනය ඔවුන් සඳහා දැනට ආහාර ලබා දෙන්නේ නැත. SLC සපයන්නේ රෙදි සෝදන සේවා පමණි. කෙසේ වෙතත්, නව ගිවිසුමක් 2024	කොන්ත්‍රාත් ගිවිසුම් මෙතෙක් අවසන් කර නොතිබුණි.

				දෙසැම්බර් 15 ට පෙර අත්සන් කිරීමට නියමිතව ඇත. ගල්ෆ් ගුවන් සමග ගිවිසුම සමාලෝචන ක්‍රියාවලිය යටතේ පවතින අතර 2024 දෙසැම්බර් 31 ට පෙර අවසන් කරනු ඇත. චීනයේ දකුණු ගුවන් සේවය සඳහා ඉහළ නැංවීමක් නොමැත, එබැවින් ගිවිසුමක් අවශ්‍ය නොවේ.	
(ඇ)	තවද, සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම ඇතුළු සමාගම් අටක් සඳහා ගුවන් ගමන් ආහාර සේවා විවෘත ගිවිසුම් යටතේ සපයා තිබුණි. කෙසේ වෙතත්, විගණනයට ලැබුණු තොරතුරු අනුව, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ ශ්‍රී ලංකන් කේටරින් සමාගම අතර ගුවන් ගමන් ආහාර, ඒ ආශ්‍රිත සේවා සහ හැසිරවීමේ ගාස්තු සැපයීම සඳහා අත්සන් කළ ගිවිසුම 2021 අප්‍රේල් 30 දිනෙන් අවසන් වී තිබූ අතර එදින සිට නව ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.	2023	විවෘත ගිවිසුම් යටතේ සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ අනෙකුත් සමාගම් වෙත සපයනු ලබන ගුවන් යානා ආහාර සේවා සම්බන්ධයෙන් කොන්ත්‍රාත් අනුකූලතාවයේ සැලකිය යුතු අඩුපාඩුවක් විසඳීමට කළමනාකාරිත්වය වහා පියවර ගනී. අනාගතයේදී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා දැනට පවතින සියලුම ගිවිසුම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් සහ කොන්ත්‍රාත් කළමනාකරණය සඳහා ශක්තිමත් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වීම .	ගුවන් ගමන් ආහාර සැපයුම් කර්මාන්තය තුළ, පාරිභෝගික ගුවන් සේවා සමඟ විවෘත ගිවිසුම් පොදු වන අතර ඒවා සේවා සපයන්නාට වාසිදායක වේ. විවෘත ගිවිසුම් යටතේ, ගාස්තු වරින් වර අලුත් කරනු ලැබේ. ආයතන දෙකම (SLA සහ SLC) එකම සමූහය තුළ සිටින බැවින්, පාර්ශවයන් සේවා මට්ටමේ ගිවිසුමකට එළැඹෙනු ඇති අතර එය දැනට සාකච්ඡා මට්ටමේ පවතී.	ගිවිසුම් තවම අවසන් කර නොතිබුණි.

(ඉ)	සමාගමේ අරමුණු සහ වටිනාකම් අනුව, 2020 වසරේ සිට ශ්‍රී ලංකන් කේටරින් සමාගම විසින් සේවා සපයනු නොලබන අනෙකුත් ගුවන් සමාගම්වලට සේවා සැපයීමේ අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කරන ලදීකෙසේ . තත්වෙ, පසුගිය වසර පහ තුළ නව පාරිභෝගිකයෙකු ලෙස ලබාගෙන ඇත්තේ එක් ගුවන් සමාගමක් පමණක් වන අතර ඒ අනු ව්‍යාපාරය ව්‍යාප්ත කර ගැනීම සඳහා නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	2023	සමාගමේ ව්‍යාපාර සංවර්ධන ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීමට සහ නව ගුවන් සේවා පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමට කළමනාකාරීත්වය ක්ෂණික පියවර ගනී. සමාගමේ වර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වත්මන් ව්‍යාපාර සංවර්ධන උපාය මාර්ග පිළිබඳ පුළුල් සමාලෝචනයක් සහ ඉලක්කගත මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු වීම.	SLC විසින් පසුගිය වසර 05 තුළ සිංගප්පූරු ගුවන් සේවය, මාලදිවයින් එයාර්, AirAstana, Fits air, Red Wings Airlines, Sky Up Airlines, Iran Air and Air Seychelles, Lot Polish සහ Fly Dubai ඇතුළු නව ගුවන් සේවා සමඟ ව්‍යාපාර සුරක්ෂිත කර ගැනීමට සමත් විය. COVID-19 වසංගතයෙන් පසු, කොළඹට ක්‍රියාත්මක වූ බොහෝ ගුවන් සමාගම් රට වෙත සිය මෙහෙයුම් නතර කර ඇත. එසේ වුවද, ශ්‍රී ලංකන් කේටරින් ආයතනය විසින් දැනට ශ්‍රී ලංකන් කේටරින් ආයතනයෙන් ආහාර සැපයීමේ සේවා නැවත ආරම්භ කිරීම සඳහා දැනට කොළඹට ක්‍රියාත්මක වන පෙර ගුවන් සේවා පාරිභෝගිකයන් සමඟ සාකච්ඡා පවත්වයි.	ශ්‍රී ලංකා කේටරින් සමාගම සිය අරමුණු සහ ඉලක්ක නිසියාකාරව ඉටුකරගෙන නොතිබුණි.
(ඊ)	සමාගමේ අංශ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයේදී UL ආපනශාලාව, CIAR සහ ශීත කළ ආහාර ඒකකය සමාලෝචිත වසර තුළ පාඩු ලබා ඇති බව ඉස්මතු විය. තවද, UL	2023	කළමනාකාරීත්වය පාඩු ලබන කොටස්වල (UL ආපනශාලාව, CIAR, සහ ශීත කළ ආහාර ඒකකය) කාර්ය සාධනය පිළිබඳ පුළුල් සමාලෝචනයක් කළ යුතු අතර පාඩුවලට මූලික හේතු	ශ්‍රී ලංකන් කේටරින් සමාගම හඳුනාගත් පාඩු උකහා ගැනීම සඳහා මිල ගණන් සමාලෝචනය කරනු ලැබේ .එසේ වුවද, ශීත කළ ආහාර ඒකකය 2024 සැප්තැම්බර් මාසය සඳහා ලාභයක් වාර්තා කර තිබුණි.	පාඩුවලට මූලික හේතු මෙතෙක් හඳුනාගෙන නොතිබුණි**.**

	ආපනශාලාව 2022 වසරේ එනම් එහි ආරම්භයේ සිටම පාඩු ලබමින් පැවතුණ අතර CIAR අංශයද දිගින් දිගටම පාඩු වාර්තා කර තිබුණි. තවද, COVID-19 කාලපරිච්ඡේදය තුළ දියත් කරන ලද ශීත කළ ආහාර ව්‍යාපෘතිය)Frozen Meals) 2021/22 සහ 2023/24 යන වර්ෂ දෙකෙහිම පාඩු වාර්තා කර තිබුණි.		හඳුනාගෙන ඒවායේ ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු වීම.		
(උ)	මෝටර් රථ ලියාපදිංචිය මගින් පවත්වාගෙන යනු ලබන දත්ත ගබඩාවේ ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් නමින් ලියාපදිංචි කර ඇති නමුත් භෞතිකව නොතිබූ වාහන හයක් විගණනයේදී හඳුනාගින ඇත.	2023	සමාගම් වාහන භාවිතය නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පුළුල් වාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කළ යුතු වීම.	එම වාහන හය පිළිබඳ අදහස් පහතින් දැක්වේ. පවතින තොරතුරු අනුව ශ්‍රී ලංකා කේටරින් ආයතනයට අදාළ නොවන අවසන් වාහන හතරේ විස්තර කරුණාකර නැවත වලංගු කරන්න	RMV වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි

වාහන අංකය.	වාහන වර්ගය	වත්මන් තත්ත්වය
GI 2059	මරුවි වැන්	2017 දී බැහැර කරන ලදී
GL 1836	චතුර බවුසර්	2021 දී බැහැර කරන ලදී
13 3653	-	SLC වාහනයක් නොවේ
ND 9199	-	SLC වාහනයක් නොවේ
47 0508	-	SLC වාහනයක් නොවේ
47 0509	-	SLC වාහනයක් නොවේ

(ඌ)	පසුගිය වසරේ සහ සමාලෝචිත වර්ෂයේ ශේෂය රුපියල් **97,750** ක් පෙන්වන බැංකු ගිණුමක් තිබෙන බව නිරීක්ෂණය විය. අක්‍රිය ගිණුම් පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම වෙනත් තැනක වඩා හොඳින් භාවිතා කළ හැකි සම්පත් භාවිතා කරන අතර ගිණුම නුසුදුසු හෝ වංචනික අරමුණු සඳහා භාවිතා කිරීමට අවස්ථාවක් තිබිය හැකිය.	2021	අක්‍රිය ගිණුම් හඳුනා ගැනීම සඳහා විවෘත බැංකු ගිණුම් පිළිබඳ සමාලෝචනයක් වරින් වර සිදු කළ යුතුය. තවදුරටත් අවශ්‍ය නොවන ගිණුම් වසා දැමිය යුතුය.	මෙම ගිණුම් විවෘත කර ඇත්තේ ඉතා රහසිගතව වන්දි ගෙවීම සහ ප්‍රතිපූරණ වියදම් වැනි විධායක ගෙවීම් සිදුකිරීම සඳහා පමණි. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ එවැනි ගෙවීම් සිදු කර නොමැත.	මෙම ගිණුම් වසා දැමීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත. එය තවමත් සිදුකරමින් පවතී.
(එ)	පෙර වසරේ 1,781,500 ක පිරිවැයකින් හයි ලෝඩර් ට්‍රක් රථ පහක සවිකර තිබූ සීසීටීවී කැමරා දහයක් ක්‍රියාත්මක ත්ත්ත්වයේ නොවන බව විගණනයේදී අනාවරණය විය. මෙම ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සමාගම අපොහොසත් වීම නිසා CCTV කැමරා සඳහා දරන ලද වියදම පාඩුවක් වී තිබුණි.	2022, 2023	කළමනාකාරීත්වය විසින් CCTV කැමරා ව්‍යාපෘතියේ සම්පූර්ණ සමාලෝචනයක් පවත්වා එහි අසාර්ථකත්වයට හේතු හඳුනාගෙන අනාගතයේ එවැනි සිදුවීම් වැළැක්වීමට පියවර ගත යුතු වීම.	ඒප්‍රොන් ප්‍රදේශයේ ඇති පාලන කුළුණු මගින් ඇති කරන ලද සංඥාවට බාධා කිරීම් හේතුවෙන් සජීවී දර්ශන දුරස්ථව නැරඹීමට නොහැකි වුවද, ඕනෑම පරීක්ෂණයක් සඳහා භාවිතා කළ හැකි DVR සමඟ දින 30ක පටිගත කිරීම් තිබේ. අසාමාන්‍ය චලනයන් සහ අක්‍රමිකතා නිරීක්ෂණය කිරීම සඳහා සමාගම මෙම කැමරා ඵලදායී ලෙස භාවිතා කරයි.	එම ප්‍රදේශයේ ඇති පාලන කුළුණෙන් ඇති වන සංඥා කැළඹීම් හේතුවෙන් CCTV කැමරා ක්‍රියා නොකරයි.

(ඒ)	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 61.1 ක මුදලක් වැය කර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 (ආ) සහ (ඇ) අනුව 2022/23 වර්ෂය සඳහා පිළිවෙලින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2022	අනාගතයේදී මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතුය.	ඉදිරි වසර තුන සඳහා ශ්‍රී ලන්කන් කේටරින් සමාගම වෙතින් සපයනු ලබන පාරිභෝගික ගුවන් සේවා සංඛ්‍යාවේ දෘශ්‍යතාව දැකිය නොහැකි බැවින් වසර තුනක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, අවධාරණය කර ඇති පරිදි, ඉදිරි වසර තුනක ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ඇත.	තෙවසරක ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඔ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.1 සහ 7.12.2 (අ), 8.9 සහ 8.12.2 අනුගමනය නොකර සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1.56 ක කාර්යාල ප්‍රදේශය සඳහා නව CCTV කැමරා ප්‍රසම්පාදනය කර තිබුණි.	2022	මින් ඉදිරියට මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.	සමාගම 2016 වසරේ සිට Flight kitchen හි CCTV කැමරා සඳහා සේවා සපයන්නාගෙන් මිල ගණන් ඉල්ලා ඇති අතර මෙම කොන්ත්‍රාත්තුව මෙම සේවා සපයන්නාට ලබා දී ඇත. වගකීම් කාලය අවසන් වීමෙන් පසුව විධිමත් ගිවිසුමක් අත්සන් කරනු ලැබේ.	වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඕ)	අතිරේක 35 මගින් සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.14 වගන්තියට අනුව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහලේකම්වරයාගේ අංක	2022	මින් ඉදිරියට මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අධිකාරී සීමාවන් ප්‍රායෝගික නොවූ බැවින්, NPC උපදෙස් මත, සමාගම 2019 වසරේ සිට අනුමත ආයතනික විශේෂිත ප්‍රසම්පාදන අත්පොතක් ලබා ගැනීමට උත්සාහ	ප්‍රසම්පාදන කොමිෂන් සභාවෙන් නිසි අනුමැතියක් ගෙන නොතිබුණි.

				NPC/PP/01/97 සහ 2020 ඔක්තෝබර් 29 දිනැති ලිපියේ විධිවිධාන අනුව, භාණ්ඩ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ උපරිම අනුමත සීමාව රුපියල් 500,000 ක් විය. කෙසේ වෙතත්, නියැදි විගණනයේ දී සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ඉහත විධිවිධාන උල්ලංඝනය කරමින් රුපියල් මිලියන 28 ක භාණ්ඩ ලබාගෙන ඇති බව අනාවරණය විය.	කළේය. SLC 2020 නොවැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන, අමාත්‍යාංශයේ වත්මන් ප්‍රසම්පාදන අධිකාරි සීමාවන් අනුමත කරන ලෙස ඉල්ලා සිටියද තවමත් එය තිරණාපේක්ෂිතය. එසේ වුවද, මෙහෙයුම්වලට ඇති විය හැකි බාධා වළක්වා ගැනීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගන්නා තෙක් මණ්ඩලයේ අනුමත කළ ප්‍රසම්පාදන අධිකාරි සීමාවන් සමඟ ඉදිරියට යාමට මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. 2010 ජනවාරි 20 සහ 2020 නොවැම්බර් 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ප්‍රසම්පාදන සීමාවන්ට අනුව ඉස්මතු කරන ලද අදාළ ප්‍රසම්පාදනයන් සිදු කරන ලදී.	
(ක)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත නොවී සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා	2023	වටිනාකම නොසලකා සියලුම මිලදී ගැනීම් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව සිදු කිරීම සහතික කිරීමට	ගුවන් ගමන් තුළ ආහාර සැපයුම් ව්‍යාපාර සමාගම විසින් මෙහෙයුම්වල ස්වභාවය අනුව විවිධ මිලදී ගැනීම් (අඩු වටිනාකමින් යුත්	වැළැක්වීමේ කටයුතු ගෙන නොතිබුණි.

	1,098 කදී රු.12,825,409 ක විවිධ මිලදී ගැනීම් සිදු කර ඇති බව විගණනයේදී අනාවරණය විය.		කළමනාකාරීත්වය වහා පියවර ගත යුතු වීම.	ප්‍රසම්පාදන) සිදු කිරීම අවශ්‍ය වේ. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අත්පොතෙහි දක්වා ඇති ක්‍රියා පටිපාටිවලට අනුව විවිධ මිලදී ගැනීම් හෝ වෙනත් ආකාරයක මිලදී ගැනීම් සිදු කර තිබුණි.	
(ග)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.5.1, 6.3.6, 6.3.2, 7.12.1, 7.12.2 (අ), 8.10.1 සහ 8.12.3 ප්‍රතිපාදන අනුගමනය නොකර සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රුපියල් මිලියන 6.5 ක අයවැය ප්‍රතිපාදන ඉක්මවමින් රුපියල් මිලියන 19.44 ක උඳුන් දෙකක් මිලදී ගෙන තිබුණි.	2022	මින් ඉදිරියට මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.	කිසිදු ණයක් ලබා නොගෙන සමාගම සතු අරමුදල්වලින් සපයා ගන්නා ලදි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ශ්‍රී ලංකන් කේටරින් ආයතනය ප්‍රාග්ධන වියදම් පිළිබඳ රජයේ රෙගුලාසි හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර වත්කම්වල වටිනාකම අයවැය අගයට වඩා ඉහළින් පවතී. මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී.	නිවාරණ කටයුතු සිදුකර නොතිබුණි.
(ච)	UL ආපනශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අයවැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන රුපියල් මිලියන 58.5 ක් වූ අතර සමස්තයක් ලෙස ප්‍රතිසංස්කරණය	2022	මින් ඉදිරියට මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය පියවර ගත යුතුය.	සමාගම් දෙකේම කළමනාකාර්ත්වයේ තීරණයට අනුව, ශ්‍රී ලන්කන් කේටරින් සමාගම 2022/23 අයවැයෙන් රු.මිලියන 58.5 ක ඇස්තමේන්තුගත කර තිබුණි. අධ්‍යක්ෂ	නිවාරණ කටයුතු සිදුකර නොතිබුණි.

	සඳහා ලංසු කැඳවා තිබුණි. කෙසේ වෙතත්, පසුව ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 20 දක්වා අඩු කර ඇති අතර සම්පූර්ණ ව්‍යාපෘතිය කොටස් වලට බෙදා සැපයුම්කරුවන් 30 දෙනෙකුට කොන්ත්‍රාත්තු ලබා දී ඇත. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.7, 2.8, 2.6.1, 4.3.1, 5.4.4, 6.3.2, 6.3.6, 7.2, 7.9.7 සහ 8.12.3 අනුගමනය නොකර මෙම කුඩා කොන්ත්‍රාත්තු ලබාගෙන ඇත. ව්‍යාපෘති සැලසුම් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් තාවකාලික ස්ථානය සඳහා සමාගමට රුපියල් මිලියන 2.19 ක අමතර මුදලක් දැරීමට සිදු වූ අතර සැබෑ මුළු පිරිවැය රුපියල් මිලියන 23.29 කි.		මණ්ඩලයේ තීරණයකට අනුව ඇස්තමේන්තු කරන ලද අළුත්වැඩියා කිරීමේ පිරිවැය රු.මිලියන 20 කි. රු.මිලියන 5ට අඩු සෑම ප්‍රසම්පාදනයක් සඳහම ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. ප්‍රමාණ බිල්පත, නඩත්තු කලමණාකරු විසින් සකස් කරන ලද අතර රු.මිලියන 5 ට අඩු ප්‍රසම්පාදන සඳහා TEC නොමැතිව ශ්‍රී ලන්කන් කේටරින් සමාගමෙහි සම්මත ඇගයීම් බලධාරියා ඔහු වන අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ප්‍රධාන විධායක නිලධාරියාට ලබා දිය හැක. AASL කාර්යමණ්ඩලයට සහන මිලට හිමිකමක් නොමැති බැවින් අපි AASL සමඟ ගිවිසුමකට එළඹ නැත.	
(ජ)	සමාගම සිය මූල්‍ය දත්ත කළමනාකරණය කිරීම සඳහා බහුවිධ ඒකාබද්ධ නොවන ගිණුම්කරණ පද්ධති (Oracle සහ Inflair Inflight) භාවිතා කර ඇති අතර	2023	සියලුම මූල්‍ය ක්‍රියාවලීන් හරහා තත්‍ය කාලීන යාවත්කාලීන කිරීම් සඳහා ඉඩ සලසන පූර්ණ ඒකාබද්ධ ගිණුම්කරණ මෘදුකාංග විසඳුමක් වෙත සමාගම	AP මොඩියුලය හැර අනෙකුත් මොඩියුලයන් 2005 දී මිලදී ගන්නා ලද වත්මන් ගුවන් යානා ආහාර සැපයුම් පද්ධතියේ සීමා කිරීම් හේතුවෙන් ඒකාබද්ධ නොවේ. සමාගම	SLC සඳහා සම්පූර්ණ ඒකාබද්ධ පද්ධතියක් තවමත් භාවිතා කර නොතිබුණි.

	කළමනාකරණය විසින් වසර අවසාන ජර්නල සටහන් අතින් පළ කර ඇත.	සංක්‍රමණය විය යුතුය.	බොහෝ අභිරුචිකරණයන් සමඟ පද්ධතිය භාවිතා කර ඇති අතර විකුණුම්කරුට යම් යම් වෙනස්කම් කිරීමට නොහැකි විය SLC මේ වන විටත් පූර්ණ ඒකාබද්ධ පද්ධතියක් පිළිබඳ මූලික අධ්‍යයනයක් ආරම්භ කර ඇති අතර නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	
(ට)	සමාගමේ පද්ධති, විශේෂයෙන් Inflair සහ Oracle EBS, Active Directory AD සමඟ ඒකාබද්ධ කර නොතිබුණි.	2023	පරිශීලක සත්‍යාපනය සහ ප්‍රවේශ කළමනාකරණය මධ්‍යගත කිරීමට, ආරක්ෂාව වැඩි කිරීමට සහ පරිපාලන ක්‍රියාවලීන් සරල කිරීමට සමාගම Inflair සහ Oracle EBS AD සමඟ ඒකාබද්ධ කළ යුතුය.	Oracle EBS දැනට Active Directory (AD) සමඟ ඒකාබද්ධ වී නොමැත. මෙම සීමාව විසඳීම සඳහා, සංකීර්ණ වින්‍යාසයන් සහිත ශක්තිමත් මුරපද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත. AD සමඟ ඒකාබද්ධ කිරීම 2025/26 හි සැලසුම් කර ඇති Oracle EBS වැඩිදියුණු කිරීමේ කොටසක් ලෙස සැලසුම් කර ඇත. ඒ හා සමානව, Inflairnet හි AD ඒකාබද්ධ කිරීමේ හැකියාවන් නොමැත. මෙය අවම කිරීම සඳහා, එය දැඩි මුරපද වින්‍යාසයන් ද භාවිතා කරයි.	SLC සඳහා සම්පූර්ණ ඒකාබද්ධ පද්ධතියක් තවමත් භාවිතා කර නොතිබුණි.

(ඩ)	ශ්‍රී ලංකන් ගුවන් සේවයේ 3.2 - ආයතනික තොරතුරු ආරක්ෂාව සහ රහස්‍යතා කළමනාකරණ අත්පොතට අනුව, සේවා සපයන සියලුම තුන්වන පාර්ශ්වයන් ‘විගණනය කිරීමේ අයිතිය’ සහ ‘අධීක්ෂණය කිරීමේ අයිතිය’ වගන්ති ඇතුළු සේවා ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය වේ. මෙම වගන්තිවලට ඕනෑම ව්‍යතිරේකයක් යුක්ති සහගත වන අතර ගිවිසුම් සමාලෝචන ක්‍රියාවලියේදී සමාලෝචනය කෙරේ. කෙසේ වෙතත්, සේවා මට්ටමේ ගිවිසුම් (SLAs) සමාලෝචනය කිරීමේදී, මෙම වගන්ති ඇතුළත් කර නොමැති බව සොයා ගන්නා ලදී.	2023	සමාගම 'විගණනය කිරීමට ඇති අයිතිය' සහ 'අධීක්ෂණය කිරීමේ අයිතිය' වගන්ති ඇතුළත් කිරීමට දැනට පවතින සියලුම SLAs සමාලෝචනය කර සංශෝධනය කළ යුතුය. තවද, මෙම වගන්ති තරයේ යුක්ති සහගත සහ ලේඛනගත කර ඇති ව්‍යතිරේක සහිතව, සියලුම අනාගත සේවා ගිවිසුම්වලට අඛණ්ඩව ඇතුළත් කර ඇති බව සහතික කිරීම සඳහා දැඩි සමාලෝචන ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය.	මෙම මූල්‍ය වර්ෂයේ අලුත් කිරීමට නියමිත සියලුම ගිවිසුම් ‘විගණනය කිරීමේ අයිතිය’ සහ ‘අධීක්ෂණය කිරීමේ අයිතිය’ යන වගන්ති දෙකම ඇතුළත් වන පරිදි සංශෝධනය කෙරේ. විගණනයට ඇති අයිතිය' සහ 'අධීක්ෂණය කිරීමේ අයිතිය' වගන්ති ඇතුළත් කිරීම සඳහා අනෙකුත් සියලුම ගිවිසුම් අතිරේකයක් සමඟ සංශෝධනය කෙරේ. අවසාන දිනය - **31** මාර්තු **2025.**	සංශෝධන සිදු කර නොතිබුණි.
(ණ)	සමාගමට පුළුල් ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණ (BCM) ක්‍රියා පටිපාටියක් නොතිබුණි.	2023	ශක්තිමත් අවදානම් තක්සේරුව, BIA, BCP දැනුවත් කිරීම සහ පරීක්ෂණ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම ප්‍රමුඛත්වය දිය යුතුය.	සියලුම ව්‍යාපාර අඛණ්ඩ සැලසුම් සමාලෝචනය කර යාවත්කාලීන කර ඇත. බලපෑම් තක්සේරුවක් 2025 ජනවාරි මාසයේදී සැලසුම් කර 2025 ජනවාරි 31 වන විට	බලපෑම් තක්සේරුවක් තවම අවසන් කර නොතිබුණි.

අවසන් කර ඇත.

(ත)	Inflair Inflight පද්ධතියේ පද්ධතිය ජනනය කරන ලද පරිශීලක ලැයිස්තුවේ නිර්මාණය කළ දිනය, අවසන් පුරනය වූ දිනය, අක්‍රිය කළ දිනය, අක්‍රිය පරිශීලකයින් වැනි දත්ත ක්ෂේත්‍ර ග්‍රහණය කර නොමැත. අක්‍රිය කිරීමේ දිනයක් නොමැති වීම හේතුවෙන්, පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රිය කිරීම තහවුරු කිරීමට කළමනාකාරීත්වයට නොහැකි විය හැක. අවසාන පිවිසුම් දිනය නොමැතිව, විෂමතාවයක් ඇති විට, පරිශීලකයන් විසින් පද්ධතියට පිවිසුම් දිනය සත්‍යාපනය කිරීමට කළමනාකරණයට නොහැකි විය හැකිය. තවද, පරිශීලක තත්ත්වය නොමැතිව, පද්ධතියේ පරිශීලකයින්ගේ වත්මන් පරිශීලක ගිණුම් තත්ත්වය සත්‍යාපනය කිරීම අපහසුය.	2022	පද්ධතිය ජනනය කරන ලද පරිශීලක ලැයිස්තු තුළ පරිශීලක නිර්මාණය කිරීමේ දිනය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.	අස්ථානගත වූ ක්ෂේත්‍ර සමඟ වාර්තා ආකෘතිය වැඩි දියුණු කිරීමට ඇති හැකියාව බැලීමට 2023 අප්‍රේල් 25 වැනි දින වන විටත් වෙනස් කිරීමේ ඉල්ලීමක් සැපයුම්කරු වෙත ඉදිරිපත් කර ඇත.	නව පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවශ්‍ය වෙනස් කිරීමේ ඉල්ලීම ප්‍රමාද වී තිබුණි.

(ද)	සමාගම Inflair Inflight පද්ධතියේ මුරපද ආරක්ෂක පරාමිතිය ප්‍රමාණවත් ලෙස වින්‍යාස කර නොමැත. අනවසර පිවිසීමේ අවදානම අවම කිරීම සඳහා පරිශීලකයා එකම මුරපද වින්‍යාසයන් භාවිතා කිරීම වැළැක්වීම සඳහා මෙම පරාමිතිවල සංයෝජනය සැකසිය යුතුය.	2022	අනවසර පිවිසීමේ අවදානම අවම කිරීම සඳහා ප්‍රමාණවත් මුරපද වින්‍යාසයන් බලාත්මක කිරීම තොරතුරු පද්ධතිවල ආරක්ෂාව පිළිබඳ වැදගත් අංගයකි.	මුරපද සැකසීම් වෙනස් කිරීම සඳහා වෙනස් කිරීමේ ඉල්ලීම 2023 අප්‍රේල් 25 දින සැපයුම්කරු වෙත යොමු කර ඇත.	වෙනස් කළමණාකරණ පද්ධතියක් තවමත් සම්පූර්ණ කර නොතිබුණි.
(න)	සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්හි පාලනය කරන, ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ හි දැනට පවතින “Corporate Information Security Privacy Management” අත්පොත ලේඛනය, ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ්හි අතින් ප්‍රවේශ කළමණාකරණය සහ වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටිවල වර්තමාන පරිවය පිළිබඳ වගන්ති වලින් සමන්විත නොවේ. කළමනාකරණය විසින් ව්‍යාපාරික අරමුණු/අවශ්‍යතාවලට අනුකූලව පැහැදිලි ප්‍රතිපත්තිමය	2022	පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සහ වෙනස් කළමණාකරණ ක්‍රියාවලීන් ප්‍රමාණවත් ලෙස සහ යෝග්‍ය ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකන් කේටරින් ලිමිටඩ් පාලනය කරන පවතින ප්‍රතිපත්ති ලේඛනයේ කළමනාකරණය ප්‍රවේශ කළමනාකරණය පිළිබඳ වැදගත්කම සහ වගන්ති අර්ථ දැක්වීම සහ කළමනාකරණ අංශ වෙනස් කිරීම ඉතා වැදගත් වේ.	පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයේ වර්තමාන භාවිතය වන්නේ අතින් පෝරම හරහාය. මෙය 2024 දෙවන කාර්තුව වන විට වෙනස් කළමණාකරණ පද්ධතියකට වෙනස් වනු ඇත. ශ්‍රී ලංකන් ගුවන් සේවයේ නව පද්ධතියක් ඇගයීමට ලක් වෙමින් පවතින අතර ශ්‍රී ලංකන් කේටරින් එම ක්‍රමයටම අනුගත වීමට අදහස් කරයි.	වෙනස් කළමණාකරණ පද්ධතියක් තවමත් සම්පූර්ණ කර නොතිබුණි.

දිශානතියක් සැකසිය යුතු අතර, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සඳහා සහය සහ කැපවීම පෙන්නුම් කළ යුතු අතර, විස්තීර්ණ පරිශීලක ප්‍රවේශ කළමනාකරණයක් පවත්වා ගෙන යාම සහ කළමනාකරණය වෙනස් කිරීම කළමනාකරණය කිරීම තුළින්, ප්‍රමාණවත් නොවීම් පවතින බැවින්, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සහ සමාගමේ පවතින ප්‍රතිපත්ති වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටි තොරතුරු තාක්ෂණ පරිසරය තුළ සිදු කෙරෙන නුසුදුසු ක්‍රියාවලට හේතු විය හැකි අතර, එය අනාවරණයකින් තොරව පැවතිය හැකි අතර වංචනික ක්‍රියාකාරකම්වලට ද හේතු විය හැක.